CHETAN BHAGAT

# 3 idiots



# තුන් බොල්ල

පරිවර්තනය

**දිලීප ජයකොඩි**

# Five Point Someone

## Chetan Bhagat

# ගැබෝල්ල

පරිවර්තනය

**දිලීප ජයකොඩි**

**සුරස පොතක්**

ප්‍රකාශනය

**ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්**

165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10.

දුරකථන : 2682223 / 5833323 ෆැක්ස් : 2682224

බෙදාහැරීම

**සුරස පොත්හල**

617, මරදාන පාර, කොළඹ 10.

දුරකථන : 2694230 ෆැක්ස් : 2674018

Colombo Public Library

SA157156

# මේකත් ඔයාටයි වින්ඩි!

වින්ඩි...!
ඒ තමයි එයාගෙ නම!!
නම වගේම තමයි එයත්.
හුළඟක් වගේ.
එනව දන්නෙත් නෑ,
යනව දන්නෙත් නෑ.
එහෙම යන එන ගමනකදි තමයි
එයා මට ඉන්දියාවෙන්ම
චේතන්ගේ Five Point Someone
ගෙනල්ල දෙන්නෙ.
ඒ මීට අවුරුදු පහකට වගේ කලින්.
ඒත් දැන් තමයි 'තුන් මෝල්ලු' එළි දකින්නෙ.
කොච්චර කල් ගියත්
වින්ඩිව අමතක කරන්නෙ කොහොමද?
ඒ නිසා වින්ඩි
ඕන්න... ඔයාටයි මේ
තුන් මෝල්ලු!

# මගේ සත පහ!

මාත් මොනව හරි කියන්න එපායැ...? මේ තමයි ඒ "මොනව හරි...!" ඉස්සෙල්ලම කියන්න තියෙන දේ තමයි, 'තුන් මෝල්ලු' ලියල ඉවර වෙනවත් එක්කම... (සොරි... පරිවර්තනය කරල ඉවර වෙනවත් එක්කම), චේතන් ලියපු ඔක්කොම 'නවකතා' (ඒව නවකතා කියල අඳුන්වන එක හරිද මන්ද...) මගෙ අතින් සිංහලයට පරිවර්තනය වෙලා අවසන් වීම.

හැබැයි චේතන්ගෙ මුල්ම පොත තමයි, මේ තුන් මෝල්ලු කියල මගෙ අතින් අන්තිමට පරිවර්තනේ වෙන්නෙ. හරිනං මාත් මේක තමයි ඉස්සෙල්ලම පරිවර්තනේ කරන්න තිබ්බෙ. ඒත් ඒක කල් ගියා.

කොහොමින් හරි චේතන්ගෙ මේ පොත වැඩියමත්ම ප්‍රසිද්ධ වුණේ "ත්‍රී ඉඩියට්ස් ෆිල්ම් එකේ පොත" හැටියටයි. හැබැයි මේ පොත ඔයාලා බලන්න කලින් මේකත් මං කියන්නම ඕනේ!

"ත්‍රී ඉඩියට්ස් ෆිල්ම් එකේ පොත" කිව්වට මේක එහෙමම නෙවෙයි. 'ත්‍රී ඉඩියට්ස්' ෆිල්ම් එකට අරගෙන තියෙන්නෙ මේකේ යම්, යම් මූලික කරුණු ටිකක් විතරයි. එහෙම අරගෙන සාර්ථක ෆිල්ම් එකක් කරන්න තරම් රාජ්කුමාර් හිරානි දක්ෂ වෙලා තිබුණා.

ඒ නිසා එහෙම හිතාගෙන, 'ත්‍රී ඉඩියට්ස්' ෆිල්ම් එක පොතකින් බලන්න ඕනෙ කියල හිතාගෙන මේක කියවන්න එපා!

මේක 'ත්‍රී ඉඩියට්ස්' ෆිල්ම් එකට වඩා ගොඩක් වෙනස්!

තවත් දෙයක් මට ඔයාලට කියන්න ඕනෙ. මගෙ පොත් කියවන, (විශේෂයෙන්ම චේතන්ගේ පොත් කියවන) රසිකයො පොඩි අවුලක ඉන්නවය කියල මට හිතුණ. ඒ තමයි, චේතන්ගෙ පොතුයි, මං පරිවර්තනය කරපු පොතුයි පටලව ගැනීම. ඒ හින්ද මං හිතුව ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න.

ඔක්කොමල හොඳ ළමයි වගේ මේ වගුව බලන්න.

| | චේතන්ගෙ පොතේ නම | ලියපු අවුරුද්ද | ඒකෙ පරිවර්තනයට මම දාපු නම | ඒකෙ චිත්‍රපටයෙ නම |
|---|---|---|---|---|
| 1. | Five Point Someone | 2004 | තුන් මෝල්ලු | 3 Idiots (හින්දි), Nanban (දෙමළ), Snehithudu (තෙළිඟු) |
| 2. | One Night @ Call Centre | 2005 | හලෝ... හලෝ... | Hello... Hello 2 |
| 3. | Three Mistakes in My Life | 2008 | තුන්තකතිරුකං කරපු කෙනෙක් මං | Kai po Che |
| 4. | 2 States | 2009 | මොන මඟුලක්ද මන්දා | 2 States |
| 5. | Revolution 2020 | 2011 | දෙන්න දෙපැත්තේ ආරති මැද්දේ | Film එක (තාම හදනවලු) |

දැන් ඔය ළමයි ඔක්කොටම පැහැදිලිනෙ! මීට පස්සෙ වරද්ද ගන්න එපා... හොඳද ළමයි?

ඉතින් මේ පොත් ටික ඔක්කොම ඔයාලා අතට පත් වෙන්නේ 'සූරස' ප්‍රකාශන හැටියට. ඒකට මට හැමදාම උදව් කරන, ෆාස්ට් පබ්ලිෂින් අධිපති ප්‍රේම් දිසානායක සූධීමතුන්ට මගේ හද පිරි ස්තුතිය මේ විදිහට පිළිගන්වන්න මං කැමැතියි. ඊළඟට ෆාස්ට් පබ්ලිෂින් කාර්යමණ්ඩලයට... ඩිලන්ත මල්ලිත් ඇතුළු!

ඊට පස්සෙ කවදත් මට ආදරය කරන, මගේ පොත් කියවන, මට අමතන, ලියන මගේ ආදරණීය පාඨකයො සමූහය... ඔයාලටත් ගොඩක්ම ස්තුතියි. ඔයාලගෙ ප්‍රතිචාර සහ ආදරය තමයි මාව දිරිමත් කරන්නෙ...!

මගේ ආදරය බිරිඳ ස්වර්ණා... දුව පුලස්ති... පුතා අර්ජුන... එයාලටත් ස්තුති කරන්නෙ මට වාත නොවී ලියන්න උදව් දෙනවට!

ඊළඟට මගෙ ආදරණීය දෙමවුපියන්ට වගේම, නදීජා, ස්වේතා සොයුරියන් දෙදෙනාටත් ස්තුතියි නොකියම බැහැ.

තවත් විශේෂ කෙනෙක් ඉන්නව තැන්ක් යූ කියන්න!

ඒ තමයි මට මේකෙ මුල් පොත ඉන්දියාවෙන්ම ගෙනල්ල දීපු වින්ඩි! වින්ඩි නැත්නම් මේ පොත ඔයාලට කියවන්න වෙන්නෙ නෑ.

වින්ඩි... තැන්ක් යූ සෝ මච්...!

දැන් ඉතින් ෂෝ එක පටන් ගන්නයි යන්නේ...!

ඔන්න තුන්වෙනි බෙල් එක! ලයිට් නිව්ව!!

වෙනද වගේම ඔයාලගෙ අදහස් මට කියන්න, ලියන්න මෙන්න ටෙලිෆෝන් නොම්බර, ඊමේල්... ඇඩ්‍රස්...!

දිලීප ජයකොඩි

118/4, 'මිහිර',

සමගිපුර මාවත, වත්තෙගෙදර පාර, මහරගම.

ඊමේල්: dileepa8@yahoo.com

ටෙලිෆෝන්: (ගෙදර) 2844508/4920078

මොබයිල්: 0771143324.

# ඇක්නොලේජ්මන්ට් එක!

ඉස්සෙල්ලම කියන්න ඕනෙ මේ පොත මගෙ හීනයක් හැබෑ වීමක් කියල... ලෝකෙ දැනට ඉන්න මිනිස්සු (එහෙම කිව්වට ගැනුත් එක්ක... හරිද?) ගෑනු... ඔය හැමෝම අතරෙ බොහොම සුන්දර මිනිස්සුත් ඉන්නව. එයාල තමයි මගෙ හීනෙ හැබෑ කළේ. ඒ හීනෙ තමයි දැන් ඔයාගෙ ඇඟිලි දහය අතරෙ දිග ඇරිල තියෙන්නෙ. ඉතින් මං කැමතියි එයාලට බොක්කෙන්ම තැන්ක් යූ කියන්න. ඒ අය අතරෙ විශේෂයෙන්ම නම් කියල ස්තුති කරන්න ඕනෙ කට්ටියකුත් ඉන්නව.

මිනි ඇන්ටනි - මගෙ උපදේශිකාව... මගෙ ගුරු... මගෙ මිතුරිය... කතාන්දරයක් කීමේ මූලික දේවල් ටික ඉගැන්නුවෙ එයා තමයි. මාත් එක්ක මුල ඉඳලම අගට එනකල් ඉන්න එකත් එයාගෙ විශේෂ ලක්ෂණයක්. එයාගෙ බර බරේ නොවෙන්න මං මේ වැඩේ අල්ලල අල ගොඩක් කල්!

ජේම්ස් ටර්නර්, ගව්රව් මලික්, ජෙසිකා රොසෙන්බර්ග්, රීතු මලික්, ට්‍රේසි අන්ග්, ඇන්ජෙලා වැන්ග්, රිම්ජිම් චට්ටෝපාධ්‍යාය... කල්‍යාණ මිත්‍රයො සෙට් එක... මගෙ අත් පිටපත කියවල හොඳනං "හොඳයි" නැත්තං "ජරාවක්" කියල කෙළින්ම, අවංකව කියන කට්ටිය. මෙයාලත් මේ වැඩේ ඉවර වෙනකල්ම මාත් එක්ක හිටිය. සමහර වෙලාවට මං අතිශය හැඟීම්බර වෙලා වැඩ කරනකොට මාව කොන්ට්‍රෝල් කරගත්තු කට්ටිය.

අනුෂා බගත් - මෙයා කාලයක් මගෙ ක්ලාස් මේට්. මගෙ කතාවල දළ සැකිල්ල කියවන පළවෙනිය. මේ පොතේ තියෙන සමහර දේවල් කියවල ටිකක් විතර තක්බීර් වුණා ඇරෙන්න එයා බොහොම සන්සුන්ව හිටිය. මොකද එයාට තිබුණ බරපතළ රාජකාරි දෙකක්.

1. තමන්ගෙ හස්බන්ඩ්ට ඕන නැති දේවල් කියල අප්සෙට් නොකිරීම
2. ඒ තුළින් මේ පොතේ ගුණාත්මක බව වැඩි කිරීම

ඒ දෙකම එයා බොහොම හොඳට කළා.

මගෙ අම්මා, රේඛා හගට්... සහෝදරා කේටන් හගට්... එයාල මා ගැන පුදුම විශ්වාසෙකින් රැඳිලා හිටිය මේ වැඩේ කෙරෙනකල්. එයාලත් එක්ක මගෙ තියෙන්නෙ හුදු ජානමය සම්බන්ධයක් විතරක් නෙවෙයි. ඊට එහා ගිය බැඳීමක්. හැම කර්තෘ කෙනෙකුටම වගේ මටත් එයාලගෙ සහයෝගෙ හරිම වැදගත්.

ඊට පස්සෙ මගේ අයි.අයි.ටී. කස්ටිය! අමීස් (ගෝලු), ජෝරී, වීකේ, මනු, ෂැන්කි, පප්පු, මන්හාර්, වීපී, රාහුල්, මේතා, පාගෝ, අසේම්, රජීව්, ලැව්මීටි, රාහුල් 2, ප්‍රනීත්, චාපර් සහ අනෙක් හැමෝම! මේක ප්‍රබන්ධයක්. ඒත් ප්‍රබන්ධෙකට පණ දෙන්න සැබෑ ප්‍රබෝධවත් ආවේගයක් ලැබෙන්න ඕනෙ... අන්න ඒක ලබල දුන්නෙ මුං තමයි. උන් ගැන පොතක් ලියන්න පුළුවන් වෙච්චි එකට මට උන් ගැන ඇති වෙන්නෙ මාර ආදරයක්!

හොංකොංවල ඉන්න මගෙ යාළුවො, මගෙ කාර්යාල සගයො, මගේ යෝග ගුරුතුමා වගේම මගෙ වටේ හිටිය අනික් හැමෝමත් මගේ ජීවිතේට සැහැල්ලුව ගෙනාව අය. මට ආදරේ කරපු අය.

රූපා. මගෙ ප්‍රකාශකයා වගේම ඒකෙ සමස්ත කාර්ය මණ්ඩලය. මේ හැමෝටම මම ස්තුති කරන්න ඕනෙ එයාලගෙ තියෙන වෘත්තීයමය ප්‍රවීණත්වයයි, මට දක්වපු හෘදයාංගම සහයෝගයයි නිසා.

අන්තිමට, පොතක් ලියන කෙනෙකුටයි තේරෙන්නෙ Ms Word පැකේජ් එකේ බලේ! ව්‍යාකරණ, අක්ෂර වින්‍යාස බැලීම ආදී බොහෝ දේ සමඟ!! Ms Word නැත්තං මේ පොත ලියන්න?? (ටයිප් කරන්න) හම්බ වෙන්නෙ නෑ. ඒ නිසා බිල් ගේට්ස් මහත්තයටයි, මයික්‍රොසොෆ්ට් කොම්පැනියටයි දෙකටම ස්තුතියි!

# ප්‍රෝලෝගය

මං මීට ඉස්සර කවදාවත් ඇම්බියුලන්ස් එකක් ඇතුළෙ ඉඳල නෑ. ඒක මහ මූසල අත්දැකීමක්. හරියට ඉස්පිරිතාලෙකට, ඒකෙ තියෙන බඩු මුට්ටු ඔක්කොම අකුළගෙන පිටවෙන්න කිව්වම හැදෙන පුංචි ඉස්පිරිතාලයක් වගේ! අඩුපඩු, ඔක්සිජන් බෝතල්, බට, කැතීටර්, සේලයින් බෝතල්, ෆස්ට් ඒඩ් බොක්ස් ඔය හැම දෙයක්ම ඒකෙ ඇතුළෙ තිබ්බ ඇඳන් දෙක වටේ තිබ්බ. ඇතුළ හුණ්ඩුවක් වගේ. ආලෝක්ව හතර ගාතෙන් බාවල හිටිය නිසා මමයි, රයනුයි හිටගෙන හිටියෙත් බොහොම අමාරුවෙන්. අනික් අතින් බැලුවම ඇටකටු බිඳීම් 13ක් තියෙන ගොබ්ලෙක්ව හතර ගාතෙන් බාවන්නෙ නැතුව කෙළින් හිටවනහැකියැ? ඒ ඇඳන්වලට දාන ෂීට් සාමාන්‍යයෙන් සුදු පාට වුණත් ඒ වෙද්දි නම් ඒව රතුම රතු පාට වෙලා තිබ්බෙ ආලෝක්ගෙ ලේවලින්. ආලෝක් හතර ගාතෙ දාල හිටිය විදිහට මිනිහව අඳුරන්නත් අමාරුයි. කළු ඉංගිරියාව උඩට ගිහින්. දිව කටින් එළියට ඇවිත් පැත්තකට වැටිල. හරියට ඇල්සේෂන් බල්ලෙක් හති දාද්දි වගේ! ඉස්සරහ දත් හතර නෑ. කවුරු හරි දත්ටික බඩට යන්න හොම්බට එකක් දීල වගේ! (ඒක අපිට දොස්තර පස්සෙයි කිව්වෙ.)

මිනිහගෙ ඇඟ නෝ හෙල්ලුම්. හරියට එයාගෙ තාත්තගෙ ඇගේ දකුණු පැත්ත වගේ. මිනිහගෙ දකුණු දණිස්සෙන් කකුල නැවිල තියෙන විදිහ දැක්කම කවුරු හරි හිතන්නෙ මිනිහගෙ කකුල හැදිල ඇත්තෙ රබර්වලින් කියලයි. පණ තියෙනවද කියල හිතන්නත් අමාරුයි. වෙන වෙලාවකදි කවුරු හරි මිනිහව පෙන්නල ඔට්ටුවක් අල්ලන්න හැදුවොත් මං ඔට්ටු අල්ලන්නෙ මිනිහ මැරිලයි කියන පැත්තට!

මං මටම දිවුර ගත්ත මෙහෙම. "ආලෝකය මේකෙන් ගොඩ ආවොත්, ආයෙ දෙකක් නෑ, මං ලියනව පොතක් අපි පිස්සු කෙළපු හැටි කියල..." එක අතකින් ඒක මහ ඔල්මොරොන්දන් දිවුරීමක්. මොකද ඒ වෙද්දි මගෙ ඔළුව හොල්මං වෙලා තිබ්බෙ. අනික නින්ද නැතුව එක දිගට පැය පනහක් ඇහැරගෙන හිටියෙ.

# 1

# පටන් ගත්තෙම හෙලුවෙන්!

මං මේ පොත පටන් ගන්න කලින් එක දෙයක් ගැන පැහැදිලිව කියන්න ඕනෙ. ඒ තමයි මේ පොත "කැම්පස් එකක ජීවත් විය යුත්තේ කෙසේද?" වගේ දෙයක් ගැන, ඒ ජීවිතේට උපදෙස් දෙන, අත්පොතක් නොවෙන විත්තිය. ඇත්තටම බැලුවොත් මේ පොත, ඔයාලා කැම්පස් එකේ ඉන්දැද්දි මොළේ ඇතුව, පැහැදිලිව නොහිතා වැඩ කළොත් ඔයාලට කෙළවෙන්නේ කෙසේද වගේ දෙයක් කියල දෙන පොතක්! හැබැයි ඉතින් ඒ මං හිතන විදිහ. ඔයාලට ඕන්නං ඒකට කැමති වෙන්නත්, ඕන්නං ඒකට අකැමැති වෙන්නත් ඉඩ තියෙනව. මේක කියෙව්වට පස්සෙ රයනුයි, ආලෝකයි කියන පිස්සො දෙන්නා මාව මරන්නත් ඉඩ තියෙනව. ඉතින් මට මොකෝ? උන්ට ඕනෙනං උන්ගෙ පැත්තෙන් කතාව කියන්න, උන් කරන්න ඕනෙ මාව මරන එක නෙවෙයි. උනුත් පොතක් ලියන එක! හැබැයි මං එකක් දන්නව. ආලෝකය... ඌට ලියන්න බෑ කොහොමටවත්. ඌ පොතක් ලිව්වොත් ඒක බල්ලෙක්වත් කියවන්නෙ නෑ. ඒක මට ෂුවර්. ඊළඟට රයන්... ඌනං මොකක් හරි කරන්න ඕනෙ කියල හිතුණොත් ඒක කරන ජාතියෙ එකෙක්. ඒත් පැය ගාණක් එක දිගට වාඩිවෙලා ලියන්නවත්, ටයිප් කරන්නවත් ඌට බෑ. ඌ එහෙම හික්මිච්ච එකෙක් නෙවෙයි. ඒ නිසා මේ කියන්නෙ උඹල දෙන්නට. මේක මගේ පොත... උඹලට පොත් ලියන්න බැරි එක මගේ ප්‍රශ්නයක් නෙවෙයි. ඒක නිසා මේක මං ලියන්නෙ මට ඕනෙ විදිහට!

මේ පොත තවත් එක කාරණාවකට මඟ පෙන්නන පොතක් නෙවෙයි කියන එකත් පැහැදිලිව කියන්න ඕනෙ. ඒ තමයි, මේ පොත ඔයාලට අයි.අයි.ටී. එකට ඇතුළු වෙන්න ඕනෙ කොහොමද කියල මඟ පෙන්නන පොතකුත් නෙවෙයි. මං හිතන්නෙ අයි.අයි.ටී. එන්ට්‍රන්ස් එග්සෑම් එකේ පේපර්ස් ගයිඩ් හදන්න ලෝකෙ තියෙන ගස්වලින් බාගයක් විතර කපල ආනව ඇති! ඒ ගයිඩ්වලින් තුන්කාලක්ම ශත පහක වැදගැම්මක් නැති ඒව. හැබැයි ඉතින් ඒවයින් අයි.අයි.ටී. එකට ඇතුළුවෙන විභාගෙට මූණ දෙන හැටි ඉගෙන ගන්න පුළුවන් මේකෙන් වඩා.

කොහොමටත් අයි.අයි.ටී. එකට ඇතුළු වෙන්නෙ කොහොමද කියල අහන්න මායි, ආලෝකයයි, රයනුයි තෝර ගැනීම අන්තිම ගොන්කමක්. ඒ ප්‍රශ්නෙ මේ ලෝකෙන්ම අහන්න ඕන නැති තුන්දෙනා තමයි අපි! ඒ මොකද දන්නවද? අපෙන් ඒ ප්‍රශ්නෙ ඇහුවොත් අපේ උත්තරේ වෙන්නෙ මේක නිසා.

"උඹලව පාඩම් පොත්වලින් පිරුණු කාමරේක ආල ඒකට යතුරු ආලා, ඒ යතුරු ගඟේ මූදෙ විසි කරනව. එතකොට උඹල ඒ කාමරේ ඇතුළෙ... ඒ විදිහට උඹලට අවුරුදු දෙකක් ඉන්න පුළුවන්නං සමහරවිට උඹලට අයි.අයි.ටී. එන්න පුළුවන් වේවි."

ඔන්න ඕක තමා අපේ උපදේසෙ වෙන්නෙ. ඊට අමතරව ඉස්කෝලෙ ඒලෙවල් කරන කාලෙදි වෙන කිසිම දෙයක් නොකර පොත් අස්සෙම ඔළුව ගහගෙන හිටියොත් ඒකත් ටිකක් විතර ඒ වැඩේට උදව් වේවි. මං ඉස්කෝලෙ හිටිය අන්තිම අවුරුදු දෙක හිටියෙ හරියට අපායක ඉන්නව වගේ. ඒ කාලෙදි කෙනෙක් ඉස්කෝලෙ බාස්කට් බෝල් ටීම් එකේ හරි වෙනින් මොකක් හරි ටීම් එකක සෙල්ලම් කෙරුවොත් මිසක්, එහෙමත් නැත්තං අවුරුදු හයේ ඉඳන් ගිටාර් ගහන්න පුරුදු වෙලා ඉන්නවනං මිසක් නැත්තං ඉතින් ඒ අවුරුදු දෙක අපායෙම තමා!

දැන් ඉතින් මට තියෙන්නෙ වැඩේ පටන් ගන්නයි.

හරි... ඉතින් කොහෙන් හරි මේක පටන් ගන්න එපායැ. ඒකට ඉතින් මම ඉන්දියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි, ඒත්





නැත්තං මේ පොතේ හැම තැනම කියවෙන අයි.අයි.ටී. එකට ඇතුළු වෙච්ච, ඒ වගේම ආලෝකයයි, රයනුයි කියන පිස්සු පොරවල් දෙක පළවෙනි වතාවට හම්බවෙච්ච දවසට වඩා නැකතක් තියෙනවද? අපි තුන්දෙනාට හම්බවෙලා තිබ්බෙ කුමාඕන් හොස්ටල් එකේ, දෙවෙනි තට්ටුවෙ, එක පේළියට තිබිච්ච කාමර තුනක්. වෙන්න ඕනෙ විදිහටම, කැම්පස් එකේ සිරිත අනුව රැ දොළහ වෙද්දි උන් ටික අපිව හොයාගෙන ආව. උන් කිව්වෙ, 'ජ්‍යෙෂ්ඨ උත්තමයො' ටික. කැම්පස් එකේ අයියල! අපි ඉතින් 'කුණු ෆ්‍රෙෂාලා!" ජ්‍යෙෂ්ඨ උත්තමයො තුන්දෙනෙක් ඉස්සරහ අපි හිටගෙන හිටිය. මංනං හිටියෙ නිදිමතේ කබ කඩ කඩ. ඒ සෙට් එකේ 'ලොකුම අයියා' අනුරාග්, දුෂ්ටයො ඉස්සරහ හින්දි චිත්‍රපටවල වීරයා ඉන්නවා වගේ ස්ටයිල් එකට බිත්තියකට හේත්තු වෙලා, ටූත්පික් එකකින් දතක් හාර හාර හිටිය. අනික් උත්තමය මට පෙනුණෙ තුට්ටු දෙකේ හොල්මං ඉංග්‍රීසි චිත්‍රපටයක ඉන්න අමනුස්සයෙක් වගේ. පොර අඩි හයක් විතර උස ඇති. කිලෝ සීයක්වත් බර ඇති. කළුයි. මයිලානන්ද කෙනෙක්. අවුරුදු දහයකින්වත් දත් දොස්තර කෙනෙක් ළඟට ගිහින් සුද්ද කර නොගත්ත තඩි දත් ඇඳි දෙකකුත් ඌට තිබ්බ! කොහොමටත් ඌව දැක්කම ඕන කෙනෙක් හොල්මං වෙනව. විසේසෙන් රැ දොළහට! හැබැයි පොර වැඩි කතාබහ කරන එකෙක් නෙවෙයි. මිනිහ වැඩියම කළේ එයාලගෙ ලොකු අයියට, බොසාට වැඩේ ඇදගෙන යන්න පසුබිමක් හදන එකයි. තුන්වෙනි එකා කෝටුකිතයියෙක්. නම බාකු. එයාලගෙ බොසා දත් හාර හාර ඉන්න ටූත්පික් එකක පෙනුමමයි මිනිහට තිබ්බේ. මිනිහ ළඟින් ටූත්පික් එකකින් එන මඩ පුවක් ගඳකුත් ඇති කියල මට නිකමට හිතුණ!

"තොපි කුණු ෆ්‍රෙෂාලා... හෙමින් ෂේප් වෙලා ඉන්නයි හැදුවෙ ඈ...? කියපිය තොපි ගැන විස්තර..." මිස්ට ටූත්පික් බෙරිහන් දුන්න.

මේ වගේ අවස්ථාවකදී හැසිරෙන්න ඕනෙ හැටි, කතා කරන්න ඕනෙ හැටි මං දැනගෙන හිටියා.

"මං හරි කුමාර් සර්... මැකැනිකල් ඉංජිනියරිං ස්ටුඩන්ට්... ඕල් ඉන්දියා රෑන්ක් 326..." මං එයාල ළඟ බලු කුක්කෙක්ගෙ ගාණට වැටිල කිව්ව. ඊළඟට හිටියෙ ආලෝකයා... ඌත් මගෙන් මොනව හරි ඉගෙන ගන්න ඇති ඒ ටිකට!

"මං ආලෝක ගුප්තා සර්... මැකැනිකල් ඉංජිනියරිං... රෑන්ක් 453..."

එතකොට තමයි මං ආලෝකය දිහා හරි හැටියට බැලුවෙ. පොර මං තරමටම උස ඇති. තව විදිහකින් කිව්වොත් අඩි පහයි අඟල් පහයි. කොටින් කිව්වොත් කොට ජීවිතේ! පොර දාගෙන හිටිය බෝතල් අඩි කණ්ණාඩි දෙකකුත්. නීට් එකට ක්‍රීස් එක තියල මැදපු පිජාමා ෂූට් එකක් තමයි පොර ඇඳගෙන හිටියෙ.

"රයන් ඔබරෝයි... මැකැනිකල් ඉංජිනියරිං... රෑන්ක් 91 සර්...7 ගැඹුරු හඬකින් අපේ අන්තිම එකා කිව්ව. හැමෝගෙම ඇස් ඒ දිහාට හැරුණා.

"රයන් ඔබරෝයි..." මං මගේ හිත ඇතුළෙන් ආයෙ කියෝ ගත්ත. රයන්, සාමාන්‍යයෙන් අයි.අයි.ටී. එකේදි දකින්න නොලැබෙන තාලෙ පොරක්. උසයි, මාර හැන්ඩ්සම්. එල්ලා හැලෙන දුඹුරු පාට ටී ෂර්ට් එකක් තමයි මිනිහ ඇඳල හිටියෙ. ඒකෙ ඉස්සරහ දිලිසෙන අකුරෙන් 'GAP' කියල තිබ්බ. දණිස්ස ළඟට දිග දිලිසෙන කොට කලිසමත් ඒකටම මැච් වුණා. "ෂුවර් එකටම මුගෙ කවුරු හරි ළඟම නෑයො සෙට් එකක් රට ඇති..." මට හිතුණා. නැත්තං මොකාද 'GAP' ටී ෂර්ට් එකක් තිඩා ගන්න අඳින්නෙ?

"බල්ලො..." බාකුවා බෙරිහන් දුන්නා. "ගලෝපියව් ඇඳුම්..."

"ඔහ්... ඔහ්... බාකු ටිකක් ඉන්නවකො... අපි පොඩ්ඩක් මෙයාල එක්ක චැට් එකක් දාමු ඉස්සර වෙලා..." බිත්තියට හේත්තු වෙලා හිටිය ලොකු අයියා... වීරය, සන්සුන් විදිහට කිව්ව. ඒ වෙද්දි මිනිහ හිටියෙ හොලිවුඩ් ස්ටයිල් එකට සිගරැට් එකක් බිබී.





"මුං එක්ක මොන චැට්ද ලොක්කා... ඕනෙ නෑ..." බාකුවා කිව්වෙ අතකුත් උස්සන ගමන්.

"ගලෝපියව් ඇඳුම්...!"

උන් එක්ක හිටියෙ තව ජ්‍යෙෂ්ඨ උත්තමයෙක් අපි දිහා බලාගෙන විරිත්තගෙන, බඩට තට්ටු කර කර හිටියෙ බොහොම සතුටින්. උන් ඉස්සරහ පිට අපිට වෙන කරන්න දෙයක් තිබ්බෙ නෑ. අපි අපේ ඇඳුම් එකින් එක ගලවන්න ගත්ත. බාකුවා අපේ වටේ කැරකි කැරකි හිටියෙ හමුදා නිලධාරියෙක් වගේ. බාකුවගෙ මූණෙ තිබ්බෙ බොහොම තෘප්තිමත් විලාසයක්!

මගෙයි, ආලෝක්ගෙයි, රයන්ගෙයි ඇඟවල්වල වෙනස හොඳට පේන්න ගත්තෙ ඇඳුම් ඔක්කොම ගැලවුණාට පස්සෙයි. මගෙයි, ආලෝකයගෙයි ඇඟවල්වල කිසිම ෂේප් එකක් තිබ්බෙ නෑ. ඒකට රයන්ගෙ ඇඟ! අන්න ඇඟවල්!! රයන්ගෙ ඇඟ හරියට ග්‍රීක් ප්‍රතිමාවක් වගෙයි මට පෙනුණෙ. අනවශ්‍ය මේදය බිංදුවක්වත් අනවශ්‍ය තැනක තිබ්බෙ නෑ. මෙඩිකල් කොලේජ් එකේ මිනිස් සිරුරේ මාංස පේසීන් පෙන්නන රූප සටහනක වගේ තමයි මිනිහගෙ ඇඟේ මාංස පේසී පිහිටලා තිබ්බෙ. අපේ බඩවල් 'වන් පැක්' වෙලා තියෙද්දි, රයන්ට තිබ්බෙ 'සික්ස් පැක්ස්' බඩක්! මං කල්පනා කළේ මෙඩිකල් කොලේජ් ප්‍රොෆෙසර් කෙනෙකුට එයාලගෙ ශිෂ්‍යයින්ට මිනිස් සිරුර ගැන කියල දෙන්න මාව හරි, ආලෝකයව හරි ගන්න සිද්ධ වුණොත් ඒ ළමයින්ට යන කලදසාව ගැනයි. මං හිතන්නෙ ඒකම තමයි බාකුවා මටයි, ආලෝකයටයි ඉස්සරහට එන්න කිව්වෙ... එතකොට උන්ට අපි දෙන්නව තවත් හොඳට බලාගෙන, තවත් හයියෙන් හිනාවෙන්න පුළුවන්නෙ.

"බලපල්ල මුන් දෙන්නගෙ හැටි..." බාකුව හිනාව තද කරගෙන කිව්ව. "මං හිතන්නෙ මුන්ගෙ අම්මල මුන්ව පිපිරෙනකල් කන්න දීලා... අනේ පව්... චුත්තිම චුත්ති අපේ ෆාලිස් රස්ක් බබාල දෙන්න..." බාකුව අන්තිම ටික කිව්වෙ තොඳොල් වෙවී.

බඩට තට්ටු කර කර හිටිය එකයි, ලොකු අයියා... අනුරාගුයි එක පොදියට හිනා වෙන්න ගත්ත. ලොකු අයිය කොච්චර හිනා

වුණාද කිව්වොත් මිනිහට සිගරැට් දුම ඉස්මොල්ලෙන් ගිහින් කහින්න පටන් ගත්ත.

"අයියෙ... සර්..." ආලෝකය කියවන්න ගත්තෙ වචනත් පටලෝගෙන. "අපිට යන්න දෙනවද... ප්ලීස්..." ළඟට ආව බාකුවට, ආලෝකය කිව්ව.

"මොකක්? යන්න දෙන්න...? යකෝ... අපි තාම උඹලට මොනවත් කළේවත් නෑනෙ... හතර ගාතෙන් හිටපියව්..." බාකුවා කෑ ගැහුව. අපි මූණට මූණ බලා ගත්ත.

"ඔව්... තොපි දෙන්න තමයි... අපේ චූටි ෆාලිස් බබාල..." බාකුවා මටයි, ආලෝක්ටයි ගෝරනාද කළා. "හතරගාතෙන් හිටපියව්... බතලයො..."

මං ආලෝක්ගෙ මූණ බැලුව. මිනිහ දාල හිටිය බෝතල් අඩි කණ්ණාඩි දෙක නිසා මට මිනිහගෙ ඇස් දෙක හරියට පෙනුණෙ නෑ. ඒත් මට හොඳ ෂුවර් එකක් තිබ්බා, මිනිහගෙ ඇසුත් මගෙ වගේම කඳුළු පිරිලා ඇතිය කියලා.

"ඇහුන්නැද්ද තොත්ත බබාලා දෙන්නට... කරපියව් කියපු දේ..." බඩ අත ගගා හිටිය එකා බෙරිහන් දුන්නා. බාකුවාගෙයි, බඩ අත ගාන එකාගෙයි පුදුමාකාර සහජීවනයක් තියෙනව කියන එක මට තේරුණා. බාකුවට ඕනෙ කරන මැරවරකම සප්ලයි කළේ ඌ!

ආලෝකයයි, මායි හතරගාතෙන් හිටියා. හතර වටෙන්ම හිනාවල් පුපුරන්න ගත්තා. මේ පාර අපේ ඔළුවට උඩිනුත් හිනාවෙනව අපිට ඇහුණ.

"අපි මුං දෙන්නව රේස් එකක් යවමු..." බඩ අත ගාන එකා, උගේ කුලුඳුල් සංකල්පය ප්‍රකාශ කළේ හරි ආඩම්බරෙන්. ඒ වුණාට බාකුවට ඊට වඩා හොඳ අදහසක් ඇවිල්ල තිබ්බ.

"රේස් යවන්න ඕනෙ නෑ මුංව... මගෙ තියෙනව ඊට වඩා හොඳ අදහසක්. විනාඩියක් හිටපල්ල මං ටක් ගාල කාමරේට ගිහින් එනකල්..." බාකු කිව්ව. "තොපි දෙන්න හෙල්ලෙනව එහෙම නෙවෙයි හරි...?" බාකුවා වැඩිදුරටත් අණ කළා.





අපි බිම බලාගෙන තත්පර 20ක් විතර හිටිය. මං යන්තං ඔළුව හරෝල බැලුවහම මට පෙනුණ ආලෝක් අඬන බව.

ඒ අතරෙදි බඩ අත ගගා හිටිය එකා රයන්ට බොඩි බිල්ඩර් කෙනෙක්ගෙ පෝස් එකකට හිටපිය කියල කියනව අපි අහගෙනයි. ඒත් ඒ දිහා බලන්න විදිහක් අපිට තිබ්බෙ නෑ. මොක වුණත් රයන් ඒ විදිහට හිටියනං ඒකෙ ලස්සනක් තියෙන්න ඇති කියල මට හිතුණා.

බාකුවා දඩිබිඩි ගාලා ආපහු එන සද්දෙ මං අහගෙන.

"මේ... දැක්කද බඩු...?" බාකුව බොහොම ආඩම්බරෙන් ගෙනාපුව පෙන්නන වග අපිට තේරුණා.

"බාකු... මොනවටද ඒව?" අනුරාග් ඇහුව. එතකොට අපිත් බෙල්ල හරවල ඒ දිහා බැලුව.

බාකුව අත් දෙකෙන්, බොහොම ආඩම්බරෙන් උස්සගෙන හිටියෙ හිස් කොකාකෝලා බෝතල් දෙකක්...!

"හිතන්න පුළුවන්ද මොකටද කියල...?" බාකුවා ඔජ වැඩුවෙ බෝතල් දෙක ටිලිං ටිලිං ගාල එකට වද්දන ගමන්. ඒ ගමන්ම මිනිහ ඒකෙන් කරන්න යන දේ අංග චලනයෙන් කරල පෙන්නන්න ඇති කියල මට හිතුණෙ වටේ හිටිය කට්ටියගෙ "ආහ්..." "ඕ... ඕ..." වගේ ප්‍රතිචාර හින්ද. බොඩි බිල්ඩර් කෙනෙක්ගෙ පෝස් එකෙන් හිටිය රයනුත් කට ඇරියෙ මිනිහටත් ඒක පෙනුණ නිසා වෙන්න ඕනෙ.

"එක්ස්කියුස් මී... මොනවද ඔයාල කරන්න යන්නෙ...?"

"ඇයි... උඹට පේන්නෙ නැද්ද කරන්න යන දේ?" බාකුව බෙරිහන් දුන්න. "අනික... උඹ කවුද අපෙන් ප්‍රශ්න අහන්න?"

"ප්ලීස්... එපා..." රයන්ගෙ කටහඬ උස් වුණා.

"කට වහපං." බාකු කෑ ගැහුව. තමන්ගෙ ආධිපත්‍යයට විරුද්ධව කතා කරපු ෆ්‍රෙෂා ගැන මිනිහ පුදුම වුණාට සැක නැහැ.

බාකුවා, මිනිහ අදහස් කරපු දේ කරන්න හදනකොටම නොහිතපු විදිහට මිනිහගෙ ඇඟට කඩාගෙන පැන්නෙ රයන්! රයන් කොකාකෝලා බෝතල් දෙක බාකුගෙ අතින් උදුර ගත්තෙ හරියට කව්බෝයි කෙනෙක් පිස්තෝල කේස් එකෙන් පිස්තෝලෙ එළියට ඇදල ගන්න තරමෙ වේගෙකින්. තත්පරයක් ගත වෙද්දි බෝතල් දෙක තිබ්බෙ රයන්ගෙ අතේ! රයන් බෝතල් දෙකෙන් බාකුගෙ කකුලෙ ඇඟිලිවලට චොරොප්ප පාරක් ඇදල ඇරපි. ඒ පාරෙන් බාකුව නටන්න පටන් ගත්තෙ හරියට ටැප් ඩාන්ස් එකක් දානව වගේ. ඌට යකා ආවේශ වෙලා තිබ්බෙ.

"අල්ල ගනිං ඕකව...!" බාකුව උඩ පනින ගමන් කෑ ගැහුවෙ පිස්සෙක් වගේ. බඩ අත ගගා හිටිය එකාට කිසිම සාමාන්‍ය බුද්ධියක් නම් තිබුණෙ නෑ, වටපිටාවෙ සිද්ධ වෙන දේවල් අවබෝධ කර ගන්න. ඒත් උගෙ කන් ඇහීමනං හොඳට තිබුණු බව තේරුණේ ඌ වහාම රයන්ව අල්ල ගන්න ඉදිරිපත් වීමෙන්. හරියටම ඒ වෙලාවෙදි තමයි රයන් මිනිහගෙ අතේ තිබ්බ කොකාකෝලා බෝතල් දෙක, ළඟ තිබ්බ තාප්ප කැල්ලට ගැහුවෙ. එතකොට රයන්ගෙ අතේ ඉතුරු වුණේ බෝතල් දෙකේ කරවල් විතරයි. ඒ දෙකම, පිහි දෙකක් වගේ උලට දිලිසුණා.

"වරෙල්ල..." රයන් කෑ ගැහුවෙ ඒ බෝතල් කොට දෙක, දෙපැත්තට වන වනා. රයන්ගෙ මූණ කොමඩු පළුවක් වගේ රතු වෙලා තිබ්බා. බාකුවයි, බඩ අත ගගා හිටිය එකයි රයන්ගෙ ළඟට එච්චර කිට්ටු වුණේ නෑ. මෙච්චර වෙලා පැත්තකට වෙලා වැඩි සද්දක් බද්දක් නැතුව හිටිය අනුරාග් කතා කරන්න ගත්තා.

"ඡ්... ඡ්... හැමෝම පොඩ්ඩක් කූල් ඩවුන් වෙනවද... මොකක්ද මේ වෙන්නෙ...? මොකක්ද ඔයාගෙ නම කිව්වෙ. ආහ්... රයන්.. ඔව් රයන්..." අනුරාග් කියවන්න ගත්තෙ වැඩේ සමථයකට පත් කරන්න හිතාගෙන වෙන්න ඕනේ. "රයන්... මොකද මේ...? ඕව ගණන් ගන්න එපා. මේක ෆන් එකට කරන වැඩක්නෙ..."

"ෆන්...? රෙද්දෙ ෆන් එක... මට මේක ෆන් එකක් නෙවෙයි. මෙතනින් මකබෑ වෙනවද... නැද්ද?" රයන් රත් වෙච්ච යකඩයක් වගේ.





ආලෝකයි, මායි මූණට මූණ බලා ගත්ත. රයන්ට තේරෙනවද මන්ද මිනිහ කරන, කියන දේ. මිනිහ අපිව කොකාකෝලා බෝතල්වලින් බේර ගත්තා තමයි. ඒත් සම්පූර්ණ කොකාකෝලා බෝතල්වලට වඩා කැඩිච්ච කොකාකෝලා බෝතල් භයානක වෙන්න පුළුවන්.

"මේ අහපං මචං..." අනුරාග් 'මචං ලෙවල්' එකට බැස්සා. ඒත් රයන් නෙවෙයි ඒකෙන් රැවටුණු බවක් පෙන්නුවෙ.

"බම්බු ගහනව... මෙතනින් මකබෑ වෙනවද නැද්ද...?" රයන්ගෙ පිපිරිල්ල නැවතුණේ නැහැ. ඒ පාර රයන් කොයි තරම් හයියෙන් බෙරිහන් දුන්නද කිව්වොත් ඒකෙ සද්දෙට බාකුවාවයි, බඩ අත ගාන්නයි පස්සට විසි වුණා. ඇත්තම කිව්වොත් ඒ වෙද්දිත් උන් දෙන්න හෙමින් ෂේප් වෙලා යන්න පසුබහිමිනුයි හිටියෙ! අනුරාග් ටිකක් වෙලා ගල් වෙලා ඉඳලා අපි දෙන්න දිහා බැලුව.

"තමුසෙලගෙ යාළුවට මූලග්ගාය නැති කරගන්න කියනව... නැත්තං දවසක තමුසෙලත් අමාරුවෙ වැටෙනව..." අනුරාග් කිව්ව.

ආලෝකයයි, මායි නැඟිටල අපේ ඇඳුම් ඇඳ ගත්ත.

"රයන්... තැන්ක්ස්... මට ජීවිතෙත් එපා වෙලයි හිටියෙ..." ආලෝකය කිව්වෙ මිනිහගෙ කණ්ණාඩිය ගලවල කඳුළු පිහල, හොටු හූරන ගමන්. අපේ වීරයා අපේ ඉස්සරහ ග්‍රීක පිළිමයක් වගේ හිටගෙන හිටියා.

මිනිස්සු, ඒ කිව්වෙ පිරිමි අඬන්න හොඳ නෑ කියල කියන්නෙ ඇයි කියල මට හොඳටම තේරුම් ගියේ ඒ වෙලාවෙ. ඇයි දන්නවද... ඒ දර්ශනය මාරම කැතයි!! කණ්ණාඩි ආපු ආලෝකයගෙ මූණ කොහොමටත් අවුල්. ඒ මදිවට උගෙ ඇස් බබෙක්ගෙ වගේ... ඒවයෙ කඳුළුත් පිරිල... ඒව දකින කෙනෙකුට දිවි නහගන්න තරම් කලකිරීමක් ආවොත්, ඒකෙ කිසිම පුදුමයක් නෑ!

"ඔව් රයන්... තැන්ක් යූ... ඔයා මාර රිස්ක් එකක් තමයි ගත්තෙ..." මාත් අපේ වීරයට ස්තුති කරන්න වුණා. අර බාකුවා

කියන එකානං මානසික ලෙඩෙක් මං හිතන්නෙ. ඔයා හිතන්නෙ උන් ආයෙ අපිට මොනව හරි කරාවිද...?" මං ඇහුවෙ, සිද්ද වෙච්ච කිසි දේකින් මම කැලඹිලා නැතිය... මං ඒ වගේ කලබල වෙන, බයවෙන එකෙක් නෙවේය කියල පෙන්නන්න උත්සාහ කරන ගමන්. හැබැයි ඇත්ත කතාව උනේ ඒක නෙවෙයි. මාත් හිටියෙ දණිස් පොල්කටු දෙක එකට වැදෙන ගාණට බය වෙලා!

"කවුද දන්නෙ...? සමහර විට කරයි..." රයන් කිව්වෙ කිසි ගාණක් නැතුව. "ගැන්සි ගැහුණම කවුරු මොනව කරයිද කියල කාටවත් කියන්න බෑ. එතකොට වෙනස්ම මානසික තත්ත්වෙකනෙ පොරවල් ඉන්නෙ..." රයන් අත් කරකව කරකව පොඩියට එක්සයිස් පාරක් දාන ගමන් කිව්ව. "මං බෝඩිං හවුස්වල ඕනෙ තරම් ඉඳල තියෙන නිසා ඔය වගේ එවුන් ගැන මං හොඳට දන්නව..."

රයන්ගෙ සැහැල්ලු, ඒත් එඩිතර විලාසෙ නිසාම අපි තුන්දෙනාට එකට සෙට් වෙන්න මහ වෙලාවක් ගියේ නෑ. අනික අපි තුන්දෙනාම එකම අංශෙ...! කතාවක් තියෙනව පළවෙනිම දවසෙ, එකට නිදා ගන්න මිනිස්සු එක්ක සම්බන්ධකම් දිගට ගෙනියන්න එපා කියල (විශේෂයෙන් ඒක අදාළ ගෑනුන්ට). අපි තුන්දෙනා එකට නිදා ගත්තෙ නැති එක ඇත්ත. ඒත් ඇත්තටම බැලුවොත් අපිව හම්බවුණේ, අපි මුණ ගැහුණෙ තුන්දෙනාම ඇඳුම් නැතුව හිටිය වෙලාවකදි!! එආයින් ඇතිවුණ ඒ බැඳීම හින්ද අපි තුන්දෙනා එකට ඇලුණෙ හරියට සුපර් ග්ලූ ආල වගේ!

★

"M-A-C-H-I-N-E" තඩි පොල් අකුරුවලින් බ්ලැක් බෝඩ් එකේ ලියල තිබ්බ. අපි දේශන ශාලාවට ඇතුළු වුණා. ඒක හරියට ග්‍රීක රඟමඬලක් වගේ. එක එක පත්‍රිකා අපේ අත්වල පිරිල තිබ්බ. අපේ ලෙක්චරයා බ්ලැක් බෝඩ් එක ළඟ පුටුවෙ පිම්බිච්ච පොල් කුරුම්බියෙක් වගේ වාඩිවෙලා හිටිය. මිනිහ අමුතු බැල්මකින් පන්තිය දිහා බල බලා හිටියෙ අපි වාඩිවෙලා අපේ ෂා... ෂූ... සද්ද





ඉවර වෙනකල්. සාමාන්‍යයෙන් වෙන්නෙ එහෙමනෙ. පන්තියට ඇවිල්ල ඉන්න සර් හරි ලෙක්චරර් හරි මුකුත් නොකියා, උකුසු බැල්මෙන් පන්තියෙ වරෝබරෝව දිහා බලා ඉඳිද්දි ටික වෙලාවකින් පන්තියම නිස්සද්ද වෙනව. ඒක පිළිගත්ත සත්‍යයක්.

මිනිහට අවුරුදු හතළිස් ගාණක් ඇති. කෙස් ඉදිලා... ඒව පොල්තෙල්වලින් පොඟවලද කොහෙද මාර විදිහට දිලිසුණා. ඇඳල හිටිය ළා නිල්පාට ෂර්ට් එකේ සාක්කුවේ පෑන් තුනක් ගහල තිබ්බ. ඒ ළඟින්ම චෝක් කෑලි තුනකුත් ගාණට අඩුක් කරල තිබ්බෙ බුලට් තුනක් වගේ.

"හැමෝටම ආයුබෝවන්... මං ප්‍රොෆෙසර් ඩුබේ... මැකැනිකල් ඉංජිනියරිං ඩිපාර්ට්මන්ට්... හරිය...? මේ තමුන්ලගෙ පළවෙනි දවස... හරිය...? තමුන්ලට හිතෙනවද තමුන්ල විශේෂයි කියල...?" ප්‍රොපා ඇහුවෙ එකම ස්වරයකින්.

පන්තිය මීක් නෑ. අපි ගත්තු පත්‍රිකා කියවන්නයි අපි පෙලඹිලා හිටියෙ. ප්‍රොෆෙසර් කරන පාඨමාලාව වුණේ Manufacturing Processes... ඒක ෆොගඩක් තැන්වලදි කෙටියෙන් හඳුන්වල තිබ්බෙ MANPRO කියල. පාඨමාලාවෙ අන්තර්ගතය, සිලබස් එක අපේ අත්වල රැඳුණු පත්‍රිකාවල සටහන් කරල තිබ්බ. ඇත්තටම බැලුවොත් නිෂ්පාදනවල මූලික තාක්ෂණික ක්‍රම තමයි ඒකට ඇතුළත් වෙලා තිබ්බෙ. වෑල්ඩිං වැඩ, මැෂින්වලින් කෙරෙන වැඩ, කාස්ටිං, බෙන්ඩිං, ෂේපිං... ඔය වගේ. ඒත් එක්කම පත්‍රිකාවල සඳහන් වෙලා තිබ්බ ලකුණු දෙන පිළිවෙළ. ඒ මෙහෙමයි.

Majors - 40%
Minors - 20%
Practicals - 20%
Assignments (6-8) and Surprise Quizzes (3-4) 20%

තමන්ගෙ සුබ පැතීමටයි, කතාවටයි පන්තියෙන් ලැබුණු ඇල්මැරුණු ප්‍රතිචාරෙ හින්දද කොහෙද ප්‍රොෆෙසර් ඩුබේ අලුත් ප්‍රාණවත්කමක් කටහඬට ආරූඪ කර ගත්ත.

"ඕව පස්සෙ බලාගත්තැකි... ඒව ගැන කරදර වෙන්න එපා. හැම කෝස් එකකටම ඒවයෙ විස්තර තියෙන ලීෆ්ලට් තමුන්ලට ලැබෙයි... දැන් ඕව පැත්තකින් තියනවල... හරිය...?"

එහෙම කියන ගමන් මිනිහ නැගිටල බ්ලැක් බෝඩ් එක ළඟටම ගියා. සාක්කුවට අත දාලා බොහොම සීරුවට, හරියට ත්‍රස්තවාදියෙක් අත් බෝම්බයක් ගන්නව වගේම සීරුවට, චෝක් කෑල්ලක් එළියට අරන්, බ්ලැක් බෝඩ් එකේ ලියල තිබ්බ Machine කියන වචනෙ යටින් ගැහුව තනි කෙළින් ඉරි හයක් විතර! ඊට පස්සෙ හැරුණ අපි දිහාවට.

"මැෂින්... ඕනෙම මැකැනිකල් ඉංජිනියර් කෙනෙක්ගෙ පැවැත්ම තීරණය වෙන්නෙ මේං මේ කියන 'මැෂින්' මත... තමුන්ලා ඉගෙන ගන්න හැම දේමත් සම්බන්ධ වෙන්නෙ ඒකට... දැන් කාට හරි කියන්න පුළුවන්ද මැෂින් එකක් කියන්නෙ මොකක්ද කියල...?"

පන්තිය හෝම්පොළක් වුණා. මීක් සද්දක් නෑ. අපේ පළවෙනි පාඩම - නිශ්ශබ්දතාවේ විවිධ පරාසයන් අත්දැකීම!

"නැද්ද කවුරුවත් ඒක දන්න කෙනෙක්?" ප්‍රොෆෙසර් ඩුබේ ඇහුවෙ පන්තියෙ පේළි අතරෙ ඇවිදින ගමන්. මේ වගේ වෙලාවලදි අපි... ශිෂ්‍යයො දන්නව කරන්න ඕන දේ. මුලින්ම අපි පරිස්සම් වෙන්න ඕනෙ ගුරුවරයට හරි ප්‍රොෆෙසර්ට හරි ඇහැට ඇහැ නොදී ඉන්න. ඇහැට ඇහැ ගැහුණොත් ඉතින් විනාස බාවං තමා! ඒ හින්ද අපි හැමෝම ලෝකෙ අලුත්ම සිද්ධාන්තයක් හොයා ගන්න උත්සාහ කරනව වගේ බර කල්පනාවල්වල යෙදිලා හිටියෙ ප්‍රොෆෙසර්ට ඇහැට ඇහැ නොදී. මං හොරෙන් වටපිට බැලුවා. අපේ මුළු බැච් එකේම තුන්සීයක් විතර ඇති. එයින් හැත්තෑවක් තරම මේ පන්තියෙ හිටිය. ඒ වෙලාවෙ තමයි මගෙ ඇහැ ගියේ ඉස්සරහ පේළියෙ හිටිය ගොබ්ලෙකුට! පොර නිකං වීර සිංහයෙක් වගේ ප්‍රොෆෙසර් දිහාම බලන් ඉන්නව මං දැක්ක. නිකම්මත් නෙවෙයි. ඔළුව හොලෝ හොලෝ, කට ඇරගෙන. බොහොම හැදිච්ච පෙනුමක් තමයි පොරට තිබ්බෙ. මං උගෙ දිහා බලන් ඉන්න අතරෙ තමන්ගෙ පළවෙනි ගොදුර හැටියට ප්‍රොෆෙසර් මාව තෝර ගත්ත.





"ඔයා කියනව බලන්න..."

එතකොට තමා මං පියවි ලෝකෙට ආවෙ. දිව බොග් බොග් ගාන්න ගත්ත. මුළු ඇඟම හීතල වුණා. ඉතාම හීනි නහරවලට පවා ලේ පොම්ප වෙනව දැනුණ. නාහෙ උඩ ආඩිය බිංදු තුනක් විතර දැම්ම. මං, ප්‍රොෆෙසර් කතා කළේ මට නෙවෙයි වගේ ඉන්න හැදුව.

"අයිසෙ... මං තමුසෙටයි කතා කරන්නෙ..." ප්‍රොෆෙසරය සපත්තු අඩියෙ ඇලුණු චුයිංගම් එකක් වගේ මගෙ පස්සෙම ආව.

මට මොනවත්ම කියවුණේ නෑ. මාව නිකං කරකෝල අත ඇරිය වගේ වුණා. මට ඕන්නං ඔහේ මොකක් හරි උත්තරයක් කනාපොල්ලෙන් ගහන්නා වගේ කියන්න තිබ්බ. ඒත් නැත්තං ඕනෙ කුදයක් කියල "මං දන්නෑ" කියල කියන්න තිබ්බ. ඒත් ඒ එකක්වත් කියවුණේ නෑ. මගේ කටේ පාස්වර්ඩ් එක නැතිවෙලා තිබ්බ!

"හුහ්... මෙහෙමත් ලෝකයක්..." ප්‍රොෆෙසර් දිග හුස්මක් හෙළුව. මිනිහ මාව අත ඇරල වෙන එකෙක්ව අල්ල ගත්ත.

"ඔය කොටු කොටු ෂර්ට් එක ඇඳල ඉන්න එක්කෙනා... ඔව්... ඔයා තමයි. මොකක්ද ඔයාට කියන්න තියෙන්නෙ?"

කොටු කොටු ෂර්ට් එක ඇඳපු එකා මෙච්චර වෙලා හිටියෙ, පොතටම මූණ පාත් කරගෙන, මෙලෝ සිහියක් නැතුව මොනවද ලිය ලියා. හැබැයි, ඌ එහෙම කර කර හිටියෙ ප්‍රොෆෙසර්ගෙ ඇස්වලින් ගැලවෙන්න බව මට රහසක් වුණේ නෑ. ඒත් උගෙ උත්සාහයෙන් වැඩක් වුණේ නෑ!

"සර්... මැෂින්... සර්... ඒ කිව්වෙ ඒක ලොකු කෑල්ලක්... හරියට ලොකු ගියර් වගේ... ලොකු කෑල්ලක පොඩි කෑල්ලක් වෙන්නත් පුළුවන්..." කොටු කොටු ෂර්ට් පොර අග මුල නැති අණ්ඩර දෙමළයක් කියවන්න පුණා.

"මොකක්??" ප්‍රොෆෙසර් ධූබේ කිව්ව. "අනේ දෙයියනේ අයි.අයි.ටී. එකට දෙයියන්ගෙම පිහිටයි... අවුරුද්දෙන් අවුරුද්ද මේකෙ තත්ත්වෙ බල්ලට යන එකයි වෙන්නෙ..." ප්‍රොෆෙසර් කම්පා වුණා. "මේකට ඇතුළු කරගන්න සිස්ටම් එක මීට වඩා ටෆ් කරන්න ඕනෙ කියල මං කොච්චරනං කිව්වද...!" මිනිහ තනියම කියවන්න ගත්තෙ ඔළුව දෙපැත්තට වන වනා. "ඒ ඔළුව ඇතුළෙ මේ ග්‍රහලෝකවල තියෙන සියලුම දැනුම ගබඩා වෙලා ඇති... ඔව්... මැෂින් ගැනත් එක්කම..." මට හිතුණ.

"ඒ කියන්නෙ, මේකට තෝර ගන්න ඕනෙ දාහකින් එකෙක් කියලද මිනිහ කියන්නෙ?" රයන් මගේ කනට කෙඳිරුව.

"ෂ්... ෂ්... ෂ්..." අපේ කනුකුනුව ඇහිල ප්‍රොෆෙසර් පිම්බා. මිනිහ අපි තුන්දෙනා දිහා දරුණු බැල්මක් හෙළුව. පස්සෙ මිනිහම උත්තරේ කියන්න ගත්ත.

"මැෂින් එකක් කියන්නෙ..." මිනිහ ආඩම්බර බැල්මක් මුළු පන්තියටම හෙළුවා. "බොහොම සරල අර්ථ දැක්වීමකින් විස්තර කරන්න පුළුවන් දෙයක්... හරිය...? මිනිසුන්ගේ ශ්‍රමය අඩු කිරීමට උපකාරී වන්නේ කුමක්ද... එය මැෂින් එකකි." මිනිහ ලිඛිත භාෂාවෙන් කතා කරන්න ගත්ත.

"හරිය...? දැන් තමුන්ලා බලනව තමුන්ලගෙ ජීවිතවල වටපිටාව... දැන් තමුන්ලට තේරෙයි ඒ වටපිටාව මැෂින්වලින් පිරිල තියෙන බව..."

"මිනිස් ශ්‍රමය අඩු කිරීමට උපකාරී වන්නේ කුමක්ද? එය..." මං හිත ඇතුළෙන් කියවන්න ගත්ත. "ෂුඃ... මාර සිම්පල් කතාවක්නෙ! ඇයි අපිට මේක මෙච්චර කලක් නොතේරුණේ." මං හිතුව.

"අති විශාල වානේ කම්මල්වල ඉඳල ඉතාම සරල උපකරණයක් වෙන කොස්ස දක්වා තියෙන හැම දෙයක්ම වගේ මිනිහා විසින් හොයාගෙන තියෙන්නෙ අඩු මහන්සියකින් යම් වැඩක් කර ගන්නට ඕනෙ උපකරණ විදිහට... මැෂින් විදිහට... හරිය...?" ප්‍රොෆෙසර් කියාගෙන යන්න ගත්තෙ ඒ හැම එකකටම





වගකියන්න ඕනෙ එයාය කියන්නා වගේ ආඩම්බරේකින්. වටපිට බැලුව ප්‍රොෆෙසර්ට පෙනුණෙ, එයාගෙ සරල අර්ථ දැක්වීමෙන් වශී වෙලා ඉන්න පන්තිය!

"ප්ලේන් එක...?" ඉස්සරහ පේළියෙ එකෙක් ප්‍රශ්න කළා.

"මැෂින්..." ප්‍රොෆෙසර් කිව්ව.

"ස්ටෙප්ලර්?" තව එකෙක් ඇහුව.

"මැෂින්..." ප්‍රොෆෙසර් කිව්ව.

මාරයිනෙ! පන්තියෙ එවුන් එක එක උදාහරණ අහන්න ගත්ත. හැඳි, කාර්, බ්ලෙන්ඩර්, පිහි, පුටු... ඒ හැම එකකටම තිබුණෙ එකම අර්ථ දැක්වීම! එකම උත්තරේ!! ඒකත් මැෂින් එකක්!!

"බලන්න වටපිට ඔයාලගෙ... ඒ තියෙන දේවල්වලට ආදරේ කරන්න පටන් ගන්න..." ප්‍රොෆෙසර් ධූබේ හිනාවුණා. පළවෙනි වතාවට! "එතකොට ඔයාලටත් පුළුවන් මැෂින් ගැන විසාරදයෝ වෙන්න."

ප්‍රොෆෙසර් ධූබේගේ මූණේ මෙච්චර වෙලා තිබ්බ්ච මුස්පේන්තු ගතිය අන්තර්ධාන වෙලා, ඒ මූණට හිනාවක් ආව එක ගැන මුළු පන්තියම හිටියෙ හරිම පිබිදීමකින්.

"සර්..." අපේ වීරයා... රයන් ප්‍රශ්නයක් මතු කරන්න වුණා. "සර් එතකොට ජිම් එකක තියෙන මැෂින්? අපි හිතමු බෙන්ච් ප්‍රෙස් එක වගේ එකක්...?"

"ඉතින්... මොකක්ද ප්‍රශ්නෙ...?" ප්‍රොෆෙසර්ගෙ මූණෙන් හිනාව පැනල යන්න ලෑස්ති වුණා.

"සර් ඒව මිනිස් ශ්‍රමය අඩු කරන්නෑනෙ සර්... ඇත්තටම බැලුවොත් ඒවයින් වෙන්නෙ මිනිස් ශ්‍රමය වැඩි කරන එකනෙ..." රයන් බෝම්බයක් දැම්ම.

පන්තියම ආයෙත් මීක් සද්දක් නැති තැනක් වුණා.

"හරි... ඒත් මං අදහස් කළේ..." ප්‍රොෆෙසර් ධූබේ පරිස්සමින් වචන තේරුව.

'අඩේ... රයන්ගෙ කතාවෙ මාර පොයින්ට් එකක් තියෙනවා...' මට හිතුණා.

"මං හිතන්නෙ සමහරවිට අපේ අර්ථ දැක්වීම සරල වැඩි ඇති..." රයන් කිව්වෙ ප්‍රොෆෙසර්ට උදව්වක් කරන අදහසින් වෙන්න ඕනෙ. ඒත් වුණේ වෙනින් දෙයක්.

"මොකක්ද ඔයා කියන්න හදන්නෙ? මං වැරදියි කියලද?" ප්‍රොෆෙසර් ඇහුවෙ මූණ නොරොක් කරගෙන, තොල් තද කරගෙන අපේ ළඟට එන ගමන්.

"නෑ සර්... මං මේ කිව්වෙ..."

"කට තිබ්බ පළියට කතා කරන්න එපා මගෙ පන්තිවලදි... හරිය...?" ප්‍රොෆෙසර් කිව්වෙ එච්චරයි. ඒක කියල එයා ආපහු හැරිල පන්තිය ඉස්සරහට ගියා.

"ඇති... ඇති... අනම්මනංවලින් වැඩක් නෑ... අපි මැන්ප්‍රෝවලට අවධානෙ යොමු කරමු..." ප්‍රොෆෙසර් ඩුබේ කිව්වෙ බ්ලැක්බෝඩ් එකේ ලියපු Machine කියන වචනෙයි, ඒක යටින් ගහපු ඉරි හයයි මකන ගමන්.

"මගෙ පාඨමාලාව ඉතාම වැදගත්... මං දන්නව අනික් ප්‍රොෆෙසර්ලත් එයාලගෙ කෝර්සස්වල තියෙන වැදගත්කම කියාවි. ඒත් මං විශේෂ අවධානයක් යොමු කරනව මැන්ප්‍රෝවලට. ඒ නිසා කිසිම ක්ලාස් එකක් මිස් කරගන්න ලෑස්ති වෙන්න එපා. හරිය...? එසයින්මන්ට්ස් වෙලාවට කරල බාර දෙන්න ඕනෙ... හැම තිස්සෙම ලෑස්ති පිට ඉන්න ඕනෙ... මං කොයි වෙලාවෙ කොතනින් ප්‍රශ්නයක් අහවිද කියලා කියන්න බෑ. හරිය...?"

ඊට පස්සෙ මිනිහ යකඩ වාත්තු කිරීම ගැන පැයක විතර ලෙක්චර් එකක් දුන්න. යකඩ උණු කරන හැටි, ඒවා වැලි අච්චුවලට දාන හැටි. ඒවා වාත්තු කරන හැටි වගේ විස්තර තමයි ඒ පැයේදි එයා ඉගැන්නුවෙ.

"අදට ඔය ඇති... තමුන් මෙහෙ ගත කරන කාලෙ සාර්ථක වේවා කියල මං ප්‍රාර්ථනා කරනව. ඒ වගේම මේං මේ ටිකත්





මතක තියා ගන්න එක හොඳයි. ඔයාලගෙ ඩිපාර්ට්මන්ට් හෙඩ්... ප්‍රොෆෙසර් චෙරියන් කියන විදිහට ඔයාලට ඔළුව උස්සන්න බැරි තරම් වැඩ ගොඩක් තියෙනව. ටෙස්ට්වලින් එසයින්මන්ට්ස්වලින් තමයි ඔයාලව ග්‍රේඩ් කරන්නෙ... හරිය...? සවුත්තු ග්‍රේඩ් එකක් ලැබුණොත්, ඒකෙ තේරුම ඔයාලගෙ මුළු අනාගතේම ඉවරයි කියන එකයි. රස්සාවල් නෑ... අනාගතයක් නෑ... හරිය...? ඒ වගේම තමා හරියට කළොත් මුළු ලෝකෙම ඔයාලගෙ අතේ... හරිය...? ඒ ලෝකෙ ඔයාලගෙ ඇඟිලි අස්සෙන් ලිස්සල යවන්න එපා... ඒක ගියොත් ගියා තමයි. හරිය...?"

ඒක කියන ගමන් ප්‍රොෆෙසර් බ්ලැක්බෝඩ් එක මකපු ඩස්ටර් එක එයාගෙ මේසෙ උඩට වේගයෙන් පහත් කළා. ප්‍රොෆෙසර්ගෙ අනතුරු ඇඟවීම නිසා අපි හැමෝගෙම කොඳුඇට දිගේ හීතලක් දුවන්න ගත්ත. චෝක් වලාකුළ අතරෙන් නොපෙනී ගිය ප්‍රොෆෙසර්ගෙ රූපෙ අපේ හිත්වල උපද්දපු බය වැඩි කළා.

# 2

# ටර්මිනේටර්

විනෝදෙන් ඉන්නවනං කාලෙ පියාඹනව කියලනෙ කියන්නෙ. අපේ පළවෙනි සෙමෙස්ටර් එක ගත්තහම ඒකෙ තිබ්බ කෝර්ස්ම හයක්. එයින් හතරක් ප්‍රැක්ටිකල් ක්ලාසුත් එක්ක! මෙලෝ රහක් නෑ. ෆන් එකක්, විනෝදයක් පේන මානෙක තිබ්බෙ නෑ. හැමදාම උදේ අටේ ඉඳල පහ වෙනකල් තට්ටු අටේ බිල්ඩිමක හිරවෙලා හිටිය. නිකම්මත් නෙවෙයි ලෙක්චරස්ලයි, ටියුට්සුයි, ලැබ්ස් ගණනාවකුයි එක්ක. පහෙන් පස්සෙ? ඒත් ඉතින් වැඩි වෙනසක් තිබ්බෙ නෑ. ඊට පස්සෙ ලයිබ්‍රරියට රිංග ගන්නව. නැත්තං කාමරේට කුඩු වෙනව. ඒ කරල, දීල තියෙන එසයින්මන්ට්ස්, රිපෝට්ස් හදනව. ඕව ඔක්කොම කරන්න තිබ්බෙ ටෙස්ට් එකක් එහෙමත් නැතුව! ටෙස්ට් තියනවයි කියල කිව්වෙ මේ විදියට. හැම විෂයකටම පොඩි ටෙස්ට් දෙකක් තියෙනවලු. ලොකු ටෙස්ට් එකක් තියෙනවලු. තව... සර්ප්‍රයිස් ප්‍රශ්න තුනක් තියෙනවලු... ඒ කිව්වෙ එක සබ්ජෙක්ට් එකකට ටෙස්ට් හතයි. එතකොට කෝර්සස්, එහෙමත් නැත්තං සබ්ජෙක්ට් හයට, 7 × 6 = 42යි! ටෙස්ට් 42යි!! හොඳ වෙලාවට අපේ ලෙක්චරර්ස්ලා 'සර්ප්‍රයිස් ප්‍රශ්න ටික' මුල් මාසෙදි අහන්න තීරණේ කරල තිබ්බා. රැග් සීසන් එකෙන් පස්සෙ තමයි එයාල ඒකට සැලසුම් කරගෙන තිබුණයි කියන්නෙ. දැන් ඉතින් රැග් සීසන් එකත් ඉවර නිසා ඒ මරාලෙ කොයි වෙලාවක හරි ඔළුවට කඩාගෙන වැටෙන්න තියෙන බව අපි දැනගෙන හිටිය. හැම ක්ලාස් එකකටම ආපු ලෙක්චරර්ස්ලට





අපි හොඳට ඇන්ටනාව දාගෙනයි හිටියෙ. මොකද එයාල ඊළඟ පන්තියෙදි අහන්න පුළුවන්ය කියල හිතෙන ප්‍රශ්න ගැන පොඩි පොඩි හින්ට් දෙන නිසා.

ඔය අච්චස්සෙදි මං රයනුයි, ආලෝකයි එක්ක මාරෙට ෆිට් වුණා. අපි අපේ ගෙවල්වල විස්තරත් හුවමාරු කර ගත්තෙ බොහොම නිර්ලෝභී විදිහට. රයන්ලා සැහෙන බරකාරයො! මිනිහගෙ තාත්තා බිස්නස්කාරයෙක්. යුරෝපෙ මාකට් කීපයකටම මැටි මල් පෝච්චි සපයන්න එයාලට අවස්ථාව ලැබිල තිබ්බ. තාත්තා විතරක් නෙවෙයි, රයන්ගෙ අම්මත් ඒකට බැහැලම වැඩ කරනවලු. ඒ හින්ද නිතරම වගේ එයාගේ අම්මයි, තාත්තයි පිටරට! මිනිහට ටෙක් එකේම බෝඩිං වෙන්නත් සිද්ධ වෙලා තියෙන්නෙ ඒකයි. ආ... එයාල මිසෝරිවලින්... කඳුකරයේ සිටුවරයෙක්ගෙ පුතෙක්...!

ආලෝකයා ගැන මට වැල්වටාරම් තොගයක් ලියාගෙන ගිහින් අන්තිමට බොහොම සියුම් විදිහට මිනිහගෙ තත්ත්වෙ එළිකරන්නත් පුළුවන්. ඒත් එච්චර ආරලු බූරලු නැතුව බොහොම සරල විදිහට කිව්වොත්... (මෙහෙම කියන්නෙ මිනිහට කිසිම විදිහකින් අපහාස කරන්නනං නෙවෙයි.) එයාල දුප්පත්...! (ඒක ඉතින් අපහාසයක් හරි අපහාසෙකට කාරණාවක් හරි නෙවෙයිනෙ!) එයාලගෙ පවුලෙ හම්බ කළේ අම්මා විතරයි. ඉස්කෝලෙක ගුරුවරියක්. එයාගෙ පඩියෙන් භාගයක්ම යන්නෙ තාත්තගෙ බේත් හේත්වලට කියලයි ආලෝකයා කිව්වෙ. ඒ මදිවට ආලෝකයගෙ අක්කා, ඉන්දියාවෙ විදිහට කිව්වොත්, "දෙමවුපියන්ගෙ ඇඟ හීතල කරන" කාලෙට ඇවිල්ල හිටියා. ඒ කිව්වෙ කසාද බඳින කාලෙට පා තබමින් හිටියා. ආලෝකයගෙ දිහා බැලුවම මිනිහගෙ අක්ක රූප සුන්දරියක් වෙන්න බැරි බව ඕන මොට්ටයෙකුට තේරෙනව. ඔන්න, කෙල්ල ලස්සන වුණානං දැවැද්දට ඒ හැටි ගාණක් නොදී ෂේප් වෙන්න තිබ්බ. එහෙව් බරපතළ තත්ත්වෙක තමයි ආලෝකයගෙ පවුල තිබ්බෙ.

මං අපේ බිල්ඩිමේ විතරක් නෙවෙයි, ඊට අල්ලපු බිල්ඩිමේ පොරවල් එක්කත් සෙට් වෙලයි හිටියෙ. එහෙමයි කියල මං

ඒ හැමෝවම ළඟින් ආස්සරේ කරන්න ගියේ නෑ. කුමාඕන් බිල්ඩිමේ එවුං එක්ක ළඟ ආස්සරයක් තිබ්බ. තව ෂුක්වින්ඩර් කියන එකා එක්කත් තරමක ආස්සරයක් තිබ්බා. තව එකෙක් හිටියා වෙන්කත් කියල. මිනිහ මුළු කාමරේම ජනෙල්වලට කළු කොළ අලවගෙන, කාමරේටම රිංගගෙන ගොළුබෙල්ලෙක් වගේ හිටිය එකෙක්. තව එකෙක් හිටිය 'කසානා රාජු' කියල. මිනිහගෙ නියම නම රාජේශ්. ඒත් මිනිහ හැම තිස්සෙම ඇගේ කොතන හරි කස කසා හිටිය නිසා, (සමහර වෙලාවට බොහොම රහසිගත තැන් පවා) තමයි 'කසානා රාජු' කියන නම වැටිල තිබ්බෙ. අපිට අනික් පැත්තෙන් තිබ්බ බිල්ඩිමේ තමයි අපේ 'සීනියර් උත්තමයො' ටික බාකූ, අනුරාග් වගේ 'සත්තු' ටික වාසය කළේ!

ගොඩක් වෙලාවට හැන්දෑවලදි මායි, ආලෝකයයි, රයනුයි තමයි පාඩම් කරන්න සෙට් වුණේ. එදා අපි මගෙ කාමරේදි සෙට් වෙලා කතා කළේ අපිට දීල තිබ්බ ෆිසික්ස් එසයින්මන්ට් එකක ඩෙඩ් ලයින් එක ගැන නොහොත් මළ ඉර ගැන!

"රෙද්ද..." රයන් කිව්වෙ මගෙ කාමරේ තියෙන හාන්සි පුටුවෙන් නැගිටලා අත් දෙක දෙපැත්තට කරලා ඇගේ හිරි අරින ගමන්.

"මොන මඟුලක්ද... පන්ති... පන්ති... එසයින්මන්ට්ස්... ආයි පන්ති... ආයෙ එසයින්මන්ට්ස්... ඒ මදිවට සර්ප්‍රයිස් ක්විස්... හඃ... මේකත් ජීවිතයක්ද ආ...?"

ආලෝකයා හිටියෙ මේසෙ ළඟ වාඩි වෙලා. මිනිහගෙ සම්පූර්ණ අවධානෙ යොමු වෙලා තිබ්බෙ ෆිසික්ස් එසයින්මන්ට් එකට. පෑන තදට අල්ලගෙන. මිනිහ ලිය ලියාහිටිය කොළේ ප්‍රතිබිම්බෙ මිනිහගේ බෝතල් අඩි කණ්ණාඩියෙන් පෙනුණ.

"මොකක්...?" ආලෝකයා ඔළුව ඉස්සුවෙ රයන් කියපු දේ ඇහිල.

"මං අහන්නෙ, මේකද ජීවිතේ...? මේකත් ජීවිතයක්ද...?" ඒ පාර රයන් ඇහුවෙ මගෙ දිහා බලල.





මං වාඩිවෙලා හිටියෙ ඇඳ උඩ. එරමිණිය ගොතාගෙන. මං එසයින්මන්ට් එක කර කර හිටියෙ ඇඳ උඩ ආර්ට් බෝඩ් එකක් තියාගෙන. කොහොමටත් ඒ වෙද්දි මාත් හිටියෙ ඒ වැඩේ ඇති වෙලා. ටික වෙලාවකට හරි වැඩේ නවත්තන්න මටත් ඕනෙ වෙලා තිබ්බ. මං මගේ පෑන පැත්තකින් තිබ්බ.

"ඒකට ජීවිතේ කියල කියන්න බැරිනං වෙන ඕන ලබ්බක් වෙද්දෙන්..." මං කිව්වෙ ඇනුමකට කිට්ටු ස්වරයෙන්. "ඒත් ඒකෙන් මේ මොකුත් වෙනස් වෙන්නෙනං නෑ..."

"මේක හිරගෙයක්නෙ... ඔව්... මේක හිරගෙදරක්ම තමා..." රයන් මිට මොළවල දුන්න බිත්තියට පාරක්. කොහොමටත් පතුරු ගිහිල්ල තිබ්බ බිත්තියෙ තවත් පතුරක් ගැලවුණා.

"මං හිතන්නෙ ඔයාට අමතක වෙලා වගෙයි ඔයා ඉන්නෙ අයි.අයි.ටී. එකේ කියල. මුළු ඉන්දියාවෙන්ම තියෙන හොඳම කැම්පස් එකේය කියල..." ආලෝක් ඇඟිලිවල ඇට කැඩුව.

"ඉතිං? එහෙමයි කියල ඉගෙන ගන්න එවුන්ව හිරේකට දැම්මම හරියනවද?" රයන් ඉණට අත්දෙක ගහගෙන ඇහුව.

"නෑ... ඒත් මේවයෙ මොකක් හරි තත්ත්වයක් තියෙන්න එපායැ. එහෙම නැතුව මේව තෝසෙ කඩ වගේ කරගෙන යන්න බෑනේ..." ආලෝකයත් ඇඟපතේ හිරි අරින ගමන් කිව්ව.

"ඉතින් මේකෙ එහෙම තත්ත්වයක් තියෙනවද? අපි නිකං පිස්සො රැළක් වගේ නිදිමරාගෙන එසයින්මන්ට්ස් කරනව. ඊයෙ මැන්ප්‍රෝ... ඊට ඉස්සෙල්ල ඇප් මෙක්... අද ක්වන්ටෝ... මේකෙ ඉවරයක් නෑනෙ..." රයන් මැසිවිලි කිව්වෙ එක එක කෝර්සස් ගැන සඳහන් කරන ගමන්. "මටනං මේක ඇති වෙලා... මොකෝ කියන්නෙ යමුද ෆිල්ම් එකක් බලන්න...?"

"එතකොට එසයින්මන්ට්ස්?" ආලෝකය ඇහුවෙ එක දිගට ඇහිපිය ගගහ.

"ප්‍රියා එකේ දාල තියෙනව ටර්මිනේටර්..." රයන් පෝර දැම්ම.

"එතකොට අපි නිදා ගන්නෙ කීයටද?" ආලෝකය, ප්‍රශ්න පත්තරයක් වුණා.

"අනේ තොත්ත බබා... බලාගෙන නින්ද මදිවෙයි..." රයන් කිව්ව.

"මං එනව..." මම කිව්වෙ ආර්ට් බෝඩ් එක පැත්තකින් තියන ගමන්. "ආලෝක්... යං... මේක පස්සෙ කරමු..." මං මිනිහට කිව්ව.

"අපි එද්දි පරක්කු වෙයිනෙ..." ආලෝකය මඩේ හිටෝප්පු ඉන්නක් වුණා.

මං නැගිටල ආලෝකයගෙ පෑන අරන් පෙට්ටියට දැම්ම. හරියට පොඩි කාලෙදි පොඩි එවුන් කරනව වගේ!

"නැගිටිනව ඉතිං..." ආලෝකයට කියද්දි තමයි මං දැක්කෙ මිනිහගෙ පෙට්ටියෙ පින්සල් දෙකක් තියෙනව! පින්සල් මොකටද මූට?

"ඒයි... මොකටද මේ පේන්ට් බ්‍රෂ් තියාගෙන ඉන්නෙ?" මං ඇහුව.

"නිකං..." ආලෝකය බොග් බොග් ගාන්න ගත්ත.

මං බ්‍රෂ් එකක් අරන්, අවකාශෙ මනඃකල්පිත ආරුක්කු අඳින්න ගත්ත. "නිකං...? නිකං මොකටද? මොකෝ ෆිසික්ස් ඩයග්‍රම්ස් පාට කරන්නද...?" මගෙ විහිළුවට හිනා වුණේ මං විතරයි. "එහෙමත් නැත්තං මැන්ප්‍රෝ ක්ලාස් එකේදි ඔයා ඔයාගෙ ආත්ම ප්‍රකාශනයක යෙදෙන්න හදනවද...? ඒත් නැත්තං ඔයා ප්‍රොෆෙසර් ඩුබේව අඳින්නද යන්නෙ?"

"ඇත්තම කිව්වොත් ඕව අපේ තාත්තගෙ... එයා ආර්ටිස්ට් කෙනෙක්. ඒත් දැන් එයා පැරලයිස් වෙලා නිසා අඳින්න බෑ..." ආලෝක් බොහොම හෙමින් කිව්ව.

අපේ සමහර ගොංපාට් අපිටම දිරව ගන්න බැරි වෙලාවල් එනව. මාත් ඒ වගේ අවස්ථාවකට මූණ දීල තිබ්බ. අවකාශෙ





ආරුක්කුවක් අඳින්න ගිය මගෙ ඇඟිලිවලට හිරවුණු පින්සල එහෙමම අවකාශෙ මැද ගල් ගැහුණ!

රයන් මගෙ මූණ දැක්ක. මිනිහගෙ මූණෙ මෙච්චර වෙලා තිබ්ච්ච හිනාව මැකුණ. කටෙන් ඉබේටම වහ්... වහ්... සද්දයක් පිටවුණා.

"ආලෝක්... සොරි... අපි ඒ ගැන දැනගෙන හිටියෙ නෑ..." රයන් මා වෙනුවෙනුත් වගඋත්තර බැන්දෙ බැරෑරුම් මූණකින්. ඒ මදිවට මිනිහ ආලෝක්ගෙ කර වටේ අතකුත් දාපි. හහ්... මිනිහ ඒකෙනුත් ලකුණු දා ගත්ත!

"කමක් නෑ... අවුලක් නෑ... එයා චිත්‍ර ඇන්දෙ ගොඩක් කාලෙකට කලින්. එයා එක්තැන් වෙලත් දැන් සෑහෙන කාලයක්. දැන් අපි ඒකට පුරුදු වෙලා..." ආලෝකත් එහෙම කියාගෙන නැගිට්ටෙ ෆිල්ම් එක බලන්න යන්න හිත හදාගෙන. ඒත් මගෙ හිතේ ඇතිවුණ කම්පනය, ලැජ්ජාව ඒ වෙනකලුත් මැකිලා ගිහින් තිබ්බෙ නෑ. ඒ වෙද්දිත් මං හිටියෙ ඔළුව හංගගන්න තැනක් හොය හොයා.

අපි එළියට ගියා. අපි ඇවිදගෙන යද්දිත් ආලෝක් එක්ක එක පේළියට අඩිය තිබ්බෙ රයන්. මං ගියේ එයාලට අඩි හයක් විතර පස්සෙන්!

"ඉස්කෝලෙ යන කාලෙ ඉඳලම මං හිටියෙ බෝඩිංවල..." රයන් කියන්න ගත්ත. "ඒ හින්ද ගෙවල්වල වෙන දේවල් ගැන මට එච්චර තේරුමක් නෑ. ඔයාලගෙ ගෙදර අය කොහොමද ඕව කරගෙන යන්නෙ...?"

"අමාරුවෙන් ඇදන් යනව... අපේ අම්ම බයෝ ටීචර් කෙනෙක්. ඒක තමයි අපේ එකම ආදායම... ලොකු නංගි තාම කොලේජ් එකේ..."

මාත් පැත්තක ඉඳගෙන ආලෝක් කියපු දේවල්වලට ඔළුව වැනුවෙ, මිනිහගෙ පවුලෙ අමාරුකම් ගැන මමත් නොසෑහෙන්න දුක්වෙන බව අඟවන්න.

"මං අයි.අයි.ටී. එකට ආවෙ සෑහෙන කට්ටක් කාලා... පහුගිය අවුරුදු දෙක තිස්සෙම තාත්තව බලා ගත්තෙ මං...!" ආලෝක් කිව්ව.

"නෑහ්... ඇත්තට...?" අන්තිමට මටත් චාන්ස් එකක් ආවා එයාලගෙ කතාවට හවුල් වෙන්න. ඒත් මං එහෙම කිව්වෙ බොක්කෙන්මයි. මොකද, එක්තැන් වෙච්ච තාත්ත කෙනෙකුට සාත්තු කරන ගමන් අයි.අයි.ටී. එකට එන්න තරමට පාඩම් කර ගන්න පුළුවන් වෙනවයි කියන්නෙ... වැඩක් තමයි!!

"ඔව්... හැමදාම ඉස්කෝලෙ ගිහින් ඇවිත් මං එයාගෙ වැඩ ටික කරලයි පාඩම් කළේ..."

අපි කතාවෙන්ම රයන්ගෙ ස්කූටරේ ළඟට ඇවිත් තිබ්බ. (අහ්... ඒ ගැන මට මුලින් කියන්න අමතක වුණා. රයන්ට ස්කූටර් එකක් තිබ්බා.) ප්‍රියාඑකට යන්න අපි තුන්දෙනාම ඒකට නැග්ග. ස්කූටර් එකක ට්‍රිබල් දාලා යන්න බෑ. තහනං. පොලීසියෙන් ඇල්ලුවොත් ඒකෙන් ශේප් වෙන්න ගාණක් අතමිට මොළවන්න වෙනවා. ඒත් මේ වෙලාවට පොලිසියට අහුවෙන්න තියෙන චාන්ස් එක දහයෙන් එකකටත් අඩුයි. ඒ හින්ද ඕනෙ කෙහෙල්මලක් කියල අපි ස්කූටරේට නැග්ග.

රැට ප්‍රියා සිනමා එකේ තියෙන්නෙ කැම්පස් එකට වඩා එහෙම පිටින්ම වෙනස් ලෝකයක්. දිග පෝලිම්... පවුල් පිටින්... ජෝඩු පිටින්... කොල්ලො කෙල්ලො... මේ හැමෝම කවුරුත් කැමති නෑ ෆිල්ම් එක මිස් කර ගන්න. අපි ගත්තෙ ගැලරි ටිකට්ස්.. ආලෝක්ට අනවශ්‍ය වියදම්වලට සල්ලි නෑ කිව්ව හින්ද. ඒත් මට හිතුණෙ පිටිපස්සට ගියානං ආලෝකයගෙ ඇස් පෙනීම දුර්වල හින්ද, මිනිහට ෆිල්ම් එක හරියට නොපෙනේවි කියල ඉස්සරහම පේළියට ආව කියලයි. කොහොම වුණත් මේ ෆිල්ම් එක විද්‍යා ප්‍රබන්ධ ගණයෙ එකක්. මං හිතන්නෙ ඒක රයන්ගෙ තේරීම. ඒකා තෝර ගන්නෙම ඔය වගේ සයන්ස් සම්බන්ධ චිත්‍රපටි. මටනං ඒව ජේන්න බෑ. ඒත් කවුද මගේ තීරණේ ගැන අහන්නෙ? මේ ෆිල්ම් එක ටයිම් ට්‍රැවල් ගැන. මිනිස් රොබෝල... ලේසර් තුවක්කු...





ෆයිට්... මේ ඔක්කොම ඒකෙ තිබ්බ. විනාඩි දහයක් විතර යද්දි ඒකෙ හිටිය බොඩි බිල්ඩර්ගෙ ඇඟ ගැනවත් ගනිච්චියක් නැතුව මට ඇනුම් යන්න ගත්ත!

"අම්මට සිරි..." රයන් කට ඇරගෙන ඇස් දෙක තිරේ අලෝගෙන හිටියෙ චිත්‍රපටියෙ දුෂ්ටයා මිනිහගෙ පිටේ එල්ලෙන මල්ලෙන් රොකට් ලෝන්චරයක් අරන් ගහද්දි!

"මොන කෙහෙල්මලක්ද මේ...?" මං රයන්ට කෙඳිරුවෙ මිනිහගෙ ආතල් කඩන්නම හිතාගෙන.

"බලනවකො මේකෙ තියෙන ගැජට්ස් ටික විතරක්..." රයන් ෆිල්ම් එකෙන් මුසපත් වෙලා කියෙව්ව.

"ඔව ඔක්කොම බොරුනෙ... නිකං මනස්ගාත..."

"දැනට... කවද හරි ඕව ඇත්ත වෙනව..."

"මොකක්...? ටයිම් ට්‍රැවල් එක. ඒකත් ඇත්ත වෙනවද? එහෙම ද ඔයා හිතන්නෙ?" චිත්‍රපටයක තියෙන දේකින් රයන් වශී වුණහම මිනිහ කියන දේවල් මිනිහම දන්නෙ නෑ.

"ෂ්... ෂ්... හෙමින්... ඔය සද්දෙට මෙලෝ දෙයක් මට ඇහෙන්නෙ නෑ..." ආලෝකය මිනිහගෙ විරුද්ධත්වෙ පෑව.

අපි ආපහු කැම්පස් එකට එද්දි වෙන්කත්ගෙ ඉඳන් ෂුක්වින්ඩර් වෙනකල් හැම එකාම වගේ වල්ගෙ ගිනි අරන් වගේ එහෙ මෙහෙ දුව දුව හිටිය. නිකම්මත් නෙවෙයි නෝට් පැඩ්ස්, පාඩම් පොත් අතින් කටින් අරන්!

"සර්ප්‍රයිස් ක්විස් එකක් ගැන ඔත්තුවක් ඇවිත්..!" ෂුක්වින්ඩරය පැහැදිලි කරන්න වුණා. "ඇප් මැක්වලින්නලු එන්නෙ..." ෂුක්වින්ඩරය කියෙව්වෙ මෙලෝ සිහියක් නැතුව පොතක පිටු පෙරළන ගමන්.

"ඇප් මැක්" කියල කෙටියෙන් හැඳින්නුවෙ 'ඇප්ලයිඩ් මැකැනික්' කියන කෝර්ස් එක. වෙලා තිබුණයි කියන්නෙ මේකලු. නිල්ගිරි හොස්ටල් එකේ ඉන්න පොරවල් ටිකක් එයාලගෙ

එසයින්මන්ට්ස් දෙන්න ප්‍රොෆෙසර්ගෙ ඔෆිස් එකට ගිහින් තියෙනව හවස් වෙලා. එතකොට ප්‍රොෆෙසර් කිව්වලු, "ඊයේ දීපු නෝට්ස් ටික හොඳට බලා ගන්නවල..." කියල. නිකම්මත් නෙවෙයි... වම් ඇහි බැම නටව නටව කපටි හිනාවකුත් එක්ක. අපේ එවුන්ට ඒ ටික ඇති වැඩේ අල්ලගන්න. එච්චරයි. ආයි නෑ, ඒ ආරංචිය බට කැලේට ගිනි ගත්ත වගේ මුළු කැම්පස් එක පුරාම පැතිරෙන්න ගිහිල්ල තියෙන්නෙ විනාඩි ගාණයි!

"කෙළිය... දැන් ඉතින් බලාපල්ලකො ඇප් මැක් නෝට්ස් ටිකත්...! කීයට බලල ඉවර කරන්නද?" ආලෝක් නාහෙන් අඬන්න ගත්ත.

"ඇයි... එතකොට අපිට දෙන්න තියෙන ක්වන්ටෝ එසයින්මන්ට් එක...? ඒකත් ඉවර කරන්න එපායැ...?" මං තවත් හෙණපතයක් පාත් කළා.

ආයෙත් අපි තුන්දෙනා මගෙ කාමරේට සෙට් වුණේ පාඩම් කරන්න. ඒ වෙද්දි වෙලාව පාන්දර දෙකයි.

"අපි ෆිල්ම් එක බලන්න ගිය එක තමයි අපි කරපු ගොං වැඩේ...! මං කිව්වනෙ නොයා ඉමු කියල..." ආලෝකය නාහෙන් අඬන්න ගත්ත.

"අපි දන්නවයැ මෙහෙම එකක් වෙයි කියල." රයන් ගාණක් නැතුව කිව්ව. "අනික මොකෝ මේ ලෝකෙ පෙරළිලා වගේ?"

"එහෙම එකක් නෙවෙයි... මේකට ලකුණු හම්බවෙනව. බැරි වුණොත් අපිට කෙළවෙනව. තේරෙන්නෙ නැද්ද?"

ආලෝක් 'අපිට කෙළවෙනව...' කියන වචනෙට වැඩි බරක් දාලා කිව්ව. ඒකට නම් රයනුත් ටිකක් විතර හොල්මන් වෙච්ච ගතියක් පෙනුණ.

එතකොටම තමයි කොහේද හිටිය මීයෙක්, මගේ ඇඳ යට ඉඳල බුලට් එකක් වගේ එළියට පැන්නෙ.

"ආං... ආං... මීයෙක්..." රයන් කෑ ගැහුවෙ කතා කර කර හිටිය මාතෘකාව වෙනස් කරන්නත් හිතාගෙන වෙන්න ඕනෙ.





රයන් සෙරෙප්පුවත් ගලෝගෙන මීයට ගහන්න කුරුමානං ඇල්ලුව. එළියට ආව මීයා තීරණේ කළා යන්න ගිය දිහාට නොගිහින් ආපහු හැරිල ඇඳ යටටම රිංගන්න!

"ඔවුන් ඉන්නව මගෙ කාමරේ ඕනෙ තරං..." මං ගාණක් නැතුව කිව්ව.

"ඕන්නං මං උන්ව මරල දාන්නං..." රයන් ඉදිරිපත් වුණා.

"ඒක හරි යන්නෙ නෑ. උන් මහ කපටි යක්කු... අනික උන් මාර ෆාස්ට්..."

"මොනවද ඔට්ටු?" රයන්ට වැඩේ ඒ තරම්ම ෂුවර්.

"මොන මගුලක්ද ඔයාල මේ කතා කරන්නෙ? දැන් අපිට තියෙන ලොකුම වැඩේ මෙයාගෙ කාමරේ ඉන්න මීයො මරන එකද? දෙයියන්ගෙ නාමෙට ඔය කෙහෙල්මල් මීයො පැත්තකින් තියල දැන්වත් පාඩං කරමුද?" ආලෝක් ඇහුවෙ අඬන්නා වගේ. මිනිහ සමහර වෙලාවට හැඟීම්බර වෙනව වැඩියි.

රයන් ආපහු සෙරෙප්පු දාගෙන, සන්සුන් ලීලාවෙන් හාන්සි පුටුවෙ දිගෑදුණේ ඇප් මැක් පොතකුත් දිග ඇරන්. ඊට පස්සෙ මිනිහ ගත්ත හොඳ හුස්මකුත්.

"ඕකේ ඕකේ බොස්... අපි පාඩම් නොකළොත් මහා භාරතේට ශ්‍රේෂ්ඨ ඉංජිනේරුවො තුන්දෙනෙක් අහිමි වෙනව..." රයන් කෙඳිරි ගෑව.

"කට වහනවද?" ආලෝක් කිව්වෙ පොතෙන් ඔළුව ගන්නෙත් නැතුව.

රයන් කට වහගත්තත් සැරින් සැරේ මගෙ ඇඳ යටට එබෙන්න මිනිහ අමතක කළේ නැහැ. අඩු ගාණෙ එක මීයෙක් හරි මරාගන්න මිනිහගෙ හිතේ තියෙන බව මට තේරුණා. ඒත් මං හිතන්නෙ රයන්ගෙ හිතුවිලි තරංග, මීයගෙ හිතුවිලි තරංගයි සමපාත වෙච්ච හින්දද කොහෙද, එක මීයෙක්වත් නෙවෙයි ඊට පස්සෙ පේන්න ආවෙ. අපි යන්තං පැයක් ඇතුළතදි අපේ

ක්වන්ටෝ එසයින්මන්ට් එක ඉවර කළා. ඊට පස්සෙ පාන්දර පහ වෙනකල් ඇප් මැක් නෝට්ස් බලා ගත්ත. 'අපි' කිව්වෙ මමයි, ආලෝකයයි. මොකද ඒ වෙද්දි රයන් ගොරෝ ගොරෝ නිදාගෙන හිටිය. මගෙත් ඇස් දෙක පියවෙන්න මාර ට්‍රයි එකක් දුන්නත්, මම සටනක් දීල ඇහැරගෙන හිටිය. ආලෝකයටත් ඒ සන්තෑසියම වෙලා තියෙන බව මට තේරුණා. අපිට තව බලා ගන්න නෝට්ස් තිබ්බත් පොඩ්ඩක් හරි නිදා ගන්න එකත් අත්‍යවශ්‍ය වෙලයි තිබ්බෙ. අනෙක් අතට ඔය සර්ප්‍රයිස් ක්විස් එක තියෙනවයි කියන එක ආරංචියක් විතරයිනෙ. ඒක ඇත්තටම තියේවිද කියල මොකාටද කියන්න පුළුවන්?

හැබැයි අනික් අතට බැලුවොත් ඔය නරක කටකතා, අසුබ ආරංචි තියෙනව නේද? ඒවනං ගොඩක් වෙලාවට ඇත්තටම සිද්ධ වෙනව. හොඳ ආරංචි, කටකතා තමයි සිද්ධ නොවෙන්නෙ. ඇප් මැක් ක්ලාස් එක පටන් අරන් පැය බාගෙකට පස්සෙ, ඒක ලෙක්චර් කරන ප්‍රොෆෙසර් සෙන් ක්ලාස් රූම් එකේ දොර වහල, එයාගෙ කළු පාට බ්‍රීෆ්කේස් එක ඇරිය.

"ඔන්න පුතෝ අපිට ටිකක් විනෝද වෙන්න කාලෙ ඇවිත්..." එයා අපේ ඇඟවල් හීතල වෙන විහිළුවක් කළා. "සර්ප්‍රයිස් ක්විසස්...!"

ප්‍රොෆෙසර් සෙන් බෑග් එකෙන් ගත්ත කොළ ටික ඉස්සරහ පේළියෙ අසරණයො ටික අතට දුන්න. උන් එකා එක කොළේ ගානෙ තියාගෙන අනික්ව පිටිපස්සට පාස් කළා. කටකතා හැබෑ වෙන වෙලාව! මගෙ අතට කොළේ ආව ගමන් මං ඒක උඩ ඉඳල පහළට ස්කෑන් කළා. ගොඩක් ප්‍රශ්න අහල තිබ්බෙ ළඟදි කරපු දේශනවලින්. ඒ ඔක්කොම හරියටම අපිට පාඩම් කරන්න බැරි වෙච්ච, බලා ගන්න බැරි වෙච්ච කොටස්!!

"කෙළිය... පස්වෙනි ප්‍රශ්නෙන් එහාට අපි පාඩම් කරලම නෑ...!" මං ආලෝක්ට කෙඳිරුව.

"අපිට කෙළවෙලා තියෙන එකේ කට වහගෙන ඉන්නවද? එතකොට අඩු ගානෙ සද්දයක් නැතුවම කෙළව ගත්තහැකි..."





ආලෝකය කිව්වෙ බොහොම බැරෑරුම් විදිහට ප්‍රශ්න පත්තරේ දිහා බලාගෙන කල්පනා කරනව වගේ අඟවමින්. කොච්චර හරි මිනිහගෙ වම් කම්මුල ප්‍රශ්න පත්තරේට ගෑවෙන තරමට පාත් වෙලා තිබ්බ!

උත්තර ලියල යන ගමනෙදි අපි නෙවෙයි ඇවිත් තිබුණු ප්‍රශ්න එකක් ගැනවත් කතා කරන්න හිතුවෙ! අනික් එවුන්නං අරකට ලිව්වද...? මේකට ලිව්වද...? අරකට මෙහෙමද ලිව්වෙ? මේකට මොකක්ද ලිව්වෙ? කියල කචබච ගානව ඇහුණ.

අපේ දක්ෂකම්වල ප්‍රතිඵලේ බලා ගන්න අපිට වැඩි දවසක් ටැග් ගැහෙන්න ඕනෙ වුණේ නෑ. දවස් දෙකකට පස්සෙ ප්‍රොෆෙසර් සෙන් අපේ උත්තර පත්තර පන්තියෙදි බෙදල ඇම්ම.

"මොකෑ... පහයි! යකඩො මට විස්සෙන් පහයිනෙ...!" මං ළඟ හිටිය ආලෝක්ට කිව්ව.

"මට හතයි... හිඃ..." ආලෝකයට සසර කලකිරිල තිබ්බ.

"මට තුනයි... කොහොමද ඒක... එකයි... දෙකයි... තුනයි..." රයන් අතේ ඇඟිලි එක එක නවල ගණන් හදන්න වුණා.

ප්‍රොෆෙසර් සෙන් ඒ ඒ ලකුණු සීමාවල් මට්ටම් බෝඩ් එකේ ලිව්ව.

විශිෂ්ට - 17/20
සාමාන්‍ය - 11/20
දුර්වල - 3/20

ප්‍රොෆෙසර් සෙන් එයාගේ දේශනේ දෙන්න කලින් ටික වෙලාවක් ඒ දිහාවෙ බලාගෙන හිටිය.

"මට තියෙන්නෙ අඩුම එක. දැක්කද?" රයන් මට කෙඳිරුව. මිනිහට මේ වෙලාවෙදි මොන වගේ හැඟීමක් ඇවිල්ල ඇතිද කියල හිතා ගන්න මං උත්සාහ කළා. මිනිහ ගාණක් නෑ වගේ ඉන්න උත්සාහ කළත් හිත ඇතුළෙන් සෑහෙන්න කලබල වෙලා ඇති කියලයි මට හිතුණෙ. මිනිහ ආයෙත් ලකුණු ටික දීල තියෙන

විදිහ හරිද බැලුව. හරි... කිසි වැරැද්දක් වෙලා නෑ. තුන, තුනම තමයි!

ආලෝකයගෙ කතාව වෙනින් එකක්. මිනිහගෙ මූණෙ තිබ්බෙ මහ භයංකාර හොල්මනක් දැක්කා වගේ පෙනුමක්. තැති ගැනිච්ච පෙනුමක්. හරියට රැග් එකට අහුවෙච්ච දවසෙදි වගේ. මිනිහ සැරින් සැරේ උත්තර පත්තරේ දිහා බැලුවෙ අඬන්න ඔන්න මෙන්න මූණක් හදාගෙන. ඒ වෙලාවෙදි මිනිහට ඇඟිල්ලෙන් ඇන්නනං අඬනව ෂුවර්! කොහොමටත් මිනිහට තියෙන්නෙ පොඩි දේකටත් කම්පාවෙන, වැලපෙන හදවතක්. මේ වෙලාවෙදි මිනිහට මොකුත් නොකළත්, ප්‍රශ්නවලට දීපු වැරදි උත්තරම මිනිහව අඬවන්න පුළුවන් මට්ටමක තිබ්බ.

මං මගෙ උත්තර පත්තරේ දිහා බැලුව. මගෙ එක බලපු කෙනා පොල් ගෙඩි සයිස් එකේ අකුරුවලින් ලකුණු දාල තිබ්බෙ මහ නොසැලකිලිමත් විදිහට. හරියට කුරුටු ගීත වගේ. මංනං අයින්ස්ටයින් වගේ මොළකාරයෙක් නොවෙන බව හැබෑව. හැබැයි ඉස්කෝලෙ කාලෙදිවත් මට මේ වගේ දෙයක් වෙලා තිබ්බෙ නෑ. විස්සෙන් පහයි! ඒ කියන්නෙ සීයෙන්නං විසිපහයි!! මගෙ මුළු ඉස්කෝලෙ ඉතිහාසෙටම විසිපහෙන් පහළ ලකුණු තිබිල තියෙන්නෙ තුන් පාරක් විතරයි. ෂෑ... අයි.අයි.ටී. පළවෙනි ටෙස්ට් එකම කෙළ වුණානෙ...!!

නිකං බලමුකො රයන්ගෙ ලකුණු දිහා! මංනං හිතන්නෙ මිනිහ ඊයෙ රෑ පාඩම් කළෙත් අපරාදෙ. මං මිනිහට වඩා ලකුණු දෙකයි වැඩි. ඕහ්... නෑ... නෑ... ප්‍රතිශතයක් හැටියට බැලුවොත් මං මිනිහට වඩා සීයට හැටහයක් ලකුණු අරං තියෙනව. ඒ හිතුවිල්ල මට හරි සනීපයක් ගෙනාව.

ප්‍රතිශතයක් හැටියට ගත්තොත් අපි තුන්දෙනාගෙන් ආලෝකය තමා වැඩිම! ඒත් මේ ප්‍රතිශත කෙළිය මිනිහව සනසවන්න මදි බව මං දැනගෙන හිටිය. මිනිහ මිනිහගෙ ලකුණු දැක්ක... ප්‍රොෆෙසර් සෙන් බෝඩ් එකේ දාපු ලකුණු මට්ටම් දැක්ක... මං මිනිහගෙ මූණ දිහා හොඳට බලාගෙනයි හිටියෙ.





හැම වැරැදි උත්තරයක් ගානෙම මිනිහගෙ මූණ ඇඹුල් වෙනව මං බලාගෙන.

අපි අපේ ගොන්කම මූර්තිමත් කරපු, අපේ මෝල්කම් පැහැදිලි කරල දීපු උත්තර පත්තර ටික බෑග් එකේ ඔබාගෙන කුමාඕන්වලට ගියා. අපි ආපහු හම්බ වුණේ රෑ කෑම මේසෙදි. කෑම ගැන ඉතින් අලුතෙන් කියන්න දෙයක් තිබ්බෙ නෑ. මෙලෝ බල්ලෙකුට කන්න බැරි කෑම තමයි කවදත් මෙස් එකේ දුන්නෙ. පෝලිමේ ගිහිල්ල පිඟාන අල්ලපුවම පිඟානට දාපු කොළ පාට තැප්පෙ (ඒකට ඒක හදපු එවුනුයි, මෙස් එකේ මෙනු එක හදපු එවුනුයි නම් කිව්වෙ 'බින්ඩි මසාලා' කියල!!) දැක්කම ආලෝකයගෙ මූණ බෙරි වුණා. මිනිහ මිනිහගෙ රොටි දෙක පිඟානට දමල ගහල කෑම නොකා ඉන්න තීරණේ කළේ, රොටි කන්න දීල තිබ්බ ඩාල්, රයිටා, පුලාඕ වගේ අනික් අර්ධ ගන තත්ත්වයේ තැප්පවල් දිහා බලන්නෙවත් නැතුව. සෝමාලියාවෙ කෑම නැතුව ඉන්න මිනිස්සු ගැන හිතපු මායි, රයනුයි ලෝක අපරාදෙකට හවුල් වෙන්න හොඳ නෑ කියන ප්‍රතිපත්තියෙ ඉන්න හින්ද, අපි ආලෝක්ගෙ පංගුවත් ගලනාලය හරහා අපේ මහ බඩවැල්, කුඩා බඩවැල් හරහා යැව්වා. ඒවයෙ රසේ වෙනසක් නැති වුණත් අඩු ගානෙ එක එක පාටින් තිබ්බනෙ කියල අපි හිත් හදා ගත්ත.

අන්තිමට ආලෝක් විභාග ප්‍රශ්න ගැන කතාව ඇදල ගත්ත.

"හරි... දැන් ඉතින් ඔයාලට මොනවද කියන්න තියෙන්නෙ?"

රයනුයි, මායි මූණට මූණ බලා ගත්ත.

"මොනව ගැනද?" මං ඇහුව.

"කෑම ගැනද?" රයන් ඇහුවෙ, ආලෝක් අදහස් කළේ වෙන දෙයක් බව දැන දැනමයි.

"මළඉලව් මඟුලක් කතා කරනව... කෑම නෙවෙයි..." ආලෝක් මල පැනල කිව්ව. "මං කියන්නෙ අපේ මැක් පේපර් එක ගැන..." කොහොමටත් මිනිහගෙ තියෙන ශෝචනීය පෙනුම, යකා නැග්ග පෙනුමකට පෙරළුණා. හැබැයි මංනං ඒ පෙනුමට

කැමති වුණා. නැත්තං මිනිහගෙ මූණෙ නිතරම වගේ තියෙන මළහෝන්තු පෙනුම මට අල්ලන්නෙම නෑ.

"මොකක්ද ඉතින් ඒක ගැන කියන්න තියෙන්නෙ... අපිට කෙළවුණා... එච්චරයි. ආයෙ මොනවද ඒ ගැන සාකච්ඡා කරන්න තියෙන්නෙ?" රයන් ඇහුවෙ බොහොම සැහැල්ලුවෙන්.

"හොව්... අපිට කෙළ උනා... මළඉලව්ව... ඒකෙ දෙකක් නෑ..." ආලෝකයගෙ මල ඩබල් වුණා. ආලෝකයගෙ නිතරම තියෙනව ඕවර් ඇක්ටිං ගතියක්. ඒකෙන් වෙන්නෙ මිනිහ කියන දේවල්වල තියෙන ගතිය බාල වෙන එකයි.

"එහෙනං ඉතින් ඒක අල්ලල දාන්න... අනික අපි තුන්දෙනාගෙන්ම ලකුණු වැඩි ඔයාටනෙ... ඒක ගැන හිතලවත් සන්තෝස වෙන්නකො..." රයන් අමතර උපදෙසක් දුන්න.

"සන්තෝස...? හුහ්... සන්තෝස වෙන්නම වැඩේ. ඇක්කනෙ ඇවරේජ් ලකුණු ගාණ. එකොළහයි. වැඩිම දාහතයි. මට කීයද...? හතයි. අර මළඉලව් ටර්මිනේටරය තමයි අපිට කෙළෙව්වෙ..." ආලෝකය ආයෙත් ඕවර් ඇක්ටිං තත්ත්වෙට පත් වුණා. මිනිහ පාවිච්චි කරන විශේෂණ පද, වචන ආයෙ ආයෙ පාවිච්චි කරන එකෙනුත් මිනිහගෙ කතාවෙ ගැම්ම අඩු වෙනවයි කියලයි මට හිතුණෙ. උදාහරණයක් හැටියට "මළඉලව්" කියන වචනෙ.

"මොකක්...? මොකක්ද ඔයා කිව්වෙ?" රයන් කකා හිටිය එක නවත්තල ඇහුව. "ඔයා ටර්මිනේටර් ගැන කිව්වද...?"

"ඔව්... කිව්ව තමා... ඔයාගෙ මළඉලව් අදහසක්නෙ ඒක..." ආලෝක් පිපිරුව.

රයන් ගල් ගැහිල ආලෝක් දිහා බලාගෙන හිටියෙ, හරියට ආලෝක් ග්‍රීක් භාෂාවෙන් කතා කළා වගේ. ඊට පස්සෙ රයන් මා දිහාට හැරුණ. "හරි... ඔයාට ඇහුණද මෙයා කියපු දේ? ඇහුණද...? මටනං විශ්වාස කරන්නත් බෑ..."

ඇත්තම කිව්වොත් මට ආලෝකය කියපු දේ ඇහුණ තමයි. ඒත් ඒකා කිව්වෙ මොකක්ද කියලනං මගෙ ඔළුවට ගිහින් තිබ්බෙ නෑ. හේතුව තමයි, මං මිනිහ කියන දේට වඩා ඇහුම්කන් දීගෙන





හිටියෙ මිනිහ කී පාරක් 'මළඉලව්' කියන වචනෙ කියනවද කියන කාරණාවට නිසා. මං හිටියෙ ඒක ගණන් කර කර!

"හරි... ඔයා හිතන්නෙ ප්‍රශ්නවලට කෙළෙව්වෙ මං කියලද?" රයන් මගෙන් ඇහුවෙ හෙමින්. මං ආලෝක්ගෙයි, රයන්ගෙයි මූණු දිහා මාරුවෙන් මාරුවට බැලුව.

"රයන් ඔයාටත් ලකුණු තුනයිනෙ..." මං කිව්ව. "එහෙව් එකේ..."

රයන් මට හරස් වුණා. "නෑ... ඒක නෙවෙයි මෙතන කතාව... ආලෝක් කියන්නෙ මං ඔය දෙන්නව ෆිල්ම් එක බලන්න එක්ක ගිහින් ඔය දෙන්නට කෙළෙව්වා කියලයි. ඔයා හිතන්නෙත් එහෙමද?"

"මං කිව්වෙ එහෙම එකක් නෙවෙයි..." ආලෝක් කියාගෙන ආවත්, රයන් ආලෝක් දිහාවත් නොබලා, සේනාපතියෙක් වගේ අත උස්සල මිනිහගෙ කතාව නතර කෙරෙව්ව.

මට රයන් අහන දේ හොඳට තේරුණා. ඒත් මං කොහොමද ඒකට උත්තරයක් දෙන්නෙ? කාගෙවත් පැත්තක් නොගෙන?

"ඒත් ඒක කොහොමද.." මං වෙන වැල්වටාරමක් කියන්න ගත්තත් රයන් මාවත් නැවැත්තුව.

"හරි... ඔයා මට කියන්න, ඔයා ඔයාගෙ හොඳම යාළුවෙකුගෙන් ඒ වගේ දෝෂාරෝපණයක් බලාපොරොත්තු වෙනවද?"

"ඕකෙ ඒ හැටි දෙයක් නෑ හගිස්සවන්න. අනික ඔයා අපිව බලෙන් ෆිල්ම් එක බලන්න ඇදගෙන ගියේ නැනෙ..." මං කිව්වෙ ආයෙනං ජීවිතේට ඒ වගේ සයන්ස් ෆික්ෂන් එකක් බලන්න යන්නෙ නැමයි කියල හිතාගෙන.

මගෙ උත්තරෙන් රයන් සෑහීමකට පත් වුණා වගෙයි පෙනුණෙ. මිනිහ උස්සපු අත පාත් කරල හිනා වුණා. "ඒකනෙ කියන්නෙ..."

"ඒත් අනෙක් අතට ආලෝකත් හරි..." මං දිගටම කියෙව්ව. "අපිට මේ තියෙන ක්‍රමේ වෙනස් කරන්න බෑ... ඇත් එකෙත් සීමාවක් තියෙන්න ඕනෙ. නැත්තං අපිවමයි අමාරුවෙ වැටෙන්නෙ..." මං වැඩේ බැලන්ස් කළා.

"ඇති යන්තං... තැන්ක් යූ..." ආලෝක් කිව්ව. "ඕක තමයි මං මෙච්චර වෙලා කියන්න හදපු බණේ..."

අන්න එහෙම අවුල් වෙච්ච දේවල් බැලන්ස් කරන්න ඕනෙ. ඒකත් එක කලාවක්. සමහර වෙලාවලට හැමෝගෙම වාද විවාදවලට අලුත් අර්ථකථනයක් දීගන්න පුළුවන් වුණොත්, වැඩෙත් ගොඩ අගෙන, වීරයෙකුත් වෙන්න පුළුවන්.



# 3

# සුරංගනාවක් ඩ්‍රයිවින්!

ප්‍රසිද්ධියෙන් පස්සෙ අපි ටිකක් ඇපකැප වීමෙන් පාඩම් කරන්න ගත්ත. රයන් වෙනදට පාඩම් කරද්දි, බාගයක් දුර පාඩම් කරගෙන යද්දි ඒක නවත්තල චිත්‍රපටි ගැන, කෑම ගැන, ගැජට් බැජට් ගැන කරන කතාවල් නවත්තල නිස්සද්දව පාඩම් කරන්න උත්සාහ දැරුව. අපේ පාඩම් කිරීමේ ව්‍යාපෘතිය සැහෙන්න ඵලදායි තත්ත්වෙකට පත් වුණා කියලයි මට හිතුණෙ. අපේ ලකුණුත් පන්තියෙ සාමාන්‍ය මට්ටමට වගේ ආවා. ඒත් එසයින්මන්ට්ස් ගැනනං කියන්න තිබ්බෙ පරණ කතාවමයි. ඒ කිව්වෙ ඒව මහ බෝරිං. ඒව කරද්දිනං අතරමැදදි බ්‍රේක් එකක් ඕනෙමයි නේද කියලා මට හිතිච්ච වාරත් අනන්තයි. රයන් නම් එසයින්මන්ට්ස් දෙකක් මැද්දෙදි කුකුල් නින්දක් ආනව. එහෙමත් නැත්තං බිත්තිය දිහා බලාගෙන මොනවද මතුරනව. මං හිතන විදිහටනං මිනිහ ඒ මතුරන වචන මේවයෙ ලියන්න අමාරුයි!

"ඇති යන්තං..." දවසක් රයන් කිව්වෙ එයාගෙ එසයින්මන්ට් එකක් ඉවර කරල, ඒක ස්ටේපල් කරන ගමන්. "ඒ ඉලව්ව ඉවරයි... ඔයාල මොකද කරන්නෙ... තව කරනවද... නැත්තං..."

"ඇයි ඒකට ඉලව්ව කියන්නෙ...?" ආලෝක් ඇහුවෙ සිරාවට.

"හිතා ගන්න බැරිද?" රයන් එසයින්මන්ට් එක කුණු මාළු කෑල්ලක් වගේ මේසෙ උඩට වීසි කරන ගමන් ඇහුව.

"කියන්නකො ඇයි කියල..." ආයෙත් ආලෝක් ඇහුව. "ඔයා අයි.අයි.ටී. එකට එන්න ඇත්තෙ සෑහෙන්න මහන්සි වෙලානෙ."

"ඔව් ඒක හරි... ඒත් ආවට පස්සෙ තමයි මට තේරුණේ මෙතන මං හිතපු විදිහෙ තැනක් නෙවෙයි කියල... එයාල විස්තර කරන්නෙ මෙතන සයන්ස්වල ටෙක්නොලොජිවල නව සොයා ගැනීම් කරන තැනක් විදිහටනෙ. ඉතින් ඔයාලට පේනවද එහෙම දෙයක් මෙතන?"

පොත වහල මාත් කතාවට හවුල් වුණා. "බොස්... මේකයි... අයි.අයි.ටී. උපාධිය ගන්නනං කටපාඩම් වෙන සයිස් එකට පාඩම් කරන්න ඕනෙ. ඒ උපාධියට තමයි අපිට රස්සාවක් හම්බවෙන්නෙ. ඉතින් මොකක්ද ඔයා කියන්නෙ මෙතන ඔයාගෙ බලාපොරොත්තු සුන් කළැයි කියල...?"

"ඕං ඕක තමා හෙණේ...! මෙතන දුවන්නෙත් කෝපි කාලෙ විදිහට. මෙතන ඉන්නෙත් කෝපි කාලෙ විදිහට හිතන ඔයාලා වගේ අය!"

මටත් මල පැනගෙන ආවා. රයන් හිතන විදිහට මිනිහ තමා පොර! අනික් උන් මෝල්ලු!!

"මොකක්ද මෙතන වෙන්නෙ? ලෙක්චරර්ස්ල එනව... නෝට්ස් දෙනව... අපි ඒව බෙල්ල කඩාගෙන පාඩම් කරනව. ඒවයින් එසයින්මන්ට්ස්, ටෙස්ට්ස් දෙනව... අපි ලියනව පාස් උනොත් උපාධිය කියන කඩදාසි කෑල්ල හම්බවෙනව ලස්සන කොළේක ප්‍රින්ට් කරල. ඒක අරං අපි ජොබ් එකකට යනව. කෝ එතකොට නව අදහස්? අලුත් සොයා ගැනීම්? පාඩම් කරන්න ගියාම ඒවට වෙලාවක් නැති වෙනව. පුටුවක හරි ඇඳක හරි ඇනගෙන දවසම පාඩම් කළාම වෙන්නෙ හරී වගේ මහත් වෙන එකයි..."

හහ්... රයනය පාඩම් කරන්න කැමති නෑ. ඒ හින්ද උෟට මාව පේන්නෙ පාඩම් කරන පුස් උෟරෙක් වගේ. මේ ලෝකෙ ඉන්න රයන් වගේ එවුන් හිතාගෙන ඉන්නෙ එයාල දෙවියන් විසින් ලෝකෙට දීපු තෑග්ගක් කියල...! පුදුම ලෝකයක් තමා.





"මටනං ඔය නව අදහස් ඇවිල්ලත් නෑ... එන්නෙත් නෑ... ඒ වගේම මං එච්චර මහතත් නෑ..." මං ආලෝක් දිහාට හැරෙන ගමන් කිව්ව. ආලෝක්ව දැක්ක ගමන් මට සහනදායි හැඟීමක් දැනුණා.

"තඩියො... කණ්ණාඩියකින් බැලුවනං තේරෙයි... ඕකට මොනවා හරි කරන්න වෙයි..." රයන් කිව්ව.

"ඒක ආරෙට යනවලු... මං ටීවී ඩොකියුමෙන්ට්‍රියක දැක්ක..." මං අසරණ විදිහට කිව්වෙ වෙනින් හේතුවක් හොයා ගන්න බැරුව.

"ආරෙට...? රෙද්ද තමයි... මට ඕන්නං පුළුවන් මෙහෙම කරද්දී..." රයන් මහපටැඟිල්ලයි, මැදඟිල්ලයි ටකස් ගාල ගැහුව. "කිලෝ දහයක් අඩු කරන්න..."

රයන් ඒක කරන්නෙ කොහොමද මං දැනගෙන හිටියෙ නෑ. ඒත් මං දැනගෙන හිටිය මටනං ඒ වැඩේ කරන්න බැරි බව. දවස ගානෙ බස් පස්සෙ දුවනවටයි, එහෙම නැත්තං දවසට පනස් පාරක් පඩිපෙළවල් නැඟල බහිනවටයි වඩා මහත් වෙලා ඉන්න එක සුවදායකයි.

"රයන්... ඒක පැත්තකින් තියන්න... ඒක මං මොකක් හරි කරගන්නං. ඔයාට පාඩම් කරන්න ඕනෙ නැත්තං අපි කැන්ටිම පැත්තෙ ගිහින් පරෝටා එකක් කමුද?"

"අන්න ඒක තමා කාරණාව... කනව... කනව... මුකුත් ව්‍යායාමයක් නෑ... බෑ... බෑ... ඒක හරියන්නෙ නෑ. මං තීරණේ කළා ඔයාව ව්‍යායාම් මාලාවකට පුරුදු කරන්න..." රයන් කිව්වෙ බොහොම උද්යෝගයකින්. "අපි හෙට උදෙන්ම පටන් ගන්නව... හරිද?"

මොකක්...? සාමාන්‍යයෙන් රයන් එහෙම තමයි. අනුන් වෙනුවෙන් තීරණ ගන්න සතා. මිනිහගෙ පෙනුම නිසාද එහෙමත් නැත්තං මිනිහගෙ ගතිගුණ නිසාද මන්ද මිනිහට ඒ වගේ දේවල්වලට කාගෙන්වත් විරුද්ධකං එහෙම එන්නේ නෑ. මිනිහ ඒ හැම දෙයින්ම ෂේප් වෙලා වැඩේ කර ගන්නව.

"රයන්... නෑ... මේ චුට්ටක් අහන්නකො..." මං පටන් ගත්ත. රයන් මාව ඇහුණෙ නෑ වගේ ආලෝක් පැත්තට හැරුණ.

"ආලෝක්... මං හිතන්නෙ ඔයත් ආවොත් හොඳයි. මොකද කියන්නෙ...?"

"ඔල්මාදෙද?" ආලෝක් ඇහුවෙ කාවෙක් වගේ පොත අස්සටම රිංගන ගමන්.

කිලෝ දහයක් අඩු කර ගැනීමේ ව්‍යාපෘතිය ගැන මං හිතුව. මගෙ ජීවිතේදි හම්බ වුණු ගොඩක් අය මට කියන්නෙ 'තඩිය' කියලයි. එහෙමත් නැත්තං 'තඩි බරිය' කියලයි. ඒ හින්ද ඒ තඩි ගතිය මගෙ අනන්‍යතාව බවට පත්වෙලයි තිබ්බෙ. ඒත් ඇත්තම කිව්වොත් මගෙ ඒ අනන්‍යතාවෙනං මට රුස්සන්නෙ නැතුවයි තිබ්බෙ. එක අතකට බැලුවම රයන් ආවට ගියාට මොනවත් කියන ජාතියෙ එකෙක් නෙවෙයි. අනික මිනිහ බොහොම අපූරු ඇඟක් තියෙන කෙනෙක්. ඒ හින්ද මට උපදෙස් දෙන්න සම්පූර්ණ අයිතියක් මිනිහට තියෙනව. ඕන කෙහෙල්මලක්... මිනිහ කියන විදිහට ටික දවසක් හරි කරල බලන්න ඕනැයි කියල මට හිතුණ.

"හරි.. දැන් මං මොනවද කරන්න ඕනෙ?" මං ඇහුව.

"උදෙන්ම නැඟිටල කැම්පස් එක වටේ ජොග් කරන්න ඕනෙ... කිලෝමීටර් හතරක් විතර..."

"පිස්සුද...? කිලෝමීටර් හතරක්?? මම කිලෝමීටරයක් ඇවිදින්නෙත් අමාරුවෙන්..."

"වාතයක්නෙ... අඩු ගානෙ ට්‍රයි කරල බලන්නකො... ඊට පස්සෙ ඔයාට දැනෙයි මාර ෆිට් එකක්..." රයන් කිව්ව.

කිව්වත් වගේම පහුවදා පාන්දර පහට රයන් ඇවිත් කිසිම හිතක් පපුවක් නැතුව දොරට තඩි බෑව. මට යකා නැග්ග රයන් එක්ක. ඒත් මං ගිහින් දොර ඇරිය.

"ඉක්මනට... ඉක්මනට... දාගන්න ෂෝට් එකකුයි ටී ෂර්ට් එකකුයි."





"කිලෝමීටර් හතරක්...??"

"කට වහගෙන එන්න කිව්වම අහල... ට්‍රයි කරල බලන්නකො..." රයන් මාව දිරිගැන්නුව.

අපි කුමාඕන්වලින් පිටවෙද්දිත් වටපිටාව කළුවරයි. ඒ ගැනනං මට තිබුණේ හීන් සන්තෝෂයක්. මොකද... එතකොට කවුරුවත් දකින්නෙ නැනෙ කිලෝ අසූවක තඩියෙක් බැරි අමාරුවෙන් පෙරළි පෙරළි දුවන හැටි! හොස්ටල් පහු කරල, පිට්ටනිය පහු කරල, ලෙක්චර්ස් හෝල්ස් පහු කරල, ෆැකල්ටි හවුස් එකට එනකල් දිව්වම තමයි කිලෝමීටර් හතර සම්පූර්ණ වෙන්නෙ. මං දුවන්න පටන් ගත්ත. රයන් එයාගෙ ව්‍යායාම කරන්න ගියා.

එච්චර කල් මගෙ ඇඟේ තිබුණයි කියල හිතන්න බැරි මාංසපේශි, ඒව තියෙනවයි කියල ඔප්පු කළේ දුවන්න පටන් ගත්තමයි. විනාඩි දහයක් දුවද්දි මං ඇල්සේෂන් බල්ලෙක් වගේ, එහෙමත් නැත්තං එවරස්ට් නඟිද්දි ඔක්ෂිජන් මදි වෙච්ච කඳු නඟින්නෙක් වගේ හති දාන්න පටන් ගත්ත! විනාඩි පහළොවක් දුවද්දි මට තේරුණේ මගෙ අන්තිම මොහොත ළඟා වෙලා වගේ!! ඒත් හිතට දහිරිය අරන් ලෙක්චර් හෝල්ස් ටිකත් පහු කරල ෆැකල්ටි හවුස් තියෙන හරියට ළඟා වෙන්න මට පුළුවන් වුණා.

ඒ වෙද්දි හතර අතින් එළිය වැටීගෙන එනව. හිරු රැස් ලස්සනට ගාණට කපාපු තණ පිට්ටනි එළිය කළා. වටේ තිබ්බ ගොඩනැඟිලි එහෙම පික්චර් පෝස්ට්කාඩ් එකක වගේ බොහොම ලකේට පෙනුණ. ඒ වෙද්දි මං පහු කරමින් හිටියෙ ප්‍රොෆෙසර් ඩූබේගෙ ගෙදර. ප්‍රොෆෙසර් ඩූබේ!! මිනිහ දේශන නොදෙන වෙලාවල්වලදි ගෙදර ඉන්නෙ කොයි විදිහටද කියල මට හිතා ගන්නවත් බැරි වුණා. මිනිහ ටීවී බලන හැටි, ටොයිලට් ගිහින් චූ කරන හැටි, මේසෙ වාඩි වෙලා කෑම කන හැටි... මේ වගේ දර්ශනවල හරිම අස්වාභාවික බවක් තමයි මට දැනුණෙ... මේ වෙනකොට මගෙ සරුවාංගෙම දාඩියවලින් නෑවිලා. මූණ රතු පාටත් ඉක්මවල ගිහින් දම් පාටට හැරිල.

මං හති දදා නැවතුණා. එක පාරටම මාව වීසි වෙලා ගිහින් දණින් ඉන්දවුණා. හොම්බ තළා නොගෙන බේරුණේ අත් දෙක බිමට තියල. මොකක් වුණාද කියල හිතා ගන්න බැරුව තත්පරයක් දෙකක් ගෙවුණා. මාව මොකක හරි වැදිල වීසි වෙලා ගිහින් වැටිච්ච බව තේරුණේ එතකොටයි. ඒකෙ කම්පනයෙන් ගල් ගැහිච්ච මාව ඒකෙන් මිදෙන්න ටිකක් වෙලා ගියා. හුස්මක් කටක් අරගෙන මං ආපහු හැරිල බැලුව.

මාව හැප්පිලා තියෙන්නෙ... එහෙමත් නැත්තං මාව හප්පල තියෙන්නෙ රතු පාට මරුති කාර් එකක්. මගෙ නිලංකාර වෙච්ච ඇස්වලින් ඩ්‍රයිවර්ව බලා ගන්න මං කීප වතාවක් ඇස්පිල්ලන් ගැහුව. කවුද මේ මාව මරන්න හදපු එකා? මගෙ හුස්ම ගැනීමේ රිද්මය සාමාන්‍ය තත්ත්වෙට පත් වෙනකල් මං කල් මැරුව.

"ඌ... ඌප්...ප්...ස්... අයෑම් රියලි... රියලි... රියලි සොරි...!"

"රියලි" තුනක් එක්ක මිහිරි ගෑනු කටහඬක් මට ඇහුණා. ඕහ්... මගේ වයසෙම ලස්සන කෙල්ලෙක් ටිකක් බුරුල් ටී ෂර්ට් එකකුයි, දණිස්ස ළඟට විතර දිග කොට කලිසමකුයි ඇඳගෙන මගේ ඉස්සරහින් ප්‍රාදූර්භූත වුණා. ඒවා සාමාන්‍ය විදිහට ගෙදරට ඇඳගෙන ඉන්න ඇඳුම්... එයා කලබලෙන් මා දිහාට ආපු නිසාදෝ ටිකක් විතර ලිස්සල වැටෙන්න ගියත් එක්ක. එයා සෙරෙප්පුවත් නොදා හිටිය බව මං දැක්ක.

"අනේ... අයෑම් සෝ සොරි... ඔයාට ප්‍රශ්නයක් නැද්ද?" එයා ඇහුවෙ, උදේ පාන්දර හමන හීතල මුදු සුළඟට මූණට වැටුණු කොණ්ඩ කැල්ලක් ආයෙත් කන පිටිපස්සට රිංගවන ගමන්.

හහ්... ප්‍රශ්නයක් නැද්ද? ප්‍රශ්නයක් තියෙනව... මං හිතුව. ඒත් මෙහෙම දෙයක් තියෙනවනෙ. කෙල්ලෙක් කොල්ලෙක්ගෙන් ඒ වගේ ප්‍රශ්නයක් ඇහුවම, විශේෂයෙන්ම ලස්සන කෙල්ලෙක්... මොන කොල්ලටද කියන්න පුළුවන් ප්‍රශ්නයක් තියෙනවය... මට අමාරුය... මගෙ අත රිදෙනවය... මගෙ මෙතන තැළිලය කියල? ඒ නිසා මාත් ඒක සුළු දෙයක් බව ඇඟෙව්ව.





"අපෝ නෑ..." මං කිව්වෙ අත් දෙකේ ඇඟිලි විදහලා මිට මොළෝ ගන්න ගමන්.

"මං ඔයාට ලිෆ්ට් එකක් දෙන්නද?"

ඕ...හ්... සොඳුරු ඇරයුමක්! එයා ඒක කළේ මට නැගිටින්න අදව් කරන්න අතක් දික් කරගෙන ළඟට එන ගමන්.

එයා ළඟට එද්දි මං එයා දිහා හොඳට බැලුව. මං ගෑනු ළමයෙක්ව දකින්නෙ සෑහෙන කාලෙකට පස්සෙ නිසාද මන්ද, මට එයාව පෙනුණෙ සුරංගනාවියක් වගේ! එච්චරට ලස්සනයි. මං හිතන්නෙ එයා හිටියෙ ඇඳෙන් බැහැපු ගමන්. එයා රෑට නිදා ගන්න ඇඳපු ඇඳුමෙන්. රෑට නිදා ගන්න ඇඳුමට ලස්සනට පේන්නෙ කෙල්ලන්ව විතරයි. උදාහරණයක් හැටියට ආලෝක්ව ගත්තොත්, ඒකා රෑට අඳින පිජාමා කලිසමයි, හතර පස් පොළකට වෙඩි වැදුණු කබල් සුදු වෙස්ට් එකයි එක්ක පේන්නෙ ඇවිදින මළමිනියක් වගේ!

මං එයාගෙ අත අල්ලගෙන හෙමින්, වෙලා අරන් නැගිට්ට. එයාට නොතේරෙන විදිහටයි මං ඒ වෙලාව ගත්තෙ. "මං ජොගින්වලට ආව ගමන්..." මං කිව්ව. කාටද ඕනෙ ලස්සන කෙල්ලෙක්ගෙ අතක් අත අරින්න? ඒත් ඉතින් නැගිට්ටට පස්සෙ මට එහෙම කරන්න සිද්ධ වුණා!

"හායි... මම නේහා... අනේ සොරි අනේ..." එයා ආයෙත් සමාව ඉල්ලුවෙ තවත් සැරයක් කොණ්ඩෙ හදන ගමන්. ඒ, මං අල්ලගෙන හිටිය අතින්.

"මං හරී... හරී කිව්වෙ ඕකේ කියන එක නෙවෙයි. මං හරිකුමාර්... යාළුවො කියන්නෙ හරී කියල... තව පොඩ්ඩෙන් හරී - වැරදි වෙනව..." මං හිනා වෙවී කිව්ව.

"අනේ මං තාම ඩ්‍රයිව් කරන්න පුරුදු වෙනව..." එයා මරුටියෙ ගහල තිබ්බ 'L' අකුර පෙන්නුව. "අහ්... ඒ කියන්නෙ L අකුර ගහගෙන ගියාම මිනිස්සුන්ව හප්පන්න පුළුවන්, අවුලක් නෑ... එහෙමද?" මං එහෙම හිතුවත්, ඒක කටින් පිට කළේ නෑ.

විශේෂයෙන්ම L අකුර ගහගෙන යන ලස්සන කෙල්ලන්ට එහෙම කරන්න පර්මිෂන් ඇති... මං හිතුව.

හැබැයි ඉතින් ඇත්තම කිව්වොත් මට මොන හෙණයක්වත් වෙලා තිබ්බෙ නෑ. එකක්... එයා එළවගෙන ආවෙ පැයට කිලෝමීටර් දෙකක විතර ගොළුබෙලි වේගෙන්. අනික, බොහොමයක් අය බිම වැටුණම ඩැමේජ් වෙන්නෙ ටිෂූස්. මගෙ එහෙම වුණේ නෑ. මොකද ඒ ටිෂූස් කෙළින්ම පොළොවෙ හැපුණෙ නෑ. මගේ ඇගේ මස්වලට ඒව බම්ප් වුණා විතරයි...! මහතට හිටියම ඒ වගේ පොඩි පොඩි චාන්ස් හම්බ වෙනව. ඒ කොහොම වුණත් මේ රත්තරන් අවස්ථාව මඟ ඇරගන්න මට මොනම ඕනකමක්වත් තිබ්බෙ නෑ.

"ඔයාට ෂුවර්ද ඔයාට ලිෆ්ට් එකක් ඕනෙ නෑ කියල... අනේ මට හරිම අප්සෙට්..." එයා ආයිත් කම්පා වෙවී කිව්ව.

"බූරුවො... ලිෆ්ට් එපා කියන්න එපා..." කවුදෝ මගේ ඔළුව ඇතුළෙ ඉඳල බෙරිහන් දුන්න.

"ඇත්තම කිව්වොත් මට කුමාඕන්වලට යන්න පුළුවන්නං හොඳයි..." මං කිව්ව.

"අපෝ සුළු දෙයක්නෙ... නඟින්න." එයා හිනා වුණා. "ඔයා මගෙ ඩ්‍රයිවින් විශ්වාස කරනවනං විතරක්...!!"

අපි කාර් එකට නැග්ගා. එයා බොහොම සීරුවට ඩ්‍රයිවින් සීට් එකේ වාඩිවෙනව මං බලාගෙන. හරියට නිකං අඟහරු යානෙක ප්‍රධාන මෙහෙයුම් සීට් එකේ ඉඳගන්න තරමෙම පරිස්සමක් ඒක! එයා එයාගෙ නිරුවත් පතුලක් ඇක්සලරේටරේ උඩින් තිබ්බ. ඒක මට ගෙනාවෙ අමුතුම ශෘංගාරාත්මක හැඟීමක්. එයාගෙ කකුලෙ නියපොතු, මෙරූන් පාටින් පාට කරලයි තිබ්බෙ. ඒ වගේම කකුලෙ තව ඇඟිලි දෙකකට විතර මුදු දාලත් තිබ්බ. ඇත්තටම කෙල්ලන්ට විතරනෙ එහෙම පැලඳුම් කරන්න පුළුවන්! මට ඕනෙ වුණේ තවත් ටික වෙලාවක් එයාගෙ කකුල දිහා බලාගෙන ඉන්න. ඒත් ඒක කරන්න බැරි වුණේ එයා කතාව පටන් ගත්ත හින්ද.





"ඔයා කුමාඕන් හොස්ටල් එකේද...? ඒ කියන්නෙ ස්ටුඩන්ට් කෙනෙක් ආ..?"

"ඔව්... ෆස්ට් ඉයර්... මෙකැනිකල් ඉංජිනියරින්..."

"කූල්... ඉතින් මොකද ඔයා හිතන්නෙ කැම්පස් එක ගැන... හොඳයිද...?"

"එච්චර දෙයක් හිතන්න උනේ නෑ. හැම තිස්සෙම පිස්සු බල්ලො වගේ වැඩ... වැඩ... එහෙ දුවනව... මෙහෙ දුවනව..."

"ඒ කියන්නෙ ඔයාලට සෑහෙන්න ඉගෙන ගන්න තියෙනව. පාඩම් කරන්න තියෙනව එහෙමද?"

"ඔව්... ඒ මදිවට සමහර බූරු ප්‍රොෆෙසර්ල ඉන්නව අපිට ප්‍රෙෂර් හදවන විදිහෙ..."

"මගෙ තාත්තිත් ප්‍රොෆෙසර් කෙනෙක්..." නේහා කියපි!

"ඇහ්... මොකා...?" මාව උඩ ගියා. හොඳ වෙලාවට ප්‍රොෆෙසර්ස්ල ගැන මට හිතෙන ඔක්කොම කටින් පිට නොකළේ! දෙයියනේ... මෙයා ප්‍රොෆෙසර් ඩුබේගෙ දුවනං වෙන්න එපා...!

"අපි ඉන්නෙ ෆැකල්ටි හවුසිං ස්කීම් එකේ..." ඒ වෙද්දි කාර් එක හවුසිං ස්කීම් එක පහු කරල ලෙක්චර් හෝල්ස් තියෙන හරියට ඇවිත් තිබ්බ.

"අර හරියෙ තමයි තාත්තිගෙ ඔෆිස් එකත්!" එයා ඒ බිල්ඩිමේ තිබ්බ කාමර දොළහක විතර කොටසක් පෙන්නුව.

"ඇත්තට...?" මේ වෙද්දි මං ආපහු මම කිව්ව කරපු දේවල් මොනවද කියල කල්පනා කර කර හිටියෙ. මගෙ බෙල්ලට තොණ්ඩුව වැටෙන්න පුළුවන් විදිහෙ දෙයක් මං කිව්වද? "මොකක්ද තාත්තිගෙ නම...?" මං ඕනවට එපාවට වගේ ඇහුව.

"ප්‍රොෆෙසර් චෙරියන්... ඔයාල එයාව දන්නෙ නැතුව ඇති. එයා ඔයාලගෙ ලෙක්චරින්වලට එන්නෙ තර්ඩ් ඉයර් එකේදි..."

මං ඔළුව වැනුව. මං ඒ නම අහල තිබ්බත් එයාව දැකල තිබ්බෙ නෑ. එතකොටම මට අපේ පළවෙනිම පන්තිය මතක් වුණා.

“එයා මෙකැනිකල් ඉංජිනියරින් ඩිපාර්ට්මන්ට් හෙඩ් නේද?” මං ඇහුවෙ බොහොම විනීත විදිහට, එයාගෙ කකුල්වලින් මගෙ ඇස් අහකට ගන්න ගමන්.

මගෙ නොසන්සුන්කම එයාට තේරුණ නිසාදෝ, ගියර් මාරු කරන ගමන් එයා මගෙ අතට දෙතුන් පාරක් තට්ටු කළා හිනා වෙවී.

“ඔව්... ඩිපාර්ට්මන්ට් හෙඩ් තමයි... කලබල වෙන්න ඕනෙ නෑ. ඔයාලගෙ ප්‍රොෆෙසර් එයානෙ... මං නෙවෙයිනෙ...” එහෙම කියල එයා බක බක ගාලා හිනා වෙන්න ගත්තෙ හරියට මගෙ හිත කියෙව්ව වගේ.

අපි දිගටම කතා කර කර ආවා. එයා මට එයා ගැන, එයාගෙ කැම්පස් එක ගැන විස්තර කිව්ව. එයා කරන්නෙ ෆැෂන් ඩිසයින්. එයාලා මේ කැම්පස් එකේ ක්වාටස්වල පදිංචියට ඇවිත් අවුරුදු දහයකට වැඩිලු. ඒ නිසා මේකෙ ඉන්න ප්‍රොෆෙසර්ස්ලව ඔක්කොමල වගේ දන්නවලු.

අපි කුමාඕන් කිට්ටුවට ආවම, එයා ආපහු සමාව ඉල්ලුව. මං වෙනුවෙන් මොනව හරි කරන්න තියෙනවද කියල දිගින් දිගටම ඇහුව.

“නෑ... නෑ... ඔක්කොම හරි. තැන්ක්ස්... අවුලක් නෑ...” මං සහතික වුණා.

“ෂුවර්ද...? ඔයා ජොග් කරනකොට ආපහු මට දකින්න පුළුවන් වේවිනෙ...” එයා කිව්ව.

“ඔව් මං හිතන්නෙ...” මං රයන්කාරයට පින් දුන්න.

“නියමයි... මට පුළුවන් ඔයාව ඕන්නං ඩියර් පාක් එකට දාන්න. ඒක කැම්පස් එකෙන් එළියෙ තියෙන්නෙ. එතනට එනව





ගොඩක් දෙනෙක් ජොගිං කරන්න... අනික එතන තියෙනව ෂෝක් මෝර්නිං ටී ස්නැක් ෂොප් වගේකුත්... කොහොමටත් මං ඔයාට ට්‍රීට් එකක් ණයයි...” නේහා හිනා වෙවී කිව්ව.

මගෙ ඩිපාර්ට්මන්ට් හෙඩ්ගේ දූ කුමාරිව තව පාරක් හම්බ වෙන එක ගැන මගේ හිතේ ඇති වුණේ පොඩි ගැස්මක්. ඒත් එයාගෙ ඉල්ලීම, විශේෂයෙන්ම එයාව අත හරින්න බැරි හැඟීමක්, ප්‍රතික්ෂේප කරන්න බැරි හැඟීමක් මාව ආක්‍රමණය කළා.

“නියමයි...” මං කිව්වෙ කාර් එකෙන් බහින ගමන්. “ඔහොම ට්‍රීට් දෙනවනං මරුනෙ... එහෙමනං ඔයා මාව දිගටම හප්පන්න...!!”

නේහා හිනා වුණා. එයා අත වනාගෙන පිටත් වුණා. රතු පාට මරුතිය ඈතට ගිහින් නොපෙනී ගියා. ඒත් එයාගෙ පෙනුම, සුවඳ මා එක්කම ඉන්නව වගෙයි මට දැනුණෙ. රයන් මං එනකල් බලාගෙන ඉඳල පුෂ් අප්ස්ද පුෂ් ඩවුන්ද මොනවදෝ කර කර හිටිය. මිනිහ දැකල තිබ්බ මං මරුටියෙන් බහිනව. ඌට ඕනෙ වුණා සිද්ධ වෙච්ච හැම දේම අකුරක්, අල්පයක් නැතුව දැන ගන්න. ඊට පස්සෙ මට සිද්ධ වුණා ආපහු මුළු රෙකෝඩ් එකම ආලෝකයටත් දාන්න. උන් බොහොම උනන්දුවෙන් එයා ගැන විස්තර ඇහුවත් ඒ ගමන්ම මට අවවාද කරන්න අමතක කළෙත් නෑ.

“බලාගෙන පුතෝ... ප්‍රවේසමෙන්... ප්‍රොෆාගෙ දුවනෙ...!”

ඒත් එයාලා නේහාව දැකල තිබ්බෙවත්, එයත් එක්ක කතා කරල තිබ්බෙවත් නෑ. මං ඇඟිලි ගැණ ගැණ හිටියෙ ආයෙ එයාව දකින්නෙ කවදද කියල. එයාගෙ ඒ සුන්දර නිරුවත් දෙපතුල් ආයෙ කවදා මගේ ඇහැ ගැටේවිද කියල!

# 4

## පැය 3 1/2 පාඩම් - ඉතිරි ටිකේ ෆන්

ෆර්ස්ට් සෙමෙස්ටර් එක මැද්දෙදි අපේ ඔළුවලට පරණ පිනක් කඩාගෙන වැටුණා. රයන්ගෙ අම්මයි තාත්තයි මිනිහට නත්තල් තෑග්ගක් හැටියට ඩොලර්වලින් චෙක් එකක් එවල තිබ්බ, යුරෝපෙ අය දරුවන්ට කරන විදිහටම! හැබැයි රයන්ලා කතෝලික නෙවෙයි. ඌ ක්‍රිස්තියානි ආගම ගැන දන්න ඉලව්වක් ඇත්තෙත් නෑ. ඒත් චෙක් ගැන, ඒව සල්ලි කර ගැනීම ගැන හොඳ දැනුමක් අපි හැමෝටම වගේ තිබ්බ. රයන් ඒකෙන් ගත්ත අලුත්ම ටොයියා ස්කූටරයක්... කයිනටික් හොන්ඩා...! මෙටලික් බ්ලූ!!

ඒක කුමාඕන්වලට ගෙනාවම හැමෝම වට වුණා ඒක බලන්න. හැබැයි ඒකෙ වාඩි වෙන්න අවසර තිබ්බෙ මටයි, ආලෝක්ටයි විතරයි. ඒකෙ යන්න පුළුවන් දෙන්නෙකුට විතරක් වුණත් රයන් අපි දෙන්නවම ඒකෙ ආගෙන ගියා. පන්තිවලට... කැන්ටිමට... කලාතුරකින් ෆිල්ම් එකක් (ටර්මිනේටර් වගේ) බලන්න යනකොට. දකින එවුන්නං අපිට ඉරිසියා කරන්න ඇති. අපි තුන්දෙනාගෙ බර හින්ද ස්කූටරේ සෑහෙන දුකක් විඳින්නත් ඇති. පව්...!

ඔය අතරෙදි පන්තිවල තත්ත්වෙනං එන්න එන්නම නරක් වුණා. ප්‍රොෆෙසර්ස්ල අපේ ඔළු උඩ වැඩ පැටෙව්වෙ නැහීගෙන පාඩම් කළත් පන්තියෙ සාමාන්‍ය ලකුණු මට්ටමටවත් එන්න





බැරි විදිහට! අපි බෙල්ල කඩාගෙන පාඩම් කළා. එසයින්මන්ට්ස් සමහරකට අපි සාමාන්‍ය ලකුණු ගත්තත් ෆිසික්ස් නම් දිගටම ඇන ගත්ත.

එක දවසක් රෑ ආලෝක්ට කෝල් එකක් ආපි. තාත්තට මොකක්ද වෙලාලු... වහාම ඉස්පිරිතාලෙට ගෙනියන්න ඕනෙලු කියල. ආලෝක්ගෙ අම්මා ජීවිතේට තනියෙන් ඒ වගේ වගකීමක් අරගෙන නැහැයිලු. ඒත් ඒ වෙලාවෙදි එයා ඒක කරන්න තීරණේ කළාට මොකද එයාට ඒක බැරි බව ආලෝක් දන්නව.

ෆිසික්ස් ප්‍රශ්න පත්තරයක් අත ළඟ තියෙන ආරංචි ඒ වෙත්දිත් පැතිරලයි තිබ්බෙ. ඒත් ආලෝක් තීරණේ කළා ගෙදර යන්න. රයන් එයාගෙ ස්කූටර් එක දුන්න. ඒත් මොකක්ද ඇති වැඩේ? ආලෝකය එළවන්න පුළුවන් එකෙක්යෑ. ඒ නිසා එළවගෙන යන්න රයන්ම ඉදිරිපත් වුණා. මං විතරක් මොකටද තනියෙන් ඉන්නෙ කියල මාත් ඒ ගමනට එකතු වුණා.

ඒ තමයි, මම ආලෝක්ගෙ ගෙදර දැකපු පළවෙනි වතාව. මම කියල තිබ්බනෙ එයාලා දුප්පත් කියල. ඒකෙන් අදහස් කරන්නෙ නෑ එයාලා ලෝක බැංකුවෙන් දාන ඇඩ්ස්වල ඉන්න සාගතේට අහු වෙච්ච ඉතියෝපියන්කාරයො වගේය කියල. නමුත් එයාලගෙ ගෙදර තිබ්බෙ සෝචනීය තත්ත්වයක්. පවුලකට නොමැරී, හිඟා නොකා ජීවත් වෙන්න පුළුවන් අඩුම මට්ටමක. පවුලකට ජීවිතේ ගෙනියන්න පුළුවන් අවම තත්ත්වෙක. එහෙ ලයිට් තිබ්බ... ඒත් ලැම්ප්ෂේඩ්ස් තිබ්බෙ නෑ. සාලයක් තිබ්බ... සැටි සෙට් එකක් තිබ්බෙ නෑ. ටී.වී. එකක් තිබ්බ... කලර්ස් නෑ. ආලෝක්ගෙ තාත්තගෙ සදාකාලික තිප්පොළ වෙලා තිබ්බෙත් සාලෙ. ටී.වී. එකේ චැනල්ස් දෙකෙන් එකක් එයා අයිති කරගෙන. ඒත් අපි යද්දි එයා හිටියෙ සිහිය නැති තත්ත්වෙක. ආලෝක්ගෙ අම්මා සාරි පොටෙන් කඳුළු පිහදදා හිටිය.

"ආලෝක්... අනේ දෙයියනේ... බලන්නකො ඔයා නැතුව වෙච්ච් දෙයක්..." ආලෝක්ගෙ අම්මා හරිම දුක්බරිත ස්වරයකින් කිව්ව. ඒක කොච්චර සෝකීද කිව්වොත්, ඒ කටහඬ ඇහුවනං

හිට්ලර් වුණත් අඬනව. ආලෝක්ට කන්කෙඳිරි ගෑම, ඤුරු ඤුරු ගෑම, මැසිවිලි කීම උරුම වුණේ කාගෙන්ද කියල මට හොඳට තේරුම් ගියේ එතකොට තමයි.

මං ටක් ගාලා ට්‍රයිෂෝ එකකට කතා කළා. අපි ආලෝක්ගෙ තාත්තවත් අරගෙන එවෙලේම ඉස්පිරිතාලෙට ගිහිල්ල එයාව ඇතුළු කරල දොස්තර එයාව බලනකල් බලාගෙන හිටිය. පිනට බේත් දෙන නිසා සෙනඟ පිරිල උතුරන ඉස්පිරිතාලෙ, ආලෝක්ගෙ තාත්තගෙ වාරෙ කොයි වෙලේ එයිද කියල දොස්තරවත් දැනගෙන හිටියෙ නෑ. ඒ වගේ තැනක වැඩ කරන්න තරම් දොස්තරල අවාසනාවන්ත වෙලා හිටිය. ඒව ඉවර වෙලා ඉස්පිරිතාල ගඳයි, බේත් ගඳයි අරගෙන අපි ආපහු කුමාඕන්වලට එද්දි පාන්දර තුන විතර වෙලා.

ඊළඟ දවසෙ මොකද වුණේ කියල අලුතින් කියන්න ඕනයැ? පැතිරිලා තිබ්බ ආරංචියෙ විදිහටම ඊළඟ දවසෙ ෆිසික්ස් ටෙස්ට් එක තිබ්බ. ආයෙ නෑ... ඇනෙන එක ඇනුණා ලෙසට! අපි තුන් දෙනාටම විස්සෙන් දෙකයි... එකයි... ඔහොමයි ලකුණු තිබ්බෙ. ආලෝක් අපට වෙච්ච දේ කියල ආයි උත්තර ලියන්න අවස්ථාවක් ඉල්ලුව. ඒ වෙලාවෙදි ප්‍රොෆෙසර්ගෙ මූණ බලන්නයි තිබ්බෙ! ඒ වෙලාවෙදි එයාගෙ මූණෙ මතු වුණේ හරියට අපි එයාගෙ වකුගඩු දෙකම අපිට දෙන්න කියලා ඉල්ලුවහම මතුවෙන පෙනුම වගේ පෙනුමක්!

ඒ වැඩෙන් ආලෝක් විභාග ගැන දක්වපු ආකල්පෙ චුට්ටකින් විතර වෙනස් කර ගත්ත. ඊට පස්සෙදි රයන් අපේ විභාග ගැන, අපේ පාඩම් ගැන විවේචනය කරද්දි මිනිහ ඒවට ඉස්සර තරම් ලේ කෝප කර ගත්තෙ නෑ.

"ඔයාල දන්නවද... මේ අයි.අයි.ටී. සිස්ටම් එකම මහ බොරුවක්..." රයන් කිව්ව.

"ඔන්න පටන් ගත්ත ආයෙත්..." මං වටපිට බැලුව. අපි හිටියෙ මගෙ කාමරේ. මං හිතුවෙ ආලෝක්ට ඒකට තද වෙයි කියල. හැබැයි ඒ වෙනුවට මිනිහ රයන්ට පොඩි ඉඩක් දුන්න මේ පාර.





"ඇයි...?" ආලෝක් ඇහුව.

"ඇයි? හොඳයි. මට කියන්න බලන්න මෙච්චර කාලෙකට අයි.අයි.ටී. එකෙන් ශ්‍රේෂ්ඨ විද්‍යාඥයො කී දෙනෙක් බිහි වෙලා තියෙනවද... ශ්‍රේෂ්ඨ... ලෝකෙ පිළිගත්තු ඉංජිනේරුවො කී දෙනෙක් බිහිවෙලා තියෙනවද කියල...?"

"මොන ගොන් ප්‍රශ්නයක්ද ඒක... සීඊඕස්ලම කී දෙනෙක් ඉන්නවද මේකෙ ඉගෙන ගත්තු? වෙන වෙන අංශවලිනුත්, ඒ කිව්වෙ තමන්ගෙම ව්‍යාපාර කරන කී දෙනෙක් ඉන්නවද මේකෙන් පිටවෙච්ච...?" මං රයන්ගෙ කතාව කියල ඉවර වෙන්න කලින්ම පැන්න. හැබැයි ඒක වැරදි වෙලාවකදියි කිව්වෙ කියල මට තේරුණේ පස්සෙ.

"මේක මුළු ඉන්දියාවෙම තියෙන හොඳම කොලේජ් එක... බිලියන් ගාණක ජනගහනයට තියෙන හොඳම ටෙක්නිකල් ඉන්ස්ටිටියුට් එක... හරිද...? කෝ එහෙනං මෙච්චර කාලෙකට මේකෙන් හොයා ගත්තු නව නිපැයුමක්? ඇයි එහෙම එකක් නැත්තෙ? ඉන්දියාවෙ ටෙක්නිකල් පැත්තට, මේකෙන් ලැබිල තියෙන දායකත්වය මොකක්ද?"

"ඉතින් දෙයියනේ රටට ඉංජිනේරුවො බිහි කරනව කියන්නෙ රටේ දියුණුවට දායක වෙනව කියන එකනෙ. වෙන මොකක්ද?" ආලෝක් ඇහුවෙ පොත වහන ගමන්. එදා රෑට අපි ඊට වඩා පාඩම් නොකරන බව ඒකෙන්ම මට තේරුණා. සෂී රෙස්ටොරන්ට් එකට ගිහින් පරෝටා කමු කියන යෝජනාව ඉහළින්ම සම්මත උනා. හොස්ටල් එකේ බඩකඩුත්තු කාල අපිට එපා වෙලයි තිබ්බෙ.

රයන් ආපහු මිනිහගෙ දර්ශනේ ඉදිරිපත් කරන්න වුණා.

"අවුරුදු තිහක් තිස්සෙ අයි.අයි.ටී. එකෙන් කෙරිල තියෙන්නෙ මොකක්ද? දන්නවද? බහුජාතික සමාගම්වල වැඩ කරන්න පොරවල් ටිකක් පිට කරපු එක. උන්ට මොළේ තියෙනව... මං නෑ කියන්නෙ නෑ. ඒත් මොකක්ද ඒකෙන් රටට වෙලා තියෙන සෙතේ...? මං කියන්නෙ මේකයි. දැන් බලන්න ඇමෙරිකාවෙ එම්.අයි.ටී. එක දිහා..."

"මේක ඇමරිකාව නෙවෙයිනෙ." මං සෂී රෙස්ටොරන්ට් එකේ වේටර් කෙනෙකුට පරෝටා පිඟන් තුනක් ගේන්නයි කියන ගමන්ම කිව්ව. "උන්ට තියෙනව සල්ලි උතුරන්න... එම්.අයි.ටී. එකට සල්ලි වෙන් කරනව ඇත්තෙ ඩොලර් බිලියන්වලින්..."

"අනික මොකක්ද ඔය කතාවෙන් ඇති පලේ? මට ඕනෙ කරන්නෙ මේකෙන් කොහොම හරි ඩිග්‍රිය ගහල ජොබ් එකකට පැන ගන්න විතරයි..." ආලෝක් කිව්ව.

සෂී කියන්නෙ අයි.අයි.ටී. හොස්ටල් එකේ ගේට්ටුවෙන් පිටවුණු ගමන්ම වගේ හදල තිබ්බ අනවසර ඉදි කිරීමකට. ඒකට හරිහමන් වහලයක්වත් තිබ්බෙ නෑ... තිබ්බෙ ටෙන්ට් රෙද්දක්. වාඩි වෙන්න තිබ්බෙ ස්ටූල්ස්. සොබාවික හුළං වැදි වැදි කතහැකි. එයාලගෙ මෙනු එකේ පරෝටා, ලෙමනේඩ් වගේම සිගරැටුත් තිබ්බ. රුපියල් දෙකකට බටර් පරෝටා එකක් ගණන් වැඩි වුණත් අපිට ඒකෙන් වෙන් වෙන්න හිතක් තිබ්බෙ නෑ. සෂී එක කරන එවුන් දැනගෙන හිටියා හොස්ටල් කෑම කුජීතයි කියල. ඒ නිසා අයි.අයි.ටී. එකේ තිබ්බ හොස්ටල් ගණනාවකින්ම සෑහෙන සෙට් එකක් එයාල ළඟට එනව කියල. කොච්චර හරි සෂී දිව්වෙ හොස්ටල් කොල්ලන්ගෙන්. අපේ පරෝටා ටික පිඟන් තුනක් උඩ අඩුක් වෙලා අපි ළඟට ආව. උණු උණු පරෝටා උඩට අල තිබ්බ බටර් තලිය, පරෝටාවල රස්නෙට දිය වෙද්දි අපිට ආවෙ කුඩා බඩවැල් දිග ඇරෙන තරමෙ මිහිරි සුවඳක්!

"මේකයි... හැම තිස්සෙම හැමදේම සල්ලිවලින් මනින්න එපා..." රයන් සිගරැට් ඇල්ල කඩන ගමන් කිව්ව. "මං පිළිගන්නව... අයි.අයි.ටී. එකට බෑ අභ්‍යවකාශ පරීක්ෂණ කරන්න... ඒත් අයි.අයි.ටී. එකට බැරි වෙන්න හේතුවක් නැහැ රටට ඕනෙ කරන වැඩිය සල්ලිත් නොයන අලුත් දෙයක් කරන්න? මොකක් හරි දේකට අලුත් මැෂිමක් හොයා ගන්න? එතනදි සල්ලි නෑ කියන්නෙ සමාවට කාරණයක් නෙවෙයි. ඒ වගේ ප්‍රයෝජනවත් දෙයක් හැදුවොත් අයි.අයි.ටී. එකටත් ඒවට අදාළ බිස්නස්කාරයො සල්ලි දේවි. ඒව වැඩි දියුණු කරගන්න උදව් කරාවි..."





"එහෙනං මොන මළඉලව්වක් හින්දද එහෙම නොවෙන්නෙ?" මට යකා නැඟගෙන එන්න පටන් අරගෙනයි තිබ්බෙ. ඇත්තටම මං හිතුවෙ දැන් රයන් කට වහනවනං හොඳයි කියලයි. අපේ කෑමත් ඇවිත් තියෙන එකේ! මිනිහට අයි.අයි.ටී. එක එපානං, ඉගෙන ගන්න ඕනෙ නැත්තං ඒක එකක්. ඒත් අපිට දේශනා පවත්වන එක? උණු පරෝටා උඩ බටර් දිය වෙද්දි?

"එහෙම වෙන්නෙ මේකෙ සිස්ටම් එක වැරදි නිසා..." රයන් කිව්වෙ දේශපාලකයෙක් වගේ. උනුත් එහෙමනෙ...! හැම දේකටම දොස් කියල, ඒකට හේතුව හැටියට කියන්නෙ පවතින ක්‍රමයෙ දුර්වලතාව...!!

ඒත් රයන්ට කියන්න තව දේවල් තිබ්බ. "මේකෙ හැටියට වෙන්නෙ මේකෙ ඉගෙන ගන්න එවුන්ව හෙම්බත් කරන එක... උන්ව එක එක ග්‍රේඩ්ස්වලට ඉහළ පහළ දාන එක...! මං කියන්නෙ මේකෙ කරන්නෙ අපේ ජීවිතවල හොඳම කාලෙ කාබාසීනියා කරන එක. මේකෙදි කාබාසිනියා වෙන්නෙ ඒක විතරක් නෙවෙයි... අපේ නිරවුල් හිතිවිලිත් කාබාසිනියා කරනව... ඒව මරල දානව... ඒවට තැනක් දෙන්නෙ නෑ... තැන දෙන්නේ විභාගවලටයි... ලකුණුවලටයි... අපේ නිර්මාණශීලීතාව... කෝ ඒකට ඉඩක්...? කවුද ඒව ගැන අහන්නෙ? හොයන්නෙ? මේක හරි අසාධාරණයි..."

"මොකක්ද අසාධාරණේ? එයාල උගන්වනව... අපි ඉගෙනගෙන විභාග පාස් වෙලා ඩිග්‍රිය අරන් රස්සාවට යනව. මටනං ඕනෙ එච්චරයි..." ආලෝක් කිව්ව.

"අඩේ... මාරයිනෙ..." මං උල්පන්දම් දුන්න.

"ආ...න්...න... අනික් හේතුව. ඔයාලගෙ ඔය ආකල්ප! ඒක තමා අනිත් ප්‍රශ්නෙ... ඔයාලට මං කියන එක තේරෙන්නෙ නෑ. ඒ නිසා අපි ඒක අල්ලල දාමු..." රයන් කිව්ව.

"අඩේ... ඒකත් මාරයි..." මං ඒකටත් කිව්ව. ආලෝක් මා දිහා බැලුව. එක පාරටම ආලෝක්ගෙයි, මගෙයි හිනාවල් කටවල්වලින්

පැනල මල් වෙඩිල්ලක් වගේ පිපිරුණා. අපේ මේ හැසිරීමට රයන්ගෙ මල පනින බව මං හොඳටම දැනන් හිටිය. ඇත්තටම මට ඕනෙ වුණේ රයන්ට එහෙම කරවන්න. අඩු ගානෙ එතකොටවත් මිනිහ අපිට දේශනාව දෙන එක නවත්තන්නෙ නැතෑ! එහෙමත් නැත්තං වෙන මාතෘකාවක් පටන් ගන්නෙ නැතෑ...!

"මෝල්ලු...!" රයන් එහෙම කියල පිඟාන දිහාට ඔළුව පාත් කර ගත්තා.

"ඒක අල්ලල දාමු... ඒක නෙවෙයි මොනවද වීක්එන්ඩ් එකේ ප්ලෑන්...?"

"මුකුත් නෑ... ඇයි...?" ආලෝක් ඇහුව.

"අපිට දැන් ස්කූටරේකුත් තියෙන එකේ..."

රයන් සද්ද නැතුව හිටිය.

"මොකෝ මේ මිනිහ මැරිච්චි ගෑනියෙක් වගේ බුම්මං." මං රයන්ට වැළමිටෙන් ඇන්න. මිනිහට හිනා නොවී ඉන්න බැරි වුණා.

"හරි... හරි... ඉතින් යමු... කතාව ඉවරනෙ..." රයන් හිනා වෙවීම කිව්ව. "අපි යමු කොනෝට් ප්ලේස්..."

"මොකෝ එහෙ...?" ආලෝක් ඇහුව.

"එහෙ ඩාබා හරි ලාබයි. ඒකත් එක්ක උන් දෙනව එළම එළ බටර් චිකන් එකකුත්. අම්මා...හ්." රයන් හිතෙන් ඩාබා එකක් කෑව. "අනික අපිට හින්දි ෆිල්ම් එකකුත් බලතහැකි. එහෙ මාකට් එකේ හොඳ හොඳ කැලිත් ඉන්නව..." රයන් කොනෝට් ප්ලේස් එක ගැන විග්‍රහයක් කළා.

"නියමයිනෙ..." මට කියවුණා. රයන් එහෙ ඉන්න "හොඳ හොඳ කැලි" ගැන කිව්වම මට මතක් වුණේ නේහාව. "ෂිඃ... ආයෙ මට එයාව හම්බවුණේ නෑනෙ..." ආපහු ජොගිං යන්න මං තීරණේ කළා.





"ආලෝක්... මොකෝ කියන්නෙ? ඔයත් එනවනෙ...? නැද්ද හොඳයි... එහෙමත් නැත්තං මෙහෙ ඉඳන් පාඩම් කරන්නද කල්පනාව?"

"ම්... ම්... ඇප් මැක් එසයින්මන්ට් එකකුත් තියෙනව. ම්... කමක් නෑ. ඒක යකාට ගියාවෙ. යං... මාත් එනව." ආලෝක් වීර පුරුෂයෙක් වුණා.

අපි ඒ සති අන්තෙදි කෝනට් ප්ලේස් ගිහින් වින්දෙ ඉහළම විනෝදයක්. බලපු හින්දි චිත්‍රපටියනං ඉතින් අනෙක් හින්දි චිත්‍රපටි වගේම තමයි. කෙල්ලයි කොල්ලයි හම්බ වෙනව. කොල්ල දුප්පත්. හැබැයි හිත හොඳ අවංක එකා! කෙල්ල පෝසත්. කෙල්ලගෙ තාත්ත හොර ජාවාරංකාරයෙක්. මේකෙ කෙල්ලට අරන් හිටිය නිළිය අලුත් කෙල්ලෙක් නිසා රසිකයන්ට ඒ ඇති. ඒකි වැස්සෙ තෙමෙනව. දුහුල් ඇඳුම ඇඟටම ඇලෙනව... ටෙනිස් ගහනව කොටම කොට ස්කර්ට් එකක් ඇඳගෙන. ටයිට් එකට ඇඳල ඩිස්කො යනව. කොටින්ම එයා තෝරගෙන තියෙන විනෝදාංශ ඔක්කොම වගේ ඇඳුම් බොහොම පොඩ්ඩක් අඳින්න ඕන ඒව. රසිකයො මන්මත් වෙනව. ජාවාරංකාර තාත්තට ඒ සම්බන්ධෙ අහුවෙලා කොල්ලව බාගෙට මරනව. ඒත් අන්තිමට අවංක, උත්තරීතර ආලය හින්ද තාත්ත පරදිනව. වැඩේ කියන්නෙ උන්ට නෑ මොකුත් එසයින්මන්ට්ස් එහෙම. නිදි මරාගෙන පාඩම් කරන්නත් නෑ. උන්ගෙ බෙල්ල කන්න බලන් ඉන්න ප්‍රොෆෙසර්ලත් නෑ. ඒ ඔක්කොම තියෙන්නෙ අපිට. හින්දි චිත්‍රපටි කියන්නෙ මහ අබූත ලෝකයක් බව මං දන්නව. ඒත් ඒ අබූත ලෝකෙට පුළුවන් ඇත්ත ලෝකෙ තියෙන දුක් කරදරවලින් පැය ගාණකට මිනිස්සුන්ව ගලෝගෙන, ඒ මිනිස්සුන්ට සතුට දෙන්න!

ෆිල්ම් එකට පස්සෙ දවල් කෑම. කිව්වත් වගේම ඩාබා එකනම් නියමයි! මොන හේතුවක් නිසා හරි ඒ වගේ දේවල්වලදි නම් රයන්ගෙ තීරණ හරියටම හරි! අපි හැමෝම වෙනුවෙන් කෑම ඕඩර් කළෙත් රයන්මයි. කොහොමටත් හැමදාම සිද්ධ වෙන්නෙ එහෙමයි. එහෙම ඕඩර් කරනකොටත් මිනිහ ආයෙ සුළුවෙන් එහෙම නෙවෙයි ඕඩර් කරන්නෙ. මහා පරිමාණයෙන්ම තමයි.

කටු නැති බටර් චිකන්වල ඉඳන්, ඩාල්ද, පරෝටද, රයිටද, වඩේද... ඔය ඔක්කොම මිනිහ ඕඩර් කරනව. වෙන එකක් තියා මිනිහ කොකාකෝලා බෝතලුත් ඕඩර් කරනව. සාමාන්‍ය ශිෂ්‍යයෙකුට දරන්න බෑ ඒ වියදං... හැබැයි මේකා නාස්තිකාර පුත්‍රයෙක්ද මන්දා... මොකා උනත් අපි බඩ පැළෙන්න කෑව. එයාර්කන්ඩිෂන් එකක් වගේම මැෂිමකින් විහිදුවපු සියුම් ජල වාෂ්පවලින් වටපිටාවම නැහැවිලා සිසිලසක් අපේ මූණවල්වල තැවරුණා.

ඉතියෝපියාවෙ අනාතයෙකුට යුනිසෙෆ් එකෙන් කෑම වේලවක් හම්බ වුණහම කන විදිහටම තමන්ගෙ රොටියෙන් කෑල්ලක් කඩා ගත්තු ආලෝක් කතා කරන්න ගත්ත.

"එළ කෑම ටික... චිකන් එකනං කියල වැඩක් නෑ... සුපිරි...!"

"හරි... ඉතින් කියමු බලන්න. අද අපි මැක්සා ෆන් එකක් ගත්තෙ නැද්ද හොඳයි...?" රයන් ඇහුවෙ ආඩම්බරෙන්.

"උහ්ග්... උහ්ග්..." ආලෝක් කටේ රොටි පුරෝගෙන කිව්ව දේ පරිවර්තනය කළහම ඒකෙ තේරුම වුණේ, "ඔව්... ඔව්..." කියන එකයි.

"එහෙනං මොන මඟුලකටද මිනිහො අපි පාඩම් පොත් මත්තෙ නහින්නෙ?"

"ඔන්න පටන් ගත්ත ආයෙත්..." මං මැසිවිල්ලෙක් වුණා. මේ වෙනකල්ම මං දවස විනෝදෙන් ගත කරල තිබ්බ. මගෙ යාළුවොය කියල ඉන්න මේ මෝල්ලු දෙන්නගෙ විකාර බලල සතුටු වුණා. හැබැයි මේ මාතෘකාව ආවොත්නං ඒ සතුට නැති වේවිය කියලයි මට හිතුණෙ.

"නෑ... නෑ... මෙතන කිසිම වාදයක් නෑ." රයන් කියපි. හැබැයි මිනිහ ඒක කියපු ස්වරයෙ තිබ්බෙම මාත් එක්ක වාද කිරීමේ ස්වරූපයක්. මිනිහ ගත්ත පපුව පුරෝල හුස්මක්. "හරි... ඕකේ... මේක අහන්නකො... මං හිතුව මෙහෙම..."





"අනේ දෙයියනේ ඔක්කොම ඉවර වෙන්නයි යන්නෙ... මේක නවත්තල දෙන්න" මං හිතෙන් දෙයියන්ට කිව්ව. ඒත් මං පරක්කු වැඩියි.

"මේක අහනවල... මේ තමයි අපේ ජීවිතවල හොඳම කාලෙ. ඇත්තටම ඒක එහෙමයි. විශේෂයෙන්ම ආලෝක් වගේ කෙනෙක්ගෙ."

"මං වගේ? මොකක්ද මගෙ තියෙන විශේෂෙ?" ආලෝක් සැලඩ් එකෙන් අමු මිරිස් කරලක් ගන්න ගමන් ඇහුව. මිනිහ වීරය වගේ ඒක කෑවට හායි හූයි ගාන්න ගත්ත.

"බැරි වැඩ නොකරං අබරෝ කිව්වෙ ඒකනෙ..." ආලෝක් කඳුළු පුරෝගෙන මා දිහා බැලුව.

"මොකෝ දන්නවද විසේසෙ..." රයන් එයාගෙ හේතු දැක්වීම කරන්න ගත්ත. "නිකං හිතන්න බලන්න මෙහාට එන්න කලින් ඔයාගෙ ජීවිතේ ගෙවුණු විදිහ... මං දන්නවා ඔයා තාත්තට ආදරේ බව... ගෙදරට ළැදි බව... ඒත් ඔයා පහුගිය අවුරුදු දෙකේදීම පාඩම් කළේ තාත්තට සාත්තු සප්පායම් කරන ගමං... මේක ඉවර වෙලා ආයෙ ගෙදර නවතින්න ගියහමත් ඔයාට කරන්න වෙන්නෙ ඒකමයි... නැද්ද හොඳයි?"

"මං දිල්ලියෙන් ජොබ් එකක් හොයා ගන්නව..." මේ පාර ආලෝක් කතා කළේ ටිකක් සීරියස් විදිහට. ඒත් මිනිහගෙ හිත සම්පූර්ණයෙන්ම කටු නැති කුකුළගෙන් අයින් වෙලා නැති බව මට හොඳට තේරුණා.

"ඔව් වෙන්න පුළුවන්... ඒත් ඒකෙන් ඔයාට තියෙන වගකීම නැති වෙන්නෙ නෑනෙ. ඔයා දිල්ලියෙ ඉඳල ජොබ් එකක් කළත් ගෙදරට සලකන්න ඕනෙ. සමහර විට තාත්තව බලා කියා ගන්න සාත්තුකාරයෙක්වත් කුලියට ගන්න වේවි... මේ වගේ ජීවිතයක් ඔයාට ආයෙ ලැබෙන්නෙ නැති විත්තිය ජේනවනෙ?"

ආලෝක් කන එක නැවැත්තුව. "රයන්... මං මගෙ අම්මටයි තාත්තටයි ආදරෙයි. ඒකයි මං එයාලව බලා ගන්නෙ. නැතුව වගකීමක් ඉෂ්ට කරන්න නෙවෙයි..." මිනිහට රයන්ගෙ කතාවෙන් හිත රිදිල වගෙයි.

"හරි... හරි... ඒක මං දන්නව." රයන් කිව්වෙ අතකුත් වන වන. "මං මගෙ දෙමවුපියන්ට ආදරේ නැති වුණාට මට ඒක තේරෙනව..."

"මොකක්?" මට කියවුණා. ඇත්තටම මට ඕන කරල තිබ්බෙ ඒ වාදෙට පැටලෙන්නෙ නැතුව ඉන්නයි. ඒත් මට ඉබේටම එහෙම කියවුණා.

"මං කිව්වෙ මං මගෙ අම්මටයි තාත්තටයි ආදරේ නෑ කියල. ඉතින් මොකෝ...? ඒක මහ ලොකු දෙයක්යැ?"

ආලෝක් මා දිහා බලල ඇස් ලොකු කළා. මට හිතා ගන්න පුළුවන් වුණා ආලෝක්ගෙ හිතේ තියෙන දේ. ආලෝක් හිතන්න ඇති මෙහෙම. "දෙයියනේ මගේ තාත්ත ඔහේ ඉන්නවට ඉන්නව. කතාබහක් නෑ. ඇවිදින්න කරන්න බෑ. එහෙව් තාත්තට මං මෙච්චර ආදරේ එකේ මූ මොනවද මේ කියන කතා? මූ මොන විදිහෙ පුතෙක්ද?"

ඇත්තටම රයන්ගෙ දෙමවුපියො කොච්චර හොඳද? ඌට හැමදේම දෙනව. හොඳ ඇඳුම් ගන්න සල්ලි... අපි වගේ බඩජාරියොන්ගෙ බඩ පුරවන්න හොඳ රෙස්ටොරන්ට්වලට ගෙවන්න සල්ලි... ස්කූටර්... එයාගෙ තාත්තල බොහොම මහන්සියෙන් දියුණු වෙච්චි අය. බොහොම පොඩියට පටන් ගත්තු අය. පස්සෙ මුළු ඉන්දියාවටම... ඊටත් පස්සෙ මුළු ලෝකෙටම. ඒත් මුලදී, එයාලට සල්ලි හිඟ කාලෙදි මේකව සන්තෝසෙන් තියන්න ඒ මිනිස්සු කොච්චර මහන්සි වෙන්න ඇද්ද? ඒත් දැන් මූ කියන කතා...?

"නොදකින් විතරක්..." මං කිව්ව.

"නොදකින් විතරක්...? ඇයි එහෙම කියන්නෙ...? අඩු ගානෙ මං කිව්ව දේ ඔයා හරියට අහගෙන ඉඳලවත් නෑ." රයන් කිව්ව.

හරියට හරි. මේ මෝලගෙ කතා මොකට අහගෙන ඉන්නවද?

"මොකක්ද ඔයාගෙ කතාවෙ තේරුම හොඳයි...?" ආලෝක් ආපහු කෑමවලට අවධානෙ යොමු කරන ගමන් ඇහුව.





"මං බෝඩිංවල හිටියෙ අවුරුදු හයේ ඉඳන්... අනික් හැම ළමයෙක්ම වගේ මාත් ඒකට කැමති වුණේ නෑ. එයාල මාව බෝඩිමේ නවත්තල යද්දි මං ඇඬුව. ඒත් අනික් අතට බෝඩිංවලින් තමයි මං හැමදේම ලබා ගත්තෙත්... මගේ වැඩ තනියම කර ගන්න පුරුදු වුණා... හොඳට ඉගෙන ගත්ත... ස්පෝට්ස් කළා... යාළුවො ඇති කරගත්ත. විනෝද වුණා... සමහරවිට ගෙදර ඉඳල ඉස්කෝලෙ ආව ගියානං ඒවා එහෙම නොවෙන්න තිබ්බ. ඒව එහෙම වුණ නිසාම මට එයාලව එච්චර ඕන උනේ නෑ... එයාල නැති මගේ ජීවිතේ මට සාමාන්‍ය දෙයක් වුණා. අපි නිවාඩුවලට හම්බ වුණා. එයාල මට ලිව්ව... සල්ලි එව්ව... ඒත්..."

"ඒත්... මොකක්ද?"

"ඒත් මට එයාල නෑ කියල අඩුවක්, පාළුවක් දැනුණෙ නෑ..."

"ඒක වැරදියි කියල ඔයාට හිතෙන්නෙ නැද්ද?" ආලෝක් ඇහුව.

"මොන පිස්සුද...? මගෙ ජීවිතේ තමයි යාළුවො... යාළුවො තමයි මගෙ පවුල! අම්මගෙයි, තාත්තගෙයි කිසි වරදක් නෑ... එයාල හරි හොඳයි... ඒත් මං යාළුවන්ට ආදරේ කරන තරමට එයාලට ආදරේ කරන්නෙ නෑ... මං මගෙ යාළුවන්ට ආදරෙයි..."

"ඕ... ඕ... ඒ කියන්නෙ ඔයා අපිට ආදරෙයි...!!" ආලෝක් මුදු, මොළොක් කෙල්ලෙක්ගෙ රඟපෑමකින් ඇහුව. "ඕ අයි ලව් යූ ටූ රයන්..."

ඒක ඇහිලද මන්ද, අහල පහල මේසවල හිටි එවුන් දෙතුන් දෙනෙක්ගෙ ඔළුගෙඩි අපි දිහාට හැරුණා. රයන් ආපහු එයාගෙ මූලික තර්කෙට ආව.

"කොහොම හරි, මං කියන්නෙ මේකයි... මේ තමයි අපේ ජීවිතවල හොඳම කාලෙ. අපිට පුළුවන් ඕන්නං පොත්ගුල්ලො වෙලා මැරෙනකල් පාඩම් කරන්න. නැත්තං අපිට පුළුවන් විභාගවලට, මේ සිස්ටම් එකට කුද ගහගන්න කියන්න..."

"හරි... කොහොමද අපි ඒවට එහෙම 'කුද ගහගනිං' කියන්නෙ?"

"මං කියන්නෙ නෑ අපි පාඩම් කරන එක එහෙම පිටින්ම නවත්තල පිස්සු කෙළින්න පටන් ගන්න ඕනෙ කියල. මං කියන්නෙ අපි සීමාවක් තියා ගන්න ඕනෙ... අපිට පුළුවන් දවසට පැය දෙක තුනක් හරියට පාඩම් කරල ඊට පස්සෙ පොඩි ෆන් එකක් ගන්න... මොකක් හරි ස්පෝට් එකක් කරන්න. ස්ක්වොෂ් වගේ... ඔයාල කවදාවත් ස්ක්වොෂ් සෙල්ලම් කරල තියේද? එහෙමත් නැත්තං අපිට පුළුවන් වාද කරන්න... ස්ක්‍රැබල් වගේ ගේම් එකක් ගහන්න... කැරම් ගහන්න... ෆිල්ම් එකක් බලන්න... ඕනෙ තරං දේවල් තියෙනව මේකෙ ඇතුළෙම අපිට කරන්න."

"තියෙනවානං තමයි... ඒත් වැඩියෙ කවුරුත් ඒව කරන්නෙ නෑ. එහෙම කරන එවුන්ගෙ ලකුණු ඔයාටම පේනවනෙ...?"

"ඒක තමයි මං කිව්වෙ... අපි පාඩම් කරන එක එහෙම පිටින්ම නවත්තන්න ඕනෙ නෑ කියල... අපි සීමාවල් තියා ගමු. දවසක්ම පන්ති... ඊළඟට පැය තුනක් පාඩම්. ඊළඟට, අර මං කිව්ව විදිහෙ දේවල්... මොකෝ කියන්නෙ. අපි ට්‍රයි එකක් දීල බලමුද? අඩු ගානෙ එක සෙමෙස්ටර් එකකදිවත්?"

ආලෝකයි, මායි මූණට මූණ බලා ගත්ත. බලාගෙන ගියාම රයන් කියන දේවල්වල ඇත්තකුත් තියෙනව නේද කියල අපිට හිතුණ. පහසුකම් තියෙන මේ කැම්පස් එකේදි මං ස්ක්වොෂ් සෙල්ලං කළේ නැත්තං, ආයෙ ජීවිතේට මං ස්ක්වොෂ් සෙල්ලං නොකරන බව මං දැනන් හිටිය. මේ කාලෙදි ස්ක්‍රැබල් නොකළොත්, ආයෙ ජීවිතේට මං ස්ක්‍රැබල් සෙල්ලම් කරන්න පෙලඹෙන්නෙ නැති බව මං දැනන් හිටිය. ආයෙ ඉතින් රස්සාවක් කරන කාලෙදි ඕව කෙරෙන්නෙ නෑ!

"බලමු... මං කැමති ට්‍රයි කරල බලන්න..." මම කිව්වෙ රයන් කියපු ගොඩක් දේවල්වලට එකඟ වෙන ගමන්. අනිත් එක තමයි, එහෙම නොකිව්වනං මිනිහගෙ ඔය දේශනාව මිනිහ නවත්තන්නෙ නැහැ!





"පාඩම් කරන්න පැය තුනක් මදි..." ආලෝක් උදැල්ල දැම්ම.

"හරි... එහෙනං පැය තුනහමාරක්... හරිනෙ..?" රයන් සංශෝධනයක් ගෙනාව.

"හ්ම්... හ්..." ආලෝක් අමාරුවෙන් කියා ගත්ත. අපිට ඒක ඇහුණෙ හරියට මිනිහ කාපු කුකුළා, මිනිහගෙ ඇඟ ඇතුළෙ ඉඳන් ඒක කිව්ව වගේ!

රයන් හිටියෙ සතුටින් ඉලිප්පිලා. කුමාඕන්වලට අපි ආපහු ආවෙ ඒ සතුට දිගේ පාවි පාවී. මං හිතන්නෙ අපි පාරෙ ආවෙ සිග්සැග් විදිහට. එක්කො පොලිස්කාරයො අපිව දැක්කෙ නෑ. එහෙමත් නැත්තං උන් අපිව නැවැත්තුවත් අපි නැවැත්තුවෙ නෑ. දෙකෙන් එකක්! බයික් එකේ නම්බර් ප්ලේට් එක මං කකුලෙන් වහ ගත්ත. උන් මොකටද අපිව අල්ලන්නෙ? අපි මේ අපේ ජීවිතවල වැදගත් තීරණයක් අරගෙන එන ගමන්!

★

ඔය අතරෙදි තමයි මට ආයෙ සැරයක් කැම්පස් එකේ පොත් සාප්පුවෙදි නේහා හම්බ වුණේ. මාව හප්පල, මාව මරන්න ගිය දවසෙ ඉඳන් මං එයාව දැක්කෙ නෑ. මං හැමදාම රෑට හිතුවත් හෙට උදෙන්ම නැඟිටල ජොගින් කරන්න ඕනෙ කියල, (ඒකෙ ප්‍රධානම අරමුණ වුණේ මගෙ ඇඟ බැස්සීමටත් වඩා නේහාව හම්බ වීම.) මගේ නිදිකුම්බකම නිසා ඒක සිද්ධ වුණේ නෑ. යන්තං එක දවසක් බොහොම අමාරුවෙන් නැඟිටල ජොගින් කළත්, එදා මං පරක්කු වෙලා ගිය නිසාදෝ කොහෙද නේහගෙ හෙවණැල්ලක්වත් තිබ්බෙ නෑ. ඊට පස්සෙ මගෙ උනන්දුව හීන වුණා. මං වගෙ කම්මැළියෙකුට ශාරීරික සුවතාව ගැන කියල දීල වැඩක් නෑ කියල රයනුත් මාව නැඟිට්ටල, ජොගින් කරන්න ඇදගෙන යන රාජකාරියෙන් සමු ගත්තා. ඇත්තට කිව්වොත්

මිනිහට ඒකෙන් සමු ගන්න සිද්ධ වුණා! මොකද... මං මිනිහට තර්ජනේ කළ මිනිහගෙ "පැය තුනහමාරෙ පාඩම් - ඉතිරි ටිකේ ෆන්" කියන තේමාවෙන් මං අයින් වෙනව කියල. කොහොම වුණත් හිතපු නැති විදිහට නේහව දැකපු මට ඇති වුණේ මාර ප්‍රීතියක්.

"හායි...!" මං අතක් උස්සගෙනම කිව්ව.

එයා මා දිහා බැලුව. බලල හරියට මාව අඳුරන්නෙ නෑ වගේ ආයෙ එයාගෙ අතේ තිබ්බ පොතේ පිටු පෙරළන්න ගත්ත. මළ සවුත්තුව! පොදු තැනකදි කෙල්ලෙකුට 'හායි' කියල, ඒකි අඳුරන්නෙ නෑ වගේ ඉන්නකොට කොල්ලෙකුට මොකක්ද හිතෙන්නෙ? වහ කන්න නේද?

පොත් කඩේ එකත් මා දිහා බැලුවෙ මං නේහව අල්ලගෙන දූෂණය කරන්න ගියා වගේ. ඌ විතරක් නෙවෙයි, පොත් කඩේ එවෙලේ හිටිය දෙතුන් දෙනෙක්ම මං දිහාවෙ බැලුවෙ එහෙම! උඹල කුද ගහගනිල්ල කියල මං ආයෙ එහෙම කළා. මේක මාර ලෝකයක්...! මීට සුමාන දෙක තුනකට කලින් මාව මැරේවි කියල, "සොරී...රී...රී..." කිය කියා කනිපින්දං කිව්ව එකී, දැන් මාව කුණු මාළු කෑල්ලක් ගානට ආල!

"නේහා... මොකෝ... මාව අඳුරන්න බැරිද? ඔයා හප්පල මරන්න හැදුවෙ මාවනෙ...!"

"එක්ස්කියුස් මී..." ගෑනි කියපි! කිව්ව විතරක් නෙවෙයි, එහෙම කියල එතනින් පිටවෙලා යන්නත් ගියා!

ඒ පාර පොත් කඩේ අයිති එකා මා දිහා බැලුවෙ, ඉංග්‍රීසි ෆිල්ම්වල කෙල්ලො එක එකා ආස්සරේ කරල, මරල හංගන සීරියල් කිලර් දිහා බලන විදිහට! මේකි වගේ බැල්ලියෙක්? මාව හප්පල, මරන්න හදල, මට ලිෆ්ට් එකක් දීල දැන් හැසිරෙන්නෙ මෙහෙමයි!! මට හිතුණ බෙරිහන් දීල කෑ ගහන්න. මං නළුවෙක් වගේනං නොවෙන විත්තිය මං දැනගෙනයි හිටියෙ. මෙහෙම එකකුත් තියෙනවනෙ... ගොඩක් අය කැමතියි ප්‍රසිද්ධ තැන්වලදි





හැන්ඩ් පොරවල් තමන්ගෙ යාළුවො හැටියට පේන්න හැසිරෙන්න. එතකොට එච්චර හැන්ඩ් නැති එකෙක් තමන්ගෙ යාළුවෙක්ය කියල ප්‍රසිද්ධ තැනකදි පෙන්නන්න ගොඩක් අය කැමති නෑ... අරකෙම අනික් පැත්ත...! ඔය වගේ පසුබානාසුලු අත්දැකීම් මට මීට ඉස්සෙල්ලත් ලැබිල තියෙන හන්ද, මං ඒ හැටිම පුදුම වුණෙත් නෑ. ඒත් මට හිතා ගන්න බැරි වුණේ නේහා වගේ කෙල්ලෙක් එහෙම කළේ ඇයි කියලයි! මොකද, එදා එයා හැසිරුණු විදිහට එයා මේ වගේ දෙයක් කරාවි කියල මං හීනෙන්වත් හිතුවෙ නෑ.

මං ඉක්මනට සාප්පුවෙන් එළියට ආවෙ එතන ඉන්න එවුන්ගෙ මූණුවල් දිහා බලන් ඉන්න බැරිකමටයි. මට හිතුණෙ මාව ගඳ ගහන මඩ පුවක් බාල්දියකින් නාවල කියලයි. අඩු ගාණෙ එයාට තිබ්බ 'හායි' කියල කියන්නවත්. මං ඒ කල්පනාව පිටම බිම බලාගෙන ඇවිදගෙන යද්දි තමයි කවුදෝ මගෙ පිට්ට තට්ටු කරල 'හායි' කිව්වෙ.

නේහා...!

යකාට ගියදෙන්... මට එක පාරටම එහෙම හිතුණත්, හැරිල බලපු ගමන් දැක්ක එයාගෙ ලස්සන හින්ද ඒ හැඟුම වාෂ්ප වෙලා ගියා. විශේෂයෙන්ම හිනාවෙන හැම වෙලාවකදිම වළ ගැහෙන දකුණු කම්මුලත් එක්ක! ඉතින් කොහොමද 'යකාට ගියදෙන්' කියන්නෙ?

"නේහා නේ...?" මං කිව්වෙ බොහොම පරිස්සමින්.

"නැතුව... අනේ... අනේ... සොරිම, සොරිම, සොරිම සොරි මෙයා... මට එතනදි ඔයා එක්ක කතා කරන්න බැරි හේතුවක් තිබ්බ..."

ඔහොම තමයි කෙල්ලන්ගෙ හැටි. එයාල හිතන්නෙ මොකක් හරි වචනයක්, විශේෂයෙන්ම සොරි, ගොඩාක්, ලොකු වගේ වචනයක් එක දිගට තුන් හතර පාරක් කිව්වම ඒකෙන් මාර වෙනසක් කරන්න පුළුවන් කියලයි. හහ්... එක දිගට 'සොරි' හතරක්! නරකම නෑ.

"මොකක්ද හේතුව?"

"තිබ්බ හේතුවක්... ඒක ගැන කියල වැඩක් නෑ. අපි ඒක අල්ලල දාමු..."

"බෑ... කියන්නකො හේතුව...?"

"ඒ කඩේ අයිතිකාරයා මාවයි, තාත්තවයි හොඳටම දන්නව අවුරුදු දහයක විතර ඉඳන්..."

"ඉතින්..."

"තාත්ත කැමති නෑ මං කොල්ලෙක් එක්ක කතා කරනවටවත්. ඉතින් බැරි වෙලාවත් මං එතනදි ඔයා එක්ක කතා කරල, අර මිනිහ ඒක තාත්තගෙ කනේ තිබ්බොත් අවුල්ම අවුල්...! විශේෂයෙන්ම මේකෙ ඉගෙන ගන්න කොල්ලෙක් එක්ක..."

"ඇත්තට...? ඒ කියන්නෙ අඩු ගානෙ කොල්ලෙකුට හායි කියන්නවත් බෑ... එහෙමද?"

"ඔයා දන්නෑ තාත්තගෙ හැටි. තාත්තට ඒකත් ඇති. අනික ඕක ආරංචි වෙනකොට ආරංචි වෙන්නෙ හායි කිව්ව කියල නෙවෙයි. ඒකට තව තාරබර එහෙම එකතු වෙලා. අනේ සොරි අයියෝ..."

ඒක මහ පිස්සු කතාවක් වුණත්, සමහර කෙල්ලන්ගෙ, සමහර තාත්තල ඒ වගේ පිස්සු භූතයො කියන එක මං දැනන් හිටිය. අනික ඉතින් ඇත්තටම බැලුවොත්, කැම්පස් එක ඇතුළෙ හැම මොහොතක් ගානෙම ඉහළ නගින ටෙස්ටෙස්ටොරෝන් හෝමෝන තොගේ දිහා බැලුවම තාත්ත කෙනෙක් තමන්ගෙ දුව පරිස්සම් කර ගන්න එක හරිම සාධාරණ වැඩක්.

"ඒ කියන්නෙ ඉතින් අපිට හම්බවෙන්න බෑ...? එහෙමද?"

"පුළුවන්... හැබැයි කැම්පස් එකෙන් පිට."

"ඒ වුණාට අපි ඉන්නෙ මෙහෙනෙ..."

"ඇයි ඔයාට මෙතනින් එහා ලෝකයක් නැද්ද? අපිට යන්න පුළුවන්නෙ හවුස්කාස් මාකට් එකට. නැද්ද අයිස්ක්‍රීම් එකක් එහෙම කන්න හිතක්...?"





ලස්සන කෙල්ලෙක් අයිස්ක්‍රීම් කන්න කතා කළහම බැහැ කියන්නෙ කොහොමද? මෙහෙමයි ලස්සන කෙල්ලෙක්ට බෑ කියන්න බෑමයි... අයිස්ක්‍රීම්වලටත් බෑ කියන්න බෑමයි. ඒ දෙකම එකතු වෙලා එන ඉල්ලීමකට කොහොමටවත්ම බෑ කියන්න බෑ... බෑම තමා! නේහා මට කිව්වා ඉස්සර වෙලා ගිහින් එතන ඉන්න කියල, මං ගිහින් විනාඩි පහක් යද්දි එයා එන්නං කියල.

මට ඒ ටික තනියෙන් යන්න ඕනකමක් තිබ්බෙම නෑ. මං එතනට ගිහින් මොකෙක්ද වගේ බලා ඉන්දැද්දි නේහා නාවොත් එහෙම මොකද වෙන්නෙ කියල මං හිතුව. කමක් නෑ... එතකොට මං අයිස්ක්‍රීම් එකක් කාල එනව. කොහොමටත් කෙල්ලො වගේම කැමත් වැදගත්. හොඳයි. සිත් ඇදගන්නව!

ඒත් එයා ආවා. අයිස්ක්‍රීම් ෂොප් එක ඇතුළෙදි මට හම්බවුණේ වෙනස්ම නේහා කෙනෙක්.

"හායි... ජොගර්... එදායින් පස්සෙ දැක්කෙම නැනෙ ඉතින්... එදා ඔයා හොඳටම බය වුණා නේ...?" නේහා හයියෙන් හිකි හිකි ගාන්න වුණා. කෙල්ලො ඔහොමමයි. මොකක් හරි බාග විහිළුවක් කරල පණ යන්න හිනා වෙනව.

"මගෙන් මුකුත් අහගන්න එපා ඉතින්..." මං බොරු තරහක් පෙන්නුව.

"මං බලාගෙන හිටියෙ ආයෙ ඔයාව හම්බවෙයිද කියල..."

"අනේ මේ... දැක්කනෙ බුක්ෂොප් එකේදි හම්බවෙලා වෙච්ච හරිය...?"

"මං කිව්වනෙ සොරි කියල... ඒකට හේතුවත් කිව්වනෙ..." නේහා කිව්වෙ මගෙ අත ස්පර්ශ කරන ගමන්. ෂා... ඒක හරි සනීපයි. කවුද අකැමැති, මොන කොල්ලද අකැමැති ලස්සන කෙල්ලෙක් තමන්ගෙ අත අත ගානවට? විශේෂයෙන්ම 'සොරි' කිය කියා...? හිනාවෙවී? ඒක අයිස්ක්‍රීම්වලටත් වඩා රසවත්!!

දිල්ලියෙ ඉන්නව දෙයාකාරයක ලස්සන කෙල්ලො. එක කට්ටියක් මොඩ්, පොෂ් කට්ටිය. එයාල කොණ්ඩ කපල, ස්ට්‍රේට් කරල, ටින්ට් කරල, ජීන්ස්, ස්කර්ට් ඇඳල පුංචි කරාබු එහෙම

ආන කට්ටිය. දෙවෙනි කට්ටිය තමයි සාම්ප්‍රදායික කට්ටිය. එයාල අඳින්නෙ සල්වාර්... පාට පාට බින්ඩි... එල්ලෙන ලොකු කරාබු... මේකෙන් නේහාව අයිති වුණේ දෙවෙනි කට්ටියට. එයා ඇඳල හිටියෙ ළා නිල්පාට සල්වාරියක්. ඒකටම ගැළපෙන කරාබුත් දාල තිබ්බ. හැබැයි නේහා සල්වාරිය ඇඳල තිබ්බෙ, දිල්ලියෙ ඉන්න සමහර වංගෙඩි කොට තරම් මහත කෙල්ලන්ට වෙන අඳින්න ඇඳුමක් නැති නිසා සල්වාරිය අඳිනව වගේ අත්‍යවශ්‍ය හින්ද නෙවෙයි. එයාට ඒක හොඳට ගැළපෙන හින්ද වෙන්න ඕනෙ. එයාට තිබ්බෙ ළා දුඹුරු පාට කොණ්ඩයක්. ඒක කඩා ආලයි එයා හිටියෙ. පොඩි කෙහෙ රොදක් අකීකරු විදිහට ඉඳහිට නළලට වැටුණා. එයාගෙ මූණ හරි රවුම්. ඒ, එයා මහත හින්ද නෙවෙයි. එයාගෙ උපන් හැඩරුව. මගේ ස්ට්‍රෝබෙරි අයිස්ක්‍රීම් එක මගේ ඉදිරියේ දිය වෙලා යද්දි මං එයා දිහා බලාගෙන හිටිය.

"දැන් අපි යාළුයිනෙ... හරිද...?" එයා ඇහුව.

"හ්ම්ම්... ඒත් ඔයා බුක්ෂොප් එක ඇතුළෙදි හැසිරිච්ච විදිහෙන් මං හිතුවෙ මගෙ හැටි නිසා ඔයා එහෙම හැසිරුණා කියලයි."

"ඔයාගෙ හැටි? ඇයි මොකක්ද ඔයාට වෙලා තියෙන්නෙ?"

"අහ්... ඒක වැඩක් නෑ... අල්ලල දාන්නකො."

මම නේහාට අපේ "පැය තුනහමාරෙ පාඩම් - ඉතිරි ටිකේ ෆන්" ව්‍යාපෘතිය ගැන පැහැදිලි කළා.

"පැය තුනහමාරක්! මාර නිර්භීත තීරණයක්නෙ. මං හිතන්නෙ ඔයාල තාම තේරුම් අරන් නෑ මේකෙ ඉන්න ප්‍රොෆෙසර්ස්ල කොයි තරම් කැමතිද එසයින්මන්ට්ස් දෙන්න කියල..." නේහා කිව්වෙ අයිස්ක්‍රීම් කප් එකේ අඩිය හූරන ගමන්.

මං උරිස් ඇකිළුව. "කොහොමද ඔයාගෙ ඩ්‍රයිවින් තත්ත්වෙ දැන්?"

"ඔයා දන්නවද... මට ලයිසනුත් හම්බවුණා."





නේහා දඩිබිඩි ගාල බෑග් එක ඇරල එයාගෙ ලයිෂන් එක පෙන්නන්න ලෑස්ති වුණා. ලයිෂන් එකට කලින් එක එක දේවල් කෙළකෝටියක් විතර එයා ඒකෙන් එළියට ගත්ත. ලිප්ස්ටික්ස්... ලිප් බාම්ස්... ක්‍රීම්ස් තුනක්... බින්ඩි... කරාබු... පෑන්... කණ්ණාඩි... බ්‍රෂ්... ටිෂූස්... කොළ කෑලි... ලේන්සුවක්... පොඩි පර්ස් දෙකක්... පෙපර්මින්ට්... හදිසියෙ අතරමං වුණොත් නොමැරී ජීවත් වෙන්න ඕනෙ නොකරන දේවල් ඔක්කොම ඒකෙ තිබ්බ. අන්තිමේදි තමයි එයාට ලයිසන් එක හම්බවුණේ.

"අඩේ... නේහා සමීර් චෙරියන්... ෆීමේල්... වයස දහඅටයි..." මම ඒක කියෙව්ව.

"ඒයි මෙහෙ දෙන්න... ගෑනුන්ගෙ වයස කියන්නෙ නෑ එහෙම."

"එහෙම නොකියන්නෙ හතළිස් ගණන්වල ඉන්න ආන්ටිලනෙ... ඔයා ආන්ටි කෙනෙක්ද?" මං කිව්වෙ ලයිසන් එක දෙන ගමන්.

"මැනර්ස්... මැනර්ස්... හරිද..." නේහා කිව්වෙ, එළියට ආපු බඩු කෙළකෝටිය ඇතුළට දාන ගමන්.

"මං කැමති එහෙම අයට..." ආයෙමත් එයා කියපි!

"ඒ කිව්වෙ..."

"ඒ කිව්වෙ ගෑනුන්ට ගෞරවනීය විදිහට සලකන අයට..." එයා හිනාවෙන්න ගත්ත.

ඒ කියන්නෙ මෙයා මට අඟවනවද එයා කැමති කොයි විදිහෙ පිරිමින්ටද කියල. ඒකෙ තේරුම එයා මට කැමතියි කියන එකද? එහෙමත් නැත්තං මට එයාගෙ කැමැත්ත ඕනෙනම් මං හැසිරෙන්න ඕනෙ ඒ විදිහට කියන එකද? කවුරු දනීද...? ගෑනුන්ව තේරුම් ගන්න එක, මැන්ප්‍රෝ ප්‍රශ්නෙකට උත්තර ලියනවටත් වඩා අමාරුයි.

"සමීර්... ඒක පිරිමි නමක්නෙ..." මං කිව්ව.

"ඒක මගෙ අයියගෙ නම... මං තීරණේ කළා ඒ කෑල්ල මගෙ නමට දා ගන්න..."

"ඕ නියමයි... මොනවද එයා කරන්නෙ...?"

"එහෙමම මුකුත් නෑ..." එයා උරිස් ඇකිළුව. "එයා මැරිල!!"

මට නිකං පොල්ලෙන් ගැහුව වගේ වුණා. මං හිතාගෙන හිටියෙ එයාගෙ නමේ මැද්දට පිරිමි නමක් අල තියෙන එකට එයාව පොඩ්ඩක් බයිට් කරන්න. ඒත් මේ ආරංචියෙන් මාව හොල්මන් වුණා. මට "උහ්..." ගෑවුණා.

"උහ්..."

"එයා මැරිල දැනට අවුරුද්දයි. එයා මට වඩා අවුරුදු දෙකක් වැඩිමල්. ඔයාට හිතා ගත්තැකිනෙ ඉතින් අපි දෙන්න යාළුවො වගේ හිටිය බව?"

මං ඔළුව වැනුව. එයාගෙ ලස්සන මූණ දුකෙන් බර වෙනව මං බලාගෙන. මේ දුක්බර මාතෘකාව වෙනස් කරන්න විදිහක් මං හිත හිතා හිටිය. ඒත් ඒක එක පාරටම කරන එක හරි නෑනෙ. ඒ නිසා මං ඒකට උපක්‍රමශීලී වුණා.

"මොකද වුණේ?" මට එවෙලෙට අහන්න ආව ප්‍රශ්නෙ ඒකයි.

"රේල් පාර පනිද්දි කෝච්චියට..." එයා කිව්ව.

එයා මගේ අත ඇල්លුව වගේම මේ වෙලාවෙදි මම එයාගෙ අතින් අල්ලගෙන සනසවන්න ඇත්නං කියල මට හිතුණ. මේ වගේ වෙලාවකදි, ඒ වගේ දේකින්වත් එයාව සනසවන්න පුළුවන්නං... ඕන දෙයක් වෙද්දෙන් කියල මං මගෙ අත එයාගෙ අත දිහාට දික් කළා. හෙමින්. එයා ආයෙ කතාව පටන් ගත්ත.

"ජීවිතේ හැටි ඔහොම තමයි... මට හිටියෙ එයා විතරයි... දරා ගන්න අමාරුයි තමා... ඒත් මොනව කරන්නද?" එයා ඒ ටික කිව්වෙ හරියට එයාටම කතා කරගන්න විදිහට. මං මගෙ අත ආපහු ඇද ගත්ත. එයාගෙ අත අල්ලගන්න මේ වෙලාව හොඳ මදි.





"යමුද තව අයිස්ක්‍රීම් රවුමක්...?" එයා බොහොම ප්‍රබෝධෙන් ඇහුවෙ 'ටක්' ගාල මාතෘකාව වෙනස් කරන ගමන්. ඇහුව විතරක් නෙවෙයි, එයා නැඟිටල කවුන්ටරේ ළඟටත් ගියා. තඩි අයිස්ක්‍රීම් සන්ඩේ දෙකක් අරගෙන එයා හිනාවෙවී මා දිහාට ආව.

ඒත් මට ඒ ඇක්සිඩන්ට් එක අමතක කරන්න බැරි වුණා. මගෙ කටින් ආයෙම ගොන් ප්‍රශ්නයක් පිට වුණා.

"කොහෙදිද ඒක වුණේ...? දිල්ලියෙදිද...?"

"ඔව් ඇයි...? ඔයා හිතන්නෙ දිල්ලියෙදි එහෙම දෙයක් වෙන්න බෑ කියලද?" එයා ඇහුවෙ මට අභියෝග කරන්න වගේ.

"නෑ... නෑ... එහෙම නෙවෙයි..." මං තැටමුව.

"ඒක අමතක කරන්න. මට කියන්න ඔයාලගෙ හොස්ටල්වල වෙන පිස්සු වැඩ ගැන..."

මං එයාට රයන්ගෙ ස්කූටරේ ගැන කිව්ව. අපි ආ ගිය තැන් ගැන කිව්ව. හැබැයි ඒව එච්චර රසවත් නොවුණ බව මට තේරුණා. ඒත් අපිට පුළුවන් වුණා අර දුක්බර මාතෘකාවෙන් ඈත් වෙන්න. අපි ඊට පස්සෙ එක එක දේවල් ගැන කතා වුණා. අන්තිමේදි එයා වෙලාව බැලුව.

"දැන් යන්න ඕනෙ..." එයා දඩිබිඩියෙ නැඟිට්ට. "අපි ඇවිදිමු..."

"හ්ම්... මං ඉස්සර වෙලා... එහෙමනෙ...".

"සොරි... ඒත්, ඔව්..." එයා බොහොම හුරතල් විදිහටයි එහෙම කිව්වෙ. හිත නොරිදෙන විදිහට! මට ඒක කරන්න හිතෙන විදිහට!! මාත් නැඟිට්ට.

"ඉතින්..." එයා කොමළයක් ඇම්ම.

"ඉතින්... මොකක්ද?"

"ඉතින් ඔයා මගෙන් අහන්නැද්ද අපි ආයි හම්බ වෙමුද... අපි කොහේ හරි යමුද කියල..."

මාව උඩ ගිහින් බිම වැටුණා. ඇත්තටම ඒව ඔක්කොම මගෙ දිව අග පොර කකා තිබ්බෙ එළියට පනින්න. ඒත් එයා මොනව කියයිද කියන සැකේට මං ඒව ඇතුළට තල්ලු කරලයි තිබ්බෙ. අයිස්ක්‍රීම් කෑම වගේ දේකින් සැනසෙනවයි කියලයි මං හිතාගෙන හිටියෙ. ඒත් මෙන්න... ෂිඃ මට බැරි වුණානෙ එයාට ඉස්සෙල්ල ඒක අහන්න? ඒ අතින් එයා මට වඩා ෆෝවර්ඩ්...!!

"මොකෝ නැතුව...?" මං ගාම්බීර වුණා. "නේහා... ඔයා කැමතිද මා එක්ක එළියට යන්න?"

ඇත්තටම නේහා මට ඒ අවස්ථාව ලේසි කළා. නැත්තං කෙල්ලෙක්ගෙන් පළවෙනිම සැරේට එළියට යන්න අහන එක ඒ තරම් ලේසි නෑ! ඒක උගුර පැටලෙන දෙයක්. වචන එළියට නොඑන දෙයක්. හරියට ඉන්ටර්ව්‍යූ එකකදී පරීක්ෂක මණ්ඩලේට උත්තර දෙන අවස්ථාව වගේ අවස්ථාවක්!

"අනිවා... ඊළඟ සෙනසුරා මේ වෙලාවටම... මෙතෙන්දිම... හරිනෙ...?" එයා කිව්ව.

මං ඔළුව වැනුව.

"හැබැයි මේ... ඊළඟ පාර හම්බවෙද්දි ඔච්චර ලැජ්ජාවෙන් ඉන්න එපා... හරිද...?"

මළ කෙළියයි. ෂිඃ... එයා එහෙමද මං ගැන හිතන් ඉන්නෙ? මං ඒකටත් බූරු පැටියෙක් වගේ ඔළුව වැනුව. ඊට පස්සෙ හිනා වුණා.

"හරි එහෙනං ඇයි දැන් තවත් බලන් ඉන්නෙ...? යන්න..."

මං පිටත් වුණා. මං ගිහින් විනාඩි පහකින් තමයි එයා එනවයි කිව්වෙ. කෙල්ලන්ගෙ හිත් වැඩ කරන හැටි හරිම පුදුමයි. මං ඇවිදින ගමන් හිතුවෙ ඒ ගැන. මගෙ මුළු හිතම බොහොම සැහැල්ලු හැඟීමකින් පිරිල තිබ්බ. ඒ ප්‍රීතිදායක හැඟීමත් එක්කලමයි මං හොස්ටල් එක දිහාට ගියේ!



# 5

## ඉරාක් යුද්දෙයි - අපේ යුද්දෙයි!

"ඇමරිකාවෙන් ඉරාකයට රතු එළියක්...!" පත්තරවල තිබ්බෙ එහෙමයි. අපේ කැම්පස් එකේ ඉඳන් කිලෝමීටර් දහස් ගාණක් දුරින් හිටිය ඒකාධිපතියෙක්, එයාගෙ පුංචි අල්ලපු රට ආක්‍රමණය කරල. ඒ පුංචි රටෙත් ඉන්නෙ ඒකාධිපතියෙක්, අපි මුලින්ම කිව්ව ඒකාධිපතියට තර්ජනේ කරල! මුලදිම කිව්ව ඒකාධිපතියගෙ රටයි, එයා ආක්‍රමණය කළ පුංචි රටයි දෙකම ලෝකෙ තෙල් වෙළෙඳ පොළට සම්බන්ධ හින්ද මේ කෙළිය මුළු ලෝකෙටම දැනෙන්න වෙලා! පුංචි ඒකාධිපතියගෙ යාළුව මුල්ම ඒකාධිපතියට කියල ඒ පුංචි රටෙන් අයින් වෙන්න කියල. ඌ බැහැයි කියල. ඒ හින්ද මළකෙළියක් අත ළඟ බව හැමෝම දැනන් හිටිය.

මේ මළකෙළිය ඉන්දියාවෙ අයි.අයි.ටී. එකේ ඉන්න අපි වගේ මෝල්ලු තුන්දෙනෙකුට බලපාන්නෙ කොහොමද කියල ඔයාලට හිතෙනව ඇති. මේක නිකම් කොම්පියුටර් ගේම් එකක් වුණානං අපි තුන්දෙනාට තිබ්බ ඒ එක එක රටවල්වලට අපිට ඕන කරන ආයුධ දීල සපෝට් කරන්න. ඒත් ඒක එහෙම එකක් නොවුණ නිසා අපිට පුළුවන්කමක් තිබ්බෙ නෑ ගල්ෆ් යුද්දෙට මැදිහත් වෙන්න. කොහොම වුණත් අපි තුන්දෙනා වාසනාවන්ත වෙලා තිබ්බ අපේ මැන්ප්‍රෝ එසයින්මන්ට් එක ඒකට කලින් භාර දෙන්න!

ගල්ෆ් යුද්දෙ පුද්ගලිකව අපි තුන්දෙනාට බලපෑවෙ නෑ. ඒත් ඒක අපේ පළවෙනි සෙමෙස්ටර් එකට බලපෑව. නැඟල යන හොලිවුඩ් 'වෝ ෆිල්ම්' එකක් ආවම ලැබෙන උත්තේජනයෙන් අපේ හිත් පිරුණා. හැම පැයේම නිවුස් බලන්න, රෑට පැය ගණන් ලබා දෙන සජීවී දර්ශන බලන්න අපි අමතක කළේ නෑ. යුද්දෙට, අරගලවලට ආස කරන ජානයක් පිරිමින්ගෙ හැංගිලා ඇති!

අහ්... ඒ ගැන කියන්න කලින්, අපේ 'පැය තුනහමාරෙ පාඩම් - ඉතුරු ටිකේ ෆන්' ප්‍රොජෙක්ට් එක ගැන කියන්න එපායැ. කතා කරගත්තු විදිහටම අපි පැය තුනහමාරක් පණ දාගෙන පාඩම් කළා. වැඩියෙන්ම රෑට. ඒකෙන් අපිට හවස් කාලෙ ඉතුරු වුණා ෆන් එකට.

"මේක තමයි ලෝකෙ හොයා ගත්ත හොඳම ගේම් එක." රයන් අපිව ස්ක්වොෂ් කෝට් එක ළඟට එක්කගෙන එන ගමන් කිව්වෙ, හරියට මායි, ආලෝකයයි මුළු ජීවිතේටම එහෙම ගේම් එකක් අහල නැති ගාණට!

"මේ ගේම් එකෙන් මයින්ඩ් එක රෙස්ට් කරවනව... ඒ වගේම ඇඟේ මේද තට්ටුවත් හීන් කරනව..." රයන් දේශනා කරන්න වුණා. මිනිහ එයාලගෙ ඉස්කෝලෙ ස්ක්වොෂ් ටීම් එකේ කැප්ටන්. මිනිහ අපිට වෝම්-අප් එක්සර්සයිසස් කියල දෙන්න ගත්ත.

ස්ක්වොෂ් ගේම් එක ගැන විශාරදයෙක්, චැම්පියන් කෙනෙක් වුණොත් මිසක් නැත්තං වෙනින් කෙනෙකුට ඒකෙ තියෙන අමාරුව තේරුම් ගන්න බෑ. රබර් බෝලෙ එහෙට මෙහෙට පනින්න ගත්තෙ ගෙම්බෙක් වගේ. අපි ට්‍රයි කරන්න ඕනෙ ඒ ගෙම්බව රැකට් එකට අහු කරගන්න. රයන් නම් අවුරුදු ගාණක් ඒක කරපු එකෙක්. ඒත් මායි, ආලෝකයයි අන්දබූතයො දෙන්නෙක් වගේ කණාබල්ලන් ගහන්න ගත්ත. කොච්චර හරි එක දිගට පස් පාරක්ම ගෙම්බව මගෙ රැකට් එකේ වැදුණෙ නෑ! ආලෝකය ට්‍රයි කළේ එක තැන ඉඳන් ස්ක්වොෂ් ගහන්න. ඌ හිතන් හිටියෙ ගෙම්බ, බූමරංගයක් වගේ උගේ ළඟට එයි





කියලලු...! ටික වෙලාවකට පස්සෙ මායි, ආලෝකයයි වැඩේ අත ඇරිය. අපි දෙන්න කෝට් එකේ කණු දෙකක් වුණා.

"එනවලකො... ඇවිල්ල ට්‍රයි කරල බලනවකො අඩු ගානෙ..." රයන් කන් කෙඳිරි ගෑවෙ ලෝකෙට ශ්‍රේෂ්ඨ ස්ක්වොෂ් ක්‍රීඩකයො දෙන්නෙක් බිහි කිරීමේ අරමුණ බිඳ වැටීමේ සෝකයෙන්.

"මටනං බෑ මේක කරන්න..." ආලෝකය හිටගෙන ඉන්න එකත් අත ඇරල බිම වාඩි වුණා. ඌනං මහ කැඳයෙක්! මාත් සෙල්ලම් කරන්නෙ නෑ තමා. ඒත් මං බිම ඉඳගන්න තත්ත්වෙට වැටුණෙ නෑ.

"අයෙ හෙට ට්‍රයි කරල බලමුකො එහෙනං..." රයන් කිව්වෙ, අදට වැඩිය හෙට හොඳ වේවි කියන කියමන හිතේ තියාගෙන වෙන්න ඕනෙ.

කොහොමින් කොහොම හරි රයන් මාවයි, ආලෝකයවයි එක දිගට දවස් දහයක් ස්ක්වොෂ් ගහන්න ඇදගෙන ගියා. බලෙන්ම වගේ. ඒත් උපන්ගෙයිම ස්ක්වොෂ් විරෝධියො දෙන්නෙක් වෙච්ච අපි දෙන්නව වෙනස් කරන්න රයන්ට බැරි වුණා. අඩු ගානෙ බෝලෙට ගහන්න තියා, බෝලෙ ආ ගිය අතක්වත් හොයා ගන්න අපිට බැරි වුණා! ඒක කොහේ යනවද කියල ඒක විතරමයි දන්නෙ!

"රයන්... අනේ මටනං බෑ මේක..." ආලෝක් කිව්වෙ ඇල්සේෂන් බල්ලෙක් වගේ හති දම දමා. "ඔයා මේකට මෙච්චර ආසනං වෙනින් පාට්නර්ස්ල දෙන්නෙක් හොයා ගන්නකො..."

"ඒ මොකටද... ඔයාල දැන් ටික ටික හැදීගෙන එන්නෙ."

හැදීගෙන! ඔව්... අපිට පිස්සු හැදීගෙනනං එන්න ගත්ත රයන්ගෙ කතාවලට. සමහරවිට අපිට පුළුවන් වෙයි ස්ක්වොෂ් ගහන්න එන ආත්මෙදි වගේ. එතකොටනං අපි හැදිල ඉදීවි ඒකට.

"ඔයාල මේක එන්ජෝයි කරන්නෙ නැද්ද හොඳයි?" රයන් ආපහු අපෙන් ඇහුවෙ අපේ මූණුවල තිබ්ච්ච හීතියට පත් වෙච්ච පෙනුම නිසා වෙන්න ඕනෙ.

මොකක්? 'එන්ජෝයි...?' රයන් මෙච්චර කල් හිතන් ඉඳල තියෙන්නෙ එහෙමද? අනේ දෙයියනේ...! එන්ජෝයි නෙවෙයි... මට හිතිල තිබ්බෙ ඒ බෝලෙ අරන් ගලක් උඩ තියල තළාගෙන, තළාගෙන යන්න. ඒ රැකට් එක අරන් හතරට පහට පළල ළිපේ දාන්න!

"ම්... ම්... ඇත්තම කිව්වොත් එහෙමම එන්ජෝයි එකක් නෑ..." මං අමාරුවෙන් වගේ කිව්වෙ, මිනිහගෙ හිත නරක් වෙයි කියල.

"හරි... එහෙනං අපි මේක කරන්න ඕනෙ නෑ. මං කරන්නෙත් නෑ... මාත් මේක අල්ලල දානව..." රයන් කිව්ව.

"නෑ... නෑ... එහෙම නෙවෙයි..." ආලෝක් රයන්ගෙ තීරණේ වෙනස් කරන්න හැදුවත් රයන් තදට හිටිය. රයන් දෙයක් කිව්වොත් කිව්වම තමා ඉතින්. මොකද මිනිහගෙ ප්‍රතිපත්තිය තමයි "යාළුවො කැමති මොනවද - මගෙත් කැමැත්ත ඒකයි... යාළුවො ඉන්නෙ කොතනද - මමත් ඉන්නෙ එතනයි" කියන එක. මිනිහගෙ ප්‍රියතම ක්‍රීඩාව අපි වෙනුවෙන් අත ඇරීම ගැන මට ඇති වුණේ දුකක්.

"ඔයාට පුළුවන්නෙ වෙන අය එක්ක ප්ලේ කරන්න." මං කිව්ව.

"වෙන අය මගෙ යාළුවො නෙවෙයිනෙ..." ඔන්න මිනිහගෙ උත්තරේ! ආලෝකයි, මායි මූණට මූණ බලා ගත්ත. අපි ස්ක්වොෂ් කෝට් එකෙන් පිට වෙලා ආව.

ස්ක්වොෂ්වලින් සමුගත්තට පස්සෙ, රයන්ට ඕනෙ වුණා අපිව වෙනින් සෙල්ලමකට යොමු කරන්න. චෙස්! ඒකනං ස්ක්වොෂ්වලට වඩා අපිට හිතට ඇල්លුව. අඩු ගානෙ ඒකෙදි අපිට පුළුවන්කම ලැබුණ සෙල්ලමට යොදා ගන්න දේ අල්ලන්නවත්. ස්ක්වොෂ්වලදි අපිට ඒකෙ බෝලෙ අල්ලන්න තියා ආ ගිය අත හොයා ගන්න බැරුවනෙ හිටියෙ. ඒත් මේකෙදිත් හැම තිස්සෙම දිනුවෙ රයන් තමයි. මිනිහ ක්‍රීඩාවට දක්වන ඇල්ම බැල්ම මටයි, ආලෝක්ටයි උපතින්ම ලැබිල නොතිබුණාට අපි මක් කරන්නද?





චෙස් සෙල්ලං නොකරන වෙලාවට අපේ කාලෙ ගත වුණේ රයන්ගෙ බයික් එකේ. ඒකෙ නැඟල වේගෙන් යද්දි වදින හුළං රැලි අපේ කොණ්ඩ අවුල් කළා. අපි හැම අලුත් ෆිල්ම් එකක්ම වගේ බැලුව. දිල්ලියෙ බලන්න ඕනැ තැන් හැම එකක්ම වගේ බැලුව. හැම දෙයක්ම කළා. හැම දිහාවකම ගියා.

කොහොම වුණත් අපිට පුළුවන් වුණා පැය තුනහමාරක් පාඩම් කරන්න. එසයින්මන්ට් තිබ්බ දවස්වලදිනම් ඊට වඩා වැඩි වෙලාවක් ගියා. සෙමෙස්ටර් එකේ අන්තිම හරිය ළං වෙද්දි ආලෝක් යෝජනාවක් ගෙනාව පාඩම් කරන වෙලාව වැඩි කරමු කියල. ඇත්තටම ඒක අපි කරන්න තිබ්බ, ගල්ෆ් යුද්දෙ නොතිබ්බනං!

එක එක විදිහෙ යුද්ධ හැම තැනම තිබ්බත්, ඉන්දියාවත් නොයෙක් විදිහෙ යුද්ධවලට මැදිවෙලා හිටියත්, ගල්ෆ් යුද්දෙ ඊට වෙනස් එකක් වුණා. ටීවී එකේ CNN චැනල් එක ඉරාකෙ කාන්තාර අපේ ටීවී රූම් ඇතුළට අරගෙන ආව.

"This is CNN... Reporting live from the streets of Baghdad.. The Sky is lit up with the first air rade..." තිරයෙ මතු වෙච්ච නිවේදකයා කියවන්න ගත්ත. මිනිහගෙ පසුබිමෙන් අපිට පෙනුණෙ බැග්ඩෑඩ් නගරයෙ රාත්‍රී අහස. ඒකෙ හරියට දෙසැම්බර් 31 රෑ මල්වෙඩි පිපිරෙනව වගේ ගිනිකෙළි සන්දර්ශනයක් මතු වුණා.

චෙස් සෙල්ලම් කර කර හිටිය මගෙයි, ආලෝක්ගෙයි, රයන්ගෙයි අවධානෙ පැහැර ගන්න CNN එකට ඒ හැටි වෙලාවක් ගියේ නෑ. ඒකෙ තිරේ මතු වුණේ මීට කලින් අපි දැකල තියෙන දර්ශන නෙවෙයි. ඔයාල මතක තියා ගන්න ඕනෙ මේ කියන කාලෙදි ඉන්දියාවෙ ප්‍රයිවෙට් චැනල්වත්, කේබල් ටීවීවත් නොතිබුණු බව. ඒ වෙනකල් අපිට තිබ්බෙ ඇල් මැරිච්චි, හෝන්දු මාන්දු වෙච්ච ආණ්ඩුවෙ චැනල් දෙකක් විතරයි. මොකක් හරි වාද්‍ය භාණ්ඩයක් කුරු ගාන ගෑනු, ඔහේ නිවුස් කියාගෙන යන නිදිමත එනවුන්සර්ල... ඒව තමයි ඒවයෙ තිබ්බෙ. කලර් ටීවී ඇවිල්ලත් අවුරුදු දෙකයි... ඒ ඇවිල්ලත් ගොඩක් වැඩසටහන්

තිබ්බෙ කළු-සුදුවලින්. ඒ වගේ පසුබිමක් තියෙද්දි තමයි, එක සුමානයක් ඇතුළතදි, දිදුලන, පැහැදිලි, වෛවර්ණ, ඇක්ෂන්වලින් පිරිච්ච CNN ප්‍රාදූර්භූත වුණේ.

"අඩේ... අප්පට සිරි... ඒ ඇත්තටම බෝම්බ දානවද?" ආලෝක් ඇහුවෙ කටත් ඇරන්.

"නැත්තං... ඔයා හිතන්නෙ ඇමරිකන්කාරයො ඉරාක්කාරයින්ට අහස්ගුංඩු යවල පෙන්නනව කියලද?" රයන් කිව්වෙ, බැග්ඩෑඩ්වලට බෝම්බ වරුසාවක් අපු ඇමරිකන් පයිලට්ල දෙන්නෙක් 'පහක්' දාද්දි CNN රිපෝටර් එයාලගෙන් ප්‍රශ්න කළා මෙහෙයුම ගැන. පයිලට්ල බොහොම ආඩම්බරෙන් කිව්වෙ, එයාලට ලබා දීපු ඉලක්ක, ඒ කිව්වෙ විදුලිබලාගාරයකට එහෙම 'තිතට' බෝම්බ දාල ඒක 'ෆ්ලැට්' කළා කියලයි.

"දෙකක් නෑ... මේක ඇමරිකන්කාරය දිනනව..." ආලෝක් කිව්ව.

"ඒත් ඉරාක්කාරයින්ව ලේසියට ගන්න හොඳ නෑ... උන් අවුරුදු දහයක් විතර දිග යුද්ධෙකට පැටලිලා හිටිය පොරවල්. ඇමරිකාව ඔය ගහන්නෙ උඩින් විතරනෙ..." රයන් කිව්ව.

"හරි... ඒ වුණාට සදාම් කොහේ හැප්පෙන්නද ඇමරිකාව එක්ක?"

"බලාගෙන ඉන්නකො... ලේසි වෙන්නෙ නෑ ඇමරිකාවට..." රයන් කිව්ව.

බොහොම ඉක්මනට ගල්ෆ් යුද්දෙ අපේ ජීවිතවලට ඇතුළු වුණා. රයනුයි, ආලෝකයයි හරියට ඉරාක්කාරයෙකුයි, ඇමරිකන්කාරයෙකුයි වුණා. "කවුද දිනන්නෙ" කියන එක ගැන උන් දෙන්නගෙ වාද විවාද නිතරම ඇති වුණා. මං ඒ වෙනකල් හිතාගෙන හිටියෙ ඔය "කවුද දිනන්නෙ" මානසිකත්වය අවුරුදු දොළහෙදි විතර ඉවර වෙනවයි කියලයි. ඒ කිව්වෙ ඒ කාලෙදිනෙ, "කවුද දිනන්නෙ...?", "මං කියන්නෙ බැට්මෑන්...", "පිස්සුද... සුපර් මෑන්...", "නෑ බැට්මෑන්...", "ඔළුගෙඩිය... සුපර් මෑන්..." වගේ වාද





ඇති වෙන්නෙ. ඒත් ඒක එහෙම නොවෙන බව මට ආලෝක්ගෙයි, රයන්ගෙයි ඇමරිකන්-ඉරාක වාදවලින් පෙනුණා. උන් දෙන්නට ඉරාකෙයි, ඇමරිකාවෙයි පැත්ත ගන්න කියල, මං නොබැඳි ජාතිකයෙක් වුණා. හැබැයි මාත් යුද්දෙ බලන්න පෙරේතකමක් දැක්වූව.

කොහොමටත් අයි.අයි.ටී. එකේ වැඩිපුර හිටියෙ ඇමරිකාවට සපෝට් කරන අය. ඒ වෙද්දි ඉරාකෙ එච්චර ප්‍රසිද්ධ වෙලත් තිබ්බෙ නෑ අපේ කට්ටිය අතරෙ. අයි.අයි.ටී. එකට විදේශ ආධාර ඔක්කොම වගේ ලැබුණෙ ධනපති ඇමරිකන් සමාගම්වලින්. ඒ ඇරෙන්න අයි.අයි.ටී. එකෙන් පිටවෙන අයගෙන් සෑහෙන කොටසකට ශිෂ්‍යත්ව හම්බ වුණෙත් ඇමරිකාවෙන්. ජොබ්ස් හම්බ වුණෙත් ඇමරිකාවෙන්. එහෙව් එකේ අයි.අයි.ටී. සෙට් එක ඇමරිකාවට සපෝට් කරන එකේ කිසි පුදුමයක් තිබ්බෙ නෑ. ඒ අතරෙ රයන් වගේ දෙතුන් දෙනෙකුත් හිටිය!

එන්න එන්නම යුද්දෙ දර්ශන බිහිසුණු වෙන්න ගත්ත. ඇමරිකන්කාරයො බැග්ඩෑඩ්වලට නවත්තන්නෙ නැතුව බෝම්බ වැහි වස්සවන්න ගත්ත. සදාම් එයාගෙ බංකරේක හැංගුණ බවයි වැඩි විස්තරවලට කියවුණේ. ගොඩක් වෙලාවල්වලදි ඇමරිකන් බෝම්බ සාමාන්‍ය මිනිසුන් ඉන්න පැතිවලට වැටිල එයාලගෙ ජීවිත, ගෙවල් දොරවල් අළු දූවිලි කළා. ඇමරිකාව අයි.අයි.ටී. එකට ආධාර කරන එක වෙනම කාරණාවක්. ඒත් අහිංසක මිනිස්සුන්ගෙ ගෙවල්වලට බෝම්බ දාන එක? ළමයින්ව පවා මරන එක? ඒක කොච්චර සාධාරණද? අනික් අතට සදාම් කියලත් හොඳ මනුස්සයෙක් නෙවෙයිනෙ. මිනිහට තද වුණාම එයාලගෙම මිනිස්සු පවා මරල දාන්න පසුබට වෙන්නෙ නෑ කියලයි කියන්නෙ. එහෙම බැලුවොත් ගල්ෆ් යුද්දෙදි පැත්තක් ගන්න එක අමාරු වැඩක්. අනික මොකක්ද ඒකෙන් ඇති වැඩේ? විශේෂයෙන්ම අපිට! අපේ අය ඒක ඉක්මනටම තේරුම් ගනීවි.

"මදැයි... විභාගෙට තව දවස් අටයි නේද තියෙන්නෙ?" එක ද්වසකදි, එක පාරටම ආලෝකයට මතක් වුණා. ඒක මේජර් විභාගයක්! "අපි ටීවී බැලිල්ල නැවැත්තුවොත් හොඳා..."

"ඇයි අපි පැය තුනහමාරක් දෙන්නෙ දොඹට...!" රයන් කිව්වෙ, ආලෝකයගෙ තැතිගැන්ම ගැන වැඩි තැකීමක් නැතුව.

"මළඉලව් පැය තුනහමාර... ඒක අල්ලල දාන්න... ඒ මදි..." මාත් ආලෝක්ගෙ පැත්ත ගත්ත.

"මංනං කියන්නෙ ඉරාකෙ දිනනව..." රයන් කිව්ව.

"පිස්සු කියවන්න එපා... ඇමරිකාවට ගේමක් නෑ ඉරාකෙ එක්ක..." ආලෝක් කිව්ව. "ඒ හින්ද වැඳල කියන්නං පුතෝ... ඒව අල්ලල දාල අපි ගේමට බහිමු... නැත්තං අපිට කෙළවෙනව ෂුවර්..."

"එහෙම කියන්න එපා... තාම ග්‍රවුන්ඩ් බැට්ල් පටන් ගත්තෙ නෑනෙ..." රයන් ආයෙත් කතා කරන්න ගත්තෙ ගල්ෆ් යුද්දෙ ගැන.

අපේ වාසනාවට විභාගෙට දවස් පහක් තියල යුද්දෙ ඉවර වුණා. ඇමරිකාව ගැහුව ගැහිල්ලක් ඉරාකෙට ආයෙ කට උත්තර නැති වෙන්නම. සදාම් කුවේට් අත ඇරිය. ඇමරිකාව ලෝකෙම තියෙන හොඳම තෙල් ළිං තමන්ට අයිති වීම ගැන උත්සව පැවැත්තුව. රයන් දවසක්ද දෙකක්ද මන්ද නොකා හිටිය.

අපි අන්තිම විභාගෙට රිවිෂන් කරන්න මගෙ කාමරේට එකතු වුණාම රයන් ආපහු නාහෙන් අඬන්න වුණා.

"මේක හරි අසාධාරණයි... හරි යුද්ධයක්නං සිද්ධ වෙන්න ඕනෙ ගොඩබිමේ..."

"රයන්... කටවහගන්නව... ඇමරිකාව උන්ට ඕන කරන දේ කර ගත්ත... දැන්වත් දෙයියන්ගෙ නාමෙට අපි අපේ වැඩක් බලා ගමුද?" මං කිව්ව.

"හරිම අසාධාරණයි... ඇමරිකාව ලෝකෙ පොලිස්කාරය වෙලා..."

"ඇප්මැක් ඇප්මැක්..." ආලෝක් මන්තරයක් වගේ කියෙව්ව.

★





ස්ක්වොෂ්... චෙස්... ගල්ෆ් යුද්දෙ... මේ ඔක්කොම අපිට පාඩම් කරන්න තිබ්බ කාලෙ කාල දාපු කාලකණ්ණි! විභාගෙට දවස් පහක් තියල, අපි "පැය තුනහමාරක් පාඩම් - ඉතිරි ටිකේ ෆන්" සංකල්පෙ කුණු බාල්දියට දැම්ම. අපිට එහෙම කරන්න වුණා. දවසකට පැය තිහක් පාඩම් කරලත් ඉවර කරන්න බැරි පාඩම් තොගයක් අපේ අතේ තිබ්බ. රයන්කාරයවත් අල්ලගෙන හැමදාම පාන්දර තුන විතර වෙනකල් අපි වැඩේ ඇදගෙන ගියා. අපේ තිබ්බ ප්‍රාර්ථනාවකුත්. ඒ තමයි විභාගෙ පටන් ගන්න දවසෙදි ඉන්දියාවත් මොකක් හරි යුද්ධෙකට මාට්ටු වේවා කියන එක!

විභාගෙට කලින් දවසෙ තිබ්බෙ ප්‍රායෝගික විභාගෙ. මුළු විභාගෙන්ම රයන්ගෙ හිත ගත්තු කැල්ලකට තිබ්බෙ එච්චරයි. ඒ හින්දමද කොහෙද මිනිහ එදා උදෙන්ම අපි දෙන්නවත් ඇදන් ෆිසික්ස් ලැබ් එකට ආව. ඇත්තටම අපි තුන්දෙනාවම අයිති වෙලා තිබ්බෙ එකම කණ්ඩායමකට. අපිට තිබ්බෙ විද්‍යුත් පරිපථයක් හදන්න. ඊට පස්සෙ වයිවා එකට, එහෙමත් නැත්තං වාචික පරීක්ෂණේට වාඩි වෙන්න. අපිට හම්බ වුණා ප්‍රතිරෝදයෙ හා වෝල්ටීයතාවයෙ සම්බන්ධතාවෙ පරීක්ෂා කරන ගැජට් එකකුත්.

ෆිසික්ස් ටෙස්ට් මට නයාට අඳුකොළ ගාණයි! ඔක්කොටමත් වැඩිය වයිවා එක මට මහ බයානක අත්දැකීමක් වෙන බව මං දැනන් හිටිය!! මට මතක නෑ මං ඔයාලට මගෙ ගැන කිව්වද කියල? ඒත් කවුරු හරි මගෙ ඇස් දෙක දිහා බලාගෙන මගෙන් ප්‍රශ්න අහද්දි මගෙ කොඳුඇටේ දිගේ හීන් හීතලක් ගිහින් මාව ගල් ගැහෙනව වගේ මට දැනෙනව! ඊළඟට මගෙ දෙකන්සෙන් ආඩිය ආල, නාහෙ උඩටත් ආඩිය බිංදු තුනක් දානව. ඊට පස්සෙ මගෙ කටහඬ අබල් බබල් වෙනව. වයිවාවලට මං කොච්චර වයිර කළාද කිව්වොත් ඉක්මනටම අපේ ප්‍රැක්ටිකල් ටෙස්ට් එක ඉවර කරන්න දඟලන රයන්ටත් මං වයිර කරන්න ගත්ත.

"ඒයි... මේ දැක්කද?" රයන් සර්කිට් එකේ ගැජට් බැජට් අතේ තියාගෙන කිව්ව.

ආලෝකය නිකං ඔළුව උස්සල බැලුව විතරයි. ආපහු පොතට ඔළුව පාත් කරගත්ත. රයන් ඊළඟ විනාඩි දහය ගත කළේ

දීල තිබ්බ රෙසිස්ටර්ස්, කැපැසිටර්ස්, ස්විච් සහ වයර් එකකට එකක් සම්බන්ධ කරන්න. හැබැයි ඒක අපිට පවරල තිබ්බ ටෙස්ට් එකට කිසිම සම්බන්ධයක් නැති එකක්. ඒ හින්දමද කොහෙද ආලෝකය නළියන්න ගත්ත.

"රයන්... දෙයියන්ගෙ නාමෙට අපි අපට දීල තියෙන ප්‍රැක්ටිකල් එකට බහිමුද?"

"හිටපං මිනිහො... අපිට ඒකට පැය දෙකක් දීල තියෙනව... ඒක නෙවෙයි බලනව ඔය කොහේ හරි අහුමුල්ලක ස්පීකර් එකක් තියේද කියල..."

"මොකටද ස්පීකරයක්?" මං ඒක අහද්දි මිනිහ ඒකත් හොයාගෙන ඒකට අන්තිම කනෙක්ෂන් එක දීලත් ඉවරයි!

"මෙන්න මේකට..." මිනිහ සර්කිට් එක 'ඔන්' කළා. හයි කරල තිබ්බ රවුම් කෑල්ලක් එහෙට මෙහෙට කැරකුවා. එක පාරටම ස්පීකර් එකෙන් හින්දි සිංදුවක් ඇහෙන්න වුණා.

"ගාර් ආයා... මේරා පර්දේශී..."

"මොකක්...?" ආලෝක් උඩ විසික් වෙලා නැඟිට්ටෙ ලැබ් එකට හොල්මනක් ආව ගාණට.

"මෝලෝ... ඒක රේඩියෝ එකක්..." රයන් කිව්ව. රයන්ගෙ ඇස් සන්තෝෂෙන් දිලිහෙනව මං බලාගෙන. "ඒකට ඕනෙ කරන ඔක්කොම දේවල් අපිට දීල තියෙන බව මං දැනන් හිටිය."

"රයන්..." මං බොහොම ඉවසිල්ලෙන් කතා කළා.

"මොකෝ..."

"අපි ඇවිල්ල ඉන්නෙ මේජර් ටෙස්ට් එකකට..."

රයන්ගෙ හැටි එහෙම තමයි. වැඩකාරය! හැබැයි වැඩ පෙන්නන්නෙ වැරදි වෙලාවල්වලදි, වැරදි තැන්වලදි!

ආලෝක්ගෙත් ඉවසීම නැති වෙන ගාණට ඇවිත්. "වයිව එකට තව විනාඩි විස්සයි..."





රයන් දඩිබිඩි ගාල මිනිහගෙ නවතම හොයා ගැනීමෙ කෑලි බෑලි ගලවන්න වුණේ, මිනිහගෙ හොයා ගැනීම ගැන කිසිම සුබදායී ප්‍රතිචාරයක් නොපෙන්නූ අපි දිහා ඔරව ඔරව. මිනිහට අපිව පේන්න ඇත්තෙ නව නිර්මාණවල වයිරක්කාරයින්ගෙ සංගමයෙ සබාපතියි, ලේකමුයි හැටියට!

ප්‍රැක්ටිකල් ටෙස්ට් එක පරීක්ෂා කරන්න ප්‍රොෆෙසර් ගෝයාල් අපි ළඟට එන්න විනාඩියක් දෙකක් තියෙද්දි අපිට පුළුවන් වුණා අපේ සර්කිට් එක ගහල ඉවරයක් කර ගන්න!

"හ්ම්ම්..." ප්‍රොෆෙසර් සර්කිට් එකේ කනෙක්ෂන් එහෙම බල බල ඔළුව වැනුව. සර්කිට් එක හැදුවෙ රයන් නිසා අපිට ඒ ගැන කිසි සැකයක් තිබ්බෙ නෑ. ඒකට නියම පුතය රයන් බව අපි දැනගෙන හිටිය. අපි මිනිහව විශ්වාස කළා.

"හරි... රයන්... කියමු බලන්න මං මේ හන්ඩ්‍රඩ් ඕම් රෙසිස්ටර් එක වෙනුවට මෙතෙන්ට ෆයිව් හන්ඩ්‍රඩ් ඕම් රෙසිස්ටර් එකක් දැම්මොත් වෙන දේ...?"

"සර්... වැඩි වෝල්ටේජ් එකක් හම්බවෙනව... හැබැයි අධික තාප ප්‍රමාණයක් අපතේ යනව..."

"හ්ම්ම්..." ප්‍රොෆෙසර් කල්පනා කර කර එයාගෙ නිකට අත ගාන්න ගත්ත. ඒක රයන්ගෙ උත්තරේ හරියි කියන එකට හොඳ සලකුණක්.

"හ්ම්... ආලෝක්... කොහොමද මේ තීරුවලින් ඕම් ගාණ කියවන්නෙ... පැහැදිලි කරන්න බලන්න..."

"සර්... රතු පාට තීරුවෙන් කියන්නෙ ඕම් සීය... නිල් පාට එකෙන් දහය... ඒ කියන්නෙ ඕම් එකසිය දහයයි..."

අපේ ගෲප් එක වැඩේ හොඳට ගෙනිච්ච. ඒත් ප්‍රොෆෙසර් එහෙම ලේසියෙන් වැඩේ අතාරින්න ලෑස්ති නෑ. මගේ ජන්ම බය දැනගෙනද මන්ද ප්‍රොෆෙසර් ඊළඟට හැරුණෙ මා දිහාට.

"ඕ.කේ... හරී... මම මේ ඕම් එකසිය දහයට උඩින් තව රෙසිස්ටර් එකක් එකතු කළොත් විදුලි ධාරාවෙ ගලා යෑමට මොකද වෙන්නෙ?"

යකාගෙ ප්‍රශ්නයක් තමයි. ඒක තීරණේ වෙන්නෙ අලුත් රෙසිස්ටර් එක පරිපතේට සම්බන්ධ කරන්නෙ ශ්‍රේණිගතවද... සමාන්තරගතවද කියන එක උඩ. ශ්‍රේණිගතවනං විදුලි ධාරාව අඩු වෙනව... සමාන්තරගතවනං වැඩි වෙනව... හරි... ඒක තමා උත්තරේ. මං හිතෙන් උත්තරේ ලෑස්ති කර ගත්ත. ඒත් ප්‍රොෆෙසර්ගෙ ඇස් දෙක තිබුණෙ මගෙ දිහාවෙමයි. ප්‍රශ්නෙ අහද්දිත්... අහල ඉවර වුණාට පස්සෙත්.

"සර්..." මට තේරුණා මට ආඩිය ආගෙන එන බව. කොඳුඇටේ දිගේ හීතලක් හැදීගෙන එන බව.

"දැන් තියෙන විදුලි ධාරාවට මොකද වෙන්නෙ...?"

"සර්... මේ... මේ..." මොන කරුමයක්ද මේක. මං හොඳටම දන්නව උත්තරේ. ඒත් බැරි වෙලාවත් ඒක වැරදිනං... මට මං ගැනම සැක හිතෙන්න ගත්ත. මගෙ හිතුවිලි වචනවලට හැරවෙන්නෙ නැතුව ගියා.

"සර්... ඒක තීරණේ වෙන්නෙ..." රයන් වැඩේ ෂේප් කරගන්න උත්තර දෙන්න උත්සාහ කළා.

ප්‍රොෆෙසර් දබරැඟිල්ල රයන් දිහාට දික් කළා.

"ෂ්... ඔයාගෙන් නෙවෙයිනෙ මං ඇහුවෙ... මෙයාගෙන්..." ප්‍රොෆෙසර් මාව පෙන්නුව.

මං ඔළුව වනල බිම බලා ගත්ත. වැඩක් නෑ. මං වැඩේ කෑව.

"හුහ්..." ප්‍රොෆෙසර් පිම්බ. ඊට පස්සෙ තනියම කතා කරන්න ගත්ත. "අනේ ඇත්තට දවසින් දවස මේ ආයතනවල තත්ත්වෙ බල්ලට යන හැටි. කවුද තමුසෙල... ඉංජිනේරුවොද... නැත්තං කොමර්ස්කාරයොද?"





අයි.අයි.ටී. එකේ ඉගෙන ගන්න එකෙකුට කරන්න පුළුවන් ලොකුම අපහාසෙ තමයි එයාලව කොමර්ස්කාරයන්ට සමාන කිරීම! මං හිතන්නෙ ප්‍රොෆෙසර්ට හිතා ගන්න පුළුවන් වුණු ලොකුම අපහාස ක්‍රමය ඒකයි. ඒක හරියට ගණිකාවක් තමන් ළඟට ආව කෙනෙකුට "තමුසෙ නපුංසකයෙක්නෙ" කියනව වගේ වැඩක්. අයි.අයි.ටී. කියන දේවාලෙ ඉන්න පුළුවන් ඉංජිනේරු දෙවිවරුන්ට විතරයි. එතනදි කොමර්ස්කාරයො කුලහීනයො හා සමානයි!

ප්‍රොෆෙසර් ගෝයාල් අපේ ග්‍රෑප් එකේ උත්තර කඩදාසියෙ C+ එකක් ලියල ඒක අපි දිහාට වීසි කළා. මං හිතන්නෙ රයන් ඒක අල්ල ගත්ත.

ඊළඟ දවසෙ විභාග පටන් ගත්තු නිසා අපිට ෆිසික්ස් ප්‍රැක්ටිකල් එකේදි වෙච්ච හෙයියම්මාරුව ගැන හරියට කතා කරගන්න බැරි වුණා. කොච්චර හරි මං නේහා හම්බ වෙන එකත් කල් දැම්ම විභාගෙ නිසා. මං කැම්පස් ඩිරෙක්ටරියෙන් එයාලගෙ නොම්බරේ හොයාගෙන එයාට කෝල් එකක් දුන්න. ගෑනි උඩ ගියා. මීට පස්සෙ එයාට කලින් දන්නල මිසක් එහෙට කෝල් දෙන්න එපාය කියල මාව පොරොන්දු කර ගත්තත් එක්ක. ඉතින් ඒක කොහොමද කරන්නෙ? කලින් එයාට දන්නන්න වෙන්නෙ ආයෙත් ගෙදරට කෝල් එකක් දීලම තමා! කොහොම හරි විභාගෙ ඉවර වෙනදාට පහුවෙනිද අපි හම්බ වෙන්න කතා කර ගත්ත.

මේක ලොකුම විභාගයක්. කොච්චර ලොකුද කිව්වොත් විභාගෙ ළං වෙන්න වෙන්න හොස්ටල්වල පාන්දර වෙනකල් ලයිට් පත්තු වෙන්න ගත්ත. එකාට එකා කතා කරන එක අඩු වෙන්න ගත්ත. හරියට ජීවිතේ - මරණෙ අතරෙ සිද්ධ වෙන දෙයක් වගේ. ඊ කැන්ටිමේ තේ කෝප්ප ගැලුම් ගාණට හිස් වෙන්න ගත්ත. මම, ආලෝක්, රයන්... අපේ කෝර්සස් හයේ වැඩ ආපහු ස්කෑන් කරගන්න උත්සාහ කළා. විභාගෙ දාල තිබ්බෙ පිට පිටම දවස් තුනකට වැටෙන විදිහට. ඒ හින්ද විභාගෙට ලියපුව වුණත් කතාබහ වෙන්න වෙලාවක් තිබ්බෙ නෑ. මං සමහර ඒව

එළට දුන්න. ඒත් සමහර ඒව ඇන ගත්ත බව මටම තේරිලයි තිබ්බෙ. ආලෝක්ගෙ මූණෙ ඔරෝ ගත්තු පෙනුමක් තමයි දිගටම තිබ්බෙ. රයන් මිනිහගෙ සාමාන්‍ය හැසිරීම යටපත් කරගෙන හිටියෙ බොහොම අමාරුවෙන් බව මට හොඳටම පෙනුණ. විහිළු නැතුව, වෙනින් සැහැල්ලු හැසිරීම් නැතුව. මැත්ප්‍රෝ... ඇප්මැක්... ෆිසික්ස්... මැතමැටික්ස්... කෙමිස්ට්‍රි... කොම්පියුටින්... පෙරහැරක නැට්ටුවො වගේ එක පෙළට ආවා! විභාගෙ ඉවර වුණාම දැනුණෙ පුදුම සැහැල්ලුවක්. හැබැයි ඉතින් ඒක, "ළිප ගිනි මොළවන තෙක් දිය සැලියේ - සැපයක් යැයි කකුළුව දිය කෙළියේ" වගේ තත්ත්වයක්. මොකෝ රිසල්ට්ස් එන්න තිබ්බෙ සුමාන දෙකකින්. ඒ සැහැල්ලුව සුමාන දෙකකදි අන්තරස්ධාන වෙන බව අමුතුවෙන් කියන්න ඕනෙ වුණේ නෑ.

ඔය අතරෙදි දෙවෙනි සෙමෙස්ටර් එක පටන් ගත්තත්, පළවෙනි සෙමෙස්ටර් එකේදි තමන් කොච්චර වැඩ පෙන්නල තියෙනවද කියන එක දැන ගන්නෙ නැතුව, දෙවෙනි එකේ පන්තිවලට නොයා හිටිය කට්ටිය තමා වැඩි. ප්‍රොෆෙසර්ස්ල ඔක්කොම වගේ උත්තර පත්තර බලන්නයි, අලුත් එසයින්මන්ට්ස් හදන්නයි කාර්ය බහුල වෙලා හිටිය නිසා අපිට දෙයියනේ කියල හුස්මක් කටක් ගන්න වෙලාවක් ලැබිල තිබ්බ. රයන් ඒ වෙලාව ප්‍රයෝජනේට අරන් අපිට චෙස්වලින් තරමක් ඉහළට යන හැටි ඉගැන්නුව. මිනිහ අපිව අලුතෙන්ම යොමු කළේ හරස්පද ප්‍රහේලිකා පුරවන්නයි, වචනවලින් සෙල්ලං පෙන්නන්නයි.

★

ඒ අතරෙදි මට පුළුවන් වුණා තවත් වතාවක් නේහාව හම්බ වෙන්න. ඒ අපි හම්බවෙච්ච පරණ තැනදිමයි.

"ඔයාටනං පිස්සු අයියො... නැත්තං ගෙදරට කෝල් කළේ ඇයි...?"





ඒකට මොනා කියන්නද කියල මට තේරුමක් තිබ්බෙ නෑ. මං හිතාගෙන හිටියෙ ෂර්ලොක් හෝම්ස් වගේ, කල්පනා කරල කැම්පස් ඩිරෙක්ටරි එකෙන් එයාලගෙ නොම්බරේ හොයා ගත්තු එක මාර සිරා වැඩක් කියලයි!

"නැත්තං කොහොමද මං ඔයාට කතා කරන්නෙ...? පණිවිඩයක් තියන්නෙ?"

"අපේ අම්මයි තාත්තයි හරිම ස්ට්‍රික්ට් ඔය ෆෝන් වැඩේට... එයාල කැමතිම නෑ කොල්ලො ෆෝන් එකෙන් කතා කරනවට..."

"ඔයාලගෙ අම්මයි තාත්තයි මහ හණමිටිකාර පිස්සො දෙන්නෙක්නෙ..." මට එහෙම කියන්න කටට ආවත් මං එහෙම කිව්වෙ නෑ. අමාරුවෙන් ඒක ගිල ගත්ත. ඒ වෙනුවට මං එයාගෙන් ඇහුවා කන්න කැමති අයිස්ක්‍රීම් ජාතිය ගැන.

"මොනවද හොඳ... ස්ට්‍රෝබෙරි...??"

නේහා ඇඳලා හිටියෙ සුදුපාට සල්වාරියක්. එයා මගෙ අතින් අල්ල ගත්තෙ අයිස්ක්‍රීම් එක ගන්න ගමන්. ෂා... එයා මාරම ලස්සනයි! ලස්සනම ලස්සනයි...!

"හරි... ඔයාම කියන්නකො එහෙනං... මං කොහොමද ඔයාට පණිවිඩයක්වත් දෙන්නෙ?"

"ඔයා කතා කරන්න එකෙළොස් වෙනිදට..." එයා කිව්වෙ තොලේ ගැව්ච්ච අයිස්ක්‍රීම් ටිකක් ලෙව කන ගමන්. එයාගෙ දිව රෝස පාට වෙලා තිබ්බ.

"එකොළොස් වෙනිදට?"

"ඔව්... ඔයාට පුළුවන් හැම මාසෙම එකොළොස් වෙනිද මට බය නැතුව කතා කරන්න..." නේහාගෙ ලස්සන වගේම, එයාට ටිකක් පිස්සු වගෙත් කියල මට එවෙලෙ හිතුණ.

"ඒ මොකෝ එකොළහ...?"



මහජන පුස්තකාල

"එදාට ගෙදර කවුරුවත් නෑ. මගෙ අයිය මැරුණෙ මැයි එකොළහ. එදා ඉඳන් හැම එකොළොස්වෙනිදටම එයාල අයියව ඇක්සිඩන්ට් වෙච්ච තැන ළඟ තියෙන කෝවිලට යනව... ඒකට ඉතින් මුළු දවසම වගේ යනව..."

"ඔහ්... ඇත්තද? ඇයි ඔයා යන්නෙ නැද්ද?"

"මුලදි මාත් ගියා. ඒත් එහෙම ගියාම මට එයාව මතක් වෙනව වැඩියි. ඊට පස්සෙ මං ඒ ගැන හිතනව. එතකොට මට ස්ට්‍රෙස් වගේ එනව. ඒ හින්ද ඩොක්ට කිව්ව මට එහෙ නොයා ඉන්න කියල."

එයා ඒක කිව්වෙ, අයිස්ක්‍රීම් එකක ජාතිය කියන තරම් සැහැල්ලුවෙන්. හැබැයි මං ඒ සැහැල්ලු ගතියට කැමති වුණා. ඒක මතක් කරල කඳුළු වක්කරනවට වඩා ඒ සැහැල්ලුව හොඳයි. කොහොමටත් ප්‍රසිද්ධ තැන්වල කඳුළු වක් කරන ඇයින්ව මට පේන්න බෑ!

"හ්ම්... එකොළහ විතරයි එහෙම පුළුවන් ආ...?" මං ඇහුව.

"ඔව්... දැනට ඒක තමයි පරිස්සම්ම දවස..." එහෙම කියල එයා හිනා වෙන්න ගත්ත. "මොකෝ... ඔයාට ඕනෙ නිතරම කතා කරන්නද?"

මං ඒකට උත්තරයක් දුන්නෙ නෑ. හැම මාසෙකම එකම දවසක එයාට කතා කරන එක මහ විකාරයක් වගෙයි මට පෙනුණෙ. ඒක හරියට හැම මාසෙකම දත් දොස්තර කෙනෙක්ගෙ ඇපොයින්මන්ට් එකක් වගේ. ඒත් ඉතින් කෙල්ලො කරන්නෙ විකාර දේවල්නෙ. ඒ හින්ද මං ඒක ඉවසන්න හිතා ගත්ත.

"හරි... ඉතින් කියන්නකො..." එයා මගෙ අතට තට්ටු කරගන්න ගත්ත. "කොහොමද ෆයිනල් එක්සෑම් එක...?"

එයා මාව අල්ලන එකට මං කොහොමත් කැමතියි. මගේ ඇඟේ නිකං හිරිගඩු පිපෙනව වගෙයි මට දැනුණෙ. ඒක හරිම අමුතු හැඟීමක්. ඒ හැඟීම අස්සෙ මට එයා අහපු ප්‍රශ්නෙ ඔළුවට ආවෙ පහුවෙලා.





"එග්සෑම්ද...? අනේ මන්ද... සුමාන දෙකකින් රිසල්ට්ස් එනවලු."

"හොඳට කළාද?"

"එච්චරටම නෑ..."

"මං තාත්තට කියල ඔයාගෙ ග්‍රේඩ් එකක් වැඩි කරල දෙන්නද?" එයා අහපි.

"ඇහ්... එහෙම පුළුවන්ද ඔයාට...?"

"පිස්සුද අනේ...? මාව මරයි..." එයා හිනා වෙන්න ගත්තෙ, මාවත් ඒ බොරුවට අහු කරගත්ත සතුටෙන්. කෙල්ලො කොහොමටත් කැමතියි එයාලගෙ විහිළුවලටම හිනා වෙන්න. එයාලම කියනව. එයාලම හිනා වෙනව. ඒත් මං මේ විහිළුකාර කෙල්ලට කැමතියි!

මං එක පාරටම ඉස්සරහට නැවිල මගෙ මූණ එයාගෙ මූණ ළඟටම ගෙනාව. එයාගෙ හුස්ම මගෙ මූණෙ තැවරෙනව මට දැනුණා. ස්ට්‍රෝබෙරි අයිස්ක්‍රීම් කාල රෝස පාට වෙච්ච දිව මං දැක්කෙ එයා දිවෙන් දෙතොල් තෙත් කරද්දි. එයා ඇස් ලොකු කරගෙන මා දිහා බලාගෙන හිටිය. මං ඉස්සරහට නැවුණෙ මගෙ පිටිපස්සෙ සාක්කුවෙ තියෙන පර්ස් එක ගන්න විදිහෙ රඟපෑමක් කරමින් මම ආපහු කෙළින් වුණේ පර්ස් එක එළියට අරගෙ නමයි.

"ඇයි... මොකෝ බයවෙලා වගේ...?" මං මුකුත් නොදන්න තාලෙන් ඇහුව.

"මං හිතුවෙ..." එයා කියන්න ගිය දේ ගිල ගත්ත. "කමක් නෑ... ඒක ගියාවෙ..."

හිහ්... හී... මං දන්නව... මං තනි හිතට හිතුව.

# 6

## ෆයිව් පොයින්ට්ස්!

"අන්න... දන්නවද?" ආලෝක් පිස්සු හැදුණ වගේ. සෙනසුරාදා උදේ ප්‍රීතිදායක නින්දක ගිලිල හිටිය රයන්ගෙ උරිස්සෙන් අල්ලල හොලෝගෙන හොලෝගෙන ගියේ හරියට ඉන්දියාව ඊට ඉස්සරින්ද ඊ වර්ල්ඩ් කප් එක දින්නා වගේ. එහෙමත් නැත්තන් අපේ හොස්ටල් එක ඉස්සරහ පිට්ටනියෙ ලස්සන කෙල්ලො ටිකක් නිරුවතින් රංගනයක යෙදිල ඉන්නව වගේ.

"අන්න දන්නවද... ඇවිල්ල... රිසල්ට්ස් ඇවිල්ල...!"

"මට නිදිමතයි..." රයන් උණුසුම් පොරෝනාව ඇතුළට ගුළි වුණා. ඊට පස්සෙ උණුසුම් පොරෝනාව කඹේකට අරගෙන රයනුයි, ආලෝකයයි කඹ ඇදීමේ තරගයක් ගියා. ආලෝක් තමයි ඒකෙන් දිනුවෙ.

අපි කොලේජ් එක පැත්තට යද්දි තම තමන්ගෙ ප්‍රතිඵල දැන ගන්න ඇවිල්ල හිටිය එවුන්ගෙන් හැම තැනම පිරිල තිබ්බ. හැමෝටම තමන්ගෙ තත්ත්වෙ, තමන් ඉන්නෙ මොන මට්ටමකද කියල දැන ගන්න නොඉවසිල්ලක් තිබ්බ. 10න් තමයි ලකුණු දීම කෙරිල තිබ්බෙ. ශ්‍රේණිගත කරල තිබ්බෙ. 10 යි, ඊට කිට්ටුව එවුනුයි තමයි ටොපර්ස්ල! සාමාන්‍ය මට්ටම වුණේ 6.5. අපි හිටියෙ ඊටත් පහළින්! ආලෝක් කැල්කියුලේටර් එකෙන් අපේ ලකුණු මට්ටම් හැදුව.

"හරිට 5.46යි... රයන්ට 5.01යි... මට 5.88යි..."





"ඒ කියන්නෙ අපි තුන්දෙනාම ෆයිව් පොයින්ටර්ස්ල?" මං ඒ ලකුණුවල මහා පොදු සාධකේ හොයාගෙන කිව්ව.

"ආලෝක්... කන්ග්‍රැජුලේෂන්... ඔයානෙ අපෙන් වැඩිම..." රයන් කිව්ව.

හහ්... "ඔයානෙ අපෙන් වැඩිම...!" රයන් ඒක කිව්ව හැටි විතරක්... හරියට අපි තුන්දෙනා මාර මොළකාරයින්ගෙ ගෲප් එකක ඉහළම ලකුණු ගත්තු එවුන් වගේ! ඇත්තම තත්ත්වෙ තමයි අපේ ග්‍රේඩ්ස් අන්තිමයි කියන එක. තුන්සීයක් විතර ශිෂ්‍යයො ඉන්න තැනින් අපි හිටියෙ දෙසීය ගණන්වල! ආලෝක් ආපහු කැල්කියුලේටර් එකෙන් ගණන් හැදුවෙ කැල්කියුලේටර් එකෙන් මොකක් හරි හාස්කමක් මතුවෙලා අපේ ලකුණු වැඩි කරල දේවි වගේ. ඒ වුණාට අයි.අයි.ටී. එකේ එහෙම හාස්කම් වෙන්නෙ නෑ.

"මඟුලක් කියන්න එපා... අපි ඉන්නෙ ඇවරේජ් මාජින් එකෙනුත් පහළ."

"ඔව් ඉතින් ඒක කියන්නත් දෙයක්යැ.." රයන් බොහොම සැහැල්ලුවෙන් කිව්ව. "ආලෝක්... මේ අහනව... අපි ගිහින් කුකුළෙක් එහෙම කන ගමන් මේක සෙලිබ්‍රේට් කරමු..."

"මොකක්...? සෙලිබ්‍රේට්...??" ආලෝක්ට යකා නැඟගෙන ආව. "ස්කොලර්ෂිප් එකකටවත් හොඳ රස්සාවකටවත් යන්න බැරි ඇවරේජ් එකක් ලැබිල කෙළ වෙලා ඉන්න වෙලාවෙ මඟුල් සෙලිබ්‍රේට් කිරිල්ලක් ගැන විකාර කියවන්න එපා."

"ෂ්... ෂ්... මොකද මේ පොඩි එකෙක් වගේ...?" රයන් ඇහුව. "හරි... මොකක්ද ඔයාට කරන්න ඕනෙ... මීට පස්සෙ ඉඳන් එළිවෙනකල් පාඩම් කරන්නද ඕනෙ?" රයන් සන්සුන්.

"මගෙන් මුකුත් අහගන්න එපා..." ඊට පස්සෙ මිනිහගෙ කටින් පිටවුණේ අමු කුණුහරුපයක්.

ආලෝක්ට එහෙම කේන්ති ගිහින් තියෙනව මං ඔය දැක්කමයි. ආලෝක් වගේ නොමෝරපු එකෙක්ට කේන්ති ගියාම, කේන්ති ගිහින් ඒ වගේ කුණුහරුපයක් කියවුණහම මටනං මැරෙන්න හිනා යන්න ආව.

ඒත් රයන්ටනං එහෙම වුණේ නෑ. කුණුහරුපෙ ඇහුණම රයන්ගෙ මූණෙ එච්චර වෙලා තිබ්බ හිනාබර, සැහැල්ලු ගතිය වාෂ්ප වෙලා ගියා. "මොකක්ද කිව්වෙ...?" රයන් මා දිහාටයි ඊළඟට හැරුණෙ. "මොකක්ද මෙයා කිව්වෙ?" රයන් ඇහුවෙ මගෙන්.

මොන ඉලව්වකටද පැත්තකට වෙලා ඉන්න මාව මේකට ඈඳ ගන්න හදන්නෙ? රයන්ට හොඳටම ඇහුණ ආලෝකය කියපු දේ. රයන්ට විතරක් නෙවෙයි, ඒ වෙලාවෙ ඒ අහල පහල හිටිය අනෙක් උන්ටත් ඒක ඇහුණ.

"යං... යං... රූම් එකට ගිහින් කතා කරමු..." මං බැගෑසේන වුණා. මුන් දෙන්න මරා ගත්තත් මට කමක් නෑ, මේ එළිමහනෙ, හැමෝටම පේන්න මරා නොගෙන! මං එහෙම කිව්වත් දෙන්නගෙන් එක්කෙනෙක්ටවත් කාමරේට යන මූඩ් එකක් තිබ්බෙ නෑ. තත්පරේකට මට හිතුණ උන් දෙන්න මං කියල කෙනෙක් එතන නැති ගාණට අරගෙන, දෙන්න දෙන්නගෙ හොම්බවල්වලට ඇන ගනීවි කියල. මේක වෙනද මේ දෙන්න අතරෙ ඇතිවෙන සට්ටනවලට වඩා බරපතළ බව හොඳටම පේන්න තිබ්බ. දෙන්නගෙම චරිතවල මූලික ස්වභාවය එළියට ආවයි කියලයි මට හිතුණෙ.

"යං... යං... කිව්වම අහල..." මං ආයෙ කිව්ව. එතකොට දෙන්නම ස්කුටරේ ළඟට ඇදිල ආව. මොනව වුණත් රයන් අපිව වෙනද වගේම ස්කුටරේ දාගෙන හොස්ටල් එක දිහාවට ආව. හැබැයි ආවෙ තව දෙන්නෙක් මිනිහත් එක්ක ඉන්නව නේද කියන හැඟීමක්වත් නැතුව. වළවල්වල දදා. බම්පර්ස් උඩින්. වෙනින් කෙනෙකුට දන්නන්න මිනිහට මිනිහගෙම ක්‍රම ඕනෙ තරම් තියෙන බවයි මට හිතුණෙ.

★





ඊ කෑමෙන් පස්සෙ අපි රයන්ගෙ කාමරේ ඇතුළෙ වාඩි වෙලා හිටිය. ඒත් හවස සිද්ධ වෙච්ච ඒ සිද්ධියෙන් පස්සෙ තාම එක වචනයක්වත් අපි අතරෙ හුවමාරු වෙලා තිබ්බෙ නෑ. මං මගෙ ලකුණු ගාණ ගැන හිතුව. පහයි පොයින්ට් ගාණයි. ඒ කියන්නෙ අපතයෙක්. හැම ප්‍රොෆෙසර් කෙනෙක්ම දැන ගනීවි මං සාමාන්‍ය ලකුණු මට්ටමත් අඩු මට්ටමක ඉන්න එකෙක් කියල. ඒක ඉදිරියෙදි කරන කෝර්ස්වල, ග්‍රේඩ් එකට බලපානව. පොයින්ට් පහේ එවුන්ව කවුරුත් ගණන් ගන්නෙ නෑ. මං ඒක අත්දැකීමෙන්ම දන්නව. මාව කොහොමද ඒ තත්ත්වෙට වැටුණෙ? මං එච්චර මෝලෙක්ද? ඊ කෑම මේසෙ හිටපු උන් දිහා බැලුවම පැහැදිලිව ගොඩවල් දෙකකට බෙදන්න පුළුවන්. මුස්පේන්තු මූණවල් හදාගෙන මැලවිලා හිටිය උන්. මාර සතුටෙන්, උනන්දුවෙන් මූණු පිපිලා තිබ්බ උන්! එතන හිටිය, වෙන්කත්, පොත්ගුල්ල. ඌ කවදාවත් උගෙ කාමරෙන් පිට ඉන්නව අපි දැකල නෑ. (කෑම වෙලාවට කෑම කාමරෙදියි... ලෙක්චර් වෙලාවට හෝල් එකේදියි ඇරෙන්න...) ඌ කවදාවත් කනකොට කතා කරනව අපි දැකල නෑ. අද උගේ කට කතේ! ඌට නවයයි පොයින්ට් පහයි! ඌ ආලෝක් ළඟ වාඩිවෙලා උගෙ පම්පෝරිය කියනව මං අහගෙන. කෝර්සස් හයෙන් හතරකින්ම ඌ ටොප් වුණේ කොහොමද කියලයි ඒකා කියව කියව හිටියෙ. ආලෝකයත් හතර මහ නිධානයක් පහළ වුණා වගේ ඌ එක්කම විතරක් කතා කළේ අපි ඉන්නවද මළාද කියල ගාණක්වත් නැතුව! තවත් එවුන් ඒ මේසෙ හිටිය. සර්ඩිකාරයට හතයි පොයින්ට් ගාණයි. මං හිතන්නෙ අපි තුන්දෙනා තමයි කුමාඕන්වල අඩුම! මං මගෙ අනාගතේ ගැන මීට වඩා හිතන්න ඕනෙ කියල මට හිතුණා. ඒත් රයන්ගෙයි, ආලෝක්ගෙයි මුඩුම මූණු දිහා බැලුවම මට ඒක අමතක වුණා.

අපි රයන්ගෙ කාමරේට කුඩු වෙලා පැය භාගයක් විතර බස්සො වගේ හිටිය. හුම් සද්දක් නැතුව. එකෙක්වත් මොකක්වත් කළේ නෑ. පොතක් දිග ඇර ගත්තෙවත්, අනික් එකා දියා බැලුවෙවත්, වචනයක් කතා කළේවත් නෑ. මට එක පාරටම හිතුණ අඩේ... අපි සදාකාලිකවම මෙහෙම ඉන්න යනවදෝ කියලත්! එක අතකින් බැලුවම ඒ අදහසත් එච්චර නරක නෑ.

අපිට පුළුවන් එකට ලෙක්චර්ස්වලට යන්න. එකට කන්න යන්න. එකට පාඩම් කරන්න. මේ වගේ වචනයක්වත් කතා නොකරම! එතකොට සමහරවිට අපිට ඉහළ ග්‍රේඩ්ස් හම්බ වෙන්නත් බැරි නැහැ. ඇත්තටම බැලුවොත් මිනිස්සු කතාබහ කරන එක එච්චරම වැදගත් දෙයක් නෙවෙයි!

මගෙ ඒ දාර්ශනික මනෝභාවයට උදැල්ල ඇම්මෙ රයන්. ඌ කට ඇරිය!

"ඒ කියන්නෙ ඔයා සමාව ගන්නෙ නෑ...?" රයන් අහපි එක පාරටම.

"සමාව ගන්න? මං? ඒ මොකටද? හරිනං ඔයයි සමාව ගන්න ඕනෙ..." ආලෝකය කියපි.

"හැමෝම ඉස්සරහ කුණුහරුප කිව්වෙ ඔයා..." රයන් කියන්න වුණා. "හැබැයි මායි සමාව ගන්න ඕනෙ? හහ්... පුදුම කතාවක්නෙ ඒක? හරි... ඔයාට ඇහෙනවද... මංලු සමාව ගන්න ඕනෙ...!"

ආයෙත් ඉතින් ඕං මාව ඇද ගන්න හදනව. ඒ නිසා මං රයන් කියපු දේ ඇහුණෙ නෑ වගේ හිටිය. උන් දෙන්නගෙ මඟුල් උන් දෙන්න බේර ගත්තාවෙ!

"මං කියන දේ නොතේරුණාට මට කරන්න දෙයක් නෑ..." ආලෝක්, රයන්ට කිව්ව.

"මොකක්ද ඒ...?" මං පැත්තක ඉඳල හොට ඇම්මෙ මේ මෝල්ලු දෙන්නගෙ කතාවෙන් මට චුට්ටක් හරි මඟ ඇරුණද කියල සැකයක් ඇති වුණ හින්ද.

"මොකක්ද ඒ...?? ඒ තමයි මගෙ ලකුණු...!! මට පහයි පොයින්ට් අටයි අටයි... මට වඩා හොඳ ලකුණු තියෙනව දෙසීය ගාණකට...! ඔයාල දන්නවද... මගෙ මුළු ඉස්කෝලෙ ජීවිතෙදිම මං දෙවෙනියගෙන් පහළට ගිහින් නෑ...! දෙවෙනි පන්තියට වැටිල නෑ..."





ලෝකෙ කොහෙදි වුණත් ඒ වගේ කතාවක් එච්චර ජයග්‍රාහී කතාවක් හැටියට ගණන් ගන්නෙ නෑ. ඒක මහ ඔළමොට්ටල කතාවක්. ඒක ආඩම්බරේට කාරණේකුත් නෙවෙයි. මං එහෙම හිතුව විතරයි රයන් කතා කළා.

"ඉතින්...? ඔයාගෙ මෙහෙ ලකුණු නරකයි. ඒකෙයි මේකෙයි තියෙන සම්බන්ධෙ මොකක්ද? අනික... ඔයා කොච්චර පාඩම් කළාද කියල කවුද ඒක ගණන් ගන්නෙ... එහෙව් එකේ මං මොකටද සමාව ඉල්ලන්නෙ...?"

"සමාව ඉල්ලන්නෙද...? සමාව ඉල්ලන්නෙ ලකුණු අඩු වුණේ ඔයාගෙ වැරැද්දෙන් හින්ද..." ආලෝක් එහෙම කියාගෙන නැඟිට්ට.

පහයි පොයින්ට් ගාණක් හම්බ වෙච්චි එක මදිවට දැන් රයන්ට සිද්ධ වෙලා තියෙනව ආලෝකයගෙ රැස්පොට් බලන්නත්!

"මගෙ වැරැද්ද? හිඃ... හිඃ..." ආලෝකය කිව්ව දේට රයන් හිනා වෙන්න ගත්ත.

"හරියො... මේ බලනවකො... ඌ වැඩේ අනාගෙන... ලකුණු අඩු වෙලා. ඒක මගේ වැරැද්දලු. මගෙ වැරැද්ද... ආලෝක් මේ... ඔයාට පිස්සුද? නැත්තං හැටිද?"

"හරී... ඔයා කියන්නකො මොකක් හරි..." ආලෝක්... ඌ හදන්නෙත් මාව උන්ගෙ මරාලෙට ඇදල ගන්න!

"මං මොනව කියන්නද?"

"හහ්... එහෙමද හරී... ඔයාට බැරිනං මංම කියන්නම්. ඔයාගෙත් කොන්ද පණ නෑ..." ආලෝකය අහක හිටිය මාවත් අංශභාග රෝගියෙක් කළා. ආලෝක්, රයන් දිහා බලාගෙන කතා කළා.

"මේ ඔක්කොම සිද්ධ වුණේ ඔයයි, ඔයාගෙ ඔල්මොරොන්දං අදහසුයි හින්ද. පැය තුනහමාරක් පාඩම්. ඉතිරි ටිකේ ෆන්...! හුහ්...

බම්බුව තමයි... ජීවිතේ හොඳම කාලෙ විනෝද වෙන්න ඕනෙ... මේ සිස්ටම් එක වැරදියි. රෙද්ද... ඔය කළේ ඉතින්...!"

රයනුත් පුටුවෙන් නැඟිට්ටා. වාදෙකදි එහෙම නැඟිටිනවයි කියන්නෙ වැඩේ තව නැඟල යනව කියන එකයි.

"ඔයා අප්සෙට් ගිහින් ඉන්න බව මං දන්නව. මට තේරෙනව. ඒ වුණාට ඒකට ඔය හැටි නැහෙන්න ඕනෙ නෑ, මේ කොහේවත් නැති ග්‍රේඩ් එකක් අල්ලං..."

"මං නැහෙන්නෙ නෑ..." ආලෝකය ආයෙ වාඩි වුණා. "අනික මට ඒක කොහෙවත් නැති ග්‍රේඩ් එකක් නෙවෙයි... මගෙ අම්මලට ඔයාලගෙ අම්මලට වගේ ඩොලර් හම්බ වෙන්නෙ නෑ. මං මේකට ආවෙ අරමුණක් එක්ක. හොඳට ඉගෙනගෙන, හොඳ ජොබ් එකක් කරලා මගෙ ගෙදර අයව බලා කියා ගන්න... අන්න ඒකටයි මං ආවෙ... ඔයා ඒ ඔක්කොම කෑව..." ඊට පස්සෙ මිනිහ ආයෙමත් කුණුහරුපයක් කිව්ව.

තාම ආලෝකයගෙ මල පැනපු එකේ අඩුවක් වෙලා නෑ වගේ.

"එකක් කියන්නං... කුණුහරුප විතරක් කියන්න එපා. හරි..." රයන් කිව්ව.

"මං කැමති එකක් මං කියනව... ඕං ඕකයි ප්‍රශ්නෙ. කාටවත්, මුකුත් ඔයාට කියන්න බෑ... ඔයාට තමා ඔක්කොම කියන්න පුළුවන්. ඔයා මොකක් හරි ගොන් යෝජනාවක් ගේනව... මෙයත් (මිනිහ පැත්තකට වෙලා ඉන්න මාව පෙන්නලයි එහෙම කිව්වෙ) ඇහිල්ලක් බැලිල්ලක් නැතුව පොට්ටයෙක් වගේ ඒකට එකතු වෙනව. අන්තිමට අපි තුන්දෙනාම අනා ගන්නව... ඔයාට සල්ලිවල අගයක් නෑ... ඔයා සල්ලි වැඩි වෙලා නරක් වෙච්ච එකෙක්... ඔයාගෙ යාළුවො ගැන නොහිතා, ඔයාට ඕනෙ දේම කරන කෙනෙක්..."

"මොකක්...? මොකක්ද ඔයා කිව්වෙ? මං මගෙ යාළුවො ගැන හිතන්නෙ නෑ?" රයන්ගේ හඬේ නොසැලෙන, එඩිතර





ගතියක් තිබ්බත්, මේ වෙලාවෙදිනං මං දැක්ක එයාගෙ අත් ටිකක් විතර වෙවුලන්න ගන්නව.

"නෑ තමා... යාළුවො ගැන තියා ඔයා මොකක් ගැනවත් හිතන්නෙ නෑ. ඉගෙන ගන්න එක ගැනවත්... අම්මල තාත්තල ගැනවත්... ඒ මුකුත් ඔයා හිතන්නෙ නෑ... ඔයා හිතන්නෙ ෆන් එක ගැන විතරයි..."

"ඔයා නිකං කටට එන දේවල් කියන්න එපා. අනවශ්‍ය කතා කියන්න එපා..." රයන් කිව්වෙ බැරෑරුම් විදිහට.

"මට මේක ඇති වෙලා...! මට වෙනස් වෙන්න ඕනෙ. අද ඉඳන් මං ඔයාලත් එක්ක වළ බහින්න එන්නෙ නෑ. ඔන්න කිව්ව කියල හිතා ගන්න."

මේ වෙද්දි මටත් තේරුම් ගිහිල්ලයි තිබ්බෙ ආලෝකය ඕනවට වඩා වැඩි බව!

"මොනාද ඔයා කියන්නෙ?" මං ඇහුව.

"කිව්වෙ වළ බැහැල ඉවරයි කියල... ෆස්ට් සෙමෙස්ටර් එකේදි ඔයාලගෙ බූතවලට කැමති වෙලා, ඔයාල කියපු ඔක්කොටම කැමති වුණා. මොකද වුණේ...? කෙළවුණා..." ආලෝක් දිගටම කියවන්න ගත්ත.

"හරි... ඉතින් දැන් මොකක්ද කරන්න යන්නෙ?"

"මං කිව්වෙ... මීට පස්සෙ මං ඉන්නෙ වෙන්කට් එක්ක. මිනිහ කැමති වුණා මිනිහගෙ පාඩම් කිරිල්ලට මාවත් හවුල් කර ගන්න. මිනිහට තියෙනව නවයයි පොයින්ට් ගාණක්. අඩු ගානෙ ඔයාල ඒකවත් දන්නවද?"

මට ආලෝක්ව එපා වේගෙන ආව. මුළු කැම්පස් එකේ ඉන්න මොකෙක්වත් වෙන්කට් එක්ක කතා කර කර ඉන්නව මං දැකල නෑ. අඩු ගානෙ මිනිහ, මිනිහ එක්කවත් කතා කරන්නෙ නෑ. මිනිහට ලකුණු නවයයි පොයින්ට් ගාණක් තියෙන්න පුළුවන්. ඉහළ ග්‍රේඩ් එකක් තියෙන්න පුළුවන්. හැබැයි මිනිහ

මනුස්සයෙකුට වඩා කිට්ටු රොබෝවෙකුට! පොර නැඟිට්ටින්නෙ පාන්දර තුනහමාරට විතර. පැය හතරක් එතන ඉඳන් පාඩම... පාඩම... ඊට පස්සෙ තමා ලෙක්චර්ස් යන්නෙ. හවසට පැය තුනක් ලයිබ්‍රරි එකේ. ඊට පස්සෙ කනව. ආයෙ තවත් පැය දෙක තුනක් පාඩම් කරනව නිදා ගන්න කලින්. එහෙව් එකේ මොකාටද මිනිහත් එක්ක ඉන්න පුළුවන්? ඒත් මේන් දැන් එකෙක් ඉන්නව ඒකට ඉදිරිපත් වෙච්චි!

"ඔයාගෙනං ඔළුව හොඳ නෑ ආලෝක්...!" රයන් කිව්ව. "ගිහින් මොළේ පොඩ්ඩක් චෙක් කරව ගන්නව..."

"හහ්... මට මගෙ විභාග වැදගත්. ගන්න ග්‍රේඩ් එක, ලකුණු ගාණ වැදගත්... මං එහෙම හිතන නිසාද මාව පිස්සෙක් වගේ පේන්නෙ...?"

මං ආලෝකය ළඟට ගිහින් මිනිහගෙ කර වටේ අත දා ගත්ත. මේ වගේ වෙලාවකදි, ඒ වගේ එකෙකුට එහෙම සත්කාරයක් ඕනෙ.

"ආලෝක්... මේ අහන්න... අපිට පුළුවන් අපි පාඩම් කරන වෙලා වැඩි..."

"මෙහ්... නවත්ත ගන්නවද ඔය බණේ...?" මිනිහ, මිනිහගෙ කර වටේ තිබ්බ මගෙ අත ඇදල දාන ගමන් කිව්ව. "මට ඇති වෙලා තියෙන්න..." ඒ වෙලාවෙදිනං මිනිහගෙ මූණ මිනිහගෙ අම්මගේ වගේම කියලයි මට පෙනුණෙ. දුක්බර... මැසිවිලි සහිත.. ලෝකෙම එපා වෙච්ච...!

ආරෙන් එන පෙනුම, ගතිගුණ ගැන මගේ කුතුහලය වැඩි වුණා. මූසල පෙනුම මතු වෙන්න අඬන්න පුළුවන් ජානයත් ඒ පරම්පරාවට උරුම වෙලා තියෙනවයි කියලයි මට හිතුණෙ. එහෙමත් නැත්තං මේ මැසිවිලි කීම මිනිහ පස්සෙ ඉගෙන ගත්තු එකක්ද? මං හිතන්නෙ එයාලගෙ පවුලම සාමූහික වැලපීම් සංධ්වනි පවත්වනව ඇති. ආලෝකයයි... අම්මයි... අක්කයි... තාත්තට අංශබාගෙ වගේ වුණත් අඬන්න බැරිකමක් නැනෙ... අඩු ගානෙ එයත් තනි ඇහැට අඬනව ඇති.





"ඔයාලට තේරෙන්නෙ නෑ මට තියෙන වගකීම්. අපෙ අම්මගෙ පඩියෙන් භාගයක් විතර යනව තාත්තගෙ බේත්වලට. එයා එයාට කියල සාරියක් අරන් නෑ අවුරුදු පහකින්..." ඒ ගමනනං පොර කිව්වෙ කඳුළු වක් කර කර. මිනිහගෙ නහයත් බ්ලොක් වුණා. මිනිහ නහය හූරනවනං හොඳයි කියල මට හිතුණ. මොකද, මිනිහ ඒ විදිහට අඬ අඬ කතා කරද්දි මට දැනුණෙ මගෙ නහය බ්ලොක් වෙලා වගේ.

රයන් වාඩි වෙලා ආලෝක් දිහා බලාගෙන හිටියෙ ඇස් උඩ ඉන්දවගෙන! රයන්ට ආලෝක්ගෙ කුණුහරුප වුණත් ගාණක් නැතුව අහගෙන ඉන්න පුළුවන් වෙලා තිබ්බත්, මේ කඳුළුනං මිනිහට දරා ගන්න අමාරු බවයි පෙනුණෙ. අවුරුදු පහකට සාරියක් ගත්තෙ නෑ කියන කතාව එහෙම කාගෙ වුණත් බොක්කටම වදින පොයින්ට් එකක්! ඒකට කොහොමද වාද කරන්නෙ? සාමාන්‍යයෙන් ගෑනු කෙනෙක්ට අවුරුද්දට සාරි කීයක් ඕනෙද? මටනං ඒ ගැන කිසිම හැඟීමක්, දැනීමක් තිබ්බෙ නෑ. රයන්ටනං ඒ ගැන මෙලෝ දැනුමක් නැති බව අමුතුවෙන් කියන්න දෙයක්යැ!

"මගෙ අක්කගෙ බඳින වයස පහුවේගෙන එන්නෙ..." ආලෝකය මිනිහගෙ සංවේදී කඳුළු සන්දර්ශනය නවත්තන්නෙ නැතුවම කිව්ව. "හැමෝම බලාපොරොත්තු තියාගෙන ඉන්නෙ මා ගැන... ඔයාලට මේව තේරෙන්නෙ නෑ. රයන්ට ඕනෙ වෙස් අදින්න... ටීවී බලන්න... ෆිල්ම්ස් බලන්න... ෆන් ගන්න... ෆන්... හහ්... අයි හේට් ෆන්..."

අප්පට සිරි...! ආලෝකය ඉංග්‍රීසි භාෂාවත් මිනිහගෙ කඳුළු සංදර්ශනේට ගෙනාපි!

"හරි... හරි... මං ඔයාගෙන් සමාව ගත්තොත් හරිද...? ඔයා මේ කියන දේවල්වල කිසිම තේරුමක්නං නෑ... ඒත් ඔයා ඔයාගෙ අම්ම, තාත්ත, අක්ක ගැන හිතන විදිහ මට තේරෙන්නෙම නෑ... මොකද මට එහෙම පවුල් බැඳීම් ගැන දැනීමක් නැති හින්ද..."

රයන් බොහොම සන්සුන් විදිහට, හැමදේම තේරුම් ගත්ත විදිහට කිව්ව. හැබැයි ඒකෙන් වුණේ ආලෝකය සංසුන් වෙනව වෙනුවට තවත් සංවේදී වෙච්ච එකයි. රයන්ගෙ ඒ කතාව ආලෝකයගෙ ඇවිළෙන කඳුළුවලට පිදුරු දැමීමක් වුණා.

"ඔව්... හරියට හරි... ඔයාට තේරෙන්නෙ නෑ තමා... තේරෙන්නෙ කොහෙද...? ඔයාට කවදාවත් එහෙම අය නොහිටි කොට..."

"මොකද නැත්තෙ...? එයාල තාම ඉන්නව. එයාල මැරිල නෑනෙ. හැබැයි මං ඔයා වගේ එයාල ගැන හිත හිත විලාප දෙන්නේනං නෑ..."

"ඒ ඔයා එයාලට ආදරේ නැති හින්ද..."

"ඔව්... නෑ තමා... ඒත් අඩු ගානෙ මං බබෙක් වගේ බෙරිහන් දෙන්නෙ නෑ."

"කට වහනව..." ආලෝක් ඒ ගමන මහ හයියෙන් බෙරිහන් දිදී අඬන්න ගත්ත.

"ඔයා තොත්ත බබෙක්... අඬනහිරිය කේස් එකක්..." රයන් කිව්ව. "හා... හා... නාඬන් බබෝ නාඬන්... ඔය හොටු හූර ගන්නවද...?" රයන් මහ හයියෙන් හිනාවෙන්න ගත්ත. සාමාන්‍යයෙන් රයන් එහෙමයි. මොනව කියන්නද කියල හිතා ගන්න බැරිවෙන වෙලාවල්වලදි මිනිහ හිනාව උපයෝගී කර ගන්නව.

"කට වහනව... ඉහි... ඉහි..." ආලෝක් දිගට අඬනව.

"මත අම්ම ඕනේ... කෝ අම්ම... කෝ..." රයන් බබෙක් වගේ කට හදාගෙන ආලෝකයව ඇවිස්සුව.

"කට වහනව... ආතක් පාතක් නැති අනාතය...!"

මහා නිශ්ශබ්දතාවක් එක පාරටම පැතිරුණා. මිනිස්සු සමහර වෙලාවල්වලට හිතල හරි නොහිත හරි කියන දේවල්වලින් මහ පුදුම දේවල් සිද්ධ වෙන්නෙ. රයන්ගෙ හිනාව එක පාරටම





අන්තරස්ධාන වෙලා වාෂ්ප වුණා. මාව කෙළින් ඉන්දවුණා. ආලෝක්ගෙ කටින් ඒ වගේ වචනයක් පිට වුණාද කියල හිතා ගන්න මට මොහොතක් ගත වුණා. කොටින්ම මිනිහගෙ වචනෙ හින්ද වටපිට සිද්ද වෙච්ච වෙනසෙන් මිනිහත් හොල්මන් වෙනව මං බලාගෙන. ඉතාම දීර්ඝ, ඉතාම නිශ්ශබ්ද තත්පර තිහක් ගෙවිල ගියා.

"අනාතයෙක්... ආ...? හරී... ඇහුණද ඔයාට... මෙයා මට අනාතයෙක් කිව්ව..."

මං නිශ්ශබ්දව හිටිය. ආලෝකයත් නිශ්ශබ්දව හිටිය.

"මකබෑවෙනව මෙතනින්... ගිහින් වෙන්කට් එක්ක බැරිනං ඕනෙ කාලකණ්ණියෙක් එක්ක කුටාලි වෙනව. යනව... ඇන්මම තොලොංචි වෙනව..." රයන් කියපි!

"ඒක ඔයා මට කියන්න ඕනෙ නෑ..." ආලෝක් කිව්ව. "හරී..." ආලෝක් මට කතා කළා.

"ඇයි මොකෝ...?"

"ඔයා එනවද මා එක්ක යන්න?"

"කොහෙද? කොහේ යන්නද?"

"ඔයාට ඕනෙ මා එක්ක ඉන්නද? රයන් එක්ක ඉන්නද?"

යකෝ... මේක හරි මඟුලක්නෙ? මේ කිසි දේකට මගෙ කිසි සම්බන්ධයක් නෑ. එහෙව් එකේ මොකටද මේකට මාව ගාව ගන්නෙ? දැන් ඉතින් මුන් දෙන්නගෙන් එකෙක් තෝර ගනිල්ලකො...!

"යන්න... යන්න... හරී ඔයත් මේ තුති තොත්ත බබා එක්ක යන්න... යනකොට බබාව පරිස්සමින් අරං යන්න... වැටිල තුවාල හෙම වෙයි..." රයන් කිව්ව.

"මං කොහේවත් යන්නෙ නෑ..." මම මගේ තීරණේ ප්‍රකාශ කළා.

"ඒ කියන්නෙ ඔයා රයන්ව තෝර ගත්ත?" ආලෝක් ඇහුවෙ පරාජිත හඬින්.

"මං කාවවත් තෝර ගත්ත එකක් නෑ... මේව අපිට කැම්පස් එකෙන් දීපු කාමර... ඔයානෙ මේව දාල යන්නෙ... ඔයාට ඕන මගුලක් කරගන්න..." මං කිව්වෙ උන් දෙන්නවම ඇති වෙලා.

එතනින් පස්සෙ ආයෙ වචන හුවමාරු වුණේ නෑ. ආලෝක් නැගිට්ට. නැගිටල එළියට ගියා. මිනිහ එළියට යනවත් එක්කම රයන් කාමරේ දොර, මිනිහගෙ පස්සට පයින් ගහනව වගේ පුළුවන් හයියෙන්, 'දඩෝං' ගාල වහල දැම්ම. ඒක බොහොම සංකේතවත් අවස්ථාවක්. මොකද කිව්වොත් මීට කලින් කවදාවත් රයන් දොරවල් වහන්න එහෙම ඉදිරිපත් වෙලා නෑ!

"දැක්කද පොර කියපු දේවල්...! ඒ මදිවට මිනිහට ඕන වුණේ ඔයාවත් ඇදන් යන්න... හහ්..." රයන් පිම්බ.

"කට වහනව..." මං කිව්ව.

★

අයිස්ක්‍රීම් කාල ඇති වෙලා තිබ්බත්, ඊට පස්සෙත් මට නේහා හම්බ වුණා. නේහාව මට වෙනදටත් වඩා ලස්සනට පෙනුණත් එයා එක්ක කතා කර කර ඉන්න බෑ... බෑ... වගේ හැඟීමක්, එහෙම නැත්තං කාත් එක්කවත් කතා කරන්න බැරි හැඟීමක් මාව වහගෙන තිබ්බ.

"මොකෝ වෙලා තියෙන්නෙ?"

"මොකුත් නෑ... ඇයි එහෙම අහන්නෙ?" මං කිව්ව. මට ඕනෙනං කිසිම හැඟීමක් දැනීමක් නැති ලාදුරු ලපයක් වගේ වෙන්නත් පුළුවන්...!

"අහන්නෙ එහෙම පේන නිසා... ඔයාගෙ මූණ බැලුවම ඒක කියතහැකි. හා... හා... කියමු බලන්න මොකක්ද අවුල කියල..."





ඕක තමා කෙල්ලොත් එක්ක තියෙන ප්‍රශ්නෙ. අපි එයාලට මැරෙන්න කැමතියි කියල දැන ගත්තම එයාල එනව අපිට නාස් ලණුව දාන්න. හහ්... එයා කවුද මගෙන් එහෙම අහන්න!

"නෑ මුකුත් නෑ..."

එයා බොහොම සීරුවට මගෙ අත උඩින් එයාගෙ අත තියල හිමින් සැරේ මගෙ අත පිරිමදින්න ගත්ත. මගෙ අධිෂ්ඨාන ශක්තිය වාෂ්ප වෙන්න ගත්ත. එයාගෙ අතින් ලණුව අරං, මමම නාහෙ අස්සෙන් දාගෙන කෙළවරවල් දෙක එයාගෙ අතට දුන්න!

"නෑ අනේ... මේ ආලෝකයයි, රයනුයි කියන බල්ලො දෙන්න..."

"ෂ්... ෂ්... මොකක්ද ඒ බාසාව..."

"හරි... හරි... ආලෝකයයි, රයනුයි කියන යාළුවො දෙන්න, ඒ කිව්වෙ මට හිටිය හොඳම යාළුවො දෙන්න දැන් ඇරගෙන. ඒකෙන් අපේ ක්ලික් එක කැඩිල බිඳිල ගිහින්..."

"මොනවටද ඔය ඇර ගත්තෙ?"

"විහාගෙ ලකුණුවලට තමා... ආලෝකය, රයන්ට දොස් කිව්ව ඌ නිසාය අපිට ලකුණු අඩු වුණේ කියල..."

"ඕ... ඇත්තටම ඔයාලට ලකුණු අඩුද ඉතින්? මොනවද ඔයාගෙ මාර්ක්ස්?"

මං නේහාට අපි තුන්දෙනාගෙ පහයි පොයින්ට් ගාණවලුයි කිව්ව.

"ඈහ්... මොකා...? ෆයිව් පොයින්ට්ස්..."

"හ්ම්..."

"අයියෝ... ඒක මදිම මදිනෙ..."

ඕං ඕකයි කෙළිය! අයි.අයි.ටී. එකට හරි ජී.ජී.ඒ. එකට හරි මොකෙක් හරි තේරුණාම, ඊට පස්සෙ මුළු ඉන්දියාවම උගෙන් බලාපොරොත්තු වෙන දේවල්වල පොදු ලක්ෂණ කීපයක් තියෙනව. එකක් තමයි ඒවට තේරෙන උන් ඒ වගේ අඩු ලකුණු ගාණක් හීනෙකින්වත් නොගනීය කියන දේ!

"ඔව්... මදි තමා... ඒක මං දන්නව. ඒත් මට අප්සෙට් ලකුණු අඩු එක නෙවෙයි. මේ තැන...! මට දැන් මෙතන එපා වෙලා. මට ඇති වෙලා...!"

නේහා බක බක ගාලා හිනා වෙන්න ගත්තා. මං කිව්වෙ... මං කිව්වෙ... මං කියල තිබ්බෙ නැද්ද වෙලාවකට නේහා පිස්සු කේස් එකක් කියල?

"මොකක්ද ඒකෙ හිනා වෙන්න තියෙන්නෙ?" මං තදවෙලා ඇහුව.

"ඇයි අනේ... ඔයාට මෙතන ඇති වෙලාලු. ඔයා දන්නවද මේක ඇතුළට එන්න එළියෙ කී ලක්සයක් පොර කනවද කියල?"

"මං දන්නව... ඒත් මේක මහ ඇණයක්. ටොන් එකක් විතර තියෙනව පාඩම් කරන්න... පාඩම් කරලත් ලකුණු අඩු වෙනව. දැන් ඒ හින්ද යාළුකම්වලටත් කෙළවෙලා...!"

"හරි... ඒ කියන්නෙ ආලෝක්ට පාඩම්ම කරන්න ඕන වුණා... ඒ හින්ද මිනිහ පොත් ගුල්ලෙක්ගෙ කාමරේට කුඩු වුණා...? එහෙමනෙ?"

නේහා මං එයාට කරපු විස්තරේ හැටියට, ඒ දේවල්ම සමාලෝචනය කරල මගෙන් ඇහුව.

"ඒත් ඇයි ඔයා රයන්ව තෝර ගත්තෙ?"

"මං රයන්ව තෝර ගත්තෙ නෑ. ආලෝක් ගියා... එච්චරයි..."

"දැන් මොකක්ද ඔයා කරන්න යන්නෙ...?"

මං උරිස් ඇකුළුව 'අනේ මන්ද' කියන්නා වගේ.

"ඔයා දන්නවද මගෙ තාත්ත පොයින්ට්ස් දහයම ගත්තු කෙනෙක් බව?" නේහා ඇහුවෙ ආඩම්බරෙන්.

"කොයි කාලෙදිද?"





"එයා ඉගෙන ගන්න කාලෙදි..."

"ඈහ්... එයාට එහෙම කාලෙකුත් තිබ්බද?" මට ඉබේටම ඇහුණා. මොකද ප්‍රොෆෙසර් චෙරියන් ශිෂ්‍යයෙක් හැටියට හිතේ මවා ගන්න එකත් බොහොම අපහසු කාරණාවක් හින්ද.

"නැතුව... ඇයි ඔයා හිතුවෙ එයා අහසින් වැටිල කියලද? එයා තමා බැච් ටොප්. එයා දන්නවනං මං පහයි පොයින්ට් ගාණක් විතරක් ගත්ත කෙනෙක් එක්ක රවුම් ගහනව කියල, මාර වැඩේ..." නේහා ආයෙ හිනා වෙන්න ගත්ත.

"ඒ කියන්නෙ දැන් ඔයාටත් ඕනෙ මාව අල යන්නද?" මං ඇහුව.

157/56

"නැහැ ගොනෝ... මං විහිළුවක් කළේ..." එයා ආයෙ හිනා වෙන්න ගත්ත. මොකටද එයා, එයාට විතරක් තේරෙන විහිළු කරගෙන එයාම හිනා වෙන්නෙ?

"හරි... හරි... ඕන එකක්..."

"මෙතන්ට එන්න." එයා එයාට එහා පැත්තෙ තිබ්බ පුටුවට තට්ටු කර කර කිව්ව.

"ඒ මොකටද?"

"එන්නකො කිව්වහම."

නාස් ලණුව දාපු ගොන් නාම්බ, බොහොම කීකරු විලාසෙන්, එයාගෙ ඉස්සරහින් තිබ්බ සීට් එකෙන් නැගිටල, එයාගෙ අල්ලපු සීට් එකෙන් වාඩි වුණා. ලස්සන කෙල්ලන්ට තියෙනව පුදුම බලයක්. උන්ට පුළුවන් ගිනි මකරෙක්ව වුණත් හිම වලස් පැටියෙක්ව කර ගන්න.

එයා මගෙ අතින් අල්ලගෙන මූණ මං දිහාට හැරෙව්ව. බොහොම හුරතල් විදිහට මා දිහා බැලුව. "මේ... මං කැමතියි මගෙ ෆයිව් පොයින්ට් මෝල්ලට!" එහෙම කියල එයා දීපි මගෙ දකුණු කම්මලට කිස් එකක්. "එකයි..."

"දෙකයි... තුනයි... හතරයි... පහයි..." එයා තව කිස් හතරක් එක දිගට දුන්න.

"දැක්කනෙ... කවුද කියන්නෙ පහක් නරකයි කියල?"

මාව චොකලට් මූස් එකක් වගේ දිය වේගෙන එන්න ගත්ත. "මේ... මට ඔයාව කිස් කරන්න පුළුවන්ද?"

"බෑ... ගත්ත ලකුණු ගාණට තමා ඒව දෙන්නෙයි, ගන්නෙයි. මං තාම ලකුණු ගත්තෙ නෑනෙ..."

මට ආපහු යන්න ඕන වුණේම නෑ. ජීවිතේ මුළු ඉතුරු කාලෙම අයිස්ක්‍රීම් ෂොප් එකේ වැඩ කරන්න තියේනං කියල මට හිතුණ. චොකලට්, ස්ට්‍රෝබෙරි අතරෙ... කේර්න්ස්වලට අයිස්ක්‍රීම් පුරෝ - පුරෝ... එතකොට ලෙක්චර්ස් ගැන හිතන්න ඕනෙත් නෑ... විභාග ගැන හිතන්න ඕනෙත් නෑ... ලකුණු ගැන, ග්‍රේඩ්ස් ගැන හිතන්න ඕනෙත් නෑ... ආලෝකයයි, රයන්ගෙයි කිසිම තේරුමක් නැති වාදවලට මැදිහත් වෙන්න සිද්ධ වෙන්නෙත් නෑ.

"අපි ෆිල්ම් එකකට යං..." නේහා යෝජනා කළා.

"අද?"

"අද නෙවෙයි ළමයො... එන සෙනසුරාද... ඕකේද?"

"ෂුවර්..." අයිස්ක්‍රීම් ෂොප් එකේ ජොබ් එකෙන් අස්වෙලා, මං ෆිල්ම් එක ගැන හිතන්න ගත්ත.

"නියමයි... ඕකේ... දැන් මං යන්න ඕනෙ. ඊළඟ සෙනසුරාද දෙක වෙද්දි මෙතන ඉන්න. හොඳේ..." නේහා එහෙම කියලා පිටවෙලා ගියා.

මං එතන තව විනාඩි පහක් හිටිය. දවස් පහේ මෙනු පහක් බැලුව. හම්බ වෙච්ච කිස් පහ ගැන හිතුව. අපරාදෙ... මාර්ක්ස් දහයම ගත්තනං කිස් දහයක් හම්බ වෙනවනෙ! ඔව්... අයිස්ක්‍රීම්වල හීතලෙන් උණුසුම් වෙච්ච තොල්වලින් කිස් දහයක්!!

අයිස්ක්‍රීම් කිස් දහයක්!!



# 7

## ආලෝකයා කතා කරයි!

අඬනහිරිය... තොත්ත බබා... පොත්ගුල්ල... මැසිවිල්ලා... එහෙම තමයි ඔයාල මාව දන්නෙ. ඔයාල හිතනව ඇත්තෙ මං මහ නොමෝරපු, ළාමක ටිං ටිං කෙනෙක් කියලයි. හැම අවුරුද්දෙම පළවෙනිය වෙන්න පෙරුම් පුරල, මහ ලොකු බක්කක් වගේ පළවෙනිය වුණු රිපෝට් කාඩ් එක අම්මටයි, තාත්තටයි පෙන්නන්න බලන් ඉන්න පොත් ගුල්ලෙක් කියලයි. ඔයාලට නිදහස තියෙනව මං ගැන ඔය ඕන විදිහකට හිතන්න. ඉගෙන ගන්න මට තියෙන ඕනෙකම, යාළුවො කට්ටියෙන් වෙන්වීම, නිශ්ශබ්දතාව එක්ක මගෙ තියෙන සම්බන්ධෙ, රෝහිණී කොලනියෙ ඉඳන් දිල්ලියෙ අයි.අයි.ටී. කැම්පස් එකට ඇදිච්ච, මායි අම්මයි සම්බන්ධ වෙලා තියෙන පෙකණිවැල...! ඔය ඕන එකක් පසුබිම් කරගෙන ඕන විදිහකට මා ගැන හිතන්න ඔයාලට නිදහස තියෙනව.

ඒත් මං කැමතියි මගෙ පැත්තෙනුත් ඔයාලට මගෙ දේවල් ටික කියල දාන්න. ඔව්... මං ආලෝක් ගුප්තා. මහා ලේඛක හරි කුමාර් මිනිහගෙ පොතේ පුංචි ඉඩක් මට දුන්න ඒකට. ඒත් ඒ ඔක්කොටම කලින් මං කැමැතියි කතාන්දරයක් කියන්න.

එකමත් එක කාලෙක, දිල්ලියේ ඈත තිබිච්ච ගම්බද නගරෙක පහළ මැද පන්තියෙ පවුලක කොල්ලෙක් ජීවත් වුණා. අපි කියමුකො මිනිහට 'නිකමා' කියල, කතාව කියාගෙන යන්න ලේසියට. නිකමගෙ අම්මයි, තාත්තයි දෙන්නම ගුරුවරු. තාත්ත

ඉගැන්නුවෙ චිත්‍ර. අම්මා ජීව විද්‍යාව. 'නිකම' ඇති දැඩි වුණේ නෝට් පොතුයි, කැන්වසුයි එක්ක. ඒ හින්දමද කොහෙද තමන්ගෙ සපත්තු ලේස් එකවත් ගැට ගහන්න කලින්, 'නිකමට' පුළුවන් වෙලා තිබ්බ චිත්‍ර අඳින්න! 'නිකම' ඉගෙන ගන්නත් දක්ෂය. මොකද ගෙදර ගුරුවරුම දෙන්නෙක් හිටියනෙ මිනිහගෙ ඉගෙනීමෙ කටයුතු බලා කියාගන්න. ඒ මොනව වුණත් 'නිකම' වැඩියම ආස කළේ චිත්‍ර අඳින්නයි. මිනිහගෙ වයසෙ තියෙන හැම චිත්‍ර තරගෙ කටම මිනිහ ඉදිරිපත් වුණා විතරක් නෙවෙයි, ඒවයින් මිනිහ ගමකට පදක්කං, සහතික එහෙමත් දිනුව. මිනිහට තෑගි ගලාගෙන ආව. පේන්ටිං සෙට්ස්, කැලිග්‍රැෆික් පෑන් සෙට්ස්, ස්ටේෂනරි වවුචර්ස්... ඔය හැම එකම. 'නිකමා' තමන්ගෙ වයසටත් වඩා චිත්‍රකාරයෙක් බව තමයි හැමෝගෙම කල්පනාව වුණේ. 'නිකමට' ඕන වුණේ ලොකු වුණාම චිත්‍ර ශිල්පියෙක් වෙන්න. හැබැයි ඒක මහ ඔළමොට්ටල හීනයක්. ඉන්දියාවෙ එහෙම චිත්‍ර ශිල්පියො එක්කෙනෙකුට නැත්තං දෙන්නටයි ඉඩ තිබ්බෙ. එයාලත් අවුරුදු අනූ ගාණක් විතර වයසක අය! ඒත් 'නිකමා' ඒ ගැන හිත කරදර කර ගත්තෙ නෑ. එයා දැනගෙන හිටිය එයාගෙ අරමුණ කරා එයා කොහොම හරි, බෙල්ල කඩාගෙන හරි යන බව!

ඒත් ඒ වගේ වෙලාවල්වලටම තමා ඔක්කොම කෙළවෙන්නෙ! ගාණට ජීවිතේ ප්ලෑන් කරගෙන, අරමුණු හදාගෙන ඒව දිනා ගන්න හදනකොට තමයි තියෙන හැම මරාලයක්ම ඔළුවට කඩා වැටෙන්නෙ. 'නිකමගෙ' තාත්තට හම්බ වුණා සෑහෙන ලොකු වැඩක්. බිත්තිවල කැටයම් කිරීමක්. මියුරල් එකක්. ඒකට හොඳ ගාණකුත් පොරොන්දු වෙලා තිබ්බ. ඒ ගාණට, ලොබි එකේ සිවිලිම පේන්ට් කරන්නත් එයා පොරොන්දු වෙලා තිබ්බ. අධ්‍යාපන දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලෙ. මියුරල් එකක් කරන එක සෑහෙන අමාරු වැඩක්. සිවිලිමක් පේන්ට් කරනවයි කියන්නෙ ඊටත් වඩා අමාරු වැඩක්. ඒකට පලංචි බැඳල, ඒවයෙ වැතිරිලා උඩ බලාගෙන කරන වැඩක්. සිවිලිම පේන්ට් කරනව කියන එකෙන් අදහස් කළේ සිවිලිමේ නිකම්ම පාට උළන එක නෙවෙයි. සිවිලිමෙත් චිත්‍ර අඳින එක! චිත්‍ර ශිල්පියා එහෙම බෙල්ල





කඩාගෙන අඳින චිත්‍රයක් සමහර විට මුළු ලෝකෙම ප්‍රසිද්ධ වෙන කලා කෘතියක් වෙන්න බැරිත් නෑ! ඉතින් ඒ වගේ අවස්ථාවක් තමා 'නිකම'ගෙ තාත්තට උදා වුණේ.

ඒත් මිනිස්සු නිකමගෙ තාත්ත ගැන උනන්දු වුණේ එයාගෙ අතින් සිවිලිමේ ඇඳුණු චිත්‍රයක් හින්දනං නෙවෙයි. පලංචියේ උඩ ඉඳන්, ඒ කිව්වෙ මීටර් දහයක් උඩ ඉඳන් මහ පොළොවට දෙරි ගහපු හින්ද! එච්චරයි. ඒ තමයි චිත්‍ර ශිල්පියෙක්ගෙ අවසානෙ.

මුළු දකුණු පැත්තම පණ නැති වුණා. 'නිකම'ගෙ තාත්තගෙ ඇඟෙන් බාගයක් මැරුණා. ඊටත් වඩා මුළු පවුලටම බලපෑවෙ එයාගෙ මුළු පඩියම මැරුණු එක. තාත්තගෙ චිත්‍ර ඇඳපු දකුණු අතයි, ඇගේ මුළු දකුණු පැත්තයි පණ නැති වෙද්දි 'නිකම'ගෙ මුළු හීනෙම පණ නැති වෙලා මැරිල ගියා.

'නිකම'ගෙ තාත්ත ඇඳට වැටුණා. අවුරුදු දහයක් ඇඳේමයි. පණ තියෙන එකම ඇහැ, වම් පැත්තෙ ඇහැ, පවුලෙ දුක්කන්දරාව දකිද්දි කඳුළු වක්කළා. සමහර වෙලාවලදි එයාගෙ වම් ඇහැට කඳුළු ඉනුවෙ ආයෙ කවදාවත් චිත්‍ර අඳින්න බෑ නේද කියල හිතද්දි වෙන්න ඇති.

බොහොම ඉක්මනට තීන්ත බෝතල් තිබ්බ තැන්වලට බේත් බෝතල් අරක් ගත්ත. තාත්ත වෙනුවෙන් නර්ස් කෙනෙක් කුලියට ගන්න එයාලට පුළුවන්කමක් තිබ්බෙ නෑ. ඒ හින්ද ඒ රාජකාරිය ඉබේම පැවරුණේ 'නිකම'ට! 'නිකමා' එතකොට හතේ පන්තියෙ. එදා ඉඳන් දිගටම 'නිකම' ඉස්කෝලෙ ගිහින් ඇවිදින් කාලෙ ගත කළේ තාත්තගෙ ඇඳ ළඟ!

ටික කාලයක් 'නිකමා' උත්සාහ කළා දිගටම චිත්‍ර අඳින්න. ඒත් ඉක්මනටම මිනිහට තේරුම් ගියා පාට තැවරුණු කැන්වස් එකකට වඩා, ගෙදර අයට වටින්නෙ සල්ලිය කියන කතාන්දරේ. ඉන්දියාවෙ කොල්ලෙක්ගෙ මුළු අනාගතේම සරුසාර කරන්න පුළුවන් ඇලඩින්ගෙ පුදුම පහන, අයි.අයි.ටී. එක දිහාවට නිකමගෙ හිත යොමු වෙන්නෙ අන්න ඒ හින්දයි. ගිලිල ඉන්න දුප්පත්කමෙන්

ගැලවෙන්න තියෙන ඒකායන මාර්ගෙ ඉංජිනේරුවෙක් වීම බව 'නිකමා' ස්ථිරෙටම දැන ගත්ත. ඒක තමයි පාර! ආයෙ වරදින්නෙනං නැමයි!!

"කවද හරි දවසක එයාල සැප විඳීවි... ඔව්... මං එයාලට ඒ අවස්ථාව උදා කරල දෙනව..." 'නිකමා' තමන්ටම දිවුර ගත්ත. මිනිහ ඊ තිස්සෙ අයි.අයි.ටී. ඇතුළත් වීමෙ විභාගෙට පණ නැහැගෙන ගණන්, භෞතික විද්‍යාව පාඩම් කළා. අවුරුදු දෙකක් යනකල් නිකමා ගෙයින් පිට ගියේ ඉස්කෝලෙට යන්න විතරමයි. මිනිහ කිලෝ පහළොවකින් බැස්ස. තාත්තගෙ පිටේ ආව තුවාලවලට සාත්තු කරද්දිත් 'නිකම'ගෙ කටේ රැඳුණේ භෞතික විද්‍යාවෙ සූත්‍ර!

ඒ දවස 'නිකම'ට කවදාවත් අමතක වෙන්නෙ නෑ. අයි.අයි.ටී. එකට තේරුණු දවස. අම්මයි, තාත්තගෙ බාගෙකුයි සන්තෝෂෙන් ඉහවහා ගිය දවස. පවුලෙ දුක් කරදර වාෂ්ප වෙලා යන බවට පෙරනිමිති පහළ වෙච්ච් දවස! අවුරුදු හතරක් දුක් විඳල ඉගෙන ගත්තම හැම ප්‍රශ්නයක්ම ඉවරයි! එහෙම හිතල අයි.අයි.ටී. එකට ගිය දවසෙදි තමයි 'නිකම'ට රයනුයි, හරිකුමාර්වයි හම්බ වෙන්නෙ! උන්ගෙ පාපමිත්‍ර සේවනේ නිසා 'නිකම'ගෙ හීන බිඳිල යන්න පටන් අරන්. ලකුණු අඩු වෙලා... ග්‍රේඩ් බැහැල... අපතයො ගොඩට වැටිල...!

රයන්... අතීතයක්, අනාගතයක් නැතුව වර්තමානෙ විතරක් ජීවත් වෙන සෙල්ලක්කාරය...! කවුද අකැමැති මිනිහ වගේ ඉන්න? පෝසත් දෙමවුපියො... කඩවසම් පෙනුම... මොළේත් තියෙනව පිස්සු කෙළියට... ස්පෝර්ට් මීට් එකක ඕනෙ ඉවෙන්ට් එකක් කරන්න තරම් ක්‍රීඩාශීලීයි... දක්ෂයි... ඕන කෙනෙක්ව ආකර්ෂණය කරගන්න පුළුවන් කතාබහ... මිනිහ හරියට බෝවෙන රෝගයක් වගෙයි. හරිකුමාර් තමයි ඒකට තියෙන හොඳම උදාහරණෙ. රයන් කියන්නෙ මොනවද, හරිකුමාර් ඒකට එක පයින්. රයන් කිව්වොත් පාඩම් කළා ඇති කියල, හරිකුමාර් මිනිහගෙ පාඩම් කිරිල්ලත් නවත්තනව. රයන් කිව්වොත් අයි.අයි.ටී. එකේ ටෙස්ට්වලින් දෙන ග්‍රේඩ්ස් වැඩක් නෑ කියල, හරිකුමාරුත් වහාම ඒක පිළිගන්නව. රයන් හරියට අර මීයො වසඟ කළ නළාකාරයා වගේ කෙනෙක්!





මට මතකයි මිනිහ අපේ ගෙදර ආව වෙලාව. මිනිහ අපේ තාත්තව බබෙක් වගේ හරහට වඩාගෙනයි ඉස්පිරිතාලෙට ගෙනිච්චෙ. කොච්චර හරි ට්‍රයිෂෝ එකේදිවත් මිනිහ ඒ ඉරියව්ව වෙනස් කළේ නෑ. ඉස්පිරිතාලෙදි තාත්තට ඇඳක් ගන්න ඒ මිනිස්සුත් එක්ක වලියට ගියෙත් රයන්. ඊට පස්සෙ අපිත් එක්ක පාන්දර තුන වෙනකල් ඉස්පිරිතාලෙට වෙලා කට්ට කෑවෙත් රයන්! රයන් හොඳ කොල්ල... හිත හොඳ එකා. බොක්කෙ තියෙන දේ වුණත් අරන් දෙන බුදු පිට් එකා...! නැත්තං හම්බවෙච්ච පළවෙනිම දවසෙදි අපි වෙනුවෙන් බෝතල් කඩාගෙන, මරා ගන්න යාවිද සීනියර්ල එක්ක? නැත්තං තමන්ගෙ අලුත්ම ස්කූටර් එකේ, දෙන්න දාගෙන යන්න හදපු එකේ තුන්දෙනා දාගෙන, පොලීසියට කොකා පෙන්න පෙන්න චිත්‍රපටි පෙන්නන්න අරං යාවිද?

මිනිහ ගැන තවත් දේවල් තියෙනව කියන්නනං. එයාගෙ අම්මල එයාට ලියුම් එවනව සුමානයක් ඇර සුමානයක්. ඒත් මිනිහ නෙවෙයි ඒ එකකටවත් උත්තර ලියන්නෙ. ඒ වෙනුවට මිනිහ කියන්නෙ එයා ආදරේ නැතිලු එයාලට... එහෙමත් නැත්තං තවත් මොකක් හරි ඒ වගේ බූත කතාවක්. හැබැයි ඇත්ත කතාව තමයි මිනිහ ඒ හැම ලියුමක්ම බොහොම පිළිවෙළට ෆයිල් කරගෙන ඉන්නවයි කියන එක. මිනිහ මිනිහගෙ කාමරේ තනියෙන්ම ඉන්න වෙලාවට ඒ ෆයිල් එක දිග ඇරන්, ලියුම් එක එක කියවනව. මං අහන්නෙ එහෙමනං ඇයි මිනිහට බැරි එයාලට උත්තර ලියන්න? ඉඳල හිටලවත්? අනික මොකටද ඒ ලියුම් ආයෙ ආයෙ කියවන්නෙ එයාලට ආදරයක් නැත්තං? මං දන්නව රයන් හැම දෙයක්ම කරන්නෙ හේතුවක් ඇතුව බව. ඒත් හරිකුමාර්? මිනිහ ඔහේ අන්ධයෙක් වගේ රයන්ගෙ පස්සෙන් යනව.

මට රයන්ව තරමක් දුරට හරි තේරුම් ගන්න පුළුවන්. ඒත් අර හරිකුමාර්? ඌවනං මට තේරුම් ගන්න බෑ. මිනිහ ගොඩක් දුරට මට සමානයි. සාමාන්‍ය පන්තියෙ කෙනෙක්. මං වගේම කිසිම හිත් ඇදගන්නාසුලු පෙනුමක් නැති එකෙක්. තඩියෙක්. ඒත් මිනිහ ඉන්න හදන්නෙ, වෙන්න හදන්නෙ රයන් වගේ! ඒත් මිනිහ

මිනිහගෙ හිත ඇතුළෙන්ම දන්නව මිනිහට එහෙම වෙන්න බැරි බව! අනික මිනිහ කිසිම ආත්ම විශ්වාසයක් නැති එකෙක්. වයිවා එකේදි ආඩිය ඇල, උත්තර දීගන්න බැරුව බොග්... බොග්... ගාන එකෙක්. මිනිහට කවදාවත් රයන් වගේනං වෙන්න බෑ. මිනිහ ඒක තේරුම් ගන්නවනං මිනිහට කලදවසක් යයි. ඒත් මිනිහ ඒක තේරුම් ගන්න බවක් පේන්නෙනං නෑ.

මං එයාලගෙන් පළවෙනි වතාවෙ වෙන් වුණාම, මටත් හරියට විශ්වාසයක් තිබ්බෙ නෑ මං කළ දේ හරිද කියන එක ගැන. ඒත් දැන්නං මට විශ්වාසයක් නෑ මං ආපහු එයාල ළඟට යයිද කියන එක ගැන! ජීවිතේ හැටි එහෙම තමා. මොකක් හරි ප්ලෑන් කරගෙන පිළිවෙළක් වේගෙන එද්දි කෙළවෙනව!



# 8

## අවුරුද්දකුත් ගියපි!

ආලෝකය අපිව ඇල ගිහින් දවස් 365ක්... නැත්තං අවුරුද්දක් වුණා නේද කියල අපිට තේරුණේ තුන්වෙනි සෙමෙස්ටර් එකේ ප්‍රතිඵල ආව දවසෙදි. දැන් බැලුවහම හිතෙනව සමහර දේවල් අපිට කොච්චර අදාළ නැද්ද කියල. තවත් පහයි පොයින්ට් ගාණක්! තවත් සීල් එකක් (අපි අයි.අයි.ටී.යෙ දේපොළක් බව අඟවන...)! මායි, රයනුයි කැම්පස් පැත්තට ගියේ අපේ ලකුණු බලන්න. ඒත් ඒක නොවැදගත් සිද්ධියක් බවට ඉක්මනටම පත් වුණා. වැදගත්ම දේ තිබ්බෙ කැම්පස් එකේ වහලෙ උඩ!

මට මතක නෑ අපි කවදද මේ වහලෙ උඩ තිප්පොළ හොයා ගත්තෙ කියල. සමහර විට ඒ අපි ජොයින්ට්ස් ගහන්න පටන් ගත්තු දා වෙන්න ඇති. එහෙමත් නැත්තං අපි වොඩ්කා බොන්න පටන් ගත්තු කාලෙදි වෙන්න ඇති. ඒත් නැත්තං අපි පින්ක් ෆ්ලොයිඩ් අහන්න පටන් ගත්තු දවස්වලදි වෙන්න ඇති. ෆ්ලොයිඩ්... වොඩ්කා... ජොයින්ට්ස්... අපේ තිප්පොළ! අන්තිමට අපි අපේ ජීවිතේ වැදගත් කාරණාවට අවතීර්ණ වෙලා තිබ්බ. අයි.අයි.ටී. එකේ ජීවිතේ දරාගෙන ඉන්න සපෝට් එකක් දීපු කාරණාව. විශේෂයෙන්ම විභාගෙන් පහයි පොයින්ට් ගාණක් ගත්තු අපි වගේ උන්ට!

කැම්පස් එකේ තට්ටු නවයක්! මහ උසයි. නවවෙනි තට්ටුවෙනුත් වහල උඩට යන්නනං ඒකට තියෙන්නෙ එකම ක්‍රමයයි. රහස් පඩිපෙළක්! ඒක තිබ්බෙ බිල්ඩිමේ නඩත්තු කටයුතු

කරන කට්ටියගෙ පාවිච්චියට විතරයි. ඒත් අපි ඒකට අවතීර්ණ වෙන්න ක්‍රමයක් හොයා ගත්ත. ඒකට පිවිසෙන්න තිබ්බ වැරැන්ඩාව වගේ කෑල්ල ලොක් කරලයි තිබ්බෙ. ඒත් ඒක මහ ආදි කාලෙ ලොක් එකක්. ඉස්කුරුප්පු නියනක් ගත්තු රයන්ට ඒක අරින්න ගියේ විනාඩි තුනයි. විනාඩි පහේදි අපි වලාකුළුවලට කිට්ටු වෙලා හිටිය. කැම්පස් එකේ මුදුනෙම අපි. විභාගෙත් පහයි පොයින්ට් ගාණක් අරන් හොට බිම ඇනිල හිටියත් ඒ වෙලාවෙදිනං අපි තමයි කැම්පස් එකේ ඉහළින්ම හිටියෙ! වහලෙ මුදුන තනිකරම කොන්ක්‍රීට් තලාවක්. වටේ කොට බිත්තියක්වත් නෑ. ඒකෙ උඩ තිබ්බෙ කම්පියුටර්වලටයි, ටෙලිකොම් ජාලවලටයි ඕන කරන ඇන්ටෙනා තුන හතරකුයි, කණුවකුයි විතරයි. කළුවර වැටුණට පස්සෙ එතනට පේන්නෙ තරු එළි විතරයි. නැගිටල පහළ බැලුවොත් කැම්පස් එකේ තියෙන අතුරු පාරවල්වලට අල තියෙන ලයිට්ටුයි, ඈතින් තියෙන හොස්ටල් පේළියයි පේනව.

රයන් වොඩ්ක බෝතලෙයි, ජොයින්ට්ස් ටිකයි, වෝක්මන් එකයි එළියට ඇද්ද. ඒ දේවල් රයන්ටයි, මටයි බොහොම හුරුපුරුදු දේවල් වෙලා තිබුණෙ සුමානෙකට දෙපාරක්වත් අපි මේ වතාවත ඉෂ්ට කරන හින්දයි.

අපි වහල උඩ හාන්සි වුණා. දවාලෙ අව් රශ්නෙන් තැම්බිච්ච කොන්ක්‍රීට් පොළොව ඒ වෙද්දිත් ඒ රස්නෙ යාන්තමට වගේ රඳවගෙන තිබුණ. රයන්කාරය වෝක්මන් එකට ඉයර්ෆෝන් සෙට් එක ගහල, එයින් එකක් මගේ කනට එබුව. අනික මිනිහගෙ කනේ ගහ ගත්ත. ජොයින්ට් එකකුත් මට දුන්න. වොඩ්ක බෝතලේ දෙන්නගෙ මැදින් තියා ගත්ත. වොඩ්ක උගුරයි, ජොයින්ට් ආශ්වාස එකයි... සංගීතෙ රාවෙයි. ඒ ගීතවල පදමාලා අපිව අහසට අරගෙන ගිහින් පා කෙරෙව්ව.

"හැම එකාම තැම්බෙන්න හදනව උන්ගෙ ග්‍රේඩ්ස් ගැන කියව කියව..." රයන් කිව්වෙ දුම්වලින් වළල්ලක් අහසට යවන ගමන්.

ඒ දුම බොහොම ලස්සනයි කියල මට හිතුණ. සැහැල්ලුයි. හැඩයක් නෑ. බලයක් නෑ. හරියට ඒක පිට කරන එකා වගේම!





ඒත් ඒක එන්නෙ අපේ ඇතුළාන්තයෙන්මයි... පිස්සු... මොනවද මේ මං හිතන බූත? ජොයින්ට් එක නිසා තමයි මේ පිස්සු විකාර හිතෙන්නෙ.

"නැතුව... උන්ට පිස්සු. අනික දැක්කද උන් අපි දිහා බලන හැටි?" මං ඇහුව.

"කොහොමද?"

"හරියට අපි මොකට මේකට ආවද කියන්නා වගේ. අනික අපේ ග්‍රේඩ්ස්වලින් උන්ට තියෙන වැඩේ මොකක්ද? හරියට අපි උන්ගෙ ලකුණු උදුර ගන්නව වගේනෙ උන් හිතන්නෙ..."

"උන් දන්න ලබ්බ..." රයන් බොහොම නුවණක්කාර විදිහට ඒක විග්‍රහ කළා.

"හැබැයි උන් හිතන එකේ ඇත්තකුත් තියෙනව..." මාත් අපේ තත්ත්වෙ විග්‍රහ කරන්න වුණා. "අපි මොකට මේකට ආවද මන්ද...?"

"හරියට හරි... අපි මේකට හරි යන්නෙ නෑ... අපි මෝල්ලු."

"ඉතින්?"

"අපි උන්ව හදමු. අපි උන්ගෙ ජීවිතවලට සතුට අරන් එමු."

"එළ... ඒක තමයි කරන්න ඕනෙ..." මං එකඟ වුණා.

"හැබැයි මං වද වෙන්නෙ අපේ එවුන් ගැන නෙවෙයි... ප්‍රොෆාල ගැන..."

"ඔයා ඔය කතා කරන්නෙ ඩිසයින් ක්ලාස් එක ගැනනෙ... හරිද...?"

"හරි... අර ප්‍රොෆෙසර් හාතිය... ඔයා දන්නවනෙ මිනිහව? ඔයත් ඒ ක්ලාස් එකේ හිටියනෙ. මං පොරට අයිඩියා එකක් දුන්න සස්පෙන්ෂන් බ්‍රිජ් එකක් හදන විදිහක් ගැන. මිනිහට මාර ත්‍රිල් එකක් ගියා ඒක අහල. මිනිහ මට කිව්ව ඒකට ස්කේල් ඩ්‍රෝවිං එකක් ඇඳල සබ්මිට් කරන්න කියල. ඒ කරල කිව්ව මං ස්පෙෂල්

ඉන්ටර්න්ෂිප් ප්‍රොජෙක්ට් එකක් දෙන්නං කියල. පස්සෙ මිනිහ මගෙ නම අහගෙන මගෙ ග්‍රේඩ් එක හොයාගෙන... ඒක දැන ගත්ත විතරයි මේකා මට කිව්වෙ නැතෑ ඩ්‍රෝවිං එක අවශ්‍ය නෑ. ඉන්ටර්න්ෂිප් එකත් අමතක කරන්න කියල... ඉතින් බලහල්ලකො..." රයන් හැල්ලක් කියාගෙන ගියා.

ඒ වෙද්දි අපි දෙන්නම ජොයින්ට් එක ගානෙ ඉවර කරලයි හිටියෙ. රයන් වාඩි වුණේ තව එකක් හදන්න. මිනිහ ඒකට අවශ්‍ය අඩු වැඩිය කුඩු කළේ හරියට ඒවා ප්‍රොෆෙසර් භාතියගෙ ශරීර අංගයක් කියල හිතාගෙන වෙන්න ඕනෙ.

"ප්‍රොෆා යකාට ගියදෙන්..." මං බොහොම ඥානාන්විත යෝජනාවක් ගෙනාව. අපි අපේ වීදුරු ආපහු පුරව ගත්ත.

"අනිත් ප්‍රොෆාලත් යකාට ගියදෙන්..." රයන් ඒක ස්ථිර කළා.

"ඔව්... හැබැයි ප්‍රොෆෙසර් වීරානං එච්චර අවුලක් නෑ..." ප්‍රොෆෙසර් වීරා කියන්නෙ යාන්ත්‍රික විද්‍යාවට ආව ප්‍රොෆෙසර් කෙනෙක්.

"හරි... ප්‍රොෆෙසර් වීරා ඇර අනික් අය යකාට ගියදෙන්..." රයන් යෝජනාව සංශෝධනය කළා. "හැබැයි තව එකෙක් ඉන්නවලු එපාම කරපු... පොර තාම අපිට ආවෙ නෑ..." රයන් දෙවෙනි ජොයින්ට් එක පත්තු කරන ගමන් කිව්ව.

"කවුද?" මං ඇහුවෙ මාත් තව ජොයින්ට් එකක් ගහනවද නැද්ද කියල හිත ඇතුළෙන් වාද කරන ගමන්. රයන්ටනං දෙක තුනක් වුණත් ඔරොත්තු දෙනව. ඊට පස්සෙ ඌ යකා වගේ කනව. හැබැයි මට වැඩිපුර ගත්තම ටිකක් අවුල්. කොහොම වුණත් ඒ වෙද්දිත් මං හිටියෙ පාවි... පාවි... ලෝකෙටම ඉහළින්... පුලුන් රොදක සැහැල්ලුව අරන්. ඔක්කොම ප්‍රොෆෙසර්ලවයි, ඔක්කොම ශිෂ්‍යයන්වයි, ඔක්කොම එසයින්මන්ට්ස්සුයි යකාට ගියදෙන් කියල ප්‍රාර්ථනා කර කර...

"ප්‍රොෆෙසර් වෙරියන්..."





"ඇහ්... නේහාගෙ තාත්ත?" මාව චුට්ටක් විතර හැබෑ ලෝකෙට ආපි. "ඔව්... ආරංචියෙ හැටියටනං මිනිහ දසයෙක්. මිනිහ හැසිරෙන්නෙ ඩිපාර්ට්මන්ට් හෙඩ් වගේලු... අනික් ප්‍රොෆාලයි, ළමයිනුයි ඔක්කොම මිනිහට බයලු. මිනිහ කියන දේ අහනවලු."

අනිත් අය මිනිහට බයයි කියන කතාවෙනං ඇත්තක් ඇති කියල මට හිතුණ. ඒක නේහාගෙන්ම ඔප්පු වෙනව.

"කවුද කිව්වෙ?" මං ඇහුව.

"ඒක ඕන එකෙක් දන්නව... ඕන සීනියර් කෙනෙක්ගෙන් අහන්නකො. කොහොම වුණත් මට කිව්වෙ අනුරාග්..."

"කොයි කාලෙද පොර අපිට එන්නෙ?"

"ඊළඟ අවුරුද්දෙ... මිනිහ කරන්නෙ තර්ඩ් ඉයර් එක..."

"ඊළඟ අවුරුද්දෙ...? චැහ්... දුර වැඩියි. දෙන්නකො මට තව ජොයින්ට් එකක්."

මෙතනින් චුත වෙන්න තව අවුරුදු දෙකක් තියෙනව. හහ්... ඊත් එපාම කරපු ප්‍රොෆා තාම ඇවිත් නෑ... ඒ කලකිරීම තමයි මට තව ජොයින්ට් එකක් ගහන්න හිතුණෙ.

"ආ..." රයන් මට ජොයින්ට් එකක් දෙන ගමන් කිව්ව. රයන් හොඳ එකා? ඌ යාළුවන්ට ජොයින්ට්ස් නිර්මාණය කිරීමේ සියුම් කාර්යය බොහොම හොඳට කරනව.

"කොහොම හරි... දැන් මට ඕනෙ නෑ ඔය මළඉලව් ග්‍රේඩ්ස් ගැනයි ප්‍රොෆාල ගැනයි කතා කරන්න. අපි වෙන දෙයක් ගැන කතා කරමු..." මං කිව්ව.

රයන් නිශ්ශබ්ද වුණා. මිනිහ අපිට කතා කරන්න මාතෘකාවක් හිතනව ඇති! තත්පර විස්සක් විතර එහෙම හිටපු රයන්ට ඔන්න මාතෘකාවක් ආව.

"කොහොමද ඔයාගෙ කෙල්ල?"

රයන්, නේහාව ඇඳින්නුවෙ එහෙමයි කවදත්. මිනිහ කොයි වෙලාවකදිවත් නේහාගේ නම කිව්වෙ නෑ. මිනිහ නේහාට වැඩි වැදගත්කමක් ආරෝපණේ කළේ "ඔයාගෙ කෙල්ල" විදිහට නේහව හැඳින්වීමෙන්.

"එළ... අපි ඊළඟ සුමානෙ ෆිල්ම් එකකට යනව..."

"ඔයාලා ඕක ෆුල් සිරාද කරන්නෙ...?"

"මොනව ගැනද සිරා?"

"මන්ද... ඔය ලව් එක... එයා... ඔය ඔක්කොම... ඔයාලගෙ අනාගතේ..."

"අනේ මන්ද..." මං කිව්ව.

පිරිමි තමන්ගෙ සම්බන්ධකම් ගැන කියන්නෙ එහෙමයි. කිසිම දෙයක් ගැන අදහසක් නැහැ.

"එයා මොනව හරි කියල තියේද ඒ ගැන?" ආයෙ රයන් ඇහුව.

"ඔයා දන්නවනෙ එයාගෙ හැටි... හැම තිස්සෙම මූඩ් ගහලනෙ ඉන්නෙ. අපි ඔය ෆිල්ම් එකක් බලන්න ගියාම එහෙම එයා පූසියෙක් වගේ මට තුරුල් වෙනව... හැබැයි එතකොට මං ඊට එහාට යන්න හැදුවම එයා ඒකට ඉඩ දෙන්නැතුව, මට දේශනා දෙන්න පටන් ගන්නව. එයා හැදිච්ච කෙල්ලෙක්ය... මාත් හැසිරෙන හැටි ඉගෙන ගන්න ඕනෙය. ලෝකෙ අනිත් අය අපි දිහා බලාගෙන ඉන්නව...වගේ දේවල් කිය කියා."

"මොනාද ඔයා එයාට කරන්න ගියේ...? හිඃ... හිඃ... හිඃ... මං දන්නවනෙ සතාගෙ හැටි..." රයන්ට ඒව දැන ගන්නත් ඕනෙ වුණා. ඕං ඕක තමයි තමන් ගැන හොඳටම දන්න මිනිස්සුන්ගෙ තියෙන වැරැද්ද. මොකක් හරි කිව්වම තීරණයක් අරගෙනත් ඉවරයි... අපේ පැත්තෙන් කතාව අහන්නත් ඉස්සෙල්ලම!

"මං මුකුත් කරන්න ගිය එකක් නෑ... ඔයා දන්නවද අපි තාම කිස් කරලවත් නෑ කියල? මට එයාව මේ වෙද්දි විසි පාරක්





විතර හම්බ වෙලා තියෙනව. ඒත් ඒ එක පාරකවත් එයාගෙන් මට පුෂ් එකක් ලැබිල නෑ..."

"හ්ම්... හොඳ හැදිච්ච කෙල්ලෙක් වගේ ආ... ඔයා ලකී..."

"හැදිච්ච...? මට ඒකෙන්නං වැඩක් නෑ..."

මං කිව්වෙ ඇත්ත. ඔය හැදිච්ච එවුන් ඉන්නව නේද පට්ට බෝරිං පොරවල්! කොල්ලොයි කෙල්ලොයි දෙගොල්ලම! එයාල අපිට ජොයින්ට්ස් දෙන්නෙ නෑ. හැදිච්ච කෙල්ලො අපිට කිස් කරන්න දෙන්නෙ නෑ...! මොන කෙහෙල්මලක්ද?

"ඔයා ඉතින් ඒක එයාට කියන්නකො... කියන්න ටිකක් නෝටි වෙන්න කියල. මට ෂුවර් එයා එහෙම වෙනන් කැමතියි කියල."

"පිස්සුද ඔයාට? එයා කෙල්ලෙක්... කෙල්ලෙක් කැමති වෙනවද නරක් වෙන්න?"

"නැත්තෙ මොකද... ඕන කෙල්ලෙක් කැමතියි. හැබැයි අපි තරමටම නෙවෙයි. ඊට ටිකක් අඩුවෙන්..."

මං නේහත් එක්ක කරන්න හීන මවාගෙන ඉන්න දේවල්ම, එයත් මා එක්ක කරන්න හීන මවනවයි කියන එක මට පිළිගන්න බැරි වුණා.

"මංනං හිතන්නෙ නෑ ඔයා කියන දේ ඇත්තයි කියල... ඔයාට කවද හරි ගර්ල් ෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉඳල තියේද?"

"එහෙනං විශ්වාස නොකර ඉන්නකො... හරි කෙල්ලො ගැන කතා කළා ඇති. දැන් අපි තව ෂොට් එකක් ඇල. සිංදුවක් අහමු."

රයන් තමන් ගැන කවදාවත් වැඩිය කතා කළ කෙනෙක් නෙවෙයි. සමහර වෙලාවට මට හිතිල තියෙනව මිනිහ සමලිංගිකයෙක්දෝවත් කියල! හැබැයි ඉතින් එහෙමත් නෑ... එහෙමනං ඒක අපිට තේරෙනවනෙ! අපි ඕනෙ තරං එකට ජීවත් වෙලා තියෙනවනෙ! ඔන්න මිනිහට මාව බය හිතෙන තරමටම

අවලස්සනනං මිසක් නැත්තං එහෙම දේවල් වෙන්න ඕන තරම් අවස්ථා උදා වෙලා තියෙනව. ඒත් මිනිහ එහෙම එකෙක් නෙවෙයි. මිනිහ ෆිල්ම්ස්වල ඉන්න නිළියන්ට වහ වැටිල තියෙනව. මිනිහ පාරෙ යන කෙල්ලන්ට විසිල් ගහල එයාලගෙ නැළවෙන පස්සවල් අගය කරල තියෙනව. සමලිංගිකයෙක් (පිරිමි) එහෙම කරන්නෙ නෑනෙ. මං හිතන්නෙ කෙල්ලෙක් එකක් යාළු වෙන්න මිනිහට තවම මූඩ් එකක් ඇවිල්ල නැතුව ඇති.

රයන් දැම්ම පින්ක් ෆ්ලොයිඩ් එකක්. වොඩ්කා බෝතලේ මට්ටම අඩු වේගෙන, අඩු වේගෙන ගියා. රයන් බෑග් එක අවුස්සල අන්තිම ජොයින්ට් එකත් එළියට ගත්ත. හඳ පළුව අහසෙ දිලිහෙනව අපි බලාගෙන. ඒක වටපිටාවෙ දිලිසෙන තරු කැට හිනා වෙවී අපි දිහා බලා හිටිය. හරියට අපිට වඩා ලකුණු අරන්, අපිට වඩා ඉහළ ග්‍රේඩ්වල ඉන්න බ්‍රයිටෝ, අපතයො වෙච්ච අපි දිහා බලනව වගේම!

ඔයාලා ෆ්ලොයිඩ් ගැන දන්නවද? උන්නං එළම සෙට් එකක්! බොන්න බොන්න උන්ගෙ සිංදු ලස්සනට ඇහෙනව. හරියට උන්ව හදල තියෙන්නෙ ඇල්කොහොල්වලින් වගේ. එහෙම සෙට්වෙන දේවල් තියෙනවනෙ. කිරි-පැණි, සමෝසා-චට්නි, ඉඩ්ලි-සාම්බාර්, රජ්මා-චවාල්... ඒ වගේ ෆ්ලොයිඩ්-වොඩ්කා! මාරයි!!!

"ඔයා දන්නවද අද මට මතක් වුණේ මොකක්ද කියල?" රයන් ඇහුව.

"මොකක්ද?"

"පළවෙනි සෙමෙස්ටර් එකේ රිසල්ට්ස්... මතකද?"

"මොකෝ නැත්තෙ?"

"ඊට පස්සෙ මතකද?"

"ඊට පස්සෙ... මොකක්ද?"

"අර ආලෝකය... ඌ අපිව දාල ගියා..."





පහුගිය අවුරුද්ද තිස්සෙම රයන් ආලෝක් ගැන වචනයක්වත් කතා නොකරන්න පරිස්සං වුණා. ඒ විතරක් නෙවෙයි... ආලෝක් ගැන කතා කරන එකෙන් මාවත් වළක්වන තැනට වැඩ කළා. "යන්නෙ එහෙම නෑ මිනිහගෙ පස්සෙ... මිනිහනෙ අපිව දාල ගියේ..." එහෙමයි රයන් කිව්වෙ. බැරි වෙලාවත් මං ආලෝක්ව හම්බ වෙන්න ගියානං එහෙම රයන් මට හොඳවයින් කතා කරන බව මම දැනගෙන හිටිය.

"මොකෝ අද එක පාරටම ආලෝකයව මතක් වුණේ...?" මං ඇහුවෙ වොඩ්කා බෝතලේ උස්සල, ඒකෙ තව කොච්චර තියෙනවද කියල බලන ගමන්. ආයෙ දෙකක් නෑ... රයන්ට හොඳට වැදිල. ඒක ෂුවර්. නැත්තං මිනිහ ආලෝක් ගැන කතා කරන්නෙ නෑ කීයටවත්ම.

"මං දැන් තමයි මිනිහ ගැන කිව්වෙ. ඒක හරි... ඒත් මට නිතරම මිනිහව මතක් වෙනව." රයන් මානව දයාවෙන් පිරිපුන් උත්කෘෂ්ට මනුස්සයෙක් බවට පත් වෙමින් හිටිය. මිනිහට ඒක කළේ වොඩ්කා සහ ජොයින්ට්ස්! ඒ දෙක පදමට රයන්ගෙ වගේම මගෙත් රුධිර සංසරණ පද්ධතියෙ පිනුම් ගහන්න පටන් අරන් තිබ්බ.

"ඒකා මකබෑ වෙද්දෙන්..." මං එහෙම කිව්වෙ, මං ආස කරනම වචන ටිකත් සිංදුවෙ කියවෙද්දි.

"ඌ මෙලහට මොනව කරනව ඇද්ද...?" රයන් ඇහුව.

"කවුද?" මං ඇහුව. "ආලෝකයද?"

රයන් ඔළුව වැනුව.

"අර වෙන්කට් කියන පොත් ගුල්ලත් එක්ක පොතක් අස්සෙ රිංගන් ඇති... මට ආරංචියි මේ පාර මිනිහට හයයි පොයින්ට් ගාණක් තිබ්බ කියල..."

"හරි... ඔයා දන්නවද... ඌ කළේ හරි දෙයක්..." රයන් කිව්ව.

"ඔව්... ඔව්... නැතුව?"

"නෑ... මං මේ කියන්නෙ සිරාවටම. හරිනං ඔයාටත් තිබ්බෙ මාව දාල යන්නයි. මං ඔයාලට හොඳක් කරන කෙනෙක් නෙවෙයි."

අඩෙ අප්පා... මොකක්ද මේ වේගෙන එන්නෙ? බීපුවත් බහිනව මේකගෙ කතාවලට! මොකක්ද රයන්ට ඕන වෙලා තියෙන්නෙ? මෙතනදි මට විකල්ප දෙකක් තිබ්බ. එකක් තමයි "කට වහගෙන, විකාර දොඩවන්නෙ නැතුව සිංදුව අහපන්..." කියන එක. අනික තමයි මිනිහගෙ මතයට කන් දීල, මං මිනිහට ඕන දේ කරන එක.

"මොකද ඔයාට වෙලා තියෙන්නෙ? ඔයාට අප්සෙට්ද වෙච්ච දේට?"

"නෑ... නෑ... මට අවුලක් නෑ. හරී... ඔයත් මාව දාල ගියානං ඉවරනෙ. එහෙමයි වෙන්නෙ... හැමෝම මාව දාල යනව... ඒ හැමෝම හරි ඇති..."

"මොකක්? හැමෝම?"

"ඔව්... අම්ම... තාත්ත... ආලෝක්... ඔය හැමෝම..."

"මේ නිකං පිස්සෙක් වෙන්නැතුව අපේ ආතල් කඩා ගන්නෙ නැතුව ඉමු..."

"හොඳයි, ඔයා කියන්නෙ ආලෝකය වැරදියි කියලද? ඔයා හිතන්නෙ මං මිනිහ ගැන තැකීමක් කළේ නෑ කියලද?" මිනිහ තදින් ඇහුව.

මේ වගේ අවස්ථාවලට මූණ දෙන්න මං ආසම නෑ. ඒත් ඉතින් එන එන විදිහට ගහ උළුවස්සා කීවලුනෙ!

"රයන්... ආලෝක් කළේ හරි දෙක් නෙවෙයි... ඒක එයා කවද හරි තේරුම් ගනීවි. දැන් ඇස් දෙක පියාගෙන අපි අපේ ආතල් එක ගමු..." මං අවවාද කළා.





මං ඇස් දෙක වහ ගත්ත. වොඩ්කයි, ජොයින්ටුයි මාව සම්පූර්ණයෙන් අයිති කරගෙන තිබ්බ. ඒ වගේ වෙලාවට මට පුළුවන්, මට ඕන දේ දකින්න! නේහා මගෙ එහා පැත්තෙන් වාඩි වෙලා මාව අත ගගා හිටිය. එයාගෙ කොණ්ඩෙ, විශේෂයෙන්ම අර නළලට වැටෙන කෙහෙ රැල්ල, මගෙ මුහුණෙ වදිමින් මාව පිරිමැද්ද. එයාගෙ රවුම් මූණ මට පෙනුණෙ හඳ වගේ. එහෙමත් නැත්තං මං ඇත්තටම හඳද දකින්නෙ? මාර ට්‍රිප් එකක් තමා යන්නෙ! මං තවදුරටත් මගෙ සිහින ලෝකෙ සැරිසරන්න හදද්දි රයන් මට බාධා කළා.

"ඔයා දන්නවද මේ වහලෙ උඩ තියෙන හොඳම දේ මොකක්ද කියල?" රයන් ඇහුවෙ මගේ ඉස්සරහින් හිටගෙන.

"අපි මෙතන ඉන්නව කියල කාටවත් දැන ගන්න බැරි එක...!"

"නෑ... මෙතන අපිට හොඳ ඔප්ෂන් එකක් තියෙන නිසා..."

"ඔප්ෂන් එකක්...? මොකක්ද?"

"මෙතනින් බිමට පනින්න පුළුවන් එක...! එතකොට ඔක්කොම ඉවරයි..."

"පිස්සු කියවන්න එපා." මං වාඩි වෙන්න සටනක් දෙන ගමන් කිව්ව.

"මං සිරා... අනික් අයට පුළුවන් ඕන දෙයක් කරන්න. ඒත් මට පුළුවන් මට ඕන දේවලුත් කරන්න..."

"මොනවද මේ විකාර කියවන්නෙ? ඔයාට වැඩියි වගේ... මට දැන් යන්න ඕනෙ." මං කිව්වෙ එනපොට හොඳ නැති බව තේරුණු හින්ද... බීල හිටියත් සමහර වෙලාවට මොළේ පහළ වෙනව.

★

හතරවෙනි සෙමෙස්ටරියෙදි අපි කවදාවත් ද්‍රව තාක්ෂණ ක්ලාස් එකනං මිස් කළේම නෑ. හේතුව ඒක කළේ ප්‍රොෆෙසර් වීරා වීම! අනික ඒක තිබ්බෙ අපිට නිදිමත හැදෙන වෙලාවක නොවීම!! ප්‍රොෆෙසර් වීරා කොහොමටත් වෙනස්ම කෙනෙක්. එක වෙනසක් තමයි, එයා අනික් ප්‍රොෆෙසර්ස්ලට වඩා අවුරුදු විස්සකින් විතර බාල වීම. මිනිහට ඕනෙනං අවුරුදු තිහක් ඇති. ඇන්දෙ ඩෙනිම් ජීන්ස්... ටී ෂර්ට්ස්... ඒව එයාට ඇමරිකාවෙ යුනිවර්සිටීස්වලදි හම්බ වෙච්ච ඒව. අපි ඒක දැන ගත්තෙ ඒ ටී ෂර්ට්ස්වල ඇමරිකන් විශ්වවිද්‍යාලවල ලාංඡන ගහල තිබ්බ හින්දයි. ප්‍රොෆෙසර් වීරට ලෝකෙ ඉහළම විශ්වවිද්‍යාල පහකින් ලබා ගත්තු උපාධි තිබ්බ. උපාධිම පහක්! එයාගෙ ටී ෂර්ට්වල ඒ විශ්වවිද්‍යාල පහේම ලෝගෝස් තිබ්බ. ඒ ඇරෙන්න එයාට සී.ඩී. ප්ලේයර් එකකුත් තිබ්බ. ඒක පෝටබල් එකක්. එයා පන්තියෙන් යන්න කලින් ඒක ප්ලග් කරල, ඉයර්ෆෝන් දාගෙන සිංදුවක් එහෙමත් අහනව. ප්‍රොෆෙසර් වීරා ළඟදි තමයි කැම්පස් එකට ඇවිත් තියෙන්නෙ. ඇත්තටම එයා අලුත් හින්ද එයාට ෆුල් ක්ලාස් කරන්න නොදෙන්නයි මුලින් තීරණය කරල තියෙන්නෙ. එයාගෙ ප්‍රධාන ලෙක්චරර්ට හාට්ඇටෑක් එකක් හැදුණු හින්ද තමයි, ප්‍රොෆෙසර් වීරට මේ අවස්ථාව හම්බ වෙලා තියෙන්නෙ. එයාගෙ පළවෙනිම දවස!

"ළමයි..." ප්‍රොෆෙසර් වීරා පන්තියට එන ගමන්ම කියාගෙන ආව. එයා පළවෙනි පේළියෙ සෙට් එකට චුයිංගම් බෙදුව. පළවෙනි පේළියෙ හිටියෙ බ්‍රයිටෝ. නවයයි පොයින්ට් ගණන් ගත්තු එවුන්. උන් සෙට්එක ප්‍රොෆෙසර්ගෙ දීමනාවෙන් ගල් ගැහුණ. හරියට උන්ගෙ ඉස්සරහට ලස්සන කැබරේ කෙල්ලෙක් ඇවිදින්, උන්ගෙ මූණු ළඟටම කරල, බ්‍රා එක ගැලෙව්වම වගේ!! කවුරුත් එයාගෙ දීමනාව පිළිගත්තෙ නැති හින්ද එයා උරහිස් අකුළල, ඒව ආපහු එයාගෙ සාක්කුවට දාගත්ත. ඊට කලින් ඒවයින් කෑල්ලක් කටේ දාගෙන හපන්නත් එයා අමතක කළේ නෑ. ඊට පස්සෙ එයා බෝඩ් එක දිහාට හැරුණ.

"Turbulent Flows" ලොකු අකුරෙන් ඒකෙ ලිව්ව.





"කොල්ලනේ... පළවෙනි ලෙක්චර්ස් පහේදි අපි ඉගෙන ගන්නෙ සරල ගලා යාම් ගැන... ඒ කිව්වෙ ලැමිනර් ෆ්ලෝස්... මේ ගලා යෑම්වල හැඩය වගේම දිසාව කලින් කියන්න පුළුවන් සමීකරණ වගේ සූත්‍ර ආධාරෙන්. ඔයාල දන්නව ඒ සමීකරණෙ මොකක්ද කියල... එහෙම නේද?"

ප්‍රොෆෙසර් වීරා පන්තියෙ හතර අතම බැලුවෙ උත්තරේ බලාපොරොත්තුවෙන්. එයා අනික් ප්‍රොෆෙසර්ස්ල වගේ උත්තරේ බලාපොරොත්තු වුණේ පළවෙනි පේළියෙ හිටිය උන්ගෙන් විතරක් නෙවෙයි. එයා පන්තියෙ පිටිපස්ස පේළි දිහාත් හොඳට බැලුව.

"පළවෙනි පේළිවල ඉන්න අයගෙන් නෙවෙයි... අපි බලමු පිටිපස්ස පේළිවල ඉන්න අයගෙන්..."

රයනුයි, මායි හිටියෙ පිටිපස්සෙම. ලෙක්චරර්ගෙ ඇහැට නොපෙනෙන මානයෙ. පහයි පොයින්ට් ගාණ ගත්තු එවුන්ට තිබ්බ ආරක්ෂාකාරීම තැන තමයි එතන. ඒත් ප්‍රොෆෙසර් වීරට ඒවයින් වැඩක් වුණේ නෑ.

"රයන්... කියමු බලන්න ලැමිනර් ෆ්ලෝ එකට තියෙන ප්‍රධානම සමීකරණෙ මොකක්ද කියල...?"

"සර්... මි... මි... මේ... ම.. මම...?" රයන් වැඩියම තක්බීර් වුණේ ප්‍රොෆෙසර් වීරා එයාගෙ නම දැන ගත්තෙ කොහොමද කියන එක ගැනයි.

"ඔව්... ඔයා තමයි. මං දන්නව ඔයා උත්තරේ දන්න බව රයන්...!"

"නේවියර් ස්ටෝක්ස් සමීකරණෙ..."

"හරියට හරි... ඔයා ඒක ලියල පෙන්නන්නකො පන්තියටම..."

රයන් එඩිතර විදිහට බෝඩ් එක ළඟට ගියා. ඉස්සරහ පේළිය හිටපු 'නවයො' ටික පන්තියෙ ඉගැන්නීමට සම්මාදම්

වෙන පහේ මෝලා දිහා බලන් හිටියෙ කුණු මාළු කෑල්ලක් දිහා බලන විදිහට.

"වෙරිගුඩ් රයන්... ආ... අනික ඔයා නේද ගිය අවුරුද්දෙ ස්කූටර් එකට යන පෙට්‍රල් අඩු කරගන්න විදිහ ගැන ප්‍රොපෝසල් එකක් දීල තිබ්බෙ?"

"ඔව් සර්..."

"ඔයා ඇත්තටම ඒක ඔයාගෙ ස්කූටර් එකෙන් චෙක් කළාද?"

"ඔව් සර්... හැබැයි අකුරටමනං නෙවෙයි..."

"අයි ලයික් දැට්..." ප්‍රොෆෙසර් වීරා කිව්වෙ, ඉස්සරහ පේළියෙ නවයො දිහා බලාගෙන. ඒත් ඒක නවයො දැක්කද කියල ෂුවර් නැත්තෙ පොරවල් ටික මෙලෝ සිහියක් නැතුව, ගිරව් වගේ, වයින් කරපු රොබෝල වගේ, රයන් බෝඩ් එකේ ලියපු සමීකරණෙ තමන්ගෙ පොත්වල ලියා ගනිමින් හිටිය හින්ද.

"අයි රියලි ලයික් දැට්..." ප්‍රොෆෙසර් වීරා ආයෙමත් කිව්වා.

රයන් ආපහු සීට් එකට ආව. මිනිහ ද්‍රව තාක්ෂණයට, ඊටත් වඩා ප්‍රොෆෙසර් වීරට ඇලුම් කරන බව මිනිහගෙ ඉරියව්වලින්, මූණෙන් මට රහසක් වුණේ නෑ. එදා ඉඳන් එකම දවසක්වත් අපි ඒ ක්ලාස් එක මිස් කළේ නෑ. රයන් හිටියෙ ප්‍රොෆෙසර් වීරා වෙනුවෙන් මැරෙන්න වුණත් ලෑස්ති වෙලා. අනික් ප්‍රොෆෙසර්ස්ල, ප්‍රොෆෙසර් වීරගෙන් හාත්පසින්ම වෙනස් කියන එක අමුතුවෙන් කියන්න ඕනෙ දෙයක් නෙවෙයි. රයන්ට ඒ එක්කෙනෙක්වත් ඇස් කොනට පෙන්නන්න පුළුවන් තත්ත්වෙක නෙවෙයි හිටියෙ.

★





ද්‍රව තාක්ෂණ පන්තියෙන් සුමානෙකට පස්සෙ මට නේහව හම්බ වුණා, ප්‍රියා ෆිල්ම් හෝල් එකේදි. මට ඕන්නම් ඔයාලට කියන්න තිබ්බ "මට මගේ ගර්ල් ෆ්‍රෙන්ඩ්ව හම්බ වුණා" කියල. ඒත් එහෙම කියන්න තරමට තාම මට ඒ කාරණාව ගැන විශ්වාසයක්, ෂුවර් එකක් තිබ්බෙ නෑ. අපි දැන් හම්බ වෙන්න අරං අවුරුද්දකට වැඩි වුණත් ඒ ඒ වෙලාවල්වලට එයාගෙ තියෙන මූඩ් එකේ හැටියට එක එක දේවල් කියවනව මිසක් ආදරේ සම්බන්ධව එහෙමටය කියල යමක් කතා වෙලා නෑ. මුලින්ම මං එයාට යාළුවෙක් වුණා. (එයා කියන විදිහට.) ඊළඟට මං එයාට හොඳ යාළුවෙක් වුණා. ඊළඟට මං එයාට විශේෂ සහ "රියලි, රියලි ගුඩ් ෆ්‍රෙන්ඩ්" කෙනෙක් වුණා. ඊළඟට මං එයාට, "රියලි, රියලි, රියලි ගුඩ් ඇන්ඩ් ස්පෙෂල් ෆ්‍රෙන්ඩ්" කෙනෙක් වුණා. ඒ මිසක් මං තාම එයාගෙ "බෝයිෆ්‍රෙන්ඩ්" කියල එයා කියල නෑ. කෙනෙකුට බෝයිෆ්‍රෙන්ඩ් කියන එක එයාට මහ ලොකු දෙයක්! එයාගෙ තාත්ත, අර චෙරියන් කියන ප්‍රොෆෙසරය එයාව හදල තියෙන්නෙ, ජීවිතේ කාටවත් "බෝයිෆ්‍රෙන්ඩ්" කියල හෙම කියන්න එපාය කියල වෙන්න ඕනෙ. අපරාදෙ කියන්න බෑ, දූ කුමරිත් ඒක අකුරටම ආරක්ෂා කරනව! හැබැයි ඉතින් ප්‍රොෆෙසරය කියල නැති හින්දද මන්ද, සුමාන දෙකකට සැරයක් මාත් එක්ක ෆිල්ම් එකක් බලන්න, ඒ බලන ගමන් අත් පටලවාගෙන ඉන්න හෙමනං එයා පසුබට වුණේ නෑ!

"අදත් පරක්කුයි..." එයා කියපි. හහ්... ඕනෙනං මං විනාඩි දෙකක් පරක්කු ඇති. "ප්‍රොෆෙසර් වීරාගෙ ක්ලාස් එක... එයා ටිකක් වැඩියෙන් කළා... වෙලාව ගියා දැනුණෙත් නෑ."

"එයා කොල්ලෙක් වගේ... නේ?"

"ඔව්... ඔයා දන්නවද එයාව?"

"එහෙමටම නෑ. තාත්ත කියනව අහන් ඉඳල තියෙනව... මං හිතන්නෙ තාත්තට එයාව දිරවන්නෙ නෑ."

"අපෝ... ඔයාගෙ තාත්ත මහ..."

ඒ වාක්‍යය මට ඉවර කරගන්න බැරි වුණේ නේහා මට ඒකට විරෝධය පාලා ඇහිබැම් නටවන්න ගත්ත නිසා.

"යං... යං... ඇතුළට යං... මට ට්‍රේලර්ස් හිටන් බලන්න ඕනෙ..."

අපි බැලුවෙ ඉංග්‍රීසි ෆිල්ම් එකක්. විද්‍යා ප්‍රබන්ධයක්. හැබැයි මහ ගොන් ෆිල්ම් එකක්. දිල්ලිවල තියෙන ෆිල්ම් හෝල්ස් එහෙම තමා. ඒවයෙ පෙන්නන්නෙ එක්කො ඇක්ෂන් ෆිල්ම්ස්. නැත්තං වැඩිහිටියන්ට වඩාත් සුදුසු ෆිල්ම්ස්. දෙවෙනියට කියපු එකටනං මගෙ විරුද්ධත්වයක් නෑ! එකම අවුල ඒ වගේ එකකට කෙල්ලෙක් එක්ක යාමේ බැරිකමයි. විශේෂයෙන්ම 'හොඳට හැදිච්ච', 'පෙනුමෙනුත් නියම ඉන්දියන් සංස්කෘතිය පිළිබිඹු කරන' නේහා වගේ කෙල්ලෙක්ව! ඒ නිසා අපි වගේ අයට තියෙන්නෙ තෝරා ගැනීම් දෙකයි. එකක් විද්‍යා ප්‍රබන්ධ වගේ ගොන් ෆිල්ම්ස් බලන එක. නැත්තං හින්දි ෆිල්ම් එකක් බැලීම. කොල්ලෙක් එක්ක යන කෙල්ලෙක් හින්දි ෆිල්ම්ස් බලන්න යන්නෙ නෑ. ඒ හින්ද මට සිද්ධ වුණේ ආනල්ඩ් එයාගෙ මස්පිඬු පුම්බන හැටියි, මිනිහ ග්‍රහලෝකයක් සුනු විසුනු කරන හැටියි බලන් ඉන්නයි.

"ඔයා ආසද මේ වගේ සයන්ස් ෆික්ෂන්වලට?" නේහා ඇහුව.

"ඔව්... නැතුව...?" නැතුව වෙන මොකක් කියන්නද ඉතින්?

"අපෝ... අයි.අයි.ටී. ඉංජිනියර්ස්ලටම හොඳයි මේව..."

හහ්... කොහොමද ඒක! එතකොට එයා එයාගෙ ඩිසයිනින් ක්ලාස් කට් කරල ෆිල්ම්ස් බලන්න එන එක!

නේහායි මමයි බැල්කනි සීට් ගත්තෙ. ඉස්සරහට එන ෆිල්ම්ස්වල ට්‍රේලර්ස් එනකල් අපි බලාගෙන හිටිය. ඒත් ආණ්ඩුවෙන් අලුත අාපු නීතියක් හැටියට ඒවටත් කලින් 'පවුල් සංවිධාන සැලසුම් වාර්තා චිත්‍රපටියක්' පෙන්නන්න නියම කරල තිබ්බ.





ඉන්දියාව පිපිරෙන තරමට ජනගහනයක් ඉන්න රටක්. ඒක පාලනේ කරන්න මිනිස්සු ඉතින් මොනව හරි කරන්න ඕනෙනං තමා. එතකොට ඉන්දියාවට අලුත් එවුන් බිහිවෙන එක නවතිනව. හරි සරලයි... නේ? එහෙම තමයි කවුරුත් හිතන්නෙ. ඒත් කාටවත් ඕනෙ නෑ උපත් පාලනේ කරන්න. ඒකයි ඇත්ත. ඒ නිසා තමයි ආණ්ඩුවට සිද්ධ වෙලා තියෙන්නෙ කෙල්ලෙකුයි, කොල්ලෙකුයි චිත්‍රපටියක් බලන්න ආවම, ඒකට කලින් මෙහෙම දේවල් පෙන්නන්න.

වාර්තා චිත්‍රපටිය පටන් ගත්ත. ආණ්ඩුවෙ ඉස්පිරිතාලෙක ඩොකෙක් බොහොම ප්‍රසන්න හිනාවකින් කට පුරෝගෙන, තමන්වම අඳුන්වල දුන්න. මං හිතුව මිනිහ තමයි 'මරණයේ දූතයා' කියල, එයා 'ඔබේ පවුල් සංවිධාන මිතුරා' හැටියටයි ඒකෙ නම් කරල තිබ්බෙ. මට මිනිහව 'මරණයේ දූතයා' හැටියට හඳුන්වන්න හේතුවක් තිබ්බ. මොකද, මිනිහ විසඳුම හැටියට ඉදිරිපත් කළේ වාසෙක්තමියක් කරගන්න කියන එකයි.

වාර්තා චිත්‍රපටිය ඊළඟට පෙන්නුවෙ මෝලක කම්කරුවෙක්. මිනිහට තිබ්බ බොහොම සාන්තදාන්ත, රමණීය ගෙදරක්. බොහොම සරල බිරිඳකුත් හිටිය (හැම තිස්සෙම උයන). ළමයි දෙන්නෙකුත් හිටිය. ප්‍රීතිමත් පවුලක්. එක දවසක් මිනිහ නිදාගෙන ඉඳිද්දි දකිනව හීනයක්. මිනිහට ළමයි හයදෙනෙක් වෙලා. (හරිනං ඒකට එයා සෑහෙන වාර ගාණක් එයාගෙ බිරිඳ එක්ක ලිංගිකව හැසිරෙන්න එපායැ. හැබැයි ඒව ඔක්කොම පෙන්නන්න චිත්‍රපටිය හදපු අය පියවර අරගෙන තිබ්බෙ නෑ...!) ඉතින් ඒ ළමයින්ට කෑම වැඩියෙන් ඕන වෙනව. ඇඳුම් වැඩියෙන් ඕන වෙනව... ඒ හැම එකම එයාල ඉල්ලන්නෙ තාත්තගෙන්...! ඒත් තාත්ත ඉන්නෙ මෝලෙ වැඩ කරල මහන්සියෙන් (ලිංගික එකතුවීම නිසා නෙවෙයි). කලකිරිල. ඕං ඔය වෙලාවෙදි තමයි, චිත්‍රපටිය හදපු අයගෙ 'පවුල් සංවිධාන මිත්‍රය' මගෙ... 'මරණයේ දූතයා' ප්‍රාදූර්භූත වෙන්නෙ.

මිනිහගෙ අතේ තියෙනව, පිරිමියෙකුගෙ ඇඟේ රූපසටහන. මිනිහ ඒක දිග අරිනව. ඔන්න... හෝල් එක දෙදරන්න හූ කියන සද්දෙ... ඉස්සරහම පේළිවල ඉන්න එවුන් තමයි ඒකෙ පුරෝගාමියො. (කැම්පස් එකේ ක්ලාස් එකක ඉස්සරහම පේළි වගේ නෙවෙයි මේක... මේකෙ ඉස්සරහට පේළිවලින් තමා ඇක්ෂන් එක පටන් ගන්නෙ!)

අනේද කියන්නෙ? මේ හැම දේම වෙන්නෙ තමන්ගෙ කෙල්ලත් එක්ක පැයක් දෙකක් අඳුරෙ තනිවෙලා ඉන්න පෙරුම් පුරන කොල්ලෙකුට! මං කාවදාවත් නේහා එක්ක 'සෙක්ස්' කියන මාතෘකාව කතා කරල නෑ. ඒත් දැන් මේ තිරේ ඉන්න ඩොකා පිරිමියෙකුගෙ කපන්න ඕනෙ තැන අමු අමුවෙ පෙන්නනව. බැල්කනියෙ හිටිය අනෙක් හැම පිරිමියටම වගේ මටත් දැනුණ මහ අසරණ බවක්.

නේහා මා දිහා බැලුවෙ, මං පුටුවෙන් ඉඳන් ඇඹරෙන හැටි දැකලද කොහෙද?

"මොකෝ ඔයාට?"

"ඔයා හිතන්නෙ නැද්ද මේක ඕනවට වැඩි කියල...? මොනාද මේ පෙන්නන ලැජ්ජ නැති දේවල්..."

"මොනව...? අනේ ඇත්තට... එහෙමද හිතන්නෙ...? මේක අධ්‍යාපනික එකක්නෙ..."

"හරි... හරි... ඒක ඉතින් මේ වගේ ෆිල්ම් එකක් බලන්න ආවම පෙන්නන එක හරිද?"

"ඔයාට පිස්සු... මටනං දැනෙන්නෙ ඒක විහිළුවක් වගේ..."

වාර්තා චිත්‍රපටියෙ බිරිඳ, මරණයේ දූතයා කියන දේ අහගෙන හිටියෙ බණ අහන උපාසිකාවක් වගේ. හිනා වෙවී. සාවධානව. කියන දේවල් හොඳට හිතට අරන්. ඔළුව වන වනා. මං හිතන්නෙ ඒ ඩොකයි, ඒ වයිෆුයි අතරෙ මොකක් හරි තියෙනව!

පැය භාගයක් විතර ගියාට පස්සෙ ඒ මඟුල ඉවර වුණා. මෝලෙ වැඩ කරන එකා, මිනිහගෙ භයානක හීනෙන් නැඟිටල,





ඩොකෙක්ව හම්බ වෙලා මිනිහගෙ පිරිමිකම අවසාන කරන ලියවිල්ලට අස්සන් කරල, මූණෙ හිනාවක් පුරෝගෙන අපි දිහාට හැරුණ. ඊට පස්සෙ මිනිහයි, එයාගෙ බිරිඳයි, ළමයි දෙන්නයි ඔක්කොම හිනාවීගෙන අපි දිහා බැලුව. බලල එයාල කාටූන් බවට පත්වුණා. පත්වෙලා පවුල් සංවිධාන ලාංඡනේ වුණා. 'පුංචි පවුල රත්තරන්' කියල උඩින වාක්‍යයකුත් තිරයේ මතු වුණා. ආර්නෝල්ඩ් ස්වේසගනර් කොලුව ආවෙ ඊට පස්සෙ.

ෆිල්ම් එක පටන් ගත්ත ගමන් නේහා මගෙ අතින් අල්ල ගත්ත. එයා ඒක කළේ බොහොම කැමැත්තෙන්. මට එයාගෙන් ඊට වඩා වැඩි දෙයක් බලාපොරොත්තු වෙන්න බැරි තත්ත්වයක් තිබුණෙ. මට මතක් වුණා රයන් කියපු දේවල්. ඇත්තටම ඌ කිව්ව වගේ, නේහා මගෙන් අත් අල්ල ගන්නවට වඩා වැඩි දෙයක් බලාපොරොත්තු වෙනවද දන්නෙ නෑ! මං එයාගෙන් ඒ ගැන අහන්නද? එහෙමත් නැත්තං ඕන මඟුලක් කියල මට හිතෙන දෙයක් කරන්නද?

ෆිල්ම් එක ඉවර වෙලා අපි කන්න ගියා 'තිරූලා' එකට.

"හරි... ඉතින් මට කියන්නකො ප්‍රොෆෙසර් වීරා කොයි වගේද කියල...?" නේහා කිව්වෙ අපි ඕඩර් කරපු පීසා එක කෑලිවලට කපන ගමං. කොහොමටත් පීසා එක සමාන කෑලිවලට කපලමයි ගෙනාවෙ. ඒත් කෙල්ලන්ගෙ හැටි එහෙම තමා. එයාලට ඕනෙ ඒ ගේන එකට තව මොකක් හරි සුකුරුත්තමක් කරන්න. එයාල හරි කැමති මේසෙ උඩ කෑම ජාති පිළිවෙළකට තියන්න.

"එයා හරි වෙනස්..." මං කිව්ව. "එයා නවයයි පොයින්ට් ගාණ ගත්ත අයගෙයි, පහයි පොයින්ට් ගණන් ගත්ත අයගෙයි වෙනසක් දකින්නෙ නෑ. එහෙම බෙදන්නෙත් නෑ... අනික එයා මුල් තැන දෙන්නෙ අදහස්වලට. එයාගෙ එසයින්මන්ට් වුණත් අපිව හිතන්න පොලඹවන විදිහෙ ඒව..."

"ඒ කිව්වෙ...?"

"උදාහරණෙකට කිව්වොත්, එයා අහන්නෙ මෙහෙම... ද්‍රව තාක්ෂණයට සම්බන්ධ වන ඉංජිනේරු ගැටලුවක් හඳුන්වා දෙන්න... වෙනින් ප්‍රොෆෙසර්ස්ලනං කියන්නෙ පරිච්ඡේද 10හි සඳහන් වන සංඛ්‍යාත්මක ගැටලු විසඳන්න... ඔය වගේ දේවල්නෙ... ඒත් ප්‍රොෆෙසර් වීරා අපෙන් එළියට ගන්න හදන්නෙ අදහස්..."

"හ්ම්... කූල්... එයා හැන්ඩ්සම්ද...?"

"ඔව් මං හිතන්නෙ..."

"එහෙනං මං එයාව බලා ගන්න ඕනෙ. තාත්තට කියන්න ඕනෙ කෑමකට එයාට අපේ ගෙදරට එන්නයි කියල ඉන්වයිට් කරන්න..." නේහා එහෙම කියල හිනා වෙන්න ගත්ත.

ඉරිසියාවෙ, පැහැදිලි ඉරිසියාවෙ පැළයක් මගේ හිතේ දලු දාන්න ගත්ත. එක පාරටම ප්‍රොෆෙසර් වීරා ගැන තිබ්බ ආදරේ. පැහැදීම දිය වෙලා යන්න ගත්ත.

"ඉතින් කර ගන්නකො... මට මොකෝ..." මං කිව්ව.

"ඇයි... මොකෝ ජෙලද...?"

"නැහ්... මං මොකටද ජෙලස් වෙන්නෙ...? මං ඔයාගෙ බෝයිෆ්‍රෙන්ඩ්යෑ...?"

ඉඩක් ලැබුණු වෙලාවෙ මං තුරුම්පු ආසිය ගහල දැම්ම.

ඒ පාර නේහා තවත් බක බක ගාලා හිනාවෙන්න ගත්ත. ඒවට හිනා යන්නෙ එයාට විතරමයි. මෝඩ ගෑනු... මට හිතුණ එයාගෙ නළලට වැටෙන, මං ආස කරන කෙහෙ රැල්ල කපල දාන්න.

"මං විහිළු කළේ ළමයො... මෝඩය..." නේහා කිව්ව. "මං එහෙම කිව්වොත් තාත්ත මාව මරයි... එයාට ප්‍රොෆෙසර් වීරව පේන්න බෑ... ඔයාට කේන්ති ගියාම හරි ෂෝක්..."

"මට ගිය කේන්තියක් නෑ..."

නේහා හිනාව නැවැත්තුවෙ නෑ. හිනා වෙවීම එයා මගෙ අත අල්ල ගත්තා. මොනවටද ඇත්තට කෙල්ලො මෙච්චර





හිනා වෙන්නෙ? උන්ට පොඩි දෙයක් ඇති හිනා වෙන්න! මට නේහා එක්ක ටිකක් තදවෙලා තිබ්බත් ඇයි එයාව මට ලස්සනට පේන්නෙ? ඇයි මට එයාව කිස් කරන්න බැරි?

ඔන්න ඒ පාර ස්විච් එකකින් ඕෆ් කළා වගේ හිනාව නවත්තපු නේහා ටිකක් සාමාන්‍ය ස්වරූපයට ආව.

"සොරි මිස්ට හරිකුමාරයො... තරහද නැනෙ... ඔයා ඉතින් මගේ ස්වීටස්ට් ලිට්ල් ස්පෙෂල් ෆ්‍රෙන්ඩ්නෙ?"

ආන්න අලුත්ම එක... මේ පාර මට එයා "ස්වීටස්ට්... ලිට්ල්..." කියන විශේෂණ දෙකක් එකතු කරල තිබ්බ!

එයා මගෙ පැත්තට නැඹුරු වුණේ මගෙ කම්මුලට කිස් එකක් දෙන්න බව මං දැනගෙන හිටිය. ඔන්න පුතෝ වෙලාව! රයන් කියපු දෙයක් මතක් වුණා. කෙල්ල කම්මුලට කිස් එකක් දෙන්න පාත් වෙද්දි, හරියට එයාගෙ තොල් කම්මුලට ළං වෙද්දි, ටක් ගාලා කම්මුල තිබ්බ තැනට කට එන විදිහට ඔළුව හරවන්න ඕනෙ. එතකොට එයාගෙ කිස් එක පතිත වෙන්නෙ තොල් උඩ! හොඳට හැදිච්ච ඉන්දියන් කෙල්ලෙක්ව නියම විදිහට සිප ගන්න මුල පුරන්න පුළුවන් එකම විදිහ එච්චරයි... රයන්... උඹනං දෙයියෙක්!

"මොනාද ඔයා කරන්නෙ?" නේහා ඇහුවෙ ඔළුව පිටිපස්සට ගස්සන ගමන්. මං අහිංසක පෙනුමක් ආරූඪ කර ගත්ත.

"ඔයා මගෙ ලිප්ස් කිස් කරන්න නේද හැදුවෙ?" එයා තදින් ඇහුව.

"පිස්සුද...? නෑ..." මං පුදුම වෙලා වගේ ඇහැව්ව.

"හරි... ඔයා දන්නවනෙ මං ඒවට නෑ කියල..." නේහා දේශනාව ආරම්භ කළා. එහෙනං මොනවටද ඔයා ඉන්නෙ? මං හිත ඇතුළෙන් අහන්න ගත්ත. හැම කෙහෙල්මලටම හිනා වෙන්නද? ඒත් නැත්තං ඔයාගෙ අහංකාර තාත්තව මතක් කරවන්නද?"

එහෙනං මොනවද අපි කරන්නෙ? ගෙනාපු පීසා එක කාලා ගෙදර යනව... එහෙමද? මං මුකුත් කිව්වෙ නෑ. මට ඒ අවස්ථාව නැති වුණා. මගෙ හිතේ ඇති වෙච්ච ආසාවලුත් ඒ එක්කම නැති වුණා. අනික එයාගෙ මූණත් වෙනස් වුණා. ඒකෙන් මතු වුණේ දුක්බර පෙනුමක්. මට ඕන වුණේ නෑ එයාව අප්සෙට් කරවන්න. ඒ මොකටද, සාමාන්‍යයෙක් අපි ඊළඟට හම්බ වෙන්නෙ කවදද කියන එක තීරණේ කරන්නෙ කෑමෙන් පස්සෙ හින්ද. ආයෙ හම්බ වෙන දවසක් තීරණය කර නොගෙන වෙන් වෙන්න මට ඕන වුණේ නෑ. මං තත්ත්වෙ සාමාන්‍ය කරන්න හැදුව.

"ම්... මේ පීසනං නියමයි..."

වැඩේ සාර්ථකයි එයා කතා කළා.

"ඔයාට ඊළඟ සුමානෙ බ්‍රහස්පතින්ද මාව හම්බ වෙන්න ඕනෙද?"

"ඔව්... නැත්තං...?"

"මට තියෙනව යාළුවෙකුගෙ බර්ත් ඩේ එකට තෑග්ගක් ගන්න. ඒකට ඔයා එනවද මා එක්ක කෝනාට් ප්ලේස් එකට...?"

මං කැමති වුණා. ප්‍රියා එක පැත්තෙ රවුම් ගහන එක මට ඇති වෙලයි තිබ්බෙ.

"කූල්... මං කාර් එක අරන් එන්නම්... ඔයා අයිස්ක්‍රීම් ෂොප් එක ළඟ ඉන්න."

මං එයා දිහා නොබලම ඇගේ වැටිල තිබ්බ පීසා කුඩු පිහ දැම්ම.

★

"වෙන්කට්... මට තියෙනව මටම වෙන්වෙච්ච වගකීම් වගයක්." ආලෝක් කිව්ව.





"ඒව ඉතින් මගෙ ප්‍රශ්න නෙවෙයිනෙ... මේ මාසෙට මේ තුන්වෙනි වතාව... ඔයාගෙ ඔය වගේ පල්හෑලිවලට ඇහුම්කන් දෙන එක නවත්තන්න මට කාලෙ ඇවිත් වගේ..."

වෙන්කට්, ආලෝක කියන දේට බාධා කළා.

ඒක පෙබරවාරියෙ ශීතල රාත්‍රියක්. ඒ කතාබහ ඇහුණෙ වෙන්කට්ගෙ කාමරේ ඇතුළෙන්. අපි, ඒ කිව්වෙ මායි, රයනුයි ඒ වෙලාවෙ හිටියෙ කොරිඩෝවෙ. අපි කැන්ටිමට ගිහින් එන ගමන්.

"මොකෝ උන් එච්චර හයියෙන් කතා කරගන්නෙ?" රයන් ඇහුව.

"අනේ මන්ද... සාමාන්‍යයෙන් ඕකගෙ කාමරෙන් මීක් කියල සද්දයක්වත් එන්නෙ නැනෙ... හැම තිස්සෙම පොත් ගුල්ලො වෙලා ඉන්න හින්ද..."

රයන්, වෙන්කට්ගෙ කාමරේ දොරට කන තියා ගත්ත.

"ෂ්... මොනවද ඔය කරන්නෙ?", මං ඇහුව.

"කට... කට... මං හිතන්නෙ උන් දෙන්න මොකකට හරි වාද කරගන්නව..."

"ඉතින් අපිට මොකෝ...? යං යන්න..." මං කිව්ව.

"ෂ්... ෂ්... මෙහෙ එන්න..." රයන් මට අඬ ගැහුව.

හැබැයි ඒ වෙද්දි මටත් පොඩියට කුතුහලයක් ඇවිල්ලයි තිබ්බෙ, මොකක්ද උන්ගෙ වාදෙ කියල දැන ගන්න. ඒක ලොකු වලියක්ද? මොනව ගැනද? මාත් දොරට කන තියා ගත්ත. ඇතුළෙ තියෙන හැම දෙයක්ම කනේ තිබ්බ වගේ හොඳට ඇහෙන්න පටන් ගත්ත.

"ආලෝක්... ඔයා ඕනවට වැඩියි... මගෙ ග්‍රේඩ් ලෙවල් එක තියා ගන්නනං මං දවසකට පැය දහයක් පාඩම් කරන්න ඕනෙ. මගෙ ග්‍රෑප් එකේ ඉන්න එවුන්ගෙන් මට ඒ වගේ දෙයක්

නිකමටවත් බලාපොරොත්තු වෙන්න බෑ..." වෙන්කට් කියවන්න ගත්ත.

"තාත්තට සිහිය නැති වෙලා... හාට් ඇටැක් එකක්ද දන්නෑ... ගෙදරින් කෝල්ස් දෙකක්ම ආව..." ආලෝකය බෑඟිරි ගානව.

"මේක අහන්න... ඔයාගෙ අම්ම ඕන එකටයි, එපා එකටයි හැම එකටම නිකාං කලබල වෙනව. එයාට සනීප වෙයි. අනික ඔයා ගියා කියල මොනව කරන්නද... ඔයා දොස්තරයැ...?"

"පිරිමියෙකුට කියල ඒ ගෙදරට ඉන්නෙ මං විතරයි වෙන්කට්... මට යන්න ඕනෙ... ඔයාට බැරිද මේ පාරට විතරක් තනියෙන් ඕක කර ගන්න...?" ආලෝකය බැගෑසේන වුණා.

"පිස්සුද...? බෑ... බෑ... මං අනික් සබ්ජෙක්ට්ස් පාඩම් කරන්නත් ඕනෙ. කොච්චර කිව්වත් ඔයාට මේක නොතේරෙන හැටි! ඔයාට ඕනෙ දිගටම පහයි පොයින්ට් ගණන් අරගන්නද?"

"මොකක්ද මට තේරෙන්නෙ නැත්තෙ?"

"තේරෙන්නෙ නැත්තෙ මං මගෙ රෑන්ක් එක මේන්ටේන් කර ගන්න ඕනැයි කියන එක...! මගෙ ළඟට ඉන්න එකා මට වඩා පොයින්ට් දශම බිංදුවයි තුනයි අඩු! හරි... ඔය කතාව නවත්තල අපි වැඩ පටන් ගමුද? මොකක්ද ඉස්සෙල්ල කරන්නෙ? ගෲප් එසයින්මන්ට් එකද? නෝට්ස් බලා ගන්න එකද?" වෙන්කට් කිව්ව. කිව්වට වඩා බෙරිහන් දුන්න කිව්වොත් වැඩිය හරි.

"කාලකණ්ණි බල්ලා..." රයන් කියන්න ගත්ත. මං රයන්ට ඉඟියෙන් කිව්වෙ සද්ද කරන්න එපයි කියලයි.

"වෙන්කට්... ඔයා හැම තිස්සෙම පාඩම් කරනවනෙ... බැරිද ඔයාට මේ..." ආලෝක්ට කියන්න හම්බවුණේ එච්චරයි.

"කියන මගුල තේරෙන්නෙ නැද්ද? මං නයින් පොයින්ටර් කෙනෙක්. තේරුණාද... මං ඒ තත්ත්වෙ රැක ගන්න ඕනෙ. මට බෑ සෙකන්ඩ් වෙන්න..." වෙන්කට් කෑ ගැහුව.





"ඒත් ඔයා මගෙ යාළුවෙක් විදිහට පොඩ්ඩක් හිතන්නකො. මං මගෙ තාත්ත ගැන බලන්න ඕනෙ නේද?" මේ පාර ආලෝක්ගෙ හඬේ තිබ්බෙ නියමම හිඟන ස්වරූපයක්.

"මට මේක කියල ඇති වෙලා..." වෙන්කට් බෙරිහන් දුන්න. "මේ එසයින්මන්ට් එක අල්ලල දාන්න බෑ කියටවත්... බෑ... ඔයාට යන්න බෑ... එච්චරයි කතාව...!"

"වෙන්කට් ප්ලීස්..." එන්න එන්නම ආලෝකයගෙ කටහඬ ඇඬුම්බර වෙනව අපි අහගෙන. උන්ගෙ පවුලටම තියෙන අර 'හැඬීමේ ජානය' මතු වෙන්නයි යන්නෙ. අපිට ආලෝක්ගෙ කටහඬ අස්සෙන් මැවිල පෙනුණෙ, හැම තිස්සෙම අඬන්න සැදී පැහැදී ඉන්න ආලෝක්ගෙ අම්මගෙ බෙරිවොරොප්ප මූණ!

"මූ ඕනවට වැඩි... මං යනව ඇතුළට!" රයන් කිව්ව. මං රයන්ව නවත්තන්න හිතන්නත් කලින් රයන් වෙන්කට්ගෙ දොරට පයින් ගහලත් ඉවරයි! ඒක සිද්ධ වෙන්න තත්පරයක්වත් ගියෙ නෑ.

වෙන්කට් මිනිහගෙ පාඩම් මේසෙ වාඩිවෙලා හිටිය. ආලෝක් ඒ ළඟ හිටගෙන හිඟන්නෙක් වගේ හිටිය. දෙන්නම දොර ඇරිල බිත්තියෙ වදින සද්දෙට ඒ පැත්ත බැලුවෙ පුදුම වෙලා. දොරෙන් ආවෙ අපි දෙන්න කියල දැක්කම උන්ගෙ පුදුමෙ ඩබල් වෙච්ච බව අපිට තේරුණා.

"මොන මගු..." වෙන්කට්ට කියවුණා. "රයන් ඔයා මොනවද මගෙ කාමරේ කරන්නෙ?" ඒක බොහොම සාධාරණ ප්‍රශ්නයක්. පහයි පොයින්ට් ගාණෙ එකෙක්, නවයයි පොයින්ට් ගාණෙ එකෙක්ගෙ කාමරේ මොකද කරන්නෙ? දීපල්ලකො පුළුවන්නං උත්තර... හහ්! වෙන්කට් රයන් දිහා බැලුවෙ, බාර් එකක් පන්සලකට ආවනං පන්සල බාර් එක දිහා බලන විදිහට!

"මොකක්ද ප්‍රශ්නෙ?" රයන් ඇහුවෙ, වෙන්කට්ව ගත පහකට ගණන් නොගෙන. මං සද්ද නැතුව හිටගෙන වෙන්කට්ගෙ කාමරේ ස්කෑන් කරන්න ගත්ත. ඇඳයි, රෙදි ටිකකුයි ඇරෙන්න මුළු කාමරේම තිබ්බෙ පොත්! පොත්!! පොත්!!!

"රයන්... මේක ඔයාගෙ වැඩක් නෙවෙයි..." ඒ පාර ආලෝක්ය කතා කළා. මිනිහත් රයන්ව දැකල තක්බීර් වෙච්ච බව රහසක් නෙවෙයි. ආලෝක්ගෙ ඉතාම ඇතුළාන්තයෙන් පොඩියට මෝදු වෙච්ච බලාපොරොත්තු සහගත හැඟීමක් මිනිහගෙ මූණෙන් පිළිබිඹු වුණා. මිනිහ කටින් අර වගේ ප්‍රශ්නයක් රයන්ගෙන් ඇහුවත් හිත ඇතුළෙන්, "ඇති යන්තං... මෙන්න මගේ ගැලවුම්කාරයා ඇවිත්" කියන්නා වගේ දෙයක් මතු වෙච්ච බව මට තේරුණා. මිනිහගෙ මූණෙ තිබ්බ 'ඕනෙම තත්පරේකදි අඬන්න බලාගෙන ඉන්න පෙනුම' මිනිහගෙ මූණෙන් අතුරුදහන් වුණා.

"මං ඇහුවෙ මොකක්ද ප්‍රශ්නෙ කියල...?" රයන් ආයෙ ඇහුව.

"මං කියන්නං ප්‍රශ්නෙ මොකක්ද කියල..." වෙන්කට් ඉදිරිපත් වුණා. "අපි අපට දීල තියෙන තර්මෝ එසයින්මන්ට් එක හෙට වෙද්දි බාර දෙන්න ඕනෙ... ආලෝකයි මායි එක ග්‍රෑප් එකේ... එහෙම තියෙද්දිත් මෙයාට ගෙදර යන්න ඕනෙලු..."

"මං රස්තියාදුවක යන්න හැදුවෙ නෑ. මං යන්න හැදුවෙ ගෙදර... තාත්තට හොඳටම අසනීප හින්ද..." ආලෝක් කිව්ව.

"මොකද ඔයා කියන්නෙ. මං යන්නද එයාව බලන්න...?" රයන් ආලෝක්ගෙන් ඇහුව.

මට මතු වුණේ ප්‍රශ්නයක්. අවුරුද්දක් තිස්සෙ කතා නොකර ඉඳල, එක පාරටම මෙන්න ඉතාම සමීප යාළුවෙක්ගෙ භූමිකාව රඟ දක්වන්න යනව රයන්...!

රයන්ට ඇත්තටම ආලෝක්ට උදව් කරන්න ඕනෙ වෙලාද? එහෙමත් නැත්තං වෙන්කට් කියන්නෙ කොයි වගේ එකෙක්ද කියල ඔප්පු කරන්න ඕනෙ වෙලාද?

"අහ් ඔයා...? කොහෙද... අපේ ගෙදරට?" ආලෝක් ඇහුව.

"ඔව්... මං දන්නව ඔයාලගෙ ගෙදර. අනික මං එක පාරක් ඔයාලගෙ තාත්තව ඉස්පිරිතාලෙට ගෙනිහිල්ලත් තියෙනව... මගෙ ස්කූටර් එකෙන් එයාව ඉක්මනට අරගෙන යන්නත් පුළුවන්.





එහෙමත් නැත්තං ඔයාටම යන්න ඕනෙනං ඔයාගෙ එසයින්මන්ට් එක ඉවර කරගන්න මං උදව් කරන්නං... හැබැයි මේ පොත්ගුල්ල එක්කනං නෙවෙයි..." රයන් කිව්ව.

හහ්... රයන් එක පාරටම මදර් තෙරේසා වෙලා! ආලෝකය, රයන්ට බලු බැණුම් බැණල ගියේ. ඒත් රයන් දැන් මිනිහගෙ ගැලවීමේ දේව දූතයා වෙලා! මං වෙන්කට් දිහා බැලුව. මිනිහගෙන් මතු වුණේ, දැන් අපිට දැහට පේන්න බැරුව ඉන්න, වාත වෙලා ඉන්න ප්‍රොෆෙසර්ලගෙ තරුණ කාලෙ ආකෘතියක්! මිනිහ ඔළුවට දාල තියෙන තෙල් කන්දරාව කොච්චරද කිව්වොත්, ඒ ප්‍රමාණෙන් මුළු හොස්ටල් එකටම ඇති වෙන්න පපඩම් බැද ගන්න තිබ්බ. මිනිහගෙ නළල තිස්තුන් කෝටියක් දෙවි දේවතාවුන් වෙනුවෙන් ගාපු තුන්නූරුවලින් අළු පාට වෙලා තිබ්බ. ඇත්තටම ඒ වෙලාවෙ එතන දේවතාවුන්වහන්සෙගෙ පාට් එක කළේ රයන්!

"ඇත්තටම?" ආලෝක් ඇහුව.

"එහෙනං මං ගියා..." රයන් එහෙම කියාගෙන නැඟිට්ට. ආලෝක් ඔළුව වනල ඒකට අනුමැතිය දුන්න. රයන් පිටවුණා.

අපි මිනිත්තුවක් විතර නිශ්ශබ්දව හිටිය. රයන් මිනිත්තු ගාණෙන් අසාධ්‍ය වෙච්ච ලෙඩෙකුගෙ ප්‍රශ්නෙත්, පොයින්ට් නවයක් අරන් ඉන්න එකෙකුගෙ අනාගතේ පිළිබඳ ප්‍රශ්නෙත් විසඳුව. සිම්පල් විසඳුමක්. ස්කූටර් එකෙන් ආලෝක්ගෙ ගෙදරට යෑම! ගිහින් තාත්තව ඉස්පිරිතාලෙට ගෙනියෑම... එච්චරයි!

"හරි... ඒ ප්‍රශ්නෙ ඉවරනෙ... ඔයා ඔයාගෙ එසයින්මන්ට් එක කරගන්න..." මාත් කාමරෙන් පිටවෙලා යන්න නැඟිට්ට.

"ටිකක් ඉන්න..." ඒ ආලෝක්ගෙ කටහඬ.

"මොකටද?"

ආලෝක්, මාත් එක්ක කාමරෙන් එළියට ඇවිදගෙන ආව. තත්පරයක්වත් අපතේ නොයැව්ව වෙන්කටා ඒ ඇහිල්ලෙම පොතක් පෙරළ ගන්නව මං බලාගෙන! ඒ මදිවට ඒකා ආලෝක් දිහා බැලුවෙ, "ඉක්මනට ආපහු එන්න ඕනෙ ඕං..." කියන්න වගේ බැල්මක්.

"තැන්ක්ස්..." ආලෝක් මිමිනුව.

"මට නෙවෙයි... රයන්ට තැන්ක් කරන්න."

"අනිවා... මිනිහ තාම මා එක්ක යකා නැඟලද ඉන්නෙ?"

"පිස්සුද...? එහෙනං මිනිහ ඔයාලගෙ ගෙදර යාවිද ඔහොම උදව් කරන්න?"

"ඒත් ඔයා දන්නවනෙ මිනිහගෙ හැටි. එයාට පුළුවන් එහෙම යකා නැඟල ඉඳිද්දිත් ඒ මිනිහට උදව් කරන්න."

"එහෙම පුළුවන් ඇති... හොඳයි එහෙමමයි කියමුකො. මොකක්ද වෙනස? එයාව හම්බවෙලා තැන්ක් කරන්න..." මට ආලෝක්ව නුරුස්සගෙන ආව. මිනිහට කිසිම අයිතියක් නෑ රයන් අරහෙමය, රයන් මෙහෙමය කියල රයන්ගෙ ගතිගුණ ගැන කියවන්න. කොහොමටවත් මං තරම් එයාට ඒකට අයිතියක් නෑ.

"හරී..." ආලෝක් කිව්ව. "ඔයා හිතනවද මට ආපහු එන්න පුළුවන් කියල?"

"ආපහු එන්න? කොහේටද?" මං හොල්මං වෙලා ඇහුව.

"ඔයා දන්නවනෙ අපි තුන්දෙනා එකටම හිටියෙ..." ආලෝක් තැටමුව.

"ඕ...හ්... ඇයි අර වෙන්කටා ඔයාට සෙට් වෙන්නෙ නැද්ද?"

"මං දන්නෑ මං මොනව කළාද කියල... මට ආපහු එන්න ඕනෙ..."

මට මගේ කන් අදහන්න බැරි වුණා. අඩේ... අවුරුද්දක් නවයයි පොයින්ට් ගණන් එකෙක් එක්ක ඉඳල ඇතිවෙලා තියෙන වෙනස!!

"ඔයාට ෂුවර්ද ඔයාට එහෙම ඕනෙ කියල?"

"ඔව්... මට ෂුවර්..." ආලෝක් පැනල කිව්ව. හැබැයි බොහොම පහත් හඬින්. ඊට පස්සෙ මොකද වුණේ? අපි දෙන්න බොහොම හැඟුම්බර මෝල්ලු දෙන්නෙක් වගේ බදා ගත්ත.





මං හිතන්නෙ ආලෝකය අඬන්න ඉතුරු කරගෙනම හිටපු කඳුළු වක්කරන්න ගත්ත. මාත් ටිකක් උණු වේගෙන නාවම නෙවෙයි. මං කවදාවත් හිතුවෙ නෑ ආයෙ අපි තුන්දෙනා එකතු වෙයි කියල. රයන් මේකට පොඩි රඟපෑමක් දායි... ඒත් පස්සෙ කැමති වෙයි. මිනිහට පුළුවන්නං ආලෝක්ගෙ තාත්තගෙ බාගෙකට ඔච්චර කැපවීමක් කරන්න, ඒ තාත්තගෙ සම්පූර්ණ පුතාට ඊට වඩා කැප කිරීමක් කරන්න බැරිද!

"එළ... එහෙනං එන්න ආපහු..." මං කිව්ව.

"අනිවා... මේ මළඉලව් එසයින්මන්ට් එක කරලම එන්නං..." ආලෝක් කිව්ව. අවුරුද්දකට පස්සෙ අපි එකට හිනා වුණා!

# 9

## මී තියරිය!

හිතුව වගේම ආලෝක් ආපහු ආව එකට රයන් දවසක් දෙකක් හොස්ස උල් කරගෙන හිටිය. ඒත් වැඩි දවසක් යන්න කලින් ඒක හරි ගියා. මොකද එහෙම ඉන්න එක කිසිම තේරුමක් නැති වැඩක් බව මිනිහටම තේරුණ හින්ද. ආලෝක් තවත් ටිකක් කඳුළු වැගිරුවට පස්සෙ අපි ඔක්කොම බදාගෙන අවුරුද්දකට පස්සෙ එකතු වීම සැමරුව. වෙන්කටා අපිට එක එක ඒව කියල ශාප කළා. ඉතින් අපිට මොකෝ? ඌට උගෙ පොත් තියෙන්නෙ. අපිට අපි වෙනුවෙන් අපි ඉන්නව! ඒ මදැ!!

මේ ඓතිහාසික දිනය සමරන්න පොඩි පහේ පාටියක් දාන්න ඕනෙ බව යෝජනා කළේ රයන් බව ආයෙ අමුතුවෙන් කියන්න ඕනෙ නැනෙ. මිනිහ ඒක ඔක්කොම සංවිධානය කළා. කාමරේ අස්පස් කිරීම් කළෙත් මිනිහමයි. ඒ කිව්වෙ මිනිහගෙ කාමරේ. ඒකෙ දූවිලි තට්ටු ගණන් තිබ්බ. කොච්චර දූවිලි තිබ්බද කිව්වොත් මාස ගාණක් තිස්සෙ කිඹුහුම් යවන්න ඒ ටික ඇති!

"මොකද මිනිහ මේකට මී පාටිය කියන්නෙ?" ආලෝක් ප්‍රශ්නාර්ථෙන් ඇහුව.

"අනේ මන්ද... මිනිහ මොකක්ද අලුත් න්‍යායක් අඳුන්වල දෙන්න යනව කියන්නෙ. ඒකට හරියන්නලු ඒ නම දැම්මෙ..." මම උරහිස් අකුළන ගමන් කිව්ව.





පාටියට කලින් මිනිහගෙ කාමරේ ළඟ ගැවසීම මිනිහ අපිට තහනම් කළා. "අහකට යනවල... මේ පළාතෙ එන්න එපා..." මිනිහ කාමරේ ඇතුළෙ ඉඳන් ඒ විදිහට හය හත් පාරක් කෑ ගහනව මං අහගෙන. ඒ කෑ ගැහුවෙ ආලෝක්ට. මිනිහගෙ ආරාධිතයන්ගෙ ලිස්ට් එක මෙහෙමයි.

1. මං
2. ආලෝක්
3. ෂුක්වින්ඩර්
4. අනුරාග්
5. වයිබව් (මෙයා අපේ තට්ටුවෙ කෙළවරේම කාමරේ හිටියෙ. මිනිහගෙ කාමරේ වොඩ්කා බෝතලයක්නං වරදින්නෙම නෑ...! රයන්ගෙ මතය අනුව හොඳ යාළුකමකට පදනම වැටෙන දෙයක් තමයි වොඩ්කා!)

කොහොම වුණත් පස්සෙදි මං හොයා ගත්ත මේ ආරාධිත අමුත්තො තෝර ගත්තෙ මොන පදනමක් උඩද කියන එක ගැන. අපි හැමෝගෙම පොදු ලක්ෂණයක් තිබ්බ. ඒ තමයි අපි හැමෝම පහයි පොයින්ට් ගණන් ලබපු අය වීම. අනික අපි ඔක්කොම එකම බිල්ඩිමක හිටිය අය. අපි ඔක්කොම නොඉවසිල්ලෙන් හිටියෙ මිනිහ කාමරේ දොර අරිනකල්. හරියට දහයට මිනිහ කාමරේ දොර ඇරිය. ඒ අපි පැයක් විතර එළියෙ ඉඳන් කට්ට කෑවට පස්සෙ.

"මෙන්න මෙහෙ වරෙව් කොල්ලනි නට නටා වරෙව්..." රයන් කිව්ව.

අපි කාමරේට ඇතුළු වුණා. ඒකෙ තිබ්බෙ අඩ අඳුරක්. රයන් ඒකෙ තිබ්බ සාමාන්‍ය බල්බ් ගලවල රතු පාට බල්බ් දාල තිබ්බ. ඒවයින් විහිදිච්ච රතු එළිය පොත් මේසෙ (එතන ඒ වෙද්දි පොඩියට බාර් එකක් විවෘත කරලයි තිබ්බෙ) නැව්ව. ඒකෙ උඩ වොඩ්කා බෝතලුයි, රම් බෝතලුයි පේළියට තියල තිබ්බ. කැන්ටිමෙන් පාරෙ පෙට්ටි කඩෙන් ඔරේන්ජ් ජූස් ගෙනත් තිබ්බ.

කොකාකෝලා ගෙනත් තිබ්බ. ලෙමන් පෙති, අයිස් කැට, සීනි වගේ අඩු වැඩියත් අඩු නැතුව ලස්සනට මේසෙ උඩ අඩුක් කරල තිබ්බ. ඒ ඔක්කොම වගේම ආරාධිත අමුත්තන්ට මදි නොකියා සංග්‍රහ කිරීමේ අරමුණින් ජොයින්ට්ස් තොගේකුත් පිළිවෙළකට වීදුරුවක ආල තිබ්බ. හදපු ජොයින්ට්ස් තියෙනව කියන්නෙ, ඒ සංග්‍රහය කරන කෙනා බොහොම පිළිවෙළකට, ඒ වගේම හැම දේකින්ම අඩු නැතුව අමුත්තන්ට සංග්‍රහ කරන කෙනෙක් බවයි.

ඒ විතරක් නෙවෙයි. නිරුවත් ලලනාවො අපිව වටකරගෙන හිටිය! හැබැයි බිත්තිවල. රයන් ඒව අරගෙන තිබ්බෙ ඇමරිකන් සඟරාවලින්. ප්ලේබෝයි වගේ. කැම්පස් එකේ සීනියර් පොරවල් එහෙම යුනිවර්සිටීස්වල විස්තර පත්‍රිකා ගෙන්නගන්න ගමන්ම ඒවත් ගෙන්න ගන්නව. එහෙම තමයි ඒව කුමාඕන්වලට ආවෙ. විවිධ ආකාරෙ සුරූපිනියො, එයාලගෙ හැඩකාර අඟ පසඟ බොහොම නිදහසේ ප්‍රදර්ශනය කරමින් අපි දිහා බලාගෙන හිටිය!

ආලෝකයගෙ කට ඇරුණ ඒව දැකල. මිනිහට මිනිහගෙ ඇස් අදහ ගන්න බැරුව ගියා කියන කාරණේ මට හොඳටම විශ්වාසයි. මිනිහ ඒව දිහා බලාගෙන හිටියෙ හරියට අඟහරු ලෝකෙ යානාවක් ඇවිත් එයාලගෙ ගෙදර කුස්සියෙ සින්ක් එක ඇතුළෙ නවත්තපු ගාණට! "එ... ඒයි... මෙයාලගෙ ඇඟේ නූල් පොටක්වත් නෑනෙ..." මිනිහ කිව්වෙ ගොත ගගහ... දෙතුන් පාරකට... අමාරුවෙන් කෙළ ගිල ගිල!

අනේ දෙයියනේ අසරණය...! අර වෙන්කටා එක්ක ඉඳල මිනිහ හොඳටම නරක් වෙලා? ලෝකෙ ජීවත් වෙද්දි දැන ගන්නම ඕනෙ කාරණා ගොඩාක් අතපසු කරගෙන!! අපි ඔක්කොම රයන්ගෙ කාමරේ බිම තප්පලං ගහ ගත්තා. ඒක ලේසි වෙන්න මිනිහ එකාට එක ගානෙ කුෂන් ලෑස්ති කරලයි තිබ්බෙ. පුරුදු විදිහට කට්ටිය වීදුරුවලට මද්‍යසාරෙ, ඒකට අනුපාන දාගෙන, "එහෙනං ඕං... ඈ...?" කියල වැඬේ පටන් ගත්ත. පින්ක් ෆ්ලොයිඩ් සංගීත රාවෙ කාමරේ ඇතුළෙ පැතිරෙන්න ගත්ත.





පළවෙනි වීදුරුව ඉවර වෙන්න ඒ හැටි වෙලාවක් ගියේ නෑ. නියම ආගන්තුක සත්කාරෙ පිළිබිඹු කරපු රයන් ඉවර වෙන්න වෙන්න අපේ වීදුරු පුරවන්න වගබලා ගත්ත. මගෙ ශරීර කූඩුව ඇතුළෙ ඇල්කොහොල් වැඩ කරන්න පටන් ගත්තු බව මං දැනගත්තෙ, මට ජොයින්ට් එකක් ගහන්න හිතක් පහළ වුණු හින්දයි. එහෙම හිතෙන්නෙ ගාණකට වැදුණම. සාමාන්‍යයෙන් මට ඒ ලෙවල් එකට එන්නෙ වීදුරු තුනක් විතර බිව්වම!

සර්ඩිට තිබුණ බිව්වට පස්සෙ, ඌටම ආවේණික වෙච්චි හැසිරීම් විලාසයක්. බිව්වම ඌ මාර ආදරබර පොරක් වෙනව! මිනිහ වාඩි වෙලා හිටියෙ ආලෝක් ළඟ. ඔන්න මිනිහගෙ ආදරබර වෙරිය වැඩ කරන්න අරන්. මිනිහ දැම්ම ආලෝකයගෙ කර වටේ අතක්. ඊට පස්සෙ මිනිහ කියව කියව ආලෝකයගෙ මූණ, කන් මිරිකන්න ගත්ත. උරිස්ස අත ගාන්න ගත්ත.

"එළ පාටිය මචෝ... ආලෝක්... උඹ හැපිද...?" බොහොම සංවේදීව ඇහුව.

ආලෝක් මොකෙක්ද වගේ ඔළුව වැනුව. නිකම්ම නෙවෙයි. කර වටේ ආල තිබ්බ සර්ඩිගේ අත අහක් කරල ඉස්සරහට නැවෙන ගමන්. ආලෝක් කතා කළා රයන්ට.

"ඒක නෙවෙයි... මොකක්ද ඔයා මේ පාටිය වෙලාවෙදි කියන්න ඉන්න මහ ලොකු කාරණාව?"

රයන් හිටියෙ අපි ඉස්සරහින්ම අනික් පැත්තෙ. අනුරාග්ල එක්ක.

"ඉස්සෙල්ල අපි ෆන් එකක් ගමුකො... ඊට පස්සෙ බැරියෑ ඒක..."

"මංනං දැන් ඉන්නෙ සිරා ෆන් එකේ... ඉතින් කියපංකො..." සර්ඩි කිව්ව. ඒ කියන ගමන් මිනිහ ආයෙ අත දා ගත්ත ආලෝකයගෙ කරට!

"අන්න හරි... කියපං..." වයිබව්, අනුරාග් දෙන්නම එකටම කිව්ව.

"මේකයි මං ඒකට කියන්නෙ මී තියරිය කියලයි..." රයන් පටන් ගත්ත.

"ඒ කිව්වෙ මගේ තියරිය කියන එකද?" අනුරාග් ඇහුව.

"පිස්සුද...? මී තියරිය කිව්වෙ මීයො... මීයො... අන්න උන්... ඉන්නකො කියනකං... මං විස්තර කරන්න කලින් ඔයාල මං අහන එක ප්‍රශ්නෙකට උත්තර දෙන්න ඕනෙ... හරිද?"

"මොකක්ද ප්‍රශ්නෙ?"

"මට ඔයාල කියන්න ඕනෙ ඔයාලා ජීවිතෙන් බලාපොරොත්තු වෙන්නෙ හරියටම මොනවද කියන එක."

"මඟුලක් කියනව... අනේ මේ... විකාර නැතුව ඔයාගෙ තියරිය කියන්න..." මං කිව්ව. මොකද රයන්ගෙ ඔය විකාර වැඩ මං හොඳට දන්න හින්ද. අනික හොඳ ගාණට වැදිල හිටිය නිසා රයනයගෙ විකාර දාර්ශනික ප්‍රශ්නවලට උත්තර දෙන්න තරං ඔළුව කෙළින් තිබ්බෙ නෑ.

"ඒයි... ඒයි... මොනාද මචංලා... එහෙම කියන්න එපා..." රයන් කියන්න ගත්ත. "ඔයාල ඔයාලගෙ ජීවිත ගැන ඇත්තටම හිතනවනං, සැලකිලිමත්නං, ඔයාල මගෙ මේ ප්‍රශ්නෙ අගේ කරන්න ඕනෙ... එක ප්‍රශ්නයයිනෙ මං අහන්නෙ... මොනාද ඔයාලට ජීවිතෙන් ඕනෙ...? හරි මං විනාඩි දෙකක් දෙන්නං. කල්පනා කරල කියනවලකො."

හැමෝම නිශ්ශබ්ද වුණා. රයන් එයාගෙ න්‍යාය කියන්න කලින් 'මඳ විරාමයක්' ගත්ත. අපි 'රැඳී සිටිය...' ඒ විරාමෙ රයන් ප්‍රයෝජනේට ගත්තෙ අපේ වීදුරු ආපහු සැරයක් පුරවන්න. මං හතරවෙනි වීදුරුවට පය තබලයි හිටියෙ. ඒ වෙලාවෙ තරමට ජීවිතේ ගැන කිසිම අදහසක් නැති වෙලාවක් ඊට ඉස්සර මට තිබිල නෑ. අනික් උන් හැමෝම කල්පනා කරන බව මට පෙනුණා.

"හරි... වෙලාව ඉවරයි..." රයන් කිව්ව. මිනිහ සර්ඩිගෙන් පටන් ගත්ත. "හරි... සර්ඩි ඔයාට මොනවද ඕනෙ..."





සර්ඩි, ආලෝකයව බදාගෙන ළඟට ඇදන් ඉඹින්න වගේ හැදුව. ආලෝක් වදෙන් පොරන් උගෙ ග්‍රහණයෙන් මිදුණා.

"මට ඕනෙ කොහොම හරි ඇමරිකාවට පනින්න. ඒත් මේ ග්‍රේඩ්වලින්නං එහෙ යන්න හම්බ වෙන්නෙ නෑ. ඒත් මං කොහොම හරි, කවද හරි ඒක කරනව."

අනුරාග්ගෙ බලාපොරොත්තුව වෙලා තිබ්බෙ අලුත් කම්පියුටර් සොෆ්ට්වෙයාර් එකක් සොයා ගැනීම!

වයිබව්ගෙ අරමුණ වෙලා තිබ්බෙ මිනිහගෙම බිස්නස් එකක් පටන් ගැනී.

අනික් අය එයාලගෙ ජීවිතවලින් බලාපොරොත්තු වෙන දේවල් ගැන රයන්ට වැඩක් නැති බව මං දැනගෙන හිටිය. ඒත් මිනිහ ඒ හැමෝගෙම බලාපොරොත්තු ගැන කියපු කතා බොහොම උවමනාවෙන් වගේ ඔළුව වන වනා අහන් හිටිය. මිනිහට ඕනෙ කරල තිබ්බෙ මගෙයි, ආලෝකයගෙයි ජීවිත බලාපොරොත්තු ගැන දැන ගන්නයි.

රයන් ඒ බලාපොරොත්තුවෙන් ආලෝකය දිහා බැලුව.

"ඔයා දන්නවනෙ ඒ ගැන... ආයෙ අලුතෙන් කියන්න දෙයක් නෑනෙ..."

"හරි... ඉතින් ආපහු කියන්නකො..."

"මට දිල්ලියෙන් හොඳ ජොබ් එකක් හොයා ගන්න ඕනෙ. එතකොට මට පුළුවන් මගෙ අම්මවයි, තාත්තවයි බලා ගන්න. මගෙ ආර්ථික ප්‍රශ්න විසඳ ගන්න..."

"ඇත්තට...?" රයන් කිව්වෙ, ආලෝක්ගෙ උත්තරේ ගැන මිනිහ මාර විශ්වාසයක් නොකළ ගාණට.

"ඔව්... මොකෝ නැතුව?" ආලෝක් නිකං තුරුස්සන විදිහට කිව්ව.

"ඇත්තට?" ඒ පාර එහෙම ඇහුවෙ සර්ඩි. නිකම්මත් නෙවෙයි. ආලෝකයට මිනිහගෙ සෙනෙහස තවත් වැඩියෙන්

පෙන්නන ගමන්. බෙල්ල වටේ අතක් දාගෙන ළඟට කරගෙන හොල්ලන ගමන්!

"ඔයාගෙ අරමුණත් කියන්නකො..." රයන් මා දිහාට හැරුණ.

"අනේ මන්ද..." මං එහෙම කිව්වෙ ඇත්තටමයි. ජීවිතෙත් මං මොනවද බලාපොරොත්තු වෙන්නෙ කියන එක ගැන මට ඇත්තටම මෙලෝ අදහසක් තිබුණෙ නෑ.

මං පොඩ්ඩක් ඒ ගැන කල්පනා කළා. ඇත්තටම මට ඕන කරල තිබ්බෙ නෑ පහයි පොයින්ට් ගණන් අරගන්න. අඩු ග්‍රේඩ් එකක් ලබා ගන්න. මට ඕන කරල තිබ්බෙ නෑ ඌරෙක් වගේ මහත් වෙන්න. දකින අයට හිත් ඇදගන්නේ නැති ස්වරූපයක් ලබා ගන්න. ඒ වගේම වයිවාවලදි, ඒ කිව්වෙ වාචික පරීක්ෂණවලදි බොහ්... බොහ්... ගගා ගොත ගගහ උත්තර දෙන්නත් මට ඕනකමක් තිබ්බෙ නෑ. ඒ කියන්නෙ මං හොඳටම දැනගෙන හිටිය මට ඕනෙ නැති දේවල් ගැන. ඒත් මට ඕනෙ කරන්නෙ මොනවද කියන එක ගැන මට තිබ්බෙ ලොකු ප්‍රශ්නාර්ථයක්.

"එහෙම බෑනෙ... ඔයා ඒක දන්නව. හ්ම්... හ්ම්.. කියන්න කියන්න..." රයන් බල කරන්න වුණා. "මඩේ හිටෝප්පු ඉන්නක් වෙන්නෙ නැතුව ස්පෝටි පොරක් විදිහට හිතන්නකො..." මිනිහ උපදෙස් දෙන්නත් ගත්ත. 'ස්පෝටි...' ඒක රයන් නිතරම පාවිච්චි කළ වචනයක්. හැබැයින් මිනිහට ඒක හොඳ හැටි ගැළපෙනව. මිනිහ ඇත්තටම හොඳ ක්‍රීඩකයෙකි. ඕනම කෙනෙක්ගෙ හිත් ඇදගන්නා පෙනුමකුත් මිනිහට තිබ්බ බව අමුතුවෙන් කියන්න ඕනෙ නෑනෙ. ඒ වගේම එයාට තිබුණෙ පුදුම ආත්ම විශ්වාසයක්. ඒ වගේමයි සැහැල්ලු ගතිය. මං ඇත්තටම රහසින් මිනිහට ඊරිසියා කළා කිව්වොත් වැරදිම නෑ. ඔන්න ඒ වෙලාවෙදි මට තේරුණා මට ජීවිතේදි ඕන කරන දේ. මට ඕන කරල තිබ්බෙ රයන් වෙන්න! ඒත් මං ඒක කියන්න ගියේ නෑ. ඒ නිසාම මට හරි උත්තරයක් තිබ්බෙත් නෑ.





"මට ඉතින් එහෙමට කියල ලොකු අරමුණක් නෑ." මං කිව්වෙ වෙන කියන්න දෙයක් නැතිකමට. මං කොහොමද හැමෝම ඉස්සරහ මට රයන් වෙන්නයි ඕනෙ කියල කියන්නෙ. රයන්ටනං කවදාවත් වෙන කෙනෙක් වෙන්න ඕනෙ නැති බව ෂුවර්!

"මොකක් හරි කියන්නම වෙනව.. නැත්තං මගෙ තියරි එක කියන්න වෙන්නෙ නෑ..."

"එහෙමද...? මී මට ඕනෙ මගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ්ව කිස් කරන්න... මට ඕන කරන ඕනෙම වෙලාවකදි එයාව කිස් කරන්න... සමහර විට ඊටත් එහාට යන්න..."

මං තාමත් දන්නෙ නෑ ඇයි මං එහෙම කිව්වෙ කියල. එක අතකින් මං කිව්වෙ බොරුවක් නෙවෙයි. ඔව්... මට නේහාව කිස් කරන්නයි, අනික්වා කරන්නයි ඕනෙ තමා. ඒත් මං හිතන්නෙ මම ඒක කිව්වෙ අනික් අයට වඩා වෙනස් දෙයක් කියන්න ඕනෙ කියල හිතුණ නිසා වෙන්න ඇති.

"කවුද ඔයාගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ්?" සර්ඩි මගෙ දිහාට හැරුණෙ බොහොම උනන්දුවෙන්.

"ඒක ඔයාට වැඩක් නෑ..." රයන් බොහොම කෙටියෙන්, ඒත් ස්ථිර විදිහට කිව්ව.

"හරි දැන්වත් කියන්නකො ඔයාගෙ තියරි එක... දැන් හැමෝම කිව්වනෙ තම තමන්ගෙ ජීවත් වීමේ අරමුණු..." ආලෝක්, රයන්ට කිව්ව. ආලෝක්ටත් ටිකක් විතර වැදිල. මිනිහ දෙවෙනි වීදුරුවයි ඉවර කළේ. මිනිහට වැදිලයි කියල මම දැන ගත්තෙ, සර්ඩියගෙ ආලිංගන ගැන ඒ වෙද්දි මිනිහ එච්චර කුළෑටිකමක් නොපෙන්නුව හින්දයි.

"මහත්තුරු..." රයන් එයාගෙ ඇඳ උඩින් වාඩි වුණා. මිනිහ දැන් අපි ඔක්කොටම ඉහළින්. හරියට මිනිහ ගුරු කෙනෙක් වගේ! අපි මිනිහගෙ අනුගාමිකයො වගේ!! අපි මිනිහගෙ මුවින් පරම සත්‍යය පිටවෙනකල් බලාගෙන හිටිය!

"අද දින මෙහි පැමිණුණාට මා ඔබ සැමට පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනව. ඔබ හැම දන්නා පරිද්දෙන්, මේ ගොඩනැඟිල්ලේ වාසය කරන අය අතුරින් අඩුම ලකුණු මට්ටමකට හිමිකම් කියන්නෙ ඔය මහත්වරුන් පිරිස බව, ඔව්... මේ කතා කරන මාද ඇතුළුව... ඔබ හොඳින් දන්නවා ඇති. අපි අපතයො... අපතයන්ට ජය වේවා...!"

රයන් කිසිම විළිලැජ්ජාවක් නැතුව අපේ මට්ටම නිවේදනය කළත් අපිට ඒක දැනුණෙ අපේ වීරකමක් නිවේදනය කළා හා සමානව.ඒ හින්දම අපිත් ඒ ඔල්වරසනට හවුල් වුණා.

"ජය වේවා... අපතයන්ට ජය වේවා...! මෝලුන්ට ජය වේවා!!"

"ඉතින් මේ අයි.අයි.ටී. සිස්ටම් එක කියන්නෙ වෙනින් මොකවත් නෙවෙයි. මී පොරයක්... මී රේස් එකක්... අවුරුදු හතරක් තිස්සෙ මෙලෝ සිහියක් නැතුව අපි දුවනව. හැම පන්තියක්ම, හැම එසයින්මන්ට් එකක්ම, හැම විභාගයක්ම ජජ් කරන්න ප්‍රොෆාල ඉන්නව... එයාල හැම අඩි දහයෙන් දහයට ඉඳගෙන අපිව ජජ් කරල, හැම සෙමෙස්ටර් එකකදිම අපේ ග්‍රේඩ් එක කියන සීල් එක ගහනව අපේ නළලවල් උඩ! මේ ප්‍රොෆාල දන්නෙ නෑ සයන්ස් කියන්නෙ මොකක්ද... ඉගෙන ගන්නව කියන්නෙ මොකක්ද කියල... ඔව්. එයාල දන්නෙ නෑ. මං අහන්නෙ මේකයි. අයි.අයි.ටී. එක ඉන්දියාවට දීල තියෙන්නෙ මොනවද...? පහුගිය අවුරුදු තිහ ඇතුළතදි අයි.අයි.ටී. එකෙන් පිට වෙච්ච කෙනෙක් හොයාගෙන තියෙන අලුත් සොයා ගැනීම මොකක්ද?"

රයන්ගෙ කතාව ගැඹුරු වෙන්න වෙන්න කාමරේ ඇතුළෙ නිශ්ශබ්දතාව පැතිරෙන ගතියක් වැඩි වුණා. "රයන්ට නැට්ටට වැදිල වෙන්න ඕනෙ" මං හිතුව. "නැත්තං මේ වගේ පාටියකදි ඔය වගේ කතාවක් පවත්තාවියැ?"

"කොහොම වුණත්..." රයන් ආයෙ කතාව පටන් ගත්ත. "ප්‍රොෆාලා ඔක්කොම... අහ් ප්‍රොෆෙසර් වීරා ඇරෙන්න... අනෙක් ඔක්කොම යකාට ගියාවෙ. මං කියන්නෙ මේ සිස්ටම් එක හරිම





අසාධාරණ රේස් එකක්... අපි හිතමු ඔයාල මේ රේස් එකේ දුවන මීයො. ඒ මීයො අතරෙ ඉන්නව නම් චුට්ටකට නැවතිලා තව මීයෙක් එක්ක යාළුකමක් ඇති කරගන්න කැමති මීයෙක්... ටිකකට නැවතිලා තමන් කැමති දෙයක් ගැන උනන්දුවක් දක්වන මීයෙක්..." රයන් අපි දිහා හොඳට බැලුව. "එහෙම මීයෙකුට වෙන්නෙ පරාද වෙන්නයි. හරියට වෙන්කට් වගේ පොතේ ගුරාල අපිව පහු කරල දිනල තියෙනව වගේම දෙයක් තමා ඒ..."

සර්ඩි මහපටැඟිල්ල උස්සල ඒක අනුමත කළා.

"හැබැයි අපිට පුළුවන් ඒක වෙනස් කරන්න." රයන් කිව්ව.

"ඒ කොහොමද?" අනුරාග් ඇහුව. අඩු ගානෙ රයන්ගෙ විකාර කතාවට ඇහුම්කන් දීගෙන ඉන්න එකෙක් හරි එතන ඉන්න බව ඒකෙන් ඔප්පු වුණා.

"අපිට ඕනෙ විදිහට ජීවත් වීමෙන්. අපි ඔක්කොම එකා වගේ හිටියොත් ඒක කරන්න පුළුවන්... මංනම් මේ සිස්ටම් එක වෙනුවෙන් යාළුකම් පාවල දෙන්නෙ නෑ... මගෙන් වෙන්නෙ ඒකෙ අනික් පැත්ත... ඒ කිව්වෙ මං හදන්නෙ යාළුකමෙන් සිස්ටම් එක පරද්දන්න..."

"ඒ කොහොමද?" ආයෙත් අනුරාගයා!

"ඒක මටයි, මගේ ළඟම යාළුවන්ටයි විතරයි... ඔයාලට හම්බ වෙන්නෙ තියරිය විතරයි... ප්‍රැක්ටිකලි ඒක ඔයාලට කරවනව කියල මං කිව්වෙ නෑ..."

"ඇයි අපි ඔයාගෙ යාළුවො නෙවෙයිද?" සර්ඩිය ඇහුවෙ දුකෙන් වගේ.

"යාළුවො තමයි... හැබැයි මේ වැඩේ මට කරන්න පුළුවන් මගෙ ළඟම යාළුවො එක්ක විතරයි...!"

ඊට පස්සෙ වෙන කවුරුවත් ඒකට විරුද්ධව කතා කළේ නෑ. කාටවත් ඒ ගැන ඒ හැටි කතා කරන්න ඕන වුණෙත් නෑ.



මහජන පුස්තකාලය
කොළඹ

මොකද මිනිහගෙ කතාව පාටි එකේ එක කොටසක් විතරයි. වොඩ්කා බෝතලයයි, ජොයින්ට්ස් දහයයි... පින්ක් ෆ්ලොයිඩ් කැසට්ස් තුනයි... රයන්ගෙ කතාවයි... පාටිය සම්පූර්ණයි.

ඊ එකට විතර පාටිය ඉවර වුණා. මායි, ආලෝකයයි රයන්ට කාමරේ අස්පස් කරන්න උදව් වුණා.

"පාටිය නැගල ගියා..." ආලෝක් කිව්ව.

"ඒකනෙ කියන්නෙ... ඔයාට මේ වගේ ෆන් එකක් තිබ්බද අර වෙන්කට් කියන බූතය එක්ක හිටිය කාලෙ...?" රයන් බොහොම ප්‍රීතියෙන් ඇහුව.

"හරි දැන් කියන්නකො කොහොමද අර තියරිය ක්‍රියාත්මක කරන්නෙ කියල... කොහොමද ඒක වෙන්නෙ...?" මං ඇහුවෙ නොඉවසිල්ලෙන්.

"සී ටු ඩී..." රයන් කියපි!

"මොන අණ්ඩර දෙමළයක්ද ඒ? ඒක හරියට සයන්ස් ෆික්ෂන් ෆිල්ම් එකක රහස් කෝඩ් එකක් වගේ..."

"සී කිව්වෙ කෝපරේට්... ඩී කිව්වෙ ඩොමිනේට්... ඒ කියන්නෙ කෝපරේට් ටු ඩොමිනේට්... අපේ බලය පතුරුවන්න එකමුතු වෙමු... හඃ... හඃ..." රයන් එහෙම කියාගෙනම ඇඳ උඩට වැටුණ. මිනිහගෙ ඇස් දෙකත් පියවුණා. පාටියෙ ප්‍රතිඵල සාර්ථක බව පෙනුණෙ, තවත් විනාඩි ගාණකදි රයන් ගොරවන්න පටන් ගැනීමෙන්. අපිත් අපේ කාමරවලට බඩ ගෑව.

★

මමයි රයනුයි ලැබ් එකේ වැඩ කර කර ඉඳිද්දියි මට මතක් වුණේ පහුවදා මායි, නේහායි හම්බවෙන්න කතා කරගත්ත බව. මේ පාර එයා මගෙන් තෑග්ගක් ඉල්ලලම හිටිය. මෙච්චර





කාලෙකට මං එයාට මොකුත් දීල නෑ... අනික් කෙල්ලන්ටනං එයාලගෙ යාළුවො තෑගි දෙනවයි කිය කියා එයා මට සැහෙන්න වාත වෙලයි තිබ්බෙ! මං අහන්නෙ ගොන් බූරු ප්‍රශ්නයක් වෙන්න පුළුවන්... ඒත් මං අහන්නෙ මේකයි... ශත පහක්වත් වියදම් නොකර මට දෙන්න පුළුවන් දෙයක් එයා ළඟ තියෙනව. ඒත් එයා මට ඒක නොදී, එයා වෙනුවෙන් තෑගි දෙන්නය කියල මගෙන් ඉල්ලනව. (ඒ තෑගිවලට මං එපායැ ගෙවන්න!) මං අහන්නෙ ඒක සාධාරණද? එහෙම තියෙද්දිත් නිර්භීතව, 'මට තෑග්ගක් ඕනෙ කියල' කියන්න පුළුවන් කෙල්ලෙකුට, එහෙමත් නැත්නම් ගෑනියෙකුට විතරමයි. එයාලා වෙනස්. ඒකමයි එයාලට එහෙම කියන්න පුළුවන් වෙන්නෙ. කොහොම හරි මං එයාට දිවුරල පොරොන්දු වෙලයි තිබ්බෙ ඊළඟ දවසෙ එද්දි තෑග්ගක් අරගෙනම එනවයි කියල. ඒත් මට ඒ වෙනකල් ඒ ගැන මෙලෝ මතකයක් තිබුබෙ නෑ.

"හෙට උදේ...?" රයන් ඇහුව. "ඒ වෙද්දි කොහොමද ඔයා තෑග්ගක් ගන්නෙ?"

"අනේ මන්ද... මට එහෙම පිටින්ම ඒක අමතක වුණා. මාර සවුත්තුව. ෂිඃ... දැන් ඉතින් වැඩි ගාණක් වියත් කරන්න දෙයක් නෑ චොකලට් ටිකක් ගන්නව ඇරෙන්න..."

"චොකලට්...? ඒව ඔරිජිනල් ඒව නෙවෙයිනෙ... ඒක වෙන්නැති එයා තාම ඔයාට චොකලට් නුදුන්නෙ." රයන් කිව්ව.

"සමහරවිට... ඔයාට මොනව හරි මාර අදහසක් ඇත්තෙ එහෙම නැද්ද?" මං ඇහුවෙ නොසන්සුන් වෙවී. මිනිහ කියන කතාව ඇත්ත.

"හිතන්න... හිතන්න..." රයන් කිව්ව.

අපි ටික වෙලාවක් හිතල, එක එක අදහස් කිව්ව. ඇඳුම්...? ගාණ වැඩියි...! පර්ෆියුම්...? තේරුමක් නෑ... පොතක්...? පුද්ගලික ගතියක් නෑ...!

"එයා මොනව හරි හදාගෙන යන්න." එක පාරට මාර අදහසක් ආව රයන් කිව්ව.

"මොනවද?"

"මොකක් හරි ඔයා හදපු දෙයක්... ඉංජිනේරු ශිෂ්‍යයෙක්ගෙ නිර්මාණයක්..."

ඒකනං හොඳ අදහසක් වගේ මටත් පෙනුණා. ඒක ප්‍රායෝගික නෑ වගේ පෙනුණත් අමුතු වැඩක්. ඒත් බැරි වෙලාවත් එයා බලාපොරොත්තු වෙන්නෙ මං සල්ලි වියදම් කරගෙන ගේන තෑග්ගක් එහෙමනං තමයි වැඩේ!

"හරි ඉතින්... මොකක්ද හදන අටමගලෙ?"

"මන්ද... මොකක් හරි එයාටත් පාවිච්චි කරන්න පුළුවන් දෙයක්..."

මං නේහාගේ ජීවිතේ ගැන හිතුව. සාප්පුවෙන් දීපු බිලේ ඉඳල, මූණ බලන අත් කණ්ණාඩිය දක්වා අටංපහුරු, ලට්ට ලොට්ට තියෙන එයාගෙ හෑන්ඩ් බෑග් එක මට මතක් වුණා.

"එයාගෙ ලිප්ස්ටික්ස් එහෙම දාගන්න පුළුවන් විදිහෙ පොඩි පෙට්ටියක් කොහොමද? එයාගෙ හෑන්ඩ් බෑග් එක ඇරියම ඔය එහෙට මෙහෙට රෝල් වෙලා යන ඒව දාගන්න පුළුවන් විදිහෙ එකක්...?"

"හ්ම්ම්... දැන් ඔයා හිතන්නෙ කස්ටමර් කෙනෙක්ගෙ අවශ්‍යතාවක් ඉෂ්ට කරනව විදිහෙ දෙයක්... ම්... ම්... නරකමත් නෑ. ලිප්ස්ටික්ස් කීයක් විතර තියේද එයාගෙ?"

"හතරක්... පහක් විතර..."

"සයිස් එක?"

"අනේ මන්ද... අඟල් තුනක්... දෙකහමාරක් විතර උස ඇති එකක්... අඟල් බාගයක් වගේ පළළ ඇති..."

"ඕකේ... අපි ඒකෙ ගානට එකක් හදමු... ඉස්සෙල්ලම ඒකට හරියන මෙට්ල් ෂීට් එකක් හොයා ගමු..."





මගේ තකතීරු අදහසට ගරු කරල රයන් බොහොම උනන්දුවෙන් වැඩේ පටන් ගත්ත. සිස්ටම් එකට බෑණ බෑණ, විභාගවලට ශාප කර කර හිටිය එපා කරපු ශිෂ්‍යයා එක මොහොතකින් බොහොම උනන්දුවෙන් වැඩ කරන ඉංජිනේරුවෙක් බවට පත් වුණා. පළවෙනි වතාවට මම දැක්ක මිනිහ නියම ඉංජිනේරුවෙක් වගේ රූපසටහන් අඳින හැටි! මිනිහ මං හිතුවටත් වඩා දුර ගිහින් ඒකට තව එක එක ගැජට් කෑලි එකතු කළා. ප්‍රෙස් කළහම ඇරෙන පියනක්, ඒ පියන ඇතුල් පැත්තෙ කණ්ණාඩියක්, පෙට්ටියෙ කෙළවරක නේහාගෙ නම කෙටීම වගේ දේවල් ඒ අතර තිබුණා.

මූලික සැලැසුම ඇඳල ඉවර වුණාට පස්සෙ රයන් ඒක අදියරවලට බෙදුව.

1. තහඩුව කැපීමේ අදියර
2. තහඩුව නැවීමේ අදියර
3. ඔප දැමීමේ අදියර

මේ ඔක්කොම පන්තියෙ ඉගෙන ගනිද්දි පට්ට බෝරිං වුණත්, දැන් එක පාරටම ඒව ගැන මාර උනන්දුවක් අපිට ඇතිවෙලා තිබ්බ. එදාට දීල තිබ්බ එසයින්මන්ට් එක අපිට අමතක වුණා. ඒකට ලැබෙන ලකුණු, අපේ ග්‍රේඩ්ස් අපිට අමතක වුණා.

පැය තුනක් ගත වෙච්ච තැනදි මට පුළුවන් වුණා අපි කරපු උත්සාහයෙ ප්‍රතිඵල උඩ 'නේහා චෙරියන්' කියන නමේ අන්තිම අකුරු දෙක කොටා ගන්න.

"මේක එළ...!" මං කිව්වෙ ප්‍රෙස් කළහම ඇරෙන පියන ටෙස්ට් කරන ගමන්. ඇත්තටම ඒක නියමට වැඩ කළා.

"එයා මේකට කැමති වෙනව ෂුවර්... තෑන්ක්ස් රයන්..."

"ඕනෙ වෙලාවක බ්‍රෝ..." රයන් කිව්වෙ මහපටැඟිල්ල උස්සන්. ඇත්තටම කීවොත් මට හැම වෙලාවකදීම හිතිල තිබුණු, 'රයන් වගේ වීමේ' හීනෙ තව තවත් වැඩි වෙන්න ගත්ත.

අපි පොරොන්දු වෙච්ච විදිහට අයිස් ක්‍රීම් ෂොප් එකේදි හම්බවුණාම මං එයාට මගෙ තෑග්ග දුන්න.

"මොකක්...? මොකක්ද ඔයා මේකට කිව්වෙ?" එයා එයාගෙ සුමුදු ඇඟිලිවලින් ඒක එහාට මෙහාට කරකව, කරකව ඇහුව.

"ඒක ලිප්ස්ටික් හෝල්ඩර් එකක්..." මං කිව්වෙ ටිකක් ආඩම්බරෙන්.

"මං ඔය ඇහුවමයි එහෙම එකක්..." එයා කිව්ව.

මං එයාගෙන් එයාගෙ ලිප්ස්ටික් ටික ඉල්ලුව. එයා මට දුන්නා ලිප්ස්ටික්ස් පහක්...! මළා! ඒකෙ පහක් දාන්න බෑ... ඒ වුණත් මං හතරක් අතට ගත්ත. රතු පාට... කොපර් පාට... දුඹුරු පාට... රෝස පාට... (කෙල්ලො මේ වගේ පාට පාට තමන්ගෙ ශරීරෙ උළා ගන්නෙ මොන එකකටද කියල මටනං තේරෙන්නෙ නෑ...) හොඳ වෙලාව! ඒ හතර ගාණට ඒකට සෙට් වුණා. මාර නීට් විදිහට! අපේ වැඩේ තිතටම හරි ගිහිල්ල තිබ්බ. ඒකෙ තිබ්බ කණ්ණාඩිය හින්ද, ලිප්ස්ටික්ස් උළන කෙනාට පුළුවන් වෙලා තිබ්බ හොම්බෙයි, කටෙයි ගා ගන්නෙ නැතුව ගානට, තොල්වල විතරක් ලිප්ස්ටික්ස් උළා ගන්න!

"ඇයි ලිප්ස්ටික් හෝල්ඩර් එකක්?"

"අනේ මන්ද... මං ඔයාගෙ ලිප්ස්වලට කැමති හින්ද වෙන්න ඇති..." මං කිව්ව.

"වෙරි ෆනී... ඉතින් ඔයාද මේක හැදුවෙ?"

"ඔව්... මායි, රයනුයි... මේවයින් ලෝකෙටම තියෙන්නෙ එකයි..." මං නේහාට ඒකෙ කෙළවර පෙන්නුව. ලෝකෙ තියෙන ලස්සනම නම, ලස්සන අකුරින් ඒකෙ කොටල තිබ්බ.

"නේහා වෙරියන්... වාව්..." නේහා බොහොම හුරතල් විදිහට කිව්ව. කියල, අයි.අයි.ටී. දිල්ලි ලැබ් එකේ හදපු ලිප්ස්ටික් හෝල්ඩර් එක, අලුත උපන් බබෙක්ව අතට ගන්න තරමෙ පරෙස්සමෙන් එහාට මෙහාට හරවල බැලුව.





"වාව්..." එයා ආයෙත් කිව්ව.

"මොකෝ...?" මං කිව්ව. (ඇත්තටම මං ඒ 'වාව්වට' වඩා දෙයක් බලාපොරොත්තුවෙන් හිටියෙ.)

"මීට ඉස්සෙල්ල කවුරුවත් මං වෙනුවෙන් මේ වගේ දෙයක් කරල නෑ..." එයා කිව්ව.

අන්න වෙලාව! ඔන්න පුතෝ වෙලාව! හරියටම නියම වෙලාවෙදි නියම වචන ටික මගෙ කටින් පිට වුණා. මං දන්නෙ නෑ මට ඒ වචන කොහෙන් ආවද කියල... ඒත් කොහොම හරි ඒ වචන මට ගලාගෙන ආව.

"ඔව්... මගෙ ජීවිතෙත් මට ඔයා තරම් කෙනෙක් මේ වෙනකල් හම්බවෙලා නෑ..."

සමහරවිට ඒක සම්පූර්ණ ඇත්තක් නොවෙන්නත් පුළුවන්. ඒත් ඒක බොරුවකුත් නෙවෙයි. (මොනව වුණත්, ඇත්ත හරි බොරු හරි කෙල්ලන්ට ඒ නියම තැනදි නියම දේ කියන්න ඕනෙ.)

"ඇත්තට?" නේහා ඇහුව.

"ඔව්..."

"තැන්ක් යූ හරී... ඉන්නකො මං ඇම්මම මේක පාවිච්චි කරන්නං." එයා කිව්ව.

නේහා ලිප්ස්ටික්ස් ගාන දිහා මං බලාගෙන හිටිය. ඒ වෙලාවෙ නේහාගෙ මූණෙ තිබ්බෙ ආලෝක් ගණන් ප්‍රශ්නයක් විසඳන්න හදද්දි මිනිහගෙ මූණෙ මතුවෙන අහස පොළොව ගැටලන පෙනුමමයි. කෙල්ලො මාර ලස්සනයි. ඇත්තම කිව්වොත් එයාල නැතුව ජීවිතෙන් ඇති වැඩක් ඇත්තෙම නෑ.

"කීයටද ඔයා ගෙදර යන්නෙ?"

"නවයට විතර..." නේහා කිව්ව. "මං ගෙදරට කියල ආවෙ මගෙ යාළුවො කට්ටියක් එක්ක රෑ කෑමට යනව කියල."

"ෂඃ... එයාල බොහොම පළල් විදිහට හිතන කට්ටිය වගේ..." මං ඔලොක්කුවට කිව්ව.

"එයාල දන්නව මං සමීර් ගැන හිතල අප්සෙට් වෙන බව."

"මේ... ඒක නෙවෙයි... මං ඔයාව රහස් තිප්පොළකට එක්කන් යන්නද?"

"කොහෙද...?"

"අපේ බිල්ඩින් එකේ වහලෙ උඩට. එතන තමයි අපේ ස්පොට් එක..."

"පිස්සුද ඔයාට? වහලෙ උඩට...? හොඳට තියෙයි... හැමෝටම පේන්න..."

"එතන මොකෙක්වත් නෑ... මායි රයනුයි එතනට දහ පහළොස් පාරක් ගිහින් තියෙනව... මොන මළ යකෙක්වත් නෑ... එතනට හරි ලස්සනට බෙල් ටවර් එක පේනව..."

ටික ටික නේහා වහලෙ උඩ ස්පොට් එක ගැන උනන්දුවක් දක්වන බව මට පෙනුණ. මට තවත් විනාඩි තුන හතරක් ගියා එයාට තහවුරු කරල දෙන්න. එතනට ගියාට මොකෙකුටවත් පේන්නෙ නෑ කියල.

"හරි... මං එන්නං. හැබැයි අද නෙවෙයි. දැන් නවයටත් ළඟයි. ඊළඟ දවසෙදි යන්ද? මං සමීර්ව මතක් කරල මුළු දවස තිස්සෙම ඇඬුවම එයාල මට පරක්කු වෙනකල් එළියට ගිහින් එන්න දෙනව..."

ඒකටනං මං එච්චර කැමති වුණේ නෑ. එයාගෙ නැති වෙච්ච සහෝදරයව දඩමීම කරගෙන පරක්කු වෙන්න ප්ලෑන් ගහන එකට. ඒත් ඉතින් එයාගෙ ගෙදර අය ඒ තුල් සූත්තරවලට අහුවෙනවනං මට කරන්න දෙයක් නෑ!

"හරි... ඊළඟ පාර අපි කෙළින්ම වහලෙ උඩදි හම්බ වෙමු... අටහමාරට... මොකෝ කියන්නෙ?"

"එළ... ෂුවර්." එයා කිව්ව. "මේ ඔන්න එතන පරිස්සං නේද?"

"නැතුව බබෝ... මාව විශ්වාස කරන්නකො..."



# 10

## C - 2 - D

"කෝපරේට් වු ඩොමිනන්ට්!" වැඩේ පටන් ගන්නයි යන්නෙ.

"ආ... හැමෝටම එක කොපිය ගාණෙ තියෙනව..." රයන් එයාගෙ අතේ තිබ්බ කොළ ටික බෙදන්න ගත්ත. ඒකෙ උඩින්ම ගහල තිබ්බ මාතෘකාව "THE C2D PLAN".

රයන්ගෙ C-2-D විකාරෙ මට එහෙම පිටින්ම අමතක වෙලයි තිබ්බෙ. ඒත් රයන් කියන්නෙ තමන්ට හිතුණු දෙයක් එහෙම අමතක කරන සතෙක් නෙවෙයි. මිනිහ ඒක ෆුල් සිරා විදිහට හදල තිබ්බ. අපි හිටයෙ පරෝටා කන්න ගිහින්. 'සාසි' එකේ. ඒ වෙද්දි ආලෝකය මිනිහගෙ දෙවෙනි පරෝටා පිඟාන එක්ක 'මාර බිසී' වෙලයි හිටියෙ. ඒ වෙලාවෙදි තමයි රයන්, අයි.අයි.ටී. එකේ අපි අනාගතේ ගත කරන්න ඕනෙ මාර්ගය කියල දෙන මිනිහගෙ C-2-D ප්ලෑන දිග ඇරියෙ.

"මේ මොකක්ද?" ආලෝකයගෙ ඇඟිලිවල තිබ්බ තෙල් ගතියයි, ලාවට ගෑවිලා තිබ්බ හොදියි, රයන්ගෙ විශිෂ්ට නිර්මාණෙ තැවරුණ. හරිනං ආලෝකය ඒව පිහ දාගන්න ටිෂූ එකක් ගන්න තිබ්බ. කොහොමත් ආලෝකයට කෑම එක්ක තිබ්බෙ බොහොම ප්‍රේමණීය සුසංයෝගයක්.

මං ඒකෙ තිබ්බ දේවල් කියවන්න ගත්ත.

## C-2-D සැලසුම

අයි.අයි.ටී. හි ක්‍රමවේදය ඉතා අසාධාරණය. එනම් එයින්,

1. කෙනෙකුගේ දක්ෂතා මෙන්ම ආත්මාභිමානයද මොට කර දමයි.
2. දේශයේ බුද්ධිමත්ම මනස්හිමියන්ගේ ජීවිතයේ ස්වර්ණමය කාල පරිච්ඡේදය සූරා කයි.
3. අහස පොළොව නුහුලනා ශ්‍රේණි ක්‍රමය මඟින් සියලු මානව සබඳතා විනාශ කර දමයි.
4. මහාචාර්යවරුන් යැයි කියා ගන්නා අය විසින් සිසුන්ව නොසලකා හැරෙයි.
5. රටේ සංවර්ධනයට කිසිදු කැපී පෙනෙන දායකත්වයක් නොකරයි.

"ඔයාට මේව කරන්න වෙලාවක් තිබ්බද?" ආලෝක් මැටිමෝල් ප්‍රශ්නයක් අහපි. රයන්ට මේ ලෝකෙ ඕනෙ දෙයක් කරන්න තරම් වෙලා තියෙන බව ඌට අමතක වෙලාද මන්ද!

මං ආයෙත් කියෝගෙන ගියා.

එබැවින් එම අසාධාරණකමට මුහුණ දිය හැක්කේ විසෙන් විස නැසීමේ න්‍යාය අනුගමනය කිරීමෙනි. මේ C-2-D සැලැස්මෙන් ක්‍රියාත්මක වන්නේ එයයි. එමෙන්ම මෙම සැලැසුම රයන්, හරිකුමාර් සහ ආලෝක් යන අපි තිදෙනා අයි.අයි.ටී.හි ගත කරන මුළු කාලය තුළදීම අනුගමනය කළ යුතු වෙයි. එහි ප්‍රධාන කොන්දේසි පහත දැක්වේ...

මං කොළේ පහළ බැලුව. රයන් කොන්දේසි හයක් හදල තිබ්බ!

1. සියලුම පැවරුම් (Assignments) බෙදා හදා ගත යුතුය. එනම් පැවරුමක් ලැබුණු විට එය කරන්නේ එක් අයකු පමණි. අනික් දෙදෙනා එය මඳක් වෙනස්කොට පිටපත් කර ගනී. ඊළඟට ලැබෙන පැවරුම දෙවැන්නා විසින් සිදු කෙරේ. මෙසේ මාරුවෙන් මාරුවට පැවරුම් සම්පූර්ණ කෙරේ.





2. පාඨමාලා අන්තර්ගතයන් බෙදාහදා ගත යුතු වෙයි. උදාහරණයක් වශයෙන් සෙමෙස්ටරයකට පාඨමාලා හයක් ඇත්නම්, එක් අයෙක් එයින් දෙකක පූර්ණ වගකීම භාර ගනී. ඔහු එම පාඨමාලා දෙකට අදාළ සියලු පන්තිවලට සහභාගි විය යුතුය. අනික් දෙදෙනාම එම කාලයේදී විවේක සුවයෙන් සිටිය හැකිය. (සැ.යු. මහාචාර්ය වීරාගේ පාඨමාලා රයන් දැනටමත් භාරගෙන තිබේ.) එම පන්තිවලට සහභාගි වන්නා ඒවායේ සටහන් ඡායා පිටපත් කොට අනෙක් දෙදෙනාට ලබා දිය යුතුය. මෙලෙස තිදෙනා විසින් පාඨමාලා හය ආවරණය කෙරේ.
3. පරීක්ෂණාගාර පරීක්ෂණ හා නිරීක්ෂණද තිදෙනා බෙදාහදා ගත යුතුය.
4. ශ්‍රේණිගත කිරීම් හා ලකුණු මට්ටම්වලට ඉහළින් මිත්‍රත්වය පවතී. ලැබෙන හැම අතිරේක මොහොතකම ජීවිතය වින්දනය කළ යුතුය.
5. තිදෙනාගේ කාමර තුන ඒකාබද්ධ කොට අදාළ ක්ෂේත්‍රවලට බෙදා හැරේ. එක් කාමරයක් තිදෙනාගේම නිදන කාමරය බවට පත් වෙන අතර, තවත් කාමරයක් තිදෙනාගේම අධ්‍යයන කුටිය බවට පත් කෙරේ. ඉතිරි කාමරය තිදෙනාගේම 'මිනි සමාජ ශාලාව' බවට පත් කෙරේ.
6. තමන් කෙතරම් පානය කරන්නේද යන්න ගැන නොසලකා වොඩ්කාවලට යන වියදම තිදෙනා අතරේ සමසේ බෙදී යයි.

රයන් අපි දිහා බැලුවෙ අපි ඒක කියවල මහ හයියෙන් අත්පුඩි ගහල මිනිහට අපේ ප්‍රශංසාව පුද නොකරන්නෙ ඇයි කියන්නා වගේ! ඒත් අපි හිටියෙ නිශ්ශබ්දව. මිනිහටම පුළුවන් මේ විලම්බීතෙ අපිට තේරුම් කරල දෙන්න.

"හරි... දැන් ඉතින් මොකක්ද ඔයාලා හිතන්නෙ මේ ගැන?" රයන් ඇහුව.

"මොකක්ද මේ...? අර කොලු කාලෙදි හදා ගන්න රහස් පරීක්ෂක ක්ලබ් එකක් වගේ එකක්ද?"

"ඔයාල මේකට එකඟ වෙනවනං අත්සන් කරන්න... ලේවලින්...!"

"ඔව්... ඔව්... ඒක තමයි දැන් අඩු... කීයද අපේ වයස...? දහයක්...? දොළහක්...?"

"මේක විහිළුවක් නෙවෙයි හරිද...?" රයන් බොහොම බැරෑරුම් විදිහට කිව්ව. අපි තවත් වචනයක්වත් කියන්න කලින් මිනිහ සාක්කුවෙන් ඇදල ගත්තෙ පෑන් පිහියක්. එක තත්පරේකින් මිනිහ ඒකෙන් මිනිහගෙ ඇඟිල්ල ටිකක් කපා ගත්ත. රයන්ගෙ ඇඟිල්ලෙ කැපුණු තැන ලේ පිරෙනව මං බලාගෙන.

"රයන් පිස්සුද?" ආලෝක් ඇහුවෙ කකා හිටිය එකත් නවත්තල.

"නෑ... මං කිව්වෙ මම සිරා කියල... ඔයාල තීරණය කරන්න ඔයාල මොකද කරන්නෙ කියල..." ඊට පස්සෙ මිනිහ වූත් පික් එකක කෙළවර ලේවල ඔබල, ඒකෙන් අපිට බෙදපු කොළවල අත්සන් කළා.

"අත්සන් කරන්න කලින් අපි මේ ගැන ටිකක් සාකච්ඡා කරමුද?" මං ඇහුව.

"මොනවද සාකච්ඡා කරන්න තියෙන්නෙ... කැමතිනං කැමති... නැත්තං නෑ... මං කාටවත් බල කරන්නෙ නෑ."

"මේකෙ කියල තියෙන විදිහට එසයින්මන්ට්ස්, නිරීක්ෂණ ෂෙයාර් කරන එක කපටිකමක් නෙවෙයිද?" ආලෝක් ඇහුව.

මගේ අවධානෙ වැඩිය යොමු වෙලා තිබ්බෙ වොඩ්කාවලට යන ගාණට සම්මාදම් වීම ගැන වුණත්, මාත් ආලෝක්ගෙ අදහසට එකඟ වුණා.

"ඒක කපටිකමක් නෙවෙයි... ඒක තමයි සහයෝගය කියන්නෙ. සහජීවනය කියන්නෙ... එයාල අපිව ග්‍රේඩ්වලින්, ලකුණුවලින් බෙදල වෙන් කරල තියෙනව... අපි ආපහු එකතු වෙන්න සටන් කරනව. එච්චරයි..."





"මටනං එහෙම එකක් පේන්නෙ නෑ..." මං මගේ මතේම හිටිය.

"ඔයා අත්සන් කරනවද? නැද්ද?" රයන් ඇහුවෙ ඉණට අත් දෙක තියාගෙන.

මං ආයිත් රයන්ගෙ C-2-D බූත අදහස ගැන හිතුව. "හ්ම්හ්... හරි අත්සන් කරන්නංකො... හැබැයි මට බෑ ඔය ඇඟිලි කපා ගැනිලි කරන්න..."

"අයියෝ ඒකට තත්පරයයි යන්නෙ..." මං මොනවත් හිතන්නවත් කලින් රයන් මගෙ අතින් අල්ලන් මිනිහගෙ පෑන් පිහියෙන් මගෙ ඇඟිල්ල කපලත් ඉවරයි.

"මොන මඟුලක්ද ඒ කළේ...?"

රයන් බක බක ගාලා හිනා වෙන්න ගත්ත. "අනේ පව්... බලපල්ලකො මූණෙ හැටි... අඬන්න ළං වෙච්ච බබෙක් වගෙයි. මනුස්සයො... පිරිමියෙක් වගේ කෙළින් ඉන්නව... ඔන්න ඕක අත්සන් කරල දානව."

මං රයන් දිහා බොහොම පසුතැවිලි බැල්මක් බලල ඒකට අත්සන් කළා.

ආලෝක් අපි දෙන්න දිහා බලාගෙන හිටියෙ හරියට මරන්න ඉන්න හරකෙක් වගේ. ඉස්සර හිටිය ආලෝක් නම්, රයන්ගෙ මේ යෝජනාවට කැකෝ ගහල, විරුද්ධත්වය පෙන්නල යකා නටනව. ඒත් දැන් ඉන්නෙ ආලෝක්ගෙ නව, පැසුණු (?) බුද්ධිය මිනිහව ඒවයින් ඈතට ගෙනිහිල්ල තිබුණු බවයි පේන්න තිබ්බෙ.

"මගෙ ඇඟිල්ල මංම කපා ගන්නම්..." මිනිහ අන්තිමට කිව්ව.

ආලෝක් මිනිහගෙ ඇඟිලලෙන් ගලන ලේවලින් ඒ ලියවිලි අත්සන් කළා. අපිට ඇති වුණේ මහ ගෝත්‍රික හැඟීමක්. ඇත්තම කිව්වොත් මේ බඩකඩුත්තුව ලේවලින් අත්සන් කළාට පස්සෙ ඒක වැදගත් ලියවිල්ලක්ය කියන හැඟීම මට ඇති වුණා. ලේවලින්

අත්සන් කරපු හින්දයි එහෙම හැඟීමක් ආවෙ! මං කරපු දේ ගැන මට එච්චර ලොකු අවබෝධයක් නැති වුණත් ඒකෙන් පොඩි 'කික්' එකක් ආපු බවනං ඇත්තක්. එදාම හවස අපි අපේ කාමර තුළ 'එකම ගෙයක්' බවට පත් කර ගත්ත. රයන්ගෙ කාමරේ, 'පාටි කාමරේ' වුණා. ආලෝක්ගෙ එක 'අධ්‍යයන කාමරේ' වුණා. මගෙ කාමරේ, පොදු නිදන කාමරේ වුණා. ආලෝක්ගෙ කාමරේ මේස තුනයි...! මගේ කාමරේ ඇඳන් තුනයි...!

★

"ඒ කියන්නෙ ඔය තුන්දෙනා එක ගෙයක් හදා ගත්ත?" නේහා ඇහුව.

අපි හම්බවුණේ පහුගිය සැරේ කතා වෙච්ච විදිහටම අපේ බිල්ඩිමේ වහලෙ උඩ. එයා කිව්වත් වගේම අට වෙද්දි ආව. මේ ලෝකෙට තවම පහළ වෙලා නැති යාළුවෙකුගෙ බර්ත් ඩේ පාටියකට ගිය තමන්ගෙ දෝණියන්දැ ගැන සැක සංකාවක් එයාගෙ ගෙදර අයට ඇති වෙලා එහෙම තිබ්බෙ නෑ.

"ඔව්... ගෙයක් වගේ තමා දැන්..." මං පඩිපෙළ නඟින ගමන් හති දැම්ම.

"ෂෑ... මරුනෙ...!" එයා කිව්වෙ හරියට ඇහැ කෙළින් වැටුණු කෙහෙ රොදක් කටින් පිඹල අහකට යවන ගමන්.

වහලෙ උඩ අඳුරුයි. කළුවරයි. වෙනද වගේම එදත් මෙලෝ බල්ලෙක් එතන හිටියෙ නෑ.

"වාව් බලන්නකො අහසෙ තරු ටික ලස්සනට පේනව..."

"ඔව් ඒකනෙ..." මං කිව්වෙ, හරියට අහසෙ තරු තිබ්ම මගෙ වැඩක් වගේ! "දැන් මෙතන අපි විතරයි... අපේ රාජ්ජේ... බලන්නකො මෙතනට මුළු කැම්පස් එකම පේනව... ආං අතනනෙ ඔයාලගෙ ගේ තියෙන්නෙ..." මං විස්තර කළා.





එහෙම පෙන්නුවත් එයාලගෙ ගෙදර ලයිට් ඇරෙන්න වෙන දෙයක් පැහැදිලිව පෙනුණෙ නෑ.

"ෂා... ළඟයි... ඒත් දුරයි..." නේහා දාර්ශනික මතයක් පළ කළා. ඊට පස්සෙ එයා වහලෙ උඩ කොන්ක්‍රීට් පොළොවෙ වාඩි වුණා.

"ඉතින්...?"

"ඉතින් මොනවද...?"

"කෝ වොඩ්කා? ඔයාල මෙතනට ඇවිල්ල බොනවනෙ... නැද්ද හොඳයි...?"

"ඔව් බොනව තමා. ඒත් ඉතින් ඔයා බොන්නෙ නැනෙ..."

"කවුද කිව්වෙ? ඔයා ළඟ තියෙනවනං මං ටිකක් ගන්නං."

"අපි මෙතන එකක් හංගල තියෙනව... ඉන්න බලන්න..." මං කිව්වෙ නේහගෙ ඉල්ලීම ගැන පුදුම වෙලා. මං හිතන් හිටියෙ එයා 'හැදිච්ච කෙල්ලෙක්' කියල. 'හැදිච්ච කෙල්ලො' බොන්නෙ නැනෙ!! ඕන එකක්... මට හරි ෂොට් එකක් දාගන්න පුළුවන්නෙ... එහෙම හිතල මං හංගපු බෝතලේ අරන් ආව.

"නියමයි..." ඩිෂ් ඇන්ටෙනා එකට හේත්තු වෙලා හිටිය නේහා කිව්ව. "බලන්නකො අහස දිහා... තාරකා පිරිල... මාරයි... මට කුරුල්ලෙක් නෑ... නෑ... කිරිල්ලියෙක් වෙන්න තියෙනවනං..." එක පාරටම එයාගෙ හිතට කාව්‍යමය අදහස් ඇවිත්!

සාමාන්‍යයෙන් මිනිහෙකුට කුරුල්ලෙක් වෙන්න හිතෙන්නෙ හොඳට දෙකක් දාගත්තම. ඒ වුණාට නේහාට ඩ්‍රින්ක් එකක් දාන්න අදහස ආව ගමන්ම එහෙම හිතිල!

"ඕ... මට මෙහෙම නිදාගෙන උඩ බලාගෙන තාරුකා අස්සෙ ඉගිළි ඉගිළි ඉඳතහැකි මුළු ජීවිතේම වුණත්... කෝ දෙන්නකො මට තව ඩ්‍රින්ක් එකක්..."

"වැඩිය බොන්න එපා ළමයෝ..." මං ටිකක් සැලකිලිමත් වුණා.

"අපෝ නෑ... තාත්තට ගඳ ආවොත් මාව මරයි."

"ආවොත් මොකක්ද... ගඳ එනව තමයි..."

"නැහැ... මේ... ඔන්න බලන්න."

එයා එයාගෙ පර්ස් එක ඇරියා. ඒක අවුස්ස අවුස්ස එක එක ලව්ට ලොව්ට එළියට ගත්ත. එහෙම එක එක කෑලි දහයක් විතර එළියට ආවට පස්සේ, එකොළොස් වෙනියට ඕන්න එයා හොයපු එක එළියට ආව. කරදමුංගු පැකට් එකක්!

"මෙයින් එකක් හප හප ඉන්නයි තියෙන්නෙ... එතකොට ෂේප්..."

"ඉතින් දැන් එකක් හපන්නකො... එතකොට මං බලන්නං ඒක වැඩ කරනවද කියල...?"

"මොකක්?? ඇයි මගෙ කට ගඳ ගහනවද?" එයා කෙළින් වුණා.

"නෑ... නෑ... මං එහෙම එකක් කිව්වෙ නෑ."

එයා මගෙ අතින් ඇදල එයා ළඟට ගත්ත. "මගෙ ඇස් දිහා බලාගෙන කියන්න මගෙ කට ගඳයිද කියල...!"

"අනේ මන්ද... එහෙම කියන්න මං කවදාවත් ඔයාගෙ කට ඉඹල නෑනෙ!"

මං අහිංසක විදිහට කිව්ව. මං එහෙම කිව්වෙ ඇත්තටමයි ඒ වෙද්දි එයාගෙයි, මගෙයි මූණුවල් දෙක ඕන්නං මිලිමීටර් දහයක, පහළොවක පරතෙරේකින් තියෙන්න ඇති!

"අනේ යන්න කපටිය..." එයා මාව තල්ලු කළා.

"ඔය... මං කිව්වෙ. ඔයා මහ බයගුල්ලියෙක්..."

"පිස්සු... බයගුල්ලියෙක්? මං? මේ බලනව. මං ප්‍රොෆෙසර් කෙනෙක්ගෙ දුවෙක්... කිසිම බයක් නැතුව කැම්පස් වහලයක් උඩ නැඟල, වොඩ්ක බොනව... ඊටත් මේ රෑ... පහයි පොයින්ට් ගාණක් ගත්තු රස්තියාදුකාරයෙක් එක්ක... ඒ කියන්නෙ මං බයගුල්ලියෙක්ද ආ...??"





එයා හිකි හිකි ගගා එහෙම නොකිව්වනං මට ඒක තුරුස්සන දෙයක් වෙන්න තිබ්බ. ඒ මොනව වුණත් මං හිතා ගත්ත කල දුටු කල වළ ඉහගන්න!

"රස්තියාදුකාරයෙක් ඈ? එතකොට මං රස්තියාදුකාරයෙක්?"

"ඔව්... ඒත්..."

"ඔව්... ඒත් මොකද...?"

"ඒත් මං ඒ රස්තියාදුකාරයට ආදරෙයි...!" එහෙම කියල එයා මාව ආයෙත් එයා ළඟටම ඇදල ගත්ත. මේ වතාවෙත් අපේ මූණුවල් වෙන්වෙලා තිබ්බෙ මිලිමීටර් ගාණකින්. ඊට පස්සෙ එයා ඔළුව ඇල කරගත්ත. එයා මාව කිස් කරන්නවත්ද හදන්නෙ? එහෙමත් නැත්තං වොඩ්කද මේ වැඩ කරන්නෙ?

"ලල්ලල්ලා... ලා... ල... ලා... ලා..." කිසිම ලස්සනක් නැති විදිහට සිංදුවක කෑල්ලක් කියව කියව කවුදෝ වහලෙ උඩට එනව ඇහුණ!

"මොකක්...? ඔයා කිව්ව නේද මෙලෝ බල්ලෙක් එන්නෙ නෑය කියල..." නේහා ඇහුවෙ කලබල වෙලා.

"අනේ මන්ද... මෙච්චර කාලෙකට එහෙම වෙලා නෑ... ෂ්... ෂ්... සද්ද කරන්න එපා. මෙහෙ එන්න..." මං, එයාවත් ඇදගෙන ගිහින් ඩිෂ් ඇන්ටෙනාව පිටිපස්සෙ හැංගුණා.

ඔන්න එතකොට තමා මං දැන ගත්තෙ කවුද ආවෙ කියල! රයන්!! මිනිහට කොහොමටත් සිංදු කියන්න බෑමයි. ඒත් මිනිහ මහා ගායකයෙක් වගේ, ටකරමකට ගල් කැට ගහන ලීලාවෙන් සිංදුව කිය කියා අපි වොඩ්කා බෝතලේ හංගපු තැනට ගියා.

"ඒ රයනා..." මං නේහාට කෙඳිරුවෙ සැනසුම් හුස්මක් හෙළන ගමන්. හැබැයි ඒ එක්කම මට රයන් එක්කත් මළ පැනල හිටියෙ. මිනිහගෙ පැමිණීම හින්ද මට ලැබෙන්න තියෙන ස්වර්ණමය අවස්ථාවක් නැතිවෙලා ගිය හින්දයි ඒ!

"රයන්...!" මං ටිකක් හයියෙන් කිව්ව.

"හරියා..." රයන් ටිකක් හයියෙන් කෑ ගැහුවෙ අපි ඉන්න දිහාට ඇවිදගෙන එන ගමන්.

"ගොන්වහන්සෙ... මම ඔයාව හැම තැනම හෙව්ව... ඔයා මෙතන...! ඔයා එක්ක කවුරු හරි ඉන්නව නේ...?"

"රයන්... මේ තමයි..."

"වාව්... කෙල්ලෙක්..." රයන් ඇස් උඩ තියාගෙන, කට ඇරගෙන හිටියෙ මේ ලෝකෙ ඉන්න එකම ගෑනු පරාණෙ දැක්ක විදිහට. නේහා මට මුවා වෙන්න ගත්ත.

"ඒ නේහා..." මං කිව්ව. "නේහා... මේ රයන්... රයන් මේ නේහා... පිස්සු විකාර නොකර නේහාට හලෝ කිව්වොත් හොඳයි."

රයන්ගෙ ස්වරූපෙ බොහොම විනීත වුණා. මොකක්ද මේ මිනිස්සුන්ට වෙන්නෙ ඇත්තට? ගෑනු පරාණයක් ඉන්න තැනදි තියෙන ස්වරූපෙ එහෙම පිටින්ම වෙනස් වෙනව. මාරයි!

"හලෝ නේහා..." රයන් කිව්වෙ මෙච්චර කාලෙකට හම්බ නුනත් මෙච්චර කාලයක් මගෙන් හැම විස්තරයක්ම දැන ගත්තු කෙනෙක්ව හම්බ වුණාම ඇතිවෙන කුතුහලේ පාගගෙන බව මට තේරුණා.

"හලෝ..." නේහා එහෙම කිව්වෙ, "මෙයාව විශ්වාස කරන්න පුළුවන්ද මන්ද..." වගේ දෙයක් හිත හිත බව මට තේරුණා.

"මං හරිව හෙව්ව, එසයින්මන්ට් එකක් කරන්න කියල..."

"අල්ලල දාන්න... අපිනං ඩ්‍රින්ක් එකක් දාන ගමන්..." මං කිව්ව.

"නැහැ...? ඇත්තට??" රයන් කිව්වෙ හරියට දේවදූතියක් පහළ වෙලා ඉන්න තැනකට යක්ෂය ඇවිල්ල එයාව පාපෙට පොලඹවන්න හැදුව වගෙයි.

"ඒත් මං හිතුවෙ නේහා එහෙම කෙල්ලෙක් නෙවෙයි කියලයි..."





"කොහොම කෙල්ලෙක් නෙවෙයි කියලද...?" නේහා එක පාරට අහපි.

"නෑ... නෑ... මුකුත් නෑ..." රයන් රත් වෙච්චි කොන්ක්‍රීට් එක උඩ වාඩි වෙන ගමන් කිව්ව.

"ඉතින්... මොනවද ඔයා මගෙ ගැන අහල තියෙන්නෙ?" නේහා, රයන්ගෙන් ඇහුව.

"අපෝ... සෑහෙන්න දේවල්..." එහෙම කියල පටන් ගත්ත රයන් නවත්තන්නෙ නැතුව කියවන්න ගත්ත. අපේ පරණ දවස්වල විස්තර, අපි ගැන විස්තර, අපි කරපු වැඩවල විස්තර. මං හිතන්නෙ මිනිහ පැය ගාණක් ඒව කියෝ කියෝ (එෆ්.එම්. භාෂාවෙන් කියන විදිහටනං) 'දෙඩමලු' වුණා. ඒ අතරෙ මට කරන්න තිබ්බෙ බොන එක විතරයි. රයන්ට තියෙන්නෙ කොම්පියුටර් මතකයක්. මිනිහ කියපු සමහර දේවල් මට මෙලෝ මතකයක් තිබ්බෙ නෑ.

"එයා ෆැමිලි ප්ලෑනින් ඩොකියුමෙන්ටරි එක ගැනත් ඔයාට කිව්වද?" නේහා ඇහුවෙ හිනාව ගිලගෙන!

"නැත්තං...? මිනිහ මට ඕන දෙයක් කියනව..." රයන් බොහොම උජාරුවට කිව්ව.

මං හිත හිත හිටියෙ වෙන දෙයක්! ෂිඃ... මේ යක්ෂය මේ වෙලාවට මෙතනට කඩා වැටුණෙ නැත්තං මට නේහව කිස් කරන්න තිබ්බ. සමහරවිට ඊට වඩා වැඩි දේකටත් මඟ පෑදෙන්න තිබ්බ. චෙහ්... මේකා ඒක කාල දැම්මනෙ! මට මිනිහව උඩින් බිමට තල්ලු කරන්න හිතුණත්, එතකොට අපේ මූඩ් අප්සෙට් යන නිසා එහෙම කළේ නෑ!

"ඇයි ඔයා කිව්වෙ මං 'අරහෙම' කෙල්ලෙක් නෙවෙයි කියලා?" නේහා ඇහුව.

"ඔයා දන්නවද වොඩ්කාවල මුළු කතාන්දරේ...? ඔයා හරිනං..." රයන් ඉතුරු ටික ගිල ගත්ත. "නැහ්... කමක් නෑ...!"

"මොනවද...? කියන්න... කියන්න..." නේහා, රයන්ට කිව්වෙ අණ දෙන විලාසෙන්. කොහොමටත් ලස්සන කෙල්ලන්ට උපතින්ම උරුම වෙනව ඒ වගේ අණ දෙන ස්ථිර ගතියක්!

"මං හිතුවෙ ඔයා අර 'හොඳ' ගණේට අයිති වෙන කෙල්ලෙක් කියල. හැබැයි මං ඒ 'හොඳ' කියල කිව්වෙ බහුතරේ හිතන විදිහට... හොඳද...? මං හරි අපි හරි හිතන විදිහට නෙවෙයි... හොඳද...? කොහොමද මට එහෙම හිතුණෙ දන්නවද? දැන් ඔයාල හම්බවෙන්න පටන් අරන් අවුරුද්දකටත් වැඩියි. ඒත් ඔයා තාම මූට කිස් එකක් දීල නෑ... ඒ කියන්නෙ ඔයා හැසිරිලා තියෙන්නෙ වගකිවයුතු ප්‍රොෆෙසර් කෙනෙක්ගෙ හැදිච්ච, හොඳ දුවෙක් හැටියට... නැද්ද හොඳයි?"

"ඈත්... මෙයා ඒකත් ඔයාට කිව්වද?" නේහා ඇස් නළලෙ තියන් ඇහුව.

"නැතුව? ඔයා හිතනවද ඔයා මෙච්චර කාලයක් තිස්සෙ හම්බවෙන්නෙ කිසිම හැඟීමක් දැනීමක් නැති පඹයෙක් කියල...? ඔයා හිතන්නෙ නැද්ද මෙයාටත් එක එක ආසාවල්, උවමනාවල් තියෙනවයි කියල?"

"රයන්...! පිස්සුද? කට වහගන්නවද?" ඒ මං.

"ෂ්... ඔයා කට වහගන්න. අඩු ගානෙ දැන්වත් මිනිහෙක් වගේ හැසිරෙනවකො..." රයන් කිව්ව.

"ආසාවල්?? උවමනාවල්??" නේහා ආයෙ ඇහුව. එයා පුදුම වෙලා වගෙයි හිටිය.

"නැතුව! ඕනෙ මිනිහෙකුට ඒව තියෙනව. ඔයාල වගේ ලස්සන කෙල්ලො එක්කො ඒව ගැන දන්නෙම නෑ... තුති කුක්කු බබාල වගේ... එහෙමත් නැත්තං ඒක දැන දැන නොදන්නව වගේ ඉන්නව පිරිමිය දණෙන් වැටිල හිඟන්නෙක් වගේ ඒව බලාපොරොත්තුවෙන් පස්සෙන් එනකල්! ඔයාලගෙ බලේ පෙන්න පෙන්න..."

"බලේ??" නේහා ආයෙත් ඇහුව.





මට ඕනෙ වුණා රයන්ට මෙහෙම කියන්න. "බූරුවො... මගෙ ආසාවක්, උවමනාවක් තමයි දැන් ටිකකට කලින් ඉෂ්ට වෙන්න ගියෙ... තෝ හෙනහුරා වගේ මෙතෙන්ට පාත් වුණේ නැත්තං මෙලහකටත් ඒක වෙලා!"

"ඔව්... බලේ තමයි... නැත්තං වෙන මොකක්ද?"

ඇති යන්තං. මිනිහ ටිකක් සන්සුන් වෙලා!

"අපේ බලේ...! හිඃ... ඒක තමා මං අහපු හොඳම විහිළු කතාව. අපේ බලයක් නෙවෙයි... ඔයාල ගෑනුන්ව තේරුම් ගන්න දන්නෙ නෑ... ඒකයි..." නේහා කිව්වෙ, රයන් එක්ක වුණත් වාද කරල දිනන්න පුළුවන් තත්ත්වෙකට වොඩ්කා එයාව ගෙනැල්ල තියෙනවයි කියන විශ්වාසෙන්.

"හුත්..." රයන් කිව්ව. ඒකෙන්ම මිනිහ ඔප්පු කළා අපිට ගෑනුන්ව නොතේරෙන බවට.

නේහට ඉක්මනට ගෙදර යන්න ඕනෙ වෙලා තිබ්බ හන්ද, අපි ඒ මාතෘකාවට තිත තිබ්බ. මට රයන්ට බණින්න ඕන වෙලා තිබ්බත්, මිනිහ පරාර්ථකාමී වෙලා එයාටයි, මටයි ජොයින්ට්ස් දෙකක් හැදුව හින්දත්, මට මිනිහගෙ ස්කූටරේ දෙන හින්දත් මං කට වහන් හිටිය. අනික තමයි රයන් කියපු දේවල් නේහා ගත පහකට ගණන් නොගෙන ඉඳීම. එයාට කේන්තියක් එහෙම ගිහින් තිබ්බෙ නෑ. මගෙ ඔළුවෙ තිබ්බෙම නේහාට සිප ගන්න එක ගැනයි. රයන් මට ඒ වැඩේ කරල දෙයි... මට ඒකට උදව් කරයි කියන විශ්වාසෙ මට දිගටම තිබ්බ.

# 11

## තෑග්ග

C-2-D නියම වැඩක් හැටියට මට දැනෙන්න ගත්තෙ ඒකෙ විදිහට වැඩේ පටන් ගත්තමයි. ඒ කිව්වෙ මට කරන්න තියෙන වැඩ ගැන බැලුවමයි. සෙමෙස්ටර් එකකදි එක්කෙනෙකුට බලා ගන්න තිබ්බෙ කෝර්සස් දෙකයි! ඒක මටත් එහෙමමයි! ආලෝකයි, රයනුයි කරපු එසයින්මන්ට්ස් උන් මට දුන්න. මං ඒව එහෙ මෙහෙ කරල සංශෝධන කරල මගෙම එසයින්මන්ට්ස් හදා ගත්ත. නෝට්ස්වල ෆොටෝකොපි ගහ ගත්ත. ඒ වෙනුවට මම කළේ මට නියම වෙච්ච කෝර්සස් දෙක අඩුවක් නැතුව බලා කියාගෙන ඔළුවට ගත්තු එකයි. C-2-D හින්ද අපිට දවසකට පැයකට දෙකකට වඩා පාඩම් කරන්න ඕනෙකමක් වුණේ නැහැ. ඒකෙ තේරුම තමයි අනික් දේවල්වලට, ඒ කිව්වෙ ෆිල්ම්ස් බලන්න යන්න, ස්කූටර් එළවන්න, කඩවල් ගානෙ ගිහින් කඩචෝරු කන්න, චෙස් අදින්න, ස්ක්‍රැබල් සෙල්ලම් කරන්න, ගෘහස්ත ක්‍රිකට් ගහන්න, නිදා ගන්න, ස්ක්වොෂ් ගහන්න (අහ්... රයන් තාමත් අපිව දක්ෂ ස්ක්වොෂ් ක්‍රීඩකයො කරන්න මහන්සි ගන්න බව කියන්න අමතක වුණා!), ඒ වගේම බොන්න, ජොයින්ට් ගහන්න ඕනෙ තරම් වෙලාව ඉතුරු වුණු බව! ඒ සෙමෙස්ටර් එකේදි අපි මහ ලොකු දේවල් බලාපොරොත්තු වුණේ නෑ. අපිට ඕන කළේ අපේ තියෙන තත්ත්වෙ රැක ගන්න විතරයි. ඉතාම අඩු බලාපොරොත්තුවලිනුත් කෙනෙකුට සතුටු වෙන්න පුළුවන්ය කියන එකත් පුදුමාකාර දෙයක්!





එදා මං හිටියෙ ඩිසයින් ක්ලාස් එකක. මට පැවරිලා තිබුණු වගකීමෙ හැටියට, මං බලාකියා ගන්න නියමිත කෝර්ස් එකට අයිති පන්තියක් ඒක. රයනුත් මාත් එක්ක පන්තියට එන්න තීරණේ කළා. මං හිතන්නෙ මිනිහ හිතාගෙන හිටිය එයත් මහ ලොකු ඩිසයින්කාරයෙක්ය කියල! ඒකයි එයා ඒ පන්තියට ආවෙ. ඒ පන්තිය කළේ ප්‍රොෆෙසර් වොහ්රා.

"ළමයි... හරි ලියා ගන්න මේ ගැටලුව... ඊළඟ විනාඩි පහළොවෙදි ඔයාල මේක විසඳන්න ඕනෙ... කාර් එකක ටයර් එකක් ගිය වෙලාවට පාවිච්චි කරන්න පුළුවන් කාර් ජැක් එකක් ඩිසයින් කරන්න. මහ ලොකුවට මීම්මට තුලට මැනල කරල අඳින්න ඕනෙ නෑ... බොහොම සරල දළ සටහනක් හොඳටම ඇති..."

ප්‍රොෆෙසර් වොහ්රා මහත ශරීරයක් එක්කයි ජීවත් වුණේ. එයාට තිබ්බෙ ප්‍රොෆෙසර් කෙනෙකුට ගැළපෙන්නෙ නැති තරමෙ කරුණාවන්ත මූණක්. වයස පනස් ගාණක් විතර ඇති. කොහොමත් එයාගෙ ලක්ෂණ බොහොමයක් ප්‍රොෆෙසර් කෙනෙකුට ගැළපෙන ඒව නෙවෙයි. සෙමෙස්ටර් එකකට, එක්කෙනෙක්ගෙන් ටර්ම් පේපර්ස් හය ගාණෙ බලන එක, ප්‍රොෆෙසර්ස්ලට අයිති 'ඒ මාරක රතු පෑනෙන්' ඒ හැම ටර්ම් පේපර් එකකම දිගට හරහට ඉරි අඳින එක... මේ වගේ දේවල් ප්‍රොෆෙසර් වොහ්රාව විස්තර කරන්න සුදුසු දේවල් නෙවෙයි.

රයන් මේ පන්තියට ආවට, C-2-D වල හැටියට සියලු පන්ති ක්‍රියාකාරකම්, ගැටලු විසඳීම් කරන්න නියම වෙලා තිබ්බෙ මට. ඒ නිසා ප්‍රොෆෙසර් වොහ්රා නියම කරපු ජැක් එක ඩිසයින් කරන්න ඕනෙත් මං. රයන් කරන්නෙ ඒක කොපි කර ගන්න එක විතරයි. ඒ වගේ ජැක් එකක් ඩිසයින් කරන්න ඕනෙ කරන කාරණා, න්‍යායවල් ඔක්කොම ප්‍රොෆෙසර් වොහ්රා පන්තියට ඕනවටත් වැඩියෙන් උගන්නලයි තිබ්බෙ. මං ඒව හිතාගෙන ජැක් එක ඩිසයින් කරන්න මුල් ඉරි කෑලි දෙක තුන ගහන කොටමයි රයන් කතා කළේ.

"අයියයියෝ... ඔයත් අනික් හැමෝම කරන ඩිසයින් එකමද ගහන්න යන්නෙ?"

"නැතුව... මං ඉතින් තෝමස් අල්වා එඩිසන් නෙවෙයිනෙ වෙනම එකක් හදන්න...!" මං කිව්ව. "අනික මේක මගෙ පන්තිය. ඒ හින්ද කටවහන් ඉන්නවද?"

"මට තියෙනව වෙන අයිඩියා එකක්..." රයන් කිව්ව.

මට ආයෙත් රයන්ට කියන්න හිතුණ, එයාගෙ මාර අයිඩියා එක තියාගෙන, කටවහන් මගෙ ඩිසයින් එක කොපි කරගන්න කියල. ඒත් මං එහෙම කිව්වෙ නෑ. අනික එහෙම කිව්වත් ඇති වැඩක් නෑ... මොකද රයන් කියන්නෙ, අනික් අය කියන දේවල් අහන සතෙක් නෙවෙයි.

ඒ හින්ද රයන් වෙනම මිනිහගෙ 'මාර අයිඩියා' එක ඩිසයින් කරන්න ගත්ත. ඒකෙ හැටියට ඒ ජැක් එක වෙනම අරගෙන අපිට ක්‍රියා කරවන්න තියන එකක් නෙවෙයි.

"කාර් එකක ටයර් එකක් යනව කියන්නෙ, එන්ජිම වැඩ කරන්නෙ නෑ කියන එක නෙවෙයිනෙ..." රයන් කියන්න ගත්ත. ඒ හින්ද මෝටරේට තියෙන ජැක් එක සම්බන්ධ කරල ඒක කාර් එකේ බැටරියට සම්බන්ධ කරල හදන මොකක්දෝ අටම්පහුරක් ගැන මිනිහ දිගටම කියවන්න ගත්ත. ඒ කියන විදිහට එහෙම සම්බන්ධ කරල කාර් එක ස්ටාට් කළහම ජැක් එක ඉබේ වැඩ කරනව! මිනිහ ඊට පස්සෙ ඒක අඳින්නත් පටන් ගත්ත.

"මොකක්ද ඔය අඳින්නෙ...?" මං රයන්ගෙන් ඇහුවෙ, මිනිහ අඳින දේ මෙච්චර කාලයක් අපිට උගන්නපුවට වඩා හාත්පසින්ම වෙනස් දෙයක් හින්ද.

"බලාගෙන ඉන්නකො... මේකට ප්‍රොෆෙසර් කැමති වෙනව ෂුවර්..."

"රයන්ට, රයන්ගෙ 'සිහින නිපැයුම' කර ගන්න ඉඩ දීල, මම අපිට කියල දීපු විදිහට, අනික් හැමෝම අඳින විදිහට සාමාන්‍ය ජැක් එකක් ඩිසයින් කරන්න ගත්ත. ප්‍රොෆෙසර් වොහ්රා





පන්තියෙ පේළි අතරින් ඇවිදින්න ගත්තෙ එක එක්කෙනා අඳින රූප සටහන් දිහා බල බල. අවුරුද්දක් ගානෙ අවුරුදු ගාණක් ප්‍රොෆෙසර් වොහ්රා එහෙම ඇවිදින්න ඇති. ශිෂ්‍යයො ලක්ෂ ගාණක් අඳින එකම ඩිසයින් එක එයා ලක්ෂ වාරයක් දැකල ඇති. ඉතින් තවත් වතාවක් ඒ දර්ශනේම දැක දැක ප්‍රොෆෙසර් වොහ්රා ආව ගමන අපේ ඩෙස්ක් එක ළඟින් නැවතුණා.

"මේ මොකක්ද?" ප්‍රොෆෙසර් වොහ්රා එක එක පැත්තට ඔළුව ඇද කර කර, රයන් අඳින අමුතුම විදිහෙ රූප සටහන දිහා බැලුව. මං හිතන්නෙ එයා මේ විදිහට ඩෙස්ක් අස්සෙන් අවුරුදු ගාණක් තිස්සෙ ඇවිදපු ගමනෙදි, මේ වගේ රූපයක්නං දැකලම නැතුව ඇති.

"සර්... මේක මොඩිෆයි කරපු කාර් ජැක් එකක්..." රයන් කිව්ව. "මේක කාර් එකේ බැටරියට කනෙක්ට් කරල..."

"මේක ඉලෙක්ට්‍රිකල් ඉංජිනියරින් ක්ලාස් එකක්ද?"

"නෑ සර්. ඒත් අන්තිමට ලැබෙන්නෙ එකම ප්‍රතිඵලේනං..."

"මේක අභ්‍යන්තර දහන එන්ජින් ගැන කරන ක්ලාස් එකක්ද?"

"නෑ සර්... ඒ වුණත්..."

"ඔයාට මගෙ ක්ලාස් එකේ විදිහට වැඩ කරන්න ඕනෙ නැත්තං, මේ කෝර්ස් එක තියෙන විදිහට කරන්න ඕනෙ නැත්තං ඔයාට එළියට යන්න ඕන වෙලාවක අවසරේ තියෙනව..."

ප්‍රොෆෙසර් වොහ්රාගෙ මූණෙ තිබ්බ කරුණාවන්තකම වාෂ්ප වෙන්න ගත්ත. රයන් කට වහගෙන හිටියනං ප්‍රොෆෙසර් එතනින් යන්න තිබ්බ. ඒත් රයන් කියන්නෙ එහෙම කට වහගෙන ඉන්න සතෙක් නෙවෙයි.

"සර්... මේක අලුත් ඩිසයින් එකක්... අලුත් අදහසක්..." රයන් නැඟිට්ට.

"ඇත්තට...? ඉතින් කවුද ඔයාට කිව්වෙ එහෙම කරන්න?"

රයන් ඒකට උත්තර දුන්නෙ නෑ. ඒ වෙනුවට එයා රූප සටහන ඇඳපු කොළේ දකුණු අතින් ඉහළට ඉස්සුව. ඊට පස්සෙ වම් අතින් ඒක දෙකට ඉරුව. "චරස්..."

"හරි සර්... දැන් ඒක ඉවරයි...!"

ප්‍රොෆෙසර් වොහ්රාගෙ මූණ රතු වෙන එක වළක්කගන්න බැරි තත්ත්වෙට ආව.

"මගෙ පන්තියෙදි ඕනවට වඩා ඉදිමෙන්න යන්න එපා."

"සොරි සර්..." මං එහෙම කියන්න ඕනෙ නැති වුණත්, මම එහෙම කිව්ව!

එතන ඇති වෙන්න ගිය පීඩනේ ඒකෙන් අඩු වුණා. නිල ලත් මහාචාර්යතුමයි, නිල නොලත් මහාචාර්යතුමයි දෙන්නම එයාලගෙ නුවණක්කාර ඇස් කොන්වලින් මා දිහා බලන බව මට තේරුණා. ප්‍රොෆෙසර් වොහ්රා සුසුමක් හෙළල එතැනින් යන්න ගියා. රයන් වාඩි වුණා.

"ඒකනං එච්චර හොඳ වැඩක් නෙවෙයි... දන්නවනෙ ප්‍රොෆෙසර්ලට පුළුවන් අපිව අන්නවන්න..." පන්තිය ඉවර වෙලා මං රයන්ට කිව්ව.

"ඉතින් මට මොකෝ...? මට මේක ඇති වෙලා ඉන්නෙ. කොයි වෙලාවෙ මෙතනින් චුත වෙන්නද කියල මං බල බලා ඉන්නෙ..." එහෙම කියන ගමන් රයන් එයාගෙ ස්කූටර් ස්ටෑන්ඩ් එකට හයියෙන් පයින් ගැහුවෙ, ඒක ප්‍රොෆෙසර් වොහ්රාගෙ මූණ කියල හිතාගෙන වෙන්න ඕනෙ.

ඒක කොහොමටත් රයන්ගෙ කෝර්ස් එක නෙවෙයි. රයන් ඊට පස්සෙ ඩිසයින් ක්ලාස්වලට ආවෙ නෑ. මිනිහ මගෙ එසයින්මන්ට්ස් ගෙඩිය පිටින්ම කොපි කරල දැම්මෙ අහල තියෙන ප්‍රශ්න දිහාවත් නොබලා. මිනිහ නැට්ටට කලකිරිල!! ආන්න ඉන්දියාවට මහා ඩිසයිනර් කෙනෙක් අහිමි වෙච්චි මොහොත!





දවසක් අපි තුන්දෙනා අපේ අධ්‍යයන කාමරේට වෙලා බොහොම උනන්දුවෙන් කොපි කර කර හිටියෙ ආලෝක්ගෙ එසයින්මන්ට් එකක්.

"ඒ කියන්නෙ දැන් ප්‍රොෆෙසර් වොහ්රට ඔයාව අල්ලන්නෙ නෑ...?" ආලෝක් ඇහුව. රයන් මුකුත්ම නොකියා නිශ්ශබ්දව හිටිය.

"නැතුව...?" මාත් කතාවට ඈඳුණා. "ඔයා දකින්නයි තිබ්බෙ ඒ වෙලාවෙ ප්‍රොෆාගෙ මූණ!"

ආලෝක් හිනාවෙන්න ගත්ත.

"මිනිහ මාව අන්නවයි... එච්චරනෙ..." රයන් කිව්ව.

"ඒක නෙවෙයි වැඩේ..." ආලෝක් කියන්න පටන් ගත්ත.

"ඔයාට තේරෙන්නෙ නෑ... ඒක නිසා ඕක අල්ලල දාන්න... අනික ප්‍රොෆෙසර් වීරා මට කතා කළා... මගෙ ලූබ්‍රිකන්ට් එසයින්මන්ට් එක ගැන..."

"නැහ්... ඇත්තට??" මටයි, ආලෝක්ටයි එක පාරටම එකම වචන ටික පිට වුණා. අපි අප්සෙට් ගියේ වෙන මුකුත් හින්ද නෙවෙයි. අපි දෙන්න රයන්ගෙන් ඒ එසයින්මන්ට් එක කොපි කරපු එක ප්‍රොෆෙසර් වීරට අහු වුණාදවත් කියලයි!

"හරි... හරි... බය වෙන්න දෙයක් නෑ. මං ප්‍රොෆෙසර් වීරට දුන්නෙ ක්ලාස් එකේදි කරන්න දීපු එසයින්මන්ට් එකක් නෙවෙයි. වෙන ම හදපු ස්පෙෂල් එකක්..."

"ඈහ්... ඔයාට වෙනම එසයින්මන්ට් කරන්න වෙලාව තියේද?" මං ඇහුව.

"මං ආස කරන දේවල් කරන්න මට වෙලා තියෙනව... මං හිතුව පොඩි පොඩි එක්ස්පරිමන්ට්ස් ටිකක් කරන්න ස්කූටර් එකට. එක එක මික්ස්චර්ස් දාල ස්කූටර් එන්ජින් එකේ ලූබ්‍රිකන්ට් එෆිෂන්සි එක බලනව..."

"හරියට හරි... අනේ ඇත්තට ඔයා ඔයාගෙ ස්කූටර් එක කා ගන්නයි යන්නෙ. ඕව කරල ඔයා මොකේද යන්න එන්නෙ?"

"විද්‍යාවෙ නාමයෙන් මට මගේ ස්කූටරේ පූජ කරන එක සුළු දෙයක්..." රයන් කිව්වෙ මහා විද්‍යාඥයෙක් වගේ බැරෑරුම් විදිහට. "මාත් මොකක් හරි මේ ලෝකෙට ආයාද කරන්න ඕනෙ... මං එක එක ඔයිල් ජාති මික්ස් කරලයි තියෙන්නෙ... සාමාන්‍ය ලුබ්‍රිකන්ට් තෙල් වියදම සියයට දහයකින් විතර අඩු කරගන්න පුළුවන් ඒකෙන්..."

මහා විද්‍යාඥ රයන් ගැන මගේ හිතේ ඇති වුණේ ගෞරවයක්. කරදර, කම්කටුලු මැදින් විද්‍යාවේ නාමයෙන් තමන්ගෙ ස්කූටරේ පූජ කරන්න යන මහා විද්‍යාඥ රයන්...! කොච්චර හොඳ මානව හිතවාදියෙක්ද? ලිහිසි තෙල්වල වියදම සියයට දහයකින් අඩු කරගන්න උත්සාහ දරන ජන මිතුරා! ඒ විදිහට ඉතුරු කරගන්න සියයට දහයෙන් අපිට තව වැඩිපුර පරෝටා කීයක් කැවැකිද කියල මං ගණන් හදන්න ගත්ත.

"ඉතින් ප්‍රොෆෙසර් වීරා මොකද කිව්වෙ?" ආලෝක් ඇහුව.

"එයා කිව්ව මගෙ පරීක්ෂණේ කරන්න කැම්පස් ලැබ් එකෙන් අවසර අරන් දෙන්නං කියල... එතකොට මට පුළුවන් ලැබ් එක පාවිච්චි කරන්න... තව කිව්ව මගෙ පරීක්ෂණේට ඕන උදව්වක් කරන්නං කියල..."

"ෂෑ... එළනෙ... ඔයානං ස්ටාර් කෙනෙක්..." ආලෝක් කිව්ව.

"ඕන එකක්..." රයන් උරිස් ඇකිළුව. "ඒක හිතන තරම් ලේසි නෑ. ඉස්සෙල්ලම ප්‍රොෆෙසර් වෙරියන්ට සම්පූර්ණ විස්තර එක්ක ප්‍රපෝසල් ජේපර් එකක් දෙන්න ඕනෙ. යන වියහියදම්, ලබන්න පුළුවන් ප්‍රතිලාභ, යන වෙලාව... ඔය ඔක්කොම ගැන කියල ඊට පස්සෙ ඒක කොමිටියකට දානවලු. එයාල තමා තීරණේ කරන්නෙ. ඔය ටික සිද්ධ වෙන්න මාස ගාණක් යාවි."





"හරි, එහෙම කරල හරි වැඩේ හරි ගියොත්..." ආලෝක් වේගෙන් ඇහිපිය ගැහුව. "කියල වැඩක් නෑ..."

"ළඟ සුමාන දෙක තුනේදි මං මහන්සි වෙලා ප්‍රපෝසල් ජේපර් එක හදන්නයි හිතාගෙන ඉන්නෙ. බය වෙන්න එපා... මගෙ කෝර්සස් අතපසු කරන්නෙ නෑ මං. හැබැයි පාටි ඇමිල්ලයි, ෆිල්ම්ස් බැලිල්ලයිනං අඩු කරන්න වෙයි..."

"මේක යකාගෙ කතාවක්නෙ..." මට හිතුණ. බැරිවෙලා මං හරි, ආලෝක් හරි ඔය වගේ කතාවක් කිව්වනං රයන් අපිට මොනව නොකියයිද? ඒත් ඉතින් මේ රයන්! අපි මිනිහට මොකුත් කියන්නෙ නෑ. අනිත් එක, මිනිහ මේ පාර කරන්න යන්නෙ තේරුමක් තියෙන වැඩක්නෙ.

"හරි... හරි... ඔයා ඒක හිතට ගන්න එපා. අපි කියන්නංකො ඔයාට මග ඇරුණු දේවල්..." මං ආලෝක්ට ඇහැක් ගහල කිව්ව.

"එයත් එහෙනං පොත් ගුල්ලෙක් වුණා... ඈ...?"ආලෝක් ඇහුව.

"මං...? මං එහෙම නෑ... ඔයා තමයි අර වෙන්කටා එක්ක හිටිය කාලෙදි පොත් ගුල්ලෙක්, පොතේ ගුරෙක් වෙලා හිටියෙ..." රයන් ආපස්සට කිව්ව.

★

ඉස්සෙල්ලම කියන්න ඕන දේ තමයි ආයෙ ආලෝකයගෙ ගෙවල් පැත්තෙ යන්න මගේ තුන් හිතකවත් අදහසක් තිබ්බෙ නැති බව. ඒ ගේ ඇතුළෙන් එන බේත් ගඳයි, බැදුම්වල තෙල් ගඳයි, කැඩිච්ච කොන්ක්‍රීටුයි, ඒ ඔක්කොටමත් වැඩිය ඕන වෙලාවක විලාප දෙන්න ලෑස්ති වෙලා ඉන්න ආලෝක්ගෙ අම්මයි මට දිරවන්නෙම නැති දේවල්. ඒත් මට සෙනසුරාදා

දවසක එහෙ යන්න වුණේ මහා විද්‍යාඥ රයන්, මිනිහගෙ ලිහිසි තෙල් පරීක්ෂණේට හිර වෙලා 'බාධා නොකරනු' කියන සංඥාව නිකුත් කරල තිබ්බ හින්දයි. රයන් මහන්සි වෙන හැටි බලාගෙන ඉන්නත් දුකයි වගේ. සුමානෙ දවස් තුනක් මිනිහ රෑ තිස්සෙ ලයිබ්‍රරි එකෙයි, කොම්පියුටර් සෙන්ටර් එකෙයි නිදිමරනව මං බලාගෙන. ඒ මදිවට එක එක ඔයිල් වර්ග කලවම් කර කර මිනිහගෙ ස්කූටරේට ඒව අල ලැබ් එකට වෙලා ඒක ටෙස්ට් කළා. අනේ අපේ දඩු මොනරෙ! මං මිනිහ ළඟට ගිහිල්ල කිව්ව ප්‍රියා සිනමා එකට ඇවිල්ල තියෙන අලුත් ෆිල්ම් එකක් ගැන. ඒකෙ ලස්සන කෙල්ලන්ගෙ ටොප්ලස් සීන්ස් හයක් තියෙනව කියලත් කිව්ව. වෙනදට නම් ඒ වගේ දෙයක් ඇහුවහම මිනිහගෙ ඇස් තොරණක බල්බ් වගේ නිවෙන්න පත්තු වෙන්න ගන්නව. ඒත් එවෙලෙ මිනිහ මා දිහා බැලුවෙ හිස් බැල්මකින්. මෙලෝ රහක් නැතුව වගේ! මාත් ඇරියෙ නෑ. මං මිනිහ ඉස්සරහ කියවන්න ගත්ත අලුත් කොක්ටේල් රෙසිපි වගයක්. මිනිහ ඒක නෑහුණු ගානට කෝපි කෝප්ප ගාණකට සැරින් සැරේ වග කිව්වෙ 'පර්යේෂණේ' යෙදිල ඉන්න ගමන්මයි. එක එක අංශ යටතේ හදල තිබ්බ ප්‍රපෝසල් පේපර් එක, වැඩිය ළං වුණේ තඩි පොතකට! ඒ තරම් කොළ ගොඩක් මිනිහගෙ ප්‍රපෝසල් 'පේපර්' එකේ තිබ්බ. රයන් ප්‍රපෝසල් පේපර් එක ප්‍රොෆෙසර් වීරට භාර දුන්නා.

ඉතින් ආලෝක් මට එයාලගෙ ගෙදර යං කිව්වට මං ඒක පිළි ගත්තෙ එකම හේතුවක් හින්ද. මොකක්ද කිව්වොත්, ආලෝක්ගෙ කටින් පිටවුණ මේ වචන ටික හින්ද.

"අපි අම්මලවත් බලාගෙන, දවාලට කෑම ටිකකුත් කාලා එමු..."

මගෙ ඔළුවෙ තැන්පත් වුණේ ඒ වාක්‍යයෙ දෙවෙනි කොටස විතරයි. ඒ වෙද්දි මං ස්කූටර් පදින්න ඉගෙනගෙන තිබ්බ හින්දත්, ඒ ගමනට රයන් ස්කූටරේ පරිත්‍යාග කරපු හින්දත් (හැබැයි මිනිහ ඒක පරිත්‍යාග කළේ යන්නයි එන්නයි යන කිලෝමීටර් ගාණ කීයද කියල ගණන් තියා ගන්න කියලයි.), ආලෝක් දවල්ට කන්න දෙන හින්දත් මං ඒ ගමන යන්න කැමති වුණා.





දිල්ලියෙ පාරවල්වල වාහන එළවනව කියන්නෙ බිහිසුණු අත්දැකීමක්. රයන්කාරයා ඔච්චර හයියෙන් කොහොම ස්කූටරේ එළවනවද මන්ද? අපි ගියේ පනහටත් අඩුවෙන්. මං පාර පුරා ඉන්න හරකුන්වයි, පොලිස්කාරයින්වයි බේර බේර ස්කූටරේ පදිද්දි ආලෝක් කළේ මොන මොනවදෝ දිගින් දිගටම කියවපු එකයි.

"ඔයා මොකද හිතන්නෙ? රයන්ගෙ ප්‍රොජෙක්ට් එක පිළිගනියිද?" ආලෝක් ඒ අහපු එකනං මට තේරුණා.

"මං හිතන්නෙ ඔව්... මිනිහගෙ ප්‍රපෝසල් පේපර් එකම පිටු අසූවක්නෙ... එතනම ප්‍රොජෙක්ට් එකක්... හැබැයි මිනිහගෙ වැඩේ නම් එළ!"

"ඔව්... හැබැයි ප්‍රොපෝසල් පේපර් එකට කවරයක් දාන්න ඕනෙ නේද?" ආලෝක් ඇහුව. මිනිහගෙ අණ්ඩර දෙමළෙ මට තේරුණේ නෑ.

"ඔව් ඉතින්...?"

"ඒකෙ ප්‍රපෝසල් පේපර් එක දෙන ස්ටුඩන්ට්ගෙ නමයි, ග්‍රේඩ් එකයි ලකුණු ගාණයි ලියන්න ඕනෙ. ඉතින් පහයි පොයින්ට් ගාණ හම්බ වෙච්ච කෙනෙකුගෙ පරීක්ෂණේකට මෙයාල ආධාර කරයිද?"

"මොකෝ නැත්තෙ? එයාල ඒක කියවල තීරණේ කරාවි..."

"එයාල ප්‍රොෆෙසර්ස්ල බව දන්නවනෙ..." ආලෝක් කිව්ව. "ඔයා දන්නවනෙ ප්‍රොෆෙසර්ස්ල හිතන විදිහ..."

"ඒ වුණාට ප්‍රෙෆෙසර් වීරා රයන්ට සපෝට්..."

"ඔව්... අපි බලමු මොකද වෙන්නෙ කියල..."

පැයක් විතර ගියාට පස්සෙ අපි ආලෝක්ගෙ ගෙදරට ආව. ගෙට ඇතුළු වුණු ගමන්ම මං කළේ කිම්දෙන්න යනකොට වගේ පෙණහලු දෙකම පුරෝලා හොඳ හුස්මක් ගත්ත එකයි. එතකොට මට පුළුවන් ටිකක් වෙලා යනකල් හරි බේත් ගඳ දැනෙන්නෙ

නැතුව ඉන්න! ඒත් ඉතින් දිගටම එහෙම ඉන්නයි කියලයැ? හොඳ වෙලාවට වැඩි වෙලාවක් යන්න කලින් ආලෝක්ගෙ අම්ම කෑම ලෑස්ති කළා.

"ආලෝක්... ඕං මං ඔයාටයි යාළුවටයි පනීර් හැදුව." ආලෝක්ගෙ අම්මා කිව්ව.

දුප්පත් පවුල් එක්ක බැලුවම ආලෝක්ල හොඳ තැනක ඉන්නව. මං එහෙම කිව්වෙ කෑම මේසෙ දිහා බලල. බත්, රොටි, පරිප්පු, ගෝබි-අල, අඹ චට්නි, රයිටා... එතකොට මටාර් පනීර්... ඔය ඔක්කොම ඒකෙ තිබ්බ. එයාලගෙ පවුලෙ තරබාරුකම ගැන හෝඩුවාවක් මට ඒකෙන් හම්බවුණා.

"කන්න දරුවො... තව බෙදාගෙන කන්න..." ආලෝක්ගෙ අම්ම ඉබ්බව දියේ දැම්ම.

කෑම නම් නියමටම රසයි. ඒත් ඇති වෙච්චි කතාබහනං නීරසයි. ආලෝක්ගෙ අම්මා පහුගිය සුමානෙ ජීවිතේ ගෙවපු හැටි ගැන මැසිවිලි කියන්න ගත්ත. ලෝකෙ තියෙන හැම ප්‍රශ්නයක්ම එයාට ඇති වෙලා තියෙනවයි කියලයි ඒක අහන කෙනෙකුට හිතන්නෙ. පුදුමාකාර වැඩේ කියන්නෙ ඒ හැම ප්‍රශ්නයක්ම විසඳන්න තිබ්බෙ එකම ක්‍රමයයි. ඒ හැම ප්‍රශ්නෙකටම තිබ්බෙ එකම විසඳුමයි. ඒ තමයි 'සල්ලි...!' වැඩි වැඩියෙන් සල්ලි!! මෙන්න මෙහෙමයි එයාගෙ ප්‍රශ්න ටික!

| | |
|---|---|
| සඳුදා ප්‍රශ්නෙ: | ඇනටමත් පස් පාරක් රෙපයාර් කරල තියෙන ගීසර් එක කැඩිල... අලුත් එකක් ගන්න සල්ලි නෑ. |
| අඟහරුවාදා ප්‍රශ්නෙ: | කඩෙන් සීනි ගන්න ගියාම ගාණ ඩබල් වෙලා. |
| බදාදා ප්‍රශ්නෙ: | ටීවී ඇන්ටෙනා එක කැඩිල... අලුත් එකක් ගන්න සල්ලි නෑ. එතකල් ටීවී බලන්න වෙන්නෙ ඉරි... ඉරි... තිත්... තිත්... එක්ක. |





| | |
|---|---|
| බෲහස්පතින්ද ප්‍රශ්නෙ: | හරියට මතක නෑ. ඒත් මොකක් හරිම තිබ්බ. |
| සිකුරාදා ප්‍රශ්නෙ: | තාත්තව ඇඳෙන් වැටිල. දොස්තර ගෙදරට ගෙන්න්නන වෙලා. එතන ඒ වැඩේට අමතර රුපියල් සීයක් ගිහින්. |

"අයියෝ... අම්මෙ... ඔය මැසිවිල්ල නවත්ත ගන්නකො..." ආලෝක් කිව්ව. ආලෝක්ගෙ අම්මට අලුත්ම ඩයරියක් අරගෙන දෙන්න ඕනෙ කියල මට හිතුණා. එතකොට එයාට දවස ගානෙ එයාගෙ ප්‍රශ්න ඒකෙ ලියතහැකි. අවුරුද්ද අන්තිමේ, 'ගැටලු සමඟ දින 365ක්' වගේ නමක් අල ඒක පබ්ලිෂ් කරන්න බැරි වෙන එකකුත් නෑ.!

"නෑ... නෑ... කමක් නෑ..." මං තව පරිප්පු බෙදා ගන්න ගමන් කිව්ව. ඇත්තටම ආලොක්ගෙ අම්මගෙ ගෙදර ජීවිතේ මට ලොකු කුතුහලයක් ඇති කළා. පහුගිය අවුරුද්ද තිස්සෙම මට 'ආලෝක්ගෙ අම්ම' කිව්වම හිතේ මැවුණ රූපෙ තමයි, සාරි පොටෙන් එයා කඳුළු පිහින හැටි. එත් ඒකට පිටින් එයාට තවත් ජීවිතයක් තියෙන බව ඒ ප්‍රශ්නවලින් මට තේරුණා. එයා මූණ දෙන අභියෝග, ලිහිසි තෙල් වියදම සීයට දහයකින් අඩු කරගන්නෙ කොහොමද කියන එක නෙවෙයි... සීනි, අල... ඒ වගේ දේවල් ගණන් යද්දි ඒව කන්නෙ කොහොමද කියන එකයි.

ඊළඟට එයා තව ප්‍රශ්නයක් කියන්න ගත්ත. බාගදා ඒක සෙනසුරාදා ප්‍රශ්නෙ වෙන්න පුළුවන්.

"බලන්න අපේ සැටි සෙට් එකේ හැටි... අර ලොකු සැටියෙ ස්ප්‍රින් එහෙමත් එළියට ඇවිත්..." ආලෝක් ඒ කතාව වැඩිදුර ගෙනියන්න දුන්නෙ නෑ.

"අයියෝ අම්මෙ... නවත්ත ගන්නකො ඔය බර බරේ... මං මාසෙකට පස්සෙ ගෙදර ආවෙ... ආව වෙලේ ඉඳන් නාහෙන්ම අඬනව..."

ඒකට ආලෝක්ගෙ අම්මට යකා නැග්ග වගෙයි පෙනුණෙ. "නැත්තං ඉතින් මං වෙන කාටද කියන්නෙ මේව? තාත්තට කියන්නද? අක්කට කියන්නද? ඔයා තමයි මට මේව කියන්න ඉන්නෙ..."

"ඇති... ඇති... නවත්තගන්න..." ආලෝක් කිව්ව. මිනිහගෙ මූණ සුදුම සුදු බබෙක්ගෙ අතුල්ලල අතුල්ලල හෝදපු පස්ස පැත්තක් වගේ රතු වුණා.

"හරි... හරි... මං කටවහන් ඉන්නංකො..." ආලෝක් කිව්ව එක අහල එයා කට වහගත්තත්, එයා තමන්ටම මුමුණ ගන්න දේවල් ඇන්ටෙනා එකට අහු කරගන්න අමාරුවක් වුණේ නෑ. එයා මුමුනන්න ගත්තෙ කන ගමන්.

"එයාල නිසාම හම්බ කරල, මැරිල මැරිල හරකියක් වගේ වැඩ කරන මං කියන දේවල් අහන්නවත් ඕනකමක් එයාලට නෑ... ඕක තමයි අපේ ඉස්කෝලෙ ෆිසික්ස් උගන්නන වර්මා ටීචර් කිව්වෙත්... දරුවො නෙමෙයි ඔවුන් මරුවො... ඒ කතාව හරියට හරි..."

"ස්ලෑ...න්...ග්... ටක... ටොකස්" ආලෝකය ගැහුව පිඟාන පොළොවෙ! රොටි කෑලි, පරිප්පු, චට්නි, මටාර් පනීර් මෝස්තරයක් වගේ පොළොව උඩ විසිරුණා.! ආලෝකය නැගිටල යන්න ගියා, එතනින් එළියට.

දැන් මං මොකද කරන්න ඕනෙ? මාව මෙහෙට කැඳවගෙන ආව මගෙ යාළුවගෙ පස්සෙන් යනවද? එහෙම නැත්තං වාඩි වෙලා ආලෝක්ගෙ අම්ම අඬන දිහා බලන් ඉන්නවද? එහෙමත් නැත්තං ඒ දෙන්නටම කුද ගහගන්න කියල තව පරිප්පු ටිකක් බෙදාගෙන රොටියකට වග කියනවද? මටාර් පනීරුත් නරකම නෑ. කෑම බොහොම රසයි. අනික මං මෙහෙ ආවෙත් ඒ හින්දමනෙ...! මං තීරණේ කළා තුන්වෙනි විකල්පෙ අනුගමනය කරන්න. මං තව මටාර් පනීර් ටිකක් බෙදා ගත්ත.





ඒ ගමන සතුටුදායක නැති බව අමුතුවෙන් කියන්න ඕනෙ නැනෙ. ටික වෙලාවකට පස්සෙනං ආලෝකය ටිකක් සන්සුන් වෙලා ඉන්න බව පෙනුණ. ආලෝක් ඇවිත් සාලෙන් වාඩි වුණා. ඕන වෙලාවක කඳුළු වගුරවන්න සැදී පැහැදී ඉන්න ආලෝක්ගෙ අම්මට, ඒ වැඩේට සුදුසු පසුබිමක් හැදිල තිබුණ. එයා ඒක අපතේ යවන්න තරම් මෝඩ වුණේ නෑ. එයා අඬ අඬාම අපිට 'කීර්' ගේන්න ගියා.

"ආලෝක්... මොනවද මිනිහො කරන්නෙ?"

"ඔයා පැත්තකට වෙලා ඉන්නවද...? ඔයාට මේව තේරෙන්නෑ..."

හහ්... පෙනේද? මිනිහම මෙතනට මාව අරගෙන ඇවිත්, දැන් කියනව මට පැත්තකට වෙලා ඉන්නලු.

"බලනව... එයා 'කීර්' හිටන් හදල... මොනාටද ඔයාට ඔච්චර තද වෙන්නෙ?"

"ඒව ඔයාට තේරෙන්නෙ නෑ... කට වහගෙන ඉන්නව කීර් ගේනකං..."

අපි කීර් ගේනකන් හිටිය. ඒකත් නියමටම රසයි. ආලෝක්ලා කෑම බීම ගැන ටිකක් සැලකිලිමත් වෙනවනං, ඒ කිව්වෙ කෑමට ඔච්චර වියදම් නොකරනවනං එයාලගෙ ප්‍රශ්නවලින් භාගයක් විසඳගන්න පුළුවන් වෙයි කියල මට හිතුණ. ඒත් හොඳට කන එක එයාලගෙ ප්‍රධානම පරමාර්ථයක් බවයි මට තේරුණේ. ටීවී එක හරියට නොපෙනුණත්, ගීසර් කැඩුණත්, සැටියෙ ස්ප්‍රින් එළියට ආවත් ඒ ඔක්කොටම වඩා කෑම වැදගත් කියන කාරණාව ආලෝක්ගෙ ගෙදර අයගෙ තේමා පාඨය වෙලා තියෙන බව මට තේරුණා. ඒ හින්ද එයාලට ඕන දෙයක් කර ගන්න ඇරල මං සද්ද නැතුව හිටිය ආපහු එනකල්ම.

"මං දන්නව ඔයා මොනවද හිතන්නෙ කියල..." එමින් ගමනෙදි ආලෝක් කිව්ව.

"මොකක්ද?"

"ඔයා හිතන්නෙ මං මහ හිතක් පපුවක් නැති එකෙක් කියලනෙ?"

ආලෝකයගෙ හදවත ගැන මං හිතපු එකම දේ තමයි, ඒ ගෙදර කන විදිහට කැවොත් වැඩිකල් යන්න කලින් ආලෝකයගෙ මහා ධමනියක හරි ශිරාවක හරි කොලෙස්ටරෝල් තලියක් බැඳිල හදවතට කෙළවෙන වග!

"එහෙම එකක් නෑ... ඒත් ඔයා එහෙම හැසිරෙනව මං මීට කලින් දැකල නෑ..." මං කිව්වෙ මුනිර්කා හන්දිය පහු කරද්දි. රටකජු කරත්තකාරයෙක් ස්කූටර් එකේ ගෑවී නොගෑවී මාරු වුණා එතනදි.

"එයාලට මා එක්ක කතා කරන්න තියෙන්නෙ එච්චරයි... ප්‍රශ්න... ප්‍රශ්න... ප්‍රශ්න..." ආලෝකයට යකා නැඟල. "ඒව කිව්වයි කියල මට කරන්න පුළුවන් ඇටිකෙහෙලක් තියෙනවයැ?"

"හ්ම්ම්... ඒකත් හරි තමා..." මං කිව්වෙ ආලෝකයත් මට විසඳන්න බැරි ප්‍රශ්නයක් ඉදිරිපත් කරනව නේද කියල හිතන ගමන්.

★

මං කලින් කියල තියෙනව වගේ වයිවා - ඒ කියන්නෙ වාචික පරීක්ෂණ තමයි මගෙ ශිෂ්‍ය ජීවිතේ භයංකාරම නිමේෂයන්! මං ඒවයින් කට්ටි පනින්න උත්සාහ කළේ හරියට මෙලෝ සිහියක් නැතුව පාරෙ හැම තැනම යන, හිතුණ ගමන් පාර පනින මිනිස්සු, හරක්, බල්ලෝ බේර බේර එළවන ත්‍රීවීල්කාරයෙක් වගේ. ඒත් ඉතින් දිල්ලියෙදි ඒ වගේ පාරෙ හැම තැනම යන, හිතුණු ගමන් හිතුණු හිතුණු තැන්වලින් පාර පනින එවුන් එලෝ කෝටියට! අනිවා, එකෙක්ව හැප්පෙනවමතමා! ඒ වගේ මගේ ඩිසයින් කෝස් එකේ වයිවා එක, කට්ටි පනින්න බැරි විදිහට බඳාදට වැටිල තිබ්බ. මොකද C-2-D හැටියට ඒක මගෙ කෝර්ස් එක හින්ද,





ඒ සම්බන්ධ හැම ප්‍රශ්නයකටම උත්තර දෙන්න වෙලා තිබ්බෙ මට! මං ආලෝක්ටයි, රයන්ටයි නොවඳිනා වැඳුම් වැන්ද මට මේකට උදව් වෙන්නයි කියල. ඒත් ඒ අසමජ්ජාති බල්ලො දෙන්න ඒක කනකට නොගෙන, වෙනදටත් වැඩිය වේලසනින්, ඒ කිව්වෙ රෑ දහයට නිදා ගන්න ගියා! මට සිද්ධ වුණා මුළු රෑ තිස්සෙම පාඩම් කරල, ප්‍රොෆාල අහයි කියල හිතන ප්‍රශ්නවලට උත්තර බලා ගන්න. ඒත් ඒකෙන් වැඩක් නොවෙන බව මං දැනන් හිටිය. මොකද... මට වයිවා එක කෙළවෙන්නෙ උත්තර දන්නෙ නැති නිසා නෙවෙයි. එවෙලෙට මට මොනවදෝ වෙලා දාඩිය දාල, ගොත ගැහිල උත්තර දීගන්න බැරිවෙන හින්ද! මං ඒක දැනන් හිටිය.

"හරිකුමාර්... ඇඩි සැකිල්ලක් හැදීමේ දී ඒ සඳහා C 20 වානේ වෙනුවට C 40 වානේ යොදා ගන්නෙ ඇයි? C 20 වානේවලට වඩා C 40 වානේවල තියෙන විශේෂත්වය මොකක්ද?"

"C 40 වල කාබන් වැඩියි. ඒ හින්ද ඒක හයියයි." මං හිත ඇතුළෙන් කිව්ව! "අනික ඒක ආර්ථිකමය වශයෙනුත් ලාභදායී. C 20 මෘදුයි. නැවෙනසුලුයි." මම ඒකත් කිව්වෙ හිතෙන්. මං උත්තරේ දන්නව. මේ ප්‍රොෆෙසර් වොහ්රා කියන භූතය මගෙ ඇස් දෙක දිහා බලාගෙන ඉන්න එක නවත්තනවනං මට පුළුවන් ඒක කියන්න. ඒත් ඒ යස්සය මගෙ ඇස් දිහාම බලන් ඉන්නව!

"සර්... සී හතළිහ කියන්නෙ..." මං වටපිට බැලුව. ආලෝකයයි, රයනුයි ජේන මානෙ හිටිය. මං උන් දිහා බැලුවෙ උන්ගෙන් සානුකම්පිත බැල්මක් බලාපොරොත්තුවෙන්.

"හරී... මා දිහා බලනව..." ප්‍රොෆෙසර් වොහ්රා කිව්ව. "මං ප්‍රශ්න අහන්නෙ ඔයාගෙන්."

මට ඕන වුණේ නැහැ එයා දිහා බලන්න. මට ඕන වුණේ කොහොම හරි උත්තරේ එළියට අගන්න. නමුත් එළියට ආවෙ උත්තරේ නෙවෙයි. දාඩිය බිංදු. මූණෙන්. අත්වලින්.

ඊට පස්සෙත් වෙන වෙන ප්‍රශ්න තුනක් ප්‍රොෆෙසර් වොහ්රා අහලා, මගෙන් තැටමෙන උත්තර ලැබෙනකොට වැඩේ අල්ලල දැම්මා. රයන් හිනා වෙවී ඔළුව දෙපැත්තට වැනුවෙ හරියට මේ දේ වෙන බව එයා කලින්ම දැනගෙන හිටියා වගේ! ආලෝක් නම් ඔහේ තක්බීර් වෙලා වගේ හිටියත්, මිනිහ අපිට ලකුණු කීයක් අඩු වුණාද කියල හිතෙන් ගණන් හදපු බව මට තේරුණා.

"සොරි..." මං රෑ කෑම ගනිද්දි රයන්ටයි, ආලෝක්ටයි කිව්ව. "මං වැඩේ කෙළෙව්වා... මට ඔය වයිවාස් ජේන්න බෑ."

මෙස් එකේ කෝකියො රොටි ගහන්න ගත්තෙ උඩ දදා. එක රොටියකින් පුළුවන් කලිසමක් කපා ගන්න. මං එක රොටියක් පුළුවන් හයියෙන් දෙකට කැඩුවෙ හිතේ තිබ්බ නොසන්සුන්කමු යන්නත් එක්ක.

"ඇත්තට මොකද වුණේ?" රයන් ඇහුව.

"අනේ මන්ද... කවුරු හරි මගෙන් ප්‍රශ්නයක් ඇහුවම ඔය වගේ පසුබිමකදි, මට මුකුත් කියා ගන්න බැරුව යනව..."

"කොයි කාලෙ ඉඳන්ද?" රයන් ඇහුව.

"ඒලෙවල් කරන කාලෙ වගේ ඉඳන්..."

"ඒ කාලෙදි මොකක් හරි සිද්ධ වුණාද?"

"නෑ... ඔ... ඔව්... නෑ... නෑ... මුකුත් නෑ."

"මොකක්?" ආලෝක් කිව්ව.

"අල්ලල දාන්න... ඔන්න ඔය බත් එක ළං කරන්න. මේ රොටි කන්න බෑනෙ. හරියට හං කැල්ලක් කනව වගේ. ෂීඃ..."

★





නේහාගෙ උපන් දිනේ ළඟම ආවා. දෙසැම්බර්වල. පුරුදු විදිහටම එයාට මොකක් තෑගි දෙන්නද කියල හිතා ගන්න බැරුවයි මං හිටියෙ.

"දෙන එකක් මොක හරි විශේෂ දෙයක් වෙන්න ඕනෙ..." රයන් උපදෙස් දුන්න. අපි හිටියෙ පන්තියක් කට් කරල, කැන්ටිමට වෙලා දවල් කෑම කකා.

"විශේෂ දෙයක්? මළා... මං මේ ඉන්නෙ ටූත්පේස්ට් එකක්වත් ගන්න සල්ලි නැතුව..."

"ඇත්... ඒ කිව්වෙ ඔයා මේ දිගටම දත් මැද්දෙ නැද්ද?" ආලෝක් පුදුම වෙලා ඇහුව.

"පිස්සුද මන්ද... මං රයන්ගෙන් ටූත්පේස්ට් ගන්නෙ මේ දවස්වල..." මං කිව්ව. "ඉතින් මොකක්ද දෙන්න හොඳ. හිතනවලකො පොඩ්ඩක්..."

"හිතන්න..." රයනුත් කිව්වෙ ඔළුවට ඇඟිල්ලකින් තට්ටු කර කර. මිනිහ හිතන්න ගත්ත. හරියට න්‍යෂ්ටික භෞතික විද්‍යාවෙ ගැටලුවක් විසඳන්න හිතන ගානට. එකක් තියෙන්නෙ රයන් මොකකට හරි බැස්සොත් ඉතින්... ආයෙ දෙකක් නෑ. බොක්කෙන්ම වැඩේ කරනව!

"අනේ මන්ද... මටනං මුකුත් හිතෙන්නෑ..." මං කිව්වෙ ඇත්තටම. "ආයෙත් සැරයක් ලිප්ස්ටික් හෝල්ඩර් එක වගේ අපි හදපු එකක් දෙන්නත් බෑ... අනික් අතට මං මේ දවස්වල හොම්බෙන් යන්නෙ. ඒ හින්ද වටින දෙයක් ගන්න සල්ලි ඇත්තෙත් නෑ."

"වැඩකුත් තියෙන, ඒච්චර ගණනුත් නැති ලේන්සු වගේ දෙයක් කොහොමද?" ආලෝක් ඇහුව.

"ෂට් අප් ආලෝක්... ගොන් කතා කියන්න එපා." රයන් කිව්ව.

මං වෙනුවෙන් රයන් ඒක ආලෝක්ට කිව්ව එකට මට පොඩි ගතියක් ආව. ආලෝක්ට ප්‍රේම සම්බන්ධ ගැනවත්, කෙල්ලෙකුට

දෙන්න ඕනෙ තෑගි ගැනවත් අබ ඇටේක තරම් තේරුමක් තියෙනවයි කියල මංනං හිතන්නෙ නෑ. ආලෝක්ගෙ අම්මට කැබරේ ගැන තියෙන දැනුමක් තමයි ආලෝක්ටත් කෙල්ලො සහ ආදරේ ගැන තියෙන්නෙ.

"රයන්... කියනවකො මොකද කරන්නෙ...?" මාව නළියන්න ගත්ත.

"මෙහෙමයි... ඒක මාර වටින දෙයක් වෙන්න ඕනෙ නෑ. හැබැයි ඒක මාර සප්‍රයිස් එකක් වෙන්න ඕනෙ. කවුද අකැමැති සප්‍රයිස්වලට?"

"ඒ කිව්වෙ, කොයි වගේද?" මං ඇහුව.

"ඒ කිව්වෙ, එයාට එදාට සුබ පතන පළවෙනිම කෙනා ඔයා වීම වගේ දෙයක්..."

රයන්ගෙ ප්ලෑන් එක නියමයි. ඒ වගේම පට්ට ලාබයි. මෙහෙමයි ඒක වෙන්නෙ. එයාගෙ බර්ත් ඩේ එක ලබනකොටම, ඒ කිව්වෙ හරියට එදා රෑ දොළහට එයාගෙ කාමරේ ජනේලෙන් ඇතුළට රිංග ගන්නව. එතකොට මං තමයි එයාට සුබ පතන පළවෙනිම කෙනා! ඒ අරෙන්න එයා තක්බීර් වෙන එකත් ෂුවර්ම ෂුවර්! එතකොට වෙනින් තෑග්ගක් නැති එක දැනෙන්නෙම නෑ. හැබැයි මේකනං මාර පිස්සු පූස් අයිඩියා එකක්! තමන්ගෙ කෙල්ලගෙ කාමරේට මහ රෑ පනින එක! ඊටත් වඩා ඒක ඩිපාර්ට්මන්ට් හෙඩ් ප්‍රොෆාගෙ ගෙදර වීම!! ඒත් රයන්නං ඒක කිව්වෙ මිනිහගෙ එසයින්මන්ට් එකක් ෆොටෝකොපි ගහනව තරමෙ සැහැල්ලුවකින්. කොහොම හරි අපි ඒ ප්ලෑන් එක ඒකමතිකව අනුමත කළා.

ඒ දවසට කලින් දා උදා වුණා. උදා වෙලා රෑ වුණා. දෙසැම්බර් හීතලත් එක්ක, රෑ එකොළහමාරට අපි තුන්දෙනා මීයො වගේ එළියට බැස්ස. අපි තුන්දෙනාම ස්කූටරේ නැඟල ප්‍රොෆෙසර් ක්වාටස් පැත්තට ගියා. (අපේ බිල්ඩිමේ ඉඳල එතනට තරමක් දුරක් තියන බව දන්නවනෙ.) නේහාලගෙ ගෙදරට මීටර් පනහක්





විතර ඈතින් ස්කූටර් නවත්තල මුල්ලකට කළා. මුළු ලේන් එකේම තිබ්බෙ සොහොන් පිට්ටනියක නිශ්ශබ්දතාවක්. (අපේ බිල්ඩිං එකේනං තත්ත්වෙ වෙනස්. ඒ වෙලාවටනෙ අපේ එවුන් පාඩම් කරන්න පටන් ගන්නෙ. එතන කචබචේ එක්ක බැලුවම මෙතන සොහොන් පිට්ටනියකටත් එහා!) අපේ එවුන්ට රෑ නිදි මරාගෙන වැඩ කරන්න, එසයින්මන්ට්ස් කරන්න මුල් වෙච්ච ප්‍රොෆාලා ගොරෝ ගොරෝ හොඳට බුදි! කොච්චර අසාධාරණද?

"රයන්... ඔයාට ෂුවර්ද මේ වැඩේ කරන්න පුළුවන් කියල?" මං අන්තිම වතාවටත් රයන්ගෙන් ඇහුවෙ ප්‍රොෆෙසර් චෙරියන්ගෙ (නේහගෙ තාත්තගෙ) තණකොළ පිට්ටනියට අඩිය තියන්න ළං වෙද්දි.

"ෂ්... ෂ්... මොකෝ නැතුව? හැබැයි මෙහෙම කියල සද්දයක් බෑ... හරිද?"

රයන් හෙමින් සැරේ ගේට්ටුවෙ කොක්ක ඇරිය. අපි ඉතාම සීරුවෙන් ලස්සන කුමාරිව හිර කරගෙන ඉන්න නපුරු රාස්සයගෙ ගුහාවට ළං වෙන්න ගත්ත.

මං නේහාගෙ කාමරේ ජනේල දිහා බැලුව. මට මැව්ල පෙනුණ එයා බොහොම සාන්ත දාන්තව නිදාගෙන ඉන්න හැටි. බෙල්ල ඇල කරගෙන. මූණ දිලිසි දිලිසි. දෙතොල් පියවිලා... මගෙ පපුවෙ ලබ්-ඩබ් රිද්මෙ වැඩි වුණා.

"ආලෝක් මෙහෙ එනව..." රයන් කෙඳිරුව. "ඔයා ඉස්සෙල්ල නඟින්න පයිප්පෙ දිගේ..."

"ඈහ්... කොහොමද ඒක කරන්නෙ? ඒක කරන්න බෑ..."

"මං ඔයාට තල්ලුවක් දෙන්නං..." රයන් යෝජනා කළා.

එච්චර මහත නැති පයිප්පෙ දිගේ ආලෝක් නඟිද්දි මට මැව්ල පෙනුණෙ උණ ගහක් දිගේ ගෝරිල්ලෙක් නඟින දර්ශනයක්! ගැල්වනයිස්වලින් හදපු පයිප්පෙ මිනිහට ඔරොත්තු දෙයිද෴ කියල මට සැකයක් ඇති වුණා. මිනිහ වහලෙ ගාවට වගේ යනකල් අපි නොඉවසිල්ලෙන් බලන් හිටිය.

මිනිහ වහලෙට නැග්ගට පස්සෙ තිබ්බෙ මගෙ වාරෙ. මාත් වදෙන් පොරෙන් වහලෙට නැග ගත්ත. රයන්ට නම් ඒක දිගේ වහලෙට එන්න ගියේ තත්පර ගාණයි. කොහොමින් කොහොම හරි රෑ දොළහට විනාඩි දහයක් තියෙද්දි අපි, අපේ ඩිපාර්ට්මන්ට් හෙඩ්ගෙ, මගේ පෙම්වතියගෙ තාත්තගෙ, අපේ ප්‍රොෆාගෙ වහලෙ උඩ හිටිය!

කට්ට කළුවරයි. රයන් එයාගෙ පොඩි ටෝර්ච් එක පත්තු කරන් වතුර ටැංකිය දිහාට ගියා. ඒ හරියෙ රෙදි එහෙමත් වේළෙන්න දාල තිබ්බෙ.

"කොහෙද එයාගෙ කාමරේ?" රයන් කෙඳිරුව.

මං සද්ද නැතුව ඇඟිල්ල දික් කරල එයාගෙ කාමරේ පෙන්නුව. අපි ඒ දිහාට ගියා.

"මේං මල්...!" රයන් මිනිහගෙ ෂර්ට් එක අස්සෙන් මල් මිටියක් ඇදල ගත්ත.

"ඈන්... මේව කොහෙන්ද?" මං ඇහුව.

"කොහෙන්ද ඉතින් ඔයාගෙ මාමණ්ඩියගෙ වත්තෙන්ම මිසක්...?"

"පිස්සුද ඔයාට...?"

"ෂ්... ෂ්..." රයන් කිව්ව. "ලෑස්ති වෙන්න... වෙලාව හරියාගෙන එන්නෙ."

අපි වහලෙ උඩ තිබ්බ පුංචි ගල්කැට ටිකක් තෝරන් එයින් එකකින් නේහගෙ ජනේලෙට ගැහුව. ටිකක් වෙලා ගියා. ම්හු... දෙවෙනි එකත් ගැහුව. ඒත් නෑ. තුන්වෙනි එකටත් ඒ ආනිසංසෙමයි.

"මේක හරියන්නෑ... එයාට හොඳටම නින්ද ගිහින් ඇති..." ආලෝක් කිව්ව.

"තව බලමු... අත අරින්න එපා..." රයන් කිව්ව.





අපි පිස්සො තුන්දෙනෙක් වගේ නේහාගෙ ජනේලෙට බොරලු කැට විදින්න ගත්ත එක දිගට! බොරලු කැට ලක්ෂයක් විතර ගැහුවට පස්සෙ කාමරේ ලයිට් එක පත්තු වෙච්චි!

වහලෙනට නඟින එකත් බෙල්ල කඩල යන වැඩක් වුණාට ඒක කොහොම හරි කර ගත්තැයි කියමුකො. ඒත් ඊළඟ පියවර ඊටත් එහා යන වැඩක්. මට තිබ්බෙ වහලෙ එල්ලිලා නේහගෙ කාමරේ ජනේලෙට අඩිය තියන්න. ඒත් ඒකට නේහා ජනේලෙ අරින්න ඕනෙ. මාව අත් දෙකෙන් අල්ලල බාන්න රයනුයි, ආලෝකයයි සැදී පැහැදී හිටිය.

"ඉක්මනට එයාගෙ නම කියන්න එයා බය වෙලා බෙරිහන් දෙන්න කලින්..." රයන් කිව්ව.

"නේහා... මේ මං..." පැය භාගයක් ඇතුළතදි පළවෙනි සැරේට කොඳුරන්නෙ නැතුව වචන තුනක් පිට කළා.

"හරී...!" මගෙ කටහඬ අඳුන ගත්තු ගමන් ජනේලෙ ඇරිය. "ඔයා?? මොනවද මේ කරන්නෙ...?"

"ඉන්නකො මං කියන්නං... ඉස්සෙල්ල මට එන්න දෙන්න..." මං පහළට එල්ලෙන ගමන් කිව්ව.

"ඔයාට පිස්සුද ඇත්තට?" එයා ඇස් පිහ දදා අහද්දි, මගෙ කකුල් දෙක එයාගෙ මූණ කෙළින් හිස් අවකාශෙ වැනි වැනි තිබ්බ!

"රයන් බලාගෙන..." මං කිව්ව.

"වෙන කවුද ඉන්නෙ?" නේහා හොල්මන් වෙලා ඇහුව. එයා මේ වෙද්දි සම්පූර්ණ යථා තත්ත්වෙට පත් වෙලා වගේම සම්පූර්ණයෙන් අන්දමන්ද වෙලා.

"කවුරුත් නෑ... අහ්... මේ... මේ... රයනුයි, ආලෝකයි විතරයි..." මං එහෙම කිව්වෙ පැද්දිලා එයාගෙ ජනේලෙන් ඇතුළට පනින ගමන්.

"පරිස්සමින්..." මාව වැටුණෙ බොහොම සැප සනීප දැනෙන කුෂන් ගොඩක් උඩට. කෙල්ලන්ගෙ කාමරවල තමයි ඒව තියෙන්නෙ. මං එළියට අත අල මහපට ඇඟිල්ල උස්සල 'ඔක්කොම හරි' සංඥාව රයන්ටයි, ආලෝක්ටයි පේන්න සැලැස්සුව. ඊට පස්සෙ මං ජනේලෙ වහල දැම්ම.

"හරී... ඔයා මොනව කරනවයි කියලද ඔයා හිතන්නෙ?" නේහා ඔරවගෙන, ඒත් දඟකාර විදිහට ඇහුව. "තාත්ත ඇහැරුණොත් එහෙම?" එයා කොණ්ඩෙ හැදුව. එතකොට තමයි මං එයාගෙ නයිටිය හොඳට දැක්කෙ. ඒක අත් නැති, බොහොම සරල කොට්න් නයිටියක්. පුංචි පුංචි නිල්පාට ත්‍රිකෝණ ඒකෙ හැම තැනම විසිරිලා තිබ්බ. හැමදාමත් වගේ එයාගෙ ලස්සන ඒ වෙලාවෙත් ඉතිරෙමින් තිබුණ.

"හැපි බර්ත්ඩේ නේහා..." මං ෂර්ට් එක අස්සෙන් මල් පොකුර ඇදල ගත්ත.

ඒ වෙද්දිත් මල් ටික තැළිල, මැලවිලා වගේ. ඒත් මලුයි, කාන්තාවොයි අතරෙ අපිට නොතේරෙන මොකක්දෝ සම්බන්ධයක් තියෙනව. නේහාගෙ කේන්ති ගතිය නැතිවෙන ලකුණු පහළ වුණා. 'වැඩේ හරි...' මට හිතුණ.

"ආනෙ මල්...!" නේහා ආශාවෙන් ඒ ටික අතට ගත්ත. "කොහෙන්ද මේව?"

"ඔයාලගෙ වත්තෙන් තමයි..."

"මොකා...?" නේහා මට මලකින් ගැහුව. "ෂික් විතරක්... ලැජ්ජ නැතුව කියන හැටි."

මං කුෂන් එකක් අරන් එයාට දමල ගැහුව. 'ඔන්න දැන් මල් සහ කුෂන් ෆයිට් එකක් පටන් ගන්නයි යන්නෙ...' මට හිතුණෙ එහෙම. ඒ හිතිවිල්ලම මට මාර එක්සයිට්මන්ට් එකක් අරගෙන ආව. ඒත් එයා ඒක උපන් ගෙයිදිම මරල දැම්ම.

"අනේ මගෙ කුෂන් ටික කන්න එපා... මං ඒවයෙ කවර්ස් ඔක්කොම හැන්ඩ් පේන්ට් කරල හදපුව!"





හුහ්... හැන්ඩ් පේන්ට් කුෂන් කවර! ඇත්තටම කෙල්ලන්ට කොහෙන්ද ඔච්චර වෙලාව තියෙන්නෙ ඔය වගේ වැඩකට නැති දේවල් කරන්න. අඩු ගානෙ රයන්ටවත්, මටවත් හැන්ඩ් පේන්ට් කරපු කවර්ස් දාපුව තියා නිකං කුෂන් එකක්වත් නෑ.

"මොනාද කල්පනා කරන්නෙ?" නේහා මගෙ ළඟට ඇවිත් මගෙ අතින් අල්ල ගන්න ගමන් ඇහුව.

"මුකුත් නෑ... අනේ සොරි මං ඔයාව බය කළානං..."

"ඒකට කමක් නෑ... මං කැමතියි ඒකට..." නේහා කිව්ව. "ඒකෙ තියෙනව හරි ස්පෙෂල් ගතියක්... මෙහෙට එන්න."

එයා මාව ඇඳෙන් වාඩි කරව ගත්ත. මං පුළුවන් තරම් එයාට ඇලිල වගේ වාඩි වුණා. මගෙ ඇස් ගියේම එයාගෙ පපුව දිහාට. කෙල්ලො රෑට 'බ්‍රා' අඳින්නෙ නෑනෙ... මං හිතන් හිටියෙ එහෙම. ඇත්තටම එයාලට වැඩිය හොඳත් ඒ විදිහමයි! නේහගෙ පපුව ගැන විතරක්ම නෙවෙයි මගේ හිත තිබුණෙ. අර ප්‍රොෆෙසර් චෙරියන් කියන බූතනාත් දොර ඇරගෙන කාමරේට ආවොත්...?

"මොනාද ඔයා ඔච්චර හිතන්නෙ...? මගෙ ඇස් දිහා බලන්න..." නේහා අණ කළා.

"ආ...හ්... මුකුත් නෑ... හැපි බර්ත්ඩේ..." මං ආයි කිව්ව.

"ඔයා මාව කිස් කරන්නෙ නැද්ද?"

මගෙ ඇස් පියාඹන පීරිසි දෙකක් තරම් ලොකු වුණා. එයා පොඩ්ඩක් පස්සට ගියා.

"චුට්ටක් ඉන්න... ඔයාට එහෙම කරන්න ඕනෙනෙ?"

"ඔව්... ඔව්... නැතුව?"

"එහෙනම් දැන්...?" එයා කිව්ව.

"දැන්...? ඒ කිව්වෙ?"

"දැන් ඔයා මාව කිස් කරනවද? නැත්තං ඔයාට ඒක එපාද?"

සමහර විට ඒක මල් හින්ද වෙන්න පුළුවන්. නැත්තං හොරෙන් තමන්ගෙ කෙල්ලගෙ කාමරේට මහ රෑ රිංගීමේ එක්සයිට්මන්ට් එක නිසා වෙන්න පුළුවන්. එහෙමත් නැත්තං දැන් එයා මහ ගෑනියෙක්ය කියන හැඟීම ඇති වෙච්ච නිසා වෙන්න පුළුවන්. මේ ඔක්කොම නිසාත් වෙන්න පුළුවන්. ඒවයින් පිබිදුණු මම එයා දිහාට නැඹුරු වුණා. කොල්ලා, කෙල්ලව කිස් කරන හැටි චිත්‍රපටිවලින් ලක්ෂ වාරයක් විතර දැකල තිබ්බත් පළවෙනි සැරේට, හරියට කිස් කරන එක කොච්චර අමාරුද කියල ඔයාලට කියන එක ලේසි වැඩක් නෙවෙයි!

"ඌප්ස්... ඔච්චර හයියෙන් නෙවෙයි..." එයා කියපි. "ඉස්සෙල්ල හෙමින්..."

එයා තමයි ඊට පස්සෙ මාව මෙහෙයවෙච්චෙ! ඇත්තම කිව්වොත් ඊට වඩා හොඳින් කිස් කිරීමේ බයකිනුයි, එක්සයිට්මන්ට් එකකිනුයි මාව පෙළුණා. කොහොම හරි මං මගේ ජීවිතේ කුලුඳුල් සිප ගැනීම, ප්‍රොෆෙසර් චෙරියන්ගෙ ගෙදරදි සිද්ධ කළා!

"ෂ්... ෂ්... තාත්ත නැඟිටල... වතුර බොන්නද කොහෙද..." නේහා කිව්වෙ මාව පැත්තකට තල්ලු කරන ගමන්.

"දැන් මොකෝ කරන්නෙ?"

"මුකුත් නෑ... එයා මෙහෙට එන්නෙ නෑ. ඒත් දැන් ඔයා යන්න..."

"මට තව ඉන්න ඕනෙ..."

"යන්න ළමයො...." මීට මොහොතකට කලින් ආදරෙන් පිරිල හිටිය නේහා වෙනස් ස්වරයකින් කිව්ව.

ආයි ආයි එකම දේ කියන්න යන එක තේරුමක් නැති වැඩක්. අනිත් එක මගෙ යටි හිතෙනුත් කිව්ව ප්‍රොෆෙසර් චෙරියන් කියන මරාලෙ ඔළුවට කඩාගෙන වැටෙන්න කලින් මෙතනින් දිරාමාර් වෙනවනං හොඳයි කියල.

"ඉතින්... මොකද වැඩේ...?" රයන් ඇහුවෙ ආපහු මාව වහල උඩට ඇදල ගන්න ගමන්.





"එළ... එළ... සුපිරි!" මං එහෙම නොකිව්වත් මගෙ කන ළඟටම පැතිරිච්ච හිනාවෙන් උන්ට ඒක නොතේරී තියෙන්නෙ කොහොමද? නැග්ග වගේම බහින එකත් කලාවකට කරන්න ඕනෙ කියල අපිට තේරුණා. ඒකත් එච්චර ලේසි වුණේ නෑ. ඒත් අපිට ලොකුම ප්‍රශ්නෙකට මූණ දෙන්න වුණේ පහළට බැස්සයින් පස්සෙයි. කවුදෝ සාලෙ ලයිට් දාල තිබ්බ. ඒ එළිය මිදුලටත් වැටිල තිබුණ.

"කොහොමද ලයිට් එක වැටුණෙ?" ආලෝක් ඇහුව.

"අනේ මන්ද... චෙරියන්කාරය වතුර බොන්න නැඟිට්ටින්න ඇති..." මං කිව්ව.

"බඩ ගාගෙන වගේ යං..." රයන්ගෙ යෝජනාවෙ විදිහට, අපි දෙකට නැවීගෙන ජනෙල් අයිනෙන් මාරු වෙන්න ගත්ත.

"දඩි බිඩිං...!"

කොහොමද මන්ද බාල්දියක් පෙරළුණා. ආලෝකය පිට්ටනියෙ ටිකක් දුර බඩ ගගා ඉද්දිදියි ඒක වුණේ. මෙච්චර වෙලා හුම් සද්දයක් නොකර කරපු මුළු ඔපරේෂන් එකම චක බ්ලාස් කරන්න ඒ සද්දෙ හොඳටම සෑහුණා.

"කවුද ඔය...? කවුද...?" ගේ ඇතුළෙන් පිරිමි කටහඬකුයි, ඉක්මනට ඉක්මනට දොර දිහාට එන අඩි සද්දෙකුයි ඇහුණ.

"කෙළියා... චෙරියන්කරයා දුවපියව්...!" රයන් අණ දුන්න.

බඩ ගාන එක නවත්තල කෙළින් වුණු අපි, අපේ ශරීර කකුල්වලට බාර දුන්න. බැරි වෙලා හරි චෙරියන්කාරය අපිව දැක්කනං අපිට පස්ස පැත්තට පයින් ගහල කැම්පස් එකෙන් එළියට දාන එක ෂුවර්!

චෙරියන්කාරය දොර ඇරගෙන එළියට එද්දි අපි ගේට්ටුවෙන් එළියට පැන ගත්තා විතරයි! චෙරියන් ඇඳල හිටියෙ එයාගෙ නෝනට තිබ්බ නයිට් ගවුමක් වෙන්න ඕනෙ. එහෙමයි මටනං පෙනුණෙ.

"කවුද ඔය?" වෙරියන්කාරයා කෑ ගැහුව. මිනිහගෙ කණ්ණාඩියත් හද හදා.

"උඹේ මහ එකා...!" රයන් බෙරිහන් දුන්න. ඒ එක්කම අපි මීටර් සීය ඔලිම්පික් පටන් ගත්ත.

වෙරියන්කාරයා අපි පස්සෙ පන්නං ආවද? එහෙමත් නැත්තං එහෙම එන්න බය වෙලා එතනම නැවතිලා දත්මිටි කකා හිටියද කියන්න අපි දන්නෙ නෑ. මොකද, අපි ආපහු හැරිල බැලුවෙ රයන්ගෙ ස්කූටරේ ළඟට ආවට පස්සෙ හින්ද.

"ඔයාගෙ ඔළුව හොඳ නැද්ද අරහෙම කියල කෑ ගැහුවෙ...?" මං රයන්ට දෙහි කපන්න ගත්තෙ ස්කූටරේ පාරට ගත්ත ගමන්මයි.

"නැත්තං මොකක්ද කියන්න ඕනෙ? මෙහෙමද? සර්... මේ අපි... සර්ගෙ අනාගත බෑනයි, එයාගෙ යාළුවො දෙන්නෙකුයි... එහෙමද...? එතකොට එයා කියාවි මෙහෙම... ආ එන්න... එන්න... ආව එකේ මොනව හරි බීලම යන්න..."



# 12

# නේහා කතා කරයි

**සමීර් අයියා,**

මං දන්නෙ නැහැ ඔයා කවද, කොහොම මේක කියවයිද කියල. ඒත් මං මේ ලියුම කොහොමටත් ඔයාට ලියන්න ඕනෙ. ඔයා මට එවපු අන්තිම ලියුමට මං නිතරම වගේ උත්තර ලෑස්ති කරනව. ඔයා ඒක විශේෂයෙන්ම මට විතරක් එවපු එකටනං මගෙ ඒ හැටි කැමැත්තක් නෑ. ඒත් ඉතින් එහෙමනං මට ඒක ඔයාට කලින් කියන්නයි තිබ්බෙ.

කොහොම වුණත් මට හම්බවෙච්ච මේ කොල්ල ගැන මං ඔයාට කියන්න ඕනෙ. මං නොකීවත් ඔයාට ඕනෙනං කියතහැකි 'හරී' මගෙ බෝයිෆ්‍රෙන්ඩ් කියල. එයා තාම ඉගෙන ගන්නව. අයි.අයි.ටී. එකේ. ඔයාට මේක විශ්වාස කරන්න පුළුවන්ද? ඔයාට මතකද අපි අයි.අයි.ටී. එකේ ඉගෙන ගන්න එවුන් ගැන කතා කරපු විදිහ? අපිට එයාලව ජේන්න බැරි තත්ත්වයක්නෙ තිබ්බෙ. අපි හම්බ වුණෙත් හරිම පුදුම විදිහකට. එයාගෙ මොකක්දෝ දෙයක් තිබ්බ. ඒක හින්ද වෙන්න ඇති, හම්බ වෙච්ච මොහොතෙ ඉඳන්ම මාව එයාට ආකර්ෂණ වෙන ගතියක් තිබ්බ.

එහෙම කිව්වට එයා මාර හැන්ඩ්සම්, ලස්සන කෙනෙක් නෙවෙයි. පිස්සු පොරක්. ගෙදර අය තාම මෙලෝ දෙයක් මේ ගැන දන්නෙ නෑ. ඔයා ගියදා ඉඳන් මං හරියට පරිස්සම් වෙනව එයාලට මුකුත් ඉව වැටෙන්නෙ නැති විදිහට හැසිරෙන්න.

නැත්තං දන්නවනෙ තාත්ත දැන ගත්තොත් එහෙම? මතකද කැම්පස් එකේ කොල්ලෙක් බස් හෝල්ට් එකේදි මට විසිල් කරල තාත්ත පොලීසිය ගෙන්නුව එයාව ඇරෙස්ට් කරන්න? ආයෙ මතකද මගෙ පන්තියෙ කොල්ලෙක් ගෙදරට කතා කරල නෝට්ස් ඉල්ලුව කියල එයා ගෙදර ටෙලිෆෝන් නොම්බරේ මාරු කළා? එයාට ඕන වුණේ එයාගෙ දුවව එක්ටැම් ගේ ආපු කුමාරි වගේ හදා ගන්න. එයාගෙ ජීවිතේ අරමුණ මං. එයාට එකම වැරැද්ද දෙපාරක් කරන්න ඕනෙකමක් නෑ.

මට ඔයාට කියන්න ඕන වුණේ මං ගැන හිත කරදර කර ගන්න එපා කියලයි. මං දන්නව කෙල්ලෙක් වුණහම හොඳට හැදෙන්න ඕනෙ බව. සමහර වෙලාවට මටත් හිතෙනව මෙයා උනන්දු වෙන්නෙ ශාරීරික ප්‍රේමයක් ගැන විතරයි කියල. කොල්ලො ඉන්න කෙල්ලො මට කියල තියෙනව ඔක්කොම කොල්ලො එකයි... උන්ට ඕනෙ එක දෙයයි කියල. ඒත් මං ඔයාට දෙයක් කියන්නද? මටත් ඒක ඕනෙ. හා... හා... කලබල වෙන්න එපා. තාම එහෙම දෙයක් වුණේ නෑ. ඒත් මටත් ඒ ගැන තියෙන්නෙ ලොකු කුතුහලයක්. මං 'හරීට' ඉඩක් දුන්න නම් එයා මොන වගේ දේවල් කරාවිද? මං එහෙම හිතන එක හොඳ නැද්ද? ඒක නරකයිද?

අයි... අයියෝ මට ඔයාගෙන් ප්‍රශ්න කෝටියක් විතර තියෙනව අහන්න. මං ඔයාට 'හරී' ගැන තව විස්තර කියල ඉන්නම්කො. එයාට ඉන්නව යාළුවො දෙන්නෙකුත් රයනුයි, ආලෝකයි කියල. අමු පිස්සො ටිකක්. දැන් ඉතින් ඔයා හිතන්න එපා මං අයි.අයි.ටී. කොල්ලන්ට කැමති වෙලයි කියල! මෙයාල වෙනස්. එකක් තමයි එයාල යන්තං ඔළුව බේරගෙන වැඩේ ඇදන් යන අය. ඒ කිව්වෙ යන්තං පහයි පොයින්ට් ගාණක් ලකුණු අරන් යන්තං ගොඩ ගිය අය.

මං දන්නව දැන් ඔයා හිතන එක. එයාල තාත්තට පපුවෙ අමාරු හදවන්න පුළුවන් තරමෙ කට්ටිය. ඔයා හිතනව ඇති මං එයාල එක්ක ආස්සරේ කරන්නෙ ඒ හින්දමදෝ කියල... නෑ





අයියෙ... ඔයා දන්නවද මගෙ පහුගිය උපන් දිනේ දවසෙ මුන් ටික රෑ දොළහට අපේ ගෙදරට පැන්නනෙ! 'හරී' මගෙ කාමරේටම ඇවිත් අපේ වත්තෙන්ම කඩා ගත්තු මල් පොකුරකුත් මට දුන්න කිව්වම! මං හිතනව තාත්තා එයා ගැන වැරදියට නොහිතයි කියල. එයාට ඒව කවදාවත් ආරංචි නොවෙයි කියල... මට එයාව දිගටම හම්බ වේවි කියන බලාපොරොත්තුවෙන් මං ඉන්නෙ. තව එයා ගැන ගොඩක් දේවල් තිබුණත් මං තාම ඒව හරියට දන්නෙ නෑ.

මගෙ ප්ලෑන් එක තියෙන්නෙ හරීට ජොබ් එකක් හම්බ වුණ දාට තාත්තට එයාව අඳුන්වල දෙන්නයි. එතකොට එයාට මොකක් හරි පදනමක් තියෙනවනෙ. දැන් ඔයා ඇහුවොත් එයා කොහොමද කියල, අවංකවම මට කියන්න වෙන්නෙ කිසිම පදනමක් නැති, අපතයෙක් කියන එකයි. අනික එයාගෙ පරමාදර්ශය තමා රයන්. "රයන් මෙහෙමයි... රයන් අරෙහමයි..." ඔන්න ඔහොමයි. සමහර වෙලාවට මට එපා වෙනකල් රයන් ගැන කියවනව. ඔය රයන් ටිකක් වෙනස් අනික් අයට වඩා. සල්ලි තියෙනව හොඳට. අඳින්නෙ බ්‍රෑන්ඩඩ් ඇඳුම්. ඒත් එයාගෙ මොකක් හරි සැඟවිච්ච් දෙයක් තියෙනව කියල මට හිතෙනව. එයාටත් වධ දෙන මොකක් හරි හිස් බවක් වගේ දෙයක්.

ඔන්න ඔහොමයි මෙහෙ අයි.අයි.ටී. කොල්ලන්ගෙයි, කොලේජ් එකෙයි තත්ත්වෙ. එයාල ඔක්කොමලව එකම අච්චුවක අල එළියට ආන්න හදන ගානයි. මට ඉතින් එයාලට කියන්න තියෙන්නෙ අනාගතේ ගැන හිතල මෙතන මී පොරේට එකතු වෙන්න කලින් අතීතෙයි, වර්තමානෙයි අවබෝධ කරගන්න කියලයි. එයාල හිතයි මං මහ පැහිච්ච ආච්චි කෙනෙක්ය කියල... නෑනෙ... මං තාම හොඳටම තරුණයි!

ඉතින් මං ඔයාට දැනට ලියන්නෙ මෙච්චරයි. අනිවාර්යයෙන් මං ඔයාට ආයෙ ලියනවා. මං පොරොන්දු වෙන්නං, මං හොඳ ළමයෙක් වෙනව කියලත්. ඒත් ඔන්න අම්මලට හෙම කියනව නෙවෙයි මං ලියපුව. මමත් ඔයාට පොරොන්දු වෙච්ච විදිහටම තාම කාටවත් කියල නෑ ඔයා මට එවපු අන්තිම ලියුම ගැන! මාව

කොච්චර අමාරු අවස්ථාවලට පත් වුණත් මං ඒ ගැන කියල නෑ. මං කොච්චර කඩන් වැටුණත් මං ඒ ගැන කියල නෑ. ඒ හින්ද මගෙ පොරොන්දුවත් එහෙමම රකින්න. මං දන්නව අම්මටනං මේක ගැන ටිකක් අමාරු වෙන බව. කොහොමටත් එයා මේ දවස්වල මා එක්ක නෝ කතා... නෝ සිනා... ඇයි අයියෙ ඔයා අපිව දාල ගියේ? ඒක හරිම අසාධාරණයි... ඔයා ඒක දන්නව... එහෙම නේද?

ඔයා නැතුව පාළුයි.

නේහා.



# 13

# තවත් අවුරුද්දකට පස්සෙ...

අපි අපේ සුපුරුදු තිප්පොළේ බිබී හිටිය. තුන්වෙනි අවුරුද්ද. ඇල්කොහොල් ඒ වෙද්දි තවදුරටත් කිසිම කෙනෙකුට නැවුම් දෙයක් නෙවෙයි. ඒ කියන්නෙ මේ වෙද්දි සතුටු වෙන්න, සතුට සමරන්න බොන්න ඕනෙ කියන කාරණාව බැහැර වෙමින් තිබුණෙ. අනික මළ පෙරේතයො වගේ බෝතල් ගණන් බොන්න උවමනාවකුත් මේ වෙද්දි අපිට තිබ්බෙ නෑ. එදා අපි සෙට් වෙලා හිටියෙ අපේ හිත් සවුත්තු කළ කාරණා දෙකක් ඇල්කොහොල්වල දිය කරල දාන්න. ඒකෙන් පළවෙනි එක තමයි, අවුරුද්දක් තිස්සෙ ෆයිල් එහෙට මෙහෙට යවල යවල මැකෑනිකල් ඉංජිනියරින් ඩිපාට්මන්ට් එක කිසිම ගානක් නැතුව රයන්ගෙ ප්‍රපෝසල් එක කුණු බාල්දියට දාපු එක. දෙවෙනි එක තමයි, මං දෙවෙනි වයිවා එකත් කෙළවගත්තු එක. වයිවා එකක් කෙළව ගන්න කැමති කෙනෙක් ඉන්නවනං ඒක මට බාර දෙන්න. ඒ වැඩේට මං තරම් සතෙක් තවත් නෑ!

"මගෙ ලුබ්රිකන්ට් ප්‍රොජෙක්ට් එක යකාට ගියාවෙ... මං ඒකට වෙලාව නාස්ති කළා වැඩියි. ඒත් බලන්න ඔයා...? මොකක්ද ඔයාට වයිවා එකකට ගියාම වැහෙන යස්සය?" රයන් කිව්ව. රයන්ට යකා නැඟල හිටියෙ.

"අනේ මන්ද... මංවත් ඒක දන්නෙ නෑ..." මං කිව්වෙ ජීවිතෙත් එපා වෙලා.

"ඔයා එයාල අහන ඒවට උත්තර දන්නවනෙ... නැද්ද හොඳයි...? උත්තර නොදැන නෙවෙයිනෙ?"

ආලෝක් බොහොම උද්වේගෙන් ඇහුව. මං ඔළුව වැනුව. අවුරුදු තුනක් තිස්සෙ වයිවාවලට ඉඳලත්, වයිවා එකකදි ගල් ගැහෙන ගතිය වෙනස් වෙලා නෑ. වැඩක් නෑ... වැඩක්ම නෑ...!

"රයන් ඔයා දන්නවනෙ මට වයිවාස් ජේන්න බැරි බව...? ඒක පැත්තකින් තියන්නකො... ඔයාට ලෝකෙ එපා වෙලා ඇති නේ...?" මං රයන්ගෙන් ඇහුව.

"අහ්... ප්‍රපෝසල් එකට රෑ දහයක් නිදි මැරුව... ඒක එහෙ මෙහෙ කර කර තව පැය සීයක් විතර ලැබ් එකේ ගත කෙරුව... ඒත් මොකක්ද අන්තිමේදි වුණේ? ඔයාගෙ මාමණ්ඩිය... අර වෙරියන් කියන බූතනාත් ඒකට කෙළිය... 'විශිෂ්ට වැඩක්... ඒත් අන්ත සුබවාදියි... සුබවාදී වැඩියි...' එහෙමයි මිනිහ කිව්වෙ. මට ඒකගෙ බෙල්ල කරකවන්න හිතුණ." ආලෝක් ඇස් උඩ තියාගෙන ඉඳිද්දි රයන් එයාගෙ හැඟීම් ප්‍රකාශ කළා.

"ඒත් ඔයා දන්නවනෙ ඔයාගෙ අයිඩියා එක හොඳ බව?" ආලෝක් කිව්ව.

"ඔව්... නැතුව! ප්‍රොෆෙසර් වීරත් එහෙම හිතනව. ඒ වුණාට වෙරිය (මේ වෙද්දි, ඩිපාර්ට්මන්ට් හෙඩ් ප්‍රොෆෙසර් වෙරියන් - ප්‍රොෆෙසර් වෙරියන් – වෙරියන් – වෙරිය වෙලා තිබ්බ!) එහෙම හිතන්නෙ නෑ... මිනිහනෙ හෙඩ්... ඒ හින්ද වැඩේ කොහොමත් කෙලාට්ම තමා!"

"ඒ කියන්නෙ වැඩේ ඉවරටෙම ඉවරද?" මං ඇහුව.

"මගෙ පැත්තෙන්නං එහෙම තමා... ප්‍රොෆෙසර් වීරා කිව්ව ප්‍රයිවට් ස්පොන්සර් කෙනෙක්ව ට්‍රයි කරල බලනව කියල... එයා සෑහෙන දුරට හිතල..." රයන් කිව්ව.

ආලෝක් වැඩි සද්ද බද්දක් නැතුව නාහෙ හාර හාර මිනිහගෙ වොඩ්ක එක තොල ගගා හිටිය. ඒක එච්චර ලස්සන





දර්ශනයක් නෙවෙයි. ඒත් තවදුරටත් ඒක මට ප්‍රශ්නයක් වුණේ නෑ. මං ආලෝක් දිහා බැලුව.

"අඩු ගාණෙ ඔයා හරි හැපි එකේ ඉන්නවනෙ..."

"හැපි...? මම...??" ආලෝක් එහෙමම මං කියපු එක ආපහු ඇහුව. "විහිළුවනං නියමයි."

"ඇයි මොකෝ වුණේ?"

"මුකුත් නෑ... මගෙ කාලකණ්ණි ජීවිතේට මුකුත් වෙන්නෙ නෑ. ඒක එහෙමමයි. මං ඉතින් සදා අත් හැපි - ඇන් අක්කට බදින්න ඕනෙලු... ඒක තමා අලුත්ම තත්ත්වෙ."

බැලුවහම ආලෝක්ගෙ කතාවෙ ඇත්තක් නැත්තෙත් නෑ. කන්දොස්කිරියාවල්, මැසිවිලිම පිරුණු ගෙදරකුයි, පහයි පොයින්ට් ගාණක ලකුණුයි, අපතයො වෙච්ච යාළුවො දෙන්නෙකුයි ඉන්න එකෙකුට සන්තෝෂයක් තියෙන්න බෑ තමයි. ඒත් අඩු ගාණෙ මිනිහට තමන්ගෙ යාළුවො ඉස්සරහ හොටු බෝල කිරීමේ නිදහසවත් තියෙනව.

"කොහොමද නේහා...?" ආලෝක් ඇහුව.

"එයා හොඳින්... ඇත්තම කිව්වොත් මං අයි.අයි.ටී. එකේ ඉන්න එකම හේතුවත් එයා විතරයි..." මං කිව්ව.

"ඉතින්... දැන් මොකෝ තත්ත්වෙ? දැන්වත් සෑහෙන දුරකට ගිහින් තියෙනවද?" රයන් ඇහුව.

"ඒ කිව්වෙ? මං එයාව කිස් කළා... ඒක ඔයාල දන්නවනෙ..." මං කිව්ව.

"ඒ ඉතින් අවුරුදු දහයකට විතර කලින්නෙ..." රයන් බොහොම උපහාසයෙන් වගේ කිව්ව. "ඊට වඩා තව කොච්චර දේවල් තියෙනවද කරන්න...? එහෙම නැත්තං අර වයිවාවලදී වගේ එයා ඉස්සරහදි ඔයාට කතා කරන්න බැරුව යනවද?"

ආලෝක් බක බක ගාල හිනා වෙන්න ගත්ත.

"මඟුලක් කියන්න එපා රයන්... එයා ඒ වගේ කෙල්ලෙක් නෙවෙයි..."

"එයා ඒ වගේ කෙල්ලෙක් නෙවෙයි වුණාට, ඔයා ඒ වගේ කොල්ලෙක්නෙ..." රයන් කිව්ව. "ඒ නිසා එයාවත් ඒ වගේ කෙල්ලෙක් කර ගන්න."

"ඒ කොහොමද?"

"මට ඉතින් ඔයාට හැමදේම එකින් එක කියල දෙන්න බෑ."

කළුවර වැටුණට පස්සෙ අපි පල්ලම් බහින්න තීරණේ කළා. තවත් දවසක් ඉවරයි. ඇති යන්තං... ඒ කියන්නෙ මේ කුජීත බිමේ ඉන්න තියෙන තව දවසක් අඩු වුණා.

"මේක ඉවර වුණාම තමා මගෙ ඔළුව නිදහස් වෙන්නෙ..." මං කිව්ව.

"අඩු ගාණෙ අපි C-2-D එක හරි හරියට කරනවනෙ..." ආලෝක් කිව්ව.

"හරියට හරි..." රයන් කිව්වෙ බොහොම ආඩම්බරෙන්. "කොයි කාලෙද අපි අන්තිමට තමන්ගෙම කියල එසයින්මන්ට් එකක් කළේ?"

"ඒත් හිටපු ගමන් මට ඒ ගැන බය හිතෙනව..." මං කිව්ව.

"මොකට බය වෙනවද? අපි ප්‍රොෆාලට දෙන ඒව කවදාවත් ඕනකමින්, සංසන්දනය කර, කර කියවන්නෙ නෑ... ඒක ෂුවර්..." රයන් හිනා වුණේ උපහාසෙන්.

"ඒ වුණාට චෙරියන්කාරයා හැම මඟුලම අකුරක් නෑර බලනවලු..."

"බලමුකො... එයා එහෙමද, නැද්ද කියල ඉක්මනටම ඇන ගන්න පුළුවන්. පොර එනවනෙ මේ අන්තිම කාලෙදි අපිට උගන්නන්න."





"ඔව්.. මංනං ඕකගෙ එක පන්තියකටවත් ඉන්නෙ නෑ..." රයන් දිවුරුව.

"කොහොමටත් එයාගෙ ක්ලාස්වලට ඔයාට යන්න ඕන වෙන්නෙ නෑ. C-2-D වල හැටියට ඒවට යන්න වෙන්නෙ හරිට..." ආලෝක් එහෙම කියල ඇහැකුත් ගැහුව. "මිනිහට පුළුවන් එතකොට මාමණ්ඩිය මිනිහගෙ තරම පෙන්නල අපේ වඩන්න..."

"මටත් සමහර වෙලාවල්වලටනං හිතිල තියෙනව නේහා එයාගෙ තාත්තට මං ගැන කියනවනං කියල... මං මිනිහගෙ ක්ලාස් කට් කරන එක හොඳ පටන් ගැන්මක් වෙන එකක් නෑ..." මං කිව්ව.

"මට ඕකව පේන්න බෑ..." රයන් කිව්වෙ අවංකවමයි.

කිසිම කෙනෙක් චෙරියගෙ පළවෙනි පන්තිය කට්ටි පැන්නෙනං නෑ. රයන් ඇර! මගෙ කෙල්ලටයි, මගෙ හොඳම යාළුවටයි උදැල්ල ආලා දූෂ්ටකං කරන දුෂ්ටයව පණ පිටින්, හොඳට බලා ගැනීමේ කුතුහලේකින් මං පෙළුණා. අනික් අයනං ගියේ ඉන්දියාවෙ තියෙන හොඳම තාක්ෂණික විද්‍යාලෙ, තාක්ෂණ ඉංජිනේරු අංශෙ චිරප්‍රසිද්ධ ප්‍රධානියව බලා ගන්න! චෙරිය අයි.අයි.ටී. එකේ ඉගෙන ගන්න කාලෙදි මිනිහ පොයින්ට් දහයම අරන් රෙකෝඩ් තිබ්බ පොරක්ලු! මංනං ඒක හරියට දන්නෙ නෑ. හැබැයි මිනිහගෙ දෝණියන්දැටනං පොයින්ට් දහයෙන් දහයම දෙන්න පුළුවන් කියලනං මං දන්නව.

මං ගියේ විනාඩි පහක් වේලාසනින්. ගත වුණු අවුරුදු තුන ඇතුළතදි පළවෙනි වතාවට මට පළවෙනි පේළියෙ වාඩි වෙන්න ඉඩ ලැබුණා. මං දන්නෑ ඇයි කියල... හැබැයි මට ඕන වෙලා තිබ්බ මිනිහගෙ කෝර්ස් එක එළට කරන්න! මං සාමාන්‍ය ටෙස්ට්වලදි A ගත්තොත් මිනිහ මං ගැන පැහැදෙයි. එතකොට සමහරවිට මිනිහට මාව අඳුරල දෙන්නත් නේහාට පුළුවන් වෙයි!

"තාත්තෙ... මේ තමා හරිකුමාර්... තාත්තට මතක නැද්ද, තාත්තගෙ ටෙස්ට්වල A අරං ටොප් ආව කෙනෙක්." මාව එහෙම අඳුන්වල දෙන්න තියෙනවනං කොච්චර දෙයක්ද? මේ විදිහට අඳුන්වල දෙන්න ඉඩ තොදී.

"තාත්තෙ... මේ හරිකුමාර්... තාත්තට මතක නැද්ද අර අපතයො ගොඩේ ඉන්නෙ? තාත්තගෙ ටෙස්ට්වලින් C එහෙම ගන්නෙ...??"

හරියටම නවයට වෙරිය ආව. නිකම්ම නෙවෙයි තඩි පොත් මිටියකුත් එක්ක. මට හිතුණෙ මිනිහ කොහේ හරි පුස්තකාලෙකට වැඩක් දීල එන පොත් හොරෙක් වගෙයි!

"හැමෝම ඇහුම්කන් දෙන්න... අපි ලෙක්චර් පටන් ගමු..." මිනිහ බොහොම ස්ථිරසාර හඬින් කිව්ව.

තමන්ගෙ කෙල්ලගෙ තාත්තව පළවෙනිම පාරට දකිද්දි පොඩි ගතියක් තියෙනව. මිනිහව මට පෙනුණෙ නේහාගෙ දිහා බලාගෙන බොහොම අදක්ෂ විදිහට හදපු අනුරුවක් හැටියට! හරියට නේහාගෙ ප්‍රතිමාවක් ඉටියෙන් හදල, ඊට පස්සෙ ඒක පුම්බල, ඊට පස්සෙ ඒක ඔහේ දිය වෙන්න ඇරියම ඒකට ලැබෙන පෙනුම වගේ පෙනුමක් තමයි වෙරියට තිබ්බෙ. මිනිහට තිබ්බ නේහගෙ වගේම රවුම් මූණක්. හකුපාඩා. ඒත් ඒක නේහාගෙ මූණ වගේ දෙකක් විතර ඇති. නේහාගේ තියෙන බොහොම සුමට දිදුලන, කම්මුල් වෙනුවට මිනිහට තිබ්බෙ එල්ලා හැලෙන කම්මුල් දෙකක්. නේහට තියෙන ඝන, දිගු කොණ්ඩෙ වෙනුවට මිනිහට තිබ්බෙ නිරුලා රෙස්ටොරන්ට් එකේ දෙන හැම්බර්ගර් එක තරමට මැද තට්ටයක්. බැරිවෙලාවත් නේහා හොරර් ෆිල්ම් එකක ඇවිදින මළමිනියක චරිතෙ... නැත්තං භූතයගෙ චරිතෙ කරන්න මේකප් කළොත් නේහවත් පේන්නෙ වෙරිය වගේ නේද කියල මට හිතුණ.

"කාලය සහ චලනය පිළිබඳ ඉගෙන ගැනීම තමයි මේකෙ හරය... ඉංජිනේරුවො හැටියට තමුන්ට හැකියාවක් තියෙන්න ඕනෙ මිනිස් ශ්‍රමය අවම භාවිතාවක පවත්වගෙන යමින්...





ඔය තුන්වෙනි පේළියෙ ඉන්න දෙන්න කතාව නවත්තනවද?" වෙරිය කිව්වෙ ඒ පේළියෙ, තමන්ගෙ පුද්ගලික විහිළුවක් මෙඳ හදාගෙන සතුටු වෙන පොරවල් දෙකකට චෝක් කෑල්ලෙන් දමල ගහන ගමන්.

"ඔං ඔයාගෙ මාමණ්ඩිය... හොඳට බලා ගන්න..." ආලෝක් කෙඳිරුව. "මිනිහට මාව පණපිටින් කන්න පුළුවන් වෙයි වගේ..."

අපේ කතුකුතු ගෑමත් බෝඩ් එකේ ලිය ලියා හිටිය වෙරියට ඇහුණ. පොර එක පාරටම පන්තිය පැත්තට හැරිල ඩස්ටර් එක එයාගෙ මේසෙට දමල ගැහුව.

"ඊළඟ මිනිත්තු හැට ගෙවෙනකල් එක්කෙනෙක්වත් කතා කරනව නෙවෙයි." මිනිහ ඒක කිව්ව ආඥාදායක විලාසෙට සදාම් හුසේන් වුණත් ඇකිළෙනව!

"පැහැදිලිද කිව්ව එක?"

ඩස්ට එකෙන් නැගිච්ච සියුම් දූවිල්ල මහ වලාකුළක් වගේ පන්තිය ඉස්සරහ පිරුණ. හරියට වෙරිය පන්තිය ඇතුළෙ අත්බෝම්බයක් පිපිරෙව්ව වගේ. ඒ දූම් වලාකුළට පිටිපස්සෙන් තිබ්බ වෙරියගෙ මූණ නොපෙනී ගියා. දෙයියනේ... මේ වගේ ඔල්මොරොන්දංකාරයෙක් එක්ක මගෙ නේහා කොහොමද මුළු ජීවිතේම, මෙච්චර කාලයක් ගෙව්වෙ? මට ඒ වෙලාවෙම නේහව ඒ රාස්සයගෙ ගුහාවෙන් බේරගෙන එන්න හිතුණ. මට හිතේ මැවුණ, මං එයා බේරගෙන, වෙරිය නිදියන් ඉන්න අතරෙදි, කඹයක් දිගේ වෙරියගෙ වහලෙ ඉඳන් බහින විදිහ. ඒත් මං කොහෙටද එයාව අරන් යන්නෙ? හොස්ටල් එක එච්චර හරි නෑ... අනික අපි හතරදෙනෙක් එක කාමරේ නිදා ගන්නෙ කොහොමද?

කාලය සහ චලනය ගැන වෙරිය කරපු පළවෙනි පන්තිය. මිනිහ ඒකෙදි උදාහරණෙකට ගත්තෙ ෂර්ට් ෆැක්ටරියක්. කියමු ඒ ෂර්ට් ෆැක්ටරියෙ ඉන්නෙ වැඩ කරන අය පස්දෙනයි කියල. ඕනෙනම් ඒ පස්දෙනාට වෙන වෙනම, එක්කෙනා එක ගාණෙ

ෂර්ට් පහක් හදනහැකි, නැත්නම් පස්දෙනාට ෂර්ට් එකක කෑලි බෙදාගෙන කරනහැකි. ඒ කිව්වෙ පළවෙනි එක්කෙනා කපනව... දෙවැන්න මූලික නූල් ඇදීම කරනව... තුන්වෙනිය මහනව... හතරවෙනිය බොත්තම් අල්ලනව... ඔය විදිහට.

"මේ විදිහට ශ්‍රම විභේදනය කරල කරන කටයුත්තට අපි කියනවා එසෙම්බ්ලි ලයින් කියල... හැබැයි මේකෙදි වගබලා ගන්න ඕනෙ හැම වැඩේටම එකම කාලයක් වෙන් කරල දෙන්න... නැත්තං නිෂ්පාදනය එක තැනක හිරවෙනව... එක තැනක ගොඩ ගැහෙනව... අපි හිතමු රෙදි කපන්න මිනිත්තු හයයි, මූලික නූල් අදින්න මිනිත්තු තුනයි යනව කියල. එහෙම නම් අපට පුළුවනි රෙද්ද කපන්න දෙන්නෙක් යොදවන්න. එතකොට එතනටත් මිනිත්තු තුනයි. ඒ විදිහට ගියහම බොහොම වේගවත් එසම්බ්ලි ලයින් එකක් හදා ගත්තැකි. එහෙම වුණාම කම්කරුවො එක කාර්යයකට නාභිගත වෙනව. ඒ කාර්යයට එක්ස්පර්ට්ල වෙනව. මේකෙදි ලැබෙන වැඩිපුරම වාසිය තමයි අමතර උපකරණ අවශ්‍ය නොවීම... උදාහරණයකට ගත්තොත් කතුරු පහක් ඕන වෙන ලයින් එක එක කතුරකින් වැඩේ කරගන්න පුළුවනි." චෙරිය විස්තර කළා.

ඒක බොහොම සාධාරණ ක්‍රමයක්. අන්තිමට ඉංජිනේරුවො කළ යුත්තෙ ඔය ටික තමයි. කම්කරුවන්ට වඩාත් කාර්යක්ෂමශීලීව වැඩ කරන හැටි කියා දීම... සම්පත් රැකගෙන, තියෙන සම්පත්වලින් උපරිම ප්‍රයෝජනය ගන්න හැටි පෙන්නල දීම.

"මිනිහගෙ කතාවෙ දෙයක් තියෙනව..." මං කිව්ව.

"ලියා ගන්න... ලියා ගන්න... ප්‍රශ්නවලදි ඔය ඕන එකක් අහන්න ඉඩ තියෙනව" ආලෝක් කිව්ව.

ආලෝක්නං හැමදාම අපතයෙක් තමා. මං හිතුව මිනිහගෙ නාහෙ හැරීම ඇර. නාහෙ හාරන පැත්තෙන්නං මිනිහ දක්ෂයෙක්! මං කියන්නෙ මේකයි. මම මේ පන්තියෙ මාර පොරක් නෙවෙයි. හැබැයි මං පන්තියෙදි අහන් ඉන්නව. ආලෝකයට ඕනෙ අකුරක්





නැර ලියාගෙන විභාගෙ පාස් වෙන්න විතරයි. ටෙස්ට් ගැන රයන් එක්ක කතා කරන්න ඕනෙ. මං හිතා ගත්ත.

හරියටම විනාඩි හැටකට පස්සෙයි, චෙරිය චෝක් කෑල්ල මේසෙ උඩින් තිබ්බෙ. මිනිහ දහ පාරක් විතර ෂර්ට් කොම්පැනිය උදාහරණෙට ගත්ත. ඒ දහ පාරම මිනිහ කොම්පැනියෙ සම්පත්, වෙලාව එක එක විදිහට සංයෝග කර කර උපරිම ප්‍රතිලාභෙ ගන්න පුළුවන් විදිහ පැහැදිලි කෙරුව. අයි.අයි.ටී. තියෙන සරලම විධික්‍රමයක් තමයි ඒ! සරල උදාහරණ සමහර විට සංකීර්ණ සමීකරණ බවට පත් වෙනව. චෙරිය එසයින්මන්ට් එකක් දුන්න. ඒ කියන්නෙ අඩුම ගාණෙ පැය දෙකක්වත් රෑට ලයිබ්‍රරියෙ කට්ට කන්න වෙනව.

මං රයන්ට පන්තිය ගැන විස්තර කිව්ව. "චෙරිය මාරයි... ඔන්න හිතන්න ෂර්ට් ෆැක්ටරියක් තියෙනව... ඒකෙ කම්කරුවො පස්දෙනෙක්..." මම චෙරිය වුණා.

"මොන පිස්සු කතාවක්ද...?" රයන් භාගයක් දුරදි බාධා කළා.

"ඇයි? මොකක්ද පිස්සුව? නිකං හිතන්න එක්කෙනෙක්ම මුළු ෂර්ට් එකක් බදා ගන්නෙ නැතුව... පස්දෙනා වෙනම වෙනම..."

"ඒ කියන්නෙ ඔයාට ඕනෙ එක ටේලර් කෙනෙක්ව රෙදි කපන්න විතරයි...? අනික් එකා බොත්තම් අල්ලන්න විතරයි? එතකොට මොක්කුද උන්? රොබෝලද?"

"ටිකක් මොළේ පාවිච්චි කරන්න... ඔයා ඒකට මේ සමීකරණෙ ආල බැලුවොත් එහෙම..."

"සමීකරණෙ මකබෑවෙද්දෙන්... ඒ මිනිස්සු තමන්ගෙ ගෙවල්වලට ගිහින් මොකක් කියන්නද ඔයාට ඕනෙ? 'මං අද ෂර්ට් දහයක් හැදුව...' කියල කියන්නද? එහෙම නැත්තං, 'මං අද බොත්තං පනහක් ඇල්លුව...' කියල කියන්නද? ඒක මානසිකව කොච්චර නිරවද්‍යද කියල ඔයාට හිතෙන්නෙ නැද්ද?"

"ඒක මොන මෝඩ කතාවක්ද?" මං වාද කළා. "ඒක කාර්යක්ෂමතාවෙ වැඩි කිරීමක්නෙ..." මම කිව්ව.

"ඒත් හිතන්න ඒ මනුස්සයෙක් ආසනං තමන්ගෙම අතින් ෂර්ට් එකක් හදන්න...? ඒ ෂර්ට් මෝස්තරේ වැඩි දියුණු කරන්න...? ඕවයෙන්ම පේනව චෙරියලගෙ ආකල්ප... එයාල මිනිස්සුන්ට සලකන්නෙ මිනිස්සු විදිහට නෙවෙයි... යන්ත්‍රසූත්‍ර විදිහට..."

"ඔයාට තේරෙන්නෙ නෑ... ඔයා ඇවිල්ල බලන්නකො දවසක එයාගෙ පන්තියකට... මිනිහ කියන දේවල් හරි තර්කානුකූලයි."

"ඔව්... ඔව්... ඔයාටනං දැන් මිනිහගෙ වරදක් පේන එකක් නෑ. ඇයි ඉතින් මාමණ්ඩියනෙ..."

"හරි ඒවයින් වැඩක් නෑ... ඇවිල්ල බලල විවේචනේ කරන්නකො..."

"අනේ වැඩක් නෑ... මොකෝ අපි විවේචනේ කළාය කියල මේ සිස්ටම් එක වෙනස් කරනවයැ... බොරු වැඩ...! යං... යං... ගිහින් එසයින්මන්ට් එක කරන්න..."

★

කැම්පස් එකෙන් එළියෙදි මට නේහාව හම්බ වුණා. එදා අපේ පාද යාත්‍රා දවස. ඒ කිව්වෙ ඒ වගේ දවස්වලදි අපි කරන්නෙ කතා කර කර දිග...ට ඇවිදගෙන යන එකයි. එදාට අපි ලබා ගන්නෙ පිරිසිදු වාතයයි, ගැඹුරු සන්නිවේදනයකුයි. (අඩුගාණෙ අපි එහෙම ලබා ගන්නව කියල අපි හිතනව.) ප්‍රේම පාද යාත්‍රාවල හොඳක් තියෙන්නෙ වියදමක් නැති තරම් වීමයි. රයන්ගෙ ස්කූටරේට තෙල් ගහන්න මගෙ වාරෙ උදා වෙලා තිබ්බත් නැට්ටට හිදිල නිසා ඒක කරගන්න විදිහක් නැතුව හිටියෙ. ඉතින් ඇවිදින ගමන් ආදරේ කරන එක ඒකට හොඳ විකල්පයක් සැපයුව. නේහා තමයි කොහාට ඇවිදිමුද කියල තීරණේ කළේ. එයා තෝර ගත්ත





කැම්පස් එකෙන් කිලෝමීටර් දෙකහමාරක් වගේ එහා තිබ්බ ගමක්. එතකොට යන්නයි එන්නයි කිලෝමීටර් පහයි.

"කියන්නකො බලන්න ඔයා මොනවද අපේ තාත්ත ගැන හිතන්නෙ කියල?" නේහ මගෙන් ඇහුවෙ, හරියට එයා ඒ ප්‍රශ්නෙ මගෙන් ඇහුවම මං ප්‍රීතියෙන් පිනා යයි කියල හිතල.

"මං ඉතින් එයාව එහෙමටම දන්නෙ නෑ... තාම එක දවසනෙ හම්බ වුණේ... මං හිතන්නෙනං එයා තද නීතිකාරයෙක් කියල... ඔයා කොහොමද එයා එක්ක ඉන්නෙ?"

"ඔයා දන්නවද... එයා බ්‍රයිටො ගැන මාර විදිහට පැහැදෙනව... එයාගෙ කෝර්ස් එක නියමෙට කළොත් ඔයාටත් ඒ චාන්ස් එක වදියි."

"බලමුකො ට්‍රයි එකක් දීල... ඒත් මට කවදාවත් 'ඒ' එකක් හම්බ වෙලා නෑ. අනික එයා සුමානෙකට එසයින්මන්ට්ස් දුසිමක් විතර දෙන්නයි හදන්නෙ. ඒ අස්සෙ වයිවා එකකුත් තියෙනව... මට පේන්න බෑ ඔය වයිවාස්... ඔයා දන්නවනෙ...?"

"ඔයා 'ඒ' එකක් ගහ ගත්තොත් මට එයාට කියන්න පුළුවන් වෙයි ඔයා මගෙ යාළුවෙක්ය කියල..."

"බලමුකො... ෆුල් ට්‍රයි... ඒක නෙවෙයි... අපි මේ කොහෙද යන්නෙ?"

"යංකො... මගෙ හිතේ තියෙනව තැනක්..." එයා කිව්ව.

මං සද්ද නැතුව හිටිය. මං හිතුව එයා තෝරගෙන ඇත්තෙ කාත් කවුරුවත් නැති පාළු තැනක් වෙන්න ඕනෙ කියල. කෙල්ලෙක් එක්ක තනිවෙන ඕන කොල්ලෙක්ගෙ ප්‍රාර්ථනාව ඒකනෙ. මුකුත් නොකර, ඉන්න පුළුවන්, කාගෙවත් ඇහැ නොගැටෙන නිදහස් තැනක්. රෙස්ටොරන්ට්වල, ෆිල්ම් හෝල්ස්වල, අයිස්ක්‍රීම් පාලර්ස්වල අපි හම්බ වෙනව තමයි. ඒත් කී දෙනෙක්ගෙන් වට වෙලාද අපි ඉන්නෙ? ඔය කෙහෙල්මල් රෙස්ටොරන්ට්සුයි, අයිස්ක්‍රීම් පාලර්ස්සුයි, ෆිල්ම් හෝල්සුයි හදන්නෙ නැතුව, හිස් කාමර පේළි පේළි හදනවනං කොච්චර හොඳද?

මඩ චොරොප්පු වුණු පාරක්දිගේ මාව එක්කන් ගියේ කට්වාරියා කියන ගම දිහාට. ඒකෙ බාගෙට හෙලුවෙන් හිටිය කොල්ලො කුරුට්ටො අපි දෙන්න දිහා බැලුවෙ අඟහරු ලෝකෙන් ගොඩ බැහැපු එවුන් දෙන්නෙක් දිහා බලන්නා වගේ. මීහරක් දෙන්නෙකුත් අපි එක්කම වගේ කම්මැලිකමෙන් අඩි තිබ්බ.

"ඔයා දන්නවද ඔයා කොහෙටද යන්නෙ කියලා ෂුවර් එකටම?" මං නේහගෙන් ඇහුවෙ සැකෙන්.

"නැතුව... දැක්කද අර මේ පාර කෙළවරේම තියෙන කෝවිල?" නේහා මට ඇඟිල්ල දික්කරල පෙන්නල ඇහුව. මං ඇස් පුංචි කරල බැලුව. කිලෝමීටරයක් වගේ ඈතින්, නිල් ආකාසෙ කෝවිලක කොඩිය ලෙළ දුන්න. මීහරක් දෙන්න තීරණේ කළා අපිව ඇලා තනියම යන්න. උන් දෙන්න වෙන පැත්තකට හැරුණ. එතන ඉඳන් අපි අඩිය තිබ්බෙ තනියම.

අපි කෝවිල ළඟට ආව. ගරා වැටුණු ගතියක් ඒකෙ තිබ්බෙ. පැත්තක තිබ්බ කෙටි බැම්ම උඩ අපි වාඩි වුණා. දඩාවතේ යන බල්ලෙක් පැත්තක වැතිරිලා ඉඳන් අපි දිහා බැලුව. කෝවිලට ටිකක් ඉස්සරහට වෙන්න තිබ්බෙ රේල් පාරක්. දිල්ලියට යන රේල් පාරක් වෙන්න ඕනෙ. නගරාන්ත දුම්රිය සේවයක රේල් පාරක් වෙන්න ඕනෙ. පැය දෙක තුනකට සැරයක්ලු කෝච්චියක් යන්නෙ.

"මේ අස්සක කෝවිලක් මොකට හැදුවද මන්ද...?" මම කිව්වෙ එයාගෙ අතක් අල්ල ගන්න ගමන්. බල්ලා අහක බලා ගත්ත. වෙන කිසිම පණ ඇති සතෙක් පැත්ත පළාතක ඉන්න බවක් පෙනුණෙ නෑ.

"මං හිතන්නෙ මේ ගමේ මිනිස්සු සමහර විශේෂ දවස්වලට විතරක් මෙතනට එනව ඇති... කොහොම වුණත් මං මෙතනට ආසයි." නේහා මට හේත්තු වුණා.

අපි සිපගත්තා. කිස් කිරීම පටන් ගත්තෙ එයාද මන්ද කියල මට මතකයක් නෑ. කෙළින් ඉන්න ගර්ල් ෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්න





එකේ එක හොඳක් ඒකයි. කිස් කරන්න ඕනෙ වුණාම ඒකට පොර අල්ල අල්ල ඉන්න ඕනෙ නෑ. ඕන වෙලාවක රෙඩි! හැබැයි ඉතින් නේහා එක්ක එච්චර තමයි. ඉන් එහාට යනව බොරු. මං එයාගෙ උරිස්ස වටේ අතක් දා ගත්තෙ ලේසි වෙන්න. ඊට පස්සෙ මම ඒ අත නොදැනිම වගේ එයාගෙ පපුව දිහාට ලිස්සල එච්චෙ හොඳට ප්ලෑන් කරලා. ඒක වුණේ බැරි වීමකින්ය කියල එයාට අඟවන්නයි මට ඕන වුණේ. කොහොම වුණත් මේ පාර එයා ඒකට එච්චර විරෝධයක් පෙන්නුවෙනං නෑ. මං ඒ ගැන බොහොම සතුටෙන් ඉද්දිදි තමයි එයා එක පාරට මාව පැත්තකට තල්ලු කරල කෙළින් වුණේ.

"එපා... නවත්තන්න..."

"ඔයා හරි ලස්සනයි..." මං කිව්වෙ බොහොම විනීත, හැදිච්ච එකෙක් වගේ.

"අනේ මේ... මාව වර්ණනා කළාට ඒව හරියන්නෙ නෑ... තේරුණාද? අනේ ඇත්තට මේ කෝවිලක් ළඟදිවත් එක විදිහකට ඉන්න බැරිද ඔයාට...?" නේහා හිනාවෙන්න ගත්ත.

යකෝ... මේක මාර වැඩක්නෙ. කෝවිලක් ළඟ ඉඳන් කිස් කරන්න හොඳයි... අත පොඩ්ඩක් බැරි වෙලා පහළට රූටන එක තමයි කෝවිලක් ළඟදි හොඳ නැත්තෙ! නේහත් හරිම විසංවාදියි බැලුවම... පරස්පර විරෝධියි! වැඩක් නෑ වාද කරල. මං එයාට ආපහු ටිකක් ළං වුණා.

"කිස් කරනව විතරයි... හරිද...? වැරදි වැඩ බෑ ඕං..." නේහා රතු එළියක් දැම්ම.

අපි තව පැය භාගයක් විතර එහෙමම හිටිය. එකිනෙකාගෙ තුරුලෙ. ඔහේ වල්පල් කතා කර කර. අන්තිමේදි අපි ගෙදර යන්න නැගිට්ට. වැතිරිලා හිටිය බල්ලා ඔළුව උස්සල බලල, ආපහු නිදා ගත්ත.

"ඔයා දන්නවද මගෙ අයිය මැරුණෙ මෙතනදි බව?"

ඇත්තටම නේහාගෙ අයියා මැරුණෙ කොහොමද කියන එක ගැන වැඩි විස්තර මම දැනගෙන හිටියෙ නෑ. කොහොමටත් තමන්ගෙ කෙල්ල කියන දේ අහන එක කොල්ලගෙ යුතුකමක්.

"නෑ... ඇත්තට මම දැනගෙන හිටියෙ නෑ... මොකද වුණේ?"

"මට තාම ඒ දවස හොඳට මතකයි... මැයි එකොළහ... අයියා ජොගින් කරන්න කියල ගියා. දවල් එකොළහ විතර වෙනකොට අපිට කෝල් එකක් ආවා... ඇත්තටම කෝල් එක ආවෙ තාත්තට. එයා අපිට විස්තරේ කිව්වෙ හවස. මට එයාගෙ බොඩි එකවත් බලන්න දුන්නෙ නෑ..." නේහගෙ කටහඬේ ඇඹුම්බර ගතිය එන්න එන්නම වැඩි වුණා.

අපි ගමට කිට්ටු වෙලයි හිටියෙ. එයාට මගෙ උරිස්සට වාරු වෙලා අඬන්න ඉඩ දෙනවද කියල මං කල්පනා කර කර හිටියෙත් ගමට ළං වෙච්ච හින්දමයි. ඒත් ඒ වෙනකොටත් එයා අඬන්න පටන් අරගෙන තිබුණ. මගෙ උරිස්සට වාරුවෙලා. ඒ හින්ද මට ඒ ගැන තවත් හිතන්න ඕන වුණේ නෑ.

"නේහා... මොනව කරන්නද? ඒව අපිට වෙනස් කරන්න බෑනෙ..."

මං නේහාව සනසද්දි හඩු ඇඳුම් ඇඳ ගත්තු කොල්ලො දෙන්නෙක් අපි දිහා කට ඇරන් බලන් ඉන්නව මං දැක්ක. පුංචි ඇට්ටරයො දෙන්නෙක්. මං හිතන්නෙ චිත්‍රපටිවල ඇරෙන්න ඇත්තටම කෙල්ලෙකුයි කොල්ලෙකුයි තුරුල් වෙලා ඉන්නව එයාල දැක්ක පළවෙනි වතාව වෙන්න ඕනෙ.

නේහා මගේ තුරුල්ලෙන් මිදුණෙ ඇට්ටරයො දෙන්න තුන්දෙනා වෙලා, තුන්දෙනා, හතර, පහ වෙලා, අට දෙනෙකුට නැග්ගට පස්සෙයි.

"ඕ... කොහෙන්ද මෙයාල පාත් වුණේ?" නේහා කඳුළු පිහදාන ගමන් ඇහුව.





ඇට්ටරයො අටදෙනා (ඒකෙන් හතරදෙනෙක් විතර හිටියෙ හෙලුවෙන්) අපි දිහා ඇස් උඩ තියාගෙන බලාගෙන හිටියෙ හරියට ෆිල්ම් එකක් බලන ගානට!

"ජේනවනෙ... මෙයා තමයි නිළි රජිනි..." මං එයාලට කිව්ව.

"රවීනා තන්ඩන්..." ඇට්ටරයො අතරෙ හිටිය අවුරුදු තුනක විතර එකෙක් කිව්ව.

ඒ පාරනං නේහාට හිනා ගියා. "ඇති යන්තං." මං හිතෙන් කිව්වෙ එයාගෙ සැහැල්ලු ගතිය ආයෙ ආව හින්ද.

අපි ඔහේ දිගටම ඇවිදගෙන ආව. කැම්පස් එක ළඟට එනකල්. අපි වෙන්වෙලා පිය නඟන්න ඕනෙ පාරවල් දෙක හම්බ වෙනකල්.

"තාත්තගෙ කෝස් එකේ ටොප් ලෙවල් ස්ටුඩන්ට් කෙනෙක් හැටියට මට ඔයාව එයාට අඳුන්වල දෙන්න ඉඩ ලැබේවි සමහරවිට..." නේහා ඇහැක් ගහල මට කිව්ව. එයා මගෙන් වෙන්වෙලා ඈතට යන හැටි මං බලාගෙන හිටිය. මං විනාඩි පහක් විතර ඒ දිහා බලාගෙන හිටිය. ඊට පස්සෙ මාත් කැම්පස් එක දිහාට ඇවිදගෙන ගියා. මං එයාට ආදරේ කරනවද? මං පාරෙ තිබ්බ පුංචි ගලකට පයින් ගැහුව. එයා එච්චරටම විනෝදකාමී. මාර කෙල්ලෙක් තූතනං ආදරේ නොකර ඉන්න තිබ්බ...!

# 14

## වොඩ්කා

ආලෝකය ගෙදර ගිහින් ආවෙ කඟවේණ වගේ. එච්චර හදිස්සියෙන්.

"කොහොමද අම්මටයි, තාත්තටයි?" මං මිනිහගෙන් ඇහුවෙ, සසී රෙස්ටොරන්ට් එකේදිත් මිනිහ හිටපු අසාමාන්‍ය නිශ්ශබ්දතාව දැකල. කොච්චර හරි, "අද විශේෂ" මොනවද කියල අහන්නවත් මිනිහ උනන්දුවක් නොවෙච්චකොට. මිනිහ කෑම ගැන උනන්දු නොවෙනව කියන්නෙ මොකක් හරි ලොකු අවුලක් කියන එකයි.

"මොනවද ඉතින්... වෙනද චරුවුරුවම තමයි... මේ පාර තවත් ජිල්මාට් එකක්. ආයෙත් අක්කට හරියන මඟුලක් ඇවිත්... ඒත් ඉතින් ඉල්ලන දැවැද්ද අපිට දීගන්න බෑ... එක්කො අපි ඒකට බෑ කියන්න ඕනෙ... නැත්තං දෙන්නං කාසිවලට මඟුල කන්න ඕනෙ..."

"ඒ කිව්වෙ?"

"ඒ කිව්වෙ මං මේකෙන් අවුට් වෙලා ජොබ් එකක් කරද්දි එයාලට සල්ලි දෙන පොරොන්දුව පිට!"

"ඒ මොන පිස්සු වැඩක්ද?" රයන් කිව්ව. මිනිහ සසී එකට ආවෙ අපිට පස්සෙ. හොඳට නිදාගෙන නැඟිටල එහෙම!

"ඒ වුණාට ඒක මගෙ යුතුකම. මං එයාලට ආදරෙයි... මං ඒක කරදරයක් කියල හිතන්නෙ නෑ..." ආලෝක් කිව්වෙ බොහොම චොර වෙච්ච ගතියෙන්.





"ඉතින් මොකක්ද ඔයා කරන්න යන ජොබ් එක?" මං ඇහුව.

"ඕන මඟුලක්... මට වැඩි ගාණක් ගෙවන ඕන ජොබ් එකක්..." ආලෝක් කිව්ව.

"ඒක මහ ගොන් කතාවක්..." රයන් කියන්න ගත්ත. "ඇයි ඔයා කැමති නැද්ද ඔයා කැමති මොනව හරි කරන්න?"

"මට ඕනෙ සල්ලි..." ආලෝක් කිව්වෙ මිනිහගෙ කෑම ඉවරයක් කරන ගමන්. ඒ සල්ලි හම්බ වෙනකල් මිනිහ පරෝටා ගැන වග බලා ගනීවි!

ඒ වෙද්දි ඒ සෙමෙස්ටර් එකේ මැද. මට ඕන වෙලා තිබ්බෙ එක දෙයයි. ඒ තමයි, ඊළඟ ටෙස්ට් එකෙන් හොඳ ලකුණු ගැනීම. අවුරුදු තුනක් ඉවර වෙද්දි අයි.අයි.ටී. එකේ ඉන්න ඕනෙ එකෙක් දන්නව තමන්ගෙ තැන මොකක්ද කියන එක. මේ අවුරුදු තුනේදිම අපි හිටියෙ පහයි පොයින්ට් ගණන් අතරෙ. අපිට තිබ්බෙ බොහොම නිවිච්චි අරමුණු. ඒ හින්ද අපිට හම්බ වෙච්ච ග්‍රේඩ්ස් ගැන අපි එච්චර හිත කරදර කර ගත්තෙ නෑ. ඒත් මේ පාරනං මට ඕනෙ වුණා ඉංග්‍රීසි හෝඩියෙ අර ලස්සන අකුර "A" මගෙ ග්‍රේඩ් ෂීට් එකේ තියෙනව දකින්න. මගේ ඒ උදාර අරමුණ ගැන ආලෝකය මට අනතුරු ඇඟෙව්ව.

"චෙරිය ඔයාව පණ පිටින් කාවි... බලාගෙන... ඔයා දන්නවනෙ මිනිහ එක ටර්ම් එකකට A අකුරු දෙකකට තුනකට වඩා නොදෙන බව. නේ...??"

"ඒකනං මං දන්නව. මට ඕන්නැති ග්‍රේඩ් එකක් නෑ. ඒත් මට නේහව ඕනෙ..."

"මෙච්චර කල් දීපු එසයින්මන්ට්ස්වලින් ඔයාට ලකුණු කීයක් හම්බ වෙලා තියේද?"

"හතළිහෙන් තිස්තුනක්! ඇයි ඉතින් මං හරකෙක් වගේ මැරීගෙනනෙ ඒව කළේ."

"හරි... හරි... ඒ වුණාට A එකක් ගන්නනං ඔක්කොම ලකුණු අසූවක් ඕන බව ඔයා දන්නවනෙ?"

"හ්ම්ම්... ඒකෙන් වයිවා එකට දෙන ලකුණු දහයට තමයි කෙළමවෙන්නෙ..."

"අනික්වයෙන් ඔයා වැඩිම ලකුණු ගත්තොත් මිසක් නැත්තං වයිවා එක ගොඩ දාගන්නනං වෙනව පුතෝ... නැත්තන් ඉතින් A වානා..."

"හ්ම්... ඒක තමයි වැඩේ. කොහොම හරි ඒක කරගන්න ඕනෙ..." මං එහෙම කිව්වත් වයිවා එක කියන වචනෙ ඇහෙනකොටත් මගේ ඇඟ හිරි වැටෙන බව මං මිනිහට ඇඟෙව්වෙ නෑ.

"රිලැක්ස් මැන්. රිලැක්ස්. B එකක් වුණත් අවුලක් නැනෙ."

"නැහැ... මට ඕනෙ A එකක්... ඔව්... A එකක්මයි." මං ආලෝක්ට කිව්ව.

"හරි... හරි... එළ! ඕල් ද බෙස්ට්...!!" ආලෝක් කිව්වෙ, තවත් පරෝටා පිඟානක් මේසෙට එද්දිමයි.

"කොහොමද ඔයාගෙ කෙල්ල?" රයන් ඇහුව.

"අවුලක් නෑ... ඔය ඉන්නෙ. ඔයා දන්නවද නේහා මාව අරන් ගියානෙ එයාගෙ අයිය ඇක්සිඩන්ට් වෙච්චි තැනට. ෂෝ... එක අතකට ඒක මහ පිස්සු වැඩක්. නැද්ද හොඳයි...?" මං උත්තර දීල, ප්‍රශ්නෙකුත් ඇහුව.

"ඒ ඉතින් ඔයා එයාට විශේෂ කෙනෙක් නිසා වෙන්න ඇති. අනික ඒ තැන වුණත් එයාට විශේෂයිනෙ..." ආලෝක් ඒ ආරංචිය කපල කොටල බැලුව.

"හ්ම්ම්... ආලෝකය හරි... එයා ඔයාට කැමතියි." රයන් කිව්ව. "කොයි කාලෙදිද එයාගෙ අයිය නැති වෙලා තියෙන්නෙ?"

"අවුරුදු තුනකට විතර කලින්... මැයි එකොළහලු දවස... එයා උදෙන්ම ජොගින් ගියාලු... දවල් කෝල් එකක් ආවලු... එතකොට තමයි දැනගෙන තියෙන්නෙ එයා කෝච්චියට හැප්පිච්චි බව..."





"මාරයිනෙ... හරිම පුදුමයි..." ආලෝක් කිව්ව. "මං හිතාගෙන හිටියෙ ඒ කෝච්චියෙ කවුරුත් යන්නෙ නෑ කියලයි. ඒකෙ යන්නෙ බඩු කෝච්චි විතරයි නේද?"

"අයියෝ - නිකං ගොන් කතා කියන්න එපා. නේහගෙ අයිය මැරිල තියෙන්නෙ ඒ කෝච්චියට නගින්න ගිහිල්ල නෙවෙයි. දන්නෙම නැතුව ඒකට හැප්පිලා..."

"ඒක මහ භයානකයි... හිතනකොටත්." මං කිව්ව.

"ඒත් මං කල්පනා කරන්නෙ මේකයි... මොන යකාද ඔය මැයි මාසෙ ඔය වෙලාවට ජොගින් කරන්න යන්නෙ...? ඒ වෙලාව පට්ට රස්නෙ වෙලාවක්නෙ...? දන්නවනෙ මැයිවල රස්නෙ ගැන...?" රයන් ෂර්ලොක් හෝම්ස් වෙන්න හැදුව.

"ඒ මනුස්සය මළා... ඔයා මැරිච්ච මනුස්සයවත් විහිළුවට ගන්නද හදන්නෙ?" මම රයන් කියපු දේට එච්චර කැමති වුණේ නෑ.

"මං කිව්වෙ ඒක නෙවෙයි. මං එහෙම දෙයක් අදහස් කළේ නෑ... ආලෝක් කීයටද ඔය රේල්පාරෙ පළවෙනි කෝච්චිය යන්නෙ?"

"අනේ මන්ද... මං දන්නෙ කොහොමද?" ආලෝක් කිව්වෙ නොරිස්සුම් ගතියෙන්. මං හිතන්නෙ රයන්ගෙ ප්‍රශ්න කිරීම මිනිහ පරෝටා ගිලින එකට බාධාවක් වෙච්ච නිසයි, රයන් ඇණයක් වේගෙන එන නිසයි වෙන්න ඕනෙ.

"මං හිතන්නෙ උදේ දහයට... ඇයි?" මං කිව්ව.

"හහ්... මැයි මාසෙ උදේ දහය කියන්නෙ පැළෙන්න රස්නෙ වෙලාවක්... සෙන්ටිග්‍රේඩ් හතළිහට විතර නගින වෙලාවක්... මං ආයෙ අහන්නෙ ඔය වෙලාවට ජොගින් කරන්න යන්නෙ කවුද? පිස්සෙක් ගියොත් මිසක?"

"හරි ඉතින්... මිනිහ ගියානෙ. ඒකනෙ හැප්පිල මැරුණෙ." ආලෝක් කිව්ව. ඒ කිව්වෙත් මල පැනල. ආලෝකය ජීවිතේට

ජොගින් ගිය එකෙක් නෙවෙයි. ඉතින් මිනිහ ඒ ගැන මොන මළ දානයක්වත් දන්නෙ නෑ.

"මං දන්නව මිනිහ මැරුණු බව... ඒත් මගෙ පොයින්ට් එක තමයි..." රයන් එතනදි කතාව නැවැත්තුව. "එක්කො ඕනෙ නෑ..."

"මොකක්ද...? කියන්න... කියන්න... මට දැන ගන්න ඕනෙ..." මං බල කළා.

"හ්ම්ම්... ඔයාට හොඳටම විශ්වාසද ඒක ඇක්සිඩන්ට් එකක් බව?"

★

චෙරියගෙ වයිවා එක තියෙන දවසෙ, මං ඇහැරුණේම ඔළුව කැක්කුමක් එක්ක. ප්‍රධාන පරීක්ෂණේට තව සුමාන දෙකක් විතර තිබ්බත්, මේ වයිවා එක මට මාර වැදගත්. ඒ ලකුණු හරිම තීරණාත්මකයි. "නිදාගනින්... හොඳට නිදාගනින්..." මං එහෙම සිය පාරක් විතර ඊට ඉස්සරින්ද රෑ මටම කියා ගන්න ඇති. ඒත් මොන? එළිවෙනකම්ම බාගෙට ඇහැරිලා.

උදේ රැවුල කපන්න ගියාම රයනුත් එතන හිටිය.

"මොකද මේ...? නිකං බාගෙට මැරිච්ච ගානට?" මිනිහ ඇහුව.

"හරියට නින්ද ගියෙ නැනෙ... මං දන්නව... අදත් මට කෙළවෙනව..." මම කිව්වෙ මූණට වතුර දෝතක් ගහගන්න ගමන්.

රයන් මිනිහගෙ ගිලට් ෂේවිං ජෙල් කෑන් එක දෙපාරක් එබුව. ලස්සන කොළ පාට ෂේවිං ක්‍රීම් දහරාවක් ඒකෙන් මිනිහගෙ අල්ල උඩට ගලාගෙන ආව. ඒක මූණෙ ගානට අතුල්ලගෙන





මිනිහ මිනිහගෙ තල දෙකේ රේසරේ ලෑස්ති කරන්න වුණා. ඒ ඔක්කොම මිනිහගෙ දෙමවුපියො මිනිහට එවපු දේවල්. ලස්සන නැති එකෙකුට ඒව එව්වනං, අඩුගානෙ ඌ ටික වෙලාවකට හරි ලස්සනට ඉඳීවි. අඩු ගානෙ ආලෝකයට වගේ රයන්ගෙ මූණෙ කුරුලෑවක්, දෙකක්වත් එන්නෙ නැත්තෙ ඇයි? ෂිඃ... මං මොනවද මේ හිතන්නෙ... මොකටද මං රයන්ට ඊරිසියා කරන්නෙ? ඌ හොඳ එකා...!

"හරී... මේක අහගන්නව..." රයන් මූණ හරහා බොහොම හුරුබුහුටි විදිහට රේසරේ යවන ගමන් කිව්ව. "ඔයා මේක කොහොම හරි අවුල් කරගන්නෙ නැතුව කරන්න ඕනෙ. ඔයා මේක කෙළව ගන්නව කියන්නෙ බිග්ටයිම් ජීවිතේම කෙළව ගන්නව කියන එකයි... අනික ඔයා ඒ අහන ප්‍රශ්නවලට උත්තර නොදන්නව නෙවෙයිනෙ... ඔයා හොඳටම ඒ උත්තර දන්නවත් එක්ක..."

"උත්තර දැනගෙනත් උත්තර දෙන්න බැරි වෙච්ච එක මට ඒ කාලෙ ඉඳලම තිබ්බ අවුලක්නෙ... මේක ඊටත් එහා... වයිවා එක කරන්නෙ චෙරියනෙ... මට වඩා හොඳට වයිවා කරන එවුනුත් චෙරිය කිව්වම වෙවුලනව..."

"හ්ම්ම් ඒක නෙවෙයි... මංනම් චෙරියගෙ වයිවාවලට යන්නෙ නැනෙ... ඒත් ඔයා ඔච්චර බයනං මට තියෙනව හොඳ අයිඩියා එකක්..."

"ඔයා යන්නෙ නෑ...? සීයට දහයක් වතුරෙ යවා ගන්නද හදන්නෙ? අනික මිනිහගෙ වයිවා එකට ආවෙ නෑයි කියල දැන ගත්තොත් මිනිහට යකා නඟියි."

"මං මටම දිවුරගෙන තියෙන්නෙ මිනිහගෙ මුඩුම මූණ ආයෙ මගෙ ඇස් දෙකට දකින්න ඉඩ තියන්නෙ නෑ කියල... අනික කවුද ඔය සීයට දහය ගණන් ගන්නෙ? ඒක ගන්නයි කියල පලයල්ලකො චෙරියගෙ නැට්ට පස්සෙ... මංනං යයි..."

"මන්ද... ඒක ඉතින් ඔයාගෙ වැඩක්... ඒත් මංනං හිතන්නෙ ඔයා ආවොත් තමා හොඳ... ඒක නෙවෙයි, මොකක්ද ඔයාගෙ අයිඩියා එක...?"

"ඒක හරියටම වැඩ කරයිද කියලනං කියන්න බෑ."

"හරි... හරි... කියන්නකො... ඔච්චර අගේ කර කර ඉන්නෙ..." මං කිව්ව.

රයන් තුවායෙන් මූණ පිහිද ගත්ත. ඊට පස්සෙ ඇමෙරිකාවෙන් එවපු, සුවඳ විහිදෙන ආෆ්ටර්ෂේව් බෝතලයක් ඇරල ඒකෙන් ටිකක් අල්ලට දාගත්ත. දාගෙන අල්ලවල් දෙක එකට අතුල්ලල, අත් දෙකෙන් කම්මුල් දෙකට ගහ ගත්ත.

"වොඩ්කා... ඒක තමයි විසඳුම..."

"මොකක්...? වොඩ්කා...? මං කතා කරන්නෙ වයිවා එක ගැන. මං පාටි එකක් ඕගනයිස් කරනව නෙවෙයි."

"හරි... හරි... ඒක මං දන්නව. ඒත් ඔයා දන්නවනෙ වොඩ්කා ෂොට් එකක් දෙකක් දා ගත්තම ඇනෙන සැහැල්ලුව... විශ්වාසෙ... වැඩිපුර කතා කරන්න පුළුවන් වෙන එක... කවුද දන්නෙ සමහරවිට ඒක ඔයාට වැඩ කරාවි..."

"ඔයාටනං පිස්සු... වයිවා එක තියෙන්නෙ උදේ එකොළහට... ඒ වෙලාව බොන වෙලාවක්යැ...?"

"ඔයා වයිවා එකෙන් බිංදුව ගත්තොත් ඔයා හිතනවද කවදාවත් නේහා ඔයාව එයාගෙ තාත්තට අඳුන්වල දේවි කියල?"

ලොකු බිංදුවක් මගෙ ඔළුව ඇතුළෙ පිනුම් ගහන්න ගත්ත. ඊට පස්සෙ ඒක මගෙ ඇස් ඉස්සරහට ඇවිත් විරිත්තන්න ගත්ත.

"ඔයා කියන්නෙ කොච්චරක් විතර?" මං ඇහුව.

"වැඩිය නෑ... ෂොට් දෙකක් විතර... ඕනැනං එන්න... මං ටිකක් හංගන් ඉන්නව..."





මං රයන් එක්ක ගියා. මිනිහගෙ බ්‍රැන්ඩඩ් ඇඳුම් මැද්දෙ තමයි වොඩ්ක බෝතලේ තිබ්බෙ. බෝතලේ ළඟම ඇමරිකාවෙ මුද්දර ගහපු ලියුම් කවර ගොඩකුත් තිබ්බ. රයන් ළඟ තිබ්බ වීදුරුවකට තුනෙන් එකක් විතර වොඩ්ක පිරෙව්ව.

"මොනවද මේ ලියුම් කවර?" මං ඇහුව.

"ඒ මේ නිකං ඒව..." රයන් දෙකට දෙවාරන උත්තරයක් දුන්න. "හරි... මෙන්න ගහල දාන්න... එකයි... දෙකයි... තුනයි..." මිනිහ වීදුරුව මගෙ අතට දීල, රේස් එකක් පටන් ගනිද්දි වගේ ගණන් කරන්න ගත්ත.

ඇත්තම කිව්වොත් එතන ලියුම් කවර සීයකට වඩා තියෙන්න ඇති. මිනිහ ඒවා ගැන ගාණක් ගත්තෙ නැති එක මට හරි පුදුමයක් වුණා.

"ඔයාලගෙ අම්මලගෙන් වෙන්න ඇති... නේ?" මං අඩමාන ප්‍රශ්නයක් ඇහුව.

"ඔව්... ආ... මේකත්." රයන් තවත් වොඩ්කා ෂොට් එකක් මට දුන්න.

"වැඩි වෙයිද දන්නෑ... ඔයාට ෂුවර්ද?" මං ඇහුව.

"මොන පිස්සුද...? තුනක් ගහන්න... එතකොට තමා ගාණ... මාත් ගන්නං ඔයා එක්ක..."

මං තුන්වෙනි ෂොට් එක ඇම්මෙ රයන් එක්ක. හිස් බඩට වොඩ්කා වැටෙනකොට මට දැනුණෙ, මං ගින්දර බෝලයක් ගිල්ල ගානට.

"හරි... යං... ගිහින් මගෙ මාමණ්ඩිය හම්බ වෙමු..." මං කිව්වෙ බොහොම ප්‍රීතිමත් ස්වරෙකින්. බඩු වැඩ!

"ඕල් ද බෙස්ට් හරී... ආහ්... ඒක නෙවෙයි... අර ලියුම් කවර ගැන ආලෝක්ට එහෙම කියන්න එපා... හරිද?"

"මොනව කියන්නද ඒ ගැන?" ඇත්තටම මං ඒ ගැන මොනවත් දැනන් හිටියෙ නෑ. අනිත් එක, රයන් මට එහෙම නොකියන්න, මං ඒක ආලෝක්ට නොකිය ඉන්න තිබ්බ.

"මුකුත් නෑ... එයාට ඒ ගැන මොනාවත් කියන්න එපා. අම්මල මට හැම සුමානෙම ලියනව... හැම මාසෙටම සැරයක් චෙක් එකක් එවනව. මං උත්තර ලියන්නෑ... එච්චරයි."

"ඇයි ඔයා උත්තර නොලියන්නෙ?" මං ඇහුවෙ වොඩ්කා බඩ ඇතුළෙ ඉතාම සතුටුදායක පරිසරයක් ඇති කරමින් ඉන්දැද්දි.

"මට එයාලව අල්ලන්නෙ නෑ... මට පේන්න බෑ... ඇත්තම කිව්වොත් මං එයාලව ශත පහකට ගණන් ගන්නෙ නෑ... එයාලත් එහෙමයි... එහෙම එකේ බොරුවට වෙන චිත්‍රයක් මවාපාන්න ඕනෙ නෑනෙ...!" රයන් කිව්ව.

"රයන්... ඔයා දන්නවද ඔයා දෙමවුපියන්ව ගණන් ගන්නෙ නැහැයි කියන කීමෙ තියෙන බරපතළකම? බේදවාචකය...?" මං වෙනුවට වොඩ්ක කතා කරන්න ගත්ත.

"ඔව්... ඉතින් මොකෝ?"

"මං හිතන්නෑ ඔයා ඇත්ත කියනවයි කියල. මං කියන්නෙ, ඒක කොහොමද ඇත්තක් වෙන්නෙ?" මං රයන්ගෙ ස්වරය ගැන හිතන්නැතුව කිව්ව. මං ඇත්තටම මගේ අදහස හරි කියන මතෙයි හිටියෙ. මිනිහට ඔච්චර ආෆ්ටර් ෂේව්, ජෙල්, ඇඳුම් එවන දෙමවුපියන්ව ගණන් ගන්නෙ නැතුව, කොහොමද මිනිහ ඉන්නෙ? කොහොමද එයා එයාලට ආදරේ නොකර ඉන්නෙ?

"මං කිව්වෙ ඇත්ත... ඔයාට තාම මේව තේරෙන්නෙ නෑ... ඔයා තාම බබා... යන්න යන්න... ගිහින් වයිවා එක කරන්න..." රයන් කිව්ව. ඒ කියල මිනිහ සිගරැට් එකකුත් පත්තු කරපි. ඒකෙන් දුම් පිට කරන රයන් දුම් වලාවකින් වැහුණා. ඒ දුම අතරෙන් මට මිනිහව පෙනුණෙ බොහොම ගාම්භීර තාලෙට.

"මං යනව... ආ ඔයා එයාලට ආදරේ නැත්තං මොකටද ලියුම් කවර ගොඩ ගහන් ඉන්නෙ?" මං ඇහුවෙ මිනිහට දෙවෙනි නොවී!

මං යනකොටත් චෙරිය ඇවිත්. මගෙ වාරෙ ආවෙ විනාඩි දහයකට පස්සෙ. මගෙ ළඟින් වාඩි වෙලා හිටියෙ ආලෝකය.





"කෝ රයන්?" ආලෝක් මට කෙඳිරුව. කොඳුරන ගමනුත් මිනිහ නෝට්ස් බැලුව. කොහොමටත් මිනිහ එහෙම තමයි. අන්තිම මොහොත වෙනකල් පොතේ.

"එන්නැහැයි කිව්වෙ..." මං කිව්ව.

"මොනව? පිස්සෙක්නෙ...!" ආලෝක් ඔළුව දෙපැත්තට හොලව හොලව කිව්ව.

"මිනිහ මේක ගණන් ගන්නෙ නෑ කිව්වෙ... මේකෙන් වැඩක් නෑලු මිනිහට... මිනිහ ඉතින් තමන්ගෙ දෙමවුපියන්ගෙනුත් වැඩක් නෑය කියන පුතයනෙ..." ඇත්තටම ඒ අන්තිම වාක්‍යය එළියට ආවෙ වොඩ්ක හින්ද!

"හරී... ඔයා ඕකේද? ඔයා නිකං පටලැවෙනව වගේ. මී... මී... මොකක්ද ඒ ගඳ... ඈහ්... ඔයා බීලා නේද?"

"ෂ්... ෂ්... ෂ්... කට... කට... චුට්ටයි. රයන් කිව්ව ඒකෙන් මාව රිලැක්ස් වෙයි කියල."

"රයන්... රයන්... රයන්... ඔයාගෙ ජීවිතේ රයන්ද? ඇයි ඔයාට ඔයාගෙ ජීවිතෙන් කෑල්ලක් නැද්ද?" ආලෝක් ඇහුව.

"හරිකුමාර්..." ප්‍රොෆෙසර් චෙරියන් මට ඇතුළට කතා කළේ මං ආලෝක්ට උත්තර දෙන්න හදද්දිමයි. ඔන්න නැකත! ඊළඟ විනාඩි පහේදි මගෙ ජීවිතේ වෙනස් වෙනව. මගෙ පළවෙනි A එක මට හම්බ වෙනවද, නැද්ද කියන එක තීරණේ වෙන්නෙ ඒ විනාඩි පහේදි.

ඇතුළට ගිය ගමන්ම, ගුඩ්මෝනින්... අරව මේව නැතුව චෙරිය කෙළින්ම ප්‍රශ්නෙට බැහැපි! හරියට රොබෝ කෙනෙක් වගේ.

"ඉන්වෙන්ටරීස් අඩු කරන්න ජපාන ක්‍රමේට අනුව සිද්ධ කළ නිෂ්පාදනේ මොකක්ද?" චෙරිය ගුඩ්මෝනිං නොකිව්වට මට එහෙම ඉන්න පුළුවන්යැ. මං ඔක්කොටම ඉස්සෙල්ල මාමණ්ඩියට සුබ පැතුව!

"ගුඩ්මෝනිං සර්...!"

"ගුඩ්මෝනිං... ගුඩ්මෝනිං... දැන් මං අහපු ප්‍රශ්නෙට උත්තර දෙන්න..." මිනිහගෙ ඇස්, නේහගෙ ඇස්වල එන්ලාජ් කරපු කොපි වගේ!මං ඒ දිහා බලා හිටිය මාරයි... ෂඃ!

"ගුඩ්මෝනිං සර්...!" මං ආයෙ කිව්ව.

"හරි... හරි... දැන් එක පාරක් ඒක කිව්වනෙ. ඒ මදෑ... දැන් මං අහපු ප්‍රශ්නෙට උත්තර දෙන්න කරුණාකරල."

"සර්... ජැපනීස් ඉන්වෙන්ටරි ලෝවරිං සිස්ටම්..." මං පටන් ගත්ත.

"ඔව්... ඔව්... කියන්න. ඔයා උත්තරේ දන්නවද නැද්ද?" චෙරියගෙ කටහඬ එන්න එන්න උස් වුණා.

"සර්... මේකයි සර්... මං සර්... නියම තත්ත්වෙ සර්... මං කියන්නෙ සර්..."

"මොකක්? දැන් කාලෙ ඉගෙන ගන්න අයට මේ වගේ පුංචි ප්‍රශ්නෙකටවත් උත්තර දෙන්න බෑ... මොකක්ද ඉතින් ඇති වැඩේ? හරි... ඊළඟ ප්‍රශ්නෙ... එසෙම්බ්ලි ලයින් එකකයි, බැච් මනුෆැක්චරින් එකකයි වෙනස මොකක්ද?"

"සර්... හරිම සිම්පල් ප්‍රශ්නයක්නෙ සර්... හික්..."

"හරි... මොකද ඔයාට වෙලා තියෙන්නෙ...? ඈ...හ්... මොකක්ද ඒ ගඳ...? තමුසෙ බීල නේද? තමුසෙ මගෙ පන්තියට එන්නෙ බීලද?" චෙරියගෙ මල පැනගෙන ආව.

"තමුසෙගෙ පන්තියකට එන්නෙ කොහොමද නොබී මිසක්?" මට එහෙම අහන්න හිතුණත් මං එහෙම ඇහුවෙ නෑ.

"නෑ සර්... පිස්සුද සර්... මං ඕකට උත්තරේ දෙන්නං දොඹෙන් සර්..."

"තමුසෙ බීල! මං අහන්නෙ අද කාලෙ එවුන්ට බීල පන්තියට එන්න තරම් හයියක් තියෙනව..." චෙරියට යකා





නැගල අතේ තිබ්බ චෝක් කෑල්ලෙක් මට දමල ගැහුව. ඒක මගෙ පපුවට වැදුණෙ. ටිකක් රිදුණත් එක්ක. බීල හිටියත් මට තේරුණා මෙතන මොකක් හරි අවුලක් වේගෙන යන බව! ඇත්තටම මං වයිවා එකේ බය නැතුව කතා කරමින් හිටිය! නමුත් අදාළ දේවල් නෙවෙයි. එක එක විකාර!!

"සර්..." මං කිව්ව.

"බහිනව දොට්ට මගෙ පන්තියෙන්... දැන්මම... හ්ම්..." චෙරියගෙ මූණ බීට් පෙත්තක් වගේ රතු වෙලා. මිනිහ මේසෙ උඩ තිබ්බ මිනිහගෙම ෆයිල් මිටියක් අරන් මේසෙටම දමල ගැහුව.

චෙරිය මා දිහාට එද්දි, මං මගෙ නෝට් පොතත් අරන් එළියට යන්න හදනව විතරයි. මිනිහ රතු පෑනක් අරන් මගෙ පේපර් එකේ ලොකු රවුමක් ඇන්ද. තවත් රවුමක් ඊට උඩින් ඇන්ද... ඕහ්... තාර බිත්තරේ!

"බිංදුවයි... ඒකත් හොඳ වැඩියි තමුසෙට! මීටත් අඩු ගාණක් තමුසෙට දෙන්න තියෙනවනං තමයි මගෙ හිතට හරියන්නෙ... අනික මතක තියා ගන්නව. ඊළඟට එන විභාගෙදි තමුසෙ හොඳටම කරල නැත්තං මං තමුසෙව අන්නවන එක අන්නවනවමයි...! මං මේක ලේසියෙන් අරින්නෙ නෑ...!"

මං සද්ද නැතුව හිටිය. ෂිඃ අච්චර ෂොට් තුනක් ගහලත් බිංදුවයි. නිකං ගියත් බිංදුවයි! එහෙනං මොන ඉලව්වටද මං ගියේ...? අපරාදෙ... වොඩ්ක ගහපු එකේ සත පහක වැඩක් වුණේ නැනෙ... ෂෙහ්...

"හෙණ ගහපිය..." රයන් මිට මොළෝල මේසෙට දඩෝං ගාල ගැහුවෙ වයිවා එකේදි වෙච්ච දේ අහලයි.

"මොකෝ දැන් හෙණ ගහපිය කියන්නෙ. ඔයානෙ ඔය ගොන් බූරු අයිඩියා එක මෙයාගෙ ඔළුවට අල තියෙන්නෙ..." ආලෝක් කිව්ව.

"මං හිතුවෙ වැඩේ හරි යයි කියලනෙ. මං හිතන්නෙ දීපු ෂොට් ලොකු වැඩියි." රයන් කිව්ව. මිනිහ එවෙලෙ හිටියෙ බාස්කට් බෝලයක් බිත්තියට ගගහ, අල්ල අල්ල. "ඩග්... ඩිග්... ඩග්... ඩිග්... ඩග්..."

"ඕක නවත්තනවද... කන්දොස්කිරියාව..." ආලෝක් කිව්ව. "දැන් මොකක්ද ඔයා කරන්න යන්නෙ හරී..." ආලෝක් මගෙන් ඇහුව.

"මොනව කරන්නද...? ඒක ඉවරයි... චෙරිය හිතයි මං බෙබද්දෙක් කියල. දුවව දෙන්න අපූරු බෑනණ්ඩිය..." මං අත් දෙකෙන් මූණ වහගන්න ගමන් කිව්ව.

"ඩග්... ඩිග්... ඩග්... ඩිග්... ඩග්... ඩිග්..."

රයන් මුකුත් කිව්වෙ නෑ. වටපිටාවෙ පැතිරිලා තිබ්බෙ බාස්කට් බෝලෙ බිත්තියට වදින සද්දෙ විතරයි.

"නවත්තනවකො ඕක..." ආලෝක් බෝලෙ ඩැහැ ගත්ත. "දැන් කියන්න හරියට..."

"ආලෝක්..." එළියෙන් කෑ ගහන සද්දයක් ආව. ඒ පහළ ඉන්න සිකියුරිටි.

"ආලෝක් මහත්තය ෆෝන් කෝල් එකක්..." මිනිහ පහළ ඉඳන් කෑ ගැහුව.

"ගෙදරින් වෙන්න ඕනෙ... හරී එන්න... දැන් ඕක ගැන කතා කරල වැඩක් නෑ..." ආලෝක් මටත් පහළට යන්න කතා කළා. මාත් පහළට ඇදිල ගියේ ඉබේටම. කොහොමටත් මං අරමුණක් නැතුවයි හිටියෙ.

"ආ... අම්මෙ කොහොමද? හුඟ දවසකින් ගෙවල් පැත්තෙ එන්නත් බැරි වුණා..." ආලෝක් අම්මට කිව්ව.

"ඈහ් මොකක්... ඒ මිනිස්සු කැමති වුණා??" ආලෝක්ගෙ කටහඬේ තිබ්බෙ පුදුමාකාර උනන්දුවක්. ප්‍රීතිමත් ගතියක්.





"මට පුදුම සන්තෝසයි අම්මෙ... තාත්ත එහෙම කොහොමද? ඔව්... ඔව්... මං ජොබ් එකක් කරන කාලෙක මං ඒව ගෙවනව... අම්මල කියන්න ඒ ගැන සැකයක් ඇති කරගන්න එපයි කියල..."

මට එයාලගෙ දුරකථන සංවාදෙ ඇහුණෙ එහෙන් මෙහෙන්. ඒත් සිද්ධ වෙන්නෙ මොකක්ද කියන එක තේරුම් ගන්න මට අමාරු වුණේ නෑ. අන්තිමට ඔන්න ආලෝක්ලගෙ අම්මලට පුළුවන්කම ලැබිල එයාව මිනිහෙකුත් තීන්දු කරන්න. ආලෝක් පස්සෙ විස්තර කරපු විදිහට ගනුදෙනුව සිද්ධ වෙන්නෙ මෙහෙමයි. දෑවැද්ද හැටියට ආලෝක්ල මරුටි කාර් එකක් දෙන්න ඕනෙ මනමාලයට. ඒගොල්ලො කැමති වෙලා ආලෝක් රස්සාවක් කරනකල් ඒ වෙනුවෙන් ඉවසන් ඉන්න. හැබැයි ඉතින් මඟුල වෙන්නෙත් එතකොට තමයි. නිකං ඉන්න මට අහල ගියත් මදෑ කිව්ව වගේ, මඟුල දැම්ම නොකෙරුණත් තීන්දු කෙරුණු එක ගැන හැමෝම හිටියෙ සතුටින්.

"සුබ පැතුම් කොල්ලො...! ඔයාගෙ ගෙදර කට්ටියටත් සතුටු ඇති... සමහර විට එයා යන එක ගැන දුකකුත් ඇති... නේද?" මං ආලෝක්ට කිව්ව.

"එයාලට තමයි මේකෙන් වැඩිම සැනසීම! දැන් ඉතින් ඉක්මනට රස්සාවක් හොයාගෙන ඒක ඉවරයක් කරල දාන්න ඕනෙ... කාර් එකෙන් විතරක් බේරෙන්න හම්බ වෙන්නෙ නෑ... ඇයි ඉතින් මඟුල් කන්නත් එපායැ..."

"ඇයි ඉතින් එයාගෙ මඟුල පහු වුණාම මොකද වෙන්නෙ? මොකක්ද ඔච්චර හදිස්සිය?"

"වයස යන්න යන්න මිනිස්සු හොයා ගන්න බෑ. හොයා ගත්තත් ඉල්ලන දෑවැද්ද වැඩි වෙනව. නොබැඳ ඉන්නව කියන්නෙ කරන්න ඕනෙ වියදම් වැඩි වෙනව කියන එකයි... මේක මෙහෙම තීන්දු වෙච්ච එක ලොකු දෙයක්..."

මට මතක් වුණේ ණය ගනුදෙනුවක්. හරියට ක්‍රෙඩිට් කාඩ් උගුල වගේ. ඇම්ම ගෙවල ඇම්මොත් හරි. පහු වුණොත් එන්න එන්න පොලිය පැටව් ගහනව. ආලෝක්ලට දැනෙන සහනය මට හිතා ගත්තහැකි.

★

ඊට සුමාන ගාණකට පස්සෙ අපි කැම්පස් මෙස් එකේ රෑට කකා හිටිය. මට මතක විදිහට ඒක බ්‍රහස්පතින්ද දවසක්. මෙස් එකේ කෑම බල්ලෙකුට කන්න බෑ කියල ඔප්පු කරපු තව දවසක් මේක... මෙනු එකේ තියෙන දේවල්නං බොහොම ගාම්බීරයි. නූඩ්ල්ස්, ෆ්‍රෙන්ච් ෆ්‍රයිස්, ටෝස්ට්, සූප්! හෝටලේක කෑම වේලක් වගේ. කෑම වේල කුජීතයි! මං හිතන්නෙ මේකෙ ඉන්න කෝකියො උයන්නෙ අපිට කෑම එපා වෙන්නයි. නූඩ්ල් එක වැඩිය ළං වුණේ පාප්ප තලියකට. නූඩ්ල් රැලි එකෙකුට එකෙක් ඇල යන්න බැරි රෑනක් වගේ එකටම එකමුතුව ඇලිල හිටිය. ෆ්‍රෙන්ච් ෆ්‍රයිස්, ඒ කිව්වෙ බැදපු අල තීරු හීතලයි... සමහරක් ඒව අඟුරු වෙන්න බැදිල... සමහරක් ඒව අමුයි! ක්‍රීම් ඔෆ් මෂ්රූම් කියල දීපු සූප් එක මඩ වතුර කෝප්පෙකට ලේසියෙන්ම මාරු කරන්න පුළුවන්. ඒ දෙකේ එකම වෙනස අපේ 'සූප්' එකේ ලුණු ගතිය ටිකක් වැඩියි... රස්නෙයි... එච්චරයි.

"නොදකින් විතරක්...!" ආලෝක් කිව්වෙ ගෑරුප්පුවෙ ඇලුණු නූඩ්ල්ස් තලිය ඒකෙම තදට ඇලිල තිබ්බ හින්ද...! "මං කිව්වනෙ එළියෙන් කමු කියල..."

"කවුද දන්නෙ අද මෙච්චරම කුජීත වෙයි කියල...? අනික මේ වාරෙ අන්තිම... අතේ සතේ නෑ..."

"ඒකත් හරි තමා..." ආලෝක් කියන්න ගත්ත. "මං හිතන්නෙ අපි ගිහින් පාඩම් කළොත් හොඳයි... තව දවස් දහයයි එග්සෑම් එකට තියෙන්නෙ..."





"මටනං යන්තං ගොඩ ගියොත් ඇති..."

"රයන්... මංනං හිතන්නෙ මේක සෙල්ලමකට නොගත්තොත් හොඳයි. ඔයා වයිවා එකටත් ආවෙ නෑ. වෙරිය ඒක මතක තියාගෙන ඔයාට ඇහැ ගහන් ඉන්නෙ. ඔයාගෙ නම පන්තියෙ රෙජිස්ටරේ කියවෙනකොටත් මිනිහ කින්ඩි හිනාවක් දානව..."

"මං දන්නව..." රයන් එයාට අහු වෙච්ච අමු ෆ්‍රෙන්ච් ෆ්‍රයිස් කෑල්ල දිහා රවල බලන ගමන් කිව්ව. මට දැනටම හතළිහෙන් දහයක් තියෙනව ප්‍රශ්නවලට උත්තර සෙෂන් එකෙන්... හරි... වයිවා එකට බිංදුවයි කියමුකො... මේජර් ටෙස්ට් එකෙන් පනහෙන් විසිහතරයි මට තව ඕනෙ කරන්නෙ ඒක පාස් වෙන්න..."

"ඒක හිතන තරම් ලේසි නෑ..." මං කිව්ව.

"හොඳයි... කෙළමවුණොත් එහෙමයි. පාස් වුණොත් එහෙමයි... ඉතින් මොකෝ?" රයන් සූප් එක රස බලන්න තීරණේ කළා. හැදිච්චකම පැත්තකට ඇල කටට ගත්තු සූප් උගුර ආපහු එහෙමම සූප් කෝප්පෙට දාන්න රයන්ට ගියේ විනාඩියයි.

"වෙරිය ඔයාව අන්නවනව... බලන්නකො නැද්ද කියල...?" ආලෝක් කිව්ව.

"යකාට ගියාවෙ...!" රයන් එහෙම කිව්වෙ කෑමවලටද, එහෙමත් නැත්තං වෙරියටද කියන එක ගැන මට එච්චර පැහැදිලි වුණේ නෑ.

"මට A එකක් ගහගන්න පුළුවන් වුණොත්, ඒ කියන්නෙ මට නේහවත් අයිති කරගන්න පුළුවන් වෙනව කියන එකයි..." මං කිව්ව.

"මං හිතන්නෙ අපිට තාම මොනව හරි කරගන්න පුළුවන් වගේ..." රයන්ට අලුත් අදහසක් පහළ වුණාද කොහෙද?

"මොකක්ද...? නේහව අමතක වෙනකල් බොමු කියන්නද හදන්නෙ?" මං මිනිහට ඔලොක්කුවට වගේ ඇහුව.

"නෑ... අපි හිතමු මේජර් එග්සෑම් එක කෙළවෙලාම ගියාය කියල. ඒත් එක විදිහක් තියෙනව ගොඩ එන්න."

"පිස්සු කියන්න එපා... මට දැනට හතළිහෙන් තිස්තුනක් තියෙනව. A එකකට ලකුණු අසූවක් ඕනෙ... මේජර් එකෙන් ගන්න පුළුවන් පනහයි උපරිම... අසූව වෙන්න මං පනහෙන් හතළිස් හතක් ගන්න ඕනෙ. ඒක පුළුවන් වැඩක්යැ?"

"ඔව්... ඒක හරියන්නෙ නෑ රයන්... ඔයා මෙයාව තවත් පිස්සු නොකර ඉන්නවද?" ආලෝක් උපදේශයක් දුන්න. "මිනිහ ඉවරයි... එච්චරයි..."

"පිස්සු... ඉවර වෙන්නෙ නෑ එහෙම. මං ඔයාලට කිව්වොත් මේජර් එකෙන් මැක්සා ගන්න පුළුවන් කියල, ඔයාල ඒක විශ්වාස කරනවද?"

"ඔය මනස්ගාතවලින් වැඩක් නෑ... මං හිතන්නෙ දවසට පැය විස්සක් පාඩම් කළත් අපිට ගොඩ එන්න බෑ දැන් තත්ත්වෙ හැටියට... අනික චෙරිය හදන පේපර් එක ලේසි වෙන්නෙ නෑ... පොර අහන්නෙ අපි හීනෙකින්වත් හිතපු නැති ප්‍රශ්න... ඉවරයි... ෆිනිතො..." මං නාහෙන් ඇඬුව.

"හරි... අපි හිතමුකො විභාගෙට එන ප්‍රශ්න ඔයා කලින් දන්නව කියල...?" රයන් කිව්ව.

"මොකක්? ඒ කොහොමද? ඔයා හීන දකිනවද?" ආලෝක් ඇහුව.

"නැහ්... මං හීන දකිනව නෙවෙයි. මං යාළුවෙක්ට උදව්වක් කරන්නයි හදන්නෙ. මං හිතන්නෙ අපිට පුළුවන් පේපර් එක පන්න ගන්න!"

"ඒ කොහොමද?" මම උඩ ගිහින් ඇහුව.

"චෙරියගෙ ඔෆිස් එකට පැනල හොරකම් කරනව..."

ආලෝකයයි මායි මොහොතකට ගල් වුණා. රයන්ගෙ 'මාර අයිඩියා' ඒක දිරව ගන්න අපිට ටික වෙලාවක් ගියා. දිරව ගන්න අමාරු කෑම එක්ක, දිරව ගන්න අමාරු අදහසකුත් ආවම ඔළුව ටිකක් අවුල් වෙනව තමයි.





"ඔයා කියන්නෙ ඒක හොරකම් කරමු කියලනෙ... අයි.අයි.ටී. එකේ ප්‍රොෆෙසර්ගෙන් මේජර් පේපර් එකක් හොරකම් කරනව...? ඒකද ඔයා කියන්නෙ?" ආලෝක් අමුතු විදිහකට ඇහුව.

"ඔච්චර සුචරිතවාදියෙක් වෙන්න ඕනෙ නෑ... ඕකට ඔය හැටි නළියන්න ඕනෙත් නෑ... මං කිව්ව එකේ එච්චර ලොකු වැරැද්දක් ඇතිය කියල..."

"ඔයාට පිස්සුද? ඔල්මොරොන්දන්ද?" තද වෙච්ච ආලෝකය නැඟිට්ටා. නැඟිටල වචනයක්වත් කතා නොකර මෙස් එකෙන් එළියට ගියා. මාත් ඒ එක්කම එළියට ගියා. ඊළඟ දවසෙදි නේහව හම්බ වෙන්නෙ කොහොමද? හම්බ වුණාම ඉන්න ඕනෙ කොහොමද කියලයි මං හිත හිතා හිටියෙ. වැඩියත්ම එයාගෙ තාත්තත් එක්ක ඇති වෙච්ච ජංජාලෙට!

# 15

# ඔපරේෂන් පෙන්ඩියුලම්

ඊළඟ දවසෙදිත් රයන් බොහොම උදාර විලාසෙන් අපිට කතා කළා.

"මේ... මං කියන දේ අහගන්නවලකො..."

"පිස්සුද...? නිකං ඔල්මොරොන්දං කියවන්නෙ නැතුව ඉන්න. ඒක කරන්න බෑ..." ආලෝක් තදට විරුද්ධ වුණා.

"ඒ කතාවෙ ඇත්තක් තියෙනව..." මොන කතාවෙද කියල නොදන්නව වුණත් මාත් ඔහේ කියල දැම්ම.

"මං කියන එක අහල එක විනාඩියක් අහගන්නවලකො... ඔයාල මුකුත් කරන්න ඕනෙ නෑ..." රයන් බොහොම සාධාරණ හේතු දක්වමින් කිව්ව. මිනිහ කියන්න යන්නෙ මොකක්ද කියල අහ ගත්තම අපිට හාල්යැ...? ඒ හින්ද මං තීරණේ කළා ඒක අහන්න.

"හරි... කියන්නකො බලන්න එහෙනං..."

"අපි දැන් මෙතන අවුරුදු තුනක්. ඊටත් වැඩියෙන් ටැග් ගැහුණා... හරිද...? මොනවද අපිට ලැබිල තියෙන්නෙ?" රයන් ඇහුව.

"අයියෝ... ආයෙත් පරණ රෙකෝඩ් එකමද දාන්න හදන්නෙ? මේකෙ සිස්ටම් එක හරි නෑය... මේකෙන් ඉන්දියාවට වැඩක් වෙලා නෑය... ඕව කිය කිය ඉන්නෙ නැතුව ඔයාට ඕන





දේ කෙළින්ම කියනවද?" ආලෝකය තාමත් හිටියෙ රයන් එක්ක ඔරොප්පුවටමයි.

"හරි... හරි... ඉන්න... ඉන්න මං එතෙන්ට එන්නං." රයන්ට තේරුණා මිනිහට ඉන්නෙ ඉවසුමක් තියෙන ප්‍රේක්ෂකයො නෙවෙයි බව! මිනිහ ගත්ත සාක්කුවෙන් කොළයක්. A4 සයිස් දෙකක් තිබ්බ එතන. එයා ඒක අපි හිටිය තණකොළගොල්ලෙ බිම ඇතිරුව. බොරලු කැට දෙකකුත් තිබ්බ ඒව හුළඟෙ යනවට. ඊට පස්සෙ මිනිහ බොහොම සන්සුන් විදිහට කතා කරන්න ගත්ත.

"මහත්තුරු... බලා ගන්න... මේ තමයි අපේ ෆැකල්ටියෙ මැප් එක! ඔක්කොම ප්‍රොෆෙසර්ස්ල එයාලගේ පේපර් එක හදනව මේජර් ටෙස්ට් එකට සුමානෙකට කලින්... ඒ කිව්වෙ ටෙස්ට් එකට සුමානයක් තියෙද්දි පේපර්ස් ප්‍රින්ට් කරලත් ඉවරයි... ඒත් චෙරිය කියන්නෙ බොහොම කල්යල් බලල වැඩ කරන බුවෙක්... මිනිහ මිනිහගෙ පේපර් එක හදල ඉවර වෙනව ඇත්තෙ ඊටත් කලින්. මෙන්න මේ හයවෙනි තට්ටුවෙ තමයි මිනිහගෙ ඔෆිස් එක තියෙන්නෙ..." රයන් මිනිහගෙ මැප් එකේ තැනකට දබරඇඟිල්ල තිබ්බ. "ඒකෙ වහලෙ තියෙන්නෙ නවවෙනි තට්ටුවෙ."

රයන්ගෙ මූණෙ තිබ්බෙ බොහොම උනන්දුකාර පෙනුමක්. හරියට ප්‍රශ්න පත්තරේකට උත්තර ලියද්දි ආලෝක්ගෙ මූණෙ මතුවන පෙනුම වගේ පෙනුමක්. මේ කතාබහ ඉබේ ඇති වෙච්ච එකක් නෙවෙයි. රයන් මේක හිතල බලල කරපු වැඩක්.

"මං ඔයාට සැරේකුත් කිව්වනෙ ඕක මහ ගොන් අදහසක් බව..." ආලෝක් කිව්ව.

"අපි ඔයා කියපු එකට කැමති වුණා වගේනෙ ඔයා මේ විස්තර අපිට කියන්නෙ...!"

ඒත් රයන්ගෙ හැටි එහෙම තමයි. මිනිහ තීරණ ගන්නව. මිනිහ ඒව ක්‍රියාවට නංවනව. කොහොමටත් මිනිහ කරන්නෙ මිනිහට ඕන දේ.

"රයන්... ඇත්තට මොකක්ද මේකෙ තේරුම...?" මං සිරාවට ඇහුව.

"කියන එක අහගන්නවකො ඉස්සර වෙලා. හරී... මට පුළුවන් ඔයාට A එකක් අරන් දෙන්න. නිකං හිතන්න. ඊට පස්සෙ නේහා කොච්චර සතුටු වෙයිද කියල... ආලෝක්... ඔයාගෙ ප්‍රතිඵලවලත් A අකුරක් තිබ්බොත් ඔයා හොයන විදිහෙ ජොබ් එකක් හොයා ගන්න අමාරුවක් වෙන එකක් නෑ."

"ඒත්... ඒත්... මේක මහ වංචාවක්. වැරදි වැඩක්..." ආලෝක් ගොත ගගහ වගේ කිව්වෙ, මා දිහා බල බල. රයන්ගෙ මේ පිස්සු වැඩවලට විරුද්ධව මාත් කතා කරාවි කියල එයා හිතුවට සැක නෑ. ඒත් මං ඒ වෙද්දි හිටියෙ පාළොස්වක දවසක නේහා එක්ක කැම්පස් වත්තෙ ඇවිද ඇවිද. පායපු හඳ දිහා බල, බල. මට ඇත්තටම A එකක් ගන්න පුළුවන් වෙයිද?

"අපිව අහුවෙන්න කළොත්... ඕං අපි වැරදියි..." රයන්ටම ආවේණික වෙච්ච තර්කයක් රයන් මතු කළා. රයන් එක්ක වාද කරල වැඩක් නෑ. වැඩියත්ම කෙනෙක් තමන්ගෙ ලස්සන කෙල්ල ගැන හීන මව මවා ඉන්න වෙලාවකදි. හ්ම්ම්... ඔව්... ඒක වැරැද්දක් වෙන්නෙ අහු වුණොත් තමා. නැත්තං ඒක නියම ප්ලෑනක්!

"ඒත්..." ආලෝකය ආයෙත් උදැල්ල දාන්න හැදුව.

"ඉන්න මං ඉවර වෙනකං..." රයන් ආලෝක්ට කියන්න නොදී කතා කරන්න ගත්ත. මං ඒ වෙද්දි බාගෙට රයන්ගෙ පැත්තට හැරිල ඉවරයි.

"වහල තියෙන්නෙ නවවෙනි තට්ටුවෙ... කඹ අරන් ගියහම වහලෙ ඉඳන් හයවෙනි තට්ටුවට බැස්සැකි... ඔයාලට පුළුවන් මට උදව් කරන්න... හරියට නේහාගෙ කාමරේට යන්න අපි හරීට උදව් කළා වගේ..."

"පිස්සු හැදෙනව... මේක එච්චර ලේසි නෑ..." මං කිව්ව. "මේක තට්ටු නවයක් උස කතන්දරයක්."





"ඒක මට ප්‍රශ්නයක් නෑ. මං ඉස්කෝලෙදි කඳු නගින්නන්ගෙ සංගමේ සභාපති වෙලා හිටිය."

"හොඳයි... ඔෆිස් එකේ ජනේලෙ ඇරගන්න බැරි වුණොත්...?" ආලෝක් ඇහුව.

මෙච්චර වෙලාවටම ආලෝකය මොළේ ඇතුව ප්‍රශ්නයක් අහපු විදිහට රයන් ආලෝකය දිහා බැලුව. ඒ ඇයි දන්නවද? ඒකෙන් රයන්ට ඔප්පු වුණා ආලෝකයත් මිනිහගෙ අදහස පැත්තට ටික ටික නැඹුරු වෙන බව! ඔහ්... විනාඩියක් ඉන්න... ඒ කියන්නෙ මාත් රයන්ගෙ අදහසට නැඹුරු වෙච්චි බවද? ඒ රයන් හින්දද? A එකක් ගන්න තියෙනවනං හොඳයි තමා... ඒත් ඒකද එකම හේතුව මං ඒ පැත්තට නැවෙන්න?

"ඔව්... කිව්වත් වගේ ජනේලෙ ඇරගන්න බැරි වුණොත්...?" මාත් ඇහුව.

"මේවයෙ ජනෙල්වල අගුල් නිකං රබර් පටි වගේ... අපේ හොස්ටල් එකේ ජාතියෙම ජනෙල් තමා ඒකෙ තියෙන්නෙත්... එක පාරයි... ඩිෂිව්... ඔය ඇරෙන්නෙ...!"

"ඒ කියන්නෙ ඔයා වහලෙන් බහින්න යනව?" මං ඇහුව.

"මං කිව්වනෙ මට ඒක පුළුවන් කියල. මං බය නෑ..."

"අපිව කවුරු හරි දැක්කොත්...?" මං තව ප්‍රශ්නයක් ඇහුව.

රයන්ගෙ එකක් තියෙන්නෙ ඒකයි. මිනිහ නියම තූල් සූත්තරකාරය වගේම යකෙකුටවත් බය නැති එකා! මිනිහ තමන් ගැන තියෙන ආත්ම විශ්වාසෙ කොච්චරද කිව්වොත් ඒ හින්දම ප්ලෑන් එක බකල් වෙන්නත් පුළුවන්. ඇයි ඉතින්... තමන්ට වරදීවි... වැරදුණොත් කොහොමද කියල නිකන්වත් හිතන්නෙ නැනෙ.

"මොකෙක්වත් අපිව දකින්නෙ නෑ...!" මිනිහ කියපි!

"හහ්... හැමදාම රෑට ඒකෙ වහලෙ උඩ කොල්ලො තුන්දෙනෙක් ඉන්නවනෙ... ඉතින් සික්කො ඒක ගණන් ගන්නෙ නෑ. එහෙමද?" ආලෝක්ට යකා නැඟල ඇහුව.

"මිනිහො... ඒ වෙලාවට කට්ට කළුවරයි... වහලෙට ලයිට් දාල නෑ මොකෙක්වත්..."

"ඒ වුණාට බැරි වෙලාවත් අපෙන් සද්දයක් ආව. අනික අපි වහලෙ උඩ නෙවෙයිනෙ ඉන්නෙ. වවුලො වගේ එල්ලිලා... පහළ ඉන්න කෙනෙක් බලන්නැද්ද මොක්කුද මේ එල්ලෙන්නෙ කියල...?"

"අයියෝ... ඔයාල හිතනව වැඩියි..." රයන් කලකිරිල වගේ කිව්ව.

"අපෝ... ඔය ප්ලෑන අවදානම් වැඩියි..." ආලෝක් තණකොළ ගහක් කඩ කඩා කිව්ව. මටත් ඒකට එකඟ වෙන්නයි සිද්ධ වුණේ. රයන් වහලෙ කඹ දාල එල්ලිලා බහින හැටි මවා ගත්තමත් මට හීන් දාඩිය දාන්න ගත්ත!

"හරි... එහෙනම් ඔයාලට තියෙනවද ඊට වඩා හොඳ අදහසක් එහෙම?" රයන් ඇහුවෙ නොරුස්සන විදිහට.

"හරි... අපි ඒක කළා කියමු... ජනේලෙත් ඇරිය කියමු... ඊට පස්සෙ..." මට ප්ලෑනෙ ඉතුරු ටික දැන ගැනීමේ කුතුහලයක් ඇති වුණා.

"ඊළඟට මෙහෙමයි අපි කරන්නෙ..." රයන් බොහොම උනන්දුවෙන් විස්තර කරන්න පටන් ගත්ත. "අපි කාමරේට රිංගල සීල් කරපු දුඹුරු පාට බෑග් එක හොයනව... හොයාගෙන සීල් එක බොහොම සීරුවට පිහියෙන් කපල පේපර් එකෙන් කොපියක් ගහ ගන්නව. ඊට පස්සෙ අලුතෙන් සීල් එකක් දාල, තිබුණ වගේම අලවල එතනින් වාෂ්ප වෙනව..."

"කියන්නනං ලේසියි ඔය ටික..." ආලෝක් කිව්ව. "ඒත් මං දන්නව අපිට ඔක ඇතුළට යන්න බෑ... යං... යං... ගිහින් කමු. මට බඩගිනියි."

"මොකක් හරි විදිහක් තියෙන්න එපායැ..." මං කිව්ව.

"මොකක්ද?"





"එයාගෙ ඔෆිස් එකේ දොර ඇරගන්න බැරිද? මේන් ඩෝර් එක...?" මං කිව්ව.

"කොහොමද ඒක කරන්නෙ? එහෙනම් ලොක් එක කඩන්න ඕනෙ. ඒක කරන්න බෑනෙ... එතකොට වැඩේ දුරදිග යනව... මළ මඟුලක් වේවි එතකොට..." රයන් කිව්ව.

"මොකටද දොර කඩන්නෙ...? පිස්සුවක් ඇතෑ...? යතුරෙන් ඇරගමු..."

"යතුරෙන්...? කොහෙන්ද ඔයාට යතුරු...?" ආලෝක් මගෙන් ඇහුව.

"නේහාගෙ කාර් එකේ යතුර තියෙන යතුරු කැරැල්ලෙ ඒ යතුරත් තියෙනව.

තප්පර ගාණක නිහඬතාවක් අපි අතරෙ පැතිරුණා. මගේ බුද්ධිමත් මොළේට පහළ වුණු ඒ අතිවිශිෂ්ට සොයා ගැනීමට කරපු උපහාරයක් වගෙයි මට ඒක දැනුණෙ.

"ෂහ්... ඒ කියන්නෙ ඔයා ඒ යතුරු කැරැල්ල ගල් කරන්නද යන්නෙ?" ආලෝක් ඇහුව.

"ඊට වඩා හොඳ නැද්ද ඒක පැය බාගෙකට වගේ පන්නගෙන ඩුප්ලිකේට් එකක් ගහ ගත්තොත්..." රයන් බොහොම ප්‍රායෝගික යෝජනාවක් ගෙනාව.

"හ්ම්... ටිකක් අමාරු වැඩක්. ඒත් බැරි නෑ..." මං හිනා වුණා. මගේ බුද්ධිය ගැන මට ආඩම්බරයක් දැනුණ. වෙරියගෙ ඔෆිස් එකට යන එක දැන් කජු කන්නා වගේ!

"හරී... ඔයා මාර පොරක්නෙ... එළ... එළ..." රයන්ගෙන් ප්‍රශංසාවක් ලැබෙනව කියන්නෙ ලේසි වැඩක් නෙවෙයි.

රයන් ආපහු සැරයක් සැලසුම විස්තර කළා. එතකොටනං මේක හරිම සිම්පල්නෙ කියන හැඟීම අපිටත් දැනුණා. ඇත්තටම අපි ඒ වෙනුවෙන් ඕනෑවට වඩා කාලයක් යෙදෙව්ව නේද කියන හැඟීම පහළ වුණේ ඉබේටමයි.

"එහෙනං අපි රෑට අපේ ස්පොට් එකට ගිහින් වොඩ්ක ෂොට් එකකුත් දාගෙනම චෙරියගෙ ඔෆිස් එකට රිංගමු..."

"රිංගන්න දෙයක් නෑ දැන්... ගියා අපේ වගේ දොර ඇරිය... ගෙදර යනව වගේ ඇතුළට ගියා... එච්චරයි..." මං අභිනයෙන් දොරක් අරිනව වගේ රඟපපා කිව්ව.

"චෙරියෝ... අපි එනවෝ..." රයන් කිව්වෙ ටිකක් අසභ්‍ය හස්ත මුද්‍රාවක් එක්ක. අපි ඔක්කොම ඒකට හිනා වෙලා අතට අත දී ගත්තෙ අපේ මෙහෙයුම සාර්ථක වෙන්න කියල ප්‍රාර්ථනා කර කර.

"අපි මේකට නමක් දෙමු... නැත්තං මේකෙ ගතියක් නෑ... පොඩි ගතියක් තියෙන නමක්... සැක හිතෙන්නැති සිම්පල් නමක් දාමු..."

"කිසිම ඉස්තිර බවක් නැතුව මෙතන එහෙ මෙහෙ වැනෙන අපේ අනාගතේ සංකේත වෙන විදිහෙ නමක්!"

"අන්න නියම අයිඩියා එක..." රයන් කෑ ගැහුව. "වැනෙන එක... පැද්දෙන එක... අපි මේකට දාමු ඔපරේෂන් පෙන්ඩියුලම් කියල..."

අන්න ඒ වෙලාවෙදි, කොළ පාටින් බැබළුණු තණතිල්ල උඩදි අපි ජයඝෝෂා කළා.

"ඔපරේෂන් පෙන්ඩියුලම්..."



# 16

## මගේ ජීවිතේ දිග.....ම දවස - 1

සමහරුනං කියනව කෙනෙකුගේ ජීවිතේ ඉතාම වැදගත්, කැපිල පේන 'දවසක්' තියෙන්න බැය කියල. ඒත් මං දෙයක් කියන්නද? ඔපරේෂන් පෙන්ඩියුලම් තිබ්බ දවස තමයි මගෙ අයි.අයි.ටී. ජීවිතේදි හොඳටම මතක හිටිය වැඩියම දිගම දවස! එදා ගත කරපු හැම තත්පරයක්ම, සිද්ධ වෙච්ච හැම සිද්ධියක්ම මට ඊයෙ වගේ මතකයි. එදා තමයි අපේ ජීවිත වෙනස් වෙච්ච දවස! අඩුගානෙ අපි වෙනස් වෙච්චි දවස.

ඔපරේෂන් පෙන්ඩියුලම් එක අහවල්දා කරනවය කියල අපි දිනයක් නියම කරගෙන හිටියෙ නෑ. මං නේහගේ යතුරු කැරැල්ල අරන්, අපිට ඕනෙ යතුරෙන් ඩුප්ලිකේට් එකක් ගහගන්නෙ කවදද, අන්න එදාට ඒක කරනවය කියලයි අපි හිතාගෙන හිටියෙ. මේජර් ටෙස්ට් එකට තිබ්බෙ සුමානයයි. ඒ වෙද්දි චෙරියන් ප්‍රශ්න පත්‍ර හදල තියෙන බවට අපිට තිබුණෙ පුදුම විශ්වාසයක්. අනික ප්‍රශ්න පත්තරේ පැන්නුවට පස්සෙ ඒකෙ ප්‍රශ්නවලට උත්තර හොයා ගන්නත් අපිට කල් එපායැ...? ඒ නිසා ඉක්මන් වෙන තරමට හොඳයි. එහෙමයි අපි තීරණේ කරල තිබ්බෙ.

අප්‍රේල් 11... එදාට තමයි ඔපරේෂන් පෙන්ඩියුලම් ක්‍රියාත්මක කරන්න නැකත ආවෙ. එදා උදෙන්ම නේහයි, මායි හම්බ වෙන්න කතා කරගෙන තිබ්බ. එදා නේහා කිව්වම එයාගෙ වළලුකර ඇඹරුණා කියල ඇයි මං ඒ පෙරනිමිත්ත ගණන් නොගත්තෙ? හරිනං මට ඒ අසුබ ලකුණ තේරුම් ගන්න තිබ්බ...!

"මොකක්...?" මං ෆෝන් එකෙනුයි එයාගෙන් එහෙම ඇහුවෙ.

"මං මේ ඔයාව හම්බවෙන්න පෙරුම් පුරාගෙන බලාගෙන ඉන්නව. ඔයා විකාරයක් කියනව... අනේ අදනං හම්බ නොවී ඉන්න හදන්න එපා. ඊළඟ සුමානෙ එග්සෑම්... ආයෙ කවද හම්බ වෙන්න වෙයිද දන්නෑ එතකොට."

"මොනවද හරී... මට අඩි දහයක්වත් ඇවිදගන්න බෑ... අනේ බැයිද වෙනින් දවසක හම්බ වෙන්න...?"

"මට ඔයාව පැය බාගෙකටවත් හම්බ වෙන්න බැරිද...? එක්කො මං එන්නද ඔහේ?"

එදා නේහගෙ අම්ම ගෙදර නැති බව මං දැනගෙනයි හිටියෙ. එදා එකොළහ. එදාට එයා කෝවිල් ගිහින් නැති වෙච්චි පුතා වෙනුවෙන් වතාවත් කරන බව මට රහසක් වුණේ නෑ. ඇත්තටම නේහා එදාට හම්බ වෙමුය කියල කිව්වෙත් ඒකමයි.

"මෙහෙට? ඔයාට පිස්සුද? කවුරුවත් දැක්කොත් එහෙම?"

"අයියෝ... මොකෙක්වත් දකින්නෙ නෑ... ඔයා පණ බයේනෙ..."

"ඒ වුණාට...!"

"අනික බැරි වෙලාවත් මං A එකක් ගත්තොත් ඔයාට මාව අඳුන්නල දෙන්න කොහොමත් සිද්ද වෙනව... නැද්ද හොඳා...?"

"ඕකේ... ඕකේ... එන්න එහෙනං. හැබැයි පැය බාගයයි හරිද? අනික ඔයා හරියටම එකොළහමාරට එන්න. මං දොරවල් ඇරල තියන්නං." නේහා කිව්ව.

"හරි... අපි එහෙනං එකොළහමාරට හම්බ වෙමු..." මං ෆෝන් එක තිබ්බෙ සැනසුම් සුසුමකුත් එක්ක. එදා මට එයාව හම්බ වෙන්න ඕනෙම වෙලා තිබ්බ. අඩුගානෙ එයාගෙ කාර් එක හරි...!





"ඔක්කොම හරිනෙ...?" මං කැම්පස් එකෙන් පිට වෙද්දි රයන් ඇහුව.

"ඔව්... මං ඔයාව පැය දෙකෙන් හම්බ වෙන්නං." මං කිව්ව.

★

"ෂ්... ෂ්... සද්ද කරන්න එපා. ඉක්මනට ඇතුළට එන්න." නේහා කිව්වෙ කෙඳිරිලි ස්වරූපෙන්.

"මෙහෙ මොකෙක්වත් නෑ මාව දකින්න..."

"ඔයාටනං හොඳටම පිස්සු... මොකක්ද ඉතින් ඔච්චර මාව හම්බ වෙන්න තියෙන තදියම?" නේහා, මාව එයාගෙ කාමරේ දිහාට එක් කරගෙන යන ගමන් ඇහුව.

"ඔයා දන්නවනෙ... අපේ තර්ඩ් ඉයර් එක ඉවර වේගෙන යන්නෙ... මේජර් එකත් අත ළඟ..." මගෙ කට ඒව කිව්වට මොකෝ, මගේ ඇස් කාමරේ පුරාම දුව දුව තිබ්බෙ. එයාගෙ කාර් එකේ යතුරු කැරැල්ල හොය හොයා.

"ඉතින්...?"

"ඉතින් මං හිතුව විභාගෙට කලින් ඔයාව හම්බවෙන්න. ඔයා සුබ නිමිත්තක් කරගන්න එග්සෑම් එකට!" මං එයාගෙ ඇඳේ පැත්තකින් වාඩි වුණා.

"ෂඃ... මාර රොමැන්ටික් කතාවක්නෙ ඒක..." නේහා හිනා වෙන්න ගත්තා. "මං හිතුව ඔයාට මාව නොදැක ඉන්න බැරි ලෙඩක් හැදිල කියල..."

"නැතුව! ඒකත් තියෙනව තමා..." මං එයාගෙ පැත්තට නැඹුරු වුණේ එයාව සිප ගන්න හිතාගෙන. එයාගෙ කතාව හරි. මට එයාව නොදැක ඉන්න බෑ තමා. එයා හරිම ලස්සනයි. ඇඹරිච්ච වළලුකර එක්ක වුණත්. ඒක බැන්ඩේජ් කරල තිබ්බෙ.

"ඕහ් බලාගෙන..." එයා මාව ඇඳ මත වැටෙන්න තල්ලු කළා. "මං දන්නව ඔයාට නොදැක ඉන්න බැරි මොකක්ද කියල..."

"මොකක්ද?"

"මගෙ ඇඟ... මාව නෙවෙයි..." නේහා කිව්වෙ නාහෙ උඩු අතට හරවන්.

ඉතින් මොකෝ? මොකක්ද ඒකෙ වෙනස...? සමහර වෙලාවලට කෙල්ලන්ව තේරුම් ගන්න හරි අමාරුයි.

"පිස්සු... ඒක බොරු කතාවක්..." මං කිව්වෙ, ඒ වගේ වෙලාවකදි කියන්න ඕනෙ වචන ටික, ඒ ටික නේද කියල හිතත ගමන්.

"මෙහෙට එනව...!" එයා අණ කරල, මාව කිස් කළා.

"අම්ම කීයටද එන්නෙ?"

"පැය දෙකක් විතර යාවි... අද සමීර් අයියගෙ දවසනෙ..."

"මං දන්නව... එකොළොස්වෙනිද... මට මතකයි. ඒක නෙවෙයි. මට ඔයාගෙන් ඒ ගැන දෙයක් අහන්න තියෙනව."

"මොකක්ද?"

"මං ඒ ගැන රයන්ට කිව්ව..."

"මොනව...? ඔයා සමීර් ගැන රයන්ට කිව්ව??"

"එහෙමම නෙවෙයි... නිකන් කතා වුණා... එයා ගැන... එයා ජොගින් කරන්න ගිය ඒව ගැන එහෙම..." මං දේශපාලනඥයො දෙන ජාතියෙ උත්තරයක් දුන්න.

"උත්තර දුන්නේද නොවේ. නොදුන්නේද නොවේ." පණ්ඩිතයෙකුටනං එහෙම කියතහැකි.

"ඉතින්?"

"රයන් මාර දෙයක් කිව්වනෙ...! ඇත්තටම ඒක හරිම තර්කානුකූල දෙයක්..."





"මොකක්ද ඉතින් ඒක?"

"මිනිහ අහනව, ගිනි ගහන්න පායන මැයි මාසෙදි ඔය වෙලාවට ජොගින් යන්නෙ කවුද කියල...!"

මං ඒක කිව්ව විතරයි, නේහා මාව බදාගෙන හිටිය ආලිංගනේ අත ඇරල කෙළින් වුණේ අමුතු විදිහකට.

"නේහා..."

"හරී..." නේහා අඬන්න ගත්ත. "හරී... මට මේක ඔයාට කියන්න ඕන වුණේ නෑ... ඒත් දැන් මට ඒක කියන්න ඕනෙ."

"මොකක්ද?"

"ඉන්න..." නේහා නැඟිට්ට. නැඟිටල ගිහින් එයාගෙ අල්මාරිය ඇරිය. පාට පාට ඇඳුම් ලස්සනට අහුරල තිබ්බ. කැම්පස් එකේ කොල්ලො ඉන්න කාමර මට මතක් වුණා. ඒව යක්කු නටපු පිට්ටනි වගේ. ඒවයි, මේකයි බැලුවම මං පුදුම වුණා. නේහා රෙදි අස්සෙන් හතරට පහට නවපු කොළයක් ඇදල ගත්ත.

"මේක කියවන්න..." එයා හොටු හූර හූර කිව්ව.

"මං ඒක දිග ඇරල ගොඩක් දෙනෙක් කරනව වගේ මුලයි, අගයි බැලුව. මාව උඩ ගියේ එතකොටයි. ඒක ලියල තිබ්බෙ සමීර්! නේහට!!

**ආදරණීය නේහා,**

ඔයාව ඉපදිලා ගෙදර ගෙනාවම මං ඔයාව වඩා ගත්තෙ හරිම ආදරෙන්. එදා ඒ තිබ්බ ආදරේ තාමත් එහෙමමයි. මං එදා හරියට ආඩම්බර වුණා. ඇයි, මං අයිය කෙනෙක් වුණානෙ... ඒකයි. ඒ ආම්බරේ හැමදාටම මා ළඟ තියේවි.

නේහා... ඔයාට රහසක් තියා ගන්න පුළුවන්ද? මේ ලියුම ඔයාට ලැබෙද්දි මං මේ ලෝකෙ නැති වෙන්න පුළුවන්. හැබැයි ඔයා එකක් බලා ගන්න ඕනෙ. ඒ තමයි, මං මෙහෙම ලියුමක් ඔයාට එවපු බව කාටවත්මක නොකියන එක.

මං අයි.අයි.ටී. එන්න තුන් පාරක් උත්සාහ කළා. ඒත් ඒ හැම පාරම මට සිද්ධ වුණේ තාත්තගෙ බලාපොරොත්තු සුන් කරන්නයි. තමන්ගෙ පුතාට භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය බැහැයි කියන එක දරා ගන්න එයාට ගොඩක් අමාරු වුණා. එයාට තේරුම් ගන්න බැරි වෙන්න ඇති ඒක එහෙම වෙන්නෙ කොහොමද කියන එක ගැන. ඒත් මට ඒක කරන්න බෑ නේහා. මං කොච්චර උත්සාහ කළත්, මං කොච්චර පාඩම් කළත්, පොත් දාස් ගාණක් කියෙව්වත් මට අයි.අයි.ටී. යන්න බෑ. ඒ වගේම එහෙම යන්න බැරි වුණාම තාත්තගෙ මූණෙ මතුවෙන පෙනුම දරා ගන්නත් මට බෑ.

එයා එයාගෙ ජීවිත කාලෙ දාස් ගණන් අයි.අයි.ටී. ශිෂ්‍යයො දකිනව. එයාට තේරුම් ගන්න බෑ ඇයි එයාගෙ එකම පුතාට එයින් එක්කෙනෙක් වෙන්න බැරි කියන එක. නේහා එයා දකින්නෙ අයි.අයි.ටී ඇවිත් විභාග සමත් වෙන අය විතරයි. එහෙම නොවෙන දාස් ගාණක් ළමයින්ව එයාට පේන්නෙ නෑ. එයා දැන් මට මාස දෙකක ඉඳල කතා කරන්නෙ නෑ. මං හින්ද එයා අම්ම එක්කවත් හරියට කතාබහ කරන්නෙ නෑ. මොකක්ද මං කරන්නෙ? මැරෙනකල්ම අයි.අයි.ටී. යන්න උත්සාහ කරන එකද මං කරන්න ඕනෙ? එහෙම නැත්තං මැරෙන එකද?

කවුරු හරි දැන ගත්තොත් මගෙ මරණෙ සිය දිවි නසා ගැනීමක් කියල, අම්මට ඒක දරා ගන්න බැරි වේවි. ඒත් මං මේ ගැන කාට හරි කියල තියන්න ඕනෙ. මට ඉතින් ඒක කියන්න ඉන්නෙ ඔයා විතරයි. නේහා... මං ඔයාට ගොඩක් ආදරෙයි. ඔයා එයාලට කියන්න මං ජොගින් ගියා කියල.

**ඔයාගේම ආදරණීය අයියා,**

**සමීර්.**

"මොකක්...?" මට දැනුණෙ මහ අමුතු ගතියක්. කෙනෙකුට හැමදාම තව කෙනෙක්ගෙ සිය දිවි නසා ගැනීම දැනුම් දීමේ ලියුම් හම්බ වෙන්නෙ නෑ. ඒත් දැන් මගෙ අතේ තියෙන්නෙ එහෙම එකක්.





"ඕකයි ඇත්ත..." නේහා හෙමින් සැරේ කිව්ව. "මං මේක ඔයාට නොකිය ඉන්න තිබ්බ. ඒත් ඔයා මට ගොඩක් සමීපයි... අනික ඔයාට මේක වෙච්ච හැටි ගැන සැක ඇති වෙලත් තිබ්බ... ඒ හින්ද..." නේහා ආයෙ අඬන්න ගත්ත.

"නේහා... මේ අහන්නකො... අඬන්න එපා ඉතින්. හොඳ ළමයනෙ..." මං කිව්ව. ඒත් මං ගොඩක් කතා කළේ එයාට නෙවෙයි. මටමයි. විනාඩි පහක් විතර ගියහම එයා ඇඬිල්ල නැවැත්තුව. මං එයාට වතුර වීදුරුවක් දුන්න.

"ඔයාට දැන ගන්න ඕනෙද වයිවා එකේදි මට මොකද වුණේ කියල?" මං හිතුව ඒ කතාව කිව්වහමත් නේහගෙ තොල්වලට හිනාවක් එකතු වේවි කියල.

"වයිව එකට යන්න කලින් රයන්ට මට දුන්නනෙ වොඩ්ක ෂොට් තුනක් විතර...!"

නේහා ඇඬිල්ල නවත්තල ඔළුව උස්සල හිල්ලුව. "මොකක්... ඔයාද ඒ? එයා ගෙදර ඇවිත් කිව්ව... ඒ ඔයාද එහෙනං...?" නේහා මට කොට්ටෙන් ගහගෙන ගහගෙන ගියා. එයා ආයෙත් හිනා වෙන්න ගත්ත. එයාගෙ ලස්සන මට වැඩියෙන් පේන්න ගත්ත. මට ඕනෙනං මුළු ජීවිත කාලෙම එහෙම වාඩි වෙලා එයාගෙ ලස්සන දිහා බලාගෙන ඉන්න බැරිකමක් තිබ්බෙ නෑ. ඒත් මට රාජකාරියක් පැවරිලා තියෙනවනෙ. ඔපරේෂන් පෙන්ඩියුලම්!

"නවත්තන්න... ඒක රිදෙනව..." මං එයාගෙ දිහාට ඇදුණා.

"එන්න එපා මගෙ ළඟට - බොනපාටි... ඔයා දන්නවද තාත්ත එදා දවසෙ පැය දෙක තුනක් බුම්මන් හිටිය..." එයා කැකිරි පළන්න ගත්ත. එයා කොච්චර හිනා වුණාද කිව්වොත් අන්තිමට බඩත් කොර වෙලාද කොහෙද බඩ අත ගාන්නත් ගත්ත.

මං එයා ළඟට ගුළි වෙලා එයාව බදා ගත්ත. නේහගෙ මූණ මගෙ පැත්තට හැරුණෙ ඉබේටම. අපි සිප ගත්ත. ආයෙත්... ආයෙ ආයෙත්. ඊට පස්සෙ එයා මගෙ අත අල්ලල වෙනද කවදාටවත් නොකරන දෙයක් කළා. එයා මගෙ අත අරන් එයාගෙ පපුව උඩින් තියා ගත්ත!

වා...වි... මගෙ ඔළුව නිකං හොල්මන් වුණා. මොකක්ද මේ කෙල්ලට වෙලා තියෙන්නෙ? සිහි කල්පනාව නැති වෙලාවත්ද? මගෙනං සිහිකල්පනාව නැතිවෙලා ගිහින් ඔපරේෂන් පෙන්ඩියුලම් ගැන අමතකම වුණා.

මගෙ අත එයාගෙ ටීෂර්ට් එක ඇතුළට ගියේ ඉබේටම. ඒක කොහොම වුණාද කියල මංවත් දන්නෙ නෑ. ඊට පස්සෙ ඒක එතනින් නවතින්නෙ නැතුව බ්‍රා එක අස්සටත් රිංගුව! අනේ ඇත්තට කවුද මේ බ්‍රාවල කොකු හයි කළ එකා?

"හෙමින් ටයිගරයො... හෙමින්..." නේහ කිව්ව. එයා මට 'ටයිගර්' කිව්වට මං ගොඩක් කැමති වුණා.

එයා ඇඳේ වාඩි වෙලා එයාගෙ ටී ෂර්ට් එක ගැලෙව්ව. ඊට පස්සෙ අනික්වත්! මාව නිකං මෝහනය වෙච්ච තත්ත්වයක් උදා වුණේ. මං උත්සාහ කර කර හිටියෙ යාරයක් විතර එළියට ආව දිව ඇතුළට ඈ ගන්නයි. නැත්තං එයාට මාව කෙළ හලන බල්ලෙක් වගේ පේන්න තිබ්බ!

"මොකෝ ටයිගර්... ඔයා ඕව ගලවනවද? නැද්ද?" නේහා ඇහුවෙ බොහොම එඩිතර විදිහට.

"මං... මං... මේ... මේ..." මං බොහ් බොහ් ගාද්දි එයා මාව එයාගෙ තුරුලට ඇදල ගත්ත!

පැය බාගෙකට පස්සෙ අපි එකිනෙකාට තුරුල් වෙලා ඇඳේ වැතිරිලා හිටිය. සතුටෙන්... තෘප්තියෙන්...! මං මගෙ ඔළුව කෙළින්ම කැරකි කැරකි තිබ්බ නේහගෙ සීලින් ෆෑන් එක දිහා බැලුව. ඒකෙ රවුම් කැරකෙනව වගේම වගෙ ඔළුවත් කැරකෙන්න වුණා. හැබැයි සතුටෙන්!

"ඉතින්..." නේහා ඇහුව.

"ඉතින් මොකක්ද?" මං කිව්වෙ ආයෙ යථා තත්ත්වෙට එන්න හදන ගමන්.

"මොනා හරි කියන්නකො..."





මං හිටියෙ සතුටෙනුත් එහා සීමාවෙ. මට නේහගෙ යතුරු කැරැල්ල හොරකම් කරන්න තිබුණෙ නැත්තන් මං තාමත් ඒ විදිහට එතන!

"ඒක... මාරයි...!" මං එහෙම කිව්වත්, ඇත්තම කතාව තමයි ඒක විස්තර කරන්න ඒ වචන දෙක මදි වීම.

"ම්... ම්... ඒක ෂෝක්. මාත් කැමතියි. මං හිතන්නෙ දැන් මං නරක කෙල්ලෙක් වෙලා!" එයා මූණ නොරොක් කරගෙන කිව්ව.

"පිස්සු... එහෙම එකක් නෑ..." මං පැනපු ගමන් කිව්වෙ, එයා තමන් කරපු දෙයින් පසුතැවිලි වෙලා, ආයෙ ඒක කරන එකක් නෑ කියල හිතපු නිසයි.

"අපොයි ඔව්... බලන්න... මං ඇඳුම් නැතුව ඇඳක හාන්සි වෙලා ඉන්නව පිස්සෙක් එක්ක. වයිවා එකට බීල ගිහින් මගෙ තාත්තව ඔල්මොරොන්දං කරපු පිස්සෙක් එක්ක. මං එහෙම ඉන්නෙ ඒ තාත්ත කිලෝමීටරයක් විතර අත ළඟ ඉන්න වෙලාවක..." නේහා හිනා වෙන්න ගත්ත. "ඒක මාර නිදහස් හැඟීමක්..."

"ඇත්තට?"

"ඔව්... හරිම නිදහස්... ඒ වගේම දුකත් එක්ක."

"නේහා... නේහා..." මං එයාව සනසවන්න හැදුව. ආයෙ කඳුළු පෙරන්න ගත්තොත් එහෙම? "අපි එළියට යමුද?"

"බෑ අනේ... ඇයි... ඔයා මෙහෙම ඉන්න අකමැතිද?"

"එහෙමමත් නෙවෙයි... මට සිගරැට් එකක් බොන්න හිතුණා..."

"ඕ... මාත් අහල තියෙනව සෙක්ස්වලට පස්සෙ සිගරැට් එකක් බොන එක මාරයි කියල... මටත් එකක් ඕනෙ..." නේහා කියපි!

"ඔයා සිගරැට් බොන්නෙ නෑනෙ...!"

"මං මිනිස්සු එක්ක නිදා ගන්නෙත් නෑ එහෙනං. කෝ.. මටත් එකක් ගන්න..."

ඔන්න මගෙ වෙලාව!

"මං ඔයාගෙ කාර් එකෙන් ගිහින් ගේන්නද?"

"ඇයි ඔයා ආවෙ රයන්ගෙ ස්කූටර් එකේ නෙවෙයිද?"

"නැයියෝ... උඒ ඒක අරන් ස්ක්වොෂ් ගහන්න ගියා..."

"ඕකේ... යතුරු ෆ්‍රිජ් එක උඩ බලන්න... ඉක්මනට එන්න... හරිද?" එයා එහෙම කියන ගමන් නැගිටල මගෙ ෂර්ට් එක අරන් ඇඳ ගත්ත.

"ඒයි... ඔයා අඳින්නෙ මගෙ ෂර්ට් එක..." මං හිතුවෙ එයාට වැරදිලා කියලයි.

"මං දන්නව... මං ඒකට ආසයි... ඒක මාර සැහැල්ලුයි. පොඩි නින්දක් දාන්න මරු..." නේහා කිව්වෙ නිදා ගන්න විදිහ අභිනයෙන් පෙන්නන ගමන්.

"නේහා... පිස්සුද කෙල්ලෙ... මං කොහොමද ෂර්ට් එකක් නැතුව එළියට යන්නෙ?"

"මගෙ එකක් අඳින්න..." එයා ඕනැවට එපාවට වගේ කම්මැලිකමේ කිව්ව.

"ඔයාගෙ? ඒක රෝස පාටයි... අනික ඒක මට තදයි... පිස්සුද ඔයාට?"

"පහළ තියෙනව තාත්තගෙ ෂර්ට්. එයින් එකක් අරගෙන යන්න..."

"අනේ නේහා පිස්සු කියවන්න එපා බබෝ..."

"යන්න අනේ... ඔයා මාව මහන්සි කරවනව." එයා මට කොට්ටෙකින් දමල ගැහුව.

මං ටිකක් හිතල බැලුව. ඔව්... හරි... මට ප්‍රොෆෙසර් වෙරියන්ගෙ දුවයි, කාර් එකයි ගන්න පුළුවන්නං ෂර්ට් එකක් ගන්න බැරි මොකෝ...? මං පහළට ගිහින් එයාගෙ අල්මාරිය





ඇරල සුදු ෂර්ට් එකක් තෝර ගත්ත. ඒක බොහොම පිරිසිදුවට තිබ්බ. ෂර්ට් අතේ දිලිසෙන පොඩි ලේබල් එකකුත් තිබ්බ.

මං ෆ්‍රිජ් එක උඩ තිබ්බ යතුරු කැරැල්ලත් ගත්ත. එතන යතුරු හයක් තිබ්බ. එයින් එකක් ෂුවර් එකටම වෙරියගෙ ඔෆිස් යතුර!

"වැඩේ හරි..." මං මටම කියා ගත්තෙ නේහලගෙ ගෙදරින් පිටවෙන ගමන්. මං වාහනේ පාරට දැම්ම. ගිනි දවාල. ඒ හින්දමද කොහෙද පාරෙ එච්චර මිනිස්සු හිටියෙ නෑ. මං කෙළින්ම ජියා සරායිවලට ගිහින් යතුරු කපන සාප්පුවකට ගියා.

"කොයි එකද?" සාප්පුකාරයා ඇහුව.

"ඔක්කොම..." මං කිව්ව.

සාප්පුකාරයා යතුරු කපද්දි මං සිගරැට් පැකට් එකක් ගත්ත. මං හිතුවට වඩා වැඩේ ලේසි වුණා. මං සිගරැට් එකක් පත්තු කරන් දුම ඇරියෙ ආයෙම නේහාව මගෙ තුරුලට ගන්න හැටි හිත හිතා. "මේ තමයි මගේ ජීවිතේ ලස්සනම දවස." මට හිතුණෙ එහෙමයි.

යතුරු හය කපන්න වැඩි වෙලාවක් ගියේ නෑ. මං අලුත් යතුරු කැරැල්ල සාක්කුවෙ දාගෙන ආපහු කැම්පස් එකට ගියා.

මං වෙරියන්ලගෙ ගෙවල්වලට යන පාරට හරවනවත් එක්කම මං දැක්කෙ ඉස්සරහින් යන බයිසිකලයක්. "කෙළියා... මළ කෙළියයි... ජලා හුටා..." මට එහෙම හිතුණෙ මං බූරුවෙක් වගේ, මැටි හරකෙක් වගේ කාර් එකේ හෝන් එක ගැහුව හින්ද, මගෙ දිහා හැරිල බැලුව බයිසිකල්කාරයගෙ මූණ දැකල.

දෙයියනේ... වෙරිය!!!

# 17

## මගේ ජීවිතේ දිග.....ම දවස - 2

හොදටම බය වුණහම මර ළතෝනි දීලා කෑ ගහන අවස්ථා කෙනෙක්ගෙ ජීවිතේ තියෙන්න පුළුවන්. ඒත් සමහර අවස්ථා එනව ඊටත් වඩා බයවෙන අවස්ථා. එතකොට කෑ ගැහෙන්නෙ නෑ. බයටම කට ඇරන් ගල් ගැහෙනව විතරයි. ඒක හරියට අයිස් පෙට්ටියක දාපු පොසිලයක් වගේ. ආයෙ ආපහු ඒමක්නං නෑ. චෙරිය බයිසිකලේ නවත්තල මගෙ දිහාට, එහෙමත් නැත්තං එයාගෙ දුවගෙ කාර් එක දිහාට එද්දි මට සිද්ධ වුණේ ඒ වගේ දෙයක්.

චෙරිය ඇවිත් මගෙ ළඟින් හිට ගත්ත. හරිනං මට තිබ්බෙ බැහැල දුවන්න. ඒත් බය වැඩිකමටම මට පුළුවන්කමක් තිබ්බෙ නෑ අඟලක්වත් හෙලවෙන්න. චෙරියගෙ වචනවලටත් වැඩිය හයියෙන් මට ඇහුණෙ. මගෙම පපුව ගැහෙන සද්දෙ!

"මේක මගේ කාර් එක!" මිනිහ කියපි.

හරියට හරි. ලකුණු දහයෙන් දහයයි. ඔයා දිනුම් චෙරී...! මං මේ අවස්ථාව කොහොම හරි පාලනේ කරගන්න ඕනෙ. මං හොඳ හුස්මක් ගත්ත.

"ඔව් සර්..."

"තමුසෙ කවුද? තමුසෙ මොනවද මගෙ කාර් එකේ ඉඳන් කරන්නෙ?" චෙරිය ඇහුව.





"මං මේ ආපහු එනව එළෝගෙන සර්..." කලබල වෙච්ච පාර වචනත් පටලවගෙන මං කිව්ව. මගෙ පෙනුම වගේම මං කිව්ව දේ ඇතුළෙත් මෝඩකම ඉහවහා ගිහින් තිබ්බ.

චෙරිය මිනිහගෙ බයිසිකලේ පාර අයිනෙ නවත්තල තිබ්බෙ. මං කාර් එකෙන් බැස්ස. දෙයියනේ. දැන් මෙතනට ඩයිනෝසරයෙක්වත් එනවනං...!

"ඒ කියන්නෙ ඔයා මේක එළවගෙන යන්නෙ අපේ ගෙදරට... එහෙමනෙ?" චෙරිය ඇහුවෙ කාර් එකේ ඉස්සරහ දොර අරින ගමන්. ඔව්... ඔව්... දැන් මිනිහ වාහනේ එළවන්නයි යන්නෙ... අනේ දෙයියනේ මං ගෙදර යන්නද?

"ඔව් සර්..."

මිනිහ ටික වෙලාවක් මා දිහා බලන් හිටිය. මිනිහගෙ ඇස් දෙක ලොකු වුණා. ඇහිබැම උඩ ගියා. වැඩේ හබක්ම තමයි!

"ඕ... තමුසෙ තමයි මිනිහ... මං තමුසෙව දන්නව... තමුසෙ තර්ඩ් ඉයර්නේ?"

මං ඔළුව වැනුව.

"මොකක්ද තමුසෙගෙ නම?"

"හරී සර්... හරිකුමාර්..." මං ස්පීරෙටම උත්තරේ දන්න එකම ප්‍රශ්නෙ ඇහුවට මං බොහොම සතුටු වුණා.

"තමුසෙ නේද එදා මගෙ වයිව එකට බීල ආවෙ?"

මං ඔළුව හතර අතට වැනුව. ඒ කිව්වෙ දෙපැත්තට. උඩට යටට. ඔව්... නෑ... ඔව්... නෑ...

"මොකද තමුසෙ ඔළුව කරකවන්නෙ...? හිතුවද මට අඳුරන්න බෑ කියල... නඟිනව..." චෙරිය ඩ්‍රයිවින් සීට් එකේ වාඩි වුණා. මං අල්ලපු සීට් එකේ වාඩි වුණා. චෙරිය කාර් එක ස්ටාර්ට් කළා.

"කවුද තමුසෙට මේකෙ යතුරු දුන්නෙ?"

ඒක මං බලාපොරොත්තු වුණු ප්‍රශ්නයක් නෙවෙයි. මාව උඩ ගියා. මගෙ අත ඉබේටම දකුණු සාක්කුව දිහාට ඇදුණා. හ්ම්... ඩුප්ලිකේට් යතුරු කැරැල්ල නිරුපද්‍රිතව තියෙනව. මං මොකක්ද දෙන උත්තරේ? ඉක්මනට උත්තරයක් හිතා ගන්න ඕනෙ. ඒත් බොරුවක් කියන්නෙ කොහොමද? 'ඔයාගෙ දුවටයි - මටයි සිගරැට් ගේන්න තමයි එයා මට යතුර දුන්නෙ...' ඒත් මං ඒක කිව්වෙ නෑ. ටික වෙලාවක් නිහඬව ගත වුණා.

"නේහා සර්..."

"තමුසෙ නේහාව දන්නවද?" ආයි චෙරියගෙ ඇහිබැම් උඩ ගියා.

"සර් එයාගෙ කාර් එක ස්ටාර්ට් නොවී නැවතිලා තිබ්බ..."

"ඉතින්...?"

"මං එතනින් යද්දි ඒක දැකල එයාගෙ උදව්වට ගියා. පස්සෙ මං ඒක ගැරේජ් එකකට තල්ලු කරල දුන්න. එයාට ගෙදර යන්න ඕනෙ වුණා... එයා මගෙන් ඇහුව කාර් එක හදල ඉවර වුණාට පස්සෙ ගෙදෙට්ට අරන් එන්න පුළුවන්ද කියල... මං හා කිව්ව." හතරැස්, තුන්හුලස්, ෂඩාස්‍ර... මේ වගේ ටොං පච බොරු වැලක් මම ඇද බෑවෙ බොහොම අහිංසක විදිහට.

චෙරිය නිශ්ශබ්දයි. මිනිහට ඒක ඇත්ත වෙලා වගේ! මිනිහ හෙමින් කාර් එක එළවන්න ගත්ත. චෙරියො... එහෙනං මං උඹේ නාහෙ විද්ද... ඈ...?

"ඇයි තමුසෙට ඒ වගේ උදව්වක් කරන්න හිතුණෙ?"

"සාමාන්‍යයෙන් කෙනෙක් කරදරේක වැටිල ඉද්දිදි උදව් කරන එක මගෙ සිරිතක් සර්..." මං කිව්වෙ බාලදක්ෂ ව්‍යාපාරෙට මුළු ජීවිතේම කැප කරපු බාලදක්ෂයෙක් වගේ.

"ඒ කියන්නෙ තමුසෙට අද ක්ලාස් නෑ...?"

"ෆ්‍රී පීරියඩ් තිබ්බෙ සර්..."





"මෝඩ කෙල්ල..." චෙරිය තනියම කියවන්න ගත්ත හයියෙන්. "හම්බවෙන එකා මොකෙක්ද කියල හොයල බලන්නෙ නැතුව අඳුරන්නෙ නැති පල් හොරෙකුට ඔහේ යතුර දීල දානව. මං එයාට කතා කරන්නම්කො මේකට..."

මං සද්ද නැතුව හිටිය. මගෙ ඔළුවට අලුත් කල්පනාවක් ආපි. නේහා ඇඳගෙනද දන්නෙ නෑ. දෙයියනේ... දොර ඇරපු ගමන් එයා මං කියල හිතල චෙරියව බදා ගත්තොත්? මට චෙරියට වඩා තප්පර දහයක් ඉස්සර වෙන්න පුළුවන්නං... දෙයියනේ එහෙමත් නැත්තං මට අතුරුදහන් වෙන්න පුළුවන්නං.

චෙරිය කාර් එක එයාලගෙ ගේ ඉස්සරහ නැවැත්තුව.

"සර්... මං එහෙනං යන්නං..."

"නෑ... නෑ... එනවකො ඇතුළට. අඩු ගානෙ අර මෝඩ කෙල්ලට පුළුවන් තමුසෙට ස්තුති කරන්න එතකොට. නැත්තම් මං තමුසෙල වගේ එවුන්ව හතර මායිමට ගන්නෙ නෑ..."

"හරි සර්..." මට චෙරිය කියපු දේ හොඳට තේරුණා.

චෙරිය දොරේ බෙල් එක ගැහුව. නේහා ඇවිත් දොර ඇරිය. හැබැයි බෙඩ්ෂීට් එකක් ඇඳන්.

"ඔයා අරව..." නේහා කතා කරන්න පටන් ගත්ත සැණෙන් එයාගෙ තාත්තව දැක්ක. "තාත්තෙ..." නේහා ඇස් දෙක බල්බ් වගේ පත්තු කර කර බෙඩ්ෂීට් එකෙන් උපරිම ඇඟ වහගන්න ට්‍රයි එකක් දුන්න. සිගරැට් එකක් බොනව වගේද මේ ආතල් එක??

"මැඩම් ඔයාගෙ යතුරු..." මං දඩිබිඩි ගාල කියෙව්වෙ. "ඔක්කොම හරි... දැන් කාර් එක ලෙඩ දෙන එකක් නෑ කියල ගැරේජ් බාස් කිව්ව... හදනකල් මං එතනටම වෙලා හිටිය. නැත්තම් ඔය ගැරේජ්කාරයො විශ්වාස නෑනෙ මැඩම්..."

නේහා කට ඇරගෙන, ඇස් ලොකු කරන් මා දිහා බලා හිටියෙ හරියට මං ග්‍රීක් භාෂාවෙන් කතා කළ ගානට. "ඕ... ඔහ්..." එයාට කියවුණා.

"නේහා... මොකද ඔය? හරියට ඇඳුමක් දාගන්නෙ නැතුව ඉන්නෙ ඔයාගෙ ඔළුව හොඳ නැද්ද?" චෙරිය කතා කළේ සද්දෙ අඩු කරගෙන බව මට තේරුණා. ඒ මම ඉන්න හින්ද වෙන්න ඇති.

නේහා ආයෙත් ඇස් දෙක බල්බ් වගේ පත්තු කර කර, නිව නිව එයාගෙ කාමරේ දිහාට ගියේ ඇඳුම් දාගන්න වෙන්න ඕනෙ.

"මගෙ දුවට ටිකක් පිස්සු... වාඩි වෙනව..."

"සර්... එයත් සමහර තැන්වලදි කාර් එක තල්ලු කරන්න මහන්සි වුණා... ඒ මහන්සියට වෙන්න ඇති..." මං නේහගෙ අන්දමන්ද ගතිය, ඇඳුම සාධාරණීකරණය කරන්න උත්සාහ කළා. සෙක්ස් කිරීමත්, විනාඩි විස්සක් විතර කාර් එකක් තල්ලු කිරීම වගේම තමා. එකම වෙනස පළවෙනි එක බොහොම ප්‍රීතිමත්, තෘප්තිමත් මහන්සියක්.

නේහා ආපහු ආවෙ, "තාත්තගෙ හොඳ දුව" වගේ සල්වාර් එකක් එහෙම ඇඳගෙන, බන්දේසියක වතුර වීදුරු දෙකකුත් තියාගෙන.

චෙරියත් වතුර එක බොද්දි මං ආයෙ කියවන්න ගත්ත.

"මැඩම්... මං ඔයාගෙ තාත්තට කිය කියා හිටියෙ ඔයාගෙ කාර් එක කැඩිල තියෙද්දි අපි ගැරේජ් එකට ඒක තල්ලු කරපු විස්තරේ... හැඳුවට පස්සෙ කාර්එක මෙහෙට අරන් එන්නයි කියල මැඩම් මට යතුරු ටික දුන්නු එකටනං සර්ගෙ හිතට හරි මදි වගේ... කොහොම වුණත් මං ආපහු එද්දි තමයි මට සර්ව හම්බ වුණේ..."

"ආහ්..." නේහා කිව්වෙ ඔක්කොම තේරුම් ගත්ත මූණකින්.

"අඳුරන්නෙ නැති කෙනෙකුට එහෙමත් දෙනවද කාර් එකේ යතුරු?" චෙරිය නේහගෙන් ඇහුවෙ මූණ පුලුටු කරන්.





"සොරි තාත්තෙ..." නේහා සෝපාවෙ වාඩි වුණා.

"සර්... මං දැන් යන්නද?"

චෙරිය යන්තං ඔළුව හෙලෙව්ව විතරයි. මං පටස් ගාල මාරු වුණා. මං දුවන නොදුවන ගානට චෙරියගෙ ගේට්ටුව ළඟට ආව.

"හරි..." මං ගේට්ටුව ළඟට එද්දිම චෙරිය කෑ ගැහුව. මාව ආයෙ හීතල වුණා. ගල් වුණා. මං ආපහු හැරුණා.

"සර්..."

"ඔයාට එච්චර මොළයක් නෑ..." චෙරිය කිව්ව.

අඩු ලකුණු ගන්න ශිෂ්‍යයො ගැන කවදත් චෙරියගෙ තිබ්බෙ පිළිකුලක්. මාත් ඒක දැනගෙන හිටිය. ඒත් මං දැනන් හිටියෙ නෑ මිනිහ ඒ බව ඔච්චරම කෙළින් කියාවි කියල.

"මං දන්නව සර්... මං මහන්සි වෙලා පාඩම් කරන්නං."

"මං කිව්වෙ ඒ ගැන නෙවෙයි."

"සර්...?"

"මාත් තමුසෙල වගේම ශිෂ්‍යයෙක් වෙලා හිටිය කාලයක් තිබ්බ. මං අවුරුදු හතරෙදිම දහයෙන් දහය අරන් තියෙනව. ඒ රෙකෝඩ් එක තාම කඩල නෑ."

"මං දන්නව සර්..."

"ඒත් තමුසෙ හිතනවනං මගෙ දුව එක්ක පිස්සු නටල මාරු වෙන්න පුළුවන් කියල ඒක ලොකු වැරදීමක්."

මං සද්ද නැතුව හිටගෙන හිටිය එහෙමම.

"තමුසෙ මගෙ වයිවා එකට බීල ආව... දැන් තමුසෙ මගේ දුව එක්ක පිස්සු නටනව... මගෙ කාර්එක පාවිච්චි කර කර... මගෙ ෂර්ට් එක ඇඳගෙන!"

මේ වෙද්දි චෙරිය මගෙ ළඟට ඇවිත් මගෙ ඔහ්... නෑ... නෑ... මිනිහගෙම ෂර්ට් කොලර් එකෙන් (ඒත් හරිද මන්ද ඒක කියවුණු විදිහ?) අල්ලගෙනයි හිටියෙ.

"හරී... තමුසෙ බලා ගන්නව. මේක අයි.අයි.ටී. එක... තුට්ටු දෙකේ ඉස්කෝලයක් නෙවෙයි මේක...! ඉස්සෙල්ල වයිවා එක... දැන් මගේ දුව... මගේ දුව...!"

මිනිහ මාව හොල්ලන්න ගත්ත.

"සර්... මෙතන සර් හිතන විදිහෙ එකක් වෙලා නෑ..."

"මං දන්නව මං හිතන දේ... තමුසෙ මට ඒ ගැන කියල දෙන්න ඕනෙ නෑ. මං දැනගෙන හිටිය මගෙ දුවට මේ දවස්වල මොකකින් හරි බාධා වෙන බව. බැලුවම ඒ තමුසෙ වගේ බූරුවෙක් හින්ද...! මගෙ දුවගෙනුයි, අපේ ගෙදරිනුයි ඈත් වෙලා ඉන්නව. හරිද...? තේරුණාද?"

"ඔව් සර්..." මං හිතුවෙ එහෙම කිව්වම මිනිහ මගෙ (නෑ... මිනිහගෙම ෂර්ට් කොලර් එකනෙ දෙයියනේ ඒක) කොලර් එක අත අරීවි කියල. මට දැනුණෙ හරිම තෙහෙට්ටු ගතියක්. ඇයි දෙයියනේ සෙක්ස් කරපු එකයි (ඒ මගෙ පළවෙනිම සැරේනෙ!) චෙරියට අහු වෙච්චි එකයි, ඒ දෙකම මදෑ මිනිහෙක්ව බාගෙට මැරෙන්න!

"හොඳයි... මිනිස්සු කතා කියනවට මං කැමති නෑ. මට ආයෙ මේ ගැන කතා කරන්න ඉඩ තියන්න එපා... හරිද? මගෙ දුවගෙන් ඈත් වෙලා තමුන්ගෙ පොතක් පතක් බලා ගන්නව. තව එක වැරැද්දක් කළොත් මං තමුසෙව ඉවර කරනව... තේරුණාද? මං තමුසෙව ඉවරයක්ම කරනව..." චෙරියන් ගෙරෙව්ව. මිනිහගෙ මූණ බොහොම අසාමාන්‍ය විදිහට රතු වෙලා තිබ්බ.

"ඔව් සර්... හරි සර්... මට දැන් යන්න දෙන්න..." මං බැගෑසේන වුණා.

මිනිහ මගෙ (එයාගෙ) කොලර් එක අත ඇරිය. ඒ වෙනකොටත් මිනිහගෙ ඇඟිලි වෙවුලනව මං බලාගෙන.





මිනිහ මාව අත ඇරිය විතරයි, මං හුරේ රන්! ඒක තමයි මගේ ජීවිතේ වේගවත්ම ජොගින් එක! මං නැවතුණේ එක පාරයි. ඒ පාර අයිනෙ නතර කරල තිබ්බ චෙරියගෙ බයිසිකලේ දැකල. මං වටපිට බැලුව. කවුරුත් නෑ. මං පටස් ගාල ඇරිය රෝද දෙකේම හුළං! ඇද්ද තමුසෙට...? මට වියරු සන්තෝෂයක් දැනුණා.

★

"ඔක්කොම හබක්...!" මං රයන්ගෙ කාමරේ ඇතුළෙදි හති දදා කිව්ව.

"මොනවද හබක්? කෝ යතුරු ටික හරිද?" රයන් ඇහුව.

මං හති දදා හුස්ම ටිකක් ගන්න පොඩි වෙලාවක් ගත්ත.

"මළ මඟුලක්නෙ වුණේ...!" මං ඔක්කොම විස්තරේ කියල දැම්ම.

රයනය දෙකට නැවි නැවී හිනාවෙන්න ගත්ත. ඇත්තටම මං මිනිහගෙන් එහෙම හැසිරීමක් බලාපොරොත්තු වුණේ නෑ.

"රයන්... මේක විහිළුවක් නෙවෙයි..." මං ටිකක් තද වෙලා කිව්ව.

"ඇත්තට?" මිනිහ ඊටත් වැඩියෙන් හිනා වෙන්න ගත්ත. "චෙරියගෙ ෂර්ට් එක ඔයා ඇඳන්... නේහා බෙඩ්ෂීට් එකක් ඇඳන්... කොහොමද ඕවට හිනා නොවී ඉන්නෙ... චෙරියව කරකවල අත ඇරපු ගානට තියෙන්න ඇති..." රයන් ආයෙ හිනා වෙනව. "අනේ දෙයියනේ... මං එතන හිටියෙ නෑනෙ ඔය සීන් එක බලා ගන්න..."

"කට වහනව... මේක තව ඕන්නැති කරදරයක්." ආලෝක් කිව්ව.

"මොන කරදරයක්ද? ඔයා යතුරු ටික ගෙනාවනෙ නේද?" රයන් ඇහුව.

මං ඔළුව වනන ගමන් ඒ ටික එළියට ගත්ත.

"ඒ කියන්නෙ අපි මේක කරන්න යනව...?" මං ආයෙත් ඇහුව.

"නැතුව? චෙරිය කොහොමද මේක දැන ගන්නෙ?" රයන් මිනිහගෙ මූණ කෙළින් යතුරු කැරැල්ල නටවන්න ගත්තෙ හරියට මිදි වල්ලක් නටවනව වගේ බැල්මක් ඒ දිහා රඳවගෙන.

"අනේ මන්ද... මං දන්නෑ රයන්... මට බයක් දැනෙනව..." මං කිව්ව.

"රිලැක්ස් මෑන්. අද ඔයා ෆොක්ස් වෙලා ඉන්නෙ... සෙක්ස්සුයි, හොරර් පාටි එකයි දෙකටම එක දවසෙ මූණ දීල..." රයන් කිව්වෙ හිනා වෙවී.

"හරී කියන දේ ඇත්තක් තියෙනව. අපි ඔපරේෂන් පෙන්ඩියුලම් ගැන ආයෙ හිතන්න ඕනෙ..."

"විකාර..." රයන් ආපහු සීරියස් වුණා. "ඒකෙන් වුණේ අපේ වැඩේට හයියක් ලැබිච්චි එකයි. එයාට පුළුවන් මේකෙන් පාස් වෙලා චෙරියට පෙන්නන්න එයාට මොළයක් කියල එකක් තියෙන බව."

"තැන්ක් යූ රයන්... මං මේ කල්පනා කර කර හිටියෙ කොහොමද මට මොළේ තියෙන බව පෙන්නන්නෙ කියල..." මං උපහාසෙන් කිව්ව.

"අයියෝ... ඔයාට අද ජිල්මාට් වගේකට මූණ දෙන්න සිද්ද වෙච්ච බව ඇත්ත. චෙරියන් ඕන දෙයක් හිතපුදෙන්... අපි අපේ වැඩේ කරමු."

"මිනිහ නේහට මොනව කළාද දන්නෑ..."

"එහෙම කළත් ඔයාට කරන්න පුළුවන් දෙයක් නෑනෙ. ඒව ගැන හිතන එක නවත්තල අපි අපේ වැඩේ කරමු..."





"ඔයා දැම්මම නේහට කතා කරන්න එපා. ටික දවසක් ඔහේ යන්න අරින්න... කලබල වෙන්න එපා. චෙරියන් ඕක යට ගහවී... මිනිහ කැමති වෙන එකක් නෑ රටේ ලෝකෙ මිනිස්සු ඕක දැන ගන්නවට. අනික මිනිහ තමන්ගෙ දුවත් එක්ක අර වගේ දේවල් කතා කරන තාත්ත කෙනෙක් නෙවෙයි..." ආලෝක් එහෙම කියල මගෙ කර වටේ අතක් දා ගත්ත.

"අපි මේකෙන් එකට ගොඩ යන්න ඕනෙ... අපි යාළුවෝ... අපිට දැන් තියෙන්නෙ වෙලාව එනකල් ඉවසන එකයි. මතකනෙ සී-ටු-ඩී...?" රයන් මටයි, ආලෝක්ටයි පහක් දැම්ම.

ඊට හරියටම පැය දෙකකට පස්සෙ, හවස පහට අපි රයන්ගෙ කාමරේ කාඩ් ගගහ ඉන්දැද්දි ආලෝක්ට ගෙදරින් කෝල් එකක් ආව.

"ආලෝක් මහත්තය... හදිස්සි කෝල් එකක්...!" පහළ හිටිය සිකියුරිටි ගාඩ් මහ හයියෙන් කෑ ගැහුව. ආලෝක් කාඩ් අත වීසි කරල නැඟිට්ටුණේ රොබෝවෙක් වගේ.

"මොකක්ද දන්නෑ...?" මං කිව්ව.

"අනේ මන්ද... සමහර විට අක්කගෙ මංගල්ලෙට දින නියම වෙලා ඇති..." ආලෝක් කිව්වෙ පඩිපෙළ දිගේ පහළට දුවන ගමන්.

"යං... යං... අපිත් යං... මංගල්ලෙ දින දාගෙනනං අපි මිනිහ ගානෙ කමු..." අපිත් ආලෝක්ගෙ පස්සෙන් වැටුණා.

"ඔව් අම්මෙ... ඔව්... ඔව්... මං හොඳින්. ඇයි හදිස්සියෙ...? ඔයාගෙ කටහඬ එච්චර හරි නෑ..." ආලෝක් කියනව අපිට ඇහුණා.

මායි, රයනුයි මූණට මූණ බලා ගත්ත. රයන් උරිස් ඇකිළුවෙ "අනේ මන්ද" කියන අභිනයෙන්.

"ඈහ්... මොකක්? එහෙම කොහොමද? එයාල කොහොමද එහෙම කියන්නෙ...?" ආලෝක්ගෙ මූණ අඳුරු වෙනව අපි බලාගෙන. රයනුයි, මායි එතනින් ඈත් වුණා. ආලෝක් ගානෙ කන්නනං අද හම්බ වෙන්නෙ නැති එක ස්ථිරයි.

"ඇයි... මොකෝ තාත්තට වුණේ? හයියෙන් කියන්න අම්මෙ... කිසි දෙයක් පැහැදිලි නෑ... මේ ලයින් එකේ... මොකද වුණේ? ආ... කන්නෙ නෑ...? මුකුත්? කවද ඉඳන්ද?" එතකොට ලයින් එක කට් වුණා.

අලෝක් ටෙලිෆෝන් බූත් එකේම බිම වාඩි වුණා. අපිත් මිනිහගෙ දෙපැත්තෙන් වාඩි වුණා. ලැලිවලින් හදල තිබ්බ පොළොව කිරි කිරි ගෑවෙ අපේ බරට වෙන්න ඕනෙ.

"මේක විශ්වාස කරන්නවත් පුළුවන්ද?" ආලෝක් තනියම වගේ කියෙව්ව.

"මොකක්ද? ටෙලිෆෝන් එක කැඩුණු එකද? ඔය මළඉලව්ව හැමදාම ඔහොමමයි..." රයන් යන්නෙ කොහෙද - මල්ලෙ පොල් කතාවක් කිව්ව.

"කොල්ලගෙ පැත්තෙ එවුන් මඟුල කැන්සල් කරල...!" ආලෝක් කිව්ව.

"මොනව...? ඇයි ඒ??"

"උන්ට දැවැද්දෙන් කොටසක් දැන්මම ඕනෙලු. අම්ම කිව්ව බැංකු ණයක් ගන්න හැදුවය ඒත් ඒකටත් මාස ගාණක් යනවය කියල... ඒ අස්සෙ උන්ට වෙන තැනක් සෙට් වෙලා... මේ වැඩේ හරි යන්නෙ නෑයි කිව්වලු. බල්ලො..."

ආලෝක්ගෙ මල පැනල!

"ෂිඃ... අජූවයි. අනික ඔයාල මොන එකකටද අක්කව ඔය වගේ මළ පෙරේත පවුලකට බන්දල දෙන්න හැදුවෙ? එක අතකින් ඔවුන් මකබෑ වුණ එකමයි හොඳ..." මං කිව්ව.

"හැම කොල්ලෙක්ගෙම පවුලෙ අය එහෙම තමා... දැවැද්ද හොයනව... තාත්ත ඒකට අප්සෙට් ගිය පාර එදා ඉඳන් නොකා ඉන්නවලු! අරෙහෙ ගෙදර ගිනිවිජ්ජුම්බර... මෙතන මළඉලව් ෆෝන් එක කැඩෙනව... නොදකින් විතරක්..."





"එක අතකින් ඕක කැඩුණු එකමයි හොඳ... ම.. මං කිව්වෙ ෆෝන් එක! ඔයා කියල මොනව කරන්නද? මොකෝ කොල්ලගෙ ගෙදරට ගිහින් උන්ගෙ මහ එවුන්ගෙ බෙල්ලට පිහියක් තියල, 'මගෙ අක්කගෙ මඟුල කරපියව්' කියන්නද? යං... යං... උඩට ගිහින් කතා කරමු..." රයන්, ආලෝක්ගෙ වේදනාව අඩුවෙන විදිහෙ කතාවක් කරල මිනිහට නැඟිටින්න අතකුත් දුන්න.

★

අපි උඩට ගියා. අපි අතරෙ රැඳුණෙ නිශ්ශබ්දතාවක්. අන්තිමට ඒක බින්දෙ රයන්.

"හයයි..." මිනිහ කිව්වෙ පාතාල නායකයෙක් මිනිහගෙ සහචරයො අමතන තාලෙට. "තව පැය හතරයි... ඊට පස්සෙ අපි ඔපරේෂන් පැන්ඩියුලම් එක පටන් ගන්නව..."

මං ඒක ඇහුණ නෑහුණ ගානට ඔළුව වැනුව. මං කල්පනා කර කර හිටියෙ එවෙලෙ නේහා මොනව කරනවද කියලයි.

"රයන්..." ආලෝක් නාහෙන් අඬන්න ගත්ත. "දැන්නං මේකට මගෙ මූඩ් එකක් නැති ගානයි."

"ඒ කිව්වෙ මොනවටද?"

"අපේ ඔපරේෂන් එකට... ඉස්සෙල්ලම හරිට වෙරියන් හම්බවෙලා එතන අවුලක් වුණා... දැන් මෙතන මට අවුලක් වුණා... එහෙන් තාත්ත කන්නැලු... නොකා ඉඳල එයාට මොනව වෙයිද දෙයියො තමයි දන්නෙ... මේ ඔක්කොම සුබ ලකුණුනං නෙවෙයි... අපි මේක කරන්නම ඕනෙද?"

"හෝව්... හෝව්..." රයන් නැඟිට්ට. "ඔයාගෙ අක්කගෙ මඟුලෙයි, මේකෙයි තියෙන සම්බන්ධෙ මොකක්ද? අනික බය නැතුව ඉන්න... ඔයාගෙ තාත්තට මුකුත් වෙන්නෙ නෑ..."

ආලෝක් නිශ්ශබ්ද වුණත් මිනිහගෙ ඉරියව්වලින් කියවුණු අපහසුතාවෙනං මට හොඳට පෙනුණා.

රයන් මා දිහායි, ආලෝක් දිහායි තුන් හතර පාරක් බැලුව. මාරුවෙන් මාරුවට බලල ආයෙ කතා කරන්න ගත්ත.

"ඔයාල මට කියන්න, ඒ ගැන කතා කරන්න වෙලාවක්ද මේක? අපි අවසාන තීරණේකට ඇවිත් නේද හිටියෙ? දැන් අපිට යතුරුත් තියෙන එකේ?"

රයන් යතුරු කැරැල්ල උස්සල හෙලෙව්ව.

"ඒත් රයන්... දැන් තියෙන තත්ත්වෙ හැටියට අපි මොකටද අවදානමක් ගන්නෙ?" ආලෝක් ඇහුව.

"මේකෙ කිසිම අවදානමක් නෑ... පැය හතරයි... පේපර්ස් අපේ අතේ... කතාව ඉවරයි."

"හරී... ඔයා මොකද කියන්නෙ?" ආලෝක් මගෙන් ඇහුව.

"පොඩ්ඩක් ඉන්න..." රයන් කිව්ව. රයන්ගෙ කටහඬ උස් වුණා. "ඔයා හදන්නෙ ආයෙ මෙතන බෙදීමක් ඇති කරන්නද? හරියට ෆස්ට් සෙමෙස්ටර් එකේදි වගේ?"

"කලබල වෙන්න එපා රයන්..." මං හිත හිතා හිටියෙ නේහා එක්ක ගත කළ ඒ සුන්දර මොහොත. මුන්ගෙ මඟුලක් හින්ද ඒකෙත් ආතල් කැඩුණා. "ඇයි අපි මේ කෑ ගහ ගන්නෙ?"

"එහෙනං මෙයාට කියන්න එක හිතින් ඉන්න කියල..." රයන්, ආලෝක්ව පෙන්නුව. පෙන්නල වාඩි වෙලා සිගරට් එකක් පත්තු කරන් දුම් වළල්ලක් පිම්බ.

"හරි... හරි... මට ඔයාලව තනි කරන්න ඕන කමක් නෑ..." ආලෝක් කිව්ව.

"ඒ කියන්නෙ එයාට ඕනෙ අපි වැඩේ කරගෙන එනකල් කාමරේට වෙලා ආතල් එකේ ඉන්නද? ඊට පස්සෙ අපි ගේන පේපර්ස් බබා වගේ ඉඳගෙන බලා ගන්නද?" රයන් නෝක්කඩු කියන්න ගත්ත.





"දැක්කනෙ... දැක්කනෙ... එහෙමයි එයා හිතන්නෙ... එයාට මාව විශ්වාස නෑ..." ආලෝක් කිව්වෙ මූණ දෙක කරගෙන.

"හරි... හරි... කවුරුත් කලබල වෙන්නැතුව ඉන්න..." මං මැදිහත් වුණා. "අපි ඔක්කොටම මේක බොහොම උද්වේගකර අවස්ථාවක්. අපිට පැය හතරක් තියෙනව තව. අපිට යතුරුත් තියෙනව. අපිට ප්‍රශ්න පත්තරත් ඕනෙ. කරනවනං තුන්දෙනා එකට, එක හිතින් කරමු. නැත්තන් අල්ලල දාමු..."

"රයිට්..." රයන් කිව්ව.

අපි ආලෝක් දිහා බැලුව.

"රයිට්" ආලෝක් කිව්වෙ රයන් 'රයිට්' කියපු හඬෙන් දහයෙන් එකක් තරම් හෙමින්.

"අපි අවදානම් අවස්ථා ගැනත් හිතුවනෙ නේද?" මං ඇහුව.

"නැතුව...?" රයන් කිව්ව.

"හරි... එහෙනං අපි මේක කරමු. ආලෝක් මේක අහගන්න... මේ මුළු ඉන්දියාවෙම ඉන්නෙ එක කොල්ලෙක් විතරක් නෙවෙයි... ඔයාගෙ අක්කට වෙන මඟුලක් සෙට් වේවි. ඔයාට ජොබ් එකක් හම්බ වෙලා, අතට සල්ලි එනකොට ඒක එච්චර අමාරු වෙන්නෙ නෑ... මොකටද ඕකට ඔච්චර හදිස්සි වෙන්නෙ? හොඳ ජොබ් එකකට හොඳ ප්‍රතිඵල ඕනෙ... හොඳ ප්‍රතිඵලවලට හොඳ ලකුණු ඕනෙ... හොඳ ලකුණුවලට හොඳට උත්තර ලියන්න ඕනෙ. හොඳට උත්තර ලියන්න පේපර්ස් අපේ අතට ගන්න ඕනෙ. ඒකට අපි චෙරියගෙ ඔෆිස් එකට පනින්න ඕනෙ... ජේනවද එකකට එකක් ගැට ගැහිල තියෙන විදිහ?"

මං ආලෝකයගෙ දහිරිය වඩවන කතාවක් කළා.

"රයිට්..." ආලෝක් ඒ පාර කිව්වෙ ටිකක් උනන්දුවෙන්, විශ්වාසෙන් බව අපි දෙන්නටම තේරුණා.

"එහෙනං..." මං රයනුයි, ආලෝකයි දිහා බැලුව.

“අපි හරි...” ඒ දෙන්නම එකට කිව්ව.

“ගුඩ්... අපි ඊළඟ පැය දෙක තුන රිලැක්ස් එකේ ඉමු...” මං කිව්වෙ එතකොට මට ඒ වෙලාවෙදි නේහා ගැන හීන මව මවා ඉන්න පුළුවන් හින්දයි.

ඒ කිව්ව වගේම ඊළඟ පැය තුන අපි නිශ්ශබ්දව හිටිය. ආලෝක් විතරක් එයාගෙ තාත්ත ගැන මොනවද කිව්ව. මිනිහ ඒ ගැන හිත කරදර කරගෙන හිටියෙ. අපි එයාව සැනසුව, අම්මා තාත්ත ගැන බලා ගනියි කියල. අපි රෑට කන්න පහළට ගියේ නෑ. අපිට නිකමට හිතුණ එහෙම ගියොත් එතන ඉන්න එවුන්ට අපේ හිත් කියවන්න පුළුවන් වෙලා, අපේ වැඩේ අහුවේය කියල!

“දහයයි...” අපි ඔක්කොම නැගිට්ට. කොහේදෝ ඔරලෝසුවක දහය වදිනව අපිට ඇහුණ.



# 18

## මගේ ජීවිතේ දිග.....ම දවස - 3

අපිට ඕනෙ වුණේ නෑ, අපි එහෙට ආ ගිය බවක, හිටපු බවක කිසිම සලකුණක් තියන්න. ඒ හින්දම අපි ස්කූටරේ අල පයින් ගියේ. මං හිතන්නෙ අපි අවුරුදු ගාණකට පස්සෙ ඒ බිල්ඩිම දිහාට පයින් ගියාමයි. අපි සද්ද නැතුව හොස්ටල්ස් ටික පහු කළා. අපි කෝකටත් පොත් දෙක තුනක් අතේ තියා ගත්තෙ මහ රෑ ලයිබ්‍රරි එකට පාඩම් කරන්න යන බවක් අඟවන්න.

“ඇයි ඔයාගෙ අම්මල ඔයාගෙ අක්කව ඔච්චර කලින් බන්දල දෙන්න දඟලන්නෙ?” මං ආලෝක්ගෙන් කොඳුරල ඇහුවෙ හිතේ ඇති වේගෙන එන නොසන්සුන් ගතිය මඟ අරවගන්න. “කීයද එයාට වයස...?”

“විසිතුනයි... මං හිතන්නෙ මං රස්සාවක් කරන කාලෙකදි එයාට මනමාලයෙක් හෙව්වනං හොඳයි... එතකොට මට වුණත් ලේසියෙන් ණයක් ගත්තැකි...”

“හ්ම්... ඔව්...”

“මට රස්සාවක් හම්බ වෙනවනං එච්චරයි... ඒත් පහයි පොයින්ට් ගාණක් තියෙන එවුන්ට ඒ හැටි රස්සාවල් නෑ....”

“මේ පාර A එකක් ගත්තම ටිකක් ඉහළට එන්න පුළුවන්...” මං කිව්ව.

“ෂ්... ෂ්...” රයන් කිව්වෙ අපි අපේ ඔපරේෂන් එක ක්‍රියාත්මක වෙන බිල්ඩිමට ළං වෙච්ච හින්ද වෙන්න ඕනෙ.

අපි බිල්ඩිමේ හතර කොනම හොඳට බැලුව, සිකියුරිටි ගාඩ්ස්ලා ඉන්නවද කියල. ඇත්තටම අපි එහෙම කළේ වැඩි පරිස්සමට. අපි අපේ තිප්පොළට වොඩ්කා බොන්න ගිය කිසිම දවසක සිකියුරිටි ගාඩ් කෙනෙක් පළාතකවත් හිටියෙ නෑ. ඒත් අපි හතර අතේ බැලුවෙ එදාට වෙන කරුමයක් නිසා හරි එකෙක් ඉඳීවිද කියලයි. ම්හු... ඔහෙ නෑ මොකෙක්වත්. සුබ ලකුණක්.

චෙරියගෙ ඔෆිස් කාමරේ තිබ්බෙ හයවෙනි තට්ටුවෙ. උඩට නඟින පඩිපෙළ යාන්තමට පෙනුණෙ පැත්ත පළාතක ලයිට් එළියක් නොතිබුණු හින්දයි. අපි පඩිපෙළ නැග්ගෙ තට්ටු ගණන් කර කර. එතකොට වරදින්නෙ නැනෙ. එකයි... දෙකයි... තුනයි... හතරයි... පහයි...

"හයයි... හරි... දකුණු පැත්තෙ හත්වෙනි කාමරේ තමයි චෙරියගෙ ඔෆිස් එක" රයන් උපදෙස් දුන්න.

මුළු හයවෙනි තට්ටුවෙන්ම පත්තු වෙලා තිබ්බෙ එකම එක බල්බ් එකයි.

"හහ්... මේ බලහල්ලකො... ඩී.සී. චෙරියන්... හෙඩ් ඔෆ් ද ඩිපාර්ට්මන්ට්... ඌරා..." රයන් චෙරියන්ගෙ දොරේ ගහල තිබ්බ පිත්තල තහඩුව කියවල ශාප කළා. රයන් ලොක් එක පරීක්ෂා කරද්දි ආලෝකයි, මායි වටපිටාව ගැන හෝදිසියෙන් හිටිය.

"යතුරු..." රයන් අත දික් කළා.

මං සාක්කුවෙන් යතුරු කැරැල්ල ගනිද්දි ඒක සිලිං බිලිං ගාල හෙල්ලෙන්න ගත්ත.

"ෂ්... ෂ්... හෙල්ලෙන්න දෙන්න එපා..." ආලෝක් කෙඳිරුව.

"බයවෙන්න එපා ඔච්චරටම... අපි ඉන්නවය කියල කවුරුවත් දන්නෙ නෑ..." මං කිව්ව. ආලෝකය, මාව බය කරනවනෙ. "රයන්... ආ... හරි යතුර හොයල ගන්න..."

"හ්ම්... මේක... නෑ... නෑ... මේක බලමු. ම්හු... මේක... ම්... ම්... හරි වගේ..."





"හරිද?" ආලෝකයගෙ උනන්දුව වැඩි වෙලා.

රයන් දොර් අණ්ඩ කැරකුව. අපේ බලාපොරොත්තුවෙ දොර වැඩි කරදරයක් නැතුවම ඇරිච්චි! දිල්ලියෙ, අයි.අයි.ටී. එකේ මැකැනිකල් ඉංජිනියරින් ඩිපාර්ටම්න්ට් හෙඩ්ගෙ ඔෆිස් කාමෙර් අපිට අයිති වෙලා තිබ්බ. රයන් බිත්තිය අත ගාල ලයිට් එක දාපි!"

"මොකක්ද ඔය කරන්නෙ?" ආලෝක් බය වෙලා ඇහුව.

"නැත්තං කොහොමද අපි ඒක හොයා ගන්නෙ? බයවෙන්න එපා... මොකෙකුටවත් ඕක පේන එකක් නෑ... කලබල නොවී හෙමින් හොයමු... ආ... පේපර් එක විතරක් නෙවෙයි තවත් දෙයක් හොයා ගන්න තියෙනව."

"තව දෙයක්? ඒ මොකක්ද?"

"මගෙ ප්‍රොජෙක්ට් ප්‍රපෝසල් එක... චෙරිය ඒක ගල් කළානෙ... ඒකත් මේ ඔෆිස් එකේමයි තියෙන්න ඕනෙ. ප්‍රොෆෙසර් වීරා කිව්ව චෙරිය මිනිහගෙ කමෙන්ට්ස් ඇල කොපියක් ගහ ගත්ත කියල..."

"හරි... ඒ වුණාට අපි ඉස්සෙල පේපර් එක හොයමු..."

"කොහෙන්ද අපි පටන් ගන්නෙ?" ආලෝක් ඇහුවෙ චෙරියගෙ මේසෙ උඩ තිබ්බ ෆයිල් ගොඩ අවුස්සන ගමන්. මළකෙළියයි... මුළු රෑම යාවිනෙ මෙහෙම හොයන්න ගියොත්!

"දුඹුරු පාට බෑග් එකක් බලන්න රතු පාට ලාකඩ සීල් තියෙන..." රයන් උපදෙස් දුන්න. අපි වෙලාව ඉතුරු කර ගන්න ඕනැවට චෙරියගෙ රාක්ක බෙදා ගත්ත. අපි චෙරියගෙ ඔෆිස් එකේ තිබ්බ ජර්නල්ස්, පරිපාලන ලියකියවිලි, පාඨමාලා සැකසීම්, කාලසටහන් ඔය ඔක්කොම අවුස්සන්න ගත්ත. විනාඩි විස්සක් ගියා. ම්හු.

"තියේද මුකුත්?" මං ඇහුව.

රයනුයි, ආලෝකයි ඔළු දෙපැත්තට වැනුව.

විනාඩි දහයකට පස්සෙ රයන් වැඩේ නවත්තල වෙරියගෙ පුටුවෙ වාඩි වුණා.

"ඇයි... මොකෝ?"

"මං බලපු රාක්කවල මුකුත් නෑ. ප්‍රොජෙක්ට් ප්‍රපෝසල් එකනං හම්බ වුණා... මේ..."

රයන් ෆයිල් එකක් දිග ඇරිය.

"පෙනේද මූ ලියල තියෙන කමෙන්ට් එක... මෙහි වාණිජ හෝ අධ්‍යාපනික වටිනාකමක් හෝ නොමැත... අනේ ඉතින් මූගෙ අම්..."

"ඒක පස්සෙ කතා කරමු. මගෙ රාක්කවලත් මුකුත් නෑ. මොකෝ කරන්නෙ?"

"රතු ලාකඩ සීල් එකක් තියපු දුඹුරු පාට බෑග් එකක් නේ? මේජර් එක්සැමිනේෂන් - කන්ෆිඩෙන්ෂල්. මේකද අපි ඔය හොයන නිධානෙ...?" ආලෝක් දකුණු අතෙන් බෑග් එකක් උස්සල වන වනා ඇහුව.

අපිව එක පාරට උඩ විසි වුණා! මෙන්න බඩු!!

"ආයිත් අහල... ඔයා යකෙක්නෙ..." රයන් ප්‍රශංසා කළා.

"යේ..." අපි එකාට එකා පහ දා ගත්ත.

"මටනං මේක විශ්වාස කරන්නත් බෑ..." ආලෝක් කිව්ව.

"ඒ, ඔයා මාව විශ්වාස නොකළ හින්ද. හරි... හරි... ඉක්මන් කරමු. අපිට තව කරන්න දේවල් තියෙනව. ඉස්සෙල්ලම මේ සීල් එක..." රයන් මිනිහගෙ සාක්කු අදින්න ගත්ත. මිනිහ ඒකෙන් බ්ලේඩ් එකක්, ඉටිපන්දමක්, ලයිටරයක් එක්ක ලාකඩ ටිකකුත් එළියට ගත්ත.

"අඩේ... ඔක්කොම අරගෙනනෙ ඇවිත් තියෙන්නෙ...?" ආලෝක් පුදුම වුණා. ආලෝක්ගෙ ස්වරයේ තිබ්බෙ සැනසුම් ගතියක්.





"නැත්තං? මෝඩයො වගේ අත් වන වනා ඇවිත් හරියනවයැ මේ වගේ දේකට...? මට විනාඩි දෙක තුනක් දෙන්නකො..." රයන් බ්ලේඩ් එක අරන් කවරේ තිබ්බ සීල් එක යටින් සියුම්ව කපන්න ගත්ත. පෙත්තක් ගහනව වගේ.

"කොහෙන්ද ඕව ඉගෙන ගත්තෙ?" මං කෙඳිරුව.

"අපි ඉගෙන ගන්නෙ ඉංජිනේරුවො වෙන්න නේද? මේක එච්චර අමාරු වැඩක් නෙවෙයි... ඔහොම ඉන්නකො සද්ද නැතුව..." රයන් කිව්ව.

"කොච්චර වෙලා යයිද?" ආලෝක් ඇහුවෙ වෙරියගෙ පුටුවට ඉස්සරහින් තියෙන පුටුවෙ වාඩිවෙන ගමන්.

"විනාඩි දහයක්... සද්ද නැතුව ඉන්නවද? නැත්තං පේපර්සුත් කැපෙන්න ඉඩ තියෙනව..."

විනාඩි දෙකක් ගියා. මං ආලෝක් දිහා බැලුව. මිනිහගෙ මූණෙ තිබ්බ පෙනුමෙන් මට කියන්න පුළුවන් වුණා මිනිහ තාම හිතන්නෙ ගෙදර ගැනය කියල.

"තාත්තට කොහොමද දන්නෑ... කෑම නොකා හිටියොත් එයා ලෙඩ වෙනව ෂුවර්... මට මොනව හරි කරන්න තිබ්බනං..."

කෑමයි, ආලෝක්ලගෙ පවුලයි අතරෙ තියෙන සම්බන්ධෙ දිහා බැලුවම කෑම නැති වුණහම කවුරු හරි ලෙඩ වෙනවයි කියන එක තර්කානුකූල කාරණාවක්.

"ඕව ගණන් ගන්න එපා. ඒක කාගෙවත් වරදක් නෙවෙයි. මනමාලයගෙ පැත්තෙ එවුන් කුණු පෙරේතයො වෙන්න ඕනෙ..." මං ආලෝකව සැනසුව.

"උන් ඔක්කොම එකයි... තාත්ත ගැන දැන ගන්න තියේනං හොඳයි. අර ඉලව් ෆෝන් එක දැන්වත් වැඩ කරනවද දන්නෑ..."

"වැඩේ හරි...!" රයන් ඉතාම අඩුම පලුදු එක්ක බෑග් එක ඇරල තිබ්බ! ඒකෙ ඇතුළෙ තිබ්බෙ කිරි කිරි පේපර්ස්! මේජර් එග්සැම් එකේ පේපර්ස්!!

"එළ...! කෝ බලමු..." මං කිව්ව.

"නෑ... නෑ... මං දන්නවනෙ ඔයාල ගැන. ඔයාල ඒව මෙතන කතා කරන්න ගනීවි. අපි මේක බලන්නෙ මෙහෙන් ගිහින්. අපේ ස්ටඩි රූම් එකේදි..." රයන් පැහැදිලි කළා.

"දැන් මොනවද කරන්නෙ?" ආලෝක් ඇහුව.

"මේකෙ කොපිය අරන් ආයෙ සීල් කරන්න ඕනෙ... ඔයා හිතුවෙ මං මොකට ලාකඩ, ඉටිපන්දම්, ලයිටර් ගෙනාව කියලද?"

"හ්ම්... එහෙනං තව සෑහෙන වෙලාවක් යයි..." ආලෝක් සුසුම් හෙළුව.

"රයන්... ඉක්මන් කරමු..." මං කිව්ව.

"කටවල් වහගෙන ඉන්නවල. ඕක මට අමුතුවෙන් කියන්න ඕනෙ නෑ..." රයන් ඉටිපන්දම පත්තු කරල ලාකඩ උණු කරන්න වුණා. එක පාරටම ආලෝක් අමුතු පණක් ලැබිල වගේ කෙළින් වුණා.

"ඒයි හරි... මේකෙ ෆෝන් එකක් තියෙනවනෙ..." ආලෝක් ඇස් බබළ බබළ කිව්ව.

"ඔව් ඉතින්...?"

"මට ගෙදරට කෝල් එකක් ගතහැකිනෙ මෙතනින්ම?"

"මෙතනින්? ඇයි ඉතින් එළියෙන් ගමුකො... මොකෝ ඔච්චර තදියම." මං කිව්ව.

"මේ වෙලාවට හැම තැනම වහලනෙ... මට ඕනෙ තාත්තට කොහොමද කියල බලා ගන්න විතරයි... නැත්තං අපි මොකද කරන්නෙ මේ වැඩේ කරනකං..."

"අනේ මන්ද..." මං උරිස් ඇකිළුව.

ආලෝක් නැඟිටල ෆෝන් එක ළඟට ගියේ පුදුම උනන්දුවකින්.





"මං හිතන්නෙ අවුට් සයිඩ් කෝල් ගනිද්දි ඉස්සෙල්ල නවය ගහන්න ඕනෙ..." මං කිව්ව.

"මේ ඔයාල මොනවද කරන්නෙ ඔතන? දඟලන්නෙ නැතුව එක විදිහකට ඉන්න බැරිද මං මේක කරනකල්?" රයන් ඇහුවෙ රත් වෙච්ච ලාකඩ දුඹුරු බෑග් එක උඩට වක් කරන ගමන්.

"ගෙදෙට්ට කෝල් එකක් ගන්නව... විනාඩියකට... ඔයා තව වෙලා ගනීවිනෙ ඕනට..." ආලෝක් නිදහසට කරුණු කිව්ව.

"එළියෙන් ගන්න බැරිද?" රයන් ඇහුව. "මොකෝ... කෝල් එකක් ගන්නවත් ඔයාට සල්ලි නැද්ද මේ දවස්වල?"

"විනාඩියයි මනුස්සයො... ඔයා ඔය වැඩේ කරන්නකො..." ආලෝක් නොම්බර කරකවන්න වුණා.

ගත්ත ගමන්ම වගේ නොම්බරේ වැඩ කළා. ආලෝක්ගෙ අම්ම බලාගෙන ඉඳල තියෙන්නෙ ආලෝක්ගෙන් කෝල් එකක් එනකල් බව මට තේරුණේ එයාලගෙ කතාවෙන්. ආලෝක් වැඩිය කතා කළේ නෑ. ඒ වෙනුවට ආලෝක්ට සිද්ධ වුණේ අක්ක ගැනයි, තාත්ත ගැනයි, මුළු පවුලෙම අවාසනාව ගැනයි අම්ම කියන මැසිවිල්ලට කන් දීගෙන ඉන්නයි.

රයන් අලුත් සීල් එක තියා ගන්න දඟල දඟල හිටිය. ආලෝක් කතා කර කර හිටිය. මට කරන්න දෙයක් නැති නිසා මං කළේ රයන්ගෙ ප්‍රපෝසල් එක පෙරළ පෙරළ බල බලා හිටිය එකයි. මෙතනදි තමයි ඒක වුණේ.

මංවත්, අපි කවුරුවත් ඒ වෙනකල් දැනගෙන හිටියෙ නෑ කැම්පස් ෆෝන් සිස්ටම් එක වැඩ කරන්නෙ කොහොමද කියන එක ගැන. මෙහෙමයි ඒක වෙන්නෙ. හැම ප්‍රොෆෙසර් කෙනෙකුගෙ ඔෆිස් එකේම වෙනම ෆෝන් එකක් තියෙනව. ඒක පාවිච්චි වෙද්දි කැම්පස් කොන්ට්‍රෝල් ස්විච් බෝඩ් එකේ රතු බල්බ් එකක් පත්තු වෙනව. හැම ඔෆිස් එකටම නොම්බරයක් දීල තියෙන හින්ද පාවිච්චි වෙන ෆෝන් එක මොන ඔෆිස් එකේද කියල දැන ගන්න පුළුවන්. ඉස්සර වෙලා නවය ගහලා

පිට කෝල් එකක් ගනිද්දි ඒක කොළ පාටට පත්තු වෙනව. රෑට ගොඩක් වෙලාවට ස්විච්බෝඩ් එකේ ඉන්නෙ ගාඩ් කෙනෙකුයි, ටෙලිෆෝන් ඔපරේටරුයි විතරයි. ඒ කන්ට්‍රෝල් රූම් එක තියෙන්නෙ චෙරියගෙ ඔෆිස් එක තියෙන බිල්ඩිමේම යට තට්ටුවෙ. ගොඩක් වෙලාවට මහ රෑට එතන ඩියුටි ඉන්න දෙන්න කරන්නෙ මොනව හරි වල්පල් කියෝ කියෝ ඉන්න එකයි. එදත් එහෙම ඉන්දැද්දි තමයි ස්විච් බෝඩ් එකේ, හයවෙනි තට්ටුවෙ තියෙන චෙරියගෙ ඔෆිස් එක පෙන්වන බල්බ් එක කොළ පාට වෙලා, බීප් ගෑවෙ. ඒ, අපේ අර ආලෝක් කියන ගොන්වහන්සේට ඉවසන්න බැරුව ගත්තු බූරු, තකතීරු, ඔළමොට්ටල කෝල් එක නිසා බව ආයෙ අමුතුවෙන් කියන්න ඕනෙ නෑනෙ! ගාඩ්ට ප්‍රශ්නයක් ඇති වුණා. මොනවද මේ මහ රෑ ප්‍රොෆෙසර් චෙරියන් ඔෆිස් එකේ කරන්නෙ? ඒ අතරෙදි ඔපරේටර් ඒ ලයින් එකේ සිද්ධ වෙන කතාබහට ඇහුම්කන් දුන්න. ඒ ප්‍රොෆෙසර් චෙරියන්නං නෙවෙයි. කවුදෝ ගෑනු කෙනෙක් එයා ගැනයි, එයාගෙ දුව ගැනයි, ගෙදර ගැනයි, කැඩිච්ච මඟුලක් ගැනයි, ආලෝක් කියල කෙනෙකුට කියන දුක්ගැනවිල්ලක්. මැසිවිල්ලක්. අඳෝනාවක්! ගාඩ් උත්තමය වෝකිටෝකි එකෙන් මුර සංචාරෙ යන ගාඩ්ලට කියල තියෙනව ගිහින් ප්‍රොෆෙසර් චෙරියන්ගෙ ඔෆිස් රූම් එක චෙක් කරන්න කියල. ඒ විදිහට තමයි ගාඩ්ල දෙන්නෙක් හයවෙනි තට්ටුවෙ ප්‍රාදූර්භූත වුණේ!

අපේ තියෙන අවාසනාවට, කාලකණ්ණිකමට ඒ මොකුත් අපි දැනන් හිටියෙ නෑ!

"ඔයාගෙ ප්‍රපෝසල් එකේ ඇතුළෙ පේජස්වල එක එක කමෙන්ට්ස් දීල තියෙනව." මං කිව්ව.

"බොරු වැඩ... චෙරිය කැමති නෑ මගෙ ප්‍රපෝසල් එකට තැනක් දෙන්න... ඒකයි ඇත්ත කතාව. ඉතින් මොනව හරි කමෙන්ට්ස් ලියනව. මං ඕක ප්‍රැක්ටිකලි කරල පෙන්නල තියෙනව... ඉතින් කොහොමද ඌ කියන්නෙ ඒක වැඩක් නැති ප්‍රොජෙක්ට් එකක්ය කියල... පරය... ඌහ්..." උණු වෙච්ච ලාකඩ ටිකක් මිනිහගෙ ඇඟිල්ලට වැටිල!





"හරි... හරි... ඔයා ඔය වැඩේ කරන්න... ආලෝක් ඕක තව ඉවර නැද්ද?" මං ඇහුව.

එතකොටම තමයි ගාඩ්ලා දෙන්නා ඔෆිස් එකේ දොර ඇරල ඒ ළඟ හිට ගත්තෙ. එයාල මං හිතන්නෙ විනාඩි දෙකක් විතර දොර ළඟට වෙලා ඉන්න ඇති. ඊට පස්සෙ තමයි දොර අරින්න ඇත්තෙ. පත්තු වෙන ඉටිපන්දම, උණු වෙච්ච ලාකඩ, ප්‍රොෆෙසර්ගෙ පුටුවෙ වාඩි වෙලා ඉන්න ශිෂ්‍යයා, මේසෙ උඩ තිබෙන ප්‍රශ්න පත්තර... ඕන මැටි මෝලෙකුට තේරෙනව ඒව දිහා බැලුවම මෙතන මොකද වෙන්නෙ කියල. ඒක තේරුම් ගන්න ගාඩ්ලට මහ ලොකු විභාග පාස් කරන්න ඕනෙ නෑ.

ආලෝකය ගල් ගැහුණ. ෆෝන් එක අත ඇරුණ. එහා පැත්තෙ හිටිය එයාගෙ අම්ම හිතන්න ඇති ආයෙම ලයින් එකේ ලෙඩක්ය කියල! ඇත්තම කිව්වොත් අපි ඔක්කොම හීතල වෙලා, ගල් ගැහුණ. අනේ කෝට්! මං එහෙමම පුටුවෙ ගල් වෙලා හිටිය. මං දන්නෙ නෑ රයන් කොහොම කතා කළාද කියල. ඒත් මිනිහ තමයි ඉස්සෙල්ලම කට ඇරියෙ.

"ඕ... ගාඩ් සහීබ්... හලෝ... එන්න එන්න... මං කියන්නං විස්තරේ..." රයන් කිව්වෙ කිසි දෙයක් නොවෙච්ච් ගානට. බොහොම සැහැල්ලුවෙන්.

"ඔයා කවුද?"

"ගාඩ් සහීබ්..." රයන් කිව්වෙ නැඟිටින ගමන්. මිනිහ නැඟිට්ට විදිහෙන් මට තේරුණා ඕන වුණොත් පටාස් ගාල පැන දුවන්න බලාගෙන තමයි නැඟිට්ටෙ කියල. මායි, ආලෝකයි දෙන්නත් ඒ පස්සෙන් වැටුණෙ රයන්ගෙ හදිසි නියෝගෙකට අවනත වෙන්න බලාගෙන.

"ඔහොම ඉන්නව... එන්න එපා..." ගාඩ් කෙනෙක් කිව්ව. "අපි දැන් ප්‍රොෆෙසර්ට කතා කරනව..."

"චහ්... චහ්... චහ්... එහෙම එපා ගාඩ් සහිබ්. ඉස්සෙල්ල පොඩ්ඩක් අහගන්නකො කතාව..." රයන් කිව්වෙ තවත් අඩි දෙක

තුනක් දොරට ළං වෙන ගමන්. එතකොටනං අපිට හොඳටම පැහැදිලි වුණා, අපි හදන්නෙ එක පිම්මට එළියට පනින්න බව!

ඒත් එතකොටම උන්ට අපේ හිත් කියවන්න පුළුවන් වෙලා හරි, බයට හරි, සැකේට හරි උන් කළේ අපිට කලින් එළියට පැනල දොර වහල ලොක් කරපු එකයි! අපි අහගෙනයි එකෙක් අනිකට කියනව, ඉක්මනට ප්‍රොෆෙසර් චෙරියන්ටයි, සිකියුරිටි ලොක්කටයි කතා කරන්න කියල! රයන් ආපහු එයාලට කතා කරන්න හැදුවත් වැඩක් වුණේ නෑ. අපි තුන්දෙනා ප්‍රොෆෙසර් චෙරියන්ගෙ ඔෆිස් එක ඇතුළෙ හිරකාරයො වුණා. ඔව්... රෑ දොළහට... හයවෙනි තට්ටුවෙ හිරකාරයො...!

අපි වචනයක්වත් කතා කළේ නෑ. අපි කළේ එක එක එකාගෙ මූණට මූණ බලාගෙන හිටිය එකයි. අපිට තිබුණෙ දොර අරිනකල් ඔහේ ඉන්න එක විතරයි. අපිට වෙන විකල්පයක් තිබ්බෙ නෑ. මගේ ජීවිතේ දිග....ම දවස තාම ඉවරයක් නෑ වගේ.



# 19

## මගේ ජීවිතේ දිග.....ම දවස - 4

චෙරියගෙ ඔෆිස් දොර ඇරෙනකල් ගත වෙච්ච මොහොතෙදි මං මගේම ඇතුළාන්තෙට රිංගුව. තව ටිකකින් මේ දොර අරෙනව. අපේ ඉරණම තීන්දු වෙනව. ආලෝකයයි රයනුයි මොනව හරි කිව්වද කියල මං දන්නෙ නෑ. ඒත් උන් මොනව හරි කිව්වත් මට ඒව ඇහුණෙ නෑ. අනාගතේ පුපුරල හැලෙන හැටි මට පේන්න ගත්ත. හෙට උදේ වෙනකොට මුළු කැම්පස් එකම, ප්‍රොෆෙසර්ස්ල ඔක්කොම, ළමයි ඔක්කොම අපි ප්‍රොෆෙසර් චෙරියන්ගෙන් පේපර්ස් හොරකම් කරන්න ගිහින් අහුවුණු බව දැන ගන්නව. ඒකෙ දෙකක් නෑ! මේක විශේෂ අවස්ථාවක් නිසා කැම්පස් ඩිරෙක්ටර් එන්නත් ඉඩ තියෙනව. චෙරියට පුළුවන්නං අපිට වෙඩි තියාවි. ඒක කරන්න බැරි නිසා මිනිහ මේක ලේසියෙන් අරින්නෙ නැති එකනං ෂුවර්. මොකක්ද අර කොමිටි එකේ නම? ආ... විනය කමිටුව... ඩිස්ප්ලිනරි කොමිටි... ඒක ඉස්සරහට ආල අපේ ඉරණම තීරණය කරාවි. අනේ දෙයියනේ මට ලැබිල තිබ්බ පහයි පොයින්ට් ගාණ මට හොඳටම ඇති.! ඒක අරන් මේකෙන් පිටවෙලා පොඩි ජොබ් කට්ටක් හොයා ගන්න තිබ්බනං මට ඇති! දැන් තමා එහෙම හිතෙන්නෙ. ඒත් දැන් ඒකවත් නොලැබෙන පාටක් තමා තියෙන්නෙ. අපි බැගෑපේනල වෙලා යටහත් පහත්ව චෙරියගෙන් සමාව ඉල්ලුවොත් මිනිහ අපිට බුරුලක් දේවිද? එහෙමත් නැත්තං අපි මිනිහගෙ ඔෆිස් එකට ආවෙ හොරකං

කරන්න නෙවෙයි කියල පරසක්වළ ගැහුවොත් කී දෙනෙක් ඒක පිළිගනීවිද? එහෙම නැත්නම් අපි වැරැද්ද පිළි අරගෙන සමාව ඉල්ලුවොත් මොනව වෙයිද? එහෙමත් නැත්නම් අපිට බැරිද ටේප් එකක් ආපස්සට යවනව වගේ කාලය ආපස්සට යවල, අර බූරු ආලෝකව කෝල් එක ගන්න හැදුවම ඒක නවත්තන්න? මට ආයෙත් මේ දවස මුල ඉඳල පටන් ගන්න බැරිද?

මේ වගේ තකතීරු ප්‍රශ්න මගෙ ඔළුව ඇතුළෙ පිනුම් ගහන්න ගත්ත. මං ලොකු හුස්මක් ගත්ත. අපිට මේවට මූණ දෙන්න වෙනව.

"කවුද එනව..." රයන් කිව්ව.

අපි නැගිට්ට. දොර ඇරුණ. දහදෙනෙක් විතර කාමරේට කඩා වැදුණ. ඉස්සෙල්ල ආව ගාඩ්ල දෙන්නයි, එයාගෙ චීප් සිකියුරිටි ඔෆිසරුයි අපිට අඳුරු ගන්න අමාරු වුණේ නෑ. ඊළඟට හිටියෙ ටෙලිෆෝන් ඔපරේටර්. අපි මිනිහව අඳුන ගත්තෙ එයා ඇඳල හිටිය යුනිෆෝම් එකෙන්. මෙච්චර කල් බල්ලෙක්වත් ගණන් ගත්තෙ නැති ඒ සෙට් එක, මෙන්න එක පාරටම වීරයො වෙලා!

ඊළඟට හිටියේ මෙකැනිකල් ඉංජිනියරින් එකේ ප්‍රොෆෙසර්ල දෙන්නෙක්... අහ්... ප්‍රොෆෙසර් වීරත් හිටිය. ඒ වගේම අපි තාවකාලිකව අත්පත් කර ගත්තු ඔෆිස් එක ඇත්තටම අයිති කෙනා, චෙරිය... මිනිහත් හිටිය බව ආයෙ අලුතෙන් කියන්න ඕනැයැ? මිනිහ හිටියෙ තක්බීර් වෙලා. දොරක්, ජනේලයක්, අගුලක් කඩන්නෙ නැතුව මිනිහගෙ ඔෆිස් එකට අපි රිංගුවෙ කොහොමද කියන එකයි මිනිහගෙ ඔළුවෙ වැඩ කළේ. අයි.අයි.ටී. එකේ මේ තද පොරවල් ඇවිත් හිටියෙ පිජාමා එකෙන්. චෙරියට එහෙම තදවෙන එක වැඩි වෙන්න පිජාම ඇඳන් ඉන්න එකත් හේතුවක් වෙන්න ඇති.

මේ හැමෝගෙම නායකයා වගේ ඇවිත් හිටියෙ ඩීන් ශාස්ත්‍රී! ඒ කිව්වෙ පීඨාධිපති!! කැම්පස් එකේ සර්ව බලධාරියා... ඩීන්ව දැක්කම අපි දැන ගත්ත වැඩේ නම් ලේසි නොවෙන බව!





ගාඩ් ඔක්කොමලව ඇතුළට අරන් අපි දිහා ඇහැ ගහගෙන හිටියෙ අපි කොයි වෙලේ හරි පැනල දුවයි කියල වෙන්න ඕනෙ.

"තමුසෙ!" චෙරිය මට ඇඟිල්ල දික් කළා. මිනිහගෙ දුවත් එක්ක උදේ... මිනිහගෙ ඔෆිස් එකේදි රෑට... එහෙම එකෙක්ව දැක්කහම මොන මනුස්සයද අන්දමන්ද නොවෙන්නෙ? ඉවරයි... ඔක්කොම ඉවරයි.

"මොනාද ඔයාල මේකෙ කළේ?" ප්‍රොෆෙසර් වීරා ඇහුවෙ අපි කරපු දේ ගැන හිතා ගන්න බැරුව නෙවෙයි. ගාඩ්කාරයා රස කෑමක් හම්බ වෙච්ච ගානට, හැමෝටම, එක්දාස් තුන්වෙනි සැරේටත් මිනිහ දැක්ක දේ කියන්න ගත්තෙ තලු මර මර. ඉටිපන්දම ගැන, ලාකඩ ගැන... මේසෙ උඩ තිබ්බ ප්‍රශ්න පත්තර ගැන...! සමහර විට ප්‍රොෆෙසර් වීරා එහෙම අහන්න ඇත්තෙ පිළිගන්න පුළුවන් බොරුවක් කියල, මෙතනින් මාරු වෙන්න අවස්ථාවක් අපිට උදා කරන දෙන්න වෙන්න ඇති.

අපි වචනයක්වත් කතා කළේ නෑ. නිශ්ශබ්දතාවෙන් අපිව වාෂ්ප වුණානං...!

"මෙයාලා සර් මේජර් පේපර්ස් හොරකම් කරන්න ඇවිත්. මගෙ කොල්ලො ටික හොඳ වෙලාවට මෙයාලව අල්ල ගත්ත..." චීෆ් සිකියුරිටිය ලකුණු දා ගන්න හැදුව. මිනිහ ඒක කිව්වෙ හරියට සී.අයි.ඒ. එකේ රහසක් හොයා ගත්තු ගානට.

"තමුසෙ මගෙ ඔෆිස් එකෙන් පේපර්ස් හොරකම් කරන්න ආවෙ... ආ? කොහොමද තමුසෙ මේක ඇතුළට ආවෙ?" චෙරියන් මගෙන් කෙළින්ම ඇහුව.

"ප්‍රොෆෙසර් චෙරියන්... ඔයා මෙයාව දන්නවද?" වෙනින් ප්‍රොෆෙසර් කෙනෙක් චෙරියගෙන් ඇහුව.

"එහෙමටම නෑ... පන්තිවලදි දැකල තියෙනව. පහළ ලකුණු තියෙන කෙනෙක්. මගෙ වයිවා එකට ආවෙ බීලා... ඒකයි මට හොඳට මතක. හරිකුමාර්... ඒකනෙ තමුසෙගෙ නම... එහෙම නේද?"

උදේ වෙච්ච් සංගෙදිය ප්‍රොෆෙසර්ල ඉස්සරහ කියන්න වෙරියට ඕනකමක් නැතුව ඇති!

"කවුද මේ අනික් දෙන්න...?" ඩීන් ඇහුව. "නම් කියනව බලන්න..."

"ආලෝක් ගුප්තා සර්... මැකැනිකල් ඉංජිනියරින්..." ආලෝකය කිව්ව. බූරු මැට්ට!

"රයන් ඔබරෝයි... ඒකෙමයි..." රයන් කිව්ව.

"තමුසෙල හිතුව තමුසෙල වූ ස්මාර්ට් කියල නේ?" ඩීන් ඇහුව.

"නෑ සර්... ඒ නිසයි අපිට පේපර්ස් ඕනෙ වුණේ!" මළ හත්තිලව්වයි. රයනා... උඹ මේ මොනවද දොඩවන්නෙ ගොනෝ?

"චටාස්...!" ඩීන් රයන්ගෙ කනට ගැහුව. මම ඒකටනං ඩීන්ට දොස් කියන්නෙ නෑ. රයන් දැන ගන්න ඕනෙ මේ වෙලාවෙ අතිපණ්ඩිතකං දොඩවන්නෙ නැතුව ඉන්න.

"චටාස්..." "පටාස්..." මොනාද වුණේ කියල හිතන්නත් කලින් ඩීන් මගෙයි, ආලෝක්ගෙයි කම්මුල්වලටත් ඒ සත්කාරෙම දීල ඉවරයි.

පට් රෝල්! ප්‍රොෆාලා, ගාඩ්ලා, වෙරිය... මේ ඔක්කොම අපේ මූණු රතු වෙන හැටි බලන් හිටිය. අපි සද්දක් නැතුව ඉන්න වගබලා ගත්ත. මං රහසින් ප්‍රාර්ථනා කළේ එතන හිටිය ඔක්කොමල හරි කමක් නෑ, අපේ කනට ගහල කේස් එක එතනින් ක්ලෝස් කරනවනං කියලයි. කනට බැරිනං පොල්ලක් අරන් තඩි බෑවත් කමක් නෑ විනය කමිටුව ඉස්සරහට නොයවා! එතෙන්ට ගියොත් පුතෝ ආයෙ දෙකක් නෑ... කැම්පස් එකෙන් පෝඩා පෝම තමා!

"තමුසෙල අපරාධකාරයො...තේරුණාද...? අපරාධකාරයො... කතා කරනවල පොලීසියට." වෙරිය කිව්වෙ වෙවුල වෙවුල හරියට කම්මුල් පාරවල් කෑවෙ මිනිහ වගේ!





වෙරිය ෆෝන් එක දිහාට යද්දිම ප්‍රොෆෙසර් වීරා කතා කළා.

"ප්‍රොෆෙසර් වෙරියන්... පොලීසියට කතා කළොත් මේක විශාල කේස් එකක් වෙනව."

"මේක විශාල කේස් එකක් තමයි..." වෙරිය බෙරිහන් දුන්න.

වෙරියො... ඇයි ඔයා පොලීසියට කියන එක නවත්තල අපට කනට ගහන්නැත්තෙ? මං දන්නව ඔයාට ඒකට හොඳටම ඕනකම තියෙන බව. අනෙක් අයට කොහොම වුණත් මගෙ කනට ගහන්න ඕනකම තියෙන බව!

"ඩීන් ශාස්ත්‍රී..." ප්‍රොෆෙසර් වීරා ඩීන්ට කතා කළා. "ඔයාවත් මේක එයාට පැහැදිලි කරනවනං හොඳයි. පොලිසි යනව කියන්නෙ, මේක පත්තරවල තඩි අකුරෙන් යනව කියන එකයි. එතකොට අපේ අයි.අයි.ටී. ප්‍රතිරූපෙට මොකද වෙන්නෙ?"

"හ්ම්ම්..." ඩීන් ඒ ගැන කල්පනා කරන බව පෙනුණ. අත් එකට අතුල්ල අතුල්ල.

"සර්... අපිට අපේ කැම්පස් එක ඇතුළෙ සිස්ටම් එකක් තියෙනවනෙ මේ වගේ දේවල් විසඳගන්න. පොලීසියට කිව්වොත් එයාල එන්නෙ රිපෝටර්ස්ල එක්කමයි..." ප්‍රොෆෙසර් වීරා පැහැදිලි කළා.

"හ්ම්... වීරා කියන එකෙත් ඇත්තක් තියෙනව. මේ වගේ දුෂ්ට නීචයො නිසා අයි.අයි.ටී. එකේ මඩ ගාන්න මම කැමති නෑ."

නාහෙටත් උඩින් වතුර ගලල තිබ්බ මේ වගේ වෙලාවකදි වුණත් ඩීන් කියපු 'දුෂ්ට නීචයො' වචනවලට මට හිනා ගියා. ඒක හරිම 'කියුට්' කියලයි මට හිතුණේ!

"සර්... මට ඕනෙත් නෑ අයි.අයි.ටී. නමේ මඩ ගාන්න... ඒත් මෙයාල පාඩමක් ඉගෙන ගන්න ඕනෙ... දඬුවම් විඳින්න ඕනෙ.

මෙයාල කවුරු කියලද මේගොල්ල හිතාගෙන ඉන්නෙ?" වෙරිය ඩීන්ට කිව්ව.

"හරි... මේක එහෙම ලේසියෙන් අත අරින්න පුළුවන් දෙයක් නෙවෙයි. අර කිව්වත් වගේ අපිට අපේම සිස්ටම් එකක් තියෙනවනෙ... ඒක අපි නිතර පාවිච්චි නොකරන එක වෙනම දෙයක්... ඒත් මේ වගේ දේකට ඒක පාවිච්චි කරන්න ඕනෙ කියලයි මං හිතන්නෙ... මෙයාලව විනය කමිටුවට දාන්න..." ඩීන් තීන්දුව දීපි!

පොලීසිය කිව්වත් බය නොවෙච්ච අපි 'විනය කමිටුව' කියන වචනෙ ඇහුවම වෙවුලන්න ගත්ත. අපි කට වහගෙන ඉඳීම හරියන්නෙ නෑ වගේ. දෙයියනේ... මොනව හරි කියමු... රයන්... ඇයි ඔයත් කට වහගෙන? අඩුගානෙ මං හිතුව රයන්වත් කතා කරාවි කියල. ම්හු... ආලෝක් විතරයි යමක් කළේ. සුපුරුදු විදිහට මිනිහ මී හරකෙක් වගේ අඬන්න පටන් ගත්තෙ නැතෑ!

"සර්... ප්ලීස් සර්... සොරි සර්... ආයෙ එහෙම කරන්නෙ නෑ සර්..." ආලෝක් හොටු පෙරාගෙන කිව්ව.

"කතාව ඉවරයි... අවුරුද්දෙන් අවුරුද්ද මේකෙ ඉන්න අයගෙ තත්ත්වෙ බල්ලට යනව. හෙටම විනය කමිටුව කැඳවන්න..." ඩීන් අවසාන නිවේදනේ කළා.

"ඩීන් සර්... ඇතුළු වීමේ විභාගවලදි නුවණනං මනිතහැකි... ඒත් අවංකකම මනින්න විභාගයක් නෑනෙ..." සිකියුරිටි චීෆ් කිව්වෙ මිනිහ කරපු වැඩේ තරමට මිනිහට ප්‍රශංසා නැති වෙච්චි හිතේ අමාරුවෙන් වෙන්න ඕනෙ.

★

පහුවදා උදේ කුමාඕන් හොස්ටල් එකේ නෝටිස් බෝඩ් එක වටේ පොරවල් වට වෙලා නෝටිස් එකක් කියව කියව හිටිය.





ඒක එච්චර ලොකු කොළේක නෙවෙයි ගහල තිබ්බෙ. චෙක් එකක් තරම් පොඩි කොළයක්. නෝටිස් එක පොඩි වුණාට ඒකෙන් ඇති වෙච්ච කතාබහනං පොත් ගාණක් ලියන්න පුළුවන් තරමයි!

"අද රාත්‍රී 10.00ට කාර්මික ඉංජිනේරු අංශයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී විශේෂ විනය කමිටු රැස්වීමක් පැවැත්වෙයි. අප්‍රේල් 11 වෙනිදා සිදු වූ සිද්ධියක් සම්බන්ධයෙන් චෝදනා ලබා සිටින හරිකුමාර් (කුමාඕන්), ආලෝක් ගුප්තා (කුමාඕන්) සහ රයන් ඔබරෝයි (කුමාඕන්) පිළිබඳ තීරණයක් ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වෙයි."

නෝටිස් බෝඩ් එක පැත්ත පළාතකටවත් යන්න බැරි තරමෙ ලැජ්ජාවක් අපිව වෙළාගෙන තිබ්බ. අපි පුළුවන් තරම් කට්ටියව මඟ ඇරිය. බැරි වෙලා හරිඅපිව හම්බ වුණ අයට යන්තං හිනාවෙලා පටස් ගාල මාරු වුණා. ඒත් තැන් තැන්වල කරන කතාබහ අපේ කන් අස්සට රිංගුව.

"මොකද වෙලා තියෙන්නෙ... පන්ති කට් කරලද?" අනුරාග් ඇහුව.

"ඒකට විනය කමිටුවට ගෙනියනවයැ. මේක මොකක් හරි වෙන කේස් එකක්..."

"මොකක් හරි මේජර් සීන් එකක් තමයි. නැත්තං එක රැයෙන් ගහෙන් ගෙඩි එන්න වගේ විනය කමිටුවට දාවියැ...?" තව එකෙක් කිව්ව.

"අනික රෑ... මොකක් හරි මෙකැනිකල් ඉංජිනියරින් ඩිපාට්මන්ට් එකට සම්බන්ධ කේස් එකක් තමා..."

අපි ඕන කෙනෙකුට ඕන දෙයක් හිතා ගන්න ඉඩ දීල කැම්පස් එකෙන් පිට වුණා. නේහට පින් සිද්ධ වෙන්න කිසිම කෙනෙක් අපිව හොයාගෙන එන්නෙ නැති තැන් කීපයක් මම දැනගෙන හිටිය. හොඳම තැන වුණේ අයිස්ක්‍රීම් පාලර් එක. ආලෝක් කෙළින්ම කවුන්ටරේට ගිහින් ස්ට්‍රෝබෙරි අයිස්ක්‍රීම් තුනක් අරගෙන ආව.

"රයන්... ඔයා ළඟ සල්ලි ඇතිනෙ... මගෙ ළඟ ශතයක් නෑ..." ආලෝක් එහෙම කියල අයිස්ක්‍රීම් පාස් කළේ හරියට ඒව එයාගෙගානෙ වගේ.

"මේ වගේ වෙලාවකදිත් කෑම කන්නනං මේන් සතා..." මං ආලෝක්ට විහිළු කළා.

"අයිස්ක්‍රීම්... මට මේ වෙලාවෙදි ඕනෙ මගෙ හිත වෙන පැත්තකට හරවන දෙයක්... ඔයාල දන්නවනෙ මට ඊයෙ රෑ තප්පර දෙකක්වත් නින්ද නොගිය බව...?" ආලෝක් නිදහසට කරුණු කිව්ව.

"ඇයි මට? මටත් එහෙමයි..." ඇත්තටම මට නින්ද ගියෙත් නෑ.

"ඔයාල හිතන්නෙ එයාල අපිට මොනව කරයිද?" ඒකත් ආලෝක්ගෙන්.

"අපිව එක්සෑම් එකෙන් ෆේල් කරාවි. F එකක් දේවි..." රයන් අනුමාන කළා.

"F එකක්? මට ජීවිතේට F එකක් හම්බ වෙලා නෑ... එහෙම වුණොත් අපිට ආපහු කෝස් එක රිපීට් කරන්න වෙනවනෙ!" ආලෝක් නාහෙන් ඇඬුව.

"හ්ම්... ඒත් එහෙම වෙනව කියන්නෙ ලෝකෙ අවසානෙ නෙවෙයිනෙ..."

"ඔයාලට ඔල්මාදද? මේ මහ රෑ විනය කමිටුව තියන්නෙ, ඔක්කොම ප්‍රොෆෙසර්ස්ලට එන්න කියන්නෙ අපිට F එකක් දෙන්නද?" මං කිව්ව.

රයනුයි, ආලෝකයි මා දිහා බැලුවෙ මං එයාලගෙ අයිස්ක්‍රීම් එකේ තිබ්බ්ච චෙරි එක හොරකම් කරපු ගානට!

"මහ පොළොවට බැහැල හිතන්න නිකන් සුරංගනා කතා නොහිත..." මං කිව්ව. "විනය කමිටුව රැස් වෙන්නෙ භාව හඳ දකින ගානට... එහෙව් එකේ එහෙම රැස් වුණහම ආයෙ එයාලගෙන් අනුකම්පාවක්නං බලාපොරොත්තු වෙන්න එපා."





"මොනවද එයාලට කරන්න පුළුවන්...?" ආලෝක් සැකෙන් ඇහුව.

"එයාලට පුළුවන් අපිට පයින් ගහල කැම්පස් එකෙන් දොට්ට දාන්න... ඒ කිව්වෙ අපේ ශිෂ්‍ය භාවය අහෝසි කරන්න. ඊට අඩු මට්ටමෙන් බැලුවොත් එයාලට පුළුවන් අපිව අවුරුද්දකට නැත්තං සෙමෙස්ටර් එකකට සස්පෙන්ඩ් කරන්න...!"

"දොට්ට දාන්න...?" ආලෝක් වෙවුලුවෙ අයිස්ක්‍රීම් එක නිසානං නොවන බව මට තේරුණා.

"නැහ්... එයාල එහෙම කරන්නෙ නෑ. එහෙම කවදාවත් වෙලා නෑ... අඩු ගානෙ රැග් කරද්දි කොකාකෝලා බෝතල් අහවල් තැනට එබුව අයවවත් එයාල අස් කරල නෑ..." රයන් කිව්ව.

"ඒක එහෙමයි කියමුකො... අවුරුද්දකට හරි සෙමෙස්ටර් එකකට හරි අපිව තහනම් කළොත්...? ඉවරයිනෙ අපේ අනාගතේ... ඔයා හිතන්නෙ ඊට පස්සෙ අපිට ජොබ් එකක් හොයා ගන්න ලේසි වෙයි කියලද?" මං කිව්ව.

"සෙමෙස්ටර් එකක්?? එහෙම කළොත් අපි මොකද කරන්නෙ?" ආලෝක් ඇහුව. හරියට නිදාගෙන ඉඳල මේ දැන් නැගිට්ට වගේ.

මං සද්ද නැතුව හිටිය. රයන් එයාගෙ අයිස්ක්‍රීම් එක කාලා ඉවර වෙලා අත පිහදාපු ටිෂූ එක කෙළින්ම ඩස්ට්බින් එකට වැටෙන්න වීසි කළා.

"කියනවලකො මොනව හරි...? එතකොට අපිට මොකද වෙන්නෙ?" ආලෝක් ඇහුවෙම ඇඬුම්බරව වගේ.

"නිකන් හිතන්න... ඔයාගෙ රිසල්ට් ෂීට් එකේ සෙමෙස්ටර් එකක් නැත්තං දෙකක් කිසිම ග්‍රේඩ් එකක් නෑ. සමහර විට ඒකෙ 'සස්පෙන්ඩඩ්' කියල සීල් එකක් වදින්න පුළුවන්. එතකොට ඉන්ටර්විව් එකේදි මොනව වෙයිද කියල හිතා ගත්තැකිනෙ."

"කවුරුවත් අපිට ජොබ් එකක් දෙන්නෙ නෑ... ඔය හොරකම් වංචාවලට සුද්දෙ කිසිම බුරුලක් දෙන්නෙ නෑ... ඒ කියන්නෙ ඇමෙරිකාවෙ යන්න, එම්.බී.ඒ. කොලේජ් එකකට යන්න හම්බවෙන්නෙ නෑ..."

"වෙනින් විදිහකට කිව්වොත් අපේ ජීවිතවලට කෙළවෙනව." මං කිව්ව. එතකොට තමයි මං දැක්කෙ මම අයිස්ක්‍රීම් එක කන්න පටන් අරගෙනවත් නෑ කියල. කෝන් එකඟ පෙඟිල. මං ඒක වීසි කළා.

"ඉතින් ඔයාලට ඒකෙ ගානක්වත් නෑ... ඈ...?" ආලෝක්ගෙ කටහඬ ඇඬුම්බර වේගෙන ආව. "කොහොමද ඔයාල ඔහොම ගානක්වත් නැතුව ඉන්නෙ? මගෙ අම්මල තාත්තල මොනව හිතාවිද? මගෙ අක්කට මොකද වෙන්නෙ?" ආලෝක් මේසෙට වැළමිටවල් දෙක ගහගෙන කොණ්ඩෙ ඇදගෙන ඇදගෙන යන්න වුණා! ඊට පස්සෙ මේසෙට මූණ ඔබා ගත්ත. ඒ, එයාගෙ කඳුළු හංගගන්න බව අපිට රහසක් වුණේ නෑ.

"කවුද කියන්නෙ මට ගානක් නෑ කියල...?" රයන් නැඟිට්ට. රයන්ගෙ කටහඬ කොයි තරම් උස් වුණාද කිව්වොත් එහා මුල්ලක නිදි කිර කිර හිටිය කැෂියරයත් ගැස්සිලා ඇහැරුණා.

"ෂ්... ෂ්... කෑ නොගහ වාඩි වෙන්න..." මං රයන්ව සැනසුව. "මේකෙ සමහරවිට කැම්පස් පොරවල් ඇති..."

"උන් යකාට ගියාවෙ... කැම්පස් එකත් යකාට ගියාවෙ... මෙයත් යකාට ගියාවෙ..." රයන් පෙන්නුවෙ ආලෝක්ව. "එයා හිතන්නෙ එයා රෑට නිදා නොගත්තු එකයි, එයාගෙ අනාගතෙයි විතරයි... ආලෝක් නැඟිටිනව... අඬන්නයි, කොණ්ඩෙ ඇද ගන්නයි වෙලාව නෙවෙයි මේ... තව පැය ගාණකින් අපිට විනය කමිටුවට යන්න තියෙනව. ඒකට ගිහින් අපි උත්තර දෙන්නෙ මොනවද... කොහොමද... කියල හිතුවොත් හොඳ නැද්ද?"

"ඉවරද...? ඉවරද දේශනාව..." ඒ පාර නැඟිට්ටෙ ආලෝකය. මං හිතන්නෙ නැඟිට්ටම කෑ ගහගන්න ලේසි ඇති! "මිස්ටර් රයන්... ආයෙත් ප්ලෑනක් ගහන්නද හදන්නෙ ඔයාගෙ විදිහට?





දැක්කනෙ ඔයාගෙ ඔපරේෂන් පෙන්ඩියුලම් එකට කෙළවෙච්ච හැටි... ඔයා කියන දේවල් කරන්න ගිහින් අපි අමාරුවෙ වැටුණ හැටි..."

මේ දෙන්නව නිශ්ශබ්ද කරන්න යාම තේරුමක් නැති වැඩක්. උන්ට ඕනනං කා ගත්තාවෙ. මගෙ මොකෝ...? මං බලන් හිටිය.

"ඔපරේෂන් පෙන්ඩියුලම්...? ඒක වැරදුණේ මගෙ ප්ලෑනෙ වරදක් හින්දද? කාටද අම්මට කෝල් කරල කිරි බොන්න ඕන වුණේ...? බූරුවෙක් වගේ කෝල් එක නොගන්න අපි ඔක්කොම ගොඩ... දැන් එනව මෙතන මගෙ ප්ලෑන් එකේ වැරදි කියන්න...!"

"ආ... ඇත්තට? අයි.අයි.ටී. ඉතිහාසෙටම මොකාද ප්‍රොෆෙසර් කෙනෙක්ගෙ ඔෆිස් එකට හොරෙන් පැනල තියෙන්නෙ...? බය වෙන්න එපා... මුකුත් වෙන්නෙ නෑ... ඕකමනෙ කිව්වෙ... දැන් ඔය වෙලා තියෙන්නෙ..."

උන් දෙන්න දිගින් දිගටම කා ගනිද්දි මට ඇඬුණ. ආලෝක්ට වගේම මටත් ඇඬුණ. හිතල නෙවෙයි. වටපිට එවුන් බලන් හිටියත් ඒව මට ගානක් වුණේ නෑ. අන්තිමට උන් දෙන්න ඒක දැක්ක.

"ඇයි... මොකක්ද දැන් ඔයාගෙ ප්‍රශ්නෙ?" රයන් ඇහුව.

"මුකුත් නෑ... දැන්වත් ඕක නවත්තනවද? ඕකෙන් කාටවත් වැඩක් වෙන්නෙ නෑ... මේක අපි තුන්දෙනාම එකට ඉන්න ඕනෙ වෙලාවක්... එහෙව් එකේ ඔහොම කා ගත්තහම හරියනවද?"

"හ්ම්... ඒකත් හරි... ආලෝක් වාඩි වෙනව..." රයන් කිව්ව.

ඊළඟ පැය පහම අපි ගත කළේ එතන! බනානා ටොෆී කෝන් දෙකකට, මින්ට් චොකලට් චිප් එකකට, රාසප්බෙරි ඩිලයිට් තුනකට ඒ අතරෙදි අපි වග කිව්ව. අපේ අනාගතේ බේරගන්න කරපු හොඳම සාකච්ඡාව කළා. අපිට පුංචි බලාපොරොත්තුවක්

ඉතුරු වෙලා තිබ්බ. අපේ සැලසුම එච්චර නිර්මාණශීලී එකක් නෙවෙයි. ඒක මෙහෙමයි. අවංක වීම... කලබල නොවීම... වැරැද්ද පිළිගැනීම... අනුකම්පාව යැදීම! අපි ආපහු කුමාඕන්වලට ආවෙ හවස හයට විතර. ඒ වෙද්දි ප්‍රොෆෙසර් වීරා අපිට හය පාරක් විතර කෝල් කරල. විනය කමිටුව ඉස්සරහට යන්න කලින් අපිට එයාව හම්බ වෙන්න කියල. අපි එයාට කතා කරල රෑ නවයට හම්බ වෙන්න සැලසුම් කර ගත්ත.

★

"ඔයා ඩුප්ලිකේට් යතුරු කැරැල්ලක් හැදුව?" ප්‍රොෆෙසර් වීරා පුදුම වෙලා ඇහුව. කොහොමත් අපේ කතාව අහල එයා පුදුම වෙලයි හිටියෙ.

"ඔව් සර්... ජියා සරායිවලින් රුපියල් හයකට කපා ගත්ත..."

ප්‍රෙෆෙසර් වීරා පුටුවට හේත්තු වෙලා බක බක ගාලා හිනැහෙන්න ගත්ත!

"මේකනං මාරයි... මේ වගේ දෙයක් මං මීට කලින් අයි.අයි.ටී. එකේදි අහලම නෑ...! රයන්... ඔයා හිතුව බොහොම ලේසියෙන් ප්‍රොෆෙසර්ගෙ ඔෆිස් එකට ගිහින් පේපර්ස් හොරකං කරගෙන A එකක් ගන්න...?"

"ඔව් සර්..." රයන් බොහොම නිහතමානී විදිහට කිව්ව.

"හරී... ඔයා නේහගෙන් ඒ කිව්වෙ ඔයා කියන විදිහට ඔයාගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ්ගෙන් යතුරු හොරකම් කර ගත්ත.?"

"ඔව් සර්..." මාත් රයන් වගේම කිව්ව.

"ආලෝක්... ඔයා මේ දෙන්නගෙ පිස්සු වැඩේට සපෝට් කළා?"





"එයාල මගෙ යාළුවො සර්..."

ආලෝක්ගෙ ඒ වචන ටිකනම් මගෙ හදවතටම කිඳා බැස්ස. ඒ මොහොතෙදි මට ආලෝක් කරපු ඔක්කොම ගොන් වැඩ අමතක වෙලා, වාද කරපුව අමතක වෙලා මිනිහ ගැන ආදරයක් ඇති වුණා.

"ඔයාලනං නියම මෝල්ලු... ඔව් තඩි මෝල්ලු තුන්දෙනෙක්..." ප්‍රොෆෙසර් වීරා කිව්ව. එයා ඒක කිව්වෙ බොහොම උපහාසාත්මකව වුණත් අපි ඒකට ආස වුණා. එක අතකින් ඒක තමා ඇත්ත!

"සර්... වැඩේ නියමෙට සිද්ධ වුණා... ආලෝක් කෝල් එක ගත්තැයින් තමා..." රයන් කියන්න වුණා.

"නියමට සිද්ධ වුණා?" ප්‍රොෆෙසර් වීරා බාධා කළා. "ඒකද වුණේ? ඒකනෙ මං කිව්වෙ ඔයාල මෝල්ලු කියල. මං එහෙම කිව්වෙ ඔයාල අහු වෙච්ච නිසා කියලද හිතුවෙ?" ප්‍රොෆෙසර් වීරගෙ ස්වරය බැරෑරුම් වුණා. එයාට ටිකක් තද වෙච්ච පාටයි.

"රයන් ඔබරෝයි... මං හිතුව ඔයා තමයි අපිට මෙච්චර කාලෙකට හම්බ වෙච්ච දීප්තිමත්ම ශිෂ්‍යයා කියල... ඔයාගෙ ප්‍රපෝසල් එක, ශිෂ්‍යයෙක්ගෙන් මෙච්චර කාලෙකට මට ලැබුණු හොඳම ප්‍රපෝසල් එක... ඔයාගෙ ග්‍රේඩ්ස් මොනව වුණත් මට කමක් නෑ... ඒත් ඔයා මොකද කළේ... ඔයාගෙ ග්‍රේඩ් ෂීට් එකට මෝඩ අකුරක් දාගන්න ඔයා ඔයාගෙ අනාගතේම අවදානමකට දැම්ම..."

රයන් ඔළුව පාත් කර ගත්ත.

"ඔයාල තුන්දෙනා හොඳම යාළුවො... ඒත් ඔයාල කාටවත් පුළුවන් වුණේ නෑ එක එක්කෙනාට බලපෑම් කරල මේ පිස්සු වැඩේ නවත්තන්න... දන්නවද... වෙරියන් බලන් හිටියෙ ඔයාලව හිරේ යවන්න!"

"සර්... අපි එයාලගෙන් සමාව ඉල්ලන්නම්. සමහර විට එයාල අපිට අනුකම්පාවක් දක්වාවි..." ආලෝක් කිව්ව.

"අනුකම්පාවක්? ඒක විනය කමිටුව...! එහෙම නැතුව මදර් තෙරේසගෙ ආශ්‍රමයක් නෙවෙයි. දැක්කනෙ චෙරියන්ගෙ මූණ?" ප්‍රොෆෙසර් වීරා කිව්ව.

අපි තුන්දෙනාම නිශ්ශබ්ද වුණා. ප්‍රොෆෙසර් වීරගෙ ඔෆිස් එකේ ඔරලෝසුවෙ ටික්... ටික්... සද්දෙ පවා ඇහෙන ගානට! වෙලාව නවයහමාරයි!!

"දැන් මොකක්ද ඔයාල විනය කමිටුවට කියන්නෙ? වැරදිකාරයො කියලද? නිවැරැදිකාරයො කියලද?" ප්‍රොෆෙසර් වීරා ඇහුව.

"වැරදිකාරයො කියල සර්... වෙන මොනව කියන්නද අතටම අහුවුණාට පස්සෙ?"

"හ්ම්ම්... මං හිතන්නෙ ඔයාල ඉස්සර වෙලාම කරන්න ඕනෙ කැම්පස් එකෙන් එළවන එක ෂේප් කරගන්න එකයි..." ප්‍රොෆෙසර් වීරා කිව්ව.

"සර් කියන්නෙ අපිට චාන්ස් එකක් තියෙනව කියලද?" ආලෝක් ඇහුව.

"ලොකු චාන්ස් එකක් නෙවෙයි. ඒකත් චෙරියන් තදට නොහිටියොත්... ඔයා මොනවද යතුරු ගැන කියන්න යන්නෙ?"

"නේහාව මේකට ඈඳ ගන්න මං කැමති නෑ සර්... අපි කියනව අපි යතුරු ගොඩක් එකතු කරගෙන තිබ්බ. දිගටම ට්‍රයි කරද්දි එයින් එකක් හරි ගියා කියල..."

"ඇයි එයාලට ඇත්තම නොකියන්නෙ? මට කිව්ව වගේ?"

"මේක නේහා දැන ගන්නවට මං කැමති නෑ සර්..."

"ළමයි මේක අහන්න... මං ඔයාලට උදව් කරන්න හදන්නෙ. ඔයාල දැන් ලොකු අමාරුවක වැටිල ඉන්නෙ. ඒත් ඔයාලට යම් යම් දේවල්වලින් ඒක පොඩ්ඩක් අඩු කරගන්න පුළුවන්."

"ඒ කිව්වෙ සර්...?"





"පළවෙනි එක තමයි ඔයාලට දෙන්න දඬුවම් ගණනාවක් යෝජනා කිරීම... මමත් ඕකෙ ඉන්නවනෙ. ඉතින් මට පුළුවන් කෝස් එකට F එකක් දෙමු වගේ යෝජනාවක් ගේන්න. එහෙම නැත්තං ප්‍රසිද්ධියෙ සමාව ගැනීමක්, පැය සීයක් සමාජ සේවයෙ යෙදීමක් වගේ යෝජනා ගේන්න..."

"සමාජ සේවය කිව්වෙ සර්...?" ආලෝක් ඇහුව.

"කැම්පස් එකේ පොඩි පොඩි වැඩ කරන එක... සයිකල් පාක් එක පේන්ට් කරන්න හරි, පැළ හිටවන්න හරි... ඔය වගේ දේවල්."

"මටනං ඒව පේන්න බෑ..." රයන් කියපි.

"රයන් කටවහනව... සොරි සර්... ඉතින්..." මං කිව්ව.

"දෙවෙනි එක තමයි ඔයාලගෙ කතාව ටිකක් වෙනස් කරන්න ඕනෙ. මං කැමතිම නැති දෙයක් තමයි බොරු කියන එක. ඒත් මෙතනදි අපිට වෙන විකල්පයක් නෑ. ඒ නිසා කියන්න, ඔයාලා එකතු කරපු යතුරු කතාව වෙනුවට නේහා ඔයාට යතුර දුන්න කියල..." ප්‍රොෆෙසර් වීරා කිව්ව.

"මොකක්?" අපි තුන්දෙනාටම එක පාර ඇස්සවුණා!

"අහගන්න... ඔයා නේහව දන්නව කියල කිව්වොත්, එයා තාත්තත් එක්ක තියෙන නෝක්කඩුවක් පිරිමහන්න ඔයාට යතුර දුන්න කියල කිව්වොත් එතනට පුද්ගලික කතාවක් මැදිහත් වෙනව. එතකොට විනය කමිටුව දෙගිඩියාවකට පත් වෙන්න ඉඩ තියෙනව... නේහා චෙරියන්ගෙ දුව හින්ද... එහෙම පොඩි චාන්ස් එකක සේයාවක් පේනව මට!"

"නේහා මොනව හිතයිද ඒක දැන ගත්තොත්? මං කොහොමද ඒක කරන්නෙ?"

"ජීවිතේට රස්සාවක් නැතුව, උපාධියක් නැතුව ඉන්න එකට වඩා ටිකක් කේන්ති ගිහින් තරහ වෙච්ච ගර්ල් ෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්න එක හොඳ නැද්ද?" ප්‍රොෆෙසර් වීරා ඇහුව.

"ප්‍රොෆෙසර් වීරා කියන කතාව හරි..." රයන් කිව්ව. "හරී... ඔයා චෙරියන්ගෙ පවුල මේකට ගාවනව කියන්නෙ වැඩේ වෙන පැත්තකට යනව කියන එකයි. චෙරියන් අකමැතිම වෙන දේ තමයි එයාගෙ දුවගෙ බෝයිෆ්‍රෙන්ඩ් ඔයාය කියල ප්‍රසිද්ධ වෙන එක!"

"ඒත් මේකෙදි මුළු ලෝකෙම ඒක දැන ගන්නවනෙ..." මං කිව්ව.

"ඔයා මුළු කතාවම කියන්න ඕනෙ නෑ... නිකං කියන්න දැන් ඔයාගෙ යාළුව නේහයි කියල... චෙරියන් ඒක ගැන අහන්න යන්නෙ නෑ... ෂුවර්!" ආලෝක් කිව්ව.

"ආලෝක්... ඔයත් හිතන්නෙ එහෙම හොඳයි කියලද?" මං ඇහුව.

"ඔව්... අපේ ගැලවීම තියෙන්නෙ එතන... ඔයා අතේ... මේක තමා අන්තිම සැලසුම..." ආලෝක් කිව්ව.

මං ඒකට කැමති වුණේ හිතකින් නෙවෙයි. මේක ආරංචි වුණාම නේහා මං ගැන මොනව නොහිතයිද? එයා මට උදව්වට යතුර දුන්නයි කිව්වම! එයා මුළු ජීවිතේටම මට වෛර කරාවි. ඔරලෝසුවෙ වෙලාව දහයයි. විනය කමිටුව ඉස්සරහට යන්න වෙලාව හරි!

අනාගතේ වෙනුවෙන් ප්‍රේමය පරදුවට තියන්න මට සිද්ධ වුණා!



# 20

## මගේ ජීවිතේ දිග.....ම දවස - 5

විනය කමිටුව! ගුප්ත පෙනුමක් තිබ්බ ශාලාවක තමයි එයාල රැස්වෙලා හිටියෙ. එහෙම කිව්වට ඒකට ඒ ගුප්ත පෙනුම ආවෙ අපේ හිත්වලින් වෙන්න ඕනෙ. නැත්තන් ඉතින් හැමදාම තිබ්බ ශාලාවමනෙ අදත්. ඒකෙ ඒ හැටි ලයිට් ආල තිබ්බෙත් නෑ. අඩ අඳුරක් වගේ. ඒ මදිවට හ්ම් සද්දක් නෑ. රවුම් බාගෙක මේසෙ, ප්‍රොෆෙසර්ල දහදෙනෙක් විතර වාඩි වෙලා හිටිය.

චූදිතයො, ඒ කිව්වෙ අපි ඒකෙ මැද්දට වෙන්න හිටිය. ප්‍රොෆෙසර්ස්ල දිගට හරහට ප්‍රශ්න අහන්න සැදී පැහැදී හිටිය. අපියි, ප්‍රොෆෙසර්ලයි අතරෙ තිබ්බෙ පොඩි පරතරයයි. උසාවියකට වඩා බොහොම කල්පනාකාරීව ඇති කරපු වටපිටාවක් ඒක.

ඩීන් ශාස්ත්‍රී, ඩිරෙක්ටර් වර්මා, ප්‍රොෆෙසර් චෙරියන්... ඒ තුන්දෙනා තමයි ප්‍රධානියො වගේ වාඩි වෙලා හිටියෙ. අනික් ප්‍රොෆෙසර්ලා හත්දෙනා නිකන් පෙනුමට වගේ ඉන්දවපු අය කියලයි අපිට හිතුණෙ. ප්‍රොෆෙසර් වීරා හිටියෙත් ඒ හත්දෙනා අතරෙ. එයින් ගොඩක් අය හිටියෙ ඇනුම් ඇර ඇර. මොකද, එයාල වෙනදටනං මේ වෙලාවෙදි ගොරෝ ගොරෝ නිදියගන්න වෙලාව නිසා වෙන්න ඇති. ඒත් එයාල දෙන පලකට නැති එසයින්මන්ට්ස් කර ගහගත්තු අපිටනං ඒ වෙලාවෙදි තමයි ඇ උදා වෙන්නෙ!

"විනය කමිටුවේ කටයුතු ඇරඹීමට කාලය පැමිණ ඇති බව, මගේ සහකාර පරීක්ෂකවරුන් දෙදෙනාට මෙලෙස දැනුම් දෙන්නෙමි..."

ඩීන් ශාස්ත්‍රි කියපි! මොන ඇටිකෙහෙලක්ද යකෝ මේ? මේක දිල්ලි උසාවියද කියල මං ඇස් පිහදාල බැලුව. රයනුයි, ආලෝකයි දෙන්නත් මා දිහා බැලුවෙ ඒ හිතිවිල්ලෙන්ම බවට සැකයක්නං නෑ.

"ඔබට එය ඇරඹිය හැකියි..." චෙරිය කියපි.

ඒ පාර මම ඇස් පිහදාල, ඔළුව හොඳට හොල්ලල බැලුවෙ අපි බැරි වීමකින් හරි ෂේක්ස්පියර්ගෙ නාට්‍යයක්වත් බලන්න ඇවිල්ලදෝ කියල නිනව්වක් නැතුව! මං හිතන්නෙ ඒ වගේ කතා කළාම, ඒ අවස්ථාවෙ තියෙන බැරෑරුම්කම ඒකෙන් වැඩි කරනව. එතන ඉන්න අයට මහේශාක්‍ය බවක් ආරූඪ කරල නැති බලයක් මවනව!

හුටා...! මට වයිවා එක මතක් වෙච්චි! දැන් ඉතින් මොකද කරන්නෙ? වයිවා එකේදිත් මට වෙන්නෙ අහන ප්‍රශ්නවලට උත්තර දීගන්න බැරිවෙන එකනෙ. ඉතින් මෙතනදිත් වෙන්නෙ ප්‍රශ්න ඇහීමනෙ. මෙතනදිත් මට උත්තර දීගන්න බැරි වුණොත්? හීන් දාඩිය බිංදු හතක් මගෙ නාහෙ උඩ මතු වුණා.

ප්‍රොෆෙසර්ල තම තමන්ගෙ ඉදිරිපිට තිබ්බ තම තමන්ගෙ විශේෂ ෆයිල් අරින්න ගත්ත. ඒ හැම එකේම තිබුණු කොළ සෙට්වල ලියැවිලා තියෙන්නෙ ඊයෙ රෑ වෙච්ච ජල්තරේ බව අපිට අලුතෙන් කියන්න ඕන වුණේ නෑ.

රයන්ට තේරුණා මට වෙන්න යන දේ. තමන් ගැන හොඳට දන්න කෙනෙකුට තමන්ට සිද්ධ වෙන වෙනස්කම් ඉව වැටෙන හැටිනං හරිම පුදුමයි. "හරී..." මිනිහ කෙඳිරුව. මං මිනිහ දිහා බැලුව.

"මං දන්නව ඔයා හිතන දේ... මතක තියා ගන්න... මේක වයිවා එකක් නෙවෙයි... ඔයා මෙතනදි කතා නොකළොත්,





අපි ඔක්කොම, ඔයත් එක්කම වළේ... ඒ වළේ අපිට වඩා ජඹුරට වැටෙන්නෙ ඔයා...! තේරුණාද?"

"උම්හ්... ඔව්..." මං කිව්ව.

"මං අකමැති වුණත් එකක් කියන්න ඕනෙ... ඔයානං රියල් පොරක්...!"

"ඇහ්...? ඒ මොකෝ එක පාරටම?"

"ඔයා මෙතන ටොං පවයක් කෙළින්න යන්නෙ අපේ අනාගතේ තීරණේ කරන මනුස්සය ඉස්සරහ පිට... ඒත් එයා මොනව කළත් එක කාරණයක් එයාගෙ හිතෙන් අයින් කරන්න බෑ..."

"ඒ මොකක්ද?"

"ඔයා ගිහින් එයාගෙ එකම දූ එක්ක මහ දවාලෙ නිදා ගත්තු බව! අන්න එහෙම නියම වැඩක් කළ හින්දයි මං ඔයාට රියල් පොරක් කිව්වෙ... ඒත් මං ඒක ඔයාට කවදාවත් නොකියන්නයි හිටියෙ. මොකෝ... ඒක කිව්වම ඔයා උඩ යන නිසා!"

"ඇත්තටම ඔයා හිතන්නෙ එහෙමද?" මට මාර ජොලියක් ආව.

"නැත්තං... ඔයා වගේ යාළුවෙක් ඉන්න එක මට සිරා ආඩම්බරයක්..."

මගෙ ඔළුවෙන් රැස් විහිදෙන්න ගත්ත. මට මාර ශක්තියක් ආව. දහ දෙනෙකුට ගහන්න තරම්!

"කතාව... කතාව... දන්නැද්ද මෙතන කතා කරන්න බෑ කියල?" ඩීන් ශාස්ත්‍රි ෆයිල් එකෙන් ඔළුව උස්සල කිව්ව.

"සොරි සර්..." මං කිව්ව. රයන් මා දිහා බලල මහපටැඟිල්ල ඉස්සුව. අඩේ මෙන්න මං නොදැනීම ඩීන්ට... ලොක්කටම උත්තර දීල!

"මිස්ටර් හරිකුමාර්... මේ රිපෝට්ස්වල හැටියට තමා ඊයෙ රෑ මිත්‍රයො දෙන්නෙක් එක්ක ප්‍රොෆෙසර් චෙරියන්ගෙ ඔෆිස් එකේ ඉඳල අහුවුණා... මේක හරිද?" ඩීන් ශාස්ත්‍රී ඇහුව.

"හරි සර්...!" මං කිව්ව.

"රයන් ඔබරෝයි... සිකියුරිටි එකෙන් ඔයාව අල්ල ගනිද්දි ඔයාගෙ අතේ ලාකඩ, ඉටිපන්දම් වගේම ඉදිරි විභාගෙට සැලසුම් කරපු ප්‍රශ්න පත්‍රත් තිබ්බ... මේක නිවැරැදිද?"

"ඔව් සර්..." රයන් කිව්ව.

"ආලෝක් ගුප්තා... තමන් ඒ වෙලාවෙදි ප්‍රොෆෙසර් චෙරියන්ගෙ ඔෆිස් එකේ දුරකථනය පාවිච්චි කරමින් පිටට කෝල් එකක් ගනිමින් හිටියා?"

"හරි සර්... ඔව් සර්..."

"ඔයාලට මේ සිද්ධියෙ බරපතළකම ගැන අවබෝධයක් තියෙනවද?" ඩිරෙක්ටර්තුමා ඇහුව.

"ඔව් සර්... අපිට ඒ ගැන දැන් තේරෙනව..." ඒ මම. ඕ...හ්... මෙන්න මම නොසැලී, නොපැකිළව උත්තර දෙනව! නිකං තැනකදිවත් නෙවෙයි. විනය කමිටුවෙදි!

ඊළඟට ඉඳන් දිගටම වගේ ඇහුවෙ වල්පල් ප්‍රශ්න. මට දැන් ඒව මතකත් නෑ. කෙනෙක්ගෙ චරිතෙ ගැන, නම්බුව ගැන, හිත ශක්තිමත් කර ගැනීම ගැන... ඔය වගේ බහුබූත! අපි ලක්ෂ පාරක් විතර සමාව ඉල්ලන්න ඇති? සමාව දෙන්නකෝ කියල බැගෑ වෙන්න ඇති! ඒ අතරෙදි තමයි එක පාරටම එයාල ඒ ජැක්පොට් ප්‍රශ්නෙ ඇහුවෙ.

"තමුන්ල මගෙ ඔෆිස් එකට ආවෙ කොහොමද?" චෙරිය ඇහුව.

"අපිට යතුරු තිබුණ සර්..." රයන් කිව්ව.

"යතුරු! තමුන්ලට කොහොමද මගෙ ඔෆිස් එකේ යතුරු ලැබුණෙ?" චෙරිය ඒක ඇහුවෙ පුදුමෙන් වගේ.





"සර්... අපි... සර්..." මං පටන් අරන් නිශ්ශබ්ද වුණා. බෑ... මට මේක කරන්න බෑ...!

"හරීගෙ යාළුව... නේහා එයාට දුන්න සර්..." රයන් හිස්තැන පිරෙව්ව.

"කවුද නේහා...?" ඩීන් ශාස්ත්‍රී අන්දමන්ද වෙලා වටපිට බැලුව.

"නේහා චෙරියන්, ප්‍රොෆෙසර් චෙරියන්ගෙ දුව සර්...! මං එයාගෙ යාළුවෙක්... මං එයාව දන්නව හොඳට!" මම කිව්ව.

කාමරේ පුරාම එක පාර පැතිරුණේ නිශ්ශබ්දතාවක්. ඩීන් ශාස්ත්‍රීගෙයි, ඩිරෙක්ටර් වර්මගෙයි කටවල් ඇරුණ. දෙන්නම චෙරියන්ගෙ පැත්තට හැරුණෙ, ඊළඟට විනය කමිටුව ඉස්සරහට ගේන්න නියම වෙලා ඉන්නෙ චෙරියන් වගේ! ඒත් ඒක එහෙම වෙන්නෙ නැති බව හැමෝම දැනගෙන හිටිය.

"මොනව... ඔයා මොනවද කියන්නෙ කියල ඔයා දන්නවද?" ඩීන් ශාස්ත්‍රී ඇහුව.

"ඔව් සර්... එයා එයාගෙ තාත්ත එක්ක අමනාප වෙලා හිටි හින්ද යතුර අපිට දුන්න... අපි ඒක තමයි පාවිච්චි කළේ..." මං කිව්ව.

එතනින් පස්සෙ ප්‍රශ්න ඇහුවෙ නැතිම තරම්. ඒත් හැම ප්‍රොෆෙසර් කෙනෙකුටම තමන්ගෙ ළඟ ඉන්න ප්‍රොෆෙසර් එක්ක මොනව හරි කතා කරන්න තිබුණු බව තේරුණේ අතන මෙතන 'කසු කුසු කුට්ටං' හැඳුණහමයි. වැඩේ කොච්චර නැගල යන තැනට ඇවිත් තිබ්බද කිව්වොත්, නිදිමතේ ඇනුම් යව යව හිටිය ප්‍රොෆෙසර්ලගෙ නිදිමත කොහේ ගිහින්ද නැති වග පෙනුණ. මහ රෑ කොල්ලො තුන්දෙනෙක් ඩිපාර්ට්මන්ට් හෙඩ්ගෙ ඔෆිස් එකෙන් ප්‍රශ්න පත්තර හොරකම් කරන්න ගිහිල්ල අතටම අහු වුණාට වැඩි කේස් එකක්, උනන්දුවක්, දෙවෙනි කාරණාවෙන් මතු වෙච්ච බවයි පෙනුණෙ!

වෙරියන්, ඩීන් ශාස්ත්‍රීගෙ කනටයි, ඩිරෙක්ටර් වර්මගෙ කනටයි මොනවදෝ කොඳුරනව පෙනුණ. ඩීන් ශාස්ත්‍රි ඔළුව වනල නිවේදනයක් කළා.

"අපි දැන් මේ පරීක්ෂණය පැවැත්වූවා. දැන් කොමිටියක් හැටියට එක තීරණේකට එන්න අපි සාකච්ඡා කළ යුතු වෙනවා... ඒ සඳහා වෙලාවයි දැන් උදා වෙලා තියෙන්නෙ... අපි අදම තීරණයක් ගත යුතුයි. පැය දෙක තුනක් ගත වුණත්... අපි තීරණේකට ඇවිත් ඒ බව ප්‍රකාශ කරන්නට අදහස් කරනවා... ඒ තීරණේ දුන්නට පස්සෙ අභියාචනා කිරීම් බැහැ... සමාව යැදීම් බැහැ... එය අවසානම තීරණයයි. එතෙක් මේ ශිෂ්‍යයන්ට මෙයින් පිට වී සිටිය හැකියි..."

ඩීන් ශාස්ත්‍රී අපිට හෝල් එකෙන් එළියට යන හැටියට සංඥා කළා. අපි කොමිටි හෝල් එකෙන් එළියට ඇවිත්, කැම්පස් එකේ තණකොළ ගොල්ලෙ වාඩි වුණා.

"මොකද හිතන්නෙ වැඩේ ගැන?" ආලෝක් ඇහුව.

මං උරිස් ඇකිළුව. නේහව පාවල දුන්න නේද කියල හිතනකොට මගෙ බඩට කවුරු හරි ගහන්නා වගේ මට දැනුණ.

"කවුරු දන්නවද? මෙතන ඉඳල බලමු...!" රයන් ඊ පින්නෙන් තෙත් වුණු තණකොළ ගොල්ලෙ වාඩිවෙන ගමන් කිව්ව.

"ඕකට පැය ගාණක් යාවි..." මං හිතුවෙ එහෙම.

"මොකක්ද අපි එතකල් කරන්නෙ...? මෙතන ඉඳල වැඩක් ඇතෑ... අපි යමු අපේ ස්පොට් එකට..." ඒ යෝජනාව ගෙනාවෙ ආලෝක්මයි.

මං එක පාරටම ඒකට කැමති වුණා. ඒක අපේ තිප්පොළ. එතනට ගියහම අපිට ආරක්ෂාකාරී හැඟීමක් දැනෙනව. මේ වෙලාවෙදි අපිට වෙන යන්න තැනක් නෑ. දහසක් ඇස් අපේ පස්සෙන් ඒවි.

"එයාල කතා කළොත් කොහොමද දැන ගන්නෙ?" රයන් ඇහුව. හොඳ ප්‍රශ්නයක්!





"අපි නිතරම පහළ බල බල ඉමු... පහළ කොරිඩෝ එකේ ලයිට් දාලනෙ තියෙන්නෙ. හෝල් එකෙන් කවුරු හරි එළියට ආවම පේනව..."

"හරි... නියමයි... යං එහෙනම්..." රයන් කිව්ව.

අපි අපේ තිප්පොළට ගිහින් වාඩි වුණා. හඳ අහසෙ බැබළුණා. එදා වහලෙ උඩ අමුත්තක් අපිට දැනුණා. මගේ හිතට තිබ්බ ලොකුම අමාරුව තමයි නේහාව මේකට ඇදල ගැනීම. කොහොමටත් කෙනෙක්ව රැවැට්ටීම ගැන මගෙ හිතේ තිබ්බෙ ලොකු කලකිරීමක්. යතුරුවල ඩුප්ලිකේට් ගැහුවෙත් නේහව රවට්ටල. මං කොහොමද මේ වගේ තත්ත්වෙකට වැටුණෙ? මුළු ඉස්කෝල කාලෙදිම ඉහළම ලකුණු මගෙ. ඒක නිසා නේද මට අයි.අයි.ටී. එන්න පුළුවන් වුණේ? එහෙනං දැන් ඇයි මං පල්ලම් බැහැල? පහයි පොයින්ට් ගාණක් අරන්, විනය කමිටු ඉස්සරහට ගිහින්, වහලයක් උඩ ඉන්නව අනාගතේ ගැන අඩමානෙන්?

සමහර වෙලාවකට හිතට නැඟෙන ප්‍රශ්න ගැන හිතුවම පුදුම හිතෙනව. හරිනං හිතට එන්න ඕනෙ උත්තර නේද? ප්‍රශ්න නෙවෙයිනෙ? ඒවට උත්තර...! එහෙනම් ඇයි අරහෙම වෙන්නෙ? මං හිතන දේවල් කිසිම තේරුමක් නැති දේවල්ද? මට එහෙම තේරිගෙන ආව. එක දිගට දවස් දෙකක් නිදි මැරීම එච්චර ප්‍රතිඵලදායක දෙයක් නෙවෙයි. ඒත් හිතට නැඟෙන ප්‍රශ්නවල සීමාවක් තිබ්බෙ නෑ.

මං මගෙ යාළුවො දිහා බැලුව. යාළුවො? මොකක්ද ඒ වචනෙ තේරුම? කවුද ආලෝක් කියන්නෙ? උගෙ තාත්ත බාගෙට මැරිල හිටියට, උගෙ අක්කට කසාද බඳින්න බැරි වුණාට මට මොකෝ? මට හාල්යැ? ඊට පස්සෙ මං රයන් දිහා බැලුව. හහ් නළුවා! ආත්ම විශ්වාසෙ තියෙන කඩවසම් ඉලන්දාරිය! මිනිහ, මිනිහ ගැන කොච්චර විශ්වාස කරනවද කිව්වොත්, මිනිහ හිත්නෙ එයා තමයි ලෝකෙට ලොක්ක කියල. මිනිහට ඕනෙ වුණේ වෙරියගෙන් පළි ගන්න! ඇත්තටම මොකක්ද ඒකෙ තේරුම? මිනිහගෙ ඔළුවට එන හැම අදහසක්ම 'මාර අදහස්' නෙවෙයි වගේ!

ඇයි මං මිනිහ කියපු දේට කැමති වුණේ ආලෝක් කිව්ව දේට නැතුව? ඇයි දැන් මුන් ඔක්කොම නිශ්ශබ්ද?

මං පාත් වෙලා රයන්ගෙ අතේ තිබ්බ ස්විස් ඔරලෝසුවෙන් වෙලාව බැලුව. පාන්දර තුනයි!

"තේ බොමුද?" රයන් අත්දෙක පිහදදා ඇහුව.

"එපා... මට නිදිමතක් පැත්ත පළාතක නෑ..." මං කිව්ව.

"මටත් එපා..." ආලෝක් කිව්ව.

තේ! ඒක තමයි මේ වෙලාවෙ රයන් දෙන්න හදන විසඳුම. අපිට වෙලා තියෙන හෙණපතේ දුරලන්න කැෆේන්වලට පුළුවන් කියලයි එයා හිතන්නෙ.

"මෙතන හීතලයි..." රයන් කිව්ව.

මං ඔළුව වැනුව. "ඔව් රයන්... මෙතන පණ යන්න හීතලයි තමා. දිල්ලියෙ දෙසැම්බර් රැයක් වගෙයි!" මට එහෙම කියන්න හිතුණ. ඒත් එහෙම කිව්වෙ නෑ. ඊට වඩා, හීතලට වඩා, භයානක දෙයක් තමයි සිද්ධ වෙමින් තිබුණෙ. තව පැය ගාණකින් අපිව අයි.අයි.ටී. එකෙන් දොට්ට දාවි සමහරවිට! එතකොට ඉතින් මේ සම්මජාතියට හොඳ ජොබ් එකක් හොයාගෙන ඉවරයි.

පැය භාගයක් ගියා රයන් නැඟිටල වහලෙ අයිනට ගියා. තට්ටු නවයක් උසයි වහලෙ. මෙතන තමයි කැම්පස් එකේ උසම තැන. ඒත් වහලෙ වටේට ආරක්ෂාවටය කියල පොඩි බිත්ති කැල්ලක්වත් නෑ. මොකට දානවද? මෙතනට කාටවත් එන්න අවසර නැති කොට? තව අඩියක් තිබ්බනං රයන්ට පුළුවන් ගුරුත්වාකර්ෂණේ රඟේ බලන්න. මිනිහ අයිනටම වෙලා නැවිල පහළ බලන් හිටිය! ඊට පස්සෙ එක කකුලක් එළියට දැම්ම.

"මොන මඟුලක්ද කරන්නෙ?" ආලෝක් ඇහුව.

"ඇත්තම තමා. මොන මඟුලක්ද මිනිහො ඔය කරන්නෙ?" මං හිතුව. අපි අපේ ජීවිතවල අතුරෙ ගියා මදිද? අපේ ජීවිතවලට මේ කෙළවෙලා තියෙන තරම මදිද? අඩු ගානෙ විනය කොමිටිය





තීරණයක් දෙනකල් හරි ඔල්මොරොන්දං වැඩ නොකර හිටියොත් හොඳ නැද්ද?

"රයන්... මෙහාට එනවද දෙයියන්ගෙ නාමෙට..." මං ඇහුව.

මිනිහ හැරුණ. "එතන මාර උසයිනෙ..." මිනිහ හෙමින් ආයෙත් හිටපු තැනටම ආව.

"ඔව්... එතන උසයි... ඔව්... මෙතන හීතලයි... තම මොනවද මහත්තයො ඔයාට කියන්න තියෙන්නෙ...?" මං හිතුව.

අර්බුදකාරී අවස්ථාවලදී සන්නිවේදනය කිරීමේ නොහැකියාව මිනිස්සුන්ගෙ ලක්ෂණයක්. මේ වෙනකල් ආලෝකයි, මායි වචනයක්වත් කතා කරල තිබ්බෙ නෑ. රයන් කතා කළොත් වෙන වල්බූත! ඒත් නේහා? එයාට ඕනෙම අවස්ථාවකදී එතනට ගැළපෙන දේවල් කීමේ හැකියාව තියෙනව. ඒත් මේකෙන් පස්සෙ නේහව මට නැති වේවි. අපේ එවුන්ගෙ අන්තිම තුරුම්පුව වුණේ එයා! මං එයාව පාවල දුන්න... ෂිඃ... ජුඩාස්... එල්ලිලා මැරියන් දැන්...! නේහා නෑ. මං මෙතන. මගෙ හොඳම යාළුවො දෙන්නත් එක්ක. අවුරුදු දෙකක් කට්ට කාල අයි.අයි.ටී. ආව. ඇවිත් අමාරුවෙන් අවුරුදු තුනක් හිටිය... දැන් ඒකෙන් එළියට විසි වෙන්න ළඟයි. ඒ එක හෙණපතයක්. අනෙක් පැත්තෙන් මගෙ ආදර කතාව ඉවර වෙනව. මට නේහව නැති වෙනව. ඒක අනික් හෙණපතේ!

"එයාල අපිට බුරුලක් දෙයිද?" ආලෝක් ඇහුව.

"එයාල විනය කමිටුව... දන්නවනෙ එයාලගෙ හැටි...? එහෙම බුරුලක් දෙන අය නෙවෙයි එයාල..."

රයන් අපි දිහාවෙ බැලුව. "අපි කළේ හොඳ දෙයක් නෙවෙයි... බොහොම නරක අදහස් අපි ක්‍රියාත්මක කළේ...!"

ඕ... තෑන්ක් යූ රයන්... මෙතක හීතලයි... මෙතන උසයි... දැන් අපේ ඔපරේෂන් පෙන්ඩියුලම් එක නරක අදහසක්! මිනිහට ඇතුයි මොළේ පෑදීගෙන එන්නෙ!

පාන්දර හතරාමාරට අපිට පහළින් සද්ද ඇහෙන්න ගත්ත. ස්කූටර් දෙක තුනක් ස්ටාට් කරන සද්දෙ ඇහුණා. නිදි මරපු ප්‍රොෆෙසර්ස්ල ගෙවල්වලට යනව ඇති. ඔන්න අපේ වෙලාව, නැකත ඇවිත්... අපේ දෛවය දැන් තීරණේ වෙලා ඇති!

"යං... යං... පහළට යං..." මං කිව්ව.

"ඔව් යං... ප්‍රොෆෙසර් වීරා සමහරවිට අපි එනකල් බලාගෙන ඇති..." රයන් කිව්ව.

"මං එන්නෙ නෑ... මං මෙතනම ඉන්නම්... මොකද වුණේ කියල ඇවිත් මට කියන්න..." ආලෝක් කිව්ව.

"පිස්සු නැතුව බහිමු පහළට..." රයන් කිව්ව.

"බෑ... එයාල තීන්දුව දෙද්දි මට ඒ දිහා බලාගෙන ඉන්න බෑ..."

"ඕනෙ කුදයක් ගහගන්නව එහෙනං... හරි... අපි යං..." රයන් කිව්ව.

අපි දඩිබිඩි ගාල පහළට දිව්ව. ඒ වෙද්දි ගොඩක් ප්‍රොෆෙසර්ස්ල යන්න ගිහින් තිබ්බ. ඩීන් ශාස්ත්‍රීයි, ඩිරෙක්ටර් වර්මයි, චෙරියයි, ප්‍රොෆෙසර් වීරයි විතරයි ඉතුරු වෙලා හිටියෙ. රයන් හෙමින් සැරේ පිටිපස්සෙන් ගිහින් ප්‍රොෆෙසර් වීරට කතා කළා.

"සර්..."

ප්‍රොෆෙසර් වීරා හැරිල බැලුව.

"අහ්... පොඩ්ඩක් ඉන්න..."

ප්‍රොෆෙසර් වීරා අනික් තුන්දෙනත් එක්ක ටික වෙලාවක් කතා කරනව පෙනුණා. ඊට පස්සෙ එක එක්කෙනාට ගුඩ් නයිට් කියල වෙන් වුණා. චෙරිය ගිහිල්ල එයාගෙ කාර් එකට නැග්ග. ඔව්... මේ ඔක්කොටම මුල් වෙච්ච කාර් එකට නැග්ග.

"සර්..."





"රයන්... හරි... ඔයාලව එළියට දාන්නෙ නෑ..."

පොඩි බලාපොරොත්තුවක එළියක් හිත ඇතුළෙ ඇල්වුණා.

"ඔය ඇත්තමද සර්...? එතකොට මොකක්ද තීරණේ?"

"ඔයාලම දකින්න ඇතිනෙ... අපි පැය ගාණක් වාද කළා... කතා කළා... බෙදිච්ච තීරණයක් තමයි ආවෙ... ඒත් අන්තිමට කොමිටිය තීරණේ කළා ඔය තුන්දෙනාගෙ පන්ති තහනම් කරන්න... සෙමෙස්ටර් එකකට...!"

"සර්...??" මට කියවුණා.

"මං පුළුවන් තරම් උත්සාහ කළා. ඒත් එයාල බුරුලක් දෙන්න කැමති වුණේ නෑ. ඔයාලව කැම්පස් එකෙන් දොට්ට නොදැම්මට සතුටු වෙන්න ඕනෙ. දැන් ඉතින් ඔයාලට සෙමෙස්ටර් එකක් මිස් වෙනව... ඒ කියන්නෙ හතරවෙනි අවුරුද්දෙ කෝර්සස් ටික කරන්න ඔයාලට ඉතුරු වෙන්නෙ සෙමෙස්ටර් එකයි. ඒ වගේම මේ මේජර් ටෙස්ට් එකේ ඔයාලට හම්බ වෙන්නෙ F... ඒ හින්ද ඔයාලට ඒක ආපහු රිපීට් කරන්න වෙනව." ප්‍රොෆෙසර් වීරා කිව්ව.

"ඒ කියන්නෙ අපිට ඊළඟ අවුරුද්දෙ ජොබ් ඉන්ටර්විව්වලට ඉන්න බෑ...?"

"එහෙම තමයි පේන්නෙ. මං උත්සාහ කළා ප්‍රොෆෙසර් චෙරියන්ට කියල ඔයාලට ප්‍රොජෙක්ට් එකක් හරි අරන් දෙන්න... මං කිව්ව ඔයාලට මාත් එක්ක වැඩ කරන්න පුළුවන් කියල... ඒත් ප්‍රොෆෙසර් චෙරියන් ඒකට කැමති වුණේ නෑ... සස්පෙන්ඩ් කරනව කියන එකේ තේරුම කිසිම දේකට සහභාගි වෙන්න බෑ කියන එකලු..."

"ඒ කියන්නෙ අපි ඉවරයි. අපිට ග්‍රේඩ් එකක් හම්බ වෙන්නෙ නෑ. අපිට ජොබ් එකක් හොයා ගන්න බෑ... ඒ මදිවට තව අවුරුද්දක් මේකෙ ටැග් ගැහෙන්නත් වෙනව..." මං කිව්ව.

රයන් මුකුත්ම කිව්වෙ නෑ.

"මේක මේ විදිහට තීන්දු වුණාට මට හරි කනගාටුයි..." ප්‍රොෆෙසර් වීරා කිව්ව. නිකම්මත් නෙවෙයි. අපේ උරිස්වලට තට්ටු කර කර. ඊට පස්සෙ එයා එයාගෙ ස්කූටර් එක දිහාට ඇවිදගෙන ගියා. තත්පර ගාණකට පස්සෙ එතන දුම් වලාවක් මැවිල ප්‍රොෆෙසර් වීරා නොපෙනී ගියා.

අපි ආපහු වහලෙ උඩට නැග්ගෙ ආලෝක් ප්‍රතිඵලේ බලාපොරොත්තුවෙන් ඉන්න බව දන්න හින්ද. මිනිහ තෙම්ච්ච කුකුළෙක් වගේ අත් දෙක පොරවගෙන, බිම බලාගෙන හිටිය. මිනිහ භාවනා කරනවද? නැත්තං හීතලේද?

"එක සෙමෙස්ටර් එකකට පන්ති තහනම්... ටෙස්ට් එක F... කෝර්ස් ටික කම්ප්ලීට් කරන්න එන අවුරුද්ද වෙනකල් ඉන්න ඕනෙ..." අපි තීන්දුවෙ සාරාංශෙ ආලෝක්ට කියල දැම්ම.

"මොනව?" ආලෝක් එක පාරට හීනෙන් බය වෙලා නැඟිට්ට වගේ කෙළින් වුණා. මිනිහ හිටිය භාවනාවෙන් හරි, හීතලෙන් හරි මිදුණ.

"ප්‍රොෆෙසර් වීරා පුළුවන් තරම් ට්‍රයි කරල තියෙනව තීන්දුවෙ වෙනසක් කරන්න... ඒත් වැඩක් වෙලා නෑ... ඔක්කොම කෙළවුණා... මට තේරෙන්නෙ නෑ මොනවද අපි කරන්න ඕනෙ කියල..."

අපි ආයෙ වාඩි වුණා. පාන්දර පහයි. එළිවෙන්න තව පැයයි.

මුකුත් කියන්නෙ නැතුව ආලෝක් නැඟිට්ට. මිනිහගෙ මූණෙ තිබ්බෙ ඇවිදින මළමිනියක පෙනුමක්. මිනිහ නැඟිටල ගියේ වහලෙ අද්දරට. මීට පැය එකහමාරකට විතර කලින් රයන් හිටියෙත් එතන.

"ඔයා කිව්ව හරි රයන්... මෙතන මාර උසයි තමා..." ආලෝක් කිව්ව.





"ආලෝක්... මෙහෙට එනවද?"

"ඇයි ඔයා හිතන්නෙ මෙහෙම අයිනට යන්න පුළුවන් ඔයාට විතරයි කියලද?"

"හරි... හරි... ඔයාටත් පුළුවන්. දැන් මෙන්න මෙහෙට එන්න. අපි පහළට යමු... මටනං දැන් ඇති වෙලා...!"

ආලෝක් උත්තර දුන්නෙ පහළ බලන ගමන්. "අන්න හරි... අඩු ගානෙ මේ වතාවෙ හරි මං ඔයා කියන එකට එකඟයි... ඔව් රයන්... මටත් ඇති වෙලා... අපි පහළට යං... මං ඉස්සෙල්ල යන්නං..."

ආලෝක්ගෙ කට හඬේ මොකක්දෝ අමුත්තක් තිබ්බ කියල අපිට හිතුණ. අපි ඒ දිහා බැලුව විතරයි... ආලෝක් වහලෙන් පැන්න!!

ඇහිපිය ගහද්දි මිනිහ නොපෙනී ගියා.

# 21

## මගේ ජීවිතේ දිග.....ම දවස - 6

මං මීට ඉස්සර කවදාවත් ඇම්බියුලන්ස් එකක් ඇතුළෙ ඉඳල නෑ. ඒක මහ මූසල අත්දැකීමක්. හරියට ඉස්පිරිතාලෙකට, ඒකෙ තියෙන බඩු මුට්ටු ඔක්කොම අකුළගෙන පිටවෙන්න කිව්වම හැදෙන පුංචි ඉස්පිරිතාලයක් වගේ! අඬුපඬු, ඔක්ෂිජන් බෝතල්, බට කැතීටර්, සේලයින් බෝතල්, ෆස්ට් ඒඩ් බොක්ස් ඔය හැම දෙයක්ම ඒකෙ ඇතුළෙ තියෙන ඇඳන් දෙක වටේ තිබ්බ. ඇතුළ හුණ්ඩුවක් වගේ. ආලෝක්ව හතර ගාතෙන් බාවල හිටිය නිසා මමයි, රයනුයි හිටගෙන හිටියෙත් බොහොම අමාරුවෙන්. අනික් අතින් බැලුවම ඇටකටු බිඳීම් 13ක් තියෙන ගොබිලෙක්ව හතර ගාතෙන් බාවන්නෙ නැතුව කෙළින් හිටවතහැකියැ? ඒ ඇඳන්වලට දාන ෂීට් සාමාන්‍යයෙන් සුදු පාට වුණත් ඒ වෙද්දි නම් ඒව රතුම රතු පාට වෙලා තිබ්බෙ ආලෝක්ගෙ ලේවලින්. ආලෝක් හතර ගාතෙ අල හිටිය විදිහට මිනිහව අඳුරන්නත් අමාරුයි. කළු ඉංගිරියාව උඩට ගිහින්. දිව කටින් එළියට ඇවිත් පැත්තකට වැටිල. හරියට ඇල්සේෂන් බල්ලෙක් හති ආද්දි වගේ! ඉස්සරහ දත් හතර නෑ. කවුරු හරි දත්ටික බඩට යන්න හොම්බට එකක් දීල වගේ! (ඒක අපිට දොස්තර පස්සෙයි කිව්වෙ.)

මිනිහගෙ ඇඟ නෝ හෙල්ලුම්. හරියට එයාගෙ තාත්තගෙ ඇගේ දකුණු පැත්ත වගේ. මිනිහගෙ දකුණු දණිස්සෙන් කකුල නැව්ල තියෙන විදිහ දැක්කම කවුරු හරි හිතන්නෙ මිනිහගෙ කකුල හැදිල ඇත්තෙ රබර්වලින් කියලයි. පණ තියෙනවද





කියල හිතන්නත් අමාරුයි. වෙන වෙලාවකදි කවුරු හරි මිනිහව පෙන්නල ඔට්ටුවක් අල්ලන්න හැදුවොත් මං ඔට්ටු අල්ලන්නෙ මිනිහ මැරිලයි කියන පැත්තට!

මං මටම දිවුර ගත්ත මෙහෙ. "ආලෝකය මේකෙන් ගොඩ ආවොත්, ආයෙ දෙකක් නෑ, මං ලියනව පොතක් අපි පිස්සු කෙළපු හැටි කියල..." එක අතකින් ඒක මහ ඔල්මොරොන්දන් දිවුරීමක්. මොකද ඒ වෙද්දි මගෙ ඔළුව හොල්මං වෙලා තිබ්බෙ. අනික නින්ද නැතුව එක දිගට පැය පනහක් ඇහැරගෙන හිටියෙ.

ඇම්බියුලන්ස් එක දිල්ලියෙ ලොකුම ඉස්පිරිතාලෙට, AIIMS එකට හැරෙව්ව ලේයි, දවස් දෙකකින් නින්දක් නැතිකමයි මාව නිකන් රොබෝවෙක් වගේ හැඟීමක්, ඇනීමක් නැති තත්ත්වෙකට පත් කරල තිබ්බ. මං දන්නෙ නෑ කවුද ඇම්බියුලන්ස් එකට කතා කළේ කියල. කවුද යන්න ඕනෙ ඉස්පිරිතාලෙ තීරණේ කළේ කියල. සමහර විට ඒ සිකියුරිටි ගාඩ් වෙන්නත් ඇති. මගෙ වටේ හිටිය හැමෝම කරන්ට් වැදිල වගේ වේගෙන් එහෙට මෙහෙට දුවල පැනල වැඩ කරන හැටි පෙනුණ.

AIIMS එකේ හදිසි අනතුරු අංශෙ දොස්තරල පිරිල හිටිය. ඒක ආණ්ඩුවෙ ඉස්පිරිතාලයක්. ඒ හින්ද මිනිස්සු වැඩියි. සර්විස් එක අඩුයි. එහෙම වෙලාද කොහෙද තමයි රයන් ගෝරනාද කරන්න ගත්තෙ. ඒ කෑ ගැහුවමනං සමහරු වැඩ කරන්න ගත්ත.

"තට්ටු නවයකින්..." ට්‍රොලිය තල්ලු කරගෙන ගිය මනුස්සය ඇහුවෙ ඇස් දෙක නළලෙ තියන්. මං හිතන්නෙ මිනිහගෙ හිත කියන්න ඇති, 'අපරාදෙ... මං මේකව දාගෙන ට්‍රොලිය තල්ලු කරන් යන මහන්සියත්' කියල.

ආලෝක්ව අයි.සී.යූ. එකට දැම්මට පස්සෙ ඩොක්ටර් අපිට කිව්ව එළියෙන් ඉන්න කියල. ඒ වෙද්දි තැන් තැන්වල ඉන්න ඉඳිල්ල මට ඇති වෙලා තිබ්බෙ! මම එළියෙ තිබ්බ ලී බංකුවෙ වාඩි වුණා. මගෙ වටේ හිටියෙ තමන්ගෙ පවුලෙ කෙනෙක් හරි, නෑදෑයෙක් හරි, හිතවතෙක් හරි එයාලගෙ ජීවිතෙත් එක්ක කරන

සටනෙ ප්‍රතිඵල බලා ගන්න හිටිය අය. අම්මල... දූල... තාත්තල... පුත්තු...! මං ටිකක් ඇස් දෙක වහ ගන්න උත්සාහ කළා. ඒත් ඒක හරි ගියේ නෑ. මට හිතුණෙ එහෙමයි.

රයන් මට ඇහැරවද්දි දවල් වෙලා. මගේ ඇගේ මුළු වම් පැත්තම නිකං කෙණ්ඩ පෙරළිලා වගෙයි මට දැනුණෙ.

"ආලෝකය මැරෙන එකක් නැලු... සෑහෙන අමාරුයිලු... ඒත් ජීවත් වෙයිලු... ඩොක්ටර් කිව්වෙ..." රයන් එක හුස්මට කිව්ව.

"මොකක්? කොහොමද? ඇත්තටම?" මං නිදිමරගාතෙ ඇහුව.

"ඔව්... මිනිහ වැටිල තියෙන්නෙ පොන්ඩ් එකටනේ... ඒකෙ තිබ්බ වතුර නිසා ඔය තරමින් බේරුණාලු..."

කැම්පස් එකේ එතන තිබුණ පොකුණ කවදාවත් අපි ආස කරපු දෙයක් නෙවෙයි. ඇත්තටම ඒකෙන් කිසිම වැඩක් තිබ්බෙ නෑ. ඒත් දැන්! කකුල තැන් එකොළහකින් කැඩිලලු. අත, තැන් දෙකකින්! ඒකනං ඒ හැටි බරපතළ නැලු. ආලෝකය කන හැටියට ඔය කැඩිච්ච ඇටකටුනං සුමානෙන් හැදෙයි!

"ඇති යන්තං... මං හිතුවෙම ඌ ඉවරයි කියල..." මං රයන්ව බදා ගත්ත. ඊට පස්සෙ මං දන්නෙවත් නැතුව මට ඇඬුණා. ඉස්පිරිතාලයක් වගේ තැනකදි එහෙම අඬන එකේ ලැජ්ජාවක් නෑනෙ.

"මිනිහට සිහිය ඇවිත්ද?"

"තාම හරියකට නෑ... වැඩියමත් මිනිහත් දවස් දෙකක් නිදාගෙන නෑනෙ... ගිහිල්ල ඕකව කොනිත්තල බලමුද?"

අපි අයි.සී.යූ. එක ඇතුළට ගියා. ඩස්පයා නිදි!

"ලෙඩ්ඩුන්ට විවේකෙ ඕනෙ... ෂ්... ෂ්..." නර්ස් කෙනෙක් අපිට සද්ද කරන්න එපා කියල ඉඟි කළා. අපි අයි.සී.යූ. එකෙන් එළියට ඇවිත් බස් එකට නැග්ගෙ කුමාඕන් යන්න.





අපි කැම්පස් එකට යද්දි රයන් මා දිහාට හැරුණ.

"හරී... ඔයා දන්නවද... මං ආලෝකයට ණයගැතියි."

"ඇත්... ඒ කිව්වෙ?"

"මිනිහ නොහිටියනං පහයි පොයින්ට් ගාණ ගන්නවත් මං පාඩම් කරන්නෙ නෑ..."

රයන් කිව්ව එක හරි. ආලෝකය නිසා තමයි අපි පාඩම් කළේ. එහෙව් ආලෝකය තමයි දැන් අයි.සී.යූ. එකේ දපල ඉන්නෙ!

"ඔයා හිතන්නෙ මිනිහ සනීප වෙයිද?" රයන් ඇහුව.

"ඔව් රයන්... ඔව්..." මං ආයෙ රයන්ව බදා ගත්ත. පළවෙනි වතාවට රයන්ගෙ ශක්තිමත් බව මට දැනෙන්න ගත්ත. මිනිහත් මාව තදින් බදා ගත්ත.

"අයෑම් සොරි හරී..." රයන් කිව්වෙ කඳුළුත් එක්ක සටන් කරන ගමන්. "අයෑම් සොරි..."

"ඔක්කොම හරියාවි... අපිට මේක පැන ගන්න පුළුවන් වේවි!"

අපි හැමෝටම විවේක ගන්න වෙලාවක් ඕනෙ කරනව. ඔව්... අපිට ඒ විවේකෙ දැන් ලැබිල තියෙනව... මාස හතරක්! හිතේ හැටියට අත පය දිග ඇරල විවේක ගන්න!!

# 22

## රයන් කතා කරයි

මේ ඔක්කොටම වග කියන්න ඕනෙ මායි. ආලෝකය අයි.සී.යූ. එකේ ජීවිතෙයි මරණෙයි අතර සටනක ඉන්නෙ මං හින්ද. ඇත්තටම ඒක මහ ඛේදවාචකයක්! ඔපරේෂන් පෙන්ඩියුලම් කියන්නෙ මහ බූරු වැඩක්. මේ කිසි දෙයක් නොවෙන්න තිබ්බ ආලෝකය තව ටිකක් ඉවසල, කීයක් හරි වියදම් කරල එළියෙන් කෝල් එකක් ගත්ත නම්. එහෙනම් තත්ත්වෙ මීට වෙනස්. සම්පූර්ණයෙන් වෙනස්. එහෙමත් නැත්තන් මිනිහ ඒ වැඩේට නැවිත්ම හිටියනං ඒත් තත්ත්වෙ සම්පූර්ණ වෙනස් වෙනව. ඒ ඔක්කොමත් හරි. මිනිහ දැන ගන්න ඕනෙ වහලෙ උඩින් බිමට පනිනවට වඩා වෙන දෙයක් කරන්න. ඇත්තටම මුන් කවද මිනිස්සු වෙයිද දන්නෑ? හැම තිස්සෙම වැඩ කරන්නෙ තොත්ත බබාලා වගේ!

දැන් ඔයාල කියයි, මේ ඔක්කොම සිද්ධ වුණේ මගේ වැරැද්ද නිසාය කියල මං පිළිගන්න කැමති නැතුව ඇති කියල. රයන් ඉතින් හැම එකටම බණින එකනෙ කරන්නෙ... හැම කෙනෙකුටම බණිනව... එයාගෙ දෙමවුපියන්ට... එයාගෙ යාළුවන්ට... ඉගෙන ගන්න තැනට... කොටින්ම දෙයියන්ට පවා...! මිනිහට ඇර වෙන හැම කෙනෙකුටම මිනිහ බණිනව.

මං ඔයාට බණින්නෙ නෑ. ඔයා කියවන්නෙ හරිට ඕන විදිහට මිනිහ ලියපු එකනෙ. එතකොට මිනිහ ලියන්නෙ නැනෙ මිනිහ





නරක මිනිහ වෙන විදිහට. නැද්ද හොඳයි? හරි කියන්නෙ ඔහේ දොඩවන අයි.අයි.ටී. පොරක්. ග්‍රේඩ් එකක්වත් ගන්න බැරි වෙච්ච එකෙක්. ජීවිතෙත් පෙළගස්ස ගන්න බැරි වෙච්ච එකෙක්. හැබැයි ඉතින් මිනිහගෙ හිත හොඳයි. හැබැයි ටිකක් අවුල්. ආදරෙන් පැටලිලා. ඇඟපතින්නම් එහෙමට කඩවසම් පොරක් නෙවෙයි. යාළුවො එකතු කරගෙන ඉන්න කැමතියි. වයිවාවලදි ගොත ගහනව්. උත්තර දීගන්න බැරුව යනව. අනේ මන්ද... මිනිහ ගැන අනුකම්පා කරනව ඇරෙන්න වෙන කරන්න දෙයක් නෑ මට.

මේක කියවගෙන යද්දි ඔයාල නෝටිස් කළේ නැද්ද හරී. සමහර දේවල් කොළේ වහල ගහල තියෙන බව? නිකම්වත් ඒක තේරුණේ නැද්ද? එයාගෙ දෙමවුපියො ගැන මුකුත් කියල නෑ. වයිවාවලදි උත්තර දීගන්න බැරි වෙන්නෙ ඇයි කියල කියල නෑ. එහෙමත් නැත්තන් මිනිහ හැම තිස්සෙම ආලෝක්ගෙ පවුල විහිළුවට ගන්නෙ ඇයි කියලත් කියල නෑ. ඇත්ත තමයි... ආලෝකයගෙ ගෙදර වෙන දේවල් දැක්කහම පිස්සු හැදෙන එක වෙනම දෙයක්. ඒත් ඉතින් ඒක හැම තිස්සෙම විහිළුවට ගන්න එක, 'සංවේදී' කියන ගොඩටනං දාන්න බැරි එකක්!

නැහ්... මිනිහ ඒවයෙ එච්චර දුරට යන්නෙ නෑ. ඒ නිසා සමහර විට මට තමයි ඒවා ඔයාලට කියන්න වෙන්නෙ. (හැබැයි ඉතින් ඕකා ඒව කපල දාවි!) හැබැයි ඒව කියන්න කලින් මට තියෙනව ආලෝකය ගැන කියන්න. නාකි ප්‍රොෆෙසර්ස්ල ටිකක් තමන් ගැන හොයන්න විනය කමිටුවක් දැම්මයි කියල තට්ටු නවයකින් පනින බූරුව මොකාද? තමන්ගෙ අක්කව කසාද බන්දන එක බිස්නස් එකක් කර ගත්තු පවුල, ඒ කසාදෙ කැන්සල් කළාය කියල ඒ ගැන හිත හිතා ඉන්න මෝලා කවුද? ඇයි ආලෝකය මෙච්චර ගොන්, බූරු මෝලෙක් වුණේ? මැටි හරකෙක් වුණේ? ඕකට ඔච්චරම මෝල් කලන්තෙ ඇල්ලුවනම් ඌට තිබ්බෙ ඌ පනිනව වෙනුවට මාව තල්ලු කරන්න!

ඔයගොල්ලො කොහොම මොනව හිතුවත් මං ආලෝක්ට කැමතියි. ඇත්ත... අපි මරා ගත්ත තමයි. වාද කළා තමයි. මිනිහ පොතේම රිංගන ඉන්න එකට බැණ ගත්ත තමයි. ඒත් අන්තිමට

බැලුවොත් මිනිහ ගත කළේ රොබෝවෙක්ගෙ ජීවිතයක්. මිනිහට මිනිහවත් නැති ජීවිතයක්! ඇත්තම කිව්වොත් මිනිහට ඕනෙ වුණේ නෑ, තමන් ඉහළ ලකුණු අතර වැජඹෙන පොරක් වෙන්න. මිනිහට ඕනෙ වුණේ නෑ, මං අයි.අයි.ටී. පොරක්ය කියල බැබළෙන්න (කාටද එහෙම ඕනෙ?). මිනිහට ඕනෙ වුණේ මිනිහගෙ අම්මවයි, තාත්තවයි සතුටු කරන්න. අක්කව බන්දල දෙන්න. ගෙදර... ගෙදර... ගෙදර... ඕකමයි මිනිහගෙ ඔළුවෙ වැඩ කළේ. මිනිහ පොඩි කාලෙ, අවුරුදු දොළහෙ ඉඳන් ගෙදරට කැපවෙලා කරපු සේවෙ, දිගටම කරන්නයි එයාට ඕන වුණේ. මිනිහ හිටියෙ ඒ මානසිකත්වයෙන්මයි. ඇඟෙන් ලොකු වුණාට හිතෙන් හිටියෙ පොඩි එකෙක්. අන්න ඒ හින්දයි මිනිහට අවුරුදු විසි ගාණක් වෙලත් හැම එකකටම වගේ අඬන්න පුළුවන් වුණේ!

ඒකම තමයි මිනිහ කවදාවත් ෆන් එකක් ගත්තෙ නැත්තෙ. ඒත් ඒකෙන් කියන්නෙ එයාට එහෙම උවමනාවක් තිබුණෙ නැහැයි කියන එකද? මිනිහ අපිට ඇලිල ගැලිල හිටියෙ ඇයි කියලද ඔයාල හිතන්නෙ? මිනිහ මොකද අපි ළඟට ආපහු ආවෙ? එක වෙලාවකදි මිනිහට තේරුණා එයා වෙන්කට් කෙනෙක් නෙවෙයි කියල. මිනිහගෙ ඇතුළෙ හිටියෙ චිත්‍ර ශිල්පියෙක් වෙන්න උවමනාව තිබ්බ ළමයෙක්! ඒත් ඒ ආශාව මුදුන්පත් කර ගන්න බැරි වුණු ළමයෙක්! ඒ වගේම කවදාවත් ඇත්ත යාළුවො නොහිටිය, ඒත් ඇත්ත යාළුවො හදාගන්න ඕනකමක්, ආසාවක් තිබ්බ ළමයෙක්. මං මිනිහව රැග් එකෙන් බේර ගත්තු එක එයාගෙ ජීවිතේ විශේෂ සිදුවීමක් වුණා. ඒ හින්දමයි මිනිහ මාත් එක්කම හිටියෙ. මාත් එක්ක රණ්ඩු වුණේ. මට සාප කළේ. මිනිහ මට ඒ දේවල් කළේ එයාටත් ඒව කර ගන්න ගමන්මයි. ඒ කිව්වෙ මිනිහ මිනිහත් එක්කම රණ්ඩු කර ගත්ත. මිනිහ මිනිහටම සාප කර ගත්ත. මං මිනිහව අල්ලල හෙල්ලුව. අනික් පැත්ත හැරෙව්ව. මිනිහගෙ විශ්වාස කුඩු පට්ටම් කළා. හැම තිස්සෙම දෙමවුපියො ගැනම හිත හිතා මැරෙන්න ඕනෙ නැතිය, කැම්පස් එකේ සිස්ටම් එක අපි පිළිගන්න ඕනෙ නැතිය, විනෝද නොවී ඉන්න එක මෝඩකමක්ය කියන අදහස් මං එයාගෙ ඔළුවට දැම්ම. මං මිනිහව





එතනට තල්ලු කළා. ඒ දේවල්වලට මිනිහ කැමති වෙන අතරෙම විරුද්ධ වුණා. මං මිනිහව තව තවත්, තව තවත් මුල්ලටම තල්ලු කළා. අන්තිමට ඕනැවට වඩා තල්ලු කළා. දෙයියනේ, ඒ ඩස්පයව ජීවත් කරල දෙන්න.

ඒත් හරී? මට මිනිහගෙන් අහන්න ප්‍රශ්න කීපයක් තියෙනව. ඔයාගෙ දෙමවුපියො කොහොමද? එයාල ගැන විස්තර හංගලද තියෙන්නෙ? තාත්ත කොහොමද ඔයාගෙ? ආමි එකේ කර්නල් කෙනෙක්? ගෙදර පාලනේ කොහොමද සිද්ධ වෙන්නෙ. ටීවී නෑ. මියුසික් නෑ... හයියෙන් හිනා වෙන්න බෑ... එහෙමද? ආමි එකේ වගේමද ගෙදර විනය?

එතකොට අම්මා? එයා දවස් ගණන් කතා නොකර ඉන්නව... එහෙම නේද? ඔහ්... ටිකක් ඉන්න... මට මේක කතා කරන්න අවසර නෑ හරිනම්... ඔයාගෙ තාත්ත පටියක් එල්ලගෙන ඉන්නව නේද අත දිග හරියෙ? ඔයාට ඒක තාම හීනෙන් පේනවද? හරි... එයා කියල තියෙන්නෙ එයාගෙන් ප්‍රශ්න කරන්න එපයි කියල නේද? එයා ප්‍රශ්න කරනකොට නිශ්ශබ්දව ඉන්නයි කියල නේද? දන්නවනෙ... තමන්ගෙ ඉහළ නිලධාරීන් එක්ක ඒ වගේ වෙලාවලදි කතා කරන්න ගියොත් දඬුවම් සැරයි. දන්නවනෙ? ඔහ්... ඒකත් වයිවා එක වගේ... නේද? හරි... ඒකෙ වේදනාව තාම ඔයාට දැනෙනවද? හරි... හරි...මං හිතන්නෙ මං ඕනවට වඩා දුර යනව. හරි හොඳ එකා. එකම දේ සමහර දේවල් තියෙනව මිනිහ කතා කරන්න අකමැති. පොතක් ලිව්ව පළියටම ඒකෙත් ඒව දරාගෙන ඉන්න ඕනෙද? අනික මේක අයි.අයි.ටී. එක ගැන, අපේ අනාගතේ රැඳිච්ච තැන ගැන ලියවෙන පොත. ඒත් ඉතින් අතීතෙ හාර අවුස්සල ඇති පලේ මොකක්ද?

ඒ නිසා මට ආයෙ අයි.අයි.ටී. එකට එන්න ඉඩ දෙන්න. හරී (මිනිහට දරන්න බැරි තරමෙ වොඩ්කා ප්‍රමාණෙකුත් ශරීරෙ ඇතුළෙ තියාගෙන...) එක පාරක් මට දේශනා කළා මිත්‍රත්වය ගැන මිනිහගෙ දර්ශනේ!

මිනිහ කිව්ව "රයන්... උඹ උඹේ යාළුවෝ වෙනුවෙන් ගොඩක් දේවල් කැප කරන මෝඩයෙක්... එක අතකින් බැලුවම ඒක ආලෝක්, ආලෝක්ගෙ ගෙදර අය වෙනුවෙන් කරන කැපකිරිල්ලට සමානයි... ඒ වගේමයි ඔයාල දෙන්නම ඔයාලට ඇත්තටම ඕන කරන දේවල්වලින් ඈත් වෙලා..."

යකෝ මාරයිනෙ? ඒ පාර තමයි මං ඇහුවෙ මිනිහගෙන්, මිනිහ මිනිහට ඕන කරන දේවල්වලට ළං වෙලාද ඉන්නෙ කියල? ඒකට මිනිහ 'ඔව්' කියල ඔළුව වැනුව.

"මොකක්ද ඒක?" මං ඇහුව.

"මට ඕනෙ ඔයා වෙන්න!"

"මොකක්?" මං හිතුවෙ මගෙ කනේ වරදක් කියල.

"මට නේහා ඕනෙ..." ඒ පාර මිනිහ ඒක හැරෙව්ව. නරියා...!

එතකොට බලමු මෙතන ගනුදෙනුව මොකක්ද කියල. මිනිහ ජීවත් වෙන්නෙ අනික් අය වෙනුවෙන් නෙවෙයි. (මායි, ආලෝකුයි වගේ... මිනිහ කියන විදිහට!) ඒත් මිනිහට ඕනෙ වෙන කෙනෙක් වෙන්න!මහ හතර බීරි කතාවක්නෙ ඒක! ඒ ගැන මට කියන්න තියෙන්නෙ ඒකයි!



# 23

## කජු බර්ෆි

අපේ පන්ති තහනම් කරපු සෙමෙස්ටර් එකෙන් මාස දෙකක් ගියහම ආලෝකයගෙ ටිකට් කැපුව. මිනිහ කුමාඕන්වලට ආවෙ ප්ලාස්ටර් ඔෆ් පැරිස් බදාම එක්කමයි. දොස්තරල කිව්වෙ ඒව කපල අයින් කළාට පස්සෙත් මිනිහගෙ පොඩි කොරයක් හිටිවි කියලයි. මැරෙන්න හිටිය එකාට කොරයක් හිටියම මොකෝ? මැරෙනවට වඩා පුංචි කොරයකින් බේරුණු එක කොච්චර ලොකු දෙයක්ද? එදා රෑ නම් ආලෝකයගෙ ජීවිතේ තියෙනකල්ම මිනිහට අමතක වෙන එකක් නෑ!

මිනිහ ඉස්පිරිතාලෙ ඉන්නකල්ම අපි හැමදාම ඉස්පිරිතාලෙට ගියා... හරියට අපිට වෙන කරන්න දෙයක් නෑ වගේ. (ඇත්තටම අපිට කරන්න දෙයක් තිබුණෙත් නෑ තමා.) සෙමෙස්ටර් එකේදි ගෙදර යාම ගැන අපි කවුරුත් කතා කළේ නැහැ. අපි කුමාඕන්වලම ඉන්න ඕනෙ කියන කාරණාවයි, අපි තුන්දෙනා අත දිග හරියක ගැවසෙන්න ඕනෙ කියන කාරණාවයි අත්‍යවශ්‍යයි කියල තීරණේකට ඇවිල්ලමයි තිබ්බෙ. අනික් එවුන් කවුරුත් අපිත් එක්ක වැඩි බජනෙට ආවෙ නෑ. එහෙම ආවනං ආවෙ අපේ සිද්ධියෙ ඇත්ත කතාව මොකක්ද කියල දැන ගන්නයි. අපි මොනවද කළේ...? විනය කමිටුව කොහොම එකක්ද...? ආලෝකය පැන්නෙ ඇයි...? ඔය වගේ දේවල්. ඒ හින්ද අපි ආස කළේ කාමරේටම වැදිල ඉන්නයි. එළියට යනව නම් ඉස්පිරිතාලෙට යන්නයි විතරයි.

ආලෝකය අපිට දහඅතේ දිවුරව ගත්ත මිනිහ වහලෙන් පැනීම එයාගෙ ගෙදර අයට හැමදාම රහසක් හැටියට තියා ගත්ත. ටිකෙන් ටික මිනිහගෙ ඇටකටු හයි වෙන්න ගත්ත. මාසයක් විතර ගියහම මිනිහට පුළුවන් වුණා පැන පැන වගේ ඇවිදින්න. ඒ විදිහට ටොයිලට් එකට එහෙම යන්න ඕනෙ වුණාම අහල පහල හිටිය කෙනෙක් දෙන සපෝට් එක පිළිගන්න මිනිහ ලැජ්ජ වුණේ නෑ. දොස්තර අපිට කියල තිබ්බෙ මිනිහගෙ හයිජම්ප් එක ගැන කතා කරන්න එපා කියලයි. ඒත් ඉතින් රයන් කියන්නෙ එහෙම කට වහන් ඉන්න පුළුවන් එකෙක්යැ?

"මොකද බූරවො පැන්නෙ? ගොන්කමද? හැටිද?"

ඒත් ආලෝකය මොකුත් කිව්වෙ නෑ. සද්ද නැතුව හිටිය. ප්‍රොෆෙසර් වීරත් දෙතුන් පාරක් ඉස්පිරිතාලෙට ආව. එයා අපිව ධෛර්යවත් කරපු එකයි කළේ. අපිට ගොඩ යන්න එයා දරන උත්සාහය ගැන එයා කිව්ව. එයා ආයෙත් චෙරියට කතා කරල අපිට සමාවක් අරන් දෙන්න උත්සාහ කරල තියෙනව. ඒත් වැඩක් වෙලා නෑ.

ආලෝකය හොස්ටල් එකට ආවමත් ප්‍රොෆෙසර් වීරා ආවා මිනිහව බලන්න.

"ආයෙ ඉතින් පුරුදු තිප්පොළට ආව එහෙනං?" එයා විහිළු කළා.

ආලෝක් එවෙලෙ හිටියෙ මගෙ ඇඳේ හාන්සි වෙලා. හාන්සි වෙලා කිව්වට කොට්ට අල හේත්තු වෙලා.

"සර් මොකට කරදර වුණාද?" ආලෝක් කිව්ව.

"ආ... ඕක මොකක්ද?" ප්‍රොෆෙසර් වීරා කිව්වෙ එයාගෙ බෑග් එකෙන් පෙට්ටියක් එළියට ගන්න ගමන්.

"මේන් ස්වීට්ස් වගයක්... ඔක්කොමල කන්න. ආලෝක් ආපහු ආව එකයි, තවත් එක හේතුවකුයි සමරන්න...!"

කොච්චර අමාරුවෙන් හිටියත් 'කෑමක්' කියන්නෙ ආලෝකයගෙ සියලු දෝෂ දුරු කරවන, හැඟීම් අවුස්සන දෙයක්.





මිනිහ ප්‍රොෆෙසර් වීරගෙ අතින් ස්වීට් පෙට්ටිය ඩැහැ ගත්තයි කිව්වොත් තමා හරි. පෙට්ටිය ඇරියම ආලෝකයගෙ කට කනේ! මොකද ඒකෙ තිබ්බෙ ඌ ආසම කරන ස්වීට් එක! කජු බර්ෆි!!

"සර් අපරාදෙ කරදර වුණේ මේව උස්සන් එන්න..." ආලෝකය ආයෙත් කිව්ව. ඒ කිව්ව එකත් හරියට පැහැදිලි වුණේ නැත්තෙ ඒ වෙද්දිත් උගෙ කටේ එයින් කෑලි තුනක් පිරිල තිබ්බ හින්දයි!

"කන්න... කන්න... කැඩිච්ච ඇටකටු දහතුනක් හොඳ කරගෙන මාස දෙකකින් ආපහු ආව කියන එක පොඩි පාටියක් දාන්න තරම් කාරණාවක්..." ප්‍රොෆෙසර් වීරා කිව්වෙ ආලෝක්ගෙ ඔළුව අත ගාන ගමන්.

ආලෝක් ආපහු ආව එකටයි, කජු බර්ෆි හම්බ වෙච්ච එකටයි අපි හිටියෙත් සෑහෙන සන්තෝෂෙකින්. හැබැයි ඉතින් කජු බර්ෆි ගැන අපිට සන්තෝෂ වෙන්න පුළුවන් ආලෝකය ඒ පෙට්ටිය අපේ අතට දුන්නොත් තමා. මේ වෙනකොටත් ඒක තිබ්බෙ උගෙ අතේමයි!

"සර්... මොකක්ද අර තවත් එක හේතුවකුයි කිව්වෙ...? මොකක්ද අනික් කාරණාව?" රයන් ඒ එක්කම ඇහුව.

"ඔව්... ඔව්... මට තියෙනව ඔයාලට කියන්න සුබ ආරංචියක්." ප්‍රොෆෙසර් වීරා කිව්ව.

"මොකක්ද? ප්‍රොෆෙසර් චෙරියන් තව විනය කමිටුවක් දාන්න යනවද අපිට?" රයන් ඇහුව.

"ඉන්නකො කලබල නැතුව..." ප්‍රොෆෙසර් වීරා රයන්ව සන්සුන් කළා. "මං දන්නව වෙච්ච දේවල් දරා ගන්න ඔයාට අමාරු බව... ඒත් මේ පාර මං ඒක ලෑස්ති කළේ කෙළින්ම ඩීන් හරහා..."

"මොකක්ද සර්?" මායි, ආලෝකයි ඇහුවෙ එකටම වගේ. ප්‍රොෆෙසර් වීරා, රයන් දියා බැලුව.

"ඔයාට මතකනෙ ඔයාගෙ ප්‍රොජෙක්ට් එක...! ප්‍රොෆෙසර් චෙරියන් ඒකෙ වැඩිදුර රිසර්ච්වලට අවසර දුන්නෙ නැනෙ... මං කෙළින්ම ඩීන් හම්බ වුණා. හම්බ වෙලා ඇහුව ප්‍රොෆෙසර් චෙරියන් කියල තියෙන වෙනස්කම් කරල ඒක ආපහු ඉදිරිපත් කරන්න පුළුවන්ද කියල..."

"මමනං එයා කියල තියෙන වෙනස්කම් කරන්න යන්නෙ නෑ..." රයන් ගෙරෙව්ව.

"පොඩ්ඩක් ඉන්නකො..." මං කිව්ව. "සර්... ඇයි අපි ඒක ආපහු ඉදිරිපත් කරන්න හදන්නෙ?"

"අන්න එතනදි තමයි මගෙ අදහස වැඩ කරන්නෙ..." ප්‍රොෆෙසර් වීරා කිව්ව. "එයාල අපිට අවසර දුන්නොත් ඒක ආපහු ඉදිරිපත් කරන්න, අපිට පුළුවන් ඒකෙ සාර්ථක බව පෙන්නන පරීක්ෂණ වැඩිදුරටත් අපේ ලැබ් එකේදිම කරන්න..."

"එතකොට...?" රයන් ඇහුව.

"එතකොට ඒ කියන්නෙ ඔයාලට පුළුවන් ඒ පරීක්ෂණවලට උදව් වෙන්න. මම ඩීන්ගෙන් ඒක ඇහුව... ඔයාල ලැබ් එකට ඇවිත් ඒකට උදව් කළාට කමක් නැද්ද කියල. ඩීන් ඒකට අනුමැතිය දුන්න. ඒකත් ලොකු දෙයක් මේ වෙලාවෙ හැටියට..."

රයන් ඒ වෙද්දිත් ආලෝකය බඳොයියගෙන හිටිය කජු බර්ෆි පෙට්ටිය උදුරගෙන එයින් කෑලි දෙකක් කෑව.

"හැබැයි තව දෙයක්... ඒ වැඩේට ලැබෙන ප්‍රශංසා, ලකුණු වගේ දේවල් ඔයාලට හම්බ වෙන්නෙ නෑ ඇම්ම!"

රයන් වාඩි වුණා.

"සර් එතකොට අපි මැරිගෙන ඒකට වැඩ කරන එකේ තේරුමක් නැනෙ...!"

"තේරුමක් තියේවි පස්සට... ඔයාලට පස්සෙ කාලකෙදි එයාලට කිව්වහැකි මේ ප්‍රොජෙක්ට් එක නිසාය ඔයාලගෙ වැඩ අතපසු වුණේ කියල... මේ ප්‍රොජෙක්ට් එක බලාපොරොත්තු





වෙන විදිහටම සාර්ථක වුණොත් ඒක විශාල පෙරළියක් වෙනව... එතකොට ඒ කීර්තිය ඔයාලගෙ හරහ අයි.අයි.ටී. එකටත් ලැබෙනව... ඒව ඒ විදිහට සිද්ධ වුණොත් ඊළඟ සෙමෙස්ටර් එකේදි ප්‍රොජෙක්ට් එක වෙනුවෙන් ඔයාලට පොඩි සැලකීමක් ලැබෙන්නත් බැරි නෑ..."

"ඒ කිව්වෙ සර්..." රයන් ඔන්න උනන්දුවෙක් වුණා. "අපිට අනිත් අය වගේම අවුරුදු හතරෙන් ඩිග්‍රිය ගන්න පුළුවන් කියන එකද?"

"සර්... සර්... අපි ගැන සෑහෙන්න හිතල... තැන්ක් යූ සර්..." මං කිව්ව.

"ඒත් ප්‍රොෆෙසර් චෙරියන් ඕකට ඉඩ තියන්නෙ නෑ සර්... ඕක හරියන එකක් නෑ..." රයන් ආපහු පහුබැස්ස.

"ඔව්... ඒ වුණාට වැඩේ සාර්ථක වෙලා ඩීන් කැමති වුණොත්? කවුද දන්නෙ...? අනික මේකට වෙලා උඩ බලන් ඉන්න වෙලාවෙ ඔයාල ඒ වගේ වැඩක යෙදෙන එක ප්‍රයෝජනවත්නෙ."

"අපි එහෙම උඩ බලන් ඉන්නෙ නෑ සර්..." රයන් කිව්ව.

"රයන්..." මං තදින් කිව්ව. "ප්‍රොෆෙසර් වීරට හරියට කතා කරන්න ඉගෙන ගන්න..."

මොන හේතුවක් නිසා හරි, විනය කමිටුවට පුළුවන් වෙලා තිබ්බ රයන් ගැන මගෙ තිබ්බ ආකල්ප වෙනස් කරන්න. ඒ හින්දම මට පුළුවන් වෙලා තිබ්බ මට හිතෙන දේ මිනිහට තදින් කියන්න. වෙනදට මිනිහ අහන්න අකැමැති දේවල් පවා කියල දාන්න... රයනුත් වෙනදට වගේ ඒවට වාද කරගෙන, එකට එක කියාගෙන ආවෙ එහෙම නෑ!

"කමක් නෑ හරී..." ප්‍රොෆෙසර් වීරා හිනා වෙවී කිව්ව. "මට තේරුම් ගන්න පුළුවන් රයන්ගෙ තත්ත්වෙ... මිනිහට දැන් හැම ප්‍රොෆෙසර් කෙනෙක්වම සැකයි. ඒත් මේක තමයි ඔයාලගෙ එකම චාන්ස් එක... අනික ඔයාල මේ පරීක්ෂණේ වැඩ කරල,

මේක ඉහළින්ම සාර්ථක වුණොත්, කොම්පැනියක් වුණත් ඉදිරිපත් වෙන්න බැරි නෑ ඒක ස්පොන්සර් කරන්න..."

"රයන්... ප්‍රොෆෙසර් වීරා කියන දේ හරි... අනික අපිට මේක ඔයා නැතුව කරන්න බෑ... මේක ඔයාගෙ ප්‍රොජෙක්ට් එක..."

"ඔයාල කියන්නෙ අපි මේක කරමු කියලද?" රයන් ඇහුව.

"ඔව්..." ආලෝකයි මායි එකටම කිව්ව.

"හරි... හැබැයි එක කොන්දේසියක් උඩ..." රයන් කිව්ව.

"මොකක්ද?" ප්‍රොෆෙසර් වීරා ඇහුව.

"ඔය ඉතුරු කජු බර්ෆි ටික මට ඕනෙ!!"

කාමරේ ඇතුළෙ හිනාව පිපිරුව.

"හරි... එහෙනං හෙට දහයට මගෙ ලැබ් එකට එන්න... අපි හෙටම පටන් ගමු..." ප්‍රොෆෙසර් වීරා කිව්ව.



# 24

## ඇති යන්තං!

නේහා...! හැමදාම රෑට මගෙ නින්ද වළක්වන නම! ඇත්ත... මගෙ ඉංජිනියරින් ඩිග්‍රි එකට කෙළවුණා... ඇත්ත... අපි ප්‍රොෆෙසර් වීරගෙ ලැබ් එකට වෙලා ඔහේ එක එක තෙල් ජාති මික්ස් කර කර හිටිය! ඇත්ත... මගෙ ග්‍රේඩ් ෂීට් එකේ තියෙන දේවල්වල හැටියට මට හොඳ ජොබ් එකක් ලබා ගන්න තියෙන චාන්ස් එක නැති වුණා...! මේ ඔක්කොම ඇත්ත... ඒත් මේ එකක්වත් නිදි දෙව්දුව මගෙ තුරුලට එන එක වළක්වන තරමෙ ප්‍රබල කාරණා වුණේ නෑ! හරිනං අපිට මාස හතරක නිවාඩුවක් හම්බ වුණ එකේ, පරණ ඇරියසුත් අල්ලල නිදා ගන්න ඕන තරම් වෙලාව තිබ්බ. ඒත් මේ ලෝකෙ ඉන්න එකම එක්කෙනෙකුගෙ සුවඳ, කටහඬ, රූපෙ, හැඟීම්, ස්පර්ශය මට නින්ද එන එක වළක්වල තිබ්බ!! නේහා!!

මං එකොළොස් වෙනිද එයාට කෝල් කළා. විනාඩි දෙකෙන් එයා තිබ්බ. මං ඒ වගේ දෙයක් කරාවි කියල එයා කවදාවත් හිතුවෙ නැලු. එයා මං ගැන ගොඩක් බලාපොරොත්තු තියාගෙන ඉඳල තියෙනව.

මං එවෙලෙම එයාට ආපහු ගත්තෙ, එයාගෙ නම ගැවුණේ කොහොමද කියන සම්පූර්ණ කතාව එයාට කියන්නයි. ඒක මගේ අදහසක් නෙවෙයි කියන්නයි. මට ඒක නොකර බැරි වුණා කියන්නයි.

"මිනිස්සු කවුරුත් එකයි... එයාල කරන්නෙ එයාලගෙ වාසියට අපිව පාවිච්චි කරනව... ඔයා කළෙත් ඒකයි... ඔයත් මාව යූස් කළා..."

"මිනිස්සු??" එයා මිනිස්සු කී දෙනෙක් එක්ක ආශ්‍රය කරල තියෙනවද එහෙම කියන්න? එක්කො එයා ටීවී එකේ යන තුට්ටු දෙකේ ටෙලිනාට්‍ය තොගයක් බලනව ඇති! ඒවයෙ තමා ඔහොම ඒව තියෙන්නෙ.

මං පහුගිය ටිකේ වෙච්ච දේවල් මතක් කළා. නේහගෙන්, චෙරියගෙ ඔෆිස් එකේ යතුර ගන්න පුළුවන්ය කියන බූරු අදහස ගෙනාවෙ මං! මං එහෙම කිව්වෙ කඹ ආල වහලෙන් බහිනවට වඩා ඒක ලේසි නිසා. මං එහෙම නොකියන්න රයන් වෙනින් ක්‍රමයක් හොයා ගන්නව ෂුවර්. ඒව විස්තර කරන්නත් එක්කල තමයි මං එයාට කතා කරන්න ට්‍රයි කළේ. කොහොම වුණත් මං දන්නෙ එකයි. ඒ තමයි මං තාමත් එයාට පිස්සෙක් වගේ ආදරේ කරන බව!

"ඔයා මොකද කළේ? ඔයා කිව්ව විනය කමිටුවට මං ඔයාට යතුර දුන්න කියල... ඔයා දන්නවද තාත්ත තාම ඒක විශ්වාස කරනව..."

ෂා... ඒකටනං මට ඇති වුණේ සතුටක්. චෙරිය තාම ඒක විශ්වාස කරනවයි කියන එක. බැරි වෙලාවත් ඔය කට්ටිය දැන ගත්තොත් අපි යතුරු ඩුප්ලිකේට් කළා කියල, අපිව නියම අපරාධකාරයන්ගෙ ගොඩට වැටෙනව! ඇත්තටම බැලුවොත් අපි ඒ ගොඩට වැටිලයි ඉන්නෙ. නමුත් ඒක නෙවෙයි කාරණාව. ඇයි කෙල්ලන්ට මේව තේරුම් කරල දෙන්න මෙච්චර අමාරු? වෙච්ච දේ අවබෝධ කරගන්න බැරිද එයාට? එහෙම නැත්තන් මං එයා අහන්න කැමති විදිහට බොරු හදල කියන්නද ඕනෙ?

"නේහා... මං දන්නව ඒක වැරදි බව... ඒත් ඒ වෙලාවෙ මං නෙවෙයි එතන හිටියෙ. ඔයාගෙ හරි නෙවෙයි. මට එවෙලෙ ඒක නොකර බැරි වුණා..."





මං දන්නව මම ඒ කිව්ව කතාවෙ මෙලෝ තේරුමක් නැති බව. ඒත් කෙල්ලන්ට කියන්න ඕනෙ ඔය වගේ අප්‍රහංස කතා තමයි. එතකොට එයාල ඒවට අහු වෙනව!

"ඇයි... ඒ... ඇයි?" නේහා ඇහුව.

"අනේ මන්ද... මට ඒක කියන්න තේරෙන්නෙ නෑ... මට එක පාරක් ඔයාව හම්බ වෙන්න බැරිද?" මං ඇහුව.

"බෑ... ඒව ඉවරයි... ඒව අමතක කරන්න..."

එයා ෆෝන් එක තිබ්බ. මං දිගින් දිගටම එයාට ගත්තත් එයා ෆෝන් එක අරන් පැත්තක තියල තිබ්බ. එදා මුළු දවසම එහෙමයි. එතකොට මං දැන ගත්ත මට ඊළඟට එයාට කතා කරන්න වෙන්නෙ ඊළඟ එකොළොස් වෙනිද කියල. ඒ කියන්නෙ තව මාසෙකින්. ඒ කියන්නෙ තවත් නිදි නැති රැයවල් තිහක්!

දවස් තිහක් ගෙවුණ.

මං එදා උදේ දහයට විතර නැඟිට්ටෙ. මූණ කට හෝදගෙන, ඇඳගෙන මං කාමරෙන් පිට වුණා. මං කොහොමද කතාව පටන් ගන්නෙ? ඒක හිත හිතා පඩිපෙළ බහිද්දි තමයි, මට උඩට නඟින තරමක වයසක ඇන්ටි කෙනෙක් හම්බ වුණේ. 'කාගෙ හරි අම්ම කෙනෙක් වෙන්න ඇති.' මං හිතුව. ඒත් මට එක පාරටම ඒ මූණෙ පොඩි හුරුකමක් තිබ්බ. මං ආයෙ කල්පනා කළා. මළසේක... ආලෝක්ගෙ අම්ම! මං දඩිබිඩි ගාල හැරිල, එයාව ඉස්සර කරල ආපහු හැරුණ.

"හලෝ ඇන්ටි... මාව අඳුරන්න බැරිද? මං හරී..."

"ආ ඔව්... ඔව් දැන් අඳුර ගත්ත. කොහොමද ඔයාල...? ආලෝක් මාස දෙකකින් ගෙදර ආවෙ නෑ. ඒකයි බලන්න ආවෙ..." ඇන්ටි හති දදා කිව්ව.

"අ... අ... මේ... ආලෝක් පොඩ්ඩක් බිසී ඇන්ටි. එයා ප්‍රොජෙක්ට් එකකට වැඩ වගයක් කරනවනෙ. ඒකයි..." මගෙ ඔළුවෙ තිබ්බෙ ඇන්ටි, ආලෝක්ව හම්බ වීමෙන් වළක්ව ගන්නෙ කොහොමද කියන එකයි.

"එයාලගෙ තාත්තත් ඉන්නව පහළ ඔටෝ එකේ... එයාට එන්න කියන්නකො. අපි බය වෙලයි හිටියෙ."

"හ... හ...රි ඇන්ටි... හරි..." මං පණ කඩාගෙන උඩට දිව්ව. ආලෝක් ඇඳේ හේත්තු වෙලා සඟරාවක් බල බල, පෝප්කෝර්න් කකා හිටිය. ඊට එහායින් රයන් වාඩි වෙලා සෙක්ස් සඟරාවක් බල බල සිගරැට් එකක් බිබී හිටිය. මුළු කාමරේම සිගරැට් දුමින් පිරිල තිබ්බ. හරියට රබර් රොටි පුච්චන දුම් ගෙයක් වගේ.

"පිස්සුද මන්ද.. උදේ පාන්දරම සෙක්ස් මැගසිනුයි... සිගරැටුයි..." මං කිව්ව.

"මොකද ඔච්චර නළියන්නෙ? මොකද ඔය එක පාරටම සුචරිතවාදියෙක් වෙලා?" රයන් ඇහුව.

"ආලෝක්... ඔයාගෙ අම්මල ඇවිත්."

"මොනව...?" කලබල වෙච්ච පාර මිනිහගෙ අතේ තිබ්බ පෝප්කෝර්න් ටිකත් බිම වැටුණ.

"ඔව්... ඔයාගෙ අම්ම පඩිපෙළ නැඟන් එනව... ඔයා කෝල් එකක්වත් දුන්නෙ නෑ කියල එයාට තද වෙලා ඉන්නෙ..."

"ඔයා කියන්නෙ එයා මෙහෙට එනව කියලද?" ආලෝක් ඇහුවෙ අත් දෙකෙන් කාමරේ පිරිල තිබ්බ සිගරැට් දුම පිහ දාන්න උත්සාහ කරන ගමන්.

"ඔව්... දැන් ඉතින් එයාල දකියි ඔය ඇටකටු කැඩිච්ච එහෙම" මං කිව්ව.

"මළා... මළ කෙළියයි..."

"ඔයා ඇඳේ හාන්සි වෙන්න... බෙඩ්ෂීට් එකක් පොරව ගන්න... එතකොට කකුල් පේන්නෙ නෑ." රයන් යෝජනා කළේ සෙක්ස් මැගසින් එක ආලෝක්ගෙ මෙට්ටෙ යටට ඔබන ගමන්.

"ඒක හරියන්නෙ නෑ... ආලෝක්ගෙ තාත්ත පහළ ඔටෝ එකේ... මෙයාට එතනට එන්නලු..." මං කිව්ව. මං හිමින් සීරුවෙ





එතන තිබ්බ පොප්කෝර්න් කන්න ගත්ත. 'මුන් දෙන්නට ටිකක් ගිනි පත්තු වුණාම දඟලන හැටි බලන් ඉන්න ලස්සනයි' මං හිතුව.

"මළා... මළා... මළා..." ආලෝක් නාහෙන් අඬන්න ගත්ත.

"තව මළේ නෑ කොල්ලො... බලන් ඉන්නකො..." මං හිත යටින් හිනාවෙවී කිව්ව.

හරියටම ඊට විනාඩියකට පස්සෙ තමයි ආලෝක්ගෙ අම්ම දොරට ගැහුවෙ. විනාඩියකට එච්චර වැඩ ගොඩක් කරන්න පුළුවන් බව එදයි මං දැන ගත්තෙ. මාරයි... රයන් ඇෂ්ට්‍රේසුයි, සෙක්ස් මැගසින්ස් ටිකයි, වොඩ්ක බෝතලුයි හැංගුව. මේසෙ උඩ පොත් ටික හදල, සමහර ඒව දිග ඇරල, පෑනත් දැන් ලිය ලියා හිටිය විදිහට පොතක් උඩින් තිබ්බ. කිලුටු ඇඳුම් ඔක්කොම, දැනටමත් රෙදි එළියට පනින්න දඟලන අල්මාරියකට එබුව! මං දොර ඇරිය!!

"ආනේ අම්මෙ පුදුමයි අම්ම ආව එක..." ආලෝක් කිව්ව.

"එපා... ඕනෙ නෑ මා එක්ක කතා කරන්න. ඔයා අපිව එහෙම පිටින්ම අමතක කළා..." ආලෝක්ගෙ අම්ම කිව්වෙ එයා ගෙනාව රසකැවිලි පෙට්ටි මේසෙ උඩින් තියන ගමන්. 'ඒක දැම්ම කෑවොත් මොකද?' මට හිතුණ.

"මේ දවස්වල හරියට වැඩ අම්මෙ. හෙලවෙන්න විදිහක් නෑ..." ආලෝක් කිව්ව. ඒක හරි... මිනිහට හෙලවෙන්නවත් බෑ තමා!

"කට වහන්න... මාස දෙකක් වුණා අන්තිම කෝල් එක දීල... අක්කගෙ මඟුල කැඩුණු එක ගැන කතා කරන්නයි අන්තිම කෝල් එක ගත්තෙ. එදායින් පස්සෙ ඔයාගෙන් සද්දක්වත් නෑ... මොකෝ... ඔයාට අපේ ප්‍රශ්න කතා කරන එක වදයක් වුණාද?" ආලෝක්ගෙ අම්ම නෝක්කඩු වැලක් කියවගෙන ගියා.

"නෑ අම්මෙ... අපිට ප්‍රොෆෙසර් වීරා එසයින්මන්ට්ස් තොගයක් දුන්න. හුස්ම ගන්නවත් වෙලාවක් නෑ..." ආලෝක් කිව්ව.

'ඒක හරි ඇන්ටි... මූට හුස්ම ගන්නවත් බැරුව තමා හිටියෙ... අයි.සී.යූ. එකේ. බට ආල, ඔක්ෂිජන් දීල...' මං හිතෙන් කිව්ව.

"පව්... මෙයා සෑහෙන්න මහන්සි වෙනව වගේ..." ආලෝක්ගෙ අම්ම ඒකනං කිව්වෙ බොක්කෙන්මයි. අපි දිහා බල බල. "ඔයාල ඉඳල හිටල හරි පොඩි විවේකයක් ගන්න. තව ඉතින් ටික කාලයයිනෙ... ඊට පස්සෙ හොඳ රස්සාවල් හම්බ වුණහම මහන්සි ඇරගන්න බැරුවයෑ...?"

රයනුයි මායි බොහොම විනීත විදිහට හිනා වුණේ මේසෙ උඩ තියෙන ස්වීට් බොක්ස් දිහා බලාගෙන. අනේ ඇන්ටි "කන්න" කියන්නකො...!

"ආලෝක් ඔයා ඊළඟ සති අන්තෙ ගෙදර එන්න ඕනෙ... හරිද? බලන්න තාත්තත් ඔයා හින්දම මෙච්චරක් දුරක් ආව ට්‍රයිෂෝ එකේ..."

"ඇහ්... ත්‍රීවීල් එකකද ආවෙ...? ගෙදර ඉඳන්ම...? අපරාදෙ සල්ලි..."

"නැත්තන් මොකද කරන්නෙ? තාත්තව ගේන්නෙ කොහොමද? ඒත් ඉතින් තව ටික දවසකින් ඔයා රස්සාවක් කරනවනෙ." ආලෝක්ගෙ අම්ම කිව්ව. ඕන්න ඊට පස්සෙ තමයි ආලෝක්ගෙ අම්ම මා දිහාට හැරුණෙ.

"හරී... ඔය ලඩ්ඩු කන්නකො. මම ගෙදරමයි හැදුවෙ."

එයා ඒක කියල ඉවර කරන්නත් කලින් රයනුයි මායි ඒකට පැනල ඉවරයි.

"ඒත් අම්මෙ අපරාදෙ..." ආලෝක් කිව්ව.

"නවත්ත ගන්න..." එයා බෑග් එකකින් ජීන්ස් එකක් එළියට ගත්ත. "මේ... අක්ක ඔයාට ජීන්ස් එකක් එව්ව. එයා ඉතුරු කරගත්තු සල්ලිවලින්..."

"ආනේ... එයාට කියන්න මං තෑන්ක් කළා කියල. මේක මං තියා ගන්නව විශේෂ වෙලාවකදි අඳින්න."





"හරි... කමක් නෑ... පොඩ්ඩක් ඇඳල බලන්න හරිද කියල...? නැත්තන් අරන් ගිහින් මාරු කරගත්තහැකි..." ආලෝක්ගෙ අම්ම කියපි!

"ආ...ම්... ඌ...ම්... මං පස්සෙ ඇඳල බලන්නංකො..." ආලෝක් බහ් බහ් ගගා කිව්ව.

"නෑ... නෑ... කම්මැළිකම නැතුව නැඟිටින්න. නැත්තන් මාරු කරගන්න බැරි වුණොත් අපරාදෙ... ඒ ළමය මහන්සියෙන් ඉතුරු කරපු සල්ලි." ආලෝක්ගෙ අම්ම කිව්වෙ නිකන් නෙවෙයි, බෙඩ්ෂීට් එකෙන් වැහිල තියෙන කකුලක් හොල්ල හොල්ල. ඒකෙදිනං ආලෝකයට රිදෙන්න ඇති. ආයෙ දෙකක් නෑ!

"පස්සෙ අම්මෙ..." ආලෝක් මූණ වොර කරන්, දත් විකාගෙන කිව්ව!

"නැඟිටින්න... නැඟිටින්න... හ්ම්..." ආලෝක්ගෙ අම්ම බෙඩ්ෂීට් එක පැත්තට ඇදල දාපි!

කෙළිය! කකුල් දෙකේම උඩ ඉඳන් පහළටම වගේ ප්ලාස්ටර් ආල. පතුල හරියෙ ප්ලාස්ටර් නැති වුණත් දොස්තරල දාපු මැහුම් ඕන පොට්ටයෙකුට පේනව. නිකන් පත්තෑයො ගියා වගේ! ඒ දර්ශනේ මුලින්ම දකින ආලෝක්ගෙ අම්මට නෙවෙයි, ඇකල පුරුදු අපිටත් හිත අවුල් වෙන දර්ශනයක්!

"දෙයි හාමුදුරුවනේ... හහ්..." ආලෝක්ගෙ අම්ම හීල්ලුව හීල්ලිල්ලක්. අත් දෙක කම්මුල්වලට ආව.

"අම්මෙ මේ අහන්නකො..." ආලෝක් එයාව අස්වසන්න හැදුව.

ආලෝක්ගෙ අම්මට නිකන් කලන්තයක් වගේ ආව නිසා රයන් එයාව වත්තන් කරන් පුටුවක වාඩි කළා. මං එයාට වතුර වීදුරුවක් දුන්න.

"මොකක්ද මේ වෙච්චි විනාසෙ...? අනේ දෙයියනේ... කියනවලකො කවුරු හරි."

රයන් මා දිහා බැලුව. අපි දෙන්නම කාමරෙන් ගියානම් හොඳයි වගේ!

"අපි පහළට යනව ඇන්ටි. අංකල්ව පොඩ්ඩක් බලන්නං."

ආලෝක්ගෙ අම්ම ඔළුව වැනුව. එයාගෙ ඇස්වල කඳුළු පිරිල. අනේ මන්ද එයාලගෙ පවුලෙ පිරිමින්ට කකුල් දෙකෙන් හිටන් ඉන්න බැරි ඇයි කියල?

"කලබල වෙන්න එපා අම්මෙ... එදා රෑ ස්කූටරෙන් යද්දි පොඩි ඇක්සිඩන්ට් එකක් වුණා..." අපි කාමරේ දොර වහද්දි ආලෝකය ගජබින්නාලංකාරය ඇන්ටිට දිග අරිනව අපිට ඇහුණා. මටනං හොඳ විශ්වාසයක් තිබ්බ ආලෝකය ඇදබාන්නෙ බේගල්ය කියන එක ඇන්ටිට තේරෙන බවට. ස්කූටර් ඇක්සිඩන්ට්! හඃ... එතකොට මටයි, රයන්ටයි හීරීමක්වත් නෑ... ඇන්ටි එච්චර මෝඩ නෑ...! කොහොම වුණත් පැය භාගෙකට විතර පස්සෙ එයා කාමරෙන් එළියට ආවෙ කඳුළු පිහ පිහ. අපි ට්‍රයිෂෝ එක ළඟට වෙලා ආලෝක්ගෙ තාත්ත එක්ක කතා කර කර හිටිය. එයා හිටියෙ බොහොම සතුටෙන්. ඉඳල හිටලනෙ එයාට මේ වගේ එළියට එන්න හම්බ වෙන්නෙ. ඒ නිසා වෙන්න ඕනෙ.

"ආලෝක්ට සෑහෙන වැඩ... නේ?" එයා ඇන්ටිගෙන් ඇහුවෙ ඇන්ටි එතනට එනවත් එක්කමයි.

"ඔව්... මොකක්දෝ ලොකු ප්‍රොජෙක්ට් එකක්." එයා ඇඳුම් නවත්තගෙන ත්‍රීවීලරේ වාඩිවෙන ගමන් කිව්ව.

"බායි ඇන්ටි..." අපි එයාට අත වැනුව.

"අපි කෙළින්ම දැන් ගෙදර නේද යන්නෙ මැඩම්..." ත්‍රීවීලර් ඩ්‍රයිවර් ඇහුවෙ ලීවරේ උඩට ඇද ඇද ඒක ස්ටාර්ට් කරන ගමන්.

"නෑ... ඊට කලින් අපි මැකෑනිකලං ඉංජිනියරින් ඩිපාට්මන්ට් ඔෆිස් එකට යන්න ඕනෙ."

"ඇන්ටී...!" මායි, රයනුයි එකම ස්වර පරාසයකින් කෑ ගැහුව!





"පුතෙක් හංගන්න හැදුවත් අම්ම කෙනෙක්ගෙන් ඒව හංගන්න බෑ... මට ගෙදර යන්න කලින් ප්‍රොෆෙසර් වීරව හම්බ වෙන්න ඕනෙ...!" ආලෝක්ගෙ අම්ම ස්ථිර හඬකින් කිව්වෙ, ත්‍රීවීල් එක ස්ටාර්ට් වෙද්දිමයි!

"එයා දැන ගනියි... එයා හැම දේම දැන ගනීවි..." මං රයන්ගෙ උරෙස්සෙන් හොල්ල හොල්ල කිව්ව.

"ඔහේ දැන ගත්තාවෙ. ඒකට එයාට අයිතියක් තියෙනව..." රයන් මගෙ උරෙස්ස වටේ අතක් දා ගත්ත.

ආලෝක්ගෙ අම්ම ගියාට පස්සෙ අපි දෙන්න සඝී එකට ගියා උදේට කන්න.

"මං අද නේහට කතා කරන්න ඕනෙ..." මං කිව්ව.

"එයා තාම ඔයා එක්ක තද වෙලාද ඉන්නෙ?" රයන් ඇහුව.

"මාසෙකට කලින්නං එහෙමයි... ඊට පස්සෙම කතා කළේ නෑනෙ... ඔයා හිතන්නෙ එයාට මං නැතුව පාළු ඇතිද?"

"අනේ මන්ද...?" රයන් එහෙම කිව්වෙ සාක්කුවෙන් ලියුම් කවරයක් අදින ගමන්. එතකොටම වේටර් පරෝටා ගෙනාව. රයන් ලියුම් කවරෙ මේසෙ උඩින් තියල පරෝටා එකක් කෑලිවලට ඉරන්න ගත්ත.

"ආලෝකය නැතුව මෙතන ඇවිල්ල කන එක හරි අමුතුයි... ඇයි ඉතින් අපිට කිසි හදිස්සියක් නෑනෙ..." රයන්, ආලෝක්ගෙ පරෝටා ගිලීමේ වේගය මතක් කරන ගමන් කිව්ව.

"මොකක්ද ඔය ලියුම? ගෙදරින්ද?" මං ඇහුව.

"ඒ වගේ... දැන් එයාල ඉන්නෙ ලොස් ඇන්ජලිස්වලද කොහෙද...?" රයන් කිව්වෙ කිසිම ගානක් නැතුව.

"කොච්චර කාලෙකට සැරයක්ද එයාල ඔයාට ලියන්නෙ?"

"මුලින්ම සුමානෙකට සැරයක් ලිව්ව... ඊට පස්සෙ ඒක සුමාන දෙක වුණා... දැන් එන්නෙ මාසෙකට එකයි."

"ඔයා උත්තර යවනවද?"

"නෑ... කුරියර් කරල අතටම හම්බවෙන එකකට විතරයි. ඒකත් කුරියර් කරන එකා උත්තරයක් අරන් යන්න බලන් ඉන්න හින්දයි."

"ඇත්තටම මොකක්ද ඕකේ තේරුම රයන්? එයාල එහෙ ඉඳන් සල්ලි හොයල, ඔයාට කැමති කැමති විදිහට වියදම් කරන්න එවනව. එහෙව් එකේ මොකෝ ඔයා එයාලව පෙන්නන්න බෑ වගේ හැසිරෙන්නෙ? මොකෝ ඔයා එයාලට ඔච්චර විරුද්ධ?"

"මං එයාලට විරුද්ධ නෑ... මං වෙනස්... ඒ මගෙ හැටි වෙන්න ඇති. මට තව පරෝටා එකක් ඕනෙ."

"ට්‍රැක් පනින්න එපා. එහෙම වෙන්නෙ කොහොමද? ඔයා එයාල එවන ලියුම් ඔක්කොම එකතු කරනව... මං දන්නව... මං දැකල තියෙනව. ඔයාගෙ වොඩ්ක කබඩ් එකට එහායින් ලියුම් සීයක්, දෙසීයක් ගොඩ ගහල තියෙනව..."

රයන් පරෝටා හපන එක ටිකකට නැවැත්තුව.

"ඒක ඔයා හිතනවට වඩා සංකීර්ණයි. මං ඒ ගැන කතා කරන්න කැමති නෑ..."

"ඒ කියන්නෙ ඔයා මට ඒ ගැන කියන්න කැමති නෑ...?"

"එයාල හරි අමුතුයි. මං බෝඩිමෙන් ආවට පස්සෙ එයාලට කිව්ව අපි එකට ඉමු කියල... ඒත් පිටරවල් එක්කල එයාලගෙ තියෙන බිස්නස් හින්ද ඒක වුණේ නෑ. එයාලට නිතරම එහෙ මෙහෙ යන්න වෙනව... ඉතින් මාත් ඒ විදිහට හැඩ ගැහුණා. මට සල්ලි හම්බ වෙනව... එයාල බිස්නස් කරනව... ඔහොම තමයි."

"ඔයා එයාලට විනය කමිටුව ගැන කිව්වද?" මං ඇහුව.

"පිස්සුද...?" රයන් කිව්ව.

"ඔයාටත් පුළුවන් ඒ බිස්නස් එකට ජොයින් වෙන්න. අයි.අයි.ටී. එකෙන් පස්සෙ ජොබ් එකක් හොයා ගන්න අමාරුවක් වෙන්නෙනං නෑ ඔයාට."





"ඒකනං වෙන්නෙ නැති දෙයක්..." රයන් කිව්වෙ අත් දෙක පිහ දදා. "කවදාවත් නෑ... පරෝටා කඩයක් දා ගත්තත්, පාරෙ මුට්ට ඉස්සුවත් ඒකටනං ජොයින් වෙන්නෙ නෑ."

"ඒක මාර වැඩක්නෙ... එයාල ඔයාගෙ දෙමවුපියොනෙ..."

රයන් මා දිහා බැලුවෙ නිකන් කුණු මාළු කෑල්ලක් දිහා බලනව වගේ... "තෑන්ක් යූ අවවාදෙට... මං යනව කාමරේට... ඔයා නේහත් එක්ක කතා කරගන්න..."

"රයන්... ඔයාගෙ ප්‍රොජෙක්ට් එක සාර්ථක වෙන්න ඔන්න මෙන්න තියෙන වෙලාවක ඔයාට ඒක අත් ඇරල දාන්න පුළුවන්ද?"

"මොකක්?"

"මං අහපු එකට උත්තර දෙන්නකො..."

"අයි.අයි.ටී. එකේදි මං කරපු හොඳම වැඩේ එච්චරයි. ඒක තමයි මගෙ ආඩිය මහන්සිය... මගෙ ලේ... මගෙ කඳුළු... බෑ... කොහොමටත් මං ඒක කරන්නෙ නෑ. මට ඒක කරන්න බෑ..."

"ඒ වගේම තමයි ඔයාගෙ අම්මටයි තාත්තටයි එයාලගෙ බිස්නස් එක... එයාලගෙ ප්‍රොජෙක්ට් එක තමයි ඒක..." මං එහෙම කියල නැඟිට්ට.

රයන් එයාගෙ ලියුම අරන් එහාට ගියා.

"රයන් ඕකට උත්තර ලියන්න..." මං පාරෙ මේ පැත්තෙ ඉඳන් කෑ ගැහුව.

රයන් ලියුම එයාගෙ සාක්කුවට ඔබා ගන්නව පෙනුණා.

★

කතා කරන්නෙ නේහා බව සීයට සීයක් ෂුවර් වුණත් මං සුපුරුදු ප්‍රශ්නෙම ඇහුව. "නේහා... ඔයාද?"

එයත් මගෙ කෝල් එක බලාපොරොත්තුවෙන් හිටිය බව මට තේරුණත්, එයා ඒ වගක් නොඇඟවයි කතා කළේ. "ආ... හරිද...?"

"ඔයා තියන්න කලින් මට දෙයක් කියන්න පුළුවන්ද?" මං බොහොම විනීත විදිහට ඇහුව.

"මං තියන්නෙ නෑ... මොනවද ඔයාට කියන්න තියෙන්නෙ...?"

"නේහා... මට ඔයා නැතුව පාළුයි... මං ඔයාට ආදරෙයි... අපි දෙන්න කොච්චර ළං වෙලා හිටියද? ඒත් මං ඒ ඔක්කොම විනාස කර ගත්ත. මට ඕනෙ වුණේ ඔයාගෙ තාත්තගෙ කෝර්ස් එකට A එකක් ගන්න. මං හිතුව එතකොට එයා මං ගැන පැහැදේවි කියල... එයාගෙන් හොඳ නමක් ගන්නයි මට ඕනෙ වුණේ. ඒ අස්සෙ තමයි ඔපරේෂන් පෙන්ඩියුලම් කියන මැටිමෝල් අදහස අපේ ඔළුවලට ආවෙ. ඊට පස්සෙ අර විනය කමිටුව ඇවිත් අපේ ජීවිත විනාස කළා... දැන් ඔයත් මාත් එක්ක කතා කරන්නෙ නෑ..." මගෙ කටහඬ එන්න එන්න කෙඳිරීමකට ළං වුණා.

"හරි...?"

"ඇයි...?"

"මටත් ඔයා නැතුව පාළුයි..." නේහා අඬනව මට ඇහුණා.

මටත් හයියෙන් අඬන්න ඇත්නම් කියල මට හිතුණා. ඒත් එයා කියපු දේවල්වලින් මගෙ හිතට ආවෙ සන්තෝසයක්. මං මාත් එක්කම හිතෙන් පහක් දා ගත්ත.

ඒත් මං මගෙ සන්තෝසෙ නොපෙන්න ඉන්න උත්සාහ කළා. සීරියස් පිට ඉන්න... සීරියස් පිට ඉන්න... මං මටම කියා ගත්ත.





"නේහා... අඬන්න එපා..." එහෙම කිව්වත්, ඇත්තටම මට ඕනෙ වුණේ එයා තවත් අඬනව අහන්නයි. කොල්ලෙක් නැතුව පාළුයි කියල කෙල්ලෙක් අඬනව අහන් ඉන්න එක ඒ කොල්ලට ගෙනත් දෙන්නෙ මාර සන්තෝසයක්.

"මට බෑ හරී... මට ඔයාව අමතක කරන්න බෑ... ඇයි ඔයා ඒ වගෙ දෙයක් කළේ?"

හ්ම්ම්... එන්න එන්න එයාගෙ කතාවෙ සැර බාල වෙනව. ඒක හොඳ ප්‍රගතියක්. ඉස්සෙල්ල එයා අහ අහ හිටියෙ, "කොහොමද ඔයා ඒ වගෙ දෙයක් කළේ?" කියල. දැන් ඒක "ඇයි ඔයා ඒ වගෙ දෙයක් කළේ?" කියන තැනට ඇවිත්. මට ඒවට උත්තර තිබ්බ. ඒත් ඒ හැම එකක්ම වක්කඩ කැඩුව වගේ එක පාරටම කියාගෙන යන එක හරි නෑ.

"මම ඔයාට ඔක්කොම විස්තරේ කියන්නම්. මාව හම්බ වෙන්න පුළුවන්ද? විනාඩි දහයකට?" මං ඇහුව.

"එහෙම හම්බ වෙන්න ඕනෙද අපි? තාත්ත මගෙන් දිවුරුම් පිට දිවුරුම් ගත්ත ආයෙ ඔයාව හම්බ වෙන්නෙ නෑය කියල."

ඉතින් කොහොමද ඒ වගෙ කතාවකට උත්තර දෙන්නෙ? තාත්තට දීපු දිවුරුම කඩන්න පුළුවන් හැටියක් ගැන මං කල්පනා කළා. ඒත්... ම්හු... මොකුත් ඔළුවට ආවෙ නෑ.

"මට ඔයා නැතුව බෑ... පාළුයි..." මං කිව්ව. මොනව හරි ගැන සැකයක් තියෙද්දි එහෙම දෙයක් කියන එක තමයි හොඳ.

"මටත් ඔයා නැතුව පාළුයි..." එයා ටිකක් වෙලා නිහඬව හිටිය. "ඔයාට පුළුවන්ද දෙක වෙනකොට අපේ අයිස්ක්‍රීම් ස්පොට් එකට එන්න?"

"ෂුවර්... හැබැයි එක කොන්දේසියක් පිට...!" මං කිව්ව.

"මොකක්ද?" එයා ඇහුවෙ කුතුහලයෙන්.

"මේ පාර ස්ට්‍රෝබෙරි නොකා ඉමුද...? මං ආසයි චොකලට්වලට."

"ෂටප් හරී..." එයා හිනාව තද කරගන්න හැදුවත් ඒක කරගන්න බැරි වුණා. හරී... වැඩේ හරී... එයා හිනා වුණා කියන්නෙ ආයෙ පරණ විදිහමයි. මං ෆෝන් බූත් එක ඇතුළෙ පොඩි රංගනේකුත් දැම්ම. එළියෙ ඉඳල මාව දැක්ක එවුන් හිතනව ඇති මට ලොතරැයියක් ඇදුණ කියල. ඇති යන්තං...!

"ඕකේ... එහෙනං දෙකට හම්බ වෙමු." මං කිව්ව. මං ෆෝන් මැෂින් එකට දාපු පහේ කාසිය මිහිරි නාදයක් නඟාගෙන මැෂින් එක ඇතුළෙන් ගමන් ගත්ත. ෂඃ... රුපියල් පහක් වියදම් කරන්න තියෙන සුන්දරම විදිහ!

★

නේහා මා එක්ක පැය දෙකක්ම අයිස්ක්‍රීම් තිප්පොළේ හිටිය. ආවෙ විනාඩි දහයකට කියල! ඒත් ඊට වඩා දොළොස් ගුණයක් එයා හිටිය. පැය දෙක ගෙවෙද්දි මං එයාට සෑම සියලු දෙයක්ම කියල ඉවරයි! කොහොමටත් එයාට වැඩි වෙලාවක් අප්සෙට් මූඩ් එකේ ඉන්න බැරි වුණා. මං හිතන්නෙ චොකලට්වලට අමතරව මම ස්ට්‍රෝබෙරිත් ගෙන්නපු හින්ද වෙන්න ඇති. එහෙමත් නැත්තන් මාව හම්බ වෙච්චි සන්තෝෂෙට වෙන්නත් පුළුවන්. තවත් සුමානෙකට පස්සෙ එතනදිම හම්බ නේන අපි තීරණේ කළා. එතකොට තමයි අපි දෙන්නටම හොඳටම තේරුණේ, "කවදටද අපි ඊළඟට හම්බ වෙන්නෙ" කියන පරණ පුරුද්දට අනුගත වෙලාය කියන එක. ඒ කිව්වෙ සියල්ල යථා තත්ත්වෙට පත් වෙලා!

ඒ වෙද්දි අපි ප්‍රොෆෙසර් වීරගෙ ලැබ් එකේ දවසට පැය අටක් වැඩ කරමිනුයි හිටියෙ. සමහර වෙලාවලදි ඒක පැය දහය දොළහ තරම් දික්වෙච්ච වෙලාවල් තිබ්බ. රයන් ඊටත් වඩා වැඩ කළා. පැය ආසයක් විතර! මිනිහ, මිනිහගෙ ස්කූටරේ පරීක්ෂණ වෙනුවෙන්ම පූජා කළා කිව්වොත් තමයි හරි. ඒක කෑලි කෑලිවලට





ගලවනව... ආයෙ හයි කරනව... එක එක තෙල් දානව... දුවනව... ඔය වගේ. ආලෝකය තවත් මාස ගාණක් කිහිලිකරුවලින් ගිහින්, කොර ගගහ පයින් යන තත්ත්වෙට දියුණු වුණා. අපේ දෙවෙනි ප්‍රපෝසල් එක සෑහෙන්න සාර්ථකයි කියල ප්‍රොෆෙසර් වීරා හිටියෙ සතුටෙන්. එයා නිතරම ඩීන්ට අපේ ප්‍රොජෙක්ට් එකේ ප්‍රගතිය වාර්තා කළා. එයා කොයි වෙලාවකවත් අපිට ඕනැවට වඩා බලාපොරොත්තු දුන්නෙ නෑ. ඒත් අපි දැනගෙන හිටිය මේ පරීක්ෂණ සාර්ථක වුණොත් අපිට පොඩි චාන්ස් එකක් තියෙන බව. සෙමෙස්ටර් එක ඉවර වෙන්න සුමානයක් තියෙද්දි අපි අපේ ප්‍රොජෙක්ට් එකේ අන්තිම සැලසුම ප්‍රොෆෙසර් වීරට බාර දුන්න. පිටු දෙසීයයි. මං, රයන්, ආලෝක්... තුන් මෝල්ලුන්ගෙ නිර්මාණයක්!

"ෂඃ... තඩි ප්‍රපෝසල් එකක්නෙ..." ප්‍රොෆෙසර් වීරා කිව්ව.

"මේකෙ ඔක්කොම තියෙනව... අ යන්නෙ ඉඳන් අඃ වෙනකල්ම..." රයන් කිව්ව.

"මට හිතා ගත්තැකි... ඇත්තටම මේක සාමාන්‍ය ප්‍රපෝසල් එකකින් එහා ගිය එකක්..." ප්‍රොෆෙසර් වීරා ඒකෙ පිටු පෙරළ පෙරළ කිව්ව. "විශ්වාස කරන්නත් බෑ මාස හතරක් ගියා කියල."

"ඔව් සර්... අපිටත් එහෙමයි... ආයෙත් අපිට ක්ලාස් යන්න වෙලාව හරි..." මං කිව්ව.

"මේ පාරනම් බැහැල කරනව සර්... පිස්සු නැටිලි ඉවරයි..." ආලෝක් කිව්ව.

"සර්... දැන් මොකක්ද ඊළඟට වෙන්නෙ?" රයන් ඇහුව.

"මං මේක ඔක්කොම කියවනව. හදන්න එහෙමට කියල ලොකු වරදක් නැත්තන් මෙහෙමම ඩීන්ට සබ්මිට් කරනව... ගුඩ් ජොබ්... ඊළඟ සෙමෙස්ටර් එක පටන් ගන්න කලින් තුන්දෙනාම හොඳ විවේකයක් එහෙම ගන්න..."

"සර්... සර් දවසක් කිව්ව විදිහට ප්‍රොජෙක්ට් එක හින්ද අපිට ලකුණු ටිකක් හම්බ වෙයිද සර්?" ආලෝක් ඇහුව.

"ඉන්නකො ඉවසල... ඔක්කොම රඳා පවතින්නෙ ප්‍රපෝසල් එකේ සාර්ථකත්වය උඩ. ඕනැවට වඩා බලාපොරොත්තු තියා ගන්න එපා. ඒ වගේම බලාපොරොත්තු නැති කරගන්නත් එපා. පොඩ්ඩක් ඉන්නකො..." ප්‍රොෆෙසර් වීරා කිව්ව.

මාස තුනක් මැරිගෙන කරපු ප්‍රපෝසල් එක ප්‍රොෆෙසර් වීරගෙ ඔෆිස් එකෙන් තියල, අපි එළියට ආව. ඒක හරි ගියා හරි නැතා හරි අපි අපේ උපරිමෙන් ඒක කෙරුව. ඒ සතුට අපි ළඟ තිබ්බ. තව සුමානෙකින්, ඒ කිව්වෙ ජනවාරි 5 වෙද්දි අන්තිම සෙමෙස්ටර් එක පටන් ගන්නව. ඊට දවස් හයකට පස්සෙ ඒ කිව්වෙ 11 වෙනිද මං නේහව හම්බ වෙනව. එදා මුළු දවසම එයා ෆ්‍රී. එදාටත් එයා මට එහෙ එන්න කිව්වොත්!



# 25

## ලියුම් එක්ක දවසක්

අන්තිම සෙමෙස්ටර් එක පටන් ගන්න දවස අපිට දැනුණෙ අපි කැම්පස් ආව පළවෙනි දවසෙදි දැනුණු හැඟීමමයි. අටට තිබ්බ පන්තියට අපි නැඟිට්ටෙ හයට! රයන් නාලා කරලා ඊට පස්සෙ විනාඩි විස්සක් විතර කොණ්ඩෙ පීරුව.

එහෙම කරලත් අපි පන්ති පටන් ගන්න කලින්ම හෝල් එකට ගියා. එදා තිබ්බෙ ප්‍රොෆෙසර් සක්සේනාගෙ 'ශීතකරණ හා වායුසමීකරණ' පන්තිය. එයා සීනියර් ප්‍රොෆෙසර් කෙනෙක්. ඊළඟ අංශ ප්‍රධානිය වෙන්න පෝලිමෙ ඉන්න කෙනා! එහෙම වෙන්න ඉතින් එක්කො චෙරිය පෙන්ෂන් යන්න ඕනෙ... නැත්තන් මැරෙන්න ඕනෙ...! ඒ දෙකෙන් මුකුත්ම සිද්ධ වුණේ නැති නිසා එයා තාම අන්තිම අවුරුද්දෙ ළමයින්ට එක එක ජාති කුල් කරන හැටි උගන්න උගන්න ඉන්නව. හෝල් එකට ඉස්සෙල්ලම ඇවිත් හිටියෙ අපි! හැබැයි ඒ වෙද්දි ප්‍රොෆෙසර් සක්සේනත් හෝල් එකට ඇවිත් හිටිය.

"ඕ... එන්න... එන්න..." ප්‍රොෆෙසර් සක්සේනා කිව්ව. "මේකනං ටිකක් පුදුම හිතෙන වැඩක්... කවුද හිතන්නෙ ෆයිනල් ඉයර් ස්ටුඩන්ට්ස්ල වේලාසන ලෙක්චර්ස්වලට ඒවි කියල?"

ප්‍රොෆෙසර් සක්සේනා කිව්ව කතාව හරි. අන්තිම අවුරුද්දෙ ඉන්න එවුන් වැඩිය උනන්දු වෙන්නෙ ජොබ් ඉන්ටර්විව්වලට යන්න ලෑස්ති වෙන්නයි. එම්.බී.ඒ. ඇඩ්මිෂන් ලෑස්ති කර ගන්නයි.

අපිනං මේ පාර අන්තිම අවුරුද්දෙ ශිෂ්‍යයන්ව ඉල්ලල තියෙන කොම්පැනි මොනවද කියල බලන්නවත් උනන්දු වුණේ නැහැ. ඒ මොකද, අපිට මොනව වෙයිද කියල අපිම දැනගෙන හිටියෙ නැති නිසා!

"ගුඩ් මෝනින් සර්..." රයන් කිව්ව. අපි ඉස්සරහම පේළියෙ වාඩි වුණා. අපි පන්තියක වාඩි වුණේ මාස හතරකට පස්සෙ! කළු ලෑල්ල පවා අපිට පෙනුණෙ මහා වස්තුවක් විදිහට. පන්තිය පටන් ගන්නෙ කොයි වෙලාවෙද කියල මං වෙලාව බල බල හිටියෙ.

"මොනවද ඔයාලගෙ නම්?" ප්‍රොෆෙසර් සක්සේනා ඇහුව.

"මට ඔය නම් ටික අහල පුරුදුනෙ..." අපි අපේ නම් කිව්වට පස්සෙ එයා කල්පනා කර කර කිව්ව. නළලත් රැලි කරගෙන තමයි එයා කල්පනා කළේ.

"සර්... අපි විනය කමිටුවට ආව... සර්රුත් ඒකෙ හිටිය..." රයන් එයාගෙ මතකෙ අලුත් කරන්න උදව් කළා.

"ආ...හ්... හැබැම නේන්නං... වෙරියන්ගෙ කේස් එක නේද? ඒ කියන්නෙ ඔයාල මාස ගාණකට පස්සෙ ආව පළවෙනි ක්ලාස් එක මේක වෙන්න ඕනෙ. එහෙම නේද?"

අපි බොහොම හැදිච්ච විදිහට ඔළුව වැනුව.

"හ්ම්... හරි... හරි... ඉතින් දැන් කොහොමද ඔයාලගෙ තත්ත්වෙ? ඔයාලට වෙලාවට උපාධිය ගන්න පුළුවන් වෙයිද?" ප්‍රොෆෙසර් සක්සේනා ඇහුව. එයා එහෙම ඇහුවෙ ඇත්තටම අපි ගැන සැලකිල්ලෙන්ද, එහෙමත් නැත්නම් වෙලාව කා දැමීමේ උපක්‍රමයක් හැටියටද කියන එක ගැන මට ස්ථිර අදහසක් තිබ්බෙ නෑ.

"සර් අපිට තව ග්‍රේඩ්ස් මදි සර්... මේ සෙමෙස්ටර් එකේ අපිට කරන්න තියෙන කෝර්ස් ගාණත් වැඩියි..." ආලෝක් කිව්ව.

"කෝර්ස් කීයක් තියේද ඔයාලට මේකෙදි කවර් කරන්න?"

"කෝර්ස් හයක් සර්..."





"ඕහ්... මේකෙ ෆයිනල් ඉයර් කරන ගොඩක් දෙනෙකුට කරන්න තියෙන්නෙ කෝර්සස් දෙකයි! ඒකටවත් එයාල ක්ලාස් එන්නෙ කලාතුරකින්. ඔයාල මුළු දවසම ක්ලාස් එකේ ඉන්නවද?"

"ඔව් සර්... අපිට වෙන විකල්පයක් නැනෙ..." මං හිඟන්නෙක් වගේ කිව්ව.

"ඔයාල වෙරියන් එක්කල කතා කළාද ග්‍රේඩ්ස් ගැන?" ප්‍රොෆෙසර් සක්සේනා ඇහුව.

"ප්‍රොෆෙසර් වීරා අපි වෙනුවෙන් කතා කරනව සර්..."

"හ්ම්ම්... මොනව වුණත් මේවයෙ සිස්ටම් ටිකක් දරුණුයි. දැන් බලන්න ඔයාල... ඔයාලට ඔයාලගෙ අඩුම රිසල්ට්ස්වලින් වුණත් ජොබ් එකක් හොයා ගන්න තිබ්බ. මේ පාර සොෆ්ට්වෙයාර් කොම්පැනීස් ගොඩක් අපෙන් ෆයිනල් ඉයර්ස්ලව ඉල්ලල තියෙනව. ඒත් විනය කමිටු තීරණේ ඔයාලගෙ උපාධිය, අනාගතේ විනාශ කරලයි තියෙන්නෙ."

ඊළඟ මිනිත්තු පහ, දහයෙදි තව ටික දෙනෙක් පන්තියට ඇදුණා. මේ කෝර්ස් එක කරන්න තිහක් රෙජිස්ටර් වෙලා හිටියත් පන්තියෙ හිටියෙ දහදෙනයි! මට අපේ පරණ සෙමෙස්ටර්ස් මතක් වුණා. දෙවෙනි, තුන්වෙනි සෙමෙස්ටර්වලදිත් අපි ඒව කට් කරපු හැටි මට මතක් වුණා. ඒත් දැන්...? එක තප්පයරක්වත් අහක දාන්න අපිට ඕන වුණේ නෑ.

"හරි... අපි දැන් තර්මොඩයිනමික්ස්වල තුන්වෙනි නියමය ගැන කතා කරමු..." ප්‍රොෆෙසර් සක්සේනා බෝඩ් එක පැත්තට හැරුණා.

ඊළඟ පැය ඇතුළතදි ප්‍රොෆෙසර් කියපු හැම වචනයක්ම මායි, රයනුයි, ආලෝකයි ලියා ගත්තෙ හරිම භක්තියෙන්.

★

අන්තිම සෙමෙස්ටර් එකේදි මට සුමාන දෙක තුනක් නේහව හම්බ වුණා. ජීවිතේ පළවෙනි වතාවට මට එයාව හම්බ වෙන්න වෙලාවක් හදා ගන්න දඟලන්න වුණා. එසයින්මන්ට්ස්, මඟ ඇරුණු සටහන්, පාඩම් කිරීම් ඉහටත් උඩින් තිබ්බ. අපිට වෙලා තිබුණු දේවල්වල හැටියට එකම කෝර්ස් එකක්වත් ෆේල් වෙන්න ඉඩක් නෑ. ඒ වගේම අයි.අයි.ටී. එකෙන් ඇන්වත් ගන්න පුළුවන් හැම දෙයක්ම හූරල, මිරිකල, උරල ගන්න එකයි අපේ එකම අරමුණ වෙලා තිබ්බෙ. ඒත් නේහා කියන්නෙත් මගේ ජීවිතේ වැදගත්ම කාරණාවක්. ඒ හින්ද එසයින්මන්ට් එකකුත් කරල ඉවර වෙලාම මං නේහව හම්බ වෙන්න අපේ අයිස්ක්‍රීම් තිප්පොළට ගියා.

"විනාඩි විස්සක්...! ඔයා විනාඩි විස්සක් පරක්කුයි. ඔයා ඒක දන්නවද?" නේහා පිම්බ.

"සොරි බබා... මට එසයින්මන්ට්..."

"මං අද කලින් යන්න ඕනෙ... මහප්පලගෙ පවුලම එනව ඩිනර්වලට... හහ්... මොකෝ මේ එක පාරටම එසයින්මන්ට්ස්වලට කැපවෙලා?" එයා ඉණට අත් දෙක තියාගෙනම ඇහුව.

"ආයි වරද්දගන්න බෑ... ඒකයි. මං ඔයාට අයිස්ක්‍රීම් එකක් ගන්නද?" මං ඇහුව.

"ඕනෙ නෑ. එපා...! මං ඔයා එනකල් එකක් කාලයි ඉන්නෙ! අනික රෑටත් කන්න වෙනව... එයාලටත් අයිස්ක්‍රීම් ගෙනාව... ඒකටත් වඩා මං හදන්නෙ අඩු කරගන්න...!"

"අඩු කරගන්න? මොනවද?" මං ඇහුව.

"මගෙ බර!" එයා කිව්ව.

"ඇත්තට? ඒ මොකෝ? ඔයා ඔය ලස්සනට ඉන්නෙ?"

"මං මොනවද අනේ? ඔයා බලන්න ඕනෙ අපේ කොලේජ් එකේ ඉන්න කෙල්ලො... ඒක නෙවෙයි... ඔයාගෙ විස්තර කියන්නකො..."





"ලෙක්චර්ස්... ලෙක්චර්ස්... උදේ අටේ ඉඳන් හවස හය වෙනකල්. ඊට පස්සෙ පැය තුනක් ලයිබ්‍රරි... ඊට පස්සෙ පැය දෙකක් විතර එසයින්මන්ට්ස්... රිවිෂන්... මට පිස්සු හැදිල ඉන්නෙ...! ඒත් මොනව කරන්නද? මෙච්චර මැරිල නෑ කොයි කාලෙවත්..."

"අර දෙන්න? එයාල කොහොමද?"

"මට වගේම තමා... පාඩම් වැඩ ඔළුවටත් උඩින්... තාම අපිට ග්‍රේඩ්ස් මදි..."

"අර ඔයාලගෙ තිබ්බෙ සීටුඩී කියල එකක්...? ඒක මොකද වුණේ?"

"පිස්සු වැඩ... ඒව එහෙම හරියන්නෙ නෑ නේහා. දැන් මට උතුරන්න වැඩ තියෙන එක ඇත්ත... ඒත් දැන් මං මොනව හරි ඉගෙන ගන්නව. සීටුඩී එකෙන් එහෙම දෙයක් නෙවෙයිනෙ වුණේ..."

"වාව්... කොල්ල දියුණු වෙලා තියෙන තරම්..." නේහා හිකි හිකි ගාන්න ගත්ත. දඟකාර විදිහට. ඒක හොඳ ලකුණක්.

"දැනුම කියන දේ ලබා ගන්න පුළුවන් එතකොටයි. නැතුව එසයින්මන්ට් කොපි කරන එකෙන් නෙමෙයි. අනික අර පිස්ස... රයන්... මිනිහ කියන හැම දේම අහපු කාලෙත් දැන් ඉවරයි..."

"එළ... එළ... ඔයා මාර පොරක් වෙලානෙ දැන්...!"

මං මුකුත් නොකිය එයාගෙ ඇස් දිහා බැලුව. ඒ සැණෙන් මං දඩස් ගාල නැඟිටල එයාව කිස් කළා.

"හරී..." නේහා තක්බීර් වුණා. "පිස්සුද ඔයාට...? මේ මිනිස්සු මාව දන්නව..."

"මාර පොරවල් එහෙම තමා..."

"හ්ම්... ඔයානං මාර බඩුවක්... ඒක නෙවෙයි මේ බලන්න..." නේහා එයාගෙ හෑන්ඩ් බෑග් එකෙන් කොළයක් ගත්ත.

"ඔය අයියගෙ ලියුම නේද?"

"ඔව්... එයාගෙ අන්තිම ලියුම... මට ඕනෙ ඒක ඔයා තියා ගන්න..."

"ඈත්... ඒ මොකෝ?" මාර තැග්ගක්නෙ අප්පා!

"අනේමන්ද... තාත්ත දැන් මාව තඹ ගතේකට විශ්වාස කරන්නෙ නෑ... දැන් එයා හිටපු ගමන් ඇවිත් මගෙ කාමරේ අවුස්සනව. මේක එයාට අහු වෙනවට මං කැමති නෑ."

"ඇත්තද? දැන් එයා ඔයාට වද දෙනවද?" මං ඇහුව.

"වද දෙනව කියන්නෙ එහෙම නෙවෙයි. හැම දේටම ඇහැ ගහගෙන ඉන්නෙ. මං එයා එක්ක වැඩි කතාවට යන්නෙ නෑ... ආ... මං අහගෙනයි ඊයෙ පෙරේදා එයා ඔයාල ගැන කතා වෙනව!"

"මොනව? කවදද? කා එක්කද?"

"මං කියන්නං... මේ ලියුම තියා ගන්නවද කියන්න...?"

"ඒක කියන්නත් දෙයක්යැ... මං තියා ගන්නං. අර විස්තරේ කියන්න..."

"ඩීන් ශාස්ත්‍රී ආව එහෙ... එයාල ඔයාලගෙ ප්‍රපෝසල් එක ගැන කතා කරා..."

"ඉතින්... ඉතින්...?" මාව නළියන්න ගත්ත.

"ප්‍රොෆෙසර් වීරා දෙන්නටම කොපිය ගානෙ දීල... ඩීන් ශාස්ත්‍රීනම් ඒකට ගොඩක්ම පැහැදිලයි ඉන්නෙ."

"එතකොට ඔයාගෙ තාත්ත? එයා මොකද කිව්වෙ?"

"මං හිතන්නෙ නෑ ඔයා ඒක අහන්න කැමති වෙයි කියල...!"

"නෑ ඔයා කියන්නම ඕනෙ..." මං කිව්වෙ කෑ ගහල වගේ. අනේ ඇත්තටම කෙල්ලන්ට බැරි මොකද කියන දෙයක් එක පාරට කෙළින් කියන්න?





"එයා කිව්ව ඒක ඕකේ වගේ පේනවය... ඒත් ඔයාල ගැන විශ්වාසයක් තියන්න බැරිය කියල... මෙහෙමයි කිව්වෙ..." නේහා, චෙරිය වගේ රඟපාන්න වුණා.

"ඩීන් ශාස්ත්‍රී... එයාල එක පාරක් හොර කළා. තව පාරක් හොර කරන එක එයාලට මහ දෙයක් නෙවෙයි... කවුද දන්නෙ එයාල ඕකෙ තියෙන කරුණු කාරණත් කොහෙන් හරි හොරකම් කරපුවද කියල? එයාලට ඕනෙ ඕකෙන් ලකුණු දාගෙන ගොඩ යන්න... ඕං ඔහොමයි එයා කිව්වෙ..." නේහා කිව්ව.

"විකාර... පට්ටපල් බොරු... ඒකෙ තියෙන ඒව අපේම දේවල්... ඔයාම දන්නවනෙ අපි කොච්චර මහන්සි වුණාද කියල ඒකට?"

"මං දන්නව... ඒත් මං කිව්වෙ එයා කියපු දේ... ඩීන් ශාස්ත්‍රී කිව්ව එයා තව ටිකක් මේ ගැන හිතල බලන්න ඕනෙ කියල..."

මං නේහා දීපු ලියුම මේසෙ උඩ දිග ඇරිය. සමීර්ගෙ අන්තිම වචන ටික! එයාව අයි.අයි.ටී. එකට තල්ලු කරගන්න චෙරියගෙ තිබ්බ ආශාව හින්ද, එයාට ඒක කර ගන්න බැරි හින්ද එයා මරණෙ තෝර ගත්ත! කෙනෙකුගෙ ඇඟ උඩින් කෝච්චියක් යනකොට කොච්චර අමාරු ඇතිද?

"මට ස්ට්‍රෝබෙරි අයිස්ක්‍රීම් ලීටර් හතරක් දෙන්න..." මට පිටිපස්සෙන් කටහඬක් ඇහුණ.

"ඕ... චෙරියන් සහීබ්... අද ගෙදර පාටියක් වගේ ආ...?" කවුන්ටරේ හිටිය කොල්ල කියාපි!

"ඔව්... අපේ නෑදෑයො වගයක් එනව ඩිනර් එකට... එයාල කැමතියි මේවට..."

දෙයියනේ... චෙරිය! මාව හීතල වෙලා ගල් වුණා. හරියට අයිස්ක්‍රීම් ෂොප් එකේ ෆ්‍රිජ්වල ආල තියෙන අයිස්ක්‍රීම් වගේ! නේහත් එහෙමමයි. අපි හිටියෙ හරියටම මිනිහගෙ කෙළින් අනික් පැත්තෙ. නැගිටල යන්න විදිහකුත් නෑ. කරන්න තිබ්බ එකම දේ

තමයි, මිනිහගෙ ඇස් ඒ පැත්තට නොහැරේවා කියල දෙයියන්ට කියන එක! ඒත් මේ චෙරිය්! මාර මීටරේ!! කවුන්ටරේ තිබ්බ වීදුරු කබඩ් එකෙන් දැකපු සේයාව මිනිහට හොඳටම ඇති.

"නේහා!" මිනිහ අපේ පැත්තට හැරුණා. මිනිහගෙ සද්දෙට මං හිතුවෙ මුළු අයිස්ක්‍රීම් පාලර් එකේම අයිස්ක්‍රීම් දිය වුණායි කියල!

නේහ සද්ද නැතුව හිටිය. මං හෙල්ලෙන්නෙ නැතුව හිටිය. මං අන්තිමට චෙරියව දැක්කෙ විනය කමිටුවෙදි. ආයෙත් පාරක් මිනිහ මාව විනාශ කරාවිද? මං තාම මගෙ අයිස්ක්‍රීම් එකවත් කාල නෑ.

චෙරිය ඇවිත් මගෙ එහා පැත්තෙන් වාඩි වුණා. මගෙ හදවත ගැහෙන්න ගත්තෙ හරියට මගෙ ඇඟෙන් පැනල එළියට යන්න වගේ. එළියට පැනල අයිස්ක්‍රීම් ෂොප් එකෙනුත් එළියට පනින්න වගේ.

"හැහ්... පුදුම හයියක්නෙ තමුසෙට තියෙන්නෙ ඈ...? තක්කඩිය... පුදුම හයියක්නෙ තමුසෙට තියෙන්නෙ..." මිනිහ දෙපාරක්ම ඒක කිව්වෙ මාව කන්න වගේ මා දිහා බලාගෙන.

නේහා මොනවද කියන්න හැදුවත්, චෙරිය සංඥාවක් දුන්න එයාට කට වහගෙන ඉන්න කියල.

"සර්... නෑ සර්... ම්... ම්... මේ අහම්බෙන් මෙතනදි හම්බ වුණා සර්." මං තැටමුව.

"තමුසෙ මාව ගොනාට අන්දන්නද හදන්නෙ?" චෙරිය කිව්වෙ අතමිට මොළෝල මේසෙට ගහන ගමන්. මේසෙ උඩ දිග ඇරල තිබ්බ සමීර්ගෙ ලියුම උඩටයි අත පාත් වුණේ. මං හිතුව මිනිහ තඩි බාපු සැරට ලියුම ඉරුණාදෝ කියල. නේහටත් එහෙමම හිතුණ බව පැහැදිලි වුණේ ඊළඟට කියපු දෙයින්.

"තාත්තෙ බලාගෙන...!" එයා ලියුම උඩ තිබ්බ චෙරියගෙ අත එහාට තල්ලු කරන්න හැදුව.





"මොකක්ද මේ...?" චෙරිය අහපි!

නේහා අල්ලවල් දෙක විහිදවල ලියුම වහ ගත්ත.

"මොකුත් නෑ තාත්තෙ... මොකුත් නෑ..."

"මේක මොකක්ද මිනිහො...?" ඒ පාර මිනිහ මට රවන්න ගත්ත. "තමුසෙ මගෙ දුව ඇලේ දාගන්න ලියපු ලව් ලෙටර් එකක් නේ? මං කිව්ව නේද තමුසෙට එයාගෙන් ඈත් වෙලා ඉන්න කියල...? මං හිතන්නෙ තමුසෙට එක විනය කමිටුවක් මදි වගේ..."

"ඒක සමීර්ගෙ ලියුම" මම කිව්ව.

"හරී... කට වහගන්න..." නේහා කෑ ගැහුව.

මම දන්නෙ නෑ ඇයි කියල... මං ආපහු ඒක කියන්න ගියේ නෑ.

"මොකක්ද එයා කිව්වෙ?" චෙරිය නේහගෙන් ඇහුව.

නේහවත්, මමවත් කතා නොකර නිශ්ශබ්දව හිටිය.

"නේහා... ගන්නව අත අහකට..." චෙරිය නේහට රවල කිව්ව. නේහ අත්දෙක අහකට ගත්තෙ ඇස් දෙකෙන් ගලන කඳුළු වහ ගන්න. චෙරිය ලියුම අරන් නිශ්ශබ්දව කියවන්න වුණා.

චෙරිය බොහොම සන්සුන්ව ඒ ලියුම කියවන බවක් අඟවන්න හැදුවත් එයාගෙ වෙවුලන ඇඟිලියි, ඇස්වලට උනපු, ඒත් කඩා වැටුණෙ නැති කඳුළුයි ඒකට ඉඩක් දුන්නෙ නෑ. එයා ලියුම කියෙව්ව. ආයෙ කියෙව්ව. ආයෙත් කියෙව්ව. තවත් සැරයක් කියෙව්ව. එයා ගෙනාව අයිස්ක්‍රීම් දිය වෙන්න පටන් අරගෙන තිබ්බ. එයා කණ්ණාඩි දෙක ගැලෙව්ව. ඔව්... කඳුළු... අපේ අංශ ප්‍රධානියගෙ, මගෙ ජීවිතේට බරපතළ පහරක් එල්ල කරපු මනුස්සයගෙ ඇස්වල කඳුළු... ඇස් කෙවෙනිවලට රැස් වෙච්ච කඳුළු බිංදු දෙකක් වෙලා එයාගෙ කම්මුල් හරහා ගලා බැස්ස. මම වැලපෙන චෙරියන් පවුලට මැදි වෙලා, අන්දමන්ද වෙලා හිටිය.

මටත් ඒකට හවුල් වෙන්න තිබ්බ. ඒත් මං හිටියෙ එහෙම මූඩ් එකක නෙවෙයි. අනිත් එක අයිස්ක්‍රීම් ෂොප්ස් කියන්නෙ ඒ වගේ සාමූහික වැලපීම්වලට සුදුසු තැනක් නෙවෙයි.

"තාත්තෙ..." නේහා කඳුළු පිහදාල කතා කළා.

ඒ පාර චෙරිය වලහෙක් වගේ කඳුළු වක්කර වක්කර මහ හයියෙන් අඬන්න ගත්ත! චෙරිය වගේ ලොකු මිනිහෙක් එහෙම අඬනව දැකීම මට හරිම අමුතු අත්දැකීමක් වුණා. සාමාන්‍යයෙන් වෙන්නෙ එයාල අපිව අඬවන එකනෙ! දෙයියනේ... රයනුත් මෙතන හිටියනං!

"තාත්තෙ... ගෙදර යං..." නේහා නැගිට්ට.

චෙරියන් පූස් පැටියෙක් වගේ නේහට කීකරු වුණා. මං නේහගෙ අතට අයිස්ක්‍රීම් බෑග් දෙක දුන්නත් ඒ වෙද්දි ඒව හොඳටම වොර වෙලා තිබ්බෙ. චෙරියන් මං ඉන්නවද නැද්ද කියලවත් ගාණක් නැතුව සමීර්ගෙ ලියුම ඉඹ ඉඹ හිටිය.

එයාල අයිස්ක්‍රීම් ෂොප් එකෙන් පිටවුණා. මට ඊට ඉස්සෙල්ල නේහව ආපහු හම්බ වෙන දවස කතා කරගන්න බැරි වුණානෙ...! නේහා කාර් එක එළවගෙන ගියෙත් අඬ අඬා බව මං දැක්ක.

"සර්... ඔක්කොම අයිස්ක්‍රීම්වලට සර් නේද ගෙවන්නෙ?" කවුන්ටරේ කොල්ලා ඇහුව!

★

"ඔයා කියන්නෙ චෙරිය ඇඬුව?? ඇත්තටම කඳුළු පෙර පෙර ඇඬුව??" රයන් මගෙන් ඇහුවෙ මං කියපු දේ විශ්වාස නොකරන තාලෙට!

"ඇඬුව නෙවෙයි... වැලපුණා... අත් දෙකෙන් මූණ වහගෙන... යනකල්ම... ඒකෙන් කෙළවුණේ මටයි... මිනිහගෙ අයිස්ක්‍රීම්වලටත් ගෙවන්න වුණේ මටයි..."





"පාඩු නෑ පුතෝ... පාඩු නෑ... ආයෙ ඒකෙ රිපීට් ටෙලිකාස්ට් එකක් යනවනං මං ගෙවනව අයිස්ක්‍රීම්වලට..." රයන් කිව්ව.

"විහිළුවකට ගන්න එපා රයන්... ඒක මිනිහට දරා ගන්න බැරුව ඇති..." ආලෝක් කිව්ව.

"ඉතින් මගෙ මොකෝ? අපරාදෙ... මං හිටියෙ නැනෙ එතන ඔය සීන් එක දකින්න..." රයන් ආපහු විස්සෝප වුණා.

"අපි දැන් හෙට තියෙන එසයින්මන්ට්ස් ටික කරමුද?" මං යෝජනා කළා.

"අපේ ප්‍රපෝසල් එකට මොකෝ දන්නෑ වෙලා තියෙන්නෙ... නේද?" ආලෝක් ඇහුව.

"අනේ මන්ද... නේහනං කිව්ව චෙරිය තාම ඒකට උඩැල්ල දානව කියල... අපි ඊළඟ සුමානෙ විතර ප්‍රෆෙසර් වීරට කතා කරල බලමු.

"කොම්පැනීස් ගණනාවක් ඇවිල්ල මේ පාර... මං දැක්ක නෝටිස් බෝඩ් එකේ... ගොඩක් ඒව සොෆ්ට්වෙයාර් කොම්පැනීස්..." ආලෝක් කිව්ව.

"අපි දැන් ඒව බලන එකේ වැඩක් නෑනෙ... අපේ ග්‍රේඩ්ස් හම්බ වුණේ නැත්තන් අපිට ඒ ගැන හිතන්න වෙන්නෙ ලබන අවුරුද්දෙ..." මං එසයින්මන්ට් එකක් කරන්න කොළයක් ගන්න ගමන් කිව්ව.

මං එදා නිදා ගනිද්දි පාන්දර හතරයි. ලියුම කියවල ඇඬුම් බර වුණ ප්‍රොෆෙසර් චෙරියන්ගෙ මූණ හැම තිස්සෙම මගෙ ඉස්සරහපිට හොල්මන් කළා. ඇත්ත... ඒකෙ පිටින් බැලුවමනං පෙනුණෙ විහිළුකාර ගතියක්. එත් ඊට කලින් තියෙන දුක මට පෙනුණෙ. චෙරියන් වගේ ශක්තිමත් පෞර්ෂයක් තියෙන කෙනෙක් එහෙම වුණේ කොහොමද? නේහා එයාගෙ තාත්තව අඬ ගහගෙන ගිය විදිහ! එයා තාත්තට ගොඩක් ආදරෙයි...

ඒ වගේම වෙරියනුත් එයාගෙ පුතාට ආදරේ කරන්න ඇති. ගොඩක්! එයා සම්ර්ව මැරෙන්න තරමට වැඩ කළත්! හැම දෙමවුපියොම දරුවන්ට එහෙම ආදරේද? එතකොට රයන්? මිනිහ මිනිහගෙ දෙමවුපියන්ට ආදරේද? එයාල රයන්ට ආදරේද?

මං නින්ද පැත්තට ආල නැගිට්ට. හතරයි දහයයි. මට එක පාරටම ඕන වුණා ලියුමක් ලියන්න. උදේ වෙච්ච සිද්ධිය ඒකට බලපාන්න ඇති. මං කාමරෙන් එළියට ගිහින් කොම්පියුටර් රූම් එක පැත්තට ගියා. ඒක පැය විසිහතරෙම ඇරල. නිතරම කවුරු හරි ඉන්නව.

**ආදරණීය අම්මා හා තාත්තා වෙතටයි,**

මේ රයන්... ටයිප් කරල එව්වට තරහ වෙන්න එපා... අද රෑ මම මේක ලියන්නම ඕනෙ. මගෙ ජීවිතේට සිද්ධ වෙන දේවල් ගැන... ඒව ඔක්කොම හොඳ දේවල්නං නෙවෙයි... ඒත් මං ඔයාලට කිව්වෙ නැත්තන් වෙන කාටද මේව කියන්නෙ...?

මං පැය දෙකක්ම ඒක ලිව්ව... සමහර වෙලාවට මං තේරුමක් නැති දේවල් ලියන්නත් ඇති. ඒත් මං ගොඩක් දේවල් ගැන ලිව්ව. අපේ ග්‍රේඩ්ස් ගැන, විනය කමිටුව ගැන... ප්‍රොෆෙසර් වීරා ගැන... හිර වෙලා තියෙන අපේ ප්‍රොජෙක්ට් එක ගැන... තව මං ලිව්ව මාව එයාල ළඟින් තියා ගන්න තරමට, මට ආදරේ නොකිරීම ගැන... මං එවෙලෙ ඇනගෙන හිටිය රයන්ගෙ වේසෙන් මිනිහගෙ ජීවිතේ හැංගිච්ච රහස් පවා එයාලට ලියපු එක වැරදි බව! රයන් දැන ගත්තොත්නං මාව මරනව... දෙකක් නෑ. මං එළිවෙනකල් ලිව්ව. ඒ ලියුම හොඳටම ලියවුණු බවකුත් මට දැනුණා. ෂුවර් එකටම රයන්ට වඩා හොඳයි...! මං අන්තිමට ප්‍රින්ට් ගත්තමයි ඒකෙ දිග දැක්කෙ! පිටු දහයයි...!! රයන්ගෙ අත්සන ගහන එක සිම්පල්. අනික එයාලගෙ අම්මල කවදාවත් අත්සන් සංසන්දනය





කරල බලන තරම් දුරකට යන්නෙ නෑ... එයාලගෙ එඩ්‍රස් එක මං රයන්ගෙ කාමරෙන් හොයා ගත්ත. ඒක තැපැල් කරන්න මට රුපියල් තිහක මුද්දර ගහන්නත් වෙච්චි!

"කොහෙද ගියේ?" මං පාන්දර කාමරේට රිංගනව දැකපු රයන් ඇහුව.

"කොහෙවත් නෑ... පොඩි වෝක් එකක් ඇම්ම..." මං කිව්ව.

බොරු කියන එක වැරදිද?

# 26

## තාත්තෙක්

එදා ප්‍රොෆෙසර් සක්සේනාට හිතපු නැති වෙලාවක එයාගෙ පන්තිය නතර කරන්න සිද්ධ වුණා. පියන් කෙනෙක් ඇවිල්ල, එයාට මොකක්දෝ කොළ කෑල්ලක් දුන්න. ප්‍රොෆෙසර් සක්සේනා ඒක කියවල බලල පන්තිය පැත්තට හැරුණා.

"කවුද හරී... ආලෝක්... රයන්... කියන්නෙ?" එයා අපිව හොඳහැටි දැන දැනම, ඒ වගේම අපි තුන්දෙනා ඉස්සරහ පේළියෙ ඉඳගෙන ඉන්නව පෙනි පෙනීම ඇහුව.

අපි අත් ඉස්සුව.

"තුන්දෙනාම ප්‍රොෆෙසර් වෙරියන්ගෙ ඔෆිස් එකට යන්න... එයාට ඕනෑලු ඔයාලව දැන්මම!"

මං සන්සුන්ව ඉන්න උත්සාහ කළත් මගෙ පපුවෙ දෙමෝලෙන් පිටි කෙටුව. මොකටද මේ? අපේ ප්‍රොජෙක්ට් එක ඉවරයි කියන්නද? තව විනය කමිටුවක් දාන්නද? නේහට අයිස්ක්‍රීම් අරන් දුන්නයි කියල මාව පොලිසියට අල්ලල දෙන්නද? එයා ගත්තු අයිස්ක්‍රීම්වලටත් මං සල්ලි ගෙව්ව බව මතක් වෙලා ඒ සල්ලි ආපහු දෙන්නද? එහෙනං මොකටද රයනුයි, ආලෝකයි දෙන්නත් ඕන වෙන්නෙ? ඔය වගේ බහුබූත මගෙ හිත ඇතුළෙ පිනුම් ගහන්න ගත්ත. වෙරියන්ගෙ ඔෆිස් එක ළඟට ගියහම අපිට පෙනුණ මිනිහ දොරේ ලොක් එක මාරු කරල බව.





ඇතුළට ගිය අපිට පෙනුණෙ ප්‍රොෆෙසර් වෙරියන් එක්ක, ප්‍රොෆෙසර් වීරයි, ඩීන් ශාස්ත්‍රීයි වාඩි වෙලා ඉන්න හැටි. කවුරුවත් අපිට වාඩි වෙන්නයි කියල කිව්වෙවත් නෑ.

"ඔයාලගෙ ක්ලාස් එකට බාධා කළාට කනගාටුයි... ඒත් අපි තුන්දෙනාම මෙතන ඉන්න වෙලාවෙදිම ඔයාලට කතා කළොත් හොඳයි කියල අපි හිතුව..."

ප්‍රොෆෙසර්ස්ල එකට එකතු වෙනව කියන්නෙම වාතයක්! අපි තුන්දෙනා මීක් නොකිය කට වහගෙන හිටිය.

"ඔයාලා ප්‍රොෆෙසර් වීරත් එක්ක එකතු වෙලා කරපු ප්‍රොජෙක්ට් එකේ ප්‍රපෝසල් එක අපි අධ්‍යයනය කළා... ඒ වගේම ඔයාල ඒක කරල තියෙන්නෙ ඔයාලව සස්පෙන්ඩ් කරපු සෙමෙස්ටර් එකේදි...!" ඩීන් ශාස්ත්‍රී කිව්ව.

අපි ප්‍රොෆෙසර් වීරා දිහා බැලුව.

"ඔව් සර්... එයාලා මාස තුනක් මගෙ ලැබ් එකට වෙලා ඔය ප්‍රොජෙක්ට් එකේ වැඩ කළා." ප්‍රොෆෙසර් වීරා කිව්ව.

"ඒ වගේම ප්‍රොෆෙසර් වීරා ඇපීල් කරල තියෙනව, පහුගිය සෙමෙස්ටර් එකේදි ඔයාල පන්තිවලට නොගියෙ, පන්ති තහනම් කරපු හින්ද නෙවෙයි, මේ ප්‍රොජෙක්ට් එකේ වැඩ කළ නිසාය කියන කාරණාවට පිළිගැනීමක් දෙන්නය කියල... ඒක එහෙමද?"

අපි ප්‍රොෆෙසර් වෙරියන්ගෙ ඔෆිස් එකට ගියේ 'කිසිම දේකට කතා නොකර කට වහගෙනම ඉමුය' කියල තීරණයක් අරන්! ඩීන් ශාස්ත්‍රී ඇහුවෙ සරල, ඒත් වැදගත් ප්‍රශ්නයක් වුණත් අපි සද්ද නැතුව හිටිය. කට වරද්දගෙන තවත් බාල්දි පෙරළගන්න අපිට ඕන වුණේ නෑ!

"ඩීන් ශාස්ත්‍රීගේ ප්‍රශ්නෙට උත්තර දෙන්න..." ප්‍රොෆෙසර් වීරා කිව්වෙ නියෝගයක් දෙන කට හඬකින්.

"ඔව් සර්..." ආලෝක් කිව්ව.

මම ප්‍රොෆෙසර් වෙරියන්ගෙ ඇස් දිහා නොබලන්න ප්‍රවේසම් වුණා. ඒත් මිනිහගෙ නිශ්ශබ්දතාව අපිට ඇති කළේ හරිම දෙගිඩියාවක්. බයක්. ඇයි මේ ප්‍රධාන නළුව රඟපාන්නෙ නැත්තෙ?

"එතකොට ඔයාලගෙ ග්‍රේඩ්ස්වල ප්‍රශ්නෙ විසඳෙනව? ඔයාලගෙ ලකුණු මට්ටම හොඳ තත්ත්වෙකට එනව... එහෙමද...?"

අපි තුන්දෙනා මොක්කුද තුන්දෙනෙක් වගේ ඔළු ගෙඩි උඩටයි, පහළටයි හෙලෙව්ව.

"මේ වගේ කාරණාවලදි අන්තිම තීරණේ තියෙන්නෙ ඔයාලගෙ ඩිපාර්ට්මන්ට් හෙඩ් අතේ... ඒ වගේම ඔයාල දන්නව ඔයාල කරපු වරද සමාව දෙන්න බැරි තරමෙ වරදක් බව... ඒත් මේ වතාවෙ ප්‍රොෆෙසර් වෙරියන් කැමති වෙලා තියෙනව, ඔයාලව සස්පෙන්ඩ් කරපු සෙමෙස්ටර් එක, ඔයාලා රිසර්ච් එකක යෙදුණු සෙමෙස්ටර් එකක් හැටියට සලකන්න!"

"ං ඈහ්... මොනව??" අපි තුන්දෙනාට එකට කියවුණා. හොඳ ආරංචි පවා සමහරවිට ඇති කරන්නෙ කම්පනයක්!

"ඔව්... ප්‍රොෆෙසර් වෙරියන් ඒකට කැමති වුණා... ඔයාලගෙ ප්‍රොජෙක්ට් එක විශිෂ්ට වැඩක්... කන්ග්‍රැජුලේෂන්ස්...!" ප්‍රොෆෙසර් වීරා අපිට සුබ පැතුව.

මං පළවෙනි වතාවට ප්‍රොෆෙසර් වෙරියන් දිහා කෙළින් බැලුව. එයාගෙ මූණෙ කිසිම හැඟීමක් සටහන් වෙලා තිබ්බෙ නෑ. එයා හිටියෙ හරියට ඒ කාමරේ නොඉන්න කෙනෙක් ගානට! ගල් වෙලා!! මොකක්ද එයාට වෙලා තියෙන්නෙ? මිනිහ ජොයින්ට් එකක්වත් ගහලද? ඒ ඉන්න විදිහට මට හිතුණෙ එහෙමයි. මට ඕන වුණේ එකම දෙයයි. පුළුවන් තරම් ඉක්මනට එතනින් එළියට පැන ගන්නයි. ඔව්... ප්‍රොෆෙසර් වෙරියන් හිත වෙනස් කර ගන්න ඉස්සෙල්ල...!





"තැන්ක් යූ සර්... තැන්ක් යූ වෙරි මච්..." ආලෝක්ගෙ කට කණේ!

"තැන්ක් යූ සර්. දැන් අපිට යතහැකිද?" මං ඇහුව.

"ඔව්... අපිත් දැන් යනව..." ඩීන් ශාස්ත්‍රී කිව්වෙ පුටුවෙන් නැඟිටින ගමන්.

"කොහොමද ඔයාලගෙ සෙමෙස්ටර් එක...?" ඩීන් ශාස්ත්‍රී ඇහුව.

"හොඳයි සර්... අපිට තව ග්‍රේඩ් මාක්ස් මදි..." මං කිව්ව.

"මොනවටද මදි?" ඩීන් ශාස්ත්‍රී ඇහුව.

"සර්... අපිට ඩිග්‍රි එක ඉවර කරන්න කෝර්ස් ගාණ මදි... අවුරුදු හතරකදි... ඒ හින්ද අපිට ජොබ්ස්වලට ඇප්ලයි කරන්න බැහැ..." මං කිව්ව.

"ඒත් දැන් ඔයාල මේ සෙමෙස්ටර් එකේදි වැඩිපුර කෝර්ස් කරනවනෙ..."

"ඔව් සර්..." මං කිව්ව.

"ඒවත් ඔක්කොම තීරණේ වෙන්නෙ ඩිපාර්ට්මන්ට් ලෙවල් එකෙන්... ඒක තමයි කියන්නෙ අනවශ්‍ය කරදර ආ ගන්න එපා කියල..." ඩීන් ශාස්ත්‍රී එහෙම කියල පිට වෙලා ගියා.

ප්‍රොෆෙසර් වීරත් අපේ උරිස්වලට තට්ටුවක් දාල පිට වුණා.

"තැන්ක් යූ සර්..." මං ප්‍රොෆෙසර් වෙරියන්ට කිව්ව. මං එහෙම කිව්වෙ ඇයි කියල මමවත් දන්නෙ නැහැ. එයාගෙන් සමු ගන්න හොඳ වාක්‍යයක් හැටියට ඒක මගෙ හිතට එන්න ඇති සමහර විට!

"හරී... ඔයා ටිකක් ඉන්න..." ප්‍රොෆෙසර් වෙරියන් කියපි!

මාව උඩ ගිහින් බිම වැටුණා. ඉස්සර හිටපු වෙරියමද මේ?

"හරි සර්..."

ආලෝකයි, රයනුයි මා දිහා බැලුවෙ කුතුහලෙයන්. එහෙම බලන ගමන් එයාලා ඔෆිස් එකෙන් එළියට ගියා.

"වාඩි වෙන්න..." එයා, එයාගෙ මේසෙ ඉස්සරහ පුටුව මට පෙන්නල, නැඟිටල ගිහින් දොර ලොක් කළා.

ඇයි එයා මට ඉන්න කිව්වෙ? ඇයි දොර ලොක් කළේ? මාව මරයිද දන්නෑ...?

"ඉතින්, ග්‍රේඩ්ස් මාක්ස් මදි... ඈ...?" ප්‍රොෆෙසර් වෙරියන් කිව්ව. ඒ කියන්නෙ එයා ඔෆිස් එකේ වෙච්ච කතාබහ කන් දීගෙන ඉඳල තියෙන්නෙ...!

"ඔව් සර්..."

"හහ්... ඔයා දන්නවද මං ඔයාල ප්‍රොෆෙසර් වීරත් එක්ක පහුගිය සෙමෙස්ටර් එක පුරාවටම කරපු ප්‍රොජෙක්ට් එක ගැන අනුමැතියක් දුන්නොත් ඔයාලට ලැබ් මාක්ස් ටික ගන්න පුළුවන්..."

දැන් ඉතින් මොකක්ද ඒකෙ තේරුම? "අනුමැතිය දුන්නොත්...?" ඒ කියන්නෙ ප්‍රොෆෙසර් වෙරියට අපිට මතක් කරල දෙනවද අපේ ජීවිතවලට එයාගෙ තීරණ කොයි තරම් බලපානවද කියල? හරි... හරි... ඒක මං දන්නව සර්... මට ඕනෙ වුණේ මේ අවුරුදු හතරෙන් ගොඩ එන්න මාක්ස් ටිකක්... කමක් නෑ... අවුරුදු ගාණක් ගිහින් හරි මට මොකක් හරි ජොබ් එකක් ලැබෙයිනෙ...? දැන්වත් මට යන්න පුළුවන්ද? මං හිතුව.

"මොනවද ඔය හිතන්නෙ?" ප්‍රොෆෙසර් වෙරියන් ඇහුව. "මං කිව්වෙ මට පුළුවන් ඔයාලට ලැබෝරටරි මාක්ස් ටික ලබල දෙන්න. හැබැයි ඔයගොල්ලො මේ සෙමෙස්ටර් එකේදි ඒ ප්‍රොජෙක්ට් එකේ වැඩ කරන්න ඕනෙ... මං දන්නව දැනටමත් ඔයාලට වැඩ වැඩි බව!"





මොකක්? ඇත්තටම ප්‍රොෆෙසර් වෙරියන් ජොයින්ට් එකක් ගහලද? මොනවද මේ කියන්නෙ? මිනිහ අපිට ගොඩ යන්න පාරක් පෙන්නනව! අපිට ලකුණු දෙන්න හදනව!! එහෙම ලකුණු දෙනවනං ලැබ් එකේ නැවතිලා, පදිංචි වෙලා ප්‍රොජෙක්ට් එක ඉවර කරන්න වුණත් බැරුවයැ? ලන්ච් එකට ග්‍රීස් කාලා, ඔයිල් බොන්න බැරුවයැ?

"සර්... අපි... අපි කරන්නං සර්... අපි වෙලාව හොයා ගන්නං..." මං කිව්ව. මට කෙළ ගිලුණෙත් අමාරුවෙන්, ඒක කියන්න ගිහින්!

"ගුඩ්... මං ප්‍රොෆෙසර් වීරත් එක්ක කතා කරන්නං... බලමු එයාට දෙන්න පුළුවන් සහයෝගෙ මොකක්ද කියල...? ඔක්කොම හොඳට ගියොත් ඔයාලට අවශ්‍ය ග්‍රේඩ්ස් ටික ලබා ගන්න ලකුණු දෙන්න පුළුවන් වේවි!"

"ස... සර්... අ... අපි තුන්දෙනාටම? මටයි, ආලෝක්ටයි, රයන්ටයි තුන්දෙනාටම?" මං ඇහුවෙ කන්දෙක අදහ ගන්න බැරුව.

"ඔව්... නැතුව?" ප්‍රොෆෙසර් වෙරියන් කිව්ව.

"තැන්ක් යූ සර්..." මං නළලෙ ආඩිය පිහ දැම්ම. මේකනං හීනයක් වගේ!

"තැන්ක් යූ හරී...!" ප්‍රොෆෙසර් වෙරියන් කියපි!

මාව කරකවල අත ඇරිය! ෆුල් මඤ්ඤං!!

"මො... මොනවටද සර්..."

"නිකං... මොනවටවත් නෙවෙයි... මං හිතන්නෙ ඔයා දැන් ප්‍රොෆෙසර් සක්සේනගෙ ක්ලාස් එකට ගියොත් හොඳයි. ගිහින් ජොබ් ඉන්ටර්විව්වලට ලෑස්ති වුණොත් තවත් හොඳයි..." වෙරියන් කිව්ව.

ෂුවර්... ජොයින්ට්ස් ගහලම තමයි!!

"තැන්ක් යූ සර්...!" මං නැඟිට්ට.

"ආ... අනික..." ප්‍රොෆෙසර් වෙරියන් අමතක වෙච්ච දෙයක් මතක් වුණා වගේ කියන්න ගත්ත. "...ජොබ් ඉන්ටර්විව්ස්වලට ගියහමනං මගෙ වයිවාවලට ආවම වගේ හැසිරෙන්න එපා...!" ප්‍රොෆෙසර් වෙරියන් එහෙම කියල හිනා වෙන්න ගත්ත! මුලදි මං හිතුවෙ ඒක නෝන්ඩියට දාපු හිනාවක්ද කියල... නෑ... ඇත්තටම ඇත්ත හිනාවක්. මාත් ඒ හිනාවට එකතු වුණා.

"හරි සර්..." මං ඔෆිස් එකෙන් එළියට ආවෙ මෝලෙක් වගේ දත් තිස්දෙක විරිත්තන්!

★

විනය කමිටුවෙන් පස්සෙ අපි තීරණේ කරල තිබ්බ අපේ බීම ඉතාම අඩු කරන්න. ඒත් ප්‍රොෆෙසර් වෙරියන්ගෙ මේ වෙනස සැහෙන්න බොන්න ඕන ප්‍රශ්නයක්!

"දෙවෙනි බෝතලෙත් අරිමු..!" ආලෝක් කිව්ව. "රයන්... අද මමයි කියන්නෙ... අරිමු දෙවෙනි එකත්!"

"ඕ... ඕ... ස්ලෝලි... ස්ලෝලි පුතෝ... අපිට තව එසයින්මන්ට්ස් කරන්න තියෙනව. ලැබ් වර්ක් කරන්න තියෙනව... ජොබ් ඉන්ටර්විව්ස් යන්න කලින් ඒව කරන්න තියෙනව..."

"හරී... හ...රී මචෝ... උඹ කොහොමද ඒක කළේ?" ආලෝක්ට ඇනටමත් හොඳ ගණන්.

"මං මුකුත් කළේ නෑ... මං ඇත්තටම හිතුවෙ මිනිහට ඔළුව විකාර වේගෙන එනව කියලයි... නැත්තන් ජොයින්ට් එකක් ගහල කියලයි... ඒත් මිනිහ සිරාවටම කියන බව පස්සෙයි මට තේරුණේ..."

"ඔයානං යකෙක්..." රයන් කිව්වෙ ඇවිල්ල මාව බදා ගන්න ගමන්. මට හැබැයි ඔය බදා ගැනිල්ල එච්චර අල්ලන්නෙ නැති දෙයක්.





"මොකක්ද ඊළඟට තියෙන ඉන්ටර්විව් එක?" මං රයන්ව පැත්තකට තල්ලු කරල ඇහුව.

"හරි... මෙන්න මේකයි එහෙනං ඩීල් එක..." ආලෝක් ෆයිල් එකක් දිග අරින ගමන් කිව්ව. ඒකෙ පුරවල තිබ්බෙ එක එක කොම්පැනිවල පත්‍රිකා. "අපි පහයි පොයින්ට් ගාණක් ගත්තු එවුන්... ඒ හින්ද මේ ගොඩක් ඉන්ටර්විව්වලින් අපි හැලෙනව..."

"ඕන මඟුලක්... මොනවද හරියන ජොබ් තියෙන්නෙ..." රයන් ඇහුව.

"සොෆ්ට්වෙයාර් කොම්පැනි වගයක් තියෙනව... එයාල ඉල්ලල තියෙන සුදුසුකම්වලටනං අපිව ගැළපෙනව..." ආලෝක් කිව්ව.

"මං කැමතියි සොෆ්ට්වෙයාර්වලට." රයන් කිව්ව.

"කවදද ඉන්ටර්විව් එක?" මං ඇහුව.

"සුමාන තුනකින්... මොකද කියන්නෙ? තුන්දෙනාම දාමුද? කවුද දන්නෙ බැරි වෙලාවත් තුන්දෙනාම එකම කොම්පැනියකට අහු වුණොත්...?" ආලෝක් කිව්ව.

"මංනම් කියන්නෙ එහෙම වේවි..." මම ඇත්තටම එහෙම පැතුව.

"පහයි පොයින්ට් ගාණෙ එවුන්ට..." ආලෝක් වීදුරුව උඩට ඉස්සුව.

"චියර්ස්..." අපිත් වීදුරු උස්සල සච්දිය පිරුව.

★

උදේ හයයි එලාම් එක වදිද්දි. ඉන්ටර්විව් තියෙන දවස! ඒ මුළු සෙමෙස්ටර් එකටම උදේ වරුවෙ පන්ති තුන මිස් කරපු එකම දවස. පහුගිය සුමාන තුනේදිම අපි ප්‍රොෆෙසර් වීරගෙ ලැබ් එකේ

පණ නැහැගෙන වැඩ කළා. හරියටම බැලුවොත් අපි දවසට පැය දාහතරක් විතර වැඩ කරල තියෙනව!

ඒත් අද සොෆ්ට්වෙයාර් කොම්පැනිවල ඉන්ටර්විව් තියෙන දවස! අපි වගේ පහළ ග්‍රේඩ්ස් තියෙන එවුන්ට ජොබක් සෙට් කරගන්න තියෙන හොඳම අවස්ථාව!

"ඒයි... නැඟිටිනව... ඉන්ටර්විව්වලට ලෑස්ති වෙන්න නැද්ද?" මං ආලෝකයව නැඟිට්ටෙව්ව.

"වැඩේ හරියයිද?" ඒකා ඇඳේ ඉඳන්ම අහනව!

"කේන්දර බලන්නැතුව නැඟිටිනවකො... ඔහොම දපා තිබ්බොත්නං ඉතින් හරි යන්නෙ නෑ..." රයන් කිව්වෙ ආලෝකය පොරවන් ඉන්න රෙද්ද පැත්තකට අදින ගමන්.

අයි.අයි.ටී.යො ඉන්ටර්විව්වලට මූණ දෙන්න ලෑස්ති වෙලා හිටියෙ මඟුල් ගෙවල්වල යන ගානට. අවුරුදු හතරටම මං ටයි එකක් දැම්මෙ එදා. ඒක මහ විකාර ටයි එකක්. කළු එකේ තැඹිලි පාට තිත්... එහෙමද මන්ද... එහෙම නැත්තං තැඹිලි පාට එකේ කළු තිත්! මට මතක නෑ. කොහොම වුණත් ගිය අවුරුද්දෙ ඒක ඇඳගෙන ඉන්ටර්විව් ගිය සීනියර් උත්තමයො ඉන්ටර්විව් පාස් වුණාලු! ලකී ටයි එකක්!! රයන් දාලා හිටියෙ එයාලගෙ තාත්තල පිටරටින් එවපු ඉතාලි සිල්ක් ටයි එකක්. මොන හේතුවක් නිසා හරි පහුගිය සුමාන දෙකේදි මිනිහට තාත්තල එවන තෑගිවල වැඩි වීමක් වෙලා තිබුණ. මං යවපු ලියුම එයාලට ලැබුණද දන්නෑ? මං ඒ ගැන දෙගිඩියාවෙන් හිටියෙ.

රයන්ගෙ ස්කූටරේ එන්ජිම ඒ වෙද්දි ගලවල, ප්‍රොජෙක්ට් එකට පූජ කරල තිබ්බ හින්ද අපිට යන්න වුණේ ට්‍රයිෂෝවක් අරන්. ඇවිදගෙන ගියානම්, එකක් පණ ආගෙන මැද්ද ඇඳුම්වල ක්‍රීස් පොඩි වෙනව! අනික් එක ආඩිය පොල්ලක් ආලා ෆ්‍රෙෂ් ගතිය නැති වෙනවා.

"ටෙක්නොසොෆ්ට් සොෆ්ට්වෙයාර් සම්මුඛ පරීක්ෂණ..." එක තැනක එහෙම බෝඩ් එකක් ගහල තිබ්බ. මගෙ බැවාලා





ඔක්කොම වගේ ඉන්ටර්විව්වලට මූණ දෙන්න සැදී පැහැදී හිටිය.

"හොඳ වෙලාවට අපේ එවුන්ගෙන් බාගෙකට විතර ජොබවල් සෙට් වෙලා..." රයන් කිව්ව. "ඒ හින්ද අපි වගේ ෆයිව් පොයින්ටර්ස්ලට මේක හොඳ චාන්ස් එකක්."

අපි අපතයො හැටියට හංවඩු ගැහුණු පළවෙනි දවස මතක් කරගන්න මං උත්සාහ කළා. එහෙම වුණේ අපි අල කර ගත්ත පළවෙනි ප්‍රශ්නෙ අහපු දවසෙදිද? නැත්තං අපි ග්‍රේඩ්ස් අල කරගත්ත දවසෙදිද? නැත්තන් විනය කමිටුව දාපු දවසෙදිද? මං හිතන්නෙ අපි ඕනැවටත් වඩා වැඩි සුදුසුකම් ලබා ගත්ත අපතයො වෙන්න.

අපි තුන්දෙනාගෙන් ඉස්සෙල්ලම ඉන්ටර්විව් එකට ගියේ රයන්. ඊට පස්සෙ ආලෝක්. ඊළඟට මං. ඉන්ටර්විව්වලට කලින් අපි පොඩි පොඩි බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න ටිකක් එක එකාගෙන් ඇහුව. ඒව ඇත්තටම සිම්පල් අයි.කියු. ප්‍රශ්න. දෙකක් දාගත්තම ඕනෙම අයි.අයි.ටී.යෙකුට උත්තර දෙන්න පුළුවන් විදිහෙ ප්‍රශ්න.

"මේවැං නෙවෙයිනෙ... ඉන්ටර්විව් එකේදි තමයි තීරණේ වෙන්නෙ..." ආලෝක් කිව්ව.

අපි අපේ රිසල්ට් ෂීට්ස් භාර දුන්න. ඒකෙ හත්වෙනි සෙමෙස්ටර් එක කෙළින් තිබ්බෙ හිස් ඉඩක්. හැබැයි ඒක හරහා 'පරීක්ෂණ කටයුතුවල යෙදී ඇත' කියන සීල් එක බොහොම ගාම්බීර විදිහට වැදිල තිබ්බ. අනෙක් සෙමෙස්ටර්වල ඉස්සරහින් තිබ්බෙ සාමාන්‍ය ප්‍රතිඵල... සී... අකුරුයි... ඩී අකුරුයි!!

"ගුඩ්ලක් රයන්...!" ආලෝක් කිව්වෙ රයන්ව ඉඹ ගන්න ගමන්.

"හා... හා... බලාගෙන... ෂර්ට් ක්‍රීස් එක පොඩි කරන්න එපා..." රයන් කිව්ව.

විනාඩි විස්සකින් මිනිහ එළියට ආව.

"කොහොමද...? කොහොමද...?" අපි මිනිහව වට කර ගත්ත.

"කියන්න බෑ... මං හිතන්නෙ එච්චර හොඳ නෑ වගේ. එයාල ඇහුවෙ මගෙ අඩු ලකුණු ගැන විතරයි... ඒකයි ඇයි මට අරව මේව කරන්න හිතුණෙ කියන එකයි විතරයි..." රයන් කියපි!

"ඉතින් ඔයා මොකද කිව්වෙ?" මං ඇහුව.

"මාත් ඔහේ කියෙව්ව... බලමුකො මොකද වෙන්නෙ කියල..." රයන් කිව්ව.

ආලෝකයවත් විනාඩි විස්සක් විතර ඉන්ටර්විව් කළා. මිනිහ එළියට ආව ගමන් යන්න තිබුණෙ මටයි. අවුරුදු තිහක විතර පොරක් මාව ඉන්ටර්විව් එක තියෙන කාමරේට පිළිගත්ත.

"හලෝ... මම කමල් දේසායි. වාඩිවෙන්න... ආ... අනික මට සර් කියන්න එපා. මට කමල් කියන්න."

මං නිශ්ශබ්දව වාඩි වුණා. කමල් මගෙ ෆයිල් එක බලන දිහා මම බලාගෙන හිටිය. එයාගෙ ඇස් නැවතුණේ මගෙ ග්‍රේඩ් ෂීට් එකේ.

"හ්ම්ම් ෆයිව් පොයින්ට්... ඕවරෝල් ආ... මොකද වුණේ?"

වෙනදට මට ඇති වෙන කතා කරන්න බැරි වෙන, හොල්මන් වෙන ගතිය ඇති වෙන මොහොතක් තමයි ඒ. ඒත් පුදුමෙ කියන්නෙ ඒ ගතිය අතුරුදහන් වෙලා තිබ්බ! මං දන්නෙ නෑ ඇයි කියල... ඒත් රයන්ගෙ ප්ලෑන් එක අප්සෙට් ගිය තැන ඉඳන්, ආලෝක් පැන්න වෙලාවෙ ඉඳන්, චෙරියන් අඬපු වෙලාවෙ ඉඳන්, මුළු ලෝකෙ අනෙක් පැත්ත පෙරළුණත් ශත පහකට ගණන් නොගෙන ඉන්න මට පුළුවන්කමක් ලැබිල තිබ්බ.

"පළවෙනි සෙමෙස්ටර් එක එහෙම පිටින්ම අපි කා ගත්ත සර්... සොරි... කමල්. දන්නවනෙ, පළවෙනි පාරම එහෙම වුණාම ආපහු අයි.අයි.ටී. එකේ වේගෙට එකතු වෙන්න අමාරු බව?"

"ඔහ්... ඇත්තට..." එයා බොහොම උනන්දු බවක් පෙන්නුව මගේ කතාවට. "පළවෙනි සෙමෙස්ටර් එකේදි මොකද වුණේ?"





"ඒක කියන්න හරි අමාරුයි... අපිට කැම්පස් ජීවිතේ විනෝද වෙන්න ඕනෙ වුණා... ඒත් අයි.අයි.ටී. එක කියන්නෙ එහෙම විනෝදෙකට ඉඩ තියෙන කැම්පස් එකක් නෙවෙයි."

"ඔව්... ඒක හරි... අයි.අයි.ටී. එක වෙනස්..." කමලුත් එකඟ වුණා. "මට කියන්න, ඔයා කැමතිද අයි.අයි.ටී. එකට?" කමල් ඇහුව.

ඒක හරි සංකීර්ණ ප්‍රශ්නයක්. මගෙන් මීට කලින් කවුරුවත් ඇහුවෙ නැති ප්‍රශ්නයක්. මට එක පාරටම හිතුණෙ, මං ඉක්මන් වෙලා 'ඔව්' කියාවිය, මේක එපා වෙච්ච හේතු කොනක ඉඳන් දිග ඇරීවිය කියලයි. ඒත් එක එහෙම වුණේ නෑ. මට මගෙ පළවෙනි දවස මතක් වුණා. රයන් බාකුවගෙනුයි, කොකාකෝලාවලිනුයි මාව බේර ගත්තු හැටි! අවුරුදු හතරක්... ඉක්මනටම මෙතනින් අපිට සමුගන්න වෙනව... මං මෙතනට කැමතිද?"

"අනේ මන්ද... මෙතන මං අමතක කරන්න කැමති දේවලුත් තියෙනව... ඒත් මට මගෙ හොඳම යාළුවො හම්බ වුණේ මෙතනදි... ඒ වගේම බොහෝ දුරට මට රස්සාවක් හම්බ වෙන්නෙත් මෙතනින් වෙන්න පුළුවන්..." මම කිව්ව.

කමල් හිනා වුණා. මං එයාව දැක්කෙ මීට අවුරුදු දහයකට කලින් අයි.අයි.ටී.යෙ ඉගෙන ගත්ත කෙනෙක් විදිහට, එයාගෙ ග්‍රේඩ්ස් කොහොමද දන්නෙ නෑ? අන්න ඒකයි අයි.අයි.ටී. එකේ වැඩේ. අයි.අයි.ටී.යෙක් දැක්කොත්, ඊළඟට ඔළුවට එන ප්‍රශ්නෙ තමයි මිනිහගෙ ග්‍රේඩ් එක මොකක්ද කියන එක. ඒකෙන් තමයි මිනිහව මනින්නෙ. ඒක බොහොම කනගාටුදායක දෙයක්.

ඇයි මට සොෆ්ට්වෙයාර් කම්පැනියකට බැඳෙන්න ඕනෙ වුණේ කියන කාරණාවට අදාළව තවත් ප්‍රශ්න දෙක තුනක් කමල් ඇහුව. සොෆ්ට්වෙයාර් නෙවෙයි, ඕනෙ මළදානෙකට මේ වෙලාවෙදි මම කැමතිය කියන එක මමනෙ දන්නෙ. ඉතින් මේක මට ලැබෙන එක චාන්ස් එකක්.

"ඔයාගෙත් එක්ක කතාබහ බොහොම ඉන්ටරෙස්ටින්... හ්ම්... දැනට එච්චරයි..." කමල් එහෙම කියල කාමරේ දොර ළඟට මාව ඇරලුව.

“ඔයත් එක්ක කතාබහ බොහොම ඉන්ටරෙස්ටින්...” මං ඒ කොටස හිත ඇතුළෙන් තුන් පාරක් විතර කියෙව්ව. ඇත්තටම මොකක්ද ඒ කතාවෙ තේරුම? ඔයාගෙන් අපිට වැඩක් නෑ කියන එක වෙනස් විදිහට, විනීත විදිහකට කීමක්ද? එහෙමත් නැත්නම් මගෙ චාටර් වෙච්ච ෆයිල් එකට ඇත්තටම මිනිහගෙ හිත ගියාද?

ප්‍රතිඵල දැන ගන්න අපි තව පැයක් විතර හිටිය. අන්න ඒ වෙලාවෙදි තමයි මගෙ බමරෙත් වැල්ලෙ කැරකෙන බව මට තේරුණේ.

“හරී... ඔයයි, මායි තේරිලා...!” ආලෝක් මගෙ ෂර්ට් එකෙන් ඇද ඇද කිව්ව. “ඔයා බොම්බෙ ඔෆිස් එකට... මං දිල්ලියෙ...!” ආලෝක්ගෙ මූණෙ මල් හතක් පිපිලා.

මාව අන්දමන්ද වෙලා, හොල්මන් වුණු පාර විනාඩි පහක් විතර යනකල් මට මුකුත් කතා කරගන්න බැරි වුණා. තව කොල්ලො සෙට් එකක් නෝටිස් බෝඩ් එක ළඟට ගියේ අපිවත් පෙරළගෙන වගේ. මං මගෙ හිතුවිලි අතරෙ අතරමං වෙලා හිටියෙ. දවස් දෙක තුනකට කලින් අපි හිටියෙ ඔක්කොම බලාපොරොත්තු අත ඇරල. ෂොක් වෙලා! ඒත් දැන්? මට රස්සාවක් හම්බ වෙලා!

“මට හම්බ වෙලා නෑ...” රයන් කිව්ව!

“මොකක්...?” මායි, ආලෝකයි දෙන්නම එකට ඇහුව.

මේකෙ මොකක් හරි වැරදීමක් වෙලා. මටයි, ආලෝක්ටයි හම්බ වෙද්දි රයන්ට හම්බ නොවී තියෙන්නෙ කොහොමද?

“ඇයි... මොකද වුණේ?”

“මං දන්නෙ නෑ... කෙළවුණා... කෙළවුණා...” රයන් එහෙම කිව්වෙ අපෙන් ඈතට යන ගමන්.

“කොහෙද එයා යන්නෙ?” ආලෝක් ඇහුව.

“අනේ මන්ද...” මං කිව්ව.

ටික වෙලාවකට රස්සාවක් ලැබුණු බවවත් මට අමතක වුණා. රයන්ට ජොබ් එකක් නෑ? එයා තමයි අපි තුන්දෙනාගෙන්ම





නිර්මාණශීලීම, ආත්ම විශ්වාසයෙන් වැඩිම, කඩවසම්ම කෙනා! මට හැම තිස්සෙම ඕන වුණේ රයන් වෙන්න. ඒ කියන්නෙ මුළු කැම්පස් එකෙන්ම අඩුම ග්‍රේඩ් තියෙන්නෙ රයන්ටද?

“හරී... අපිට ජොබ් හම්බ වුණා... මාසෙට හැටක්!” ආලෝක් උදම් වෙලා.

“ආ ඔව් ඔව්.” මං රයන් ගැන ටිකකට හිතින් අයින් කළා.

“ඒ කියන්නෙ දැන් අපි අපතයො නෙවෙයි... ඈ? අපිත් පොරවල්...!”

★

එදා රෑ ආලෝක් ගෙදරට පැය දෙකක් කතා කළා. මං හිතන්නෙ මිනිහ කොම්පැනියෙන් දීපු පත්වීමේ ලියුම ඔක්කොම, මුල ඉඳන් අගටම එයාලට කිව්වද කොහෙද? එයාගෙ අම්ම ඔක්කොම කරුණු, ඒ කිව්වෙ මූලික පඩිය, ගමන් දීමනා, වෛද්‍ය දීමනා ඔය ඔක්කොම වෙන වෙනම ලියා ගත්ත. ආලෝක් හිටිය හතරවෙනි බ්‍රහ්ම ලෝකෙ විතර!

මම තාමත් හිටියෙ හොල්මන් වෙලා. හොඳ දේවල්, සාර්ථක දේවල් නොහිතන වෙලාවල්වලදි සිද්ධ වුණහම හිතෙනව, කොතන හරි, මොනව හරි වැරදිලාද කියල! ඒක හීනයක්ද කියල හිතෙනව. කමල් දේසායි, කොයි වෙලේක හරි මට කතා කරාවි. කතා කරල කියාවි “සොරි... අපි පොඩි විහිළුවක් කළේ” කියල. අනිත් එක බොම්බෙවල! සිහින පාරාදීසෙ!

“මොකක්ද ඔයාට වෙලා තියෙන්නෙ? ඔයා එච්චර සතුටෙන් නෙවෙයි වගේ ඉන්නෙ?” ආලෝක් ඇහුවෙ ටෙලිෆෝන් බූත් එකෙන් එළියට එන ගමන්.

“නෑ... නෑ... එහෙම එකක් නෑ... ඒත් මේක බොම්බෙනෙ... එතකොට නේහා?”

"මොකක්ද නේහා? ඔයා මෙහෙන් ගියාට පස්සෙත් ඒක දිගටම කරන්නද හදන්නෙ?" ආලෝක් ඇහුවෙ හරියට නේහාත් අයි.අයි.ටී. එකේදි දීපු එසයින්මන්ට් එකක් වගේ කියල හිතලද කොහෙද!

"මොකෝ නැතුව...?" මං ෆෝන් බූත් එකේ දොරට අත තියා ගත්ත. ආලෝක් කළේ 'අනේ මන්ද' කියනව වගේ උරිස් අකුළපු එකයි. මිනිහට ඒව ගැන කියන එකේ තේරුමක් නැහැ. මිනිහට දැන් ඕනෙ අපිට ලැබුණු රස්සාවලින් ලැබෙන දේවල් ගැන හීන මවන්න.

"කෝ රයන්?" මං ඇහුව.

"මං හිතන්නෙ ලැබ් එකට ගියා... ප්‍රොෆෙසර් වීරට කතා කරන්න ඕනෙයි කිව්වෙ..."

"එයාටත් රස්සාවක් හම්බ වුණානං... මට වැඩියම සතුටු වෙන්න බැරි එක හේතුවක් ඒක..." මම කිව්ව.

"එයාට ටිකක් අමාරු වේවි... එයාට පහයි පොයින්ට් එකයිනෙ... ඒ නිසා අමාරුයි..."

"ඒ වුණාට මිනිහ මාරයි. මොළකාරය... වැඩකාරය... ප්‍රොජෙක්ට් එක තනිකරම එයාගෙනෙ ඇත්තටම..." මං කිව්ව.

"ඒත් අන්තිමටම බලන්නෙ ග්‍රේඩ්ස්නෙ..." එහෙම කියල ආලෝක් යන්න ගියා.

★

තවත් මාසයක් යනකල් රයන්ට ජොබ් එකක් හම්බ වුණේ නෑ. අපේ සෙමෙස්ටර් එක බොහොම වේගයෙන් ගෙවුණ. අපිට වැඩ ගොඩවෙලා තිබ්බ නිසා වෙලාව යනව අපිට දැනුණෙවත් නෑ. රයන් දිගටම කොම්පැනිවලට ඇප්ලිකේෂන් දැම්ම. ඒත් කතා කළේ ඉන්ටර්විව් දෙකකට විතරයි. කොහොමටත්





පන්තියෙ අන්තිමයට ජොබ් එකක් හොයා ගන්න අමාරුයි. මගෙ වාසනාවකට එදා මං අවංකව කරපු කතාවට කමල් පැහැදුණා. නැත්තන් මටත් නඟින්න වෙන්නෙ රයන්ගෙ බෝට්ටුවටමයි.

"ඔයාලට වරදින්නෙ නෑ... රයන් දිගටම ට්‍රයි කරන්න..." ප්‍රොෆෙසර් වීරා නිතරම රයන්ට කිව්ව.

රයන්ගෙ ස්කූටර් එන්ජිම ෆුල් රේස් කරල තිබ්බෙ. එදා දාපු ඔයිල් මික්ස්චර් එකෙන් ආවෙ මහ එපා කරපු ගඳක්. අපි බලාපොරොත්තු වෙන මිශ්‍රණේ මේකනං වෙන්න එපා කියල මං දෙයියන්ට කිව්වෙ ඒ පල් ගඳ උහුලන්නම බැරුවයි.

"මට බෑ ප්‍රොෆෙසර් වීරා... මේක හරි යන්නෙ නෑ..." රයන් කිව්වෙ කළු පාටට එන්ජිමෙන් පිටවෙන දුම දිහා බලාගෙන.

"ඒක හරියනව... මමනං හිතන්නෙ ඔයාට සුදුසු තැන සොෆ්ට්වෙයාර් කොම්පැනියක් නෙවෙයි කියලයි... ඔයාගෙන් ඊට වඩා වැඩක් ගත්තැකි." ප්‍රොෆෙසර් වීරා කිව්ව.

"මොකක්ද සර් ඒකෙ තේරුම?" රයන් ඇහුව.

"මං හිතන්නෙ ඔායට හොඳම තැන මෙතන... ලැබ් එක... මොකක්ද සොෆ්ට්වෙයාර් කොම්පැනියක ජොබ් එක... සුද්දන්ට අඩු කුලියට වැඩ කරන එකනෙ... ඔයා හිතනවද ඒ වගේ තැනක ඔයාට තෘප්තියක් ලැබේවි කියල?"

"මංනම් කැමතියි..." ආලෝක් කිව්ව.

"මං කිව්වෙ රයන් ගැන... ඔයාල යාළුවො... ඒත් ඔයාල කරන්න කැමති වෙනස් වෙනස් දේවල් වෙන්න පුළුවන්..." ප්‍රොෆෙසර් වීරා කිව්ව.

"ඒ කියන්නෙ? වෙන මොනවද මට කරන්න පුළුවන්?"

"ඔයා කැමතිද මගෙ ආර්.ඒ. වෙන්න?" ප්‍රොෆෙසර් වීරා ඇහුව. "මගෙ රිසර්ච් ඇසිස්ටන්ට්... මට පුළුවන් ඔයාව අවුරුදු දෙකක කන්ට්‍රැක්ට් එකකට දාන්න... ගොඩක් ගෙවන්නෙනම් නෑ...

මාසෙට විසිදාහක් විතර... ඒත් ඔයා ඉන්නෙ කැම්පස් එකේ... ඔයාට මේ රිසර්ච් එක දිගටම කරනහැකි..."

මං රයන්ගෙ මූණ දැක්ක. ගෙවන ගාණ එයාගෙ මූණ අමුතු කළා. අපිට හම්බවෙන එකෙන් තුනෙන් එකයි. රයන් මේක කැමති වෙයිද?

"හ්ම්... අදහසනම් හොඳයි..." රයන් කිව්ව.

"අදහස හොඳයි නෙවෙයි... විශිෂ්ටයි... අපිට ඔයාගෙ සොයා ගැනීම වෙළෙඳ පොළට දාගන්න ස්පොන්සර් කෙනෙක් හම්බ වුණොත් ඔයා දන්නවද ඔයා නවතින තැන?" ප්‍රොෆෙසර් වීරා ඇහුව.

රයන් මං දිහා බැලුව. මොන හේතුවක් නිසාද මන්ද, මට තේරුණා එයා වෙනුවෙන් මට තීරණේ ගන්නයි කියන එක. ගෙවන ගාණ අපට වඩා අඩු වුණත් මං උත්තරයක් දුන්න.

"රයන්... මං හිතන්නෙත් ඔයා මෙතන ඉන්නෙ සතුටෙන්... අනික මට විශ්වාසයි මේක හරි ගිහිල්ල ඔයාට ස්පොන්සර් කෙනෙක් ලැබෙන බවට..." මං කිව්ව.

"මේක මාකට් එකට දාන්න හිතාගෙන ඉන්නෙ මිලියන් දහයකට විතර... ඔයාට පේටන්ට් එකයි, රෝයලිටි එකයි හම්බවෙනව... අපිට තියෙන්නෙ ආයෝජකයෙක් හොයා ගන්න විතරයි..." ප්‍රොෆෙසර් වීරා රයන්ව තවත් ධෛර්යවත් කළා.

"මං ඉන්නව..." රයන් තීරණේ කළා! "මං සර්ගෙ ආර්.ඒ. වෙන්නම්!"

"නියමයි..." මං, රයන්ට පහක් දැම්ම.

"දැන් ඉතින් අපි හැමෝටම ජොබ් තියෙනව... පාටියක් දාන්න හොඳ හේතුවක්..." ආලෝක් කිව්ව.

"අනිවාර්යයෙන්ම පාටියක් දාන්නම ඕනෙ ඔයාල..." ප්‍රොෆෙසර් වීරා කිව්ව. "හැබැයි වොඩ්කා නාන්නෙ නැතුව...!"

හැමෝගෙම මූණුවල හිනාමල් පිපුණා!



# 27

## අපතයෝ

එදා උපාධි ප්‍රදානෝත්සව දවස. නිල වශයෙන් බැලුවොත් අයි.අයි.ටීවල අපේ අන්තිම දවස! අපි මේ දවස එනකල් කොච්චර සටන් කළාද? ඔක්කොම සෙමෙස්ටර් ටික කවර්කරන්න අපිට පුළුවන් වුණා. ලැබ් එකේ වැඩ ටික ඔක්කොම කළා. තුන්දෙනාටම රස්සාවල් හොයා ගත්තා. ඕනෙම අයි.අයි.ටී.යෙක් අවුරුදු හතරක් අවසානෙදි ඒව බලාපොරොත්තු වෙනව. එයාලට ඒව ඉෂ්ට වීම සාමාන්‍ය දෙයක්. ඒත් අපි තුන්දෙනාට නම් ඒක ආශ්චර්යයක්! පුදුමයක්! පහුගිය සුමාන ටිකේදිම මට නේහත් එක්ක හරියකට කතා කරන්න බැරි වුණා. මට ජොබ් එක හම්බ වුණාට පස්සෙ මං එයාට කතා කළා. එතකොට එයා ඇඬුව. හේතු දෙකකට.

1. මගෙ ගැන ඇති වෙච්ච සතුටට
2. මට බොම්බෙ යන්න වෙන එකට

හේතු දෙකකට එකම වෙලාවෙදි අඬන්න පුළුවන් කෙල්ලන්ට. ඒක අපිට තේරුම් ගන්න හරි අමාරුයි. මං එයාට වැඩිය කරදර කළේ නෑ. එයත් කිව්වෙ වෙරියන් කූල් ඩවුන් වෙලා තත්ත්වෙකට එනකල් අපි අඩුවෙන් හම්බවෙන එක හොඳයි කියලයි. ඇත්තටම මාත් ඒකට කැමති වුණා හිතට යටින්. හැබැයි උඩින් මං මූණ චොර කරගෙන එයා එක්ක ඒකට ෆයිට් කළා. මොකද අපිට කෝර්ස් ගොඩක් තිබුණ ඉවර කරගන්න. එදා ඔෆිස්

එකේදි දැක්කට පස්සෙ මං චෙරියන්ව දැක්කෙත් නෑ. ඊට පස්සෙ දකින්නෙ අද තමයි! කොහොම වුණත් දෙපාර්තමේන්තු ප්‍රධානියා එදාට කතාවක් කරන්න ඕනෙ, පිටවෙලා යන බැච් එකට.

ආලෝක්, මං, රයන්... අපි උපාධි ලෝගු පොරවගෙන හිටිය. අනික් හැමදාමත් වගේ. ඒ ඇඳුමටත් කඩවසම්ම පෙනුමෙන් බැබළුණේ රයන්. "මංනං ඉස්සරහින් වාඩි වෙන්නෙ නෑ... ඉස්සරහින් වාඩි වුණහම පොඩ්ඩක්වත් ඇහැ පියවන්න බැහැ..." මං හෝල් එකට යද්දිම කිව්ව.

"බෑ... මේක අපේ අන්තිම දවස... මට වෙන දේවල් ඔක්කොම බලාගන්න ඕනෙ." ආලෝක් ඒකට විරුද්ධ වුණා.

"ඔයා ඒකට හොඳ කණ්ණාඩි දෙකක් ගන්න..." රයන් කිව්ව.

ඒත් බේරුමක් වුණේ නෑ. ආලෝකය කියලම හිටිය මිනිහට ඉස්සරහම ඉන්න ඕනෙ කියල. ඒ හින්ද අපි හිටියෙ කෙළින්ම ස්ටේජ් එකට මූණ ආල. අපි හැරිල බැලුව ඇවිල්ල ඉන්න අමුත්තො දිහා.

"අන්න අම්ම... අක්කත් ඇවිත්... ආ තාත්තත්..." ආලෝක් රෝද පුටුවක් තිබ්බ දිහාට අත වනාගෙන වනාගෙන ගියා.

"ඔයාගෙ අම්මයි, තාත්තයිත් ආවද?" මං රයන්ගෙන් ඇහුව.

"ඔව්... එයාලා ආවෙ ඊයෙ රෑ ෆ්ලයිට් එකේ... මං කිව්ව එන්න ඕනෙත් නෑ කියල... ඒත් එයාල ඇවිත්. අර ඉන්නෙ තුන්වෙනි පේළියෙ..." රයන් ඒ පැත්ත පෙන්නුවෙ ටිකක් ආඩම්බරෙන්.

නේහත් ඇවිත් හිටිය, ප්‍රොෆෙසර් චෙරියන් එක්ක. එයා හිටියෙ ප්‍රොෆෙසර්ලට වෙන් කරල තිබ්බ හරියෙ. මං එයාට අත වැනුවම ඒ පැත්තෙ හිටිය ප්‍රොෆෙසර්ල හත් අට දෙනෙක්ම මට අත වැනුව.

"හරී... වාඩි වෙනව... පටන් ගන්නයි යන්නෙ..." ආලෝක් මාව ඇද්ද.





ප්‍රොෆෙසර් චෙරියන් ස්ටේජ් එකට නැග්ග. අත් වැනිලි, කටුකුටු ගෑවිලි ඔක්කොම ගල් වුණා. ශාලාවෙ පැතිරුණේ මිනී පිට්ටනියක නිශ්ශබ්දතාවක්.

"සුබ උදෑසනක්... කාර්මික ඉංජිනේරු අංශයෙ පීඨාධිපතිවරයා හැටියට මම ඔබ සියලු දෙනාවම මෙම උපාධි ප්‍රදානෝත්සවයට ගෞරවයෙන් පිළිගන්නවා. අපි ආඩම්බර වෙනවා අද තවත් දීප්තිමත් කාර්මික ඉංජිනේරුවන් පිරිසක් රටට දායාද කරලීමට හැකි වීම ගැන. මම මේ කතාව හැම අවුරුද්දකම වගේ කරනව. මේ දහවෙනි අවුරුද්ද."

ප්‍රොෆෙසර් චෙරියන් කතාව ටිකකට නැවැත්තුවෙ වතුර ටිකක් බොන්න.

"අවුරුදු දහයක්! මාර පොරක් තමා!" ආලෝක් කෙඳිරුව.

"හැම අවුරුද්දෙම එක එකාට වද දෙන්න..." රයන් අඩුව පිරෙව්ව.

"ෂ්... ෂ්..." මං කිව්ව.

"ඒ නිසා හැම අවුරුද්දෙම වගේ මගෙන් කෙරෙන්නෙ සමාන කතාවල්... අපේ දීප්තිමත් ශිෂ්‍යයන්ට සුබ පැතීමත්, එයාලගෙ අනාගතය ජයග්‍රහණය කරා ගෙන යාමට හැකි වන්නේ කෙසේද කියා උපදෙස් දීමත් තමයි එහි දී සිදු වූයේ... ඇත්තට කිව්වොත් ඊට කලින් අවුරුද්දෙ කරපු කතාව දිහා බලාගෙන තමයි ඊළඟ අවුරුද්දෙ කතාව මම හදා ගන්නෙ. ඒත් මේ අවුරුද්දෙදි ඒකෙ වෙනසක් කරන්න මං කල්පනා කළා. ඇත්ත වශයෙන්ම මම ලියාගෙන ආව කතාවක් මගෙ අතේ නැහැ... ඔබ හැමට කතාන්දරයක් කීමට මට අවශ්‍ය වෙන්නේ..."

රැස්වෙලා හිටිය පිරිස අතරෙ මුනුමුනුවක් පැතිරුණේ ඉබේ. චෙරියන් කතාන්දර කියාවි කියල කවුද හිතන්නෙ? ඉහළම ලකුණු ගත්ත අයගෙ නම් කියල, ඔක්කොටම සුබ පතල කඩේ වහනව මිසක්? මොකක්ද මේ වෙන්න යන්නෙ?

"එකමත් එක කාලෙක අයි.අයි.ටී. එකේ හිටියා ශිෂ්‍යයෙක්... ඔහු ඉතාම දීප්තිමත් ශිෂ්‍යයෙක්. හතරවෙනි අවුරුද්දෙදිත් හැම කෝර්ස් එකකටම පොයින්ට් දහය ගත්තු එක්කෙනෙක්... එයාට වැඩිය යාළුවො හිටියෙ නෑ. අර වගේ ලකුණු ප්‍රමාණයක් දිගටම පවත්ත ගන්න ගොඩක් වෙලාව ඕන වෙනව... ඒ නිසා එයාට යාළුවො වෙනුවෙන් වෙන් කරන්න වෙලාවක් තිබ්බෙ නෑ. ඒ හින්ද එයාට යාළුවො මහ ගොඩක් හිටියෙ නෑ..."

පිරිසගෙන් මඳ සිනා නැඟුණ.

"ඒත් එයාට හිටිය එයාගෙ පන්ති සගයො. එයාට වඩා අඩු මට්ටමක හිටි සගයො... ආත්මාර්ථකාමී සගයො... සල්ලි හම්බ කරන්න බලාගෙන හිටපු සගයො... අඩු වැයමෙන් ඇමරිකාවට රිංගන්න බලන් හිටිය සගයො... ඇත්තම කිව්වොත් එයාගෙ සගයො ඒ අරමුණු ඉෂ්ට කරගත්ත. එයාල බහුජාතික සමාගම්වල රැකියාවලට ගියා ඉහළ පඩිවලට... සමහරු පිටරට ගියා... එයින් සමහරු ඇමරිකාවලදි තමන්ගෙ සමාගම් පටන් ගත්ත. ඒවයින් බොහොමයක් කොම්පියුටර්... මෘදුකාංග සමාගම්. මේ අවුරුදු විස්සකට කලින්... ඔයාලට මේව මවා ගන්න වෙනව... එතකොට කොම්පියුටර්ස් කියන්නෙ බොහොම අලුත්, විශේෂ දෙයක්."

ප්‍රොෆෙසර් චෙරියන් ආපහු වතුර බොන්න නැවතුණා.

"මොකක්ද මෙයා කියන්න හදන්නෙ?" ආලෝක් කොඳුරන්න ගත්ත.

"මං දන්නෙ නෑ... කිව්වනෙ ඉස්සරහින්ම වාඩි නොවී ඉමු කියල... දැන් අඩු ගානෙ නිදා ගන්නවත් බෑ..." රයන් මැසිවිලි කිව්ව.

"ඒත් මේ දීප්තිමත් ශිෂ්‍යයා එහෙම වුණේ නෑ... මොකද එයාට තිබුණ එයාගෙම ප්‍රතිපත්ති. එයාට ඕනෙ වුණේ නෑ එයා ලබපු අධ්‍යාපනේ පටු, වාණිජ අවශ්‍යතාවන් වෙනුවෙන් පාවා දෙන්න. එයාට අවශ්‍ය වුණේ රටට සේවයක් කරන්න. එයාට ඕනෙ වුණේ අයි.අයි.ටී. එකේම ඉඳලා ඒකෙ පරීක්ෂණ, සමීක්ෂණවලට





සහයෝගෙ දෙන්න. අයි.අයි.ටී. එකෙන් ප්‍රොජෙක්ට් ප්‍රපෝසල් එකකට අනුමැතිය ගන්නව කියන්නෙ බොහොම දුර්ලභ සිද්ධියක්."

සභාවෙ හිටි අය ඒකටත් පෑවෙ මඳ සිනාවක්.

"ඒකෙන් අපේ දීප්තිමත් ශිෂ්‍යයා කලකිරුණා. අයි.අයි.ටී. එකේ එහෙම හිටියොත් ප්‍රොෆෙසර් කෙනෙක් වීම තමයි උපරිම ප්‍රතිඵලේ. අවුරුදු දහයක් ගියා. පිටරට ගිය එයාගෙ යාළුවො, බහුජාතික සමාගම්වලට ගිය එයාගෙ යාළුවො ගම් රටවල් බලා ආවා. එකකෙනෙක් හතයි පොයින්ට් ගාණක් තිබ්බ කෙනෙක්. එයා එයාගෙම සොෆ්ට්වෙයාර් කොම්පැනියක් පටන් අරගෙන තිබ්බ. ඒකෙ පිරිවැය විතරක් ඩොලර් මිලියන දෙසීයයි! තවත් යාළුවෙක් වූත්පේස්ට් සමාගමක අයිතිකාරයෙක්. එයා ආවෙ බී.එම්.ඩබ්ලිව්. එකක... ඒත් මේ මොනවවත් අර දීප්තිමත් ශිෂ්‍යයාගෙ ප්‍රතිපත්ති සොලවන්න තරම් ශක්තිමත් වුණේ නෑ... අඩු ගානෙ එයා හිතුවෙ එහෙමයි... ඔව්... ඔයාලා දැනටමත් හිතනව වගේ ඒ දීප්තිමත් ශිෂ්‍යයා මමයි. ඒ කාලෙදි මම හිතුවෙ අනික් අය කොයි තරම් ඉහළට ගියත් මට ප්‍රශ්නයක් නැහැය, මමනෙ දීප්තිමත්ම ශිෂ්‍යයා කියලා. අන්න ඒ කාලෙදි මං තීරණේ කළා මගෙ පුතත් අයි.අයි.ටී. එකට ඇතුළු විය යුතුමයි කියල. මට ඕනෙ වුණා අපේ පරම්පරාවෙ බුද්ධිමත් උරුමය එයා ලව්වා දිගටම ගෙනියවන්න... හ්ම්... පරම්පරාවෙ බුද්ධි උරුමය...! එහෙමයි මම ඒකට කිව්වෙ. ඒත් ඒක මගේ අධිමානය! මගෙ පුතාට ඕන වුණේ නීතිඥයෙක් වෙන්න. එයාට ගණිතය ජේන්න බැහැ. එයාට ගණන් ජේන්න බැරි වුණු එකට මට එයාව ජේන්න බැරුව ගියා. මං එයාව අයි.අයි.ටී. එකට යන්නම ඕනෙය කියන පීඩනේට ලක් කළා. හරියට මං මගේ පන්තිවල ශිෂ්‍යයන්ව පීඩනේට ලක් කරනව වගේම! එයා පළවෙනි පාර අයි.අයි.ටී. ඇතුළත් වීමේ විභාගය අසමත් වුණා... මං එයාගෙ ජීවිතේ තව තවත් පීඩනේට ලක් කළා... නීති ඇම්ම... පාඩම් කරන්න කියල බල කළා... ඒත් තුන්වෙනි පාරටත් එයා අසමත් වුණා... අන්න ඒ කාලෙදි එයා සිය දිවි නසා ගත්ත!!"

මුළු සභාවම හුස්ම ඉහළට ඇද්ද. සමහර එවුන් එකාට එකා කොඳුරන්න ගත්ත.

"ඔය හැම දෙනෙක්ම දන්නවා මට දුවෙක් ඉන්න බව... ඒත් මට පුතෙකුත් හිටිය... අවුරුදු පහකට කලින් රේල් පාරෙදි කෝච්චියට හැප්පිලා මැරිච්ච...! ඒ දවස්වලදි අපි හිතුවෙ ඒක හදිසි අනතුරක් කියලයි. ඒත් මේ..." ප්‍රොෆෙසර් වෙරියන් කිව්වෙ සමීර්ගෙ ලියුම සාක්කුවකින් එළියට ගන්න ගමන්! "ලියුම... ඒක එයා ලියපු එකක්. මට හම්බ වුණේ සුමාන දෙක තුනකට කලින්... එයා මේක මගෙ දුවට ලියල තියෙන්නෙ සිය දිවි නසා ගත්ත දවසෙදි... එයා සිය දිවි නසා ගත්තෙ අයි.අයි.ටී. එකට තේරෙන්න බැරි වෙච්ච හින්ද! එයා සිය දිවි නසා ගත්තෙ මං හින්ද!!" ප්‍රොෆෙසර් වෙරියන් සෑහෙන වෙලාවක් නිශ්ශබ්දව හිටිය. ඊට පස්සෙ කණ්ණාඩිය ගලවල ඇස් දෙක පිහිද ගත්ත. මුළු සභාවම මීයට පිම්බා වගේ, මළ සොහොනක නිශ්ශබ්දතාවක ගිලුණෙ, ප්‍රොෆෙසර් වෙරියන්ගෙ සියුම් ඉකිබිඳීම පවා ඇහෙන විදිහට!

"එයා අඬනව..." රයන් කිව්ව.

"මං ඔයාට කිව්වෙ... මේක මොකක් එක්කවත් සංසන්දනේ..." එහෙම කියද්දිම ප්‍රොෆෙසර් වෙරියන් ආපහු කතාව පටන් ගත්ත.

"ඔයාලගෙ ප්‍රීතිජනක දවසෙදි මේ වගේ දුක්බර කතාවක් කියන්න වෙච්ච එකට මම කනගාටු වෙනව... සමාව ඉල්ලනව... මං හිතුව මම මගේ වැරැද්ද ප්‍රසිද්ධියෙ පිළිගත්තොත් මගෙ පුතා මට සමාව දේවි කියල... ඔව්... කොහේ හරි ඉන්න තැනක ඉඳන් මා දිහා බලාගෙන...! මං කැමතියි, මට අවශ්‍යයි මේ පන්තියෙ එක ශිෂ්‍යයකුට ඒකට ස්තුති කරන්න. මොකද... එයා නිසයි මට ඇත්ත දැන ගන්න පුළුවන් වුණේ... ඒ තමයි මගෙ දුවගෙ පෙම්වතා... හරී... හරිකුමාර්. ඔහු දැන් මගෙ ඉදිරිපිටින්ම වගේ අසුන්ගෙන ඉන්නව..."

"අම්මට සිරි!" ආලෝකයයි, රයනුයි එක පාර කිව්ව. හැමෝගෙම ඇස් මා දිහාට හැරුණා. මගේ මුළු ජීවිතේදිම ඒ





වගේ අපහසුතාවකට ලක් වෙච්ච වෙලාවක් තවත් නෑ! අනේ දෙයියනේ... මට මෙතනින් වාෂ්ප වෙන්න තියේනං...! එක්කො ප්‍රොෆෙසර් වෙරියන් දැන් ස්ටේජ් එකෙන් බහිනවනං...! ඒත් ඒ දෙකෙන් එකක්වත් වුණේ නෑ.

"ඒ වගේම මේ ශිෂ්‍යයා හරිකුමාර් ගැනත්, එයාගෙ මිතුරො වන ආලෝක් සහ රයන් ගැනත් මම වචන කීපයක් කියන්න කැමතියි..." ප්‍රොෆෙසර් වෙරියන් ආපහු කතාව පටන් ගත්ත!

"ංඇ...හ්... මොකා...?" රයනුයි, ආලෝකයි ඇස් උඩ තියා ගත්ත!

"ඇත්තටම එයාල අඩු දස්කම් පෙන්නපු අය... අඩු ග්‍රේඩ්ස් තියෙන අයට මම කියන්නෙ එහෙමයි... ඔව්... එයාලට තියෙන්නෙ පහයි පොයින්ට් ගාණයි... එහෙම නේද?" ප්‍රොෆෙසර් වෙරියන් ඇහුවෙ අපිට ඉඟි කරන ගමන්!

"මගේ දුව හරීව විශ්වාස කළා එයාට මගෙ පුතාගෙ ලියුම පෙන්වන්න තරම්... එයාව හම්බ වෙන්න මගෙ දුව මට බොරු කිව්ව... මාව ගණන් නොගෙන හිටිය... ඔව්... ඒ පාර මැද්දෙ අවුරුදු හතරෙදිම ලකුණු දහය ගත්තු ප්‍රොෆෙසර් හරහට හිටිය වරද්දගෙන... ඔව්... හොඳටම වරද්දගෙන!"

මං හේත්තු වෙලා ප්‍රොෆෙසර් වෙරියන් කියන දේවල් සැලකිල්ලෙන් අහගෙන හිටිය. මගේ හිතේ දුකක් ඇති වුණා. පළවෙනි වතාවට මට හිතෙන්න ගත්ත, ප්‍රොෆෙසර් වෙරියන්ටත් හිතක් පපුවක් තියෙනව නේද කියල!

"අන්න ඒ වෙලාවෙදි තමයි මට තේරුම් ගියේ, මේ ග්‍රේඩ්ස්වල ලකුණු හොඳ ශිෂ්‍යයෙක් බිහි කළත්, හොඳ මිනිහෙක්ව බිහි නොකරන බව...! අපි මෙතනදි කෙනෙක්ව මනින්නෙ එයා ගන්න ලකුණුවලින්. කෙනෙකුට ලකුණු නවය නම් එයා විශිෂ්ටයෙක්. ලකුණු පහනම්, ඔයාලගෙම භාෂාවෙන් කිව්වොත් 'අපතයෙක්...' මම අඩු ලකුණු ගත්තු අයව කොච්චර පහත් කරල සැලකුවද කිව්වොත්, මේ රයන්..." ප්‍රොෆෙසර් වෙරියන්

රයන්ට අත දික් කළේ මේ වෙලාවෙදි... "...එයාගෙ ලිහිසි තෙල් ව්‍යාපෘති වාර්තාව මට ඉදිරිපත් කළහම මං ඒක හරි නැහැයි කිව්වෙ බලන්නෙවත් නැතුව! ඒත් මේ ළමයි ඒක අත ඇරියෙ නෑ. දෙවෙනි වතාවෙදි තමයි මම ඒක හරි හැටියට කියෙව්වෙ...! මට එක දෙයක් කියන්න පුළුවන්... මේ ව්‍යාපෘතියට මුදල් ආයෝජනය කරන ආයෝජකයට පුළුවන් ප්‍රකෝටිපතියෙක් වෙන්න...!"

"හරී... ඇහුණද...?" රයන් කිව්ව.

මම ඔළුව වැනුව.

"අද මෙතනින් පිට වෙලා අනාගතේට මූණ දෙන ඔය හැම දෙනාටම මට දෙන්න තියෙන පණිවිඩේ මේකයි. එක... ඔයාල ඔයාලා ගැන විශ්වාසෙ තියන්න. ඔයාලගෙ ලකුණුවලට හරි, ග්‍රේඩ්වලට හරි, රස්සාවක් කරන කාලෙදි උසස්වීම්වලට හරි ඔයාව මෙහෙයවන්න ඉඩ දෙන්න එපා... ඒවට වඩා දේවල් ජීවිතේ තියෙනව... ඔයාලගෙ පවුල්... ඔයාලගෙ යාළුවො... ඔයාලගෙ පුද්ගලික අරමුණු... ආශාවල්..."

"දෙක... අනවශ්‍ය හදිස්සියකින් අනික් කෙනෙක්ව විනිශ්චය කරන්න යන්න එපා. මම හිතුව අයි.අයි.ටී. එකට තුන්පාරක්ම නොතේරිච්ච හින්ද මගෙ පුතා වැඩකට නැති කෙනෙක්ය කියල. මං දෙයක් කියන්නම්... ඇත්තටම මම වැඩකට නැති, අසාර්ථක තාත්තා කෙනෙක්. අයි.අයි.ටී. එකට ඇතුළු වෙන එක ලොකු දෙයක්... ඒත් කෙනෙකුට එහෙම බැරි වුණයි කියල මුළු ලෝකෙම විනාශ වෙන්නෙ නෑ. ඔයාලා අද ලබා ගන්න අයි.අයි.ටී. උපාධිය සාඩම්බරෙන් පලඳින්න... ඒත් එහෙම නැති, වෙන ආයතනේක කෙනෙක්ව හෙළා දකින්න එපා... ඒ හැසිරීමම අපේ අයි.අයි.ටී. ආයතනයෙ ශ්‍රේෂ්ඨත්වය පෙන්නාවි..."

අත්පුඩි සද්දෙන් මුළු හෝල් එකම දෙදරුම් කෑව.

"අවසාන වශයෙන්, තමන් ගැන ඕනවට වඩා බරපතළ විදිහට හිතන්න එපා. ඇත්තටම ඒකට ප්‍රොෆෙසර්ස්ල වශයෙන් අපියි දොස් අහන්න ඕනෙ... ජීවිතේ එච්චර දිග නැහැ. ඒ නිසා





උපරිම සතුටු වෙන්න... මේ කැම්පස් ජීවිතේදි ඔයාල ලබා ගන්න ලොකුම සම්පතක් තමයි යාළුවො... මිතුරෝ... ඒ නිසා මිතුරන් ඇති කර ගැනීමේදි මුළු ජීවිතේටම එකට ඉන්න මිතුරො ඇති කරගන්න වග බලාගන්න. ඔව්... මට නොයෙක් කතා අහන්න ලැබිල තියෙනව. සමහර වෙලාවට මටත් හිතිල තියෙනව, අඩු ලකුණු ගත්ත වුණත් මටත් හිටිය නම් යාළුවො කියල... ඔව්... රෑට මේ කැම්පස් එකේ වහලෙ උඩ ඉඳන් වොඩ්ක බොන්න යාළුවො හිටිය නම් කියල!!"

ඒ පාර මුළු සභාවම ප්‍රොෆෙසර් වෙරියන්ට අත්පුඩි ගැහුවෙ එකා වගේ හිටගෙන! එන්න එන්න අත්පුඩි සද්දෙ වැඩි වුණා. මගෙ උරිස්ස උඩින්, මගෙ කනට යටින් අත්පුඩි පිපිරුව!

★

"නැඟිටිනව... නැඟිටිනව..." රයන් මගෙ උරිස්සට හයියෙන් තට්ටු කර කර කිව්ව. මං දැක දැක හිටියෙ හීනෙ හරියට වීඩියෝ ටේප් එකක ඉරි ඉරි ගිහින් පේන්නෙ නැතුව යනව වගේ නොපෙනී ගියා.

"ඇයි... මොකෝ?" මං ඇස් පිහදදා ඇහුව.

"ඔව්... ඔව්... ඒ මං තමා. දැන් ඉතින් කියන්න බලන්න අච්චර අමාරුවෙන් අයි.අයි.ටී. එකට ඇතුළු වෙලා, මෙච්චර යමර හටන් දාහක් විතර කරල ලබා ගත්තු උපාධිය ගන්න, ඒ උත්සවේට ආවෙ නැති එක ඔයාට දැනෙන්නෙ කොහොමද කියල?"

ඔව්... ඒ... රයන් තමයි... මිනිහගෙ නෝන්ඩි කටහඬ!

"ඈ... මො... මොකක්...? වෙ... වෙලාව කී... කීයද?" මං දඩබිඩි ගාල නැඟිටල බෙල්ල කරකවල එලාම් එක බැලුව. උදේ හතයි. එළියෙ හොඳට ඉර පායල තිබ්බ.

"ඔයාගෙ එලාම් එකත් ඔයා වගේම තමයි... දැන් එකොළහත් පහු වෙලා... දන්නවද...? අපි දෙන්නටම නින්ද ගිහින්. කන්වකේෂන් එක අපිට මිස් වෙලා!" රයන් කිව්වෙ කිණ්ඩියට හිනා වෙලා.

මං ඇඳෙන් බැහැල බැල්කනියට ගියා. හොස්ටල් එක හිස්. කවුරුවත් ඉන්න පාටක් පේන්නෙ නෑ

ෂෙක්... උපාධිය දෙන දවසෙත් අපි බුදිනෙ...! ඒ කියන්නෙ චෙරිය ඇඩුවෙ නෑ!!

"නොදකින්..." මට කියවුණා. "ඒ කියන්නෙ අපිට උපාධිය දෙන එකක් නැද්ද?"

"මොකෝ නැතුව? අනිවා දෙනවා. අපිට මිස් වෙන්නෙ චෙරියන්ට අතට අත දෙන එකයි, අත්පුඩි ගහන්නැති එකයි විතරයි."

මොකක්ද දැන් ඉස්සෙල්ලම කරන්න ඕනෙ... මං හිතුව. දත් මදිනවද...? නැත්තං සසී එකට ගිහින් කනවද?

"සසී?" රයන් ඇහුවෙ මගෙ හිත කියවන්න පුළුවන් වගේ!

නියමයි... මරු...! අවුරුදු හතරක් කට්ට පිට කට්ට කාල අමාරුවෙන් ගත්ත ඩිග්‍රිය දෙන වෙලාවෙ මායි, රයනුයි පිජාමා එක පිටින්! හරිනම් අපි වගේ එවුන්ට ඩිග්‍රිය දෙන්නම හොඳ නෑ!

"හරී... තාත්ත කියල තියෙනව එයා අපේ ප්‍රොජෙක්ට් එකට වියදම් කරන්න කැමතියි කියල... මං හිතන්නෙ එයා ප්‍රොෆෙසර් වීරා එක්ක කන්ටැක්ට් තියාගෙන ඉන්නව..." රයන් කිව්වෙ පරෝටාවක් කටට ඔබන ගමන්. රයන් කිව්වෙ ලැජ්ජාවෙන් වගේ. අපිට උපාධි ප්‍රදානෝත්සවයට යන්න බැරි වුණාට මිනිහටත් ටිකක් අප්සෙට් වගේ!

"ෂා... නියමයිනෙ..."

"පිස්සුද...? මං කිව්ව මට එයාලගෙ සල්ලි එපයි කියල..." රයන් කිව්ව.

"ඔයා මහ මෝලෙක්නෙ!!" මං කිව්ව.





"ඊට පස්සෙ දන්නවද එයාල කීව දේ? එයාල හිතුවලු අර ලියුම හින්ද මං දැන් ඔක්කොම අමතක කරල හොඳ වෙලා කියල..." රයන් කියපි.

"මොන ලියුමද?" මං දන්නැති ගානට ඇහුව.

"මෙන්න මේ ලියුම..." රයන් මහත ලියුම් කවරයක් එළියට ඇද්ද. "දන්නවද ඒකෙ මං නෝටිස් කරපු දෙයක්."

හැබෑමයි... රුපියල් තිහකට හරි යන්න සීල් ගණනාවක් ගහල තිබ්බ.

"ඇති යන්තං ඔයා එයාලට ලිව්ව..." මං කූල් එකේ කිව්ව.

"ඕ... එහෙමද මිස්ටර් හරිකුමාර්? මුළු ලියුමම ටයිප් කරන්න පරිස්සම් වුණා වගේ එඩ්‍රස් එක අතින් ලියද්දිත් පරිස්සම් වෙන්න තිබ්බනෙ...!" රයන් කිව්ව.

"මොකක්?" ෂිඃ... මට ඒක අමතක වෙච්ච ෑහටි!

රයන් නැඟිටල මට බොරු පාරවල් ටිකක් ගැහුව!

"මෝඩ මෝලා... බොහොම සංවේදී පොරක් වෙලානෙ ඔයා..." මිනිහ කිව්වෙ මං එයාගෙ පාරවල්වලින් ගැලවෙන්න දඟලද්දි. අන්තිමට අපි දෙන්නටම හිනා ගියා. මං රයන්ගෙ ඇස් දිහා බැලුව. මිනිහට තද වෙලා නෑ! ඇත්තම කිව්වොත් මං ඒ වැඩේ කරපු එකට මිනිහ හිත යටින් සන්තෝෂ පාටයි. ඒත් එක පාරට මිනිහගෙ මූණ වෙනස් වුණා.

"ඔයාට ඒක නොකර ඉන්න තිබ්බ..." රයන් කිව්ව.

"මං හිතන්නෙ එදා මම ටිකක් ආල හිටියෙ... ඔයාලගෙ අම්මල හොඳ මිනිස්සු බව මං දන්නව... කොහොම හරි ඔයාගෙ ප්‍රොජෙක්ට් එක සිරා...! ඔයාගෙ තාත්තට ඒකෙන් සල්ලි හොයන්න පුළුවන් වෙයි..." මං මේ වෙලාවෙ මිනිහගෙ ඔළුවට දාන්න ඕනෙ ඒකයි... ප්‍රොජෙක්ට් එකේ සාර්ථකත්වය සහ මාකට් කිරීම. නැතුව කෙහෙල්මල් ලියුමක් ගැන වාද කිරීම නෙවෙයි.

"ඔව්... ඒකනම් වෙයි... ප්‍රොෆෙසර් වීරා තාත්තට හා කියල!"

"එහෙනම් ගොඩනෙ. ප්‍රොෆෙසර් වීර දන්නව එයා කරන දේ... නොකෙරෙන දේකට එයා අත ගහන්නෙ නෑ..." මං පඬිය වගේ කිව්ව. "කෝ මේ ආලෝකය? ඒකා ඇම්ම එන්නැද්ද? අපිට මොනව හරි මිස් වුණාද දන්නෙ නෑ නේද?" මං කතාව ආපහු උපාධි ප්‍රදානෝත්සවේට හැරෙව්ව.

"පිස්සුද... ඔය හැම උපාධි ප්‍රදානෝත්සවයක්ම එකයි... ඕකෙදි චෙරියන් කතාවක් කරල ලකුණු නවය ගත්තු එවුන්ට මෙඩ්ල්ස් පලන්දයි... අපි වගේ එවුන් ඔහේ පිටිපස්සෙන් ඉඳියි... ඔච්චරයි... ඕකෙ වෙන ඇති ලබ්බක් නෑ."

මං දැක්ක පුරුදු රූපෙක හැඩරුව ඈත ඉඳන් අපි දිහාට එනව. කොර ගගහ.

"ආලෝක්..." මං කෑ ගැහුව.

"චෙහ්... ඉන්දියාවට තව ඉංජිනේරුවො සෙට් එකක් බිහි වෙද්දි ඔයාල මෙතන පරෝට ගිලිනව...!" ආලෝක් කිව්ව.

"ඕනද එකක්...?" රයන් ඉන්දියාවට බිහිවෙච්ච අලුත්ම ඉංජිනේරුවගෙන් ඇහුව. රයන් තමන්ගෙ කෑම පිඟාන වෙන කෙනෙකුට දෙන දුර්ලභ දර්ශනේ මට එතනදි දකින්න පුළුවන් වුණා!

"කමු...!" ආලෝක් කවද්ද කෑමට බැහැයි කිව්වෙ! "දන්නවද... චෙරියන් පැයක් කතා කළානෙ...!" ආලෝක් පරෝටා කෑල්ලක් ගලනාලෙ හරහා යවන ගමන් කිව්ව.

"කෝ අම්මල?" රයන් ඇහුව.

"කැම්පස් ලන්ච් එකට එයාලට ආරාධනා කළා... හැම දෙමවුපියෙකුටම... මං ආවෙ ඔයාල කෝ කියල බලන්න..." ආලෝක් කිව්ව.





"චෙරියන් මොනවද කිව්වෙ...? ඔයා දන්නවද මං හීනයක් දැක්කනෙ මිනිහ ගැන!"

"අඩේ... අපි හිතුවෙ ඔයා හීන දකින්නෙ මිනිහගෙ දුව ගැන විතරයි කියල... දැන් බැලුවම මාමණ්ඩියවත් හීනෙන් දකිනව... අනේ වාසනාවන්...!" රයන් ඇද කර කර කිව්ව.

"කට වහනව..." මං රයන්ට කියල, ආලෝක් දිහාට හැරුණා. "ඉතින් මොනවද එයා කිව්වෙ...?"

"එච්චර දෙයක් නෑ... අයි.අයි.ටී. තමයි හොඳම... අනාගතේ සරු කරන්න වගබලා ගන්න... රටට සේවෙ කරන්න... ඔය බයිල ටික තමයි... ආ... හැබැයි එකක් කිව්ව..."

"මොකක්ද?" මායි, රයනුයි එකටම ඇහුව.

"සිස්ටම් එක ගැන ආපහු බලන්න ඕනෙලු... සමහර වෙලාවට පීඩනේ වැඩිලු... ටෙස්ට් අඩු කරල, ප්‍රොජෙක්ට්ස් වැඩි කරන්න යනවලු... මං හරියට අහන් හිටියෙ නෑ... මට ටිකක් නින්ද ගියා... දන්නවනෙ...?"

"අනේ ඇත්තට...!" රයන් පුටුවට හේත්තු වෙන ගමන් කිව්ව.

"හරි... හරි... අඩුගානෙ මං අයි.අයි.ටී. එකේ අන්තිම දවසෙ හරි පිළිවෙළට හිටියනෙ...!" ආලෝක් කිව්ව.

අන්තිම දවස...! ආලෝක්ගෙ වචන මගෙ ඔළුව ඇතුළෙ රවුම් ගැහුව. දෙයියනේ... අපි මෙදා වෙනකල් බලන් හිටිය තරමක්. අන්තිමේදි ඕං ඒකත් ඉවරයි. අපි හිතපු විදිහට නෙවෙයි. අත්පුඩි ලබාගෙන, මෙඩ්ල් කරේ දාගෙන නෙවෙයි... පිජාමා ඇඳගෙන... පාරෙ අයිනෙ කඩේක පරෝටා කකා...! ඒකත් නරකම නෑ! ඔව්... අපි තුන්දෙනා දැන් අයි.අයි.ටී. උපාධිකාරයො... ඉංජිනේරුවො! අපිව ඉතින් ටයිම් සඟරාවෙ මුල් පිටුවට නොයන්න පුළුවන්. හැබැයි ඉතින් අපිත් කොහොමින් හරි ගොඩ! "ඔව්... ඒක ඉවරයි..." මං මටම කියා ගන්න හැදුව. ඒත් එක තැනකදි මගෙ හිතට ආවෙ දුකක්.

"ඒ කියන්නෙ කැම්පස් ජීවිතේ ඉවරයි... ආ...?" රයන් මගේ හිතුවිලි ඇනගෙන වගේ කිව්ව.

"ඔව්... ඉවරයි... දැන් ඉතින් හැබෑ ලෝකෙට මූණ දෙන වෙලාව... එහෙම තමයි උපාධි උත්සවේ කතාවලදිත් කිව්වෙ..." ආලෝක් තද පොරක් වගේ හරබර විදිහට කිව්ව.

මට නේහව කවදාවත් හම්බ වුණේ නැත්තන් හොඳයි කියල හිතුණ. එයාගෙන් වෙන්වෙන එක හරිම වේදනාවක්!

"ඔයා නේහට කතා කළාද?" රයන් ඇහුව. ආයෙත් මිනිහ මගෙ හිත කියවල!

"අද රෑට අපි හම්බ වෙනව..." මං කිව්ව

"වෙරියන් දන්නවද?" ආලෝක් ඇහුව.

"මං හිතන්නෙ නෑ..." මිනිහ පොඩ්ඩක් බුරුලක් දීල ඇති. ඒත් මගෙයි නේහගෙයි සම්බන්ධෙට නම් මිනිහ තාම, බෑ... බෑ... තමා!"

"එතකෙට අපි?" රයන් ඇහුව.

අපි එක්කෙනාට එක්කෙනා මූණු බලා ගත්ත. ඕහ්... අපි ඒ ගැන හිතලම තිබ්බෙ නෑ. අපේ වෙන්වීම...? ඒකනම් අපිට අමාරු වෙයි. අයි.අයි.ටී. එක සම්බන්ධ චාටර් දේවල් ඉවර වෙනකොට, ඒ එක්කම හොඳ දේවලුත් ඉවර වෙනව. කොච්චර අසාධාරණද? හොස්ටල් එකෙන් යන එක... යාළුවන්ගෙන් වෙන් වෙන එක... එච්චර ලේසි දේවල් නෙවෙයි.

"අපේ යාළුකම හැමදාමට තියේවි... ඔව් හැමදාටම..." මං නැගිටල උන්ව බදා ගත්ත. උනුත් මාව බදා ගත්ත.

"ඇති... ඇති... මෙතනදි ඔය ඇති..." රයන් කිව්ව. අපි හිනා වෙවී වාඩි වුණා.

ඒ තමයි අපි අයි.අයි.ටී.වල අන්තිමට එකට හිටිය අවස්ථාව. එතනින් පස්සෙ අපේ ජීවිත වෙනස් වුණා. ඒත් මට ඕනෙ නෑ ඒ ඔක්කොම කියන්න. මොකද මේ පොත ලියවෙන්නෙ අයි.අයි.ටී. ගැන හින්ද.





නේහගෙයි මගෙයි අතර මොනවද වුණේ කියන එකත් මං දන්නෙ නෑ. මට ඕන්නම් දැන් කියතහැකි මොකද වුණේ කියල. ඒත් මට ඒව ගැන කියන්නත් ඒ හැටි ඕනෙකමක් නෑ.

ඔව්... එදා රෑ අපි හම්බ වුණා. ආදර වදන් හුවමාරු වුණා. ඒ වගේම මීට පස්සෙ අපි හම්බ වෙන්නෙ කොහොමද වගේ ප්‍රායෝගික දේවල් ගැනත් කතා වුණා. කොහොමත් අපි දිගටම හැමදාම වෙන් නොවී ඉන්න පොරොන්දු වුණා.

ඒත් 'දිගටම හැමදාම' කියන්නෙ දිග කාලයක්. ඇත්තම කිව්වොත් අයි.අයි.ටී.යෙ හිටිය අවුරුදු හතරටත් වඩා දිග කාලයක්... අදයි... 'දිගටම හැමදාම' කියන කාලෙයි අතරතුරදි ගොඩක් දේවල් වෙන්න පුළුවන්. ඒක එහෙමම තමයි වෙන්නෙ. ඒක මේ පොතේදි අපි කතා කරන තරම් ලේසියෙන් වෙන දෙයක් නෙවෙයි. උපාධි ප්‍රදානෝත්සවය ඉවරයි. අපේ බඩු මුට්ටු අකුළගෙන පැක් කරගෙන තිබ්බ. ඒ මොහොතෙ තමයි අපි තුන්දෙනා අයි.අයි.ටී.යෙදි එකට හිටිය අන්තිම මොහොත.

ආලෝකය දිල්ලියෙ රස්සාව කරන්න පටන් ගත්ත. ඌට වාත වෙන්න මායි, රයනුයි එහෙ නැති නිසා මිනිහ රස්සාවටම සින්න වුණා. ඒකෙ ප්‍රතිඵලයක් හැටියට මිනිහගෙ කොම්පැනිය, මිනිහව මාස හයකට ඇමරිකාවට යැව්ව. එහෙදි හම්බ කරපු ඇමරිකානු ඩොලර්වලට පුළුවන් වුණා, එයාගෙ පවුලෙ දුක්ඛ දෝමනස්ස, කරදර, කරච්චල් හෝදපාළු කරල යවන්න. අලුත් කාර් එකකුත් ඒ ගෙදරට ආපු වෙලාවෙ මට නිකන් හිතුණත් එක්ක මිනිහගෙ අක්කව බඳින්න! ආලෝක්ගෙ තාත්තව පැය විසිහතරෙම බලා කියා ගන්න නර්ස් කෙනෙක්වත් ආලෝක් ලෑස්ති කළා. ඒගොල්ලන්ගෙ අම්මගෙ ප්ලෑන වුණේ රස්සාවෙන් පැන්ෂන් අරන්, ප්‍රයිවට් ටියුෂන් පන්ති ටිකක් පටන් ගන්නයි. මංනම් හිතුවෙ නමට හරි රස්සාවක් කරනවනම් හොඳයි කියලයි... ඒත් කවුද මං කියන දෙයක් අහන්නෙ!

රයන් ප්‍රොෆෙසර් වීරා එක්ක දිගටම වැඩ කළා. රයන්ගෙ තාත්ත දිල්ලිවල ඉඳන් පැය දෙකක් වගේ දුරක තියෙන ෆැක්ටරියක, රයන්ගෙ ව්‍යාපෘතිය වෙනුවෙන් සල්ලි යෙදෙව්ව.

ළඟපාත ගම්වල හිටිය මිනිස්සුන්ව තමයි කම්කරුවො හැටියට බඳව ගත්තෙ. ගෑනු සමහරකුත් හිටිය. රයන් යනවයි කියල ආරංචි වුණා ෆැක්ටරි ඉන්ස්පෙක්ෂන් කියල ඒ ගෑනුන්ව ඉන්ස්පෙක්ෂන් කරන්න. රූප්කුන්වාර් කියන ගෑනිට මිනිහගෙ වැඩි කැමැත්තක් තියෙන බවයි ආරංචිය! මං හිතන්නෙ ළඟදි මොකක් හරි ලොකු බාල්දියක් පෙරළේවි එතන.

මං ගියා බොම්බෙට. මගෙ ජීවිතේ ගොඩක් වගකීම්වලට වගේම ඒකත් මට පේන්න බැරි දෙයක් වුණා. එකට තෙරපිලා ඉතිරෙන නගරවල ජීවත් වෙන්න මං ආස නෑ. අනික මට නේහගෙන් ඈත් වෙලා ඉන්නත් බෑ. මගෙ පළවෙනි මාස තුනේම පඩියෙන් බාගයක් විතර ගියේ කාමර කුලී ගෙවන්න. ඉතුරු බාගෙ නේහට කතා කරන ටෙලිෆෝන් බිලට ගියා!

දෙයියනේ...! මට එයා නැතුව ඉන්න බෑ... එයා... එයාගෙ සුවඳ, එයාගෙ කොණ්ඩෙ, එයාගෙ හිනාව, ඒව නොදැන ඉන්නෙ කොහොමද? එයා මගෙ අතින් අල්ලන් ඉන්න හැටි. ඇත්ත... මට රයනුයි, ආලෝකයයි නැති පාළුව දැනෙනව. ඒත් නේහ නැති පාළුව ඊට වෙනස්. මට එයා නැතුව ඇඬුණා.

එයා එයාගෙ ෆැෂන් ඩිසයිනින් කෝර්ස් එක ඉවර කළා. ඉන්දියන් විලාසිතා නිර්මාණකාරයෙක් ළඟ එයාට ජොබ් එකක් හම්බ වුණා. මං හිතන්නෙ එයා බොම්බෙන් මොකක් හරි හොයා ගන්න ට්‍රයි එකක් දෙනව. ඒක හරි යාවි. බොම්බෙ ඉන්නෙ ෆැෂන්වලට පිස්සු වැටුණු පොරවල් ටිකක්!

ඒ අතරෙදි එන මාසෙදි මං යනව ආලෝක්ගෙ අක්කගෙ වෙඩින් එකට! අපි ඔක්කොම එතකොට එකට. මම... රයන්... ආලෝක්... නේහා... දැනට ඒක තමයි මගෙ තනිකම, පාළුව මකන හිතිවිල්ල. ඒ කිව්වෙ අපි ආයෙ හම්බ වෙනව නේද කියන එක. ඔයාල දන්නවද ඒක හරිම අමුතුයි... මං කොහොමින් හරි අයි.අයි.ටී. එකෙන් උපාධිය ගහගන්න ඇති... ගහගෙන පිටවෙන්න ඇති... ඒත් තාම මගෙ ආත්මය එතන... ඔව්... සමහර විට... හොස්ටල් එකේ කොරිඩෝවෙ... නැත්නම් සයී එකේ... නැත්නම් බිල්ඩිමේ වහලෙ උඩ!



ඕං තුන් මෝල්ලුන්ගෙ කතාව ඉවරයි!

දැන් ඉතින් මේක දිහා බලන් හිටියයි කියල පොතට තව කොළ උනන්නෙ නෑ...! ඔච්චර තමා...!!

පිනිතො...!

මහජන පුස්තකාලය
19 JAN 2016
කොළඹ 7.

CHETAN BHAGAT

# 3 idiots

# තුන් මෝල්ලු

පරිවර්තනය

**දිලීප ජයකොඩි**



අයි.අයි.ටී.ය...
ඒ කිව්වෙ, ඉන්දියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි
එතනට ගියොත්නම් ගොඩම තමා...
හොඳ පඩියක් හම්බවෙන ජොබක් ෂුවර්...
ඒ හින්දම ඉතින් මුළු ගෙදරම ගොඩ...

මගෙයි, රයන්ගෙයි කෙසේ වෙතත්
ආලෝකයගෙ ඒකායන ප්‍රාර්ථනේ වුණේ ඒක...

(ආ... අමතක වුණානෙ කියන්න...
ආලෝකයයි, රයනුයි, මමයි එකම බැච් එකේ...)

එක අතකට මම මොකටද ඒ මෝල්ලු දෙන්න ගැන විස්තර කරන්නෙ...?
(මමත් මෝලෙක් වෙන එක වෙනම කතාවක්...)
උං ගැන අත කැඩෙනකල් පොතක්ම ලියල තව පොතේ පිටි පස්සෙත් ලියපල්ලකො... ඕනෙ නෑ... ඔයාලම කියවල බලන එකයි ඇත්තෙ...
අනේ ඇත්තට මමත් කරන්න යන මෝල් වැඩ...

ISBN 978-955-677-375-0

9 789556 773750

මිල රු. 550/=

ප්‍රකාශනය
ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්
නො: 165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10
දුරකථන: 2682223, 5833323 ෆැක්ස්: 2682224

සුරස පොතක්